


Scanned with CamScanner

පරිවර්තකගේ වෙනත් කෘති

- පර්සි ජැක්සන් සහ අකුණු හොරා
- පර්සි ජැක්සන් සහ රාක්ෂ සයුර
- පර්සි ජැක්සන් සහ ටයිටන්ගේ ශාපය
- පර්සි ජැක්සන් උපදෙවි ලිපිගොනු
- 'පර්සි ජැක්සන් සහ අවසන් ඔලිම්පියානුවා

Rick Riordan's Percy Jackson and the Olympians - Book 4

# THE BATTLE OF THE LABYRINTH

Rick Riordan

# පර්සි ජැක්සන් සහ වංගගිරියේ සටන

-පරිවර්තනය -

සචින්දි ආරියතිලක

ආශිර්වාද ප්‍රකාශකයෝ
ගිරිඋල්ල පාර, මීරිගම
033 2275419, 033 2276499

Scanned with CamScanner

01

# මම චියර් ලීඩර් කණ්ඩායමක් සමග සටන් කළා

මේ ගිම්හාන නිවාඩු කාලේ මට කරන්න උවමනා වුණු අන්තිම දේ වුණේ තවත් ඉස්කෝලයක් පුපුරුවා දමන එකයි. ඒ කොහොම වුණත් ජුනි මාසේ පළවෙනි සතියේ, සඳුදා උදේ, මම අම්මාගේ කාරයේ වාඩි වී සිටියේ නැගෙනහිර 81වෙනි වීදියේ පිහිටි ගුඩ් උසස් පාසල ඉදිරිපිටයි.

ඒක නැගෙනහිර ගඟට ඉහළින් සෑදූ දුඹුරු පාට ලොකු ගොඩනැගිල්ලක්. එය ඉදිරිපිට බී.එම්.ඩබ්ලිව්. සහ ලින්කන් ටවුන් කාර් පොකුරක් ගාල් කර තිබුණා. එහි අරුමෝසම් ගල් ආරුක්කුව දිහා බලාගෙන මම කල්පනා කළේ මෙතැනින් මාව දොට්ට දාන්න කොයි තරම් වෙලාවක් යාවි ද කියලයි.

"සැහැල්ලු වෙන්න." මගේ අම්මගේ හඬේ නම් සැහැල්ලු ගතියක් ගෑවිලාවත් තිබුනේ නැහැ. "මේක ඉස්කෝලෙ කොහොමද කියලා බලන්න යන ගමනක් විතරයි නේ. හැබැයි මතක තියාගන්න, වස්තුවේ, මේක පෝල්ගෙ ඉස්කෝලේ. ඒ නිසා ඒක... ඔයා දන්නවා නේ?"

"විනාශ කරන්නැතුව ඉන්න බලන්න?"

"ඔව්."

Scanned with CamScanner

පෝල් බ්ලෝෆිස්, මගේ අම්මගේ පෙම්වතා දොරකඩ සිටගෙන, පඩිපෙළ නැගගෙන එන අනාගත නමය පන්තියේ ළමයින්ට ආචාර කරමින් සිටියා. ලුණු-ගම්මිරිස් පාට කොණ්ඩයත්, ඩෙනිම් ඇඳුම සහ ලෙදර් ජැකට්ටුවක් නිසා එයාට තරුණයෙකුගේ පෙනුම තිබුණත්, එයා ඉංග්‍රීසි ගුරුවරයෙක් විතරයි. මීට කලින් මම ගිහින් තිබුණු හැම ඉස්කෝලෙකින්ම මාව එළියට දමා තිබුණා වුණත්, මාව නමය වසරට බඳවා ගන්න එයා ගුඩ් උසස් පාසල කැමති කරවාගෙන තිබුණා. ඒක හොඳ අදහසක් නෙවෙයි කියලා එයාට අනතුරු අඟවන්න මම උත්සහ කළත්, එයා මම කියපු දේවල් කනකට ගත්තෙ නැහැ.

මම මගේ අම්මා දිහා බැලුවා. "ඔයා එයාට මං ගැන ඇත්ත කිවුවෙ නැහැ, නේද?"

එයා සුක්කානමට ඇඟිලිවලින් තට්ටු කළේ කලබලෙන්. අම්මා එයාගේ හොඳම නිල් පාට ඇඳුම සහ අඩි උස සපත්තු හැඳ පැලඳගෙන සූදානම් වෙලා සිටියේ රැකියා සම්මුඛ පරීක්ෂණයකටයි.

"අපි තව ටිකක් හිටියොත් හොඳයි කියලා මං හිතුවා," එයා පිළිගත්තා.

"එතකොට එයා බයේ පැනලා දුවන එකක් නෑනේ."

"මේ මග පෙන්වන ගමන හොඳට සිද්ධ වෙයි කියලා මට විශ්වාසයි, පර්සි. ඒක එක උදේ වරුවක් විතරයිනේ."

"නියමයි," මම කෙඳිරුවා. "ඉස්කෝලෙට බැඳෙන්නත් කලින්ම මට ඉස්කෝලෙන් අස් වෙන්න වෙයි වගේ."

"ධනාත්මකව හිතන්න. හෙට ඔයා කඳවුරට යනවා! ඉස්කෝලේ බලා කියාගෙන ආවට පස්සේ ඔයා ඔයාගේ කෙල්ල බලන්න යනවා-"

"එයා මගෙ කෙල්ල නෙවෙයි අනේ!" මම විරෝධය පෑවා. "ඒ ඇනබෙත් නෙ, අම්මා. දෙයියනේ!"

"එයා කඳවුරේ ඉඳලා මෙච්චර දුරක් ගෙවාගෙන ඔයාව බලන්න එනවා."

"හොඳයි, ඔව්."

"ඔයාලා ෆිල්ම් එකක් බලන්න යනවා."

"ඔව්."

"ඔය දෙන්නා විතරක්."



"අම්මෙ!"

එයා යටත් වෙන බව අඟවන්න අත් එසෙව්වා, ඒත් එයා ඉන්නේ හිනාවක් අමාරුවෙන් තද කරගෙන කියලා මට තේරුණා. " ඔයා දැන් ඇතුළට ගියොත් හොඳයි, වස්තුවේ. රෑට මුණ ගැහෙමු."

කාරයෙන් බහින්න සූදානම් වෙමින් මම ඉස්කෝලේ පඩිපෙළ මුදුනට බැල්මක් හෙළුවා. පෝල් බ්ලෝෆිස් රතු පාට බොකුටු කොණ්ඩයක් ඇති ගැහැනු ළමයෙක් සමග කතා කරමින් සිටියා. එයා මෙරූන් පාට ටී-ෂර්ට් එකකින් සහ තැනින් තැන ඉරා, මාකර් පෑනකින් බලි කුරුටු ඇඳපු කලිසමකින් සැරසී සිටියා. එයා හැරෙද්දි මට යාන්තමින් එයාගේ මුහුණ දකින්න ලැබුණා. ඒත් එක්කම මගේ අත්වල රෝම කෙලින් වුණා.

"පර්සි?" මගේ අම්මා කතා කළා. "මොකක්ද ප්‍රශ්නේ?"

"ම්-මුකුත් නෑ," මට ගොත ගැහුණා. "මේ ඉස්කෝලෙට පැති ගේට්ටුවක් නැද්ද?"

"දකුණු පැත්තේ පාර පහළ තියෙනවා. ඇයි?"

"පස්සෙ හම්බ වෙමු."

මගේ අම්මා මොනවදෝ කියන්න හැදුවත් මම කාරයෙන් එළියට පැනලා දුවන්න ගත්තේ රතු කොණ්ඩකාරිට මාව දකින්න නොලැබෙන්න ප්‍රාර්ථනා කරමින්.

එයා මොනවද මෙහෙ කරන්නේ? මගේ වාසනාවවත් මෙච්චර නරක වෙන්න බැහැ.

ඔව්, ඇත්තටම. මගේ වාසනාව කොයි තරම් නරක් වෙන්න පුළුවන් ද කියලා මට ටික වෙලාවකින්ම හොයාගන්න ලැබුණා.

***

ඉස්කෝලෙට හොරෙන් රිංගන්න ගිය එක ඒ හැටි සාර්ථක වුනේ නැහැ. දම්-සහ-සුදු නිල ඇඳුම්වලින් සැරසුණු චියර්ලීඩර්ලා දෙන්නෙක් පැති ගේට්ටුව ළඟ සිටගෙන සිටියේ අලුතෙන් එන ළමයින්ට නවක වදය දෙන්න බලාගෙනයි.

"හායි!" එයා හිනාවෙද්දි මට හිතුණේ චියර්ලීඩර්ලා ඒ තරම් සුහදව මට කතා කරන පළවෙනි සහ අන්තිම වතාව ඒක වේවි කියලයි.

එයාලගෙන් එක්කෙනෙක්ට තඹ පාට කොණ්ඩයක් සහ අයිස් නිල් පාට ඇස් දෙකක් තිබුණා. අප්‍රිකානු-ඇමරිකානුවෙක් වූ අනෙක් ගැහැනු ළමයාගේ කොණ්ඩය මෙඩූසාගේ වගේ කළු පාට කැරලි ගොඩකින් පිරිලා තිබුණා (මාව විශ්වාස කරන්න, මම කියන්නෙ මොකක් ගැන ද කියලා මම හරියටම දන්නවා). ගැනු ළමයි දෙන්නාගේ නම් එයාලාගේ නිල ඇඳුම්වල වැල් අකුරින් මසා තිබුණත්, මගේ වචන අන්ධතාවය නිසා මට ඒවා පෙනුණේ තේරුමක් නැති ස්පැගටි රැල් වගෙයි.

"ගුඩ්වලට සාදරයෙන් පිළිගන්නවා," තඹ කොණ්ඩකාරි කිවුවා. "ඔයා ඒකට ගොඩාක් කැමති වෙයි."

ඒත් එයා මගේ උඩ ඉඳන් පහළටම බැල්මක් හෙළද්දි එයාගේ මූහුණෙන් පළ වුණේ නම්, 'ඊට්ට්ට්, මේ මොන අපතයෙක් ද?' වගේ කතාවක්.

අනෙක් ගැහැනු ළමයා මට අපහසුවක් දනෙන තරම් ළඟට ආවා. එයාගේ නිල ඇඳුමේ මසා තිබුණු අකුරු දිහා බලා සිටි මට 'කෙලී' කියන නම යාන්තමින් කියවාගන්න හැකි වුණා. එයා ළඟින් රෝස සුවඳකුත්, කඳවුරේ අශ්වයෝ පදින වෙලාවට දනෙන සුවඳකුත් හැමුවා - නාවපු අශ්වයින් ළඟින් එන සුවඳ. ඒක නම් චියර්ලීඩර් කෙනෙකුට ගැළපෙන සුවඳක් නෙවෙයි. සමහරවිට එයාට අශ්වයෙක් ඇති. කොහොම හරි, එයා මට කොයි තරම් කිට්ටු වුණා ද කියනවා නම්, එයා මාව පඩිපෙළෙන් පහළට තල්ලු කරන්න යනවා කියලා මට හිතුණා. "ඔයාගෙ නම මොකක්ද, මාළුවා?"

"මාළුවා?"

"යාළුවා."

"අහ්. පර්සි."

ගැනු ළමයි දෙන්නා බැල්මක් හුවමාරු කරගත්තා.

"ඔහ්, පර්සි ජැක්සන්," තඹ කොණ්ඩකාරි කිවුවා. "අපි ඔයා එනකල් තමයි බලාගෙන හිටියේ."

ඒ කතාව ඇහුවම මගේ කොඳු නාරටිය පුරා අමුතු හිරියක් පැතිරුණා. මග අහුරාගෙන සිටි ඒ දෙන්නා පැව හිනාවේ නම් කිසිම මිත්‍රශීලී ගතියක් තිබුනේ නැහැ. මගේ අත ඉබේටම මගේ සාක්කුව වෙතට, මගේ මාරක බෝල්පොයින්ට් පෑන, රිප්ටයිඩ් තබාගෙන සිටි තැනට ඇදුණා.



ඒත් එක්කම තවත් කටහඬක් ගොඩනැගිල්ල තුළින් ඇසුණා. "පර්සි?" කොරිඩෝව පහළ කොතැනකදෝ සිට ඒ කතා කළේ පෝල් බ්ලෝෆිස්. එයාගේ කටහඬ අහලා මම වෙන කවදාවත් ඒ තරම් සතුටු වෙලා නැහැ.

චියර්ලීඩර්ලා පස්සට වුණා. මම කලබලෙන් එයාලව පහු කරගෙන යන්න උත්සහ කරද්දි මගේ දණහිසක් කෙලීගේ කලවයේ වැදුණා.

*ක්ලෑංගේ!*

එයාගේ කකුලෙන් හිස්, ලෝහමය හඬක් පිටවුණේ හරියට මම මේ දූත් කොඩි කණුවකට පයින් ගැහුවා වගෙයි.

"ඌයි," එයා කෙඳිරුවා. "බලාගෙන යනවා, මාළුවා."

මම පහළ බැලුවා, ඒත් එයාගේ කකුල සාමාන්‍ය පරණ කකුලක් වගේමයි. ඒ ගැන අහන්න බැරි තරමට මම බයවුණා. මම ශාලාව තුළට කඩාගෙන බිඳගෙන දුවද්දි මට පිටුපසින් චියර්ලීඩර්ලා හිනාවෙන හඬ ඇසුණා.

"මෙ ඉන්නේ ඔයා!" පෝල් මට කිවුවා. "ගුඩ්වලට පිළිග න්නවා!"

"හේයි, පෝල් - අහ්, මිස්ටර් බ්ලෝෆිස්," මම ආපසු හැරී බැලුවත්, ඒ වෙද්දි අර අමුතු චියර්ලීඩර්ලා අතුරුදහන් වෙලා.

"පර්සි, මොකද නිකං හොල්මනක් දැකලා වගේ."

"ඔව්, අහ්-"

පෝල් මගේ පිටට තට්ටුවක් දැමුවා. "අහන්න, මං දන්නවා ඔයා ඉන්නෙ බය වෙලා කියලා, ඒත් කලබල වෙන්නෙපා. ඒ.ඩී.එච්.ඩී, වචන අන්ධතාවය තියෙන ළමයි ගොඩක් අපි ළඟ ඉන්නවා. එයාලට උදවු කරන්න ඕනෑ කොහොමද කියලා ටීචර්ලා දන්නවා."

ඒ කතාවට මට හිනාවෙන්න ඕනෑ වුණා. මට වද වෙන්න තිබුණු ලොකුම ප්‍රශ්නේ ඒ.ඩී.එච්.ඩී සහ වචන අන්ධතාවය විතරක් නම් කොච්චර හොඳද. මම අදහස් කළේ, පෝල් උත්සහ කරන්නේ මට උදවු කරන්න කියලා මම දැනගෙන හිටියා, ඒ වුණත් මම එයාට මං ගැන ඇත්ත කිවුවොත්, මට පිස්සු කියලා එයා හිතයි, එහෙම නැත්නම්

Scanned with CamScanner

බෙරිහන් දිදී දුවන්න ගතියි. උදාහරණයක් විදිහට අර වියර්ලීඩර්ලව ගන්න පුළුවන්. මට එයාලා ගැන මහ තරක හැඟීමක් දැනුණා...

ඒ වෙලාවේ ශාලාවේ අනෙක් කෙළවර බලද්දි මට තවත් ප්‍රශ්නයක් තියෙන බව මතක් වුණා. ඉදිරි පඩිපෙළ ළඟ මට දකින්න ලැබුණු රතු කොණ්ඩකාරි ප්‍රධාන දොරටුවෙන් එනවා පෙනුණා.

මාව දකින්න නම් එපා, මම යාඥා කළා.

එයා මාව දැක්කා. එයාගේ ඇස් ලොකු වුණා.

"අනිත් ළමයි කොහෙද?" මම පෝල්ගෙන් ඇසුවා.

"ජිම් එකේ. අර පැත්තේ. ඒත්-"

"බායි."

"පර්සි?" එයා කතා කළා, ඒත් මම නවතින්නෙ නැතිව දිවුවා.

***

මම හිතුවේ මං එයාව මග ඇරියා කියලයි.

ළමයි කණ්ඩායමක් ව්‍යායාම ශාලාව දෙසට යමින් සිටියා, ඉක්මනින්ම මමත් ව්‍යායාම ශාලාවේ නරඹන්නන් වෙනුවෙන් සැදූ කොන්ක්‍රීට් පඩි මත එකට තෙරපී වාඩි වූ අවුරුදු-දහහතරේ ළමයි තුන්සියයකගෙන් එකෙක් විතරක් වුණා. පෙළපාලියේ ගිය තූර්ය වාදක කණ්ඩායම් තාලයෙන් පිට වාදනය කළ රණ ගීය ඇසුණේ පූසෝ ටිකක් දාපු මල්ලකට බේස්බෝල් පිත්තකින් තළනවා වගෙයි. වැඩිමහල් ළමයි, පෙනුණු හැටියට ශිෂ්‍ය නායකයෝ, ගුඩ් ඉස්කෝලේ නිල ඇඳුමෙන් සැරසිලා මෝස්තර නිරූපණ ශිල්පියෝ වගේ ඉස්සරහින් හිටගෙන හිටියා. ගුරුවරු හිනාවෙමින්, ළමයින්ට අතට-අත දෙමින් ශාලාව වටේ ගියා. ව්‍යායාම ශාලාවේ බිත්ති වැහෙන්න එල්ලා තිබුණු බැනර්වල සටහන් කර තිබුණේ: *අනාගත ආධුනිකයින්ව සාදරයෙන් පිළිගනිමු , ගුඩ් වීස් ගුඩ්, අපි ඔක්කොම එක පවුලක්* සහ කියෙවුවාම මට වමනෙ කරන්න හිතෙන විදිහේ තවත් ප්‍රීතිමත් වැකි ගොඩක්.

අලුත් ළමයි එක්කෙනෙක්වත් එතැන කැමැත්තෙන් ඉන්න බවක් නම් පෙනුනේ නැහැ. මං අහන්නේ, සැප්තැම්බර් වෙනකල් ඉස්කෝලෙ පටන් ගන්නෙ නැතිකොට ජූනි මාසේ මූලික වැඩමුළුවට එන්න කැමති මොන ළමය ද? ඒත් ගුඩ්වල අය කියන්නේ, 'අපි



විශිෂ්ටත්වට උදෙසා වේලාසන සැරසෙමු' කියලයි. අඩු තරමේ එයාලා දුන්න පොත් පිංචේ තිබුණෙ එහෙමයි.

තූර්ය වාදක කණ්ඩායම වාදනය නැවැත්තුවා. හීනි ඉරි මෝස්තරයක් වැටුණු ඇඳුම් කට්ටලයකින් සැරසුණු පිරිමි කෙනෙක් මයික්‍රොෆෝනය වෙත ඇවිත් කතා කරන්න පටන් ගත්තා, ඒත් ව්‍යායාම ශාලාව පුරා හඬ දෝංකාර දුන් නිසා එයා මොනවා කියවනවා ද මට තේරුනේ නැහැ. එයා කළේ උගුර හෝදන එක ද මන්දා. කවුදෝ මගේ උරහිසෙන් අල්ලා ගත්තා. "ඔයා මොනවද මෙහෙ කරන්නේ?"

ඒ අර ගැහැනු ළමයාඃ මගේ රතු කොණ්ඩකාර නරක හීනය.

"රේචල් එලිසබෙත් ඩෙයාර්," මම කිවුවා.

එයාගේ කට ඉබේටම ඇරුණේ හරියට එයාගේ නම මතක තියාගන්නවා වගේ හපන්කමක් කරන්න මට පුළුවන් ඇති කියලා විශ්වාස කරන්න බැහැ වගෙයි. "එතකොට ඔයා පර්සි කවුරුහරි. ගිය දෙසැම්බර්වල ඔයා මාව මරන්න හැදුව වෙලාවේ මට ඔයාගේ මුළු නමම අහගන්න බැරි වුණා නේ."

"බලන්න, මම එහෙම- මට ඕනෑ වුනේ නෑ- ඔයා මොනවද මෙහෙ කරන්නේ?"

"ඔයා කරන දේම තමයි, මං හිතන්නේ. ඉස්කෝලෙ බලාගන්නවා."

"ඔයා පදිංචි නිව්යෝක්වල ද?"

"මොකක්, ඔයා හිතුවේ මම හූවර් ඩැම් එක ළඟ ජීවත් වෙනවා කියල ද?"

මීට කලින් කවදාවත් මට ඒක කල්පනා වුනේ නැහැ නේ. මම එයා ගැන හිතපු හැම වෙලාවකම (මම එයා ගැන හිතුවා කියලා කියනවා නෙවෙයි; ඉඳලා හිටලා මට එයාව මතක් වුණා විතරයි, හරිද?), මම හිතුවේ එයා හූවර් වේල්ල කිට්ටුව ජීවත් වෙනවා ඇති කියලයි. මොකද මට එයාව මුණ ගැහිලා තිබුණේ එහෙදි නේ, එදා අපි දෙන්නා විනාඩි දහයක් විතර එකට ගත කළා, ඒ කාලය තුළ දී මම අහම්බයෙන් එයාට කඩුවෙන් කෙටුවා, එයා මගේ ජීවිතේ බේරුවා, ඊට පස්සේ මාව ලුහුබැඳගෙන ආව අද්භූත මිනී මරන යන්ත්‍රවලින් බේරෙන්න මට දුවන්න සිද්ධ වුණා. ඔයා දන්නවා නේ, හරිම සාමාන්‍ය අහඹු මුණගැසීමක්.

"ඒයි, කට වහගන්නවල්ලා. චියර්ලීඩර්ලා කතා කරනවා!" අපිට පිටුපසින් හිටපු කොල්ලෙක් කෙඳිරුවා.

"හායි, යාළුවනේ!" ගෑනු ළමයෙක් මයික්‍රොෆෝනයට මැතිරුවා. ඒ මම ගේට්ටුව ළඟදි දැකපු තඹ කොණ්ඩකාරි. "මගේ නම ටැමී, එතකොට මේ ඉන්නෙ කෙලී." කෙලී කරණමක් ගැසුවා.

මගේ ළඟ සිටි රේචල් එක පාරටම කෑගැසුවේ කවුරුහරි එයාට කටුවකින් ඇන්නා වගෙයි. ළමයි කිප දෙනෙක් එයා දිහා බලමින් හිනාවල් තද කරගන්නවා පෙනුණා, ඒත් රේචල් චියර්ලීඩර්ලා දිහා බලාගෙන හිටියේ තැති ගැන්විලයි. ටැමීට මේ කලබගෑනිය ගැන වගක් තිබුනේ නැහැ. ඉස්කෝලේ පළවෙනි අවුරුද්දේ අපිට සම්බන්ධ වෙන්න ලැබෙන වැදගත් දේවල් ගැන එයා කතා කරන්න පටන් ගත්තා.

"දුවන්න," රේචල් මට කිවුවා. "දැන්මම."

"ඇයි?"

රේචල් කරුණු පැහැදුවේ නැහැ. රවා බලන ගුරුවරුන්ව සහ කකුල් පෑගීම නිසා ගොරවන ළමයින්ව නොසලකා හරිමින් එයා සෙනඟ අතරින් රිංගමින් කොන්ක්‍රීට් ආසනවල කෙළවරට යන්න ගත්තා. මම පැකිළුණා. අපිව පුංචි කණ්ඩායම්වලට බෙදලා ඉස්කෝලෙ පුරා චාරිකාවකට ගෙනියන හැටි ටැමී විස්තර කරමින් සිටියා. මගේ දිහා බලපු කෙලී කොලොප්පමට හිනාවුණේ හරියට මම මොනවා කරයි ද කියලා එයා බලාගෙන ඉන්නවා වගෙයි. මම දැන් මෙතැනින් පිට වෙලා ගියොත් මාව නරක ළමයෙක් වගේ පෙනේවි. පෝල් බ්ලෝෆිසුත් පහළ අනෙක් ගුරුවරු අතරේ සිටියා. එතකොට එයා කලබල වෙන්න ඉඩ තිබුණා.

ඊට පස්සෙ මම රේචල් එලිසබෙත් ඩෙයාර් ගැන සහ පහු ගිය ශීත සෘතුවේ හූවර් වේල්ල ළඟ දි එයා දක්වූ විශේෂ හැකියාව ගැන කල්පනා කළා. වේල්ලේ සිටි ආරක්ෂක නිලධාරියෝ කණ්ඩායමක් ඇත්තටම ආරක්ෂක නිලධාරියෝ නොවෙන බව, අඩු තරමේ මිනිස්සුවත් නොවෙන බව එයාට දැකගන්න පුළුවන් වෙලා තිබුණා. මගේ හදවත වේගයෙන් ගැහෙද්දි මම නැගිටලා එයා පසුපස ව්‍යායාම ශාලාවෙන් පිටතට ගියා.

***



මට සංගීත කාමරේ දි රේචල්ව හොයාගන්න ලැබුණා. එයා බෙස් ඩ්‍රම් එකක් පිටුපස සැඟවී සිටියා.

"මෙහෙ එන්න!" එයා කිවුවා. "ඔළුව පාත් කරගෙනම ඉන්න!"

බොන්ගෝ ගොඩක් පිටිපස්සේ සැඟවෙද්දි මට මහා අමන ගතියක් දැනුණා, ඒ වුණත් මම එයා ළඟින් ඇන තියා ගත්තා.

"එයාලා ඔයාගෙ පස්සෙන් ආව ද?" රේචල් ඇසුවා.

"ඔයා අහන්නේ චියර්ලීඩර්ලා ද?"

එයා බයෙන් ඔළුව වැනුවා.

"මං හිතන්නේ නැහැ," මම කිවුවා. "එයාලා මොක්කු ද? ඔයා මොනවද දැක්කේ?"

එයාගේ කොළ පාට ඇස් භීතියෙන් දැල්වුණා. එයාගේ මූණ පුරා විසිරී තිබුණු ලප මට තරු රටා සිහිපත් කළා. එයාගේ මෙරූන් පාට ටී-ෂර්ට් එක ඉදිරිපස 'හාර්වඩ් කලා අංශය' ලෙස මුද්‍රණය කර තිබුණා. "ඔයා... ඔයා මාව විශ්වාස කරන්නැති වෙයි."

"ඔහ්, ඔව්, මම විශ්වාස කරනවා," මම පොරොන්දු වුණා. " ඔයාට මීදුම හරහා දකින්න පුළුවන් කියලා මම දන්නවා."

"මොකක් හරහා?"

"මීදුම. ඒක... හොඳයි, ඒක හරියට වටපිටාවේ තියෙන දේවල්වල සැබෑ ස්වරූපය හංගන තිරයක් වගේ. සමහර මනුෂ්‍යයෝ ඒක හරහා දකින්න හැකියාව ඇතිව ඉපදෙනවා. හරියට ඔයා වගේ."

එයා මාව පරිස්සමෙන් අධ්‍යයනය කළා. "ඔයා හූවර් ඩෑම් එකේදිත් ඔය වැඩේ කළා. ඔයා මට මනුෂ්‍යයෙක් කියලා කතා කළා. හරියට ඔයා එහෙම නෙවෙයි වගේ."

මට බොන්ගෝ එකක් හිල් වෙන්න ගහන්න හිතුණා. මම මොනවද හිතුවේ? මට කවදාවත් ඒක පැහැදිලි කරන්න බැහැ. අඩු තරමේ ඒකට උත්සහ කරන්නවත් මට බැහැ.

"මට කියන්න," එයා බැගෑපත් වුණා. "ඒකෙ තේරුම මොකක්ද කියලා ඔයා දන්නවා නේ. මොනවද මම මේ දකින භයානක දේවල්?"

"බලන්න, මේ කතාව විකාරයක් වගේ ඇහෙයි. ඔයා ග්‍රීක පුරාවෘත්ත ගැන මොනවා හරි දන්නව ද?"

Scanned with CamScanner

"හරියට... මිනටෝර්, හයිඩ්‍රා වගේ?"

"ඔව්, හැබැට මම ළඟපාත ඉන්න වෙලාවට ඒ නම් කියන්නෙ නැතුව ඉන්න බලන්න, හරි ද?"

"එතකොට පියුරිලා," එයා තව තවත් උනන්දු වෙමින් කියාගෙන ගියා. "කිඳුරෝ, තව-"

"හරි!" මම සංගීත කාමරය වටා බැල්මක් හෙළුවේ රේචල්ගේ කතා නිසා ලේ පිපාසිත යක්කු ටිකක් කොයි වෙලේ බිත්ති අතරින් මතුවෙයි ද හිතමිනුයි. ඒත් තවමත් අපි තනියම. ව්‍යායාම ශාලාවෙන් පිටතට එන ළමයි රංචුවකගේ හඬ මට කොරිඩෝව පහළින් ඇහුණා. එයාලා කණ්ඩායම් චාරිකාව පටන්ගෙන වගෙයි. අපිට කතා කරකර ඉන්න වැඩි වෙලාවක් තිබුනේ නැහැ.

"උන් ඔක්කොම රාක්ෂයෝ," මම කිවුවා, "ග්‍රීක දෙවිවරු - එයාලා ඇත්තටම ඉන්නවා."

"මං ඒක දැනගෙන හිටියා!"

එයා මට බොරුකාරයා කියලා බැන්නත් මාව ඒ තරම් අපහසුවකට පත් නොවෙන්න තිබුණා. ඒත් රේචල් බලාගෙන හිටියේ හරියට මම මේ දන් එයාගේ නරකම සැකය තහවුරු කරලා දුන්නා වගෙයි.

"ඒක කොයි තරම් අමාරු දෙයක් වුණා ද කියලා ඔයා දන්නෙ නැහැ," එයා කිවුවා. "අවුරුදු ගාණක් තිස්සෙ මම හිතුවෙ මට පිස්සු හැදිගෙන එනවා කියාල. මට කාටවත්ම කියන්න පුළුවන්කමක් තිබුනේ නැහැ. මට බැරිවුණා-" එයාගේ ඇස් පටු වුණා. "පොඩ්ඩක් ඉන්න. ඔයා කවුද? මං අහන්නේ ඇත්තටම?"

"මම රාක්ෂයෙක් නෙවෙයි."

"හොඳයි, මං ඒක දන්නවා. ඔයත් එහෙම කෙනෙක් නම් මට ඒක පේනවා නේ. ඔයාව පේන්නෙ හරියට... ඔයා වගේමයි. ඒත් ඔයා මනුස්සයෙක් නෙවෙයි, එහෙම නේද?"

මම තදින් කෙළ ගිල්ලා. මම කවුද කියන කාරණයට හුරුවෙන්න මට අවුරුදු තුනක් ම ලැබී තිබුණා වුණත්, මීට කලින් කවදාවත් මම ඒ ගැන සාමාන්‍ය මනුස්සයෙක් එක්ක කතා කරලා තිබුනෙ නැහැ - මං අදහස් කළේ, මගේ අම්මා එක්ක ඇරෙන්න, ඒත්



එයා නම් කල්තියාම දැනගෙනයි හිටියේ. ඇයි කියලා නොතේරුණත් මම ඒ අවදානම ගත්තා.

"මම අර්ධ-ලෝහිතයෙක්," මම කිවුවා. "මම බාගෙට මනුස්සයෙක්."

"එතකොට ඉතුරු බාගේ?"

ඒ මොහොතේම ටැමී සහ කෙලී සංගීත කාමරය තුළට ආවා. එයාලට පිටුපසින් දොර තදින් වැසුණා.

"මේ ඉන්නෙ පර්සි ජැක්සන්," ටැමී කිවුවා. "ඔයාට ඉස්කෝලෙ පෙන්වන්න වෙලාව ඇවිල්ලා."

***

"උන්ගෙ කැත!" රේචල් හිල්ලුවා.

ටැමී සහ කෙලී තවමත් දම්-සුදු චියර්ලීඩර් ඇඳුම්වලින් සැරසී, පොම්-පොම් අතේ තබාගෙන සිටියා.

"ඇත්තටම එයාලා මොන වගේ ද?" මම ඇසුවත් රේචල් සිටියේ උත්තර දෙන්න බැරි තරම් කම්පනය වෙලයි.

"ඔහ්, එයාව අමතක කරන්න." මට දීප්තිමත් හිනාවක් පෑව ටැමී අපි ඉදිරියට එන්න පටන් ගත්තා. අපිට පිටවීමට ඇති මග අහුරමින් කෙලී දොර ළඟ සිටගත්තා.

එයාලා අපිව කොටු කරගෙන තිබුණා. මෙතැනින් ගැලවෙන්න නම් අපිට සටන් කරන්න සිද්ධ වෙන බව මට තේරුණා, ඒ වුණත් ටැමීගේ හිත් ඇදගන්නා හිනාව දැකලා මාව අන්දමන්ද වුනා. එයාගේ නිල් පාට ඇස් හරිම ලස්සනයි, එතකොට එයාගේ කොණ්ඩය උරහිස් මතින් වැටිලා තිබුණු විදිහ...

"පර්සි," රේචල් අනතුරු ඇඟෙව්වා.

මගේ කටින් පිටවුණේ හරිම බුද්ධිමත් ප්‍රතිචාරයක්, "ඈහ්හ්හ්?"

ටැමී ටිකෙන් ටික කිට්ටු වුණා. එයා පොම්-පොම් දෙක ඉදිරියට දිගු කළා.

"පර්සි!" රේචල්ගේ කටහඬ ඈතක සිට ඇසෙනවා වගෙයි දැනුණේ. "ඔකෙන් ගැලවෙන්න!"



Scanned with CamScanner

ඒකට මගේ සම්පූර්ණ අධිෂ්ඨාන ශක්තියම යොදවන්න සිදු වුණා. ඒත් මම සාක්කුවෙන් මගේ පෑන පිටට අරන් කොපුව ගැලවුවා. අඩි තුනක් දිගු ලෝකඩ කඩුවකට හැරුණු රිප්ටයිඩ් තුනී රන්වන් එළියකින් දිලිසෙන්න ගත්තා. ටැමීගේ හිනාව විපිත්තිමකට හැරුණා.

"අයියෝ. ඔය මොකද," එයා විරෝධය පෑවා. "ඔයාට මොකටද ඕක. ඒ වෙනුවට හාද්දක් දුන්නොත් කොහොමද?"

එයා ළඟින් රෝස සහ පිරිසිදු සත්ත්ව ලොම්වල සුවඳ හැමුවා - අමුතු වුණත් මත් කරවනසුලු සුවඳක්.

රේචල් මගේ අත තදින් කෙනිත්තුවා. "පර්සි, එයාට ඔනෑ ඔයාව කන්න! බලන්න එයා දිහා!"

"එයා ඉන්නේ ඉරිසියාවෙන්," ටැමී කෙලි දෙස බැලුවා. " අවසර ද, මැතිනියනි?"

තවමත් දොර අහුරුවාගෙන සිටි කෙලි කැදර ලෙස තොල කට ලෙව කෑවා. "කරගෙන යන්න, ටැමී. ඔයා හොඳට වැඩේ කරනවා."

ටැමී තව අඩියක් ඉදිරියට තබද්දි මම කඩු තුඩ එයාගේ පපුවට එල්ල කළා. "පස්සට වෙනවා."

එයා දත් තියවා ගෙරෙව්වා. "අලුත් එවුන්," එයා කතා කළේ අප්පිරියාවෙන්. "මේක අපේ ඉස්කෝලෙ, අර්ධ-ලෝහිතයෝ. අපි කැමති අයව අපි කෑමට ගන්නවා!"

ඊත් එක්කම එයා වෙනස් වෙන්න පටන් ගත්තා. එයාගේ මුහුණේ සහ අත්වල පාට ටිකෙන් ටික නැති වී ගොස් හම හුණු වගේ සුදු පාටට හැරුණා. එයාගේ ඇස් මුළුමනින්ම රතු පාට වුණා. කටේ දත් තියුණු දළවලට හැරුණා.

"වැම්පයර් කෙනෙක්!" මම ගොත ගැහුවා. මගේ අවධානය එයාගේ කකුල් වෙත යොමු වුණේ ඒ වෙලාවෙයි. චියර්ලීඩර් සායට යටින් තිබුණු එයාගේ වම් කකුල දුඹුරු පාට දළ ලෝමවලින් වැසුණු බූරු කුරයක් ඇති එකක්. එයාගේ දකුණු කකුල මිනිස් කකුලක හැඩය ගත්තත්, එය සාදා තිබුණේ ලෝකඩවලින්. "අන්න්, වැම්පයර්ගේ-"

"කකුල් ගැන නම් කතා කරන්න එපා!" ටැමී සැර කළා. "ඒක විහිළුවකට ගන්න එක නරක වැඩක්!"



එයා අමුතු, නොගැළපෙන කකුල්වලින් ඉදිරියට ආවා. අතේ තියාගෙන සිටි පොම්-පොම් එක්ක එයාව සම්පූර්ණයෙන් ම විකාරයක් වගේ පෙනුණත් මට හිනාවෙන්න පුළුවන්කමක් තිබුනේ නැහැ - අර රතු පාට ඇස් දෙකයි උල් දතුයි දකිද්දි මොන හිනා ද?

"වැම්පයර් කෙනෙක් කියල ද කියන්නේ?" කෙලී හිනාවුණා. "ඒ මෝඩ ජනප්‍රවාදේ හැදිලා තියෙන්නෙ අපි නිසයි, මෝඩයෝ. අපි එම්පොසායිලා, හෙකේටිගේ සේවිකාවෝ."

"මම්ම්." ටැමී ටිකෙන් ටික මට ළං වුණා. "අඳුරු මායාවලින් අපිව හදලා තියෙන්නේ සතෙකුයි ලෝකඩයි හොල්මනකුයි එකතු කරලා! තරුණ පිරිමින්ගේ ලේ බිලයි අපි ජීවත් වෙන්නේ. දැන් එන්න, මට අර හාද්ද දෙන්න!"

එයා උල් දත් විළිස්සුවා. මට හෙලවෙන්නවත් බැරිවුණා, ඒත් රේචල් එම්පොසාගේ ඔළුවට බෙරයකින් දමා ගැසුවා.

යක්ෂණිය පිඹිමින් බෙරයට ගසා පැත්තකට දැමුවා. එය සංගීත භාණ්ඩ අතරින් හඬ නගමින් පෙරළී ගියා. රේචල් සයිලොෆෝනයකිනුත් දමා ගැසුවත් යක්ෂණිය එයටත් ගසා පැත්තකට දැමුවා.

"මම සාමාන්‍යයෙන් කෙල්ලො මරන්නෙ නැහැ," ටැමී ගෙරෙව්වා. "ඒත් ඔහේ වෙනුවෙන් මම ඒක වෙනස් කරන්නම්. ඔහේගෙ ඇස් පෙනිම හොඳ වැඩියි!"

එයා රේචල්ට පහර දෙන්න පැන්නා.

"නෑ!" මම රිප්ටයිඩ්ගෙන් කෙටුවා. ටැමී මගේ කඩු තලය මග අරින්න උත්සහ කළත්, එය කෙලින්ම එයාගේ චියර්ලීඩර් නිල ඇඳුම පසාරු කරගෙන ගියා. බිහිසුණු විලාපයක් නැගූ එයා පුපුරා යද්දි ඒ දූවිල්ලෙන් රේචල්ව නැවුණා.

රේචල් කහින්න ගත්තා. එයාව පෙනුණේ පිටි ගෝනියක් ඔළුවට හැලුණ කෙනෙක් වගෙයි. "ඊයා!"

"රාක්ෂයෝ ඔහොම කරනවා," මම කිව්වා. "කණගාටුයි."

"ඔහේ මගේ ගෝලයාව මැරුවා!" කෙලී මොර දුන්නා. "ඉස්කෝලෙ දි සාමූහිකව වැඩ කරන හැටි ඔහේට උගන්වන්න වෙනවා, අර්ධ-ලෝහිතයෝ!"

ඊට පස්සෙ එයා වෙනස් වෙන්න පටන් ගත්තා. එයාගේ කොණ්ඩය නටන ගිනි දලුවලට හැරුණා. එයාගේ ඇස් රතු පාට වෙලා, කට පුරා උල් දත් මතු වුණා. එයා මට්ටම් නැති කකුල් සංගීත කාමරයේ පොළොවේ වද්දමින් අපි ළඟට පැන පැන එන්න පටන් ගත්තා.

"මම තමයි ජෝෂ්ඨ එම්පොසා," එයා ගෙරෙව්වා. "අවුරුදු දහස් ගාණකින් මාව පරදවන්න කිසිම වීරයෙක්ට පුළුවන් වෙලා නැහැ."

"එහෙමද?" මම කිවුවා. "එහෙනම් ඔයා කල් පැනලා!"

කෙලී වැඩිට වඩා ගොඩාක් වේගවත් වුණා. මගේ පළමු පහර මග ඇරිය එයා පිත්තල අංශයට පෙරළෙද්දි ලොකු හොරණෑ පේළියක් මහ හඬින් බිමට වැටුණා. රේචල් අමාරුවෙන් එතැනින් පැන ගත්තා. මම එයා සහ එම්පොසා අතරට පැන්නා. කෙලී මගේ දෙසත්, කඩුව දෙසත් මාරුවෙන් මාරුවට බලමින් අපි වටේට කැරකුණා.

"කොච්චර ලස්සන චූටි කඩුවක් ද," එයා කිවුවා. "ඒක අපි දෙන්නා අතරේ තියෙන එක මොන තරම් ලැජ්ජාවක් ද."

එයාගේ රූපය සැලුණා - වරකට යක්ෂණියකටත්, තවත් වරකට ලස්සන චියර්ලීඩර් කෙනෙකුටත් එයා මාරු වුණා. මම මගේ හිත ඒකාග්‍රව තබාගන්න උත්සහ කළත්, ඒක ඇත්තටම හිත වියවුල් කළා.

"අසරණ පැටියා," කෙලී තනියම හිනාවුණා. "මොකටා වෙනව ද කියලා ඔයාට අදහසක්වත් නැහැ, නේද? ඉක්මනින් ම, ඔයාගේ චූටි ලස්සන කඳවුර ගිනි දලුවලින් වැහිලා යාවි, ඔයාගේ යාළුවෝ කාලයට අධිපතිගේ වහල්ලු වේවි, ඒ වගේම ඒක නවත්වන්න ඔහේට කරන්න කිසිම දෙයක් නැති වේවි. ඔහේට ඒක දකින්න සලස්වන්නෙ නැතුව දැන්ම ම ඉවරයක් කරලා දාන එක කරුණාවන්තකමක් වේවි."

ශාලාව කෙළවරෙන් මට කටහඬවල් ඇහෙන්න ගත්තා. ළමයි කණ්ඩායමක් ළං වෙමින් සිටියා. පිරිමියෙක් ලොකර් ගැන මොනවදෝ කියනවා ඇසුණා.

එම්පොසාගේ ඇස් දැල්වුණා. "තියමයි! අපිට තව තරඹන්නො ටිකක් ලැබෙන්නයි යන්නේ!"



එයා හොරණෑවක් අතට අරන් එයින් මට දමා ගැසුවා. රේචල් සහ මම පහත් වෙද්දි අපේ ඔළුවලට උඩින් විසි වූ එය ජනේලයක් කඩාගෙන ගියා. ශාලාව දෙසින් ඇසුණු කටහඬවල් එක්වරම නැවතුණා.

"පර්සි!" බොරු බයක් අඟවමින් කෙලී කෑගැසුවා. "ඇයි ඔයා ඒක විසි කළේ?"

ඊට උත්තර දෙන්න බැරි තරමට මම පුදුමයෙන් ගල් ගැසුණා. සංගීත ප්‍රස්ථාර රඳවනයක් අතට ගත් කෙලී එයින් ක්ලැරිනට් සහ නළා පේළියකට පහර දුන්නා. පුටු සහ සංගීත භාණ්ඩ බිමට ඇද වැටුණා.

"ඕක නවත්තනවා!" මම කිවුවා.

ශාලාවේ සිටි අය කඩිමුඩියේ අපේ පැත්තට එන හඬ ඇසුණා.

"අපේ අමුත්තන්ව පිළිගන්න වෙලාව ඇවිත්!" උල් දළ විලිස්සූ කෙලී දොර දෙසට දිවුවා. මම රිප්ටයිඩ් අරන් එයා පසුපස දිවුවා. එයා මිනිස්සුන්ට කරදර කරන්න කලින් මම එයාව නතර කරන්න ඕනෑ.

"පර්සි, එපා!" රේචල් කෑගැසුවා. ඒත් කෙලී කරන්න හදන දේ මම තේරුම් ගනිද්දි පරක්කු වැඩියි.

කෙලී වේගයෙන් දොර ඇරියා. පෝල් බ්ලෝෆිස් සහ අලුත් ළමයි කණ්ඩායමක් තිගැස්සී ආපස්සට පැන්නා. මම, මගේ කඩුව එසෙව්වා.

අන්තිම තත්පරයේ දි මගේ පැත්තට හැරුණු එම්පොසා පහර කන්න බයෙන් වගේ ඇකිළුණා. "අනේ එපා, කරුණාකරලා!" එයා කෑගැසුවා. මට මගේ කඩුව නවත්වා ගන්න බැරිවුණා. එය දැනටමත් පහළට යමින් තිබුණා.

දිව්‍යමය ලෝකඩ තලය එයාගේ වදින්න මොහොතකට කලින්, කෙලී පැට්‍රල් බෝම්බයක් වගේ ගිනි දලු ගොඩකට පුපුරා ගියා. රාක්ෂයෙක් එහෙම කරනවා මීට කලින් කවදාවත් මම දැකලා තිබුණේ නැති වුණත් ඒ ගැන පුදුම වෙවී ඉන්න වෙලාවක් මට තිබුණේ නැහැ. ගිනි දලු කොරිඩෝව ගිල ගනිද්දි මම සංගීත කාමරය තුළට පසු බැස්සා.

"පර්සි?" පෝල් බ්ලෝෆිස් ගිනි ගොඩෙන් එපිට සිට මගේ දිහා බලා සිටියේ පුදුමයෙන් ගල් ගැහිලා වගෙයි. "ඔයා මොනවද මේ කළේ?"

ලමයි බෙරිහන් දෙමින් ශාලාවේ අනෙක් කෙළවරට දිවුවා. ගිනි අනතුරු අඟවන සංඥා විලාප දෙන්න ගත්තා. සිවිලිමේ සවි කර තිබූ දිය ඉසිනයන් පිඹිමින් පණ ගැසුවා.

මේ කලබැගෑනි අතරේ රේචල් මගේ කමිස අතෙන් ඇද්දා. "ඔයා මෙතැනින් එළියට යන්න ඕනෑ!"

එයා හරි. මේ ඉස්කෝලෙ ඇතිවුණ ගින්නට වග කියන්න වෙන්නේ මටයි. සාමාන්‍ය මිනිස්සුන්ට මීදුම හරහා හොඳින් දැකීමේ හැකියාවක් නැහැ. එයාලට පේන්න ඇත්තේ සාක්ෂිකාරයෝ ගොඩක් ඉස්සරහා මම අසරණ චියර්ලීඩර් කෙනෙකුට පහර දුන්නා වගෙයි. සිදු වූ දේ පැහැදිලි කරන්න මට කිසිම ක්‍රමයක් නැහැ. පෝල්ට පිටුපා හැරුණු මම සංගීත කාමරයේ කැඩුණු ජනේලය [illegible] වේගයෙන් දිවුවා.

***

පටු මගෙන් නැගෙනහිර 81 වෙනි වීදියට කඩාගෙන බිදගෙන දුවපු මට ඉස්සරහට මුණ ගැහුණේ ඇනබෙත්.

"හේයි, ඔයා කලින්ම එළියට ඇවිත්!" හිනාවුණ එයා මාව පාරට වැටෙන්න නොදී මගේ උරහිස්වලින් අල්ලා ගත්තා. "පාර බලාගෙන යනවා..පාසි මොළේ."

එක තත්පරයකට එයා සතුටින්, හොඳ මුහුණුවරකින් සිටියා. එයා ජීන්ස් එකක්, තැඹිලි පාට කඳවුරු ටී-ෂර්ට් එකක් සහ එයාගේ මැටි පබළු මාලය හැඳ පැලඳගෙන සිටියා. එයාගේ තඹ පාට කොණ්ඩය පිටුපසට කර පෝනිටේලයකට ගැට ගසා තිබුණා. එයාගේ අළු පාට ඇස් බැබළුණා. එයා චිත්‍රපටියක් නරඹලා, හවස් වරුව විනෝදයෙන් ගත කරන්න සූදානමින් ඉන්න බව පෙනුණා.

[illegible] පස්සේ රාක්ෂ දූවිලිවලින් නැවුණු රේචල් එලිසබෙත් [illegible] මොර දෙමින් පටු මග තුළින් මතු වුණා. "පර්සි, ඔහොම [illegible]!"

ඇනබෙත්ගේ හිනාව දිය වී ගියා. එයා රේචල් දෙසත්, ඊට [illegible] ඉස්කෝලෙ දෙසත් ඇස් ලොකු කරගෙන බැලුවා. ඉහළ [illegible] කළු දුම සහ මොර දෙන ගිනි අනතුරු ඇඟවීම් සංඥා මුල්ම [illegible] එයාගේ සැලකිල්ලට හසු වූ බව පෙනුණා. එයා මගේ දිහා [illegible] බැලුවා. "මේ පාර ඔයා මොකක්ද කරේ? එතකොට මෙයා කවුද?"



"ඕහ්, රේචල් - ඇනබෙත්. ඇනබෙත් - මේ රේචල්. මම්, එයා යාළුවෙක්, මං හිතන්නේ."

රේචල්ව වෙන කොහොම හඳුන්වා දෙන්න ද මට හිතාගන්න බැරිවුණා. මං කියන්නේ, මම හරියට එයාව දන්නෙවත් නැති බව ඇත්ත. ඒත් ජීවිතයත්-මරණයත් අතර අවස්ථා දෙකක් එකට ගත කළාට පස්සේ එයා නිකං ම වැදගැම්මකට නැති කෙනෙක් කියලා මං කොහොමද කියන්නේ.

"හායි," රේචල් කිවුවා. ඊට පස්සේ එයා මගේ පැත්තට හැරුණා. "ඔයා පැටලුණේ ලෝක කරදරේක. ඒ වගේම ඔයා තවමත් මට කිසි දෙයක් පැහැදිලි කරලා දුන්නෙ නැහැ!"

එෆ්.ඩී.ආර්. මාවත දිගේ පොලිස් සයිරන් විලාප දෙමින් ඇදී ගියා.

"පර්සි," ඇනබෙත් සීතල හඬින් කිවුවා. "අපිට යන්න වෙනවා."

"මට අර්ධ-ලෝහිතයෝ ගැන තව විස්තර දැනගන්න ඕනෑ," රේචල් බල කරමින් කිවුවා. "ඒ වගේම රාක්ෂයෝ ගැනයි, දෙවිවරු ගැනයි." මගේ අත ඩැහැගත් එයා පර්මනන්ට් මාකර් පෑනකින් දුරකථන අංකයක් මගේ අතේ ලියුවා. "ඔයා මට කෝල් එකක් දීලා හැමදේම කියන්න ඕනෑ, හරි ද? ඔයා මට ඒක ණයයි. දැන් යන්න."

"ඒත්-"

"මං මොකක් හරි කතාවක් හදලා කියන්නම්," රේචල් කිවුවා. "ඒක සිද්ධ වුණේ ඔයාගේ වැරැද්දෙන් නෙවෙයි කියලා මම එයාලට කියන්නම්. දැන් යන්ඩ ඉතින්!"

ඇනබෙත්ව සහ මාව පාරේ දමා එයා ආපසු ඉස්කෝලෙට දිවුවා.

එක තත්පරයකට මාව කන්න වගේ මගේ දිහා බලා හිටපු ඇනබෙත්, ඊට පස්සෙ අනෙක් පැත්ත හැරිලා යන්න ගියා.

"හේයි!" මම ඇනබෙත් පසුපස දිවුවා. "අතනට එම්පොසායිලා දෙන්නෙක් ආව නේ," මම පැහැදිලි කරන්න උත්සහ කළා. "එයාලා චියර්ලීඩර්ලා, හරි ද, ඊට පස්සේ එයාලා කිවුවා කඳවුර ගිනි ගන්නලු යන්නේ, තව-"

"ඔයා මනුස්ස කෙල්ලෙක්ට අර්ධ-ලෝහිතයෝ ගැන කිව්ව ද?"

"එයාට මීදුම හරහා දකින්න පුළුවන්. මටත් කලින් රාක්ෂයින්ව දැක්කෙ එයා."

"ඉතින් ඔයා එයාට ඇත්ත කිව්වා?"

"එයා හූවර් ඩෑම් එක ළඟ හිටියේ මම කියලා අඳුනගත්තා. ඉතින්-"

"ඔයාට මීට කලිනුත් එයාව හම්බවෙලා තියෙනව ද?"

"මේ. ගිය ශීත සෘතුවෙදි. ඒත් මේ ඇත්තමයි කියන්නේ, මං එයාව හරියට දන්නෙවත් නැහැ."

"එයා ටිකක් ලස්සනයි නේ."

"මම- මම කවදාවත් ඒ ගැන හිතුවෙ නැහැ."

ඇනබෙත් යෝක් මාවත දිහාවට නොනැවතී ගියා.

"මම ඉස්කෝලෙ ගැන බලා ගන්නම්," මම කිවුවේ කතාව වෙනස් කරන්න උවමනාවෙන්. "ඇත්තටම, ඒක අවුලක් වෙන එකක් නෑ."

ඇනබෙත් මගේ දිහා බැලුවෙවත් නැහැ. "මං හිතන්නේ අපි අද කරන්න හිතන් හිටපු ඔක්කොම ඉවරයි. අපි දැන් මෙහෙන් ගියොත් හොඳයි. මොකද තව ටිකකින් පොලිසියෙන් ඔයාව හොයන්න පටන් ගනී."

අපිට පිටුපස ගුඩ් උසස් පාසලෙන් දුම් රොටු ඉහළ නැගුණා. එයින් පහළට ඇද හැළුණු අළු ගොඩවල් මැදින් මට පෙනුණේ මුහුණක් ද කියලා මම හිතුවා - මට හිනාවෙන, රතු ඇස් ඇති යක්ෂණියකගේ මුහුණක්.

*'ඔයාගේ චූටි ලස්සන කඳවුර ගිනි දළුවලින් වැහිලා යාවී,'* කෙලී කිවුවෙ එහෙමයි. *'ඔයාගේ යාළුවෝ කාලයට අධිපතිගේ වහල්ලු වේවි.'*

"ඔයා හරි," මගේ හදවත ගිලා බහිනවා වගේ දැනෙද්දි මම ඇනබෙත්ට කිවුවා. "අපි අර්ධ-ලෝහිත කඳවුරට යන්න ඕනෑ. මේ දැන්මම."

02

# මට පාතාල ලෝකයෙන් ඇමතුමක් ආවා

ලස්සන උදේ වරුවක් අංගසම්පූර්ණ කරන්න තරහෙන් පුපුරන ගෑනු ළමයෙක් එක්ක කුලී වාහනයකින් ගමනක් යනවා තරම් තවත් දෙයක් කොහෙද.

මම ඇනබෙත්ට කතා කරන්න උත්සහ කළත් එයා හැසිරුණේ හරියට මම මේ දැන් එයාගේ ආච්චිගෙ මූණ සමතලා කරා වගෙයි. මට එයාගෙන් එළියට ගන්න පුළුවන් වුණේ එයාට සැන් ෆ්‍රැන්සිස්කෝවල රාක්ෂයෝ වැහි වැහැපු වසන්තයක් ගත කරන්න ලැබුණා කියලත්; නත්තලෙන් පස්සෙ එයා දෙවතාවක් කඳවුරට ආවා කියලත් - ඒත් ඒ ඇයි කියලා නම් එයා මට කිවුවේ නැහැ (ඒකට නම් මටත් ටිකක් කේන්ති ගියා, මොකද එයා නිව්යෝක්වලට එනවා කියලවත් මට කිවුවේ නැහැනේ.); නිකෝ ඩි ආන්ජේලෝ ආගිය අතක් හොයාගන්න නැහැ කියලත් විතරයි (දිග කතාවක්).

"ලූක් ගැන ආරංචියක් නැද්ද?" මම ඇසුවා.

එයා ඔළුව හෙල්ලුවා. ඒක එයාගේ හිත පාරවන මාතෘකාවක් කියලා මම දැනගෙන හිටියා. හර්මීස් කැබිනයේ කලින් ප්‍රධාන උපදේශකයා විදිහට හිටපු ලූක් ඇනබෙත් නිතරම අගය කළ කෙනෙක්. ඒත් එයා අපිට ද්‍රෝහි වෙලා දුෂ්ට ටයිටන් රජා ක්‍රෝනොස්ට එකතු වුණා. ඇනබෙත් පිළිගන්න අකමැති වුණත්, එයා තවමත් ලූක්ට කැමති බව මම දැන සිටියා. පහුගිය ශීත සෘතුවේ ටැමල්පයිස් කඳු මුදුනේ දී අපි ලූක් එක්ක සටන් කළා, එතැන දී අඩි හතලිහක් විතර උස ප්‍රපාතයකින් වැටුණත්, කොහොමදෝ එයාගේ ජීවිතේ බේරිලා තිබුණා.

දුන්. මම දන්න තරමට, රන් මිනී පෙට්ටිය ඇතුළේ ක්‍රෝනොස්ගේ කැලි ටිකෙන් ටික ප්‍රතිසංස්කරණය වෙන අතරේ, ඔලිම්පියානු දෙවිවරුන්ට අභියෝග කරන්න තරම් එයා ශක්තිමත් වෙන තුරු කාලය මිඩංගු කරමින් ලූක් තවමත් එයාගේ රාක්ෂයෝ පිරුණු සංචාරක නැවෙන් රට වටේ සංචාරය කරනවා. උප දේව-භාෂාවෙන් නම්, අපි මේවගේ දේවල්වලට කියන්නේ 'ප්‍රශ්න' කියලා.

"තවමත් රැම් කන්දේ රාක්ෂයෝ වැහි වැහැලා," ඇනබෙත් කිව්වා. "මම ඒ පිට්ටුවකට නම් ගියේ නැහැ. ඒත් මං හිතන්නේ නැහැ ලූක් ඒක මුදලෝ ඇති කියලා. එයා ඉන්නවා නම් මට ඒක දැනගන්න ලැබෙයි කියලා මට හිතෙනවා."

ඒක අහලා මගේ හිත සැනසුනේ නම් නැහැ. "එතකොට ග්‍රෝවර්?"

"එයා කඳවුරේ," ඇනබෙත් කිව්වා. "අපිට අද එයාව මුණ ගැහෙයි."

"එයාට තාම වාසනාව පෑදිලා නැද්ද? මං කිව්වේ, එයාගේ පෑන්ව හොයන වැඩේට?"

ඇනබෙත් හිතේ කරදරේකින් ඉන්න වෙලාවට කරන විදිහට එයාගේ පබළු මාලය ඇඟිල්ලෙන් කරකවන්න ගත්තා. "ඔයා ම බලාග න්නකෝ," කියූ එයා ඊට වඩා පැහැදිලි කිරීමක් කළේ නැහැ.

අපි බෲක්ලින් දෙසට යන අතරේ මම ඇනබෙත්ගේ ජංගම දුරකථනයෙන් මගේ අම්මට කතා කළා. අර්ධ-ලෝහිතයෝ හැකි තරම් උත්සහ කරන්නේ ජංගම දුරකථන පාවිච්චියෙන් වැළකී ඉන්නයි, මොකද අපේ කටහඬවල් ගුවනේ ප්‍රචාරය කරනවා කියන්නේ හරියට ගිනි ගොඩක් ගහලා "මෙන්න මෙතන මම ඉන්නවෝ! ඉක්මනට මාව කාපියෝ!" කියලා රාක්ෂයින්ට සංඥා කරනවා වගේ වැඩක්. ඒත් මේ ඇමතුම ගොඩක් වැදගත් කියලා මම හිතුවා. අපේ ගෙදර දුරකථනයේ පණිවුඩ පටිගත වෙන යන්ත්‍රයට මම පණිවුඩයක් තැබුවා. ගුඩ්වල සිදු වූ දේ විස්තර කරන්න මම උත්සහ කළා. මට හිතෙන හැටියට මම ඒක ඒ තරම් හොඳින් කරන්න නැතුව ඇති. මම හොඳින් ඉන්නවා කියලත්, අම්මට වද වෙන්න එපා කියලත්, මේ කලබල ටිකක් නිවිලා යනකල් මම කඳවුරේ නතර වෙනවා කියලත් මම එයාට කිව්වා. පෝල් බ්ලෝෆිස්ට මගේ කණගාටුව දන්වන්න කියලත් මම අම්මාගෙන් ඉල්ලුවා.



ඊට පස්සේ අපි නිහඬව ගමන් කළා. නගරය අපිට පිටුපසින් බොඳ වී යද්දී අධිවේගී මාර්ගයෙන් පිටවුණු අපි උතුරු ලෝන්ග් අයිලන්ඩ්හි ගම්බද පෙදෙස්, පලතුරු වතු, වයින් සාදන තැන් සහ නැවුම් නිෂ්පාදන අලෙවි සැල් පසු කරමින් ඉදිරියට ඇදුණා.

රේචල් එලිසබෙත් ඩෙයාර් මගේ අතේ කුරුටු ගෑ දුරකථන අංකය දිහා මම බලා සිටියා. ඒක පිස්සුවක් බව දැන සිටියත්, එයාට කතා කරන්න මගේ හිතේ පෙලඹවීමක් ඇති වුණා. කඳවුර ගිනි ගන්නවා කියලත්, මගේ යාළුවන්ව හිර කරනවා කියලත් එම්පොසා කියූ කතාව තේරුම් ගන්න මට උදවු කරන්න සමහරවිට එයාට පුළුවන් වෙයි.

එතකොට කෙලී ගිනි දළුවලට පුපුරා ගියේ ඇයි? රාක්ෂයෝ කවදාවත් ඇත්තටම මැරෙන්නේ නැති බව මම දැන සිටියා. අන්තිමේට කවදාහරි - සමහරවිට සති දෙක තුනකින්, මාස ගාණකින්, නැත්නම් අවුරුදු ගාණකින් - පාතාල ලෝකයේ කැකෑරෙමින් පවතින ආදිකල්පික දුෂ්ට බලවේගවලින් කෙලී ප්‍රතිසංස්කරණය වේවි. ඒ කොහොම වුනත්, සාමාන්‍යයෙන් රාක්ෂයෝ ඒ තරම් ලේසියෙන් තමන්ව විනාශ කරන්න ඉඩ දෙන්නෙ නැහැ. ඒත් ඉතින් කෙලී ඇත්තටම විනාශ වුණා ද?

25ඒ මාර්ගයෙන් පිටවුණ අපේ කුලී වාහනය වම් පසින් තුස් කඳු ගැටවල මුදුන් මතු වී පෙනෙන තුරු කැලය මැදින් උතුරු වෙරළබඩ පාර දිගේ ඉදිරියට ඇදුණා. ගොවිපොළ පාරේ අර්ධ-ලෝහිත කඳු ගැටය පාමුල වාහනය නවත්වන්න ඇනබෙත් රියැදුරාට උපදෙස් දුන්නා.

රියැදුරා ඇහිබැම් අකුළා බැලුවා. "මේ හරියේ මොකවත් නැහැ නේ, මිස්. බහින්න ඕනෑ මෙතැනින් කියලා ඔයාට විශ්වාස ද?"

"ඔව්, කරුණාකරලා." ඇනබෙත් එයා අතට මනුෂ්‍ය සල්ලි රෝලක් දුන්නා, ඊට පස්සේ වාද නොකර ඉන්න රියැදුරා තීරණය කළා.

ඇනබෙත් සහ මම කඳු මුදුනට නැග්ගා. පුංචි ආරක්ෂක මකරා පයින් ගහ වටේ දරණ ගසාගෙන නිදි කිරමින් සිටියා, ඒත් අපි ළං වෙද්දි එයා තඹවන් ඔළුව ඔසවා බැලුවා. එයා ඇනබෙත්ට එයාගේ නිකට යට අතගාන්න ඉඩ දුන්නා. මකර පැටියාගේ නාහයෙන් කේතලයකින් වගේ හුමාලය පිට වුණා, එයාගේ ඇස් දෙක සතුටින් ඉලිප්පුණා.

Scanned with CamScanner

"හේයි පෙලියස්," ඇනබෙත් කතා කළා. "හැමදේම හොඳට බලාගන්නවා නේද?"

මම අන්තිම වතාවට දකිද්දි මකරා අඩි හයක් දිගටයි හිටියේ. දැන් එයා අඩු තරමේ ඒ වගේ දෙගුණයක්වත් දිගයි, ඒ වගේම ගහ තරමටම මහතයි. එයාගේ ඔළුවට උඩින්, ගහේ පහළම අත්තේ රන් බැටළු ලොම් සළුව දිලිසෙමින්, එහි මායාවෙන් කඳවුරේ මායිම් ආක්‍රමණවලින් ආරක්ෂා කළා. මකරා සන්සුන්ව හිටියේ හැම දෙයක්ම හරියාකාරව සිද්ධ වෙනවා වගෙයි. අපිට පහළින් තිබුණු අර්ධ-ලෝහිත කඳවුර සාමකාමී පෙනුමක් ගත්තා - කොළ පාට කෙත්, වනාන්තරය, සුදු පාටින් දිලිසෙන ග්‍රීක ගොඩනැගිලි. අපි 'මහ ගෙදර' නමින් හැඳින්වූ තට්ටු හතරේ ගොවි ගෙදර ස්ට්‍රෝබෙරි යායවල් මැද ආඩම්බරයෙන් නැගී සිටියා. උතුරු දෙස, වෙරළට ඔබ්බෙන් ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරය හිරු එළියෙන් දිලිසුණා.

ඒ වුණත්... එහි මොකක්දෝ වැරැද්දක් දැනුණා. පරිසරය පුරා නොයිවසුම් ගතියක් පැතිරී තිබුණේ හරියට මොකක් හෝ නරක දෙයක් සිදුවන තුරු මුළු කන්දම හුස්ම අල්ලාගෙන බලා ඉන්නවා වගෙයි.

පහළ දෙණියට ඇවිද ගිය අපිට දකින්න ලැබුණේ ගිම්හාන වාර වැඩ කටයුතු උපරිමයෙන් සිදුවන හැටියි. කඳවුරුකරුවන්ගෙන් වැඩිදෙනෙක් ගිය සිකුරාදා ම කඳවුරට ඇවිත් තිබුණා, ඒ නිසා මට දැනුණේ මම පරක්කුයි වගෙයි. සැටර්ලා ස්ට්‍රෝබෙරි කෙත්වලට වී බට නළා වාදනය කරමින්, වන ලැහැබේ මායාවලින් පැළෑටිවල වර්ධනය වේගවත් කළා. කඳවුරුකරුවෝ පෙගසිලා පිට නැගී වනාන්තරයට ඉහළින් වේගයෙන් පියාඹමින් පුහුණුවීම් කරමින් සිටියා. කම්මල්වලින් දුම් රොටු ඉහළ නැගුණා, ළමයින් කලා සහ අත්කම් පාඩම වෙනුවෙන් තම තමන්ගේ ආයුධ සාදන හඬ රැව් දුන්නා. ධාවන පථයේ ඇතීනාගේ සහ ඩිමීටර්ගේ කණ්ඩායම් කරත්ත තරඟයක නියැළී සිටියා. ග්‍රීක යුධ නැවකට නැගුණු ළමුන් පිරිසක් ඔරු පදින විලේ සිටි විශාල තැඹිලි පාට මුහුදු සර්පයෙකුට එරෙහිව සටන් කරනවා පෙනුණා. කඳවුරේ තවත් සාමාන්‍ය දවසක්.

"මට ක්ලැරිස්ට කතා කරන්න ඕනෑ," ඇනබෙත් කිවුවා.

මට ගඳ ගහන, තඩි බූට් එකක් කන්න ඕනෑ කියලා එයා කිවුවා වගේ පුදුමයෙන් මම එයා දිහා බලා සිටියා. "ඒ මොකටද?"



ඒරීස් කැබිනයේ ක්ලැරිස් කියන්නේ මට පෙන්නන්න බැරි කෙනෙක්. එයා හරිම අධම, ගුණමකු, දාමරික කෙල්ලෙක්. එයාගේ තාත්තා, යුද්ධයට අධිපති දෙවියාට මාව මරන්න ඕනෑ වුණා. බූරු හමකට තළනවා වගේ මට ගහන එක ක්ලැරිස්ගේ දින චර්යාවේ කොටසක් වුණා. ඒ දේවල් ඇරුණාම නම් එයා නියමයි.

"අපි දෙන්නා වැඩක් කරනවා," ඇනබෙත් කිවුවා. "පස්සෙ හම්බවෙමු."

"මොකක්ද වැඩේ?"

ඇනබෙත්ගේ බැල්ම කැලය දිහාවට යොමු වුණා. "ඔයා මෙහෙට ආවා කියලා මම කයිරොන්ට කියන්නම්," එයා කිවුවා. " විභාගෙට කලින් ඔයාට කතා කරන්න එයාට ඕනෑ ඇති."

"මොන විභාගෙ ද?"

ඒත් දුනු හරඹ අඩවියට යන අඩි පාර දිගේ දුවන්න ගත් එයා ආපසු හැරිලා බලන්නවත් කරදර වුනේ නැහැ.

"ඔව්," මම කෙඳිරුවා. "ඔයා එක්කත් කතා කරන්න ලැබුණට සතුටුයි."

***

කඳවුර හරහා යන අතරේ මම, මගේ යාළුවෝ කීප දෙනෙකුට 'හායි' කිවුවා. මහ ගෙදරට වාහන ගමන් කරන පාරේ හර්මීස් කැබිනයේ ට්‍රැවිස් සහ කොනර් ස්ටොල් දෙන්නා කඳවුරු වාහනයේ වයර් එකට අමුණා එය හොරෙන් පණ ගන්වන්න උත්සහ කරමින් සිටියා. ඇෆ්‍රොඩයිට් කැබිනයේ ප්‍රධාන උපදේශිකාව, සිලේනා බියුරිගාඩ් පෙගසස් කෙනෙකුගේ පිටේ යන ගමන් මට අත වැනුවා. මම ග්‍රෝවර්ව සෙවුවත් එයා පේන්න හිටියෙ නැහැ. අන්තිමේ දි මම හිත නොහොඳින් ඉන්න වෙලාවට යන තැනට - ඒ කියන්නේ කඩු හරඹ පිටියට ඉබාගාතේ ඇවිද ගියා. කඩු සටන් පුහුණු වීම නිතරම මාව සන්සුන් කළා. සමහරවිට ඒ කඩු සරඹ මට ඇත්තටම තේරුම් ගන්න පුළුවන් දේවල් කීපයෙන් එකක් නිසා වෙන්න ඇති.

පිටිය තුළට ඇවිදගෙන යද්දි තව පොඩ්ඩෙන් මගේ පපුව එතැනම නවතිනවා. සටන් බිම මැද, මට පස්ස හරවාගෙන සිටියේ මගේ ජීවිතේට දැකපු ලොකුම යම බල්ලායි.

මං අදහස් කළේ, මීට කලින් මට සෑහෙන ලොකු යම බල්ලන්ව දකින්න ලැබී තිබුණා. මට අවුරුදු දොළහේ දී රයිනෝ කෙනෙක් විතර ලොකු එකෙක් මාව මරන්නත් හැදුවා. ඒත් මේ යම බල්ලා යුධ ටැංකියකටත් වඩා ලොකුයි. කඳවුරේ මායා බැමි පසු කරගෙන ඌ කොහොම ආවා ද මට කිසිම අදහසක් තිබුනේ නැහැ. තමන්ගේ ගෙදර ඉන්නවා වගේ බඩ මත වැතිරිලා සිටි ඌ සටන් පුහුණුවට පාවිච්චි කරන පඹයෙකුගේ ඔළුව හපමින් තෘප්තිමත් හඬින් ගොරවමින් සිටියා. මාව තවමත් ඌගේ සැලකිල්ලට හසු වී තිබුනේ නැහැ, ඒත් මම පොඩි සද්දයක්වත් කළොත් ඌට මාව දැනෙන බව මට තේරුණා. උදවු ඉල්ලන්න තරම් වෙලාවක් තිබුනේ නැහැ. මම රිප්ටයිඩ එළියට අරන් එහි කොපුව ගැලෙව්වා.

"යා...හ්" මම පහර දෙන්න පැන්නා. මගේ කඩුව රාක්ෂයාගේ යෝධ පස්සට පහත් වෙද්දි කොහෙන්දෝ මතු වුණ තවත් කඩුවක් මගේ පහර අවහිර කළා.

*ක්ලෑංගේ!*

යම බල්ලාගේ කන් දෙක කෙලින් වුණා. "වූෆ්!"

ආපස්සට පැන්න මම නොසිතාම අනෙක් සටන්කරුවාට පහර දුන්නා - එයා ග්‍රීක යුධ සන්නාහයෙන් සැරසුණු, කොණ්ඩය සුදු වුණ පිරිමියෙක්. එයා කිසිම අපහසුවක් නැතිව මගේ පහර වැළැක්වූවා.

"හෝව් පොඩ්ඩක්!" එයා කිවුවා. "සටන් විරාමයක්!"

"වූෆ්!" යම බල්ලාගේ බිරුම් හඬට සටන් පිටිය දෙදුරුම් කෑවා.

"ඒකා යම බල්ලෙක්!" මම කෑගැසුවා.

"එයාගෙන් කරදරයක් වෙන්නෑ," පිරිමියා කිවුවා. "එයා තමයි මිසිස් ඕ'ලෙරි."

මම තදින් ඇසිපිය ගැසුවා. "මිසිස් ඕ'ලෙරි?"

එයාගේ නම ඇහෙද්දි යම බැල්ල ආයෙමත් බිරුවා. එයා ඉන්නේ කේන්තියෙන් නෙවෙයි කියලා මට තේරුණා. එයා හිටියේ උද්දාමයෙනුයි. එයා තෙත ගොහොදු, දරුණු ලෙස හපා දැමූ ඉලක්ක ගන්නා පඹයාව පිරිමියා වෙතට තල්ලු කළා.



"හොඳ කෙල්ල," පිරිමියා කිවුවා. සන්නාහයෙන් සැරසූ පඹයාව නිදහස් අතින් ඩැහැගත් එයා අමාරුවෙන් ඒක ඈතට විසි කළා. "ග්‍රීකයාව අල්ලන්න! ග්‍රීකයාව අල්ලන්න!"

ගොදුර හඹා ගිය මිසිස් ඕ'ලෙරි සන්නාහය සමතලා කරමින් පඹයා උඩට පැන්නා. එයා එහි යුධ හිස්වැසුම හපන්න පටන් ගත්තා.

පිරිමියා වියළි හිනාවක් පෑවා. කොටට කැපූ අළු පාට කොණ්ඩයත්, අළු පාට රැවුලත් නිසා එයාට වයස අවුරුදු පනස් ගාණක් වෙන්න ඇති කියලා මට හිතුණා. ඒ තරම් වයසක කෙනෙක් හැටියට එයා ශක්තිමත්ව සිටියා. එයා කඳු නගින්නන් අඳින කළු කලිසමකුත්, තැඹිලි පාට කඳවුරු ටී-ෂර්ට් එකකට උඩින් ලෝකඩ උර තහඩුවකුත් ඇඳගෙන සිටියා. එයාගේ බෙල්ල මුල උපන් ලපයක් හෝ පච්චයක් විය හැකි දම් පාටට හුරු පැල්ලමක් තිබුණා, ඒත් ඒක මොකක්ද කියලා මම හරියටම හඳුනා ගන්න කලින් එයා සන්නාහයේ පටි එහා මෙහා කරද්දි ඒ පැල්ලම කොලරයට යට වුණා.

"මිසිස් ඕ'ලෙරි තමයි මගේ හුරතලා," එයා පැහැදිලි කළා. "ඉතින් එයාගේ තට්ටමට කඩුවකින් අනින්න ඔයාට ඉඩ දෙන්න මට බැහැ නේ, නේද? ඒකෙන් එයා බය වෙන්න ඉඩ තිබුණා."

"ඔයා කවුද?"

"මම කඩුව පැත්තකට දැම්මොත් මාව මරන්නෙ නැහැ කියලා පොරොන්දු වෙනව ද?"

"මං හිතනවා."

කඩුව කොපුව තුළට දමාගත් එයා අතක් දිගු කළා. "මම කුයින්ටස්."

මම එයාට අතට-අත දුන්නා. එයාගේ අත වැලි කඩදාසියක් වගේ ගොරෝසුයි.

"පර්සි ජැක්සන්," මම කිවුවා. "කණගාටුයි අර- ඔයාට කොහොමද, මේ-"

"හුරතලේට ඇති කරන්න යම බල්ලෙක් ලැබුණේ ද? ඒක දිග කතාවක්, සෑහෙන වතාවක් මරණයෙන් අනූ නවයෙන් ගැලවුණු හැටියි, හපන්ඩ ගන්න යෝධ සෙල්ලම් බඩුයි ගැන කතාවක්. ඒක නෙවෙයි, මම තමයි අලුත් කඩු සරඹ උපදේශක. මිස්ටර් ඩී පිට ගිහිල්ලා ඉන්න ටිකට කයිරොන්ට උදවු කරන්න ආවා."

"ඉන්," පඹයෙකුගේ පලිහ අතත් සමගම ඉරා වෙන් කරගත් මිසිස් ඕ'ලෙරී ඒක ප්ලාස්ටික් කවපෙත්තක් වගේ සොලවන දිහා නොබලා ඉන්න උත්සහ කරමින් මම කිවුවා. "පොඩ්ඩක් ඉන්න, මිස්ටර් ඩී පිටට ගිහිල්ලා?"

"ඔව්, හොඳයි... මේක වැඩ වැඩි කාලයක් නේ. ඉතින් ඩයනයිසියස්ට පවා උදවු කරන්න යන්න වෙලා. එයා පරණ යාළුවෝ වගයක් බලන්න ගිහින්. එයාලා හරි පැත්තේ ඉන්නව ද කියලා සහතික කරගන්න. මං හිතන්නේ, මීට වඩා වැඩි දෙයක් නොකියා හිටියොත් හොඳයි."

ඩයනයිසියස් යන්න ගිහින් නම්, මට මුළු දවසට ම අහන්න ලැබුණ හොඳම ආරංචිය ඒකයි. එයා අපේ කඳවුරු අධ්‍යක්ෂක විදිහට පත්වෙලා ඇවිත් හිටියේ සීමාවෙන් පිට සිටි වන දෙවඟනක් පස්සෙන් පැන්නුවාට දඬුවමක් විදිහට සියුස් එයාව මෙහෙට එවපු නිසා විතරයි. කඳවුරුකරුවන්ට වෛර කළ එයා අපේ ජීවිත කාලකණ්ණි කරන්න නිතරම උත්සහ කළා. එයා බැරක ගිහිල්ලා නම් මේ ගිම්හානය හොඳ වෙයි. අනෙක් අතට, ටයිටන් තර්ජනයට එරෙහිව සටනට දෙවිවරු බඳවා ගන්න ඩයනයිසියස්ටත් යන්න වෙලා නම්, තත්ත්වය හිතුවට වඩා නරක අතට හැරිලා ඇති.

මගේ වම් පසින් මොකක්දෝ තදින් වදින හඬක් ඇසුණා. පැත්තක ගොඩ ගසා තිබුණු පික්නික් මේස තරම් ලොකු ලෑලි පෙට්ටි හයක් දෙදරන්න ගත්තා. ඔළුව ඇල කර බැලූ මිසිස් ඕ'ලෙරී ඒ දෙසට පිම්මේ දිවුවා.

"හෝව්, කෙල්ලේ!" කුයින්ටස් කතා කළා. "ඒවා ඔයාට නෙවෙයි." එයා ලෝකඩ පලිහ/කව පෙත්ත පෙන්වා මිසිස් ඕ'ලෙරීගේ අවධානය වෙනතකට හැරෙව්වා.

ලෑලි පෙට්ටි මහ හඬින් ගැස්සෙමින් සෙලවෙන්න ගත්තා. ඒවාගේ පැතිවල වචන මුද්‍රණය කර තිබුණත්, මගේ වචන අන්ධතාවය නිසා ඒවා කියවා තේරුම් ගන්න මට විනාඩි දෙක තුනක් ගියා: *ට්‍රිපල් ජී ගොවිපොළ.*

*බිඳෙන සුලුයි.*

*මේ පැත්ත ඉහළට.*



එහි යට පැත්තේ පුංචි අකුරුවලින් මුද්‍රණය කළ පේළි කීපයක් තිබුණා: *ප්‍රවේශමෙන් විවෘත කරන්න.*

*දේපොළ හානි, ශාරීරික හානි හෝ අතිශය වේදනාකාරී මරණ සඳහා ට්‍රිපල් ජී ගොවිපොළ වග කියනු නොලැබේ.*

"මොනවද ඒ පෙට්ටිවල තියෙන්නේ?" මම ඇසුවා.

"පොඩි පුදුම කිරීමක්," කුයින්ටස් කිවුවා. "හෙට රෑ පුහුණුවීම්වලට. ඔයාලා ඒකට ගොඩක් කැමති වෙයි."

"අහ්, හරි," මම කිවුවත්, 'අතිශය වේදනාකාරී මරණ' ගැන මට නම් එහෙම හිතුනෙ නැහැ.

කුයින්ටස් ලෝකඩ පලිහ විසි කරද්දී මිසිස් ඕ'ලෙරී එය හඹා ගියා. "ඔයාලා වගේ තරුණ ළමයින්ට තව අභියෝග දෙන්න ඕනෑ. මං පැංචා කාලේ මේ වගේ කඳවුරු තිබුනෙ නැහැ නේ."

"ඔයා- ඔයත් අර්ධ-ලෝහිතයෙක් ද?" මට පුදුම වුනු බව පෙන්වන්න ඕනෑ වුනේ නැහැ, ඒත් මීට කලින් කවදාවත් මම වයසට ගිය අර්ධ-ලෝහිතයෙක්ව දැකලා තිබුනේ නැහැ.

කුයින්ටස් තනියම හිනාවුණා. "ඔයා දන්නව ද, අපෙන් සමහරු වැඩිහිටි වයසට එනකල් පණ බේරගෙන ජීවත් වෙනවා. අපි හැමෝටම භයානක අනාවැකි නියම වෙන්නෙ නැහැ."

"ඔයා මගේ අනාවැකිය ගැන දන්නව ද?"

"මට එහෙන් මෙහෙන් අහන්න ලැබිලා තියෙනවා."

එයා 'එහෙන් මෙහෙන් ' දැනගත් දේවල් ගැන කතා කරන්න මට ඕනෑ වුණත් එතකොටම ක්ලිප්-ක්ලොප් හඬ නගමින් කයිරොන් පිටියට ආවා. "පර්සි, ඔයා ඇවිල්ලා!"

එයා එන්න ඇත්තේ දුනු හරඹ උගන්වමින් ඉඳලයි. එයාගේ '01 නරාශ්ව' ටී-ෂර්ට් එක මතින් හී කොපුවක් සහ දුන්නක් එල්ලෙමින් තිබුණා. එයා ගිම්හානය වෙනුවෙන් එයාගේ දුඹුරු පාට කැරලි කොණ්ඩය සහ රැවුල කෙටි කර තිබුණා. සුදු පාට, කප්පාදු නොකළ අශ්වයෙක් වූ එයාගේ යටි කය මඩ සහ තණකොළ කෑලිවලින් පුල්ලි වැටී තිබුණා.

"මට පේන්නෙ ඔයාට අපේ අලුත් උපදේශකව මුණ ගැහිලා වගෙයි," කයිරොන්ගේ කටහඬ සැහැල්ලු වුණත්, එයාගේ දෑස්වල තිබුණේ නොසන්සුන් බැල්මක්. "කුයින්ටස්, මම පර්සිව අරන් ගියාට කමක් නැද්ද?"

"කිසිම ප්‍රශ්නයක් නැහැ, මාස්ටර් කයිරොන්."

"මට 'මාස්ටර්' කියලා කතා කරන්න උවමනාවක් නැහැ," කයිරොන් කිවුවත්, එයාගේ කටහඬේ නම් ඒ ගැන සතුටක් තිබුණා. "එන්න, පර්සි. අපිට සාකච්ඡා කරන්න ගොඩක් දේවල් තියෙනවා."

පඹයාගේ කකුලක් කඩාගෙන හපමින් සිටි ඕ'ලෙරී දිහා මම තව එක වරක් බැලුවා.

"හොඳයි, පස්සෙ හම්බ වෙමු," මම කුයින්ටස්ට කිවුවා.

එතැනින් පිට වී යන අතරේ මම කයිරොන්ට කෙඳිරුවා, " කුයින්ටස් ටිකක්-"

"අභිරහස් කෙනෙක් නේද?" කයිරොන් යෝජනා කළා. "තේරුම් ගන්න අමාරු කෙනෙක්?"

"ඔව්."

කයිරොන් ඔළුව වැනුවා. "එයා සුදුසුකම්වලින් පිරුණ අර්ධ-ලෝහිතයෙක්. අති දක්ෂ කඩු හරඹ ශිල්පියෙක්. මං කැමතියි මට තේරුම් ගන්න පුළුවන් වුණා නම්..."

එයා කියන්න ගියේ මොකක් වුණත්, ආයෙමත් හිත වෙනස් කරගත්තා වගෙයි. "මුල් දේ මුලින්ම, පර්සි. ඔයාට එම්පොසායිලා වගයක් මුණ ගැහුණා කියලා ඇනබෙත් මට කිවුවා."

"ඔව්." ගුඩ්වල සිදු වූ සටන ගැන සහ කෙලී ගිනි දලු ගොඩකට පුපුරා යාම ගැන මම එයාට විස්තර කළා.

"මම්ම්," කයිරොන් කිවුවා. "ගොඩක් ම බලගතු අයට එහෙම කරන්න පුළුවන්. එයා මැරුනේ නැහැ, පර්සි. එයා පැහැදිලිව ම පැනලා ගිහින්. රාක්ෂණියොත් කැලඹෙන එක නම් හොඳ දෙයක් නෙවෙයි."

"එයාලා එහෙ මොනවද කරන්න ඇත්තේ?" මම ඇහුවා. "මං එනකල් බලන් ඉඳල ද?"



"ඒ වගේ," කයිරොන්ගේ ඇහිබැමි එකට හා වුණා. "ඔයා පණ බේරගත්ත එකම පුදුමයක්. එයාලගේ මායම්වලට... ඕනෑම පිරිමියෙක් අහුවෙලා, එයාලගේ ගොදුරක් වෙන්න පුළුවන්."

"තව පොඩ්ඩෙන් මටත් එහෙම වෙනවා," මම පිළිගත්තා. " රේචල් නොහිටියා නම්."

කයිරොන් ඔළුව වැනුවා. "මනුෂ්‍යයෙක් නිසා බේරෙන එක නම් විහිළුවක් වගේ, ඒ වුණත් අපි එයාට ණයයි. කඳවුරට පහර දීම ගැන එම්පොසා කියපු කතාව - ඒ ගැන අපි වැඩි දුරටත් කතා කරන්න ඕනෑ. ඒත් දැන්, එන්න, අපිට කැලෑවට යන්න තියෙනවා. ග්‍රෝවර්ට ඔයාව එතැනට ඕනෑ වෙයි."

"කොතැනට ද?"

"එයාගේ නිල විභාගයට," කයිරොන් කිවුවේ මූණ කළු කරගෙන. "එයාගේ ඉරණම තීන්දු කරන්න විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලය දැන් රැස්වෙලා ඉන්නේ."

***

අපි ඉක්මන් කරන්න ඕනෑ කියලා කයිරොන් කියූ නිසා මාව එයාගේ පිට උඩ තියාගෙන යන්න මම එයාට ඉඩ දුන්නා. අපි කැබින් පසු කරගෙන පිමමේ යද්දි මම භෝජන මණ්ඩපය දිහාවට - මුහුදට ඉහළින් කඳු ගැටයක් මත පිහිටි විවෘත මණ්ඩපය දිහාවට බැල්මක් හෙළුවා. පහුගිය ගිම්හානයෙන් පස්සේ පළවෙනි වතාවට ඒ තැන දකිද්දි යටපත් වී තිබුණු නපුරු මතකයන් ආපසු පණ ගසා මතු වෙන්න ගත්තා.

කයිරොන් වේගයෙන් කැලයට වැදුණා. අපි යන දිහා එබී බලන්න රුක් දෙවඟනෝ ගස්වලින් මෑත් වුණා. සෙවණැලි අතර විශාල රූප එහෙ මෙහෙ වුණා - ඒ කඳවුරුකරුවන්ට අභියෝග ලබා දීමට ගෙනැවිත් දැමූ රාක්ෂයෝයි.

ගිම්හාන සෘතු දෙකක් පුරාවට කොඩිය ඇල්ලීමේ තරඟ ක්‍රීඩා කළාට පස්සේ වනාන්තරය ගැන සෑහෙන හොඳින් දන්නවා කියලා මම හිතාගෙන හිටියා, ඒත් පරණ විලෝ ගස් එකට බැඳී සෑදුණු උමං තුළින්, පුංචි දිය ඇල්ලක් පසු කරමින්, කැලෑ මල් ඇතිරූ බිලෑන්කට්ටුවක් වගේ පිටියකට කයිරොන් මාව රැගෙන ගිය මංපෙත මට හඳුනා ගන්න බැරිවුණා.

එතැන සැටර්ලා රාවුවක් තණ ගොල්ලේ රවුමට වාඩි වී සිටියා. එය මැද සිටගෙන සිටි ග්‍රෝවර් රෝස පඳුරු කපා හැඩ කර සෑදූ සිංහාසනවල වාඩි වී සිටි සැහෙන වයසක, සැහෙන මහත සැටර්ලා තුන් දෙනෙකුට මුහුණ පාමින් සිටියා. ඒ නාකි සැටර්ලා තුන්දෙනාව මීට කලින් කවදාවත් දකලා තිබුනේ නැති වුණත්, ඒ විද්‍යාත වැඩිහිටියන්ගේ මණ්ඩලය විය යුතුයි කියලා මම හිතුවා.

ග්‍රෝවර් එයාලට කතාවක් කියනවා වගෙයි පෙනුණේ. එයා ටී-ෂර්ට් එකේ වාටිය අඹරමින්, කලබලෙන් කුරයකින් කුරයකට ඇගේ බර මාරු කළා. පහුගිය ශීත කාලුවේ දි හිටියට වඩා වැඩි වෙනසක් එයාගෙන් දකින්න ලැබුනේ නැහැ, සමහරවිට එයට හේතුව වෙන්න ඇත්තේ සැටර්ලා වයස්ගත වෙන්නේ මිනිස්සු වයස්ගත වෙන වේගයට වඩා බාගයක් අඩුවෙන් නිසා වෙන්න ඇති. එයාගේ මුහුණේ කුරුලෑ වැඩි වී තිබුණා. තරමක් වැඩී තිබුණු එයාගේ අං දෙක දූන් කැරලි කොණ්ඩයෙන් ඉහළට මතු වී පෙනුණා. ඒ වෙලාවේ තිගැස්සීමක් සමග මට තේරුම් ගියේ මම දැන් ග්‍රෝවර්ට වඩා උස ගිහින් ඇති බවයි.

රවුමෙන් පිට තැනක ඇනබෙත්, ක්ලැරිස් සහ මීට කලින් මම දකලා නැති ගැහැනු ළමයෙක් සිටගෙන සිටියා. කයිරොන් එයාලා ළඟින් මාව බැස්සුවා.

ක්ලැරිස්ගේ දුඹුරු පාට පොල් කෙඳි වගේ කොණ්ඩය පිටුපසට කර හමුදා මෝස්තරයේ පට ලේන්සුවකින් ගැට ගසා තිබුණා. එයා හිටියටත් වඩා තඩි වෙලා ද මන්දා. මට රැවූ එයා "මැට්ටා," කියලා කෙඳිරුවා, ඒ කියන්නේ එයා ඉන්න ඇත්තේ ඇත්තටම හොඳ මුහුණුවරකයි. සාමාන්‍යයෙන් එයා මට හෙලෝ කියන්නේ මාව මරන්න උත්සහ කරලයි.

ඇනබෙත් අනෙක් ගැහැනු ළමයා වටා අතක් දමාගෙන සිටියා. ඒ ගැහැනු ළමයා අඬලා වගෙයි පෙනුණේ. ඇම්බර් කහ පාට කොණ්ඩයක් සහ හුරුබුහුටි, එල්ෆියානු මුහුණක් තිබුණු එයා වැඩිය උස මහත නැති චූටි කෙනෙක්. කොළ පාට කයිටෝනයක් ඇඳ, ලේස් දමූ සෙරෙප්පු දෙකක් දමාගෙන සිටි එයා ලේන්සුවකින් ඇස් පිස දමමින් සිටියා. "ඒක හරිම දරුණු වේගෙනයි එන්නේ," එයා නහය ඉහළට ඇද්දා.

"නෑ, නෑ." ඇනබෙත් එයාගේ උරහිස්වලට තට්ටු කළා. "එයාට කරදරයක් වෙන්නෙ නැති වෙයි, ජුනිපර්."



මගේ දිහා බැලූ ඇනබෙත් 'ග්‍රෝවර්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ්' කියලා තොල්වලින් කිවුවා.

අඩු තරමේ, එයා කියන්න ඇත්තේ ඒක කියලා මම හිතුවා. ඒත් ඒ කතාවේ කිසිම තේරුමක් නැහැනේ. ග්‍රෝවර්ට ගෑනු ළමයෙක් ඉන්නවා? ඊට පස්සේ ජුනිපර් දිහා පරිස්සමෙන් බැලූ මට එයාගේ කන්වල ඉහළ කෙළවර යාන්තමින් උල් වී ඇති බව දකින්න ලැබුණා. එයාගේ ඇස්වල ඇඬීම නිසා මතු වූ රතු පාට ඇරෙන්න, යාන්තමින් කොළ පාටකුත් තිබුණා - හරිතප්‍රදවල පාට. එයා ගහකට අධිපති අප්සරාවියක් - රුක් දෙවඟනක්.

"මාස්ටර් අන්ඩර්වුඩ්!" ග්‍රෝවර් කියන්න උත්සහ කරමින් සිටි දේට හරස් කපමින් දකුණු පැත්තේ සිටි වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයා කෑගැහුවා. "ඔක අපි විශ්වාස කරයි කියලා ඔයා ඇත්තට ම හිතනව ද?"

"එ- ඒත් සිලෙනස්," ග්‍රෝවර් ගොත ගැහුවා. "ඒක තමයි ඇත්ත!"

තම සහායකයෝ දිහාවට හැරුණු සිලෙනස් මොනවදෝ කුටුකුටු ගෑවා. හැල්මේ ඉදිරියට ගිය කයිරොන් එයාලා පසෙකින් සිට ගත්තා. එයා වැඩිහිටි මණ්ඩලයේ ගරු තනතුරක් දරණ බව මට මතක තිබුණත් මම මීට කලින් කවදාවත් ඒ ගැන හිතලා තිබුනේ නැහැ. මණ්ඩලයේ වැඩිහිටියන්ට සිත් ගන්නාසුලු පෙනුමක් නම් තිබුනේ නැහැ. තඩි බඩ ගෙඩියි, නිදිබර පෙනුමයි, එළු කැමවලින් ඔබ්බට නොදකින දිලිසෙන ඇසුයි ඇති එයාලව දකිද්දි මට මතක් වුණේ සත්තු වත්තේ ඉන්න එළුවෝ රැළක්. ග්‍රෝවර් ඔය තරම් කලබල වෙලා ඉන්නේ ඇයි කියලා මට නම් හිතා ගන්න බැරිවුණා.

ඇඳගෙන හිටපු කහ පාට ටී-ෂර්ට් එක බඩ ගෙඩියෙන් පහළට ඇදගත් සිලෙනස් රෝස පඳුරු සිංහාසනය උඩ හරිබරි ගැසුණා. "මාස්ටර් අන්ඩර්වුඩ්, මාස හයක් තිස්සේ- මාස හයක් - වනගත දෙවියා පෑන් කතා කරනවා ඇහුණා කියලා ඔයා කියපු නින්දිත කතා අපි අහගෙන හිටියා."

"ඒත් මට ඒවා ඇහුණා නේ!"

"ලැජ්ජා නැති හැටියක් බලමුකෝ!" වම් පැත්තේ සිටි වැඩිහිටියා කිවුවා.

Scanned with CamScanner

"අනේ, මැරොන්," කයිරොන් කතා කළා. "ඉවසන්න."

"ඉවසනවා තමයි!" මැරොන් කිවුවා. "මේ මිනස්ගාත මං මගේ අං දෙකත් වැහෙන තරමට අහන් හිටියා. වනගත දේවෝත්තමයා එයාට... එයාටම කතා කරයි."

නාකි සැටර්ගේ ඇඟට පැනලා, දෙක තුනක් අනින්න වගේ ජුනිපර් බලාගෙන හිටියත් ඇනබෙත් සහ ක්ලැරිස් එයාව අල්ලා ගත්තා. "ගහගෙන වැඩක් නෑ, කෙල්ලේ," ක්ලැරිස් කෙඳිරුවා. "ඔහොම ඉන්ඩ."

මාව වඩාත්ම පුදුම කළේ කොයි එක ද මම දන්නෙ නැහැ: ක්ලැරිස් ගහගන්න යන කෙනෙක්ව නවත්වපු එක ද, නැත්නම් දෙන්නට දෙන්නා පෙනෙන්න බැරි වුණත්, ක්ලැරිස් සහ ඇනබෙත් එකතු වෙලා වැඩ කරනවා වගේ පෙනුණු එක ද.

"මාස හයක් ම," සිලෙනස් කියාගෙන ගියා, "අපි ඔයාට ඉඩ දුන්නා, මාස්ටර් අන්ඩර්වුඩ්. අපි ඔයාට සංචාරය කරන්න දුන්නා. අපි ඔයාට ඔයාගේ 'සොයන්නෙකුගේ බලපත්‍රය' තියා ගන්න ඉඩ දුන්නා. ඔයාගේ විකාර කතන්දරේ ඔප්පු කරන්න සාක්ෂියක් අරන් එනකල් අපි බලන් හිටියා. ඒ කරලත් මාස හයක් පුරා ගිය ගමන්වලින් ඔයා හොයාගෙන තියෙන්නෙ මොනවද?"

"මට තව ටික කාලයක් විතරයි ඕනෑ," ග්‍රෝවර් බැගෑපත් වුණා.

"මුකුත් නෑ!" මැද සිටි වැඩිහිටියා මොර දුන්නා. "ඔයා කිසිම දෙයක් හොයාගෙන නැහැ!"

"ඒත් ලෙනෙයස්-"

සිලෙනස් අතක් එසෙව්වා. පහළට නැමුණු කයිරොන් සැටර්ලාට මොනවදෝ කිවුවා. එයින් සැටර්ලා සතුටු වූ බවක් නම් පෙනුනේ නැහැ. එයාලා කොඳුරමින් වාද කරගත්තා, ඒත් කයිරොන් තවත් මොනවදෝ කිවුවා. ඊට පස්සේ සුසුමක් හෙළූ සෙලෙනස් අකමැත්තෙන් වුණත් ඔළුව වැනුවා.

"මාස්ටර් අන්ඩර්වුඩ්," සිලෙනස් නිවේදනය කළා. "අපි ඔයාට තව එක අවස්ථාවක් දෙනවා."

ග්‍රෝවර් පිබිදුණා. "ගොඩාරියක් ස්තුතියි!"

"තව එක සතියක්!"



"මොකක්? ඒත් සර්! ඒක කරන්න පුළුවන් වැඩක් නෙවෙයි නේ!"

"තව එක සතියයි, මාස්ටර් අන්ඩර්වුඩ්. ඒ වෙද්දිත් ඔයාට ඔයාගේ කතාව ඔප්පු කරගන්න බැරි නම්, වෙන රස්සාවක් හොයාගන්න බැලුවොත් හොඳයි. ඔයාගේ ඔය රඟපෑමේ හැකියාවන්වලට ගැළපෙන දෙයක්. බාගදා, රූකඩ නැටවිල්ල වගේ. එහෙම නැත්නම් ටැප් නැටුම්."

"ඒත් සර්, මට- මට මගේ බලපත්‍රය නැති කරගන්න බැහැ. මගේ මුළු ජීවිතේ ම-"

"මේ වැඩිහිටි මණ්ඩලයේ රැස්වීම දැනට කල් දමනවා," සිලෙනස් කිවුවා. "එතකොට දැන්, අපි අපේ දවල් කෑම ගමු!"

නාකි සැටර් අත්පුඩි ගසද්දි අප්සරාවියෝ පොකුරක් එළවළු, පලතුරු, ටින් කෑන් සහ තවත් එළු කෑම ජාති පිරවූ බන්දේසි අරන් ගස්වලින් පිටතට දිය වී ආවා. රවුමට වාඩි වී සිටි සැටර්ලා වහාම කෑම බන්දේසි ආක්‍රමණය කරන්න ගත්තා. ග්‍රෝවර් ලෝකෙම එපා වෙලා වගේ අපේ දිහාවට ආවා. එයා හැඳ සිටි පාට මැකුණු නිල් පාට ටී-ෂර්ට් එකේ සැටර් කෙනෙකුගේ පින්තූරයක් තිබුණා.

"හායි, පර්සි," එයා කිවුවත්, එයා කොයි තරම් කඩා වැටිලා හිටියා ද කියනවා නම් මට අත දෙන්නවත් එයා උනන්දු වුනේ නැහැ. "ඒක හොඳට ගියා ද, හහ්?"

"අර නාකි එළුවෝ!" ජුනිපර් කිවුවා. "අනේ, ග්‍රෝවර්, ඔයා කොච්චර මහන්සි වෙලා උත්සහ කළා ද කියලා එයාලා දන්නෙ නැහැ නේ!"

"මෙකට තව ක්‍රමයක් තියෙනවා," ක්ලැරිස් තරහෙන් කිවුවා.

"නෑ. නෑ." ජුනිපර් ඔළුව හෙල්ලුවා. "ග්‍රෝවර්, ඒක කරන්න මම ඔයාට ඉඩ දෙන්නෑ."

එයාගේ මූණ අළු පාටට හැරුණා. "මට- මට ඒ ගැන හිතලා බලන්න වෙනවා. ඒත් කොහේ හොයන්න ද කියලවත් අපි දන්නෙ නැහැ නේ."

"ඔයාලා මොනවා ගැන ද කතා කරන්නේ?" මම ඇසුවා.

දුර ඈතින් හක් ගෙඩියක් නාද දුන්නා.

ඇනබෙත් තොල් තදින් පියවා ගත්තා. "මම ඔයාට පස්සෙ කියන්නම්, පර්සි. දැන් අපි අපේ කැබින්වලට ගියොත් හොඳයි. සෝදිසිය පටන් ගන්නයි යන්නේ."

* * *

කඳවුරට පය ගැසූ හැටියේ ම කැබින් සෝදිසි කිරීමකට මුහුණ දෙන්න වෙන එක අසාධාරණයි වගේ පෙනුණත්, වැඩ සිද්ධ වුණේ ඒ පිළිවෙළටයි. හැම හවස් වරුවක ම ජ්‍යෙෂ්ඨ උපදේශකයින්ගෙන් කෙනෙක් පැපිරස් පිරික්සුම් ලැයිස්තු පත්‍රිකාවකුත් අරගෙන රවුමක් යනවා. එහිදී තේරෙන හොඳම කැබිනයට නෑම සඳහා පළවෙනි පැය ලැබෙනවා. ඒ කියන්නේ උණු වතුර සහතිකයි. නරකම කැබිනයට ඊ නෑමෙන් පස්සේ මුළුතැන්ගෙයි වැඩ කරන්න සිද්ධ වෙනවා.

මට තිබුණු ප්‍රශ්නය වුණේ: සාමාන්‍යයෙන් පොසෙයිඩන් කැබිනයේ සිටි එකම කෙනා මම වීමයි. ඒ වගේම ඇත්තටම මම ඒ තරම් පිරිසිදුවට පිළිවෙළට වැඩ කරන කෙනෙක් නෙවෙයි. පිරිසිදු කරන හාර්පිලා ආවේ ගිම්හානයේ අන්තිම දවසේ විතරයි, ඒ නිසා මගේ කැබිනය ශීත සෘතු නිවාඩුවේ දි මම දාලා ගියපු විදිහටම ඇති: මම කාපු චොකලට්වල දවටනයි, චිප්ස් මලුයි තවමත් මගේ ඇඳ උඩ ඇති. කොඩිය ඇල්ලීමේ තරඟයට මම ඇඳපු යුධ සන්නාහයේ කෑලි කැබිනයේ තැන තැන ඇති.

මැද මිදුලක් වටේට ඉංග්‍රීසි හෝඩියේ යූ අකුරේ හැඩයට කැබින් දොළහ - එක ඔලිම්පියානු දෙවියෙකුට එක බැගින් - පිහිටා තිබුණු පොදු අංගනයට මම දිවුවා. ඩිමීටර් ළමයි එයාලගේ කැබිනය අතුගාමින්, ජනේල අසල තබා ඇති පෙට්ටිවල අලුත් මල් වැවෙන්න සලස්වමින් ඉන්නවා පෙනුණා. කැබිනයේ දොරකඩට ඉහළින් මල් පිරුණු හනීසක්ල් වැලක් වවන්නත්, වහලය වැහෙන්න ඩේසි වවන්නත් එයාලට කරන්න තිබුණේ අසුරක් ගහන එක විතරයි. ඒක නම් සම්පූර්ණයෙන් ම අසාධාරණයි. එයාලා සෝදිසියේ දි කිසිම දවසක අන්තිම තැන අරන් නැතුව ඇති. හර්මීස් කැබිනයේ කට්ටිය දවල් තරු පෙනිලා වටේ දුවමින්, කිලුටු රෙදි ඇඳන් යට හංගමින්, එකිනෙකාට දොස් කියා ගනිමින් සිටියා. වස කම්මැලියෝ වුණත් එයාලත් මට වඩා ඉදිරියෙන් හිටියා.

අනෙක් පැත්තේ ඇෆ්‍රොඩයිට් කැබිනයේ සිට සිලේනා බියුරිගා‍ඩ් පිරික්සුම් ලැයිස්තුවත් අරන් එළියට එනවා මට පෙනුණා. මම



කට යටින් දෙස් දෙවොල් තැබුවා. සිලේනා හොඳයි තමයි, ඒත් එයා පිරිසිදුකම, පිළිවෙළ ගැන ඉහළින් ම සලකන කෙනෙක්, ඒ කියන්නේ නරකම පරීක්ෂකයෙක්. හැම දෙයක්ම ලස්සනට තියෙනවාට එයා ආසයි. මම කවදාවත් කිසිම දෙයක් 'ලස්සනට' කරලා නැහැ. අද රෑට පිඟන් අතුල්ලනවා මතක් වෙද්දි මගේ අත් ඉබේම බර වෙනවා වගේ මට දැනුණා.

පොසෙයිඩන්ගේ කැබිනය පිහිටා තිබුණේ මැද මිදුලේ දකුණු පසින් වූ 'පිරිමි දෙවිවරුන්ගේ' කැබින් පේළියේ අන්තිමටයි. ඒක සිප්පි කටු කාවැදුණු අළු පාට මුහුදු ගල්වලින් සෑදූ, බංකරයක් වගේ උසින් අඩු, දිග ගොඩනැගිල්ලක් වුණත් එහි මුහුදට මුහුණ ලා ජනේල තිබුණු නිසා ඒ හරහා හමා ආ නුළඟෙන් කැබිනය නිතරම පිරී තිබුණා.

හර්මීස් කට්ටිය කළා වගේ ඔක්කොම-ඇඳ-අස්සට පිරිසිදු කිරීමක් ඉක්මනින් කරන්න පුළුවන් වෙයි ද හිතමින් කැබිනය තුළට වේගයෙන් දිවූ මට දකින්න ලැබුණේ මගේ අර්ධ සහෝදරයා ටයිසන් බිම අතුගාන හැටියි.

"පර්සි!" එයා මොර දුන්නා. කොස්ස බිම දමූ එයා මගේ ළඟට දුවගෙන ආවා. මීට කලින් කවදාවත් මල් මල් වැටුණු ඒප්‍රනයකුයි රබර් අත්වැසුම් දෙකකුයි දමාගත් සතුටින් ඉපිලෙන සයික්ලොප්ස් කෙනෙක් ඔයාගේ ඇඟට පැනලා නැත්නම්, මම කියන්නේ, ඒකෙන් ඔයාගේ රතු එළි පත්තු වෙන්න ගනියි.

"හේයි, ලොකු යාළුවා!" මම කිවුවා. "ඌයි, බලාගෙන ඉළ ඇට. ඉළ ඇට."

වලහෙක් ඇඟට වැටුණා වගේ එයාගේ වැලඳ ගැනීමෙන් කොහොම හරි පණ බේරගන්න මට පුළුවන් වුණා. මාව බිමින් තියපු එයා පිස්සුවෙන් වගේ හිනා වෙද්දි, එයාගේ දුඹුරු පාට, වනු පැටියෙකුගේ වගේ තනි ඇහැ සතුටින් දිලිසුණා. එයාගේ බොල්ලෑ දත් ටික තවමත් කහ පාටයි, එයාගේ කොණ්ඩය මී කූඩුවක් වගෙයි. එයා කඩතොලු වූ ලොකුම ලොකු කලිසමකුත්, මල් වැටුණු ඒප්‍රනයට යටින් කඩමාලු වුණ ෆ්ලැනල් කමිසයකුත් ඇඳ සිටියා වුණත් අද දවසට මට දකින්න ලැබුණු හොඳම දේ එයායි. එයාව මට අවුරුද්දකින් විතර දකින්න ලැබී නොතිබුණේ එයා සයික්ලොප්ස් කම්මල්වල වැඩ කරන්න මුහුදු පතුලට ගිය නිසයි.

"ඔයා හොඳින් ද?" එයා ඇහුවා. "රාක්ෂයෝ ඔයාව කෑවෙ නැද්ද?"

"චුට්ටක්වත් නැහැ." තවමත් අත් කකුල් හතරම තියෙන බව මම ටයිසන්ට පෙන්නුවා ම එයා සතුටින් අත්පුඩි ගැසුවා.

"යේ..යි!" එයා කිවුවා. "දැන් අපිට පීනට් බටර් සැන්ඩ්විච් කන්නයි මාළු පෝනියෝ පදින්නයි පුළුවන්! අපිට රාක්ෂයෝ එක්ක සටන් කරන්නත් පුළුවන්. තව ඇනබෙත් එක්ක ඒවා ඩෝං! ගාලා පුපුරවනවා බලන්නත් පුළුවන්!"

මේ ඔක්කොම එක පාර කරන්න එයා අදහස් කරන්න නැතුව ඇති කියලා මම බලාපොරොත්තු වුණා. ඒත් ඇත්තටම අපිට මේ ගිම්හානයේ ගොඩක් විනෝද වෙන්න පුළුවන් කියලා මම එයාට කිවුවා. එයා හැම දෙයක් ගැනම කොයි තරම් උද්යෝගිමත් ද කියනවා නම්, මටත් හිනා නොවී ඉන්න බැරි වුණා.

"ඒත් ඉස්සෙල්ලම," මම කිවුවා. "අපිට සෝදිසියට ලැස්ති වෙන්න වෙනවා. අපි දැන්...."

ඒ වෙලාවේ කැබිනය වටේට බැල්මක් හෙළූ මට ටයිසන් සෑහෙන කාර්යබහුලව සිට ඇති බව දකින්න ලැබුණා. බිම අතු ගාලා. ඇඳත් සකසලා. කෙළවරක තිබුණු ලුණු දිය උල්පත කොරල් දිලිසෙන තුරු අතුල්ලලා. මුහුදු ඇනිමනි සහ සාගර පතුලෙන් ගෙනා දිලිසෙන පැළෑටි වර්ගයක් දමූ වතුර පිරවූ බඳුන්වලින් ටයිසන් ජනෙල් පඩි සරසා තිබුණා. ඩිම්ටර් ළමයි මවන මල් පොකුරු හැමෙකකටම වඩා ඒවා ලස්සන වුණා.

"ටයිසන්, කැබින් එක.... මාර ලස්සනයි!"

එයා සතුටින් පිම්බුණා. "දැක්ක ද අර මාළු පෝනියෝ? මම එයාලව සිවිලිමේ එල්ලුවා!"

ලෝකඩවලින් තැනූ පුංචි හිපොකැම්පියෝ පොකුරක් සිවිලිමේ රැහැන්වල එල්ලා තිබුණේ උන් වාතය හරහා පිහිනනවා වගේ පෙනෙන්නයි. එයාගේ යෝධ අත්වලින් මේ තරම් සියුමැලි දේවල් නිර්මාණය කරන්න ටයිසන්ට පුළුවන් කියලා මට විශ්වාස කරන්නත් බැරිවුණා. ඊට පස්සේ මගේ ඇඳ දිහා බැලූ මට දකින්න ලැබුණේ ඇඳට ඉහළින් බිත්තියේ එල්ලා තිබුණු මගේ පරණ පලිහයි.

"ඔයා ඒක හදලා!"



පතුර‍්‍ිය ගීත සාතුවේ මැන්ටිකෝරයෙකුගේ පහර දීමකින් ඒ පලිහ බරපතළලෙස පලුදු වෙලයි තිබුණේ. ඒත් දැන් ඒක අංගසම්පූර්ණව තිබුණා - අඩු තරමේ සීරීමක්වත් නැහැ. එහි තිබුණු ටයිසන් සහ ඇනබෙත් සමග රාක්ෂ සයුරට මම ගිය වීර චාරිකාවේ රූප දිලිසෙන තුරු ඔප දමා තිබුණා.

මම ටයිසන් දිහා බැලුවා. එයාට කොහොම ස්තුති කරන්න ද මම දැන සිටියේ නැහැ.

"ඔහ්, මගෙ දෙයියනේ." මට පිටුපසින් කවුදෝ කිවුවා.

පිරික්සුම් ලැයිස්තුව අතේ තබාගෙන සිලේනා බියුරිගාඩ් දොරකඩ සිටගෙන සිටියා. කැබිනය තුළට අඩිය තැබූ එයා ඉක්මනින් රවුමක් කැරකී, ඇහි බැම ඔසවා මගේ දිහා බැලුවා. "හොඳයි, මගේ හිතේ පොඩි දෙගිඩියාවක් නම් තිබුණා. ඒත් ඔයා හොඳට පිරිසිදු කරලා තියෙනවා, පර්සි. මං ඒක මතක තියාගන්නම්කෝ."

මට ඇහැක් ගැසූ එයා කාමරයෙන් පිට වුණා.

***

ටයිසනුයි මමයි ඉතිරි හවස් වරුව ආගිය තොරතුරු කතා කරමින්, වටපිටේ ඇවිදිමින් කාලය ගත කළා. රාක්ෂ ඩියර්ලීඩර්ලා එක්ක සටන් කරන්න සිද්ධ වුණු උදේ වරුවකට පස්සේ ඒක සෑහෙන හොඳ දෙයක් වුණා.

කම්මල වෙත ගිය අපි හෙෆාස්ටස් කැබිනයේ බෙකන්ඩෝර්ෆ්ට ලෝහ වැඩවලට උදවු කළා. ටයිසන් මායා ආයුධ හදන්න ඉගෙන ගත් විදිහ අපිට පෙන්නුවා. එයා රත් වී දිලිසෙන තල දෙකේ යුධ කෙටේරියක් කොයි තරම් ඉක්මනින් නිර්මාණය කළා ද කියනවා නම් බෙකන්ඩොර්ෆ් පවා විස්මයට පත් වුණා.

වැඩ කරන අතරේ ම ටයිසන් මුහුද යට ගත කළ අවුරුද්ද ගැන අපිට කිවුවා. සයික්ලොප්ස් කම්මල් ගැන සහ පොසෙයිඩන්ගේ මාලිගාව ගැන විස්තර කරද්දි එයාගේ ඇස් දැල්වුණා, ඒත් එහෙ කොයි තරම් ආතතියක් තිබුණා ද කියලත් එයා අපිට කිවුවා. ටයිටන්වරුන්ගේ යුගයේ දි මුහුද පාලනය කළ පරණ මුහුදු දෙවිවරු අපේ තාත්තට විරුද්ධව යුධ වදින්න පටන් ගෙන තිබුණා. ටයිසන් එහෙන් පිට වී එද්දි මුළු අත්ලාන්තික් සාගරය පුරාම යුද්ධය පැතිරී යමින් තිබුණාලු. ඒ කතාව අහද්දි මට කලබලකාරී බවක් දැනුණේ හරියට මමත් උදවු

කරන්න යන්න ඕනෑ වගෙයි, ඒත් තාත්තාව උවමනා අපි දෙන්නම කඳවුරේ ඉන්නවා දකින්න කියලා ටයිසන් මාව අස්වැසුවා.

"තව, නරක මිනිස්සු ගොඩකුත් මුහුද උඩ ඉන්නවා," ටයිසන් කිව්වා. "එයාලව ඩෝං! ගාලා පුපුරවන්න අපිට පුළුවන්."

කම්මලෙන් පස්සෙ අපි ටික වෙලාවක් ඇනබෙත් සමග මරු පදින විල ළඟ ගත කළා. ටයිසන්ව දැකලා එයා ගොඩක් සතුටු වුණා, ඒත් එයා හිටියේ කලබලෙන් බව මට තේරුණා. ඇනබෙත්ගේ ඇස් දිගින් දිගටම වනාන්තරය පැත්තට දිවුවේ හරියට එයා වැඩිහිටි මණ්ඩලය සමග ග්‍රෝවර්ට තිබුණු ප්‍රශ්නය ගැන කල්පනා කරනවා වගෙයි. එයාට දොස් කියන්නත් බැහැ. ග්‍රෝවර් පේන්න හිටියේ නැහැ. මට ග්‍රෝවර් පව් කියලා හිතුණා. එයාගේ ජීවිතේ එකම ඉලක්කය වෙලා තිබුණේ අතුරුදහන් වූ දෙවියා පෑන්ව හොයා ගැනීමයි. එයාගේ තාත්තා සහ මාමාත් ඒ හීනය ලුහුබැඳ ගිහින් අතුරුදහන් වී තිබුණා. පහුගිය ශීත කාලයේ දී ග්‍රෝවර්ට, එයාගේ ඔළුව ඇතුළෙන් කටහඬක් ඇසී තිබුණා: *'මම නුඹව බලාපොරොත්තු වෙනවා'* - ඒ කටහඬ පෑන්ගේ කියලා එයාට හොඳටෝම විශ්වාස වුණා - ඒත් දැන් පෙනෙන්න තිබුණු විදිහට එයාගේ ගවේෂණයෙන් කිසිම පලක් වෙලා නැහැ වගෙයි. මේ වෙලාවේ මණ්ඩලයෙන් එයාගේ 'සොයන්නෙකුගේ බලපත්‍රය' ගත්තොත් එයාට පිස්සු හැදෙයි.

"මොකක්ද අර 'අනිත් ක්‍රමය'?" මම ඇනබෙත්ගෙන් ඇසුවා. "අර ක්ලැරිස් කිව්වේ?"

ගලක් අහුලා ගත් එයා ඒක විල හරහා විසි කළා. "ක්ලැරිස් හොයාගත්ත දෙයක්. මේ වසන්ත කාලේ මමත් එයාට ටිකක් උදවු කළා. ඒත් ඒක ගොඩක් අනතුරුදායක වෙයි. විශේෂයෙන් ම ග්‍රෝවර්ට."

"එළු කොල්ලා මාව බය කරනවා," ටයිසන් මිමිණුවා.

මම එයා දිහා පුදුමයෙන් බැලුවා. ටයිසන් ගිනි පිඹින ගොන්නු, මුහුදු රාක්ෂයෝ වගේම මිනී කන යෝධයින්ටත් මුණ දීලා තියෙනවා නේ. "ඇයි ඔයා ග්‍රෝවර්ට බය වෙන්නේ?"

"අං දෙකයි කුරයි නිසා," ටයිසන් බයෙන් වගේ කෙඳිරුවා. "තව එළු මවිල්වලට මගේ නහයත් කසනවා."

ඒ කතාවෙන් අපේ ග්‍රෝවර් ගැන සාකච්ඡාව එතැනින්ම නැවතුණා.



***

රෑ කෑමට කලින් ටයිසනුයි මමයි කඩු හරඹ පිටියට ගියා. කුයින්ටස් අපි ගියාට ගොඩක් සතුටු වුනා. ලී පෙට්ටි තුළ තියෙන්නේ මොනවාද කියලා තවමත් එයා මට කිවුවේ නැති වුණත්, එයා මට කඩු වලන කීපයක් ඉගැන්වූවා. එයා ගොඩක් දක්ෂයි. එයා සටන් කළේ සමහරු චෙස් අදිනවා වගෙයි - හරියට එයා චලනයන් ඔක්කොම එකවර කරනවා වගෙයි, එතකොට එයා අන්තිම පහරත් දීලා කඩු තුඩ ඔයාගේ බෙල්ලට තද කරනකල් ම එයා සටන් කරන රටාව හොයාගන්න ඔයාට බැරි වෙනවා.

"හොඳ උත්සහයක්," එයා මට කිවුවා. "ඒත් ඔයාගේ ආවරණය කිරීම් නම් හොඳටම මදි."

එයා පහර දෙද්දි මම එය හරස් කළා.

"ඔයා ඉස්සර ඉඳල ම කඩු සටන් ශිල්පියෙක් ද?" මම ඇසුවා.

එයාගේ හිස් මුදුනට මම දුන් පහර එයා මග ඇරියා. "මම ගොඩක් දේවල් කරලා තියෙනවා."

එයා වෙර දමා අනිද්දි මම පසෙකට පැන්නා. එයාගේ උර පටිය පහළට ලිස්සා වැටෙද්දි එයාගේ බෙල්ලේ තිබුණු අර සලකුණ - දම් පාට පැල්ලම මට දකින්න ලැබුණා. ඒකට පැහැදිලි හැඩයක් තිබුණා - තටු අකුළාගත් වටුවෙක් වගේ කුරුල්ලෙක්.

"මොකක්ද ඔයාගේ බෙල්ලෙ තියෙන්නේ?" මම ඇසුවා. සමහරවිට ඒක අශිෂ්ට ප්‍රශ්නයක් වෙන්න ඇති, ඒත් ඒකට ඔයාට මගේ ඒ.ඩී.එච්.ඩී.වලට දොස් කියන්න පුළුවන්. ඒ නිසා හිතන්නෙ බලන්නෙ නැතිව දොඩවන පුරුද්දක් මට තිබුණා.

කුයින්ටස්ට එයාගේ රිද්මය නැති වුණා. මම එයාගේ කඩු මිටට ගසා කඩුව අතින් බිමට වැට්ටුවා.

එයා ඇඟිලි අතුල්ලා ගත්තා. ඊට පස්සෙ එයා යුධ සන්නාහය එහෙ මෙහෙ කර සලකුණ වසා ගත්තා. එය පච්චයක් නොවෙන බව මට තේරුම් ගියා. ඒක පරණ පිළිස්සුම් කැළැලක්... හරියට එයාව හංවඩු ගහලා වගෙයි.

"ඒක මතක් කරදීමක්," කඩුව අහුලා ගත් එයා හිනාවක් බලෙන් මතු කරගත්තා. "දැන්, අපි ආයෙමත් කරමු ද?"

මට තව දුරටත් ප්‍රශ්න ඇසීමට ඉඩ නොතබා එයා තදින් පහර දුන්නා.

එයයි මමයි සටන් කරන අතරේ ටයිසන මිසිස් ඕ'ලෙරි එක්ක සෙල්ලම් කළා. එයා උාට කතා කළේ 'ලූටි ඩොගී' කියලයි. ලෝකඩ පලිහට පොර කමින්, ග්‍රීකයාව අල්ලන සෙල්ලම කරමින් ඒ දෙන්නා ගොඩක් විනෝද වුණා. ඉර බහින වෙලාව වෙද්දිත් කුයින්ටස්ට එක දාඩිය බිංදුවක්වත් දාලා තිබුනේ නැහැ. ඒක නම් ටිකක් අමුතු දෙයක් වුණා; ඒත් ටයිසනුයි මමයි හිටියේ දාඩියෙන් නැවිලා. ඉතින් අපි දෙන්නා නාගෙන රෑ කෑමට යන්න ලෑස්ති වුණා.

මගේ හිතට සතුටක් දනෙමින් තිබුණා. ඒක කඳවුරේ සාමාන්‍ය දවසක් වගේමයි. ටිකකින් රෑ කෑම වෙලාව ආවා. කඳවුරුකරුවෝ හැමෝම කැබින්වලින් පිටත පෝලිමක් සෑදී භෝජන මණ්ඩපයට ගමනේ ගියා. ශාලාවට ඇතුළු වෙන තැන කිරි ගරුඬ පොළොවේ තිබූ වැසුණු පැළුම - ගිය ගිම්හානයේ එතැන නොතිබුණු අඩි දහයක් දිග ඉරි තැළුම බොහෝ දෙනෙක් නොසලකා හැරියත්, ඒ මත අඩිය නොතියන්න මම පරිස්සම් වුණා.

"ලොකු පලුද්දක්," අපි අපේ මේසයට වාඩි වුණාට පස්සේ ටයිසන් කිවුවා. "භූමිකම්පාවක් ද?"

"නෑ," මම කිවුවා. "භූමිකම්පාවක් නෙවෙයි."

එයාට ඒ ගැන කියන්න ඕනෑ ද මට විශ්වාසයක් තිබුනේ නැහැ. ඒක ඇනබෙත්, ග්‍රෝවර් සහ මම විතරක් දන සිටි රහසක්. ඒත් ටයිසන්ගේ ලොකු ඇහැ දිහා බලද්දි, ඒක එයාගෙන් හංගන්න මට බැරි බව තේරුණා.

"නිකෝ ඩි ආන්ජෙලෝ," මම කිවුවේ මගේ කටහඬ පහත හෙළමින්. "එයා තමයි ගිය සීතල කාලේ අපි කඳවුරට අරන් ආව අර්ධ-ලෝහිත ළමයා. එයා, අන්... එයා මට කිවුවා ගවේෂණයක දි එයාගේ අක්කව බලාගන්න කියලා. ඒත් මට ඒක හරියට කරන්න බැරිවුණා. එයාගේ අක්කා මැරුණා. දැන් ඒ ළමයා මට දොස් කියනවා."

ටයිසන්ගේ ඇහිබැම් එකට හා වුණා. "ඉතින් ඒකට එයා පොළොව පැළුවා ද?"

"ඇටකෝට්ටෝ වගයක් අපිව මරන්න ආවා," මම කිවුවා. "නිකෝ උන්ව එළෙව්වා. එතකොට පොළොව නිකංම ඇරිලා උන්ව



ගිලගත්තා. නිකෝ..." මම වටපිට බැලුවේ වෙන කවුරුහරි අපේ කතාවට ඇහුම්කන් නොදෙන බව සහතික කරගන්නයි. "නිකෝ කියන්නේ හේඩීස්ගෙ පුතෙක්."

ටයිසන් කල්පනාබරව ඔළුව වැනුවා. "මැරිච්ච මිනිස්සුන්ගේ දෙයියෝ."

"ඔව්."

"එතකොට දැන් නිකෝ කොල්ලා යන්න ගිහිල්ල ද?"

"මං- මං හිතනවා. වසන්ත කාලේ එයාව හොයාගන්න මම උත්සහ කළා. ඇනබෙතුත් එහෙම කළා. ඒත් වාසනාව අපේ පැත්තට වැඩ කළේ නැහැ. මේක රහසක්, හරි ද, ටයිසන්? එයා හේඩීස්ගේ පුතෙක් කියලා වෙන කවුරු හරි දැනගත්තොත්, එයාට කරදරයක් වෙන්න පුළුවන්. ඔයාට මේක කයිරොන්ටවත් කියන්න බැහැ."

"අර නරක අනාවැකිය," ටයිසන් කිවුවා. "ටයිටන්ලා දැනගත්තොත් එයාව පාවිච්චි කරන්න ඉඩ තියෙනවා."

මම එයා දිහා බලා සිටියේ පුදුමයෙන්. ඇගෙන් ලොකු, පොඩි දරුවෙක් වගේ කෙනෙක් වුණත් ටයිසන්ට සෑහෙන්න මොළේ තියෙනවා කියලා සමහර වෙලාවට නිකං ම අමතක වෙලා යනවා.

ලොකු තුන්කට්ටුවේ - ඒ කියන්නේ සියුස්, පොසෙයිඩන් හෝ හේඩීස්ගේ ඊළඟට අවුරුදු දහසය ලබන දරුවා ඔලිම්පස් බේරා ගන්නා හෝ විනාශ කරනා කෙනා වෙන බව කියවුණු අනාවැකිය ගැන එයා දැන සිටියා. ගොඩක් අය හිතාගෙන හිටියේ එයින් කියවෙන ළමයා මම කියලයි, ඒ වුණත් මම අවුරුදු දහසය ලබන්න කලින් මැරුණොත්, අනාවැකිය ලේසියෙන්ම නිකෝට අදාළ වෙනවා.

"අන්න හරි," මම කිවුවා. "ඉතින්-"

"කට වහගෙන ඉන්නවා," ටයිසන් පොරොන්දු වුණා. "හරියට අර පොළොවේ මතු වුණ වළ වැහුණා වගේ."

***

එදා රෑ මට නිදා ගන්න අමාරු වුණා. මම ඇඳේ වැතිරිලා වෙරළට රළ ගහන හඬටත්, වනාන්තරයේ බකමූණෝ සහ රාක්ෂයින් කෑගසන හඬටත් කන් දිගෙන සිටියා. නින්දට වැටුනොත් නපුරු හීන පෙනේවි හිතලා මම හිටියේ බයෙන්.

මේකනේ වැඩේ. අර්ධ-ලෝහිතයින්ට හීන කියන්නේ නිකං ම හීන විතරක් නෙවෙයි. ඒවාගෙන් අපිට පණිවුඩ ලැබෙනවා. අපේ යාළුවන්ට හෝ හතුරන්ට වෙන දේවල් අපිට යාන්තමින් දකින්න ලැබෙනවා. සමහර වෙලාවට අපිට අතීතය හෝ අනාගය පවා යන්තමින් දකගන්න ලැබෙනවා. කඳවුරේ දි මට මේ වගේ හීන වඩාත් පැහැදිලිව සහ නිතරම පෙනෙනවා.

ඉතින් ඒ මැදියම කිට්ටු වෙද්දිත් අවදියෙන් සිටි මම, මගේ ඇඳට ඉහළින් ඇති ඇඳේ මෙට්ටය දිහා බලාගෙන ඉන්නකොට කාමරයේ අමුතු එළියක් පැතිරී ඇති බව එක්වරම මට තේරුම් ගියා. ලුණු දිය උල්පත දිලිසෙමින් තිබුණා.

පොරවනය පසෙකට තල්ලු කළ මම පරිස්සමෙන් ඒ දිහාවට ගියා. උණුසුම් ලුණු වතුරෙන් හුමාලය ඉහළ නැග්ගා. එළියේ තිබුණු හඳ එළිය ඇර කාමරය තුළ වෙන කිසිම එළියක් නැති වුණත් හුමාලය හරහා දේදුනු පාට දිලිසෙමින් තිබුණා. හුමාලය තුළින් ප්‍රිය මනාප ගැහැනු කටහඬක් ඇසුණා: *කරුණාකර එක ඩ්‍රැච්මාවක් තැන්පත් කරන්න.*

මම ආපසු හැරී ටයිසන් දිහා බැලුවා. ඒත් එයා තවමත් ගොරවමින් සිටියා. එයා නිදා ගන්නේ සිහිය නැති කරපු අලියෙක් වගෙයි.

මොනවා හිතන්න ද කියලවත් මට තේරුනේ නැහැ. මීට කලින් කවදාවත් මට අයිරිස්-පණිවුඩයක් ඇවිත් තිබුනේ නැහැ. උල්පත පතුලේ එක රන් ඩ්‍රැච්මාවක් දිලිසෙමින් තිබුණා. එය අහුලාගත් මම මීදුම හරහා විසි කළා. කාසිය අතුරුදහන් වුණා.

"ඕ, අයිරිස්, දේදුන්නට අධිපති දේවතාවියනි," මම හීන් හඬින් කිවුවා. "මට පෙන්වන්න... අ්, ඔයාට පෙන්වන්න තියෙන දෙයක් මට පෙන්වන්න."

මීදුම තළියමින් දිලිසුණා. ගඟක අඳුරු ඉවුරක් මට පේන්න ගත්තා. කළු පාට වතුර මතින් ගන මීදුම් කැරලි පාවී ගියා. වෙරළ පුරා රළු යමහල් පාෂාණ විසිරී තිබුණා. පොඩි කොල්ලෙක් ගං ඉවුරේ උක්කුටියෙන් වාඩි වී ගිනිමැලයක් අවුළවමින් සිටියා. එහි ගිනි දලු අස්වාභාවික නිල් පාටකින් දැල්වුණා. ඒත් එක්කම මට පිරිමි ළමයාගේ මුහුණ දකින්න ලැබුණා. ඒ නිකෝ ඩි ආන්ජෙලෝ. එයා සිටියේ කඩදාසි කෑලි ගින්නට විසි කරමින් - ඒ ගිය ගීත සාතුවේ එයා පිස්සු වැටිලා හිටපු මිතොමැජික් කාඩ්.



නිකෝට තවම අවුරුදු දහයයි, සමහරවිට මේ වෙද්දි එකොළහ ලබලා ඇති. ඒත් එයාට ඊට වඩා ලොකු පෙනුමක් තිබුණා. එයාගේ කොණ්ඩය දිගට වැවිලා. අපිළිවෙළට තිබුණු එය උරහිස්වල ගෑවෙන-නොගෑවෙන තරමට ම දිගු වුණා. එයාගේ ඔලිව් පාට හම සුදුමැලි වෙලා. එයා ඉරුණු කළු කලිසමක් සහ එයාට වඩා සෑහෙන ලොකු, දිරා ගිය ජැකට්ටුවක් කළු කමිසයකට උඩින් ඇඳ සිටියා. එයාගේ මූණ කුණු වැකිලා, ඇස්වලට අඩබ්බර බැල්මක් එකතු වී තිබුණා. එයාට තිබුණේ පාරවල්වල ජීවත් වුණු කොලු ගැටයෙකුගේ පෙනුමක්.

එයා මගේ දිහා බලන තුරු මම බලා සිටියා. එයා කේන්තියෙන් පිස්සු වැටිලා, එයාගේ අක්කට මැරෙන්න ඇරියා කියලා බනින් පටන් ගන්න බවට මට කිසිම සැකයක් තිබුනේ නැහැ. ඒත් මාව එයාගේ සැලකිල්ලට හසු වූ බවක් පෙනුනේ නැහැ.

මම හෙලවෙන්නවත් එඩිතර නොවී, නිහඬව බලා සිටියා. අයිරිස්-පණිවුඩය එවුවේ එයා නෙවෙයි නම්, කවුද?

නිකෝ තවත් කාඩ් එකක් නිල් ගිනි දලු මැද්දට විසි කළා. "කිසිම වැඩකට නෑ," එයා කෙඳිරුවා. "මම මේවට කැමති වෙලා හිටියා කියලා මටම විශ්වාස කරන්න බැහැ."

"පොඩි එවුන්ට හරියන සෙල්ලමක්, ස්වාමීනී," තවත් කටහඬක් එයාගේ කතාවට එකඟ වුණා. ඒ හඬ ගිනි ගොඩ අසලින් එන බව පෙනුණත්, මට කතා කරන කෙනාව දකගන්න බැරිවුණා.

නිකෝගේ බැල්ම ගඟ හරහා දිව ගියා. ඈතින් තිබුණු එහා ඉවුරේ කළු පාට වෙරළ තුනී මීදුමකින් වැසී තිබුණා. මම එතැන හඳුනා ගත්තා: ඒ පාතාල ලෝකයයි. නිකෝ කඳවුරු ගසාගෙන සිටියේ ස්ටයික්ස් ගං ඉවුරේයි.

"මම වැඩ වරද්ද ගත්තා," එයා කෙඳිරුවා. "එයාව ආපහු අරන් එන්න වෙන කිසිම ක්‍රමයක් නැහැ."

අනෙක් කටහඬ නිහඬව සිටියා.

නිකෝ ඒ දෙසට සැක සහිතව හැරුණා. "ක්‍රමයක් තියෙනවා ද? කතා කරනවා."

මොකක්දෝ සැලුණා. මම හිතුවේ ඒ ගිනිමැලයේ එළිය කියලයි. ඒත් ඒක මිනිස් රුවක් බව ටිකකින් මට තේරුම් ගියා - නිල් පාට දුම් රොදක්, හෙවණැල්ලක් ඒ දිහා එක එල්ලේ බැලුවොත්,

Scanned with CamScanner

එයාව දකගන්න බැහැ. හැබැයි ඇස් කොණකින් බලද්දි එයාගේ හැඩය දකගන්න පුළුවන් වුණා. ඒ අවතාරයක්.

"ඒක කවදාවත් කරලා නැහැ." අවතාරය කිවුවා. "ඒත් සමහරවිට නව ක්‍රමයක් තියෙන්න පුළුවන්."

"මට කියන්න." නිකෝ නියෝග කළා. එයාගේ ඇස් හැඩ පරූෂ එළියකින් දිලිසුනා.

"හුවමාරුවක්," අවතාරය කිවුවා. "ආත්මයක් වෙනුවට ආත්මයක්."

"මම ඒකට ඉදිරිපත් වුණා නේ!"

"ඔයාගේ ආත්මය නෙවෙයි." අවතාරය කිවුවා. "අන්තිමේ දි කොහොමත් ඔයාගෙ තාත්තට එකතු කරගන්න ලැබෙන ආත්මයක් පූද කරලා වැඩක් නැහැ. ඒ වගේම තමන්ගේම පුතා මැරෙනවා දකින්නත් එයාට කිසිම හදිස්සියක් නැතුව ඇති. මං අදහස් කළේ දැනටමත් මළවුන් අතරට එකතු වෙලා සිටිය යුතු ආත්මයක්. මරණයට වංචා කළ කෙනෙකුගේ ආත්මයක්."

නිකෝගේ මූණ අඳුරු වුණා. "මය කතාව ආයෙමත් පටන් ගන්නෙපා. ඔයා කතා කරන්නේ මිනී මැරුමක් ගැන."

"මං කතා කරන්නේ යුක්තිය ගැන." අවතාරය කිවුවා. "පළිග ැනීම ගැන."

"ඒ දෙක එකක් නෙවෙයි."

අවතාරය වියළි ලෙස හිනාවුණා. "ලොකු වෙද්දි ඔයා අනෙක් පැත්තට ඉගෙන ගනී."

නිකෝ ගින්න දිහා බලා සිටියා. "අඩු තරමේ එයාව කැඳවන්නවත් මට බැරි ඇයි? මට එයාට කතා කරන්න ඕනෑ. එයා... එයා මට උදවු කරයි."

"මම ඔයාට උදවු කරන්නම්." අවතාරය පොරොන්දු වුණා. "මම ඔයාව කී වතාවක් බේරගෙන තියෙනව ද? මම වංගගිරිය හරහා ඔයාව පාර පෙන්නලා, ඔයාට ඔයාගේ බලයන් පාවිච්චි කරන හැටි ඉගැන්නුවේ නැද්ද? ඔයාට ඔයාගේ අක්කා වෙනුවෙන් පළිගන්න ඕනෑ ද, නැද්ද?"



අවතාරය කතා කළ විලාසයට මම කැමති වුනේ නැහැ. එයා මට සිහිපත් කළේ විද්‍යාගාරයේ බඩු හොරකම් කරන්න, ගුරුවරුන්ගේ කාර්වලට හානි කරන්න වගේ මෝඩ වැඩ කරන්න අනෙක් ළමයින්ව පෙලඹෙවූ මගේ පරණ ඉස්කෝලෙ හිටපු දාමරික ළමයෙක්වයි. ඒ දාමරික ළමයා කිසිම දවසක කරදරවලට පැටලුනේ නැති වුණත්, එයා නිසා ළමයි ටොන් ගාණකට ඉස්කෝලෙ තහනම් වුණා.

අවතාරයට මුහුණ නොපෙනෙන්න නිකෝ ගිනිමැලයෙන් ඉවතට හැරුණා. ඒත් මට එයාගේ මූණ දකගන්න පුළුවන් වුණා. කඳුළු බිඳුවක් එයාගේ මූණ පහළට පාර සොයා ඇදී ගියා. "හරි එහෙනම්. ඔයා ළඟ සැලසුමක් තියෙනව ද?"

"ඔව්, ඔව්." අවතාරය කිවුවේ සතුටට පත් වූ හඬින්. "අපිට යන්න අඳුරු පාරවල් ගොඩක් තියෙනවා. අපි පටන් ගන්න ඕනෑ-"

රූපය සැලෙන්න ගත්තා. නිකෝ නොපෙනී ගියා. මීදුම හරහා ඇසුණු ගැහැනු කටහඬ: *නවීන් විනාඩි පහක කාලයක් ලබා ගැනීම සඳහා කරුණාකර ඒක ඩ්‍රැක්මාවක් තැන්පත් කරන්න.* කිවුවා.

මගේ අත් කලිසම් සාක්කු සොයා ඇදී ගියත් මම සැරසී සිටියේ පිජාමාවකිනුයි. මම මාරු කාසි හොයන්න ඇඳ අසල මේසය වෙත දිවුවා. ඒත් ඊට කලින් අයිරිස්-පණිවුඩය නිවී ගොස් කාමරය නැවතත් අඳුරින් පිරුණා. සම්බන්ධතාවය බිඳී ගිහින්.

මම කැබිනය මැද සිටගෙන ලුණු දිය උල්පතේ ගොරගොර හඬටත්, පිටත මුහුදු රළවල හඬටත් කන් දුන්නා.

නිකෝ තවම පණපිටින්. එයා, එයාගේ අක්කව මළවුන් අතරින් ආපසු අරන් එන්න උත්සහ කරනවා. ඒ වගේම එයාට හුවමාරු කරන්න උවමනා ආත්මය කාගේ ද කියලා මම දන්න බව මට හැඟුණා - මරණයට වංචා කළ කෙනෙක්. පළිගැනීමක්.

නිකෝ ඩි ආන්ජේලෝ මාව හොයාගෙන එයි.

## 03

# අපි ගෝනුස්සන් සමග සෙල්ලම් කළා

ඊළඟ උදෑසන කෑම වෙලාවේ ලොකු කලබලයක් ඇති වුණා.

පෙනෙන්න තිබුණු හැටියට එදා පාන්දර තුනට විතර ඉතියෝපියානු ඩ්‍රැකනයෙක් කඳවුරු සීමාව ළඟ දකින්න ලැබිලා. මම කොයි තරම් විඩාබරව සිටියා ද කියනවා නම් මේ ඝෝෂාව මැද්දේ ම මම හොඳට නිදා ගත්තා. මායා බැමි රාක්ෂයාට ඇතුළට එන්න නොදී රඳවාගෙන තිබුණා. ඒත් අපේ රැකවල්වල දුර්වල තැනක් සොයමින්, කඳු ගැට අතරේ සෙවිල්ලෙන් ඇවිදිමින් හිටපු ඌ ඇපලෝ කැබිනයේ ලී ෆ්ලෙචර් සහ එයාගේ සහෝදරයෝ දෙන්නෙක් එළවන්න යන තුරුම ආපසු යන්න උනන්දු වෙලා නැහැ. ඩ්‍රැකන්ගේ ඇගේ ආරක්ෂක වැස්මේ ඇති චූටි විවරවලට ඊතල දුසිම් දෙක තුනක් බැස්සුවාට පස්සේ අපි දෙන්න උත්සහ කළ පණිවුඩය තේරුම් ගත් ඌ පහු බැහැලා.

"ඌ තවමත් එළියේ කොහේ හරි ඉන්නවා," නිවේදන දෙන වෙලාවේ ලී අපිට අනතුරු ඇඟෙව්වා. "ඌගේ පස්ස පැත්තට ඊතල විස්සක් විතර අමුණලා අපි කරේ ඌව තවත් අවුස්සපු එක විතරයි. ඒකා අඩි තිහක් විතර දිගයි. දිලිසෙන කොළ පාටයි. ඌගේ ඇස්-" එයා වෙව්ලුවා.

"ඔයා නියමෙට වැඩේ කළා, ලී," කයිරොන් එයාගේ උරහිසට තට්ටුවක් දැම්මා. "හැමදෙනාම විපරමෙන් ඉන්න, හැබැයි කලබල නොවී ඉන්න. මේ වගේ දේවල් මීට කලිනුත් වෙලා තියෙනවා."



"අන්න හරි," ප්‍රධාන මේසයේ සිටි කුයින්ටස් කිව්වා. "ඒ වගේම මේක ආයෙමත් සිද්ධ වේවි. නිතර නිතර ම වගේ."

කඳවුරුකරුවෝ අතරේ මුණුමුණුවක් පැතිරුණා.

හැම දෙනාටම කටකතා ආරංචි වෙලා තිබුණා. ලූක් සහ එයාගේ රාක්ෂ හමුදාව කඳවුර ආක්‍රමණය කරන්න සැලසුම් කරනවාලු. මේ ගිම්හානයේ ඒක සිද්ධ වේවි කියලා අපි වැඩි දෙනෙක් අපේක්ෂා කළත්, ඒ කොහොමද, කවදා ද කියලා කිසිවෙක් දන සිටියේ නැහැ. අපේ පිරිසත් එන්න එන්නම අඩු වෙමින් තිබුණා. අපිට හිටියේ කඳවුරුකරුවෝ අසූ ගාණක් විතරයි. මීට අවුරුදු තුනකට කලින් මම මුලින් ම කඳවුරට ආව කාලේ කඳවුරුකරුවෝ සියයකටත් වඩා සිටියා. එයින් සමහරු මිය ගිහින්. සමහරු ලූක්ට එකතු වෙලා. තවත් සමහරු නිකං ම අතුරුදහන් වෙලා.

"අලුත් යුධ ක්‍රීඩා පටන් ගන්න මේක හොඳ හේතුවක්," කුයින්ටස් කියාගෙන යද්දි එයාගේ ඇස් දිලිසුණා. "ඔයාලා ඒක කොහොම කරයි ද කියලා අද රෑට අපි බලමු."

"ඔව්..." කයිරොන් කිව්වා. "හොඳයි, නිවේදන හොඳටම ඇති. දැන් අපි මේ කෑම වේලට ආශිර්වාද කරලා ඒවාගේ රස බලමු." එයා කුසලානය ඉහළට එසවුවා. "දෙවිවරු වෙනුවෙන්."

අපි හැමෝම අපේ වීදුරු ඉහළට ඔසවා ආශිර්වාදය නැවත කිව්වා.

ටයිසනුයි මමයි අපේ පිඟන් ලෝකඩ ගිනි උඳුන ළඟට අරන් ගිහින් අපේ කෑමවලින් කොටසක් ගින්නට දැම්මා. වියළි මිදි දැමූ කර කළ පාන් සහ ෆ්‍රාට් ලූප්ස්වලට දෙවිවරු කැමති ඇති කියලා මම බලාපොරොත්තු වුණා.

"පොසෙයිඩන්," කියූ මම ඊට පස්සේ රහසින් කෙඳිරුවා, "නිකෝගෙයි, ලූක්ගෙයි, ග්‍රෝවර්ගෙයි ප්‍රශ්නවල දි මට උදවු කරන්න..."

මුළු උදේ වරුවම එතැනට වෙලා හිටගෙන ඉන්න තරම් කරදර මට තිබුණා වුණත් මම ආපසු මේසයට ගියා.

හැමෝම කන්න පටන් ගත්තට පස්සේ කයිරොන් සහ ග්‍රෝවර් අපි සිටි තැනට ආවා. ග්‍රෝවර්ගේ ඇස් ඉදිමිලා තිබුණා. එයා කමිසය ඇඳගෙන සිටියෙත් කණපිටටයි. මේසය උඩට පිඟාන අත ඇරිය එයා මගේ ළඟට ඇද වැටුණා.

ටයිසන් අපහසුවෙන් ඇඹරුණා. "මම ගිහිල්ලා... ම්ම්... මගේ මාළු පෝනියෝ පොලිෂ් කරන්නම්."

බාගෙට කෑව උදේ කෑම වේල එතැන ම දමා එයා එතැනින් මාරු වුණා.

කයිරොන් හිනාවෙන්න උත්සහ කළා. සමහරවිට එයාට ඕනෑ වෙන්න ඇත්තේ අපිව සනසවන්නයි, ඒත් නරාශ්ව වෙසින් සිටි එයා මට උඩින් සිටගෙන සිටිද්දි එයාගේ හෙවණැල්ලෙන් මුළු මේසය ම වැසී ගියා. "හොඳයි, පර්සි, හොඳට නින්ද ගියා ද?"

"අහ්, හොඳයි," එයා එහෙම ඇහුවේ ඇයි හිතලා මම පුදුම වුණා. මට ලැබුණු අද්භූත අයිරිස්-පණිවුඩය ගැන එයා මොනවා හරි දන්නවා ඇති ද?

"මම ග්‍රෝවර්වත් එක්ක ආවා," කයිරොන් කිවුවා. "මොකද මට හිතුණා බාගදා ඕය දෙන්නට, අහ්, කතාබහ කරන්න දේවල් ඇති කියලා. දැන් ඔයාලා මට සමාව දෙන්න ඕනෑ, මට අයිරිස්-මැසේජ් වගයක් යවන්න යන්න තියෙනවා. මං දවල් වෙලා ඔයාලව මුණ ගැහෙන්නම්." ග්‍රෝවර්ට අරුත්බර බැල්මක් හෙළූ එයා මණ්ඩපයෙන් ඉවතට හැල්මේ දිවුවා.

"මොනවද එයා කිවුවේ?" මම ග්‍රෝවර්ගෙන් ඇසුවා.

ග්‍රෝවර් එයාගේ බිත්තර කන්න ගත්තා. එයා ඉන්නේ කලබලෙන් කියලා මට තේරුණේ එයා ගැරුප්පුවේ තුඩුත් එක්කම හපන්න ගත් නිසයි. "එයාට ඕනෑ ඔයා ලවා මට ඒත්තු ගන්වන්න." එයා කෙඳිරුවා.

බංකුවේ මට එහා පැත්තෙන් තව කවුදෝ වාඩි වුණාඃ ඇනබෙත්.

"මේ කතාව මොකක් ගැන ද කියලා මම ඔයාට කියන්නම්," එයා කිවුවා. "වංගගිරිය."

එයා කියමින් සිටි දේට අවධානය යොමු කරන්න මට අපහසු වුණේ භෝජන මණ්ඩපයේ සිටි අනෙක් හැමෝම හොරෙන් අපි දිහාට එබිකම් කරමින් මොනවදෝ කොඳුරන්න ගත් නිසයි. ඒ වගේම ඇනබෙත් මගේ ළඟින් වාඩි වී සිටි නිසයි. මං අදහස් කළේ හරියටම මගේ ළඟින්.

"ඔයාට මෙතැන ඉන්න බැහැ," මම කිවුවා.



"අපි කතා කරන්න ඕනෑ," එයා ස්ථිර ලෙස කිවුවා.

"ඒත් නීති..."

කඳවුරුකරුවන්ට මේසවලින් මාරු වෙන්න අවසර නැහැ කියලා මටත් වඩා හොඳින් එයා දැන සිටියා. සැටර්ලාට ඒක අදාළ වුනේ නැහැ. එයාලා ඇත්තටම උප දෙවිවරු නෙවෙයි නේ. ඒත් අර්ධ-ලෝහිතයන්ට එයාලගේ කැබිනයේ අය සමග වාඩි වීම අනිවාර්ය වුණා. මේස මාරු කළා ම ලැබෙන දඬුවම මොකක්ද කියලවත් මම දැනගෙන හිටියේ නැහැ. මොකද එහෙම දෙයක් වෙනවා මම කවදාවත් දැකලා තිබුනේ නැහැ. බැරි වෙලාවත් මිස්ටර් ඩී මෙතැන හිටියා නම්, එයා මිදි වැලකින් ඇනබෙත්ගේ බෙල්ල හිර කරන්නවත් ඉඩ තිබුණා, ඒත් මිස්ටර් ඩී මෙතැන හිටියේ නැහැ නේ. කයිරොන් දැනටමත් මණ්ඩපයෙන් පිටව ගොස් තිබුණා. අපි දිහා බැලූ කුයින්ටස් ඇහිබැමක් එසවූවත්, කිසිවක් කිවුවේ නැහැ.

"බලන්න," ඇනබෙත් කිවුවා, "ග්‍රෝවර් කරදරේක වැටිලා ඉන්නේ. එයාට උදවු කරන්න අපිට තියෙන්නෙ එක ක්‍රමයක් විතරයි. ඒක තමයි වංගගිරිය. ඒක තමයි ක්ලැරිසුයි මමයි සෝදිසි කරමින් හිටියේ."

මම පැහැදිලිව හිතන්න උත්සහ කරමින් වාඩි වී සිටි තැනින් එහා මෙහා වුණා. "ඔයා කියන්නේ ඉස්සර කාලේ මිනටෝර්ව දාලා තිබුණ අවුල් ජාලය ගැන ද?"

"අන්න හරි," ඇනබෙත් කිවුවා.

"ඒ කියන්නේ... ඒක තව දුරටත් තියෙන්නේ ක්‍රීට්වල රජතුමාගේ මාලිගාව යටින් නෙවෙයි," මම අනුමාන කළා. "මේ වංගගිරිය ඇත්තේ ඇමරිකාවේ මොකක් හරි බිල්ඩිමකට යටින්."

දැක්කා නේ? මේ දේවල් තේරුම් ගන්න මට ගියේ අවුරුදු දෙක තුනක් විතරයි. බටහිර ශිෂ්ටාචාරයත් සමග වැදගත් ස්ථානත් ගමන් කරන බව මම දැන සිටියා, හරියට ඔලිම්පස් කන්ද එම්පයර් ස්ටේට් ගොඩනැගිල්ලට උඩින් තියෙනවා වගේ, පාතාල ලෝකයේ දොරටුව ලොස් ඇන්ජලීස්වල තියෙනවා වගේ. මට මං ගැන හරි ආඩම්බර හිතුණා.

Scanned with CamScanner

ඇනබෙත් ඇස් හැරනුවා. "බිල්ඩිමකට යටින්? අයියෝ, පර්සි. වංගගිරිය කියන්නේ සද්දන්ත දෙයක්. ඒක තනි බිල්ඩිමක් යට තියා, තනි ටවුමක් යටවත් තියන්න බැහැ."

ස්ටයින්ස් ගඟ අද්දර තිකෝ ඉන්නවා දැකපු දසුන මගේ මතකයට ආවා. "එතකොට... මේ වංගගිරියත් පාතාල ලෝකෙම කොටසක් ද?"

"නෑ." ඇනබෙත්ගේ නළල රැළි වුණා. "හොඳයි. සමහරවිට වංගගිරියෙන් පාතාල ලෝකෙට යන පාරවල් තියෙන්න පුළුවන්. මට ඒ ගැන සහතික නැහැ. ඒත් පාතාල ලෝකෙ තියෙන්නේ ගොඩක්, ගොඩාරියක් පහළින්. වංගගිරිය තියෙන්නේ සාමාන්‍ය ලෝකයේ මතුපිටත් එක්කම වගේ යටින්. ඒක හරියට පොළොවේ දෙවෙනි හමක් වගේ. ඒක අවුරුදු දාස් ගාණක් තිස්සේ බටහිර නගරවලට යටින්, හැම දෙයක්ම පොළොව යටින් එකිනෙකට සම්බන්ධ කරමින් වර්ධනය වෙමින් තියෙනවා. වංගගිරිය හරහා ඔයාට ඕනෑම තැනකට යන්න පුළුවන්."

"ඔයා අතරමං වුනේ නැත්නම්," ග්‍රෝවර් කෙඳිරුවා. "ඒ වගේම භයානක මරණයකට මුහුණ දෙන්න වුනේ නැත්නම්."

"ග්‍රෝවර්, ඒකට ක්‍රමයක් තියෙන්න ම ඕනෑ," ඇනබෙත් කිවුවා. ඒ දෙන්නා අතරේ මේ කතාව මීට කලිනුත් ඇති වෙලා තියෙන බව මට තේරුණා. "ක්ලැරිස් පණ බේරගත්තා."

"යාන්තමෙන්!" ග්‍රෝවර් කිවුවා. "එතකොට අනිත් කොල්ලා-"

"එයාගේ සිහිය අවුල් වුණා විතරයි. එයා මැරුණේ නැහේ."

"ඔහ්, කොච්චර ෂෝක් ද," ග්‍රෝවර්ගේ යටි තොල සැලුණා. "ඒකෙන් මගේ හිතට ලොකු සහනයක් දැනෙනවා."

"හෝව්," මම කිවුවා. "ඔහොම ඉන්න. මොකක්ද මේ ක්ලැරිස්ගෙයි පිස්සු හැදුණ කොල්ලෙක්ගෙයි කතාව?"

ඇනබෙත් ඊරිස් මේසය දිහාවට බැල්මක් හෙළුවා. ක්ලැරිස් අපි දිහා බලා සිටියේ අපි කතා කරන්නේ මොනවා ගැන ද කියලා එයා දන්නවා වගෙයි. ඒත් ඊට පස්සේ එයා, එයාගේ කෑම පිඟානට ඇස් හරවා ගත්තා.

"ගිය අවුරුද්දේ," ඇනබෙත් කිවුවේ කටහඬ පහත හෙළමින්. "ක්ලැරිස් කයිරොන් වෙනුවෙන් මෙහෙයුමකට ගියා."



"මට මතකයි," මම කිවුවා. "ඒක රහසක්."

ඇනබෙත් ඔළුව වැනුවා. දැන් එයා කොයි තරම් බැරෑරුම් ලෙස හැසිරෙමින් සිටියා වුණත්, එයා තව දුරටත් මාත් එක්ක තරහෙන් නොසිටීම ගැන මම සතුටු වුණා. එයා මගේ ළඟින් වාඩි වෙන්න කඳවුරේ නීති කැඩුව එකටත් මම කැමති වුණා. "ඒක රහසක් විදිහට තමයි තිබුණේ," ඇනබෙත් එකඟ වුණා. "මොකද එයා ක්‍රිස් රොඩ්‍රිග ස්ව හොයාගත්තා."

"හර්මීස් කැබින් එකේ හිටපු කෙනා?" අවුරුදු දෙකකට කලින් සිදු වූ එයා සම්බන්ධ සිදුවීමක් මට මතක් වුණා. ලූක්ගේ නැව, ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ දි අපි ක්‍රිස් රොඩ්‍රිගස්ගේ කතාවකට හොරෙන් කන් දුන්නා. එයාත් කඳවුර අතහැර ටයිටන් හමුදාවට එකතු වූ අර්ධ-ලෝහිතයින්ගෙන් කෙනෙක්.

"ඔව්," ඇනබෙත් කිවුවා. "ගිය ගිම්හානේ ඇරිසෝනා පළාතේ ෆීනික්ස්වල තියෙන ක්ලැරිස්ගේ අම්මගේ ගෙදර ළඟින් එයා නිකං ම මතු වෙලා තිබුණා."

"එයා නිකං ම මතු වෙලා කිවුවේ?"

"එයා සම්පූර්ණ ග්‍රීක යුධ සන්නාහයක් ඇඳගෙන, නූලක් ගැන දොඩව දොඩවා, අර ගිනි ගහන අව්වේ කාන්තාරේ වටේ ඉබාගාතේ ඇවිද ඇවිද ඉඳලා."

"නූලක්," මම කිවුවා.

"එයා ඉඳලා තියෙන්නේ සම්පූර්ණයෙන් ම මොළේ අවුල් වෙලා. මිනිස්සු එයාව අල්ලගෙන මානසික රෝහලකට දාන්න කලින් ක්ලැරිස් එයාව ගෙදරට අරන් ගිහින්. ක්ලැරිස් එයාව සනීප කරන්න උත්සහ කරලා. කයිරොන් ගිහින් එයාගෙන් ප්‍රශ්න කරලා, ඒත් ඒකෙන් වැඩි වැඩක් වෙලා නැහැ. එයාලට එයාගෙන් දැනගන්න ලැබිලා තිබුණ එකම දේ තමයි: ලූක්ගේ මිනිස්සු වංගගිරිය ගවේෂණය කරනවා කියන කාරණය."

මම වෙවුලා ගියත්, එයට හේතුවක් මටම තේරුනේ නැහැ. අසරණ ක්‍රිස්... එයා ඉස්සර නරක කොල්ලෙක් නෙවෙයි. එයාව පිස්සු වට්ටන්න ඇත්තේ මොකක් වෙන්න ඇති ද? ගෑරුප්පුවේ ඉතිරි ටිකත් හපමින් සිටි ග්‍රෝවර් දිහා මම බැලුවා.

"හරි." මම ඇහුවා. "ඇයි එයාලා වංගගිරිය ගවේෂණය කරන්නේ?"

"අපිටත් ඒ ගැන විශ්වාසයක් තිබුණේ නැහැ." ඇනබෙත් කිවුවා. "ඒ නිසා තමයි ක්ලැරිස් ඔත්තු බලන්න ගියේ. කවුරුවත් බයවෙලා කුලප්පු වෙනවා දකින්න ඕනෑ නැති නිසා කයිරොන් මේ දේවල් යටපත් කරගෙන තියාගත්තා. එයා මාව මේකට සම්බන්ධ කරගත්තේ... හොඳයි, වංගගිරිය කියන්නේ මං කැමති ම විෂයන්ගෙන් එකක් නිසා. ඒකෙ වාස්තු විද්‍යාව-" එයා දවල් හීන බලන්න පටන් ගත්තා. "ඒක හදපු කෙනා, ඩෙඩලස් කියන්නේ ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක්. ඒත් වැදගත් ම කාරණේ තමයි, වංගගිරියට හැම තැනින්ම පිවිසුම් දොරටු තියෙනවා. ඒක හසුරුවන්න ක්‍රමයක් ලූක් හොයාගත්තොත්, විශ්වාස කරන්නත් බැරි තරම් වේගයකින් එයාගේ හමුදාව අරන් යන්න එයාට පුළුවන් වෙයි."

"ඒ වුණාට ඒක පැටලිච්ච නූල් බෝලයක් වගේ, නේද?"

"දරුණු උගුල් පිරිච්ච තැනක්." ග්‍රෝවර් එකඟ වුණා. "හිටි හැටියේ වැහෙන පාරවල්, මායා මිරිඟු, එළුවෝ මරන පිස්සු රාක්ෂයෝ එහෙම පිරුණු තැනක්."

"ඒත් ඔයා ළඟ 'අරියඩ්නිගේ නූල' තියෙනවා නම් බය වෙන්න දෙයක් නැහැ." ඇනබෙත් කිවුවා. "ඉස්සර කාලේ තිසියස්ට වංගගිරියෙන් පිට වෙන්න පාර පෙන්නුවේ 'අරියඩ්නිගේ නූල'. ඒක ඩෙඩලස් නිර්මාණය කරපු මග පෙන්වන උපකරණයක්. ඒ වගේම ක්‍රිස් රොඩ්‍රිගසුත් නූලක් ගැන දොඩවමින් හිටියා."

"ඒ කියන්නේ ලූක් ඔය කියන 'අරියඩ්නිගේ නූල' හොයාගන්න උත්සහ කරනවා," මම කිවුවා. "ඇයි ඒ? එයා මොනවද සැලසුම් කරන්නේ?"

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "මං දන්නෙ නැහැ. සමහරවිට වංගගිරිය හරහා ඇවිත් කඳවුර ආක්‍රමණය කරන්න එයාට උවමනා ඇති කියලා මම හිතුවා. ඒත්. ඒකෙ කිසිම තේරුමක් නැහැ. ක්ලැරිස් හොයාගත්ත ළඟම දොරටුව තියෙන්නේ මැන්හැටන්වල. ඒකෙන් ලූක්ට අපේ මායා බැමි හරහා එන්න උදව්වක් වෙන්නෙ නැහැ නේ. ක්ලැරිස් බිංගෙවල් ඇතුලේ ටිකක් සෝදිසි කරලා තිබුණා, ඒත්... ඒක ගොඩක් අනතුරුදායකයි. එයා තුන් හතර වතාවක් ම බේරිලා තිබුණේ අනු නමයෙන්. ඩෙඩලස් ගැන හොයාගන්න පුළුවන් හැම විස්තරයක්



ම මම හෙව්වා. ඒත් මට බය ඒකෙන් ඒ හැටි උදව්වක් වෙන්නෙ නැතිවෙයි. ලූක් සැලසුම් කරන්නෙ මොනවාද කියලා මට හරියට ම තේරෙන්නෙ නැහැ, ඒත් මම මේක දන්නවා: ග්‍රෝවර්ගේ ප්‍රශ්නයට වංගගිරිය උදව්වක් වෙන්න පුළුවන්."

මම තදින් ඇහිපිය ගැහුවා. "ඔයා හිතන්නෙ පෑන් පොළොව යට ඇති කියල ද?"

"එයාව හොයාගන්න එක කොහෙත්ම කරන්න බැරි වැඩක් වෙලා තියෙන්නෙ ඇයි කියලා ඒකෙන් පැහැදිලි වෙනවා නේ."

ග්‍රෝවර් වෙවුලුවා. "සැටර්ලට පොළොව යටට යන එක ජේන්න බැරි වැඩක්. කිසිම සොයන්නෙක් එහෙට යන්න උත්සහ කරලා නැහැ. එහෙ මල් නැහැ. ඉර එළිය නැහැ. කෝපි කඩයක්වත් නැහැ!"

"ඒත්," ඇනබෙත් කිවුවා, "වංගගිරියට ඔයාව ඕනෑම තැනකට අරන් යන්න පුළුවන්. ඒක ඔයාගේ සිතුවිලි කියවනවා. ඒක නිර්මාණය කරලා තියෙන්නෙ ඔයාව මෝඩයාට අන්දලා, රවට්ටලා, ඊට පස්සෙ ඔයාව මරන්න; ඒත් වංගගිරිය ඔයාගේ පැත්තට නම්මා ගන්න ඔයාට පුළුවන් නම්-"

"ඒක ඔයාට වනගත දෙවියා ඉන්න තැනට පාර පෙන්වයි," මම කිවුවා.

"මට ඒක කරන්න බැහැ." ග්‍රෝවර්, එයාගේ බඩ බදාගත්තා. "ඒ ගැන හිතද්දිත් මට කාපු රිදී බඩු වමනෙට එනවා."

"ග්‍රෝවර්, සමහරවිට මේක ඔයාට ලැබෙන අන්තිම අවස්ථාව වෙන්න පුළුවන්," ඇනබෙත් කිවුවා. "වැඩිහිටි මණ්ඩලයේ අය සෙල්ලම් කරන්න කැමති නැහැ. එක සතියකින් බැරි නම් ඔයාට ටැප් නැටුම් ඉගෙන ගන්න තමයි වෙන්නෙ!"

ප්‍රධාන මේසයේ සිටි කුයින්ටස් උගුර පෑදුවා. එයාට මෙතැන ආරවුලක් ඇති කරන්න උවමනා නැති වුණත්, ඕනෑවටත් වඩා වැඩි වෙලාවක් මගේ මේසයේ වාඩි වෙලා ඉඳලා ඇනබෙත් ඒකට පොටක් පාදන බව මට හැඟුණා.

"අපි පස්සෙ කතා කරමු," ඇනබෙත් මගේ අත ඕනෑවටත් වඩා තදින් මිරිකුවා. "එයාට තේරුම් කරලා දෙන්නකෝ?"

එයාව කන්න වගේ බලා ඉන්නා අයව සතේකට මායිම් නොකර එයා ආපසු ඇතිනා මෙසයට ගියා.

ග්‍රෝවර් අත් දෙකේ මූණ සඟවා ගත්තා. "මට ඒක කරන්න බැහැ, පර්සි. මගේ සොයන්නෙකුගේ බලපත්‍රය. පැන්. මට මේ හැම දෙයක්ම නැති වෙන්නයි යන්නේ. මට රූකඩ නටවන්න පටන් ගන්නයි වෙන්නේ."

"එහෙම කියන්නෙපා! අපි මොකක් හරි හොයා ගමු."

එයා ඇස්වල කඳුළු පුරවගෙන මගේ දිහා බැලුවා. "පර්සි, ඔයා තමයි මගේ හොඳම යාළුවා. මම පොළොව යට ඉන්නවා ඔයා දැකලා තියෙනවා. අර සයික්ලොප්ස් ලෙන ඇතුළේ. ඔයා ඇත්තටම හිතනව ද මට පුළුවන් වෙයි කියලා..."

එයාගේ කටහඬ බිඳුණා. රාක්ෂ සයුර මැද, සයික්ලොප්ස් ලෙනක් ඇතුළේ එයා හිර වී සිටි හැටි මට මතක් වුණා. ඊට කලිනුත් පොළොව යට තැන්වලට එයාගේ කැමැත්තක් තිබුනේ නැහැ, ඒත් දැන් ඒ වගේ තැන්වලට ග්‍රෝවර් ඇත්තටම වෛර කළා. එයා සයික්ලොප්ස්ලාටත් බය වුණා. අඩු තරමේ ටයිසන්ට පවා... ග්‍රෝවර් ඒ බව හංගන්න උත්සහ කළා, ඒත් අපි දෙන්නා අතරේ තියෙන සහකම්පන සම්බන්ධය නිසා ග්‍රෝවර්ටයි මටයි එකිනෙකාගේ චිත්තවේග කියවන්න හැකියාව තිබුණා. ඒ නිසා එයාට දැනුණු හැටි මම දැන සිටියා. ග්‍රෝවර් ලොකු යාළුවාට පණ බයේ හිටියේ.

"මට යන්න වෙනවා," ග්‍රෝවර් මුසල හඬින් කිවුවා. "ජුනිපර් මං එනකල් බලන් ඉන්නවා. බයගුල්ලෝ හිත් ඇද ගන්නවා කියලා එයා හිතන්නෙ හොඳ වෙලාවට."

එයා යන්න ගියාම මම කුයින්ටස් දිහා බැලුවා. එයා බැරෑරුම් ලෙසින් ඔළුව වැනුවේ, හරියට අපි දෙන්නා මොකක් හරි අඳුරු රහසක් බෙදාගන්නවා වගෙයි. ඊට පස්සෙ එයා ආයෙමත් පිඟානේ තිබුණු සොසේජසය කිණිස්සකින් කපන්න පටන් ගත්තා.

***

එදා දහවලේ, මම මගේ යාළුවා බ්ලැක්ජැක්ව බලන්න පෙගසස් ඉස්තාලයට ගියා.

*යෝ, බොස්!* එයා කළු පාට පියාපත් සලමින් ගාල ඇතුලේ දඟලුවා. *ඔයා මට සීනි කැට ගෙනාව ද?*



"ඒවා ඔයාට හොඳ නෑ කියලා ඔයා දන්නවානේ, බ්ලැක්ජැක්."

*ඔව්, ඉතින් ඔයා මට ඒවා ගෙනාවා, නේ?*

හිනා වුණ මම සීනි කැට අහුරකින් එයාට සංග්‍රහ කළා. බ්ලැක්ජැක්ගෙයි මගෙයි යාළුකම පිටිපස්සේ සැහෙන දිග කතාවක් තිබුණා. මීට අවුරුදු කීපයකට කලින් ලූක්ගේ රාක්ෂයෝ පිරුණු නැවෙන් පැනලා යන්න මම එයාට උදවු කළා. එදා ඉඳන් මට එක එක උදවු කරලා කළගුණ සලකන්න එයා උත්සහ කළා.

*ඉතින් ඉස්සරහට අපිට යන්න ගවේෂණ මොනවත් නැද්ද?* බ්ලැක්ජැක් ඇසුවා. *මම නම් පියාඹන්න ලෑස්තියි, බොස්!*

මම එයාගේ නහයට තට්ටු කළා. "ඒ ගැන විශ්වාසයක් නෑ, කොල්ලෝ. හැම දෙනාම කතා කරන්නෙ පොළොව යට වංගගිරි ගැන."

බ්ලැක්ජැක් කලබලෙන් හේෂාරාවය කළා. *නෑ-අහ්. මේ අශ්වයට නම් හරියන්නෑ! වංගගිරි ඇස්සෙ රිංගන්න තරම් ඔයාට පිස්සු නැද වෙලා නෑ නේද, බොස්? ඔයා කොහොත් එළියට එයි ද කවුද දන්නේ!*

"සමහරවිට ඔයා හරි ඇති, බ්ලැක්ජැක්. අපි බලමුකෝ."

බ්ලැක්ජැක් සීනි කැට හපා කෑවා. ඊට පස්සෙ එයා කේෂර සෙලෙව්වේ හරියට සීනි වලිප්පුවක් හැදිලා වගෙයි. *වාව්! නියම බඩු! හොඳයි, බොස්, ඔයාට හොඳ සිහිය ඇවිල්ලා කොහෙට හරි පියාඹන්න ඕනෑ වුණොත් විසිල් එකක් ගහන්න. බ්ලැක්ජැකුයි එයාගේ යාළුවෝයි ඔයා වෙනුවෙන් ඕනෑ එකෙක්ට කුර පාර දෙන්න ලෑස්තියි!*

ඒක මම මතක තියාගන්නම් කියලා මම එයාට කිවුවා. ඒ වෙලාවේ අලුත් කඳවුරුකරුවෝ කණ්ඩායමක් පියාසර පුහුණු පාඩමකට ඉස්තාලයට ආව නිසා ආපහු යන්න වෙලාව හරි කියලා මම හිතුවා. සැහෙන කාලෙකට ආයෙමත් බ්ලැක්ජැක්ව දකින්න නොලැබේවි කියන නරක හැඟීම මගේ හිතේ කොණක මතු වුණා.

***

එදා රෑ කෑමෙන් පස්සේ, කොඩිය අල්ලන තරඟයකට වගේ අපිට යුධ සන්නාහවලින් සැරසෙන්න කුයින්ටස් නියම කළා, ඒත් කඳවුරුකරුවෝ අතරේ ඊට වඩා බැරෑරුම් බවක් පැතිරී තිබුණා. දහවල් වරුවේ කඩු හරඹ පිටියේ තිබුණු ලී පෙට්ටි අතුරුදහන් වී තිබුණා, ඒ

Scanned with CamScanner

පෙට්ටිය තුළ තිබුණු දේ මොකවා වුණත් ඒවා කැලය තුළට හිස් කරන්න ඇති කියලා හැඟීමක් මට දනුණා.

"හරි එහෙනම්," කුයින්ටස් ප්‍රධාන කෑම මේසය අසල සිටගෙන කිව්වා. "වටේට එකතු වෙන්න."

එයා කළු පාට ලෙදර් සහ ලෝකඩවලින් සැරසී සිටියා. එයාගේ අළු පාට කොණ්ඩයට පන්දම් එළි වැටීම නිසා එයාව පෙනුණේ අවතාරයක් වගෙයි. ඒ කෑමවල සුන්බුන් ඩැහැ ගනිමින් මිසිස් ඕ'ලෙරී එයා වටේ සතුටින් නැටුවා.

"ඔයාලව දෙන්නා ගානේ කණ්ඩායම්වලට බෙදනවා," කුයින්ටස් නිවේදනය කළා. හැමදෙනාම එකවර කතා කරමින්, තම තමන්ගේ යාළුවන්ව අල්ලගන්න උත්සහ කරද්දි එයා මොර දුන්නා "ඒවා දනටමත් තෝරලා ඉවරයි!"

"අයියෝ..!" හැමෝම අවලාද නැඟුවා.

"ඔයාලට කරන්න තියෙන දේ සරලයි: මැරෙන්නැතුව රන් ලෝරල් එකතු කරගන්න. මල් මාලය සිල්ක් රෙදි පොදියක ඔතලා, රාක්ෂයින්ගෙන් එකෙකුගේ පිටේ ගැට ගහලයි තියෙන්නේ. රාක්ෂයෝ හය දෙනෙක් ඉන්නවා. උන් හැම එකා ලඟම සිල්ක් පොදියක් තියෙනවා. හැබැයි ලෝරල් මාලය තියෙන්නෙ ඒවායින් එකක විතරයි. ඔයාලට අනෙක් කණ්ඩායම්වලට කලින් මල් මාලය හොයාගන්න වෙනවා. ඒ වගේම.. ඇත්ත වශයෙන්ම... ඒක ගන්න නම් ඔයාලට රාක්ෂයාව මරන්න වෙනවා. ඒ වගේම පණ බේරගෙන ඉන්නත් වෙනවා."

සෙනග අතරේ උද්දාමයෙන් මිමිණුමක් පැතිරුණා. ඒ වැඩේ හරිම සරලයි වගෙයි දනුණේ. හේයි, අපි හැමෝම මීට කලින් රාක්ෂයෝ මරලා තියෙනවා නේ. අපිව පුහුණු කරවන්නේ ඒකටනේ.

"මම දන් ඔයාලගේ හවුල්කරුවන්ව නිවේදනය කරනවා," කුයින්ටස් කිව්වා. "එයාලව මාරු කරගන්න බැහැ. මැසිවිලි කියන්නත් බැහැ."

"වුෆ්!" මිසිස් ඕ'ලෙරී පීසා පිඟානක මූණ ඔබාගත්තා.

ලොකු ලැයිස්තුවක් පිටට ගත් කුයින්ටස් නම් කියවන්න පටන් ගත්තා. බෙකන්ඩෝර්ෆ්ගේ හවුල්කාරිය සිලේනා බියුරිගාඩ්, ඒකට නම් බෙකන්ඩෝර්ෆ් පැහෙන සතුටු වුණ බවක් පෙනුණා. ස්ටෝල් සහෝදරයෝ, ට්‍රැවිස් සහ කොනර් එකට. පුදුමයක් නැහැ. ඒ දෙන්නා



හැමදේම කළේ එකටනේ. ක්ලැරිස් සහ ඇපලෝ කැබිනයේ ලී ෆ්ලෙචර් - අවන්ධ සටන්කාමියක් සහ දිගු දුර සටන්කරුවෙක්. ඒ දෙන්නව නම් පරද්දන්න ලේසි වෙන එකක් නැහැ. දිගින් දිගටම නම් කියාගෙන ගිය කුයින්ටස් ඊළඟට කිව්වේ "පර්සි ජැක්සන් සමග ඇනබෙත් චේස්."

"නියමයි." මම ඇනබෙත්ට දත් නියවුවා.

"ඔයාගේ සන්නාහය ඇද වෙලා." එයා කිව්වේ එච්චරයි. ඊට පස්සෙ එයාම මගේ සන්නාහයේ පටි සැකසුවා.

"ග්‍රෝවර් අන්ඩර්වුඩ්," කුයින්ටස් කිව්වා. "ටයිසන් සමග."

ග්‍රෝවර්ගේ එළු ලොම් ටික එතැනම හැලුනේ නැති එක විතරයි. "මොකක්? එ-ඒත්-"

"නෑ, නෑ," ටයිසන් ඉකි බින්දා. "මොකක්හරි වැරදීමක් වෙලා. එළු කොල්ලා-"

"මැසිවිලි කියන්න බෑ!" කුයින්ටස් නියෝග කළා. "තම තමන්ගේ හවුල්කාරයන්ට එකතු වෙන්න. ඔයාලට සූදානම් වෙන්න මිනිත්තු දෙකක කාලයක් ලැබෙනවා!"

ටයිසන් සහ ග්‍රෝවර් දෙන්නම පිංසෙණ්ඩු වෙමින් මගේ දිහා බැලුවා. මම එයාලව දිරියත්වමින් ඔළුව වනලා. ඒ දෙන්නා එක්ව යා යුතු බව ඇඟෙව්වා. ටයිසන් කිඹුහුම් ඇරියා. ග්‍රෝවර් බයෙන් වගේ එයාගේ ලී මුගුර කන්න පටන් ගත්තා.

"එයාලට ප්‍රශ්නයක් වෙන එකක් නැහැ," ඇනබෙත් කිව්වා. "මෙහෙ එන්න. අපි දන් පණ පිටින් ඉන්නෙ කොහොමද කියන එක ගැන කරදර වෙමු."

***

අපි වනාන්තරය තුළට යද්දි තවමත් එ[illegible] තිබුණත්, ගස්වල සෙවණැලිවලින් ඒ මැදියම තරම් අඳුරක් ඇති [illegible]ර තිබුණා. මේ ගිම්හානය වුණත්, පරිසරයේ හද සීතලක් පැතිරී ති[illegible]ණා. ගිය ඉක්මනින් ම වගේ ඇනබෙත්ටයි මටයි මං සලකුණු සො[illegible]න්න ලැබුණා - ඒවා කකුල් ගොඩක් ඇති සතෙක් දව්බ්ඩියේ දිව සලකුණු. අපි අඩි පාර දිගේ යන්න පටන් ගත්තා.

ඇළක් උඩින් පැනපු අපිට [illegible] ළාතකින් අතු රිකිලි බිඳෙන හඬක් ඇහුණා. අපි ලොකු ගල් ගෙඩියක පිටුපස ඇන තියා ගත්තා

ඒත් ඒ ගස් මුල්වල පැටලෙමින්, අවලාද නගමින් කැලය හරහා යන ස්ටොල් සහෝදරයෝ දෙන්නා විතරයි. එයාලගේ තාත්තා හොරුන්ට අධිපති දෙවියා වුණත්, ඒ දෙන්නගේ හොර ගමන නම් මී හරක් යනවා වගෙයි.

ස්ටොල් සහෝදරයෝ පහු වුණාට පස්සේ, අපි වඩාත් චණ්ඩ රාක්ෂයෝ සිටි වනාන්තරයේ බටහිර කොටසේ ගැඹුරට හෙමින් සීරුවේ ගියා. අපි වගුරු පතහකට ඉහළින් පිහිටි ගල් තලාවක් මත සිටගත්තා ම ඇනබෙත් ගැස්සුණා. "මෙතැනින් තමයි අපි හෙවිල්ල නතර කළේ."

එයා අදහස් කළ දේ තේරුම් ගන්න මට තත්පරයක් විතර ගියා. ගිය ශීත සමයේ, අපි එයාව හොයන්න තිබුණු බලාපොරොත්තු අත් ඇරියාට පස්සේ, ග්‍රෝවර් සහ ඇනබෙත් එක්ක මේ ගල උඩ මම සිටගෙන සිටියා. කයිරොන්ට ඇත්ත - ඒ කියන්නේ නිකෝ හේඩීස්ගේ පුතෙක් බව කියන්න එපා කියලා මම එයාලට ඒත්තු ගැන්නුවේ ඒ වෙලාවේදියි. ඒ කාලේ කරන්න ඕනෑ හරිම දේ ඒක වගෙයි පෙනුණේ. මට ඕනෑ වුණේ නිකෝගේ අනන්‍යතාවය ආරක්ෂා කරන්නයි. නිකෝව හොයාගෙන, එයාගේ සහෝදරියට සිදු වූ දේ වෙනුවෙන් හැමදේම හරිගස්සන කෙනා වෙන්නයි මට ඕනෑ වුණේ. දැන්, මාස හයක් ගිහිල්ලත්, එයාගේ හෝඩුවාවක්වත් හොයාගන්න මට බැරිවුණා. ඒ සිතුවිල්ල මගේ කටේ අමිහිරි රසයක් ඉතිරි කළා.

"ඊයේ රෑ මම එයාව දැක්කා," මම කිව්වා.

ඇනබෙත්ගේ ඇහිබැම් එකට බැඳුණා. "ඒ කිව්වේ?"

මම එයාට අයිරිස්-පණිවුඩය ගැන විස්තර කළා. මගේ කතාව ඉවර වුණා ම, එයා කැලයේ සෙවණැලි දිහා බලා ගත්වන ම හිටියා. "එයා මළවුන් කැඳවනවා? ඒක නම් හොඳ දෙයක් නෙවෙයි."

"ඒ අවතාරේ එයාට දුන්නේ නරක උපදෙස්," මම කිව්වා. " එයාට පළිගන්න කියලා දිලා."

"ඔව්... මළගිය ආත්ම කවදාවත් හොඳ උපදේශකයෝ නෙවෙයි. එයාලට එයාලගෙ ම වැඩ සැලසුමක් තියෙනවා. පරණ කෝන්තර පිරිමහගන්න. ඒ වගේම එයාලා පණ තියෙන අයව රුස්සන්නෙ නැහැ."

"එයා මගේ පස්සෙන් එන්නයි යන්නේ," මම කිව්වා. "ඒ මළගිය ආත්මය වංගගිරිය ගැනත් කිව්වා."



ඇනබෙත් ඔළුව වැනුවා. "ඒකෙන් ඔක්කොම පැහැදිලි වෙනවා. අපිට වංගගිරිය ගැන හොයලා බලන්නම වෙනවා."

"සමහරවිට," මම කිව්වෙ අපහසුවෙන්. "ඒත් අයිරිස්-මැසේජ් එක එව්වේ කවුද? මම එතැන හිටියා කියලා නිකෝ දන්නෙ නැත්නම්-"

කැලය තුළ අත්තක් බිඳෙන හඬ ඇසුණා. වියළි කොළ සරසර ගෑවා. ගල් තලාවට එපිටින්, ගස් අතරේ මොකෙක් හෝ විශාල සතෙක් සෙලවුණා.

"ඒ නම් ස්ටොල් ජෝඩුව නෙවෙයි," ඇනබෙත් කෙඳිරුවා.

අපි දෙන්නා එකටම අපේ කඩු ඇදලා ගත්තා.

***

කැලයේ බටහිර කොටසේ පිහිටි ලොකු ගල් ගෙඩි ගොඩ, සියුස්ගේ මුෂ්ටිය ළඟට අපි ආවා. ඒක කඳවුරුකරුවෝ දඩයම් චාරිකාවල දි සංකේතස්ථානයක් විදිහට නිතර පාවිච්චි කරන තැනක් වුණත් ඒ වෙලාවේ නම් වෙන කවුරුවත් ළඟ පාතක හිටියේ නැහැ.

"අර පැත්තෙන්," ඇනබෙත් මිමිණුවා.

"නෑ, ඉන්න," මම කිව්වා. "අපිට පිටිපස්සෙන්."

ඒක හරිම අද්භූත දෙයක්. කකුල් අද්දමින් දඩිබිඩියේ දුවන හඬවල් එක විට දිසාවල් කීපයකින් ම ඇහෙනවා වගෙයි පෙනුණේ. අපි කඩු සූදානමින් තබාගෙන, ගල් ගොඩ වටේට කැරකෙද්දි එක පාරට ම අපිට පිටුපසින් කවුදෝ කතා කළා. "හායි."

අපි වේගයෙන් අනෙක් පැත්ත හැරෙද්දි රුක් දේවතාවිය ජුනිපර් මහ හඬින් කෑගැසුවා.

"ඔවා පැත්තකට දාන්න!" එයා විරෝධය පෑවා. "රුක් දෙවිවරු කැපෙන තලවලට කැමති නැහැ, හරි ද?"

"ජුනිපර්," ඇනබෙත් හුස්ම හෙළුවා. "ඔයා මොනවද මෙහෙ කරන්නෙ?"

"මම ජීවත් වෙන්නෙ මෙහෙ."

මම කඩුව පහත දැමුවා. "මේ ගල් ගොඩේ?"

එයා එළිමහන් බිම කෙළවරට අත දිගු කළා. "ජුනිපර් (සදාහරිත පඳුරු විශේෂයක්) පඳුරේ. මෝඩයෝ."

එයින් කාරණය පැහැදිලි වෙද්දි මට මහා අමුතු ගතියක් දැනුණා. රුක් දේවතාවෝ එක්ක අවුරුදු ගාණක් ගත කර තිබුණත් මම කවදාවත් එයාලා එක්ක වැඩිය කතා කරලා නැහැ. එයාලගේ ජීව ප්‍රභවය වන ගහෙන් වැඩි ඈතකට යන්න එයාලට හැකියාවක් නැති බව මම දන සිටියා. ඒත් ඒ ඇරෙන්න වැඩි විස්තරයක් මම දන සිටියේ නැහැ.

"ඔයාලා ලොකු වැඩක ද ඉන්නේ?" ජුනිපර් ඇසුවා.

"හොඳයි," මම කිවුවා, "අපි මේ රාක්ෂයෝ රැනකට විරුද්ධව තරගයක් කරන ගමන් මැරෙන්නැතුව ඉන්න මහන්සි වෙනවා."

"අපිට ඒ තැටි වැඩක් නෑ," ඇනබෙත් කිවුවා. "මොකක්ද ප්‍රශ්නේ, ජුනිපර්?"

ජුනිපර් නහය ඉහළට ඇද්දා. එයා සේද ඇඳුමේ අතෙන් ඇහැ යට පිස දමුවා. "ඒක ග්‍රෝවර් ගැන. එයා ඉන්නේ ගොඩක් දුකෙන් කැලඹිලා වගේ. ගිය අවුරුද්ද පුරාම එයා පැන්ව හොයන්න පිටට ගිහිල්ලා හිටියේ. ඒ වගේම එයා ආපහු එන හැම සැරේකම, ඒක තිබුණටත් වඩා නරකයි. මම මුලින්ම හිතුවේ, සමහරවිට, එයා වෙන ගහක් එක්ක යාළු වෙලා ඇති කියලා."

"නෑ," ජුනිපර් අඬන්න පටන් ගනිද්දි ඇනබෙත් කිවුවා. "එහෙම දෙයක් නැහැ කියලා මට විශ්වාසයි."

"ඉස්සර එයාගේ හිතේ බ්ලූබෙරි පඳුරක් ගැනත් කැමැත්තක් තිබුණා," ජුනිපර් මුසල ලෙසින් කිවුවා.

"ජුනිපර්," ඇනබෙත් කිවුවා, "ග්‍රෝවර් කවදාවත් වෙන ගහක් දිහා බලන කෙනෙක් නෙවෙයි. එයා එයාගේ බලපත්‍රය ගැන කරදර වෙනවා විතරයි."

"එයාට පොළොව යටට යන්න බැහැ!" එයා විරෝධය පෑවා. "එයාට ඒකට ඉඩ දෙන්න ඔයාලට බැහැ."

ඇනබෙත් අපහසුවෙන් බලා සිටියා. "එයාට උදවු කරන්න තියෙන එකම විදිහ ඒක වෙන්න පුළුවන්; කොහෙන් පටන් ගන්න ද කියලා අපි දැනගෙන හිටියා නම්."

"අහ්," ජුනිපර් කම්මුලට වැටුණු කොළ පාට කඳුළු බිඳුවක් පිස දමුවා. "ඒ ගැන..."



කැලය තුළින් තවත් සරසර හඬක් ඇසුණා. ඒත් එක්කම ජුනිපර් මොර දුන්නා, "හැංගෙන්න!"

ඇයි කියලා අහන්න මට ඉඩක් ලැබෙන්න කලින් එයා කොළ පාට මීදුමකට දිය වී ගියා. ඇනබෙතුයි මමයි ආපසු හැරුණා. කැලයෙන් පිටතට එමින් සිටියේ අඩි දහයක් විතර දිග, රළු වැහි අඬු දෙකකුත්, මගේ කඩුව තරම් දිග විෂ තුඩක් සහිත ආරක්ෂක වැස්මකින් වැසුණු වලිගයකුත් ඇති දිලිසෙන ඇම්බර් සහ පාට කාම්යෙක්. ගෝනුස්සෙක්. ඌගේ පිටේ රතු පාට සිල්ක් පොදියක් ගැට ගසා තිබුණා.

"අපි දෙන්නගෙන් කෙනෙක් ඌගේ පිටිපස්සට යනවා," සතා කටකට හඬ නගමින් අපි ඉදිරියට එද්දි ඇනබෙත් කිවුවා. "අනිත් කෙනා ඉස්සරහින් ඌව කලබල කරන අතරේ ඌගේ වලිගෙ කපලා දානවා."

"මම ඉස්සරහ ගන්නම්," මම කිවුවා. "ඔයා ළඟ නොපෙනී යන කැප් එක තියෙනවා නේ."

එයා ඔළුව වැනුවා. අපි දෙන්නා කොයි තරම් වතාවක් එක්ව සටන් කර තිබුණා ද කියනවා නම්, එකිනෙකාගේ සටන් ඉරියව් අපි හොඳින් දන සිටියා. අපිට මේක කරන්න පුළුවන්, ලේසියෙන්ම. ඒත් හැම දෙයක්ම වැරදෙන්න ගත්තේ කැලය තුළින් තවත් ගෝනුස්සෝ දෙන්නෙක් මතු වෙද්දියි.

"තුනක්?" ඇනබෙත් කිවුවා. "ඒක වෙන්න බැහැ! මෙච්චර ලොකු කැලෑවක් වෙලත් රාක්ෂයින්ගෙන් බාගයක් ම අපිව හොයාගෙන ඇවිල්ල ද?"

මම තුදින් කෙළ ගිල්ලා. එකෙක් නම්, අපිට ඉවරයක් කරන්න පුළුවන්. පොඩි වාසනාවක් තිබුනොත් දෙන්නෙක්වත් පුළුවන්. ඒත් තුන්දෙනෙක්? ඒක නම් සැකයි. ගෝනුස්සෝ උල් තුඩු ඇති වලිග වනමින් දඩිබිඩියේ අපි දිහාවට දුවගෙන ආවේ හරියට උන් අපිව මරන්නම මෙතැනට ඇවිත් වගෙයි. ඇනබෙත් සහ මම ළඟම තිබුණු ගල් ගෙඩියට පිටුපා සිට ගත්තා.

"උඩට නගිමු ද?" මම ඇසුවා.

"වෙලාවක් නෑ," එයා කිවුවා.

එයා කිවුවා හරි. ගෝනුස්සන් දැනටමත් අපිව වට කරමින් සිටියා. උන් කොයි තරම් කිට්ටු වී සිටියා ද කියනවා නම්, රසවත්,

මිස්ස බේරෙන උප දෙවිවරු දෙන්නෙක්ව කෑමට ගැනීමේ බලාපොරොත්තුවෙන් උන්ගේ අප්‍රසන්න කටවල් තුළ පෙණ දමන හැටි පවා මට පෙනුණා.

"ඔන්න බලාගෙන!" ඇනබෙත්, එයාගේ කඩුවේ පැතලි පැත්තෙන් විෂ හූඩක් ඉවතට හැරෙව්වා. මම රිප්ටයිඩ්ගෙන් ඇන්නා, ඒත් ගෝනුස්සා කඩුව වදින සීමාවෙන් ඉවතට පසු බැස්සා. අපි ගල් කුට්ටි දිගේ පැත්තකට යන්න ගත්තා, ඒත් ගෝනුස්සෝ අපි පසුපස ආවා. මම තවත් එකෙකුට කඩු පහරක් දුන්නා. ඒ වුණත් උන්ට පහර දෙන්න යාම ගොඩක් අනතුරුදායක වුණා. මම ගෝනුස්සෙකුගේ ඇඟට පහර දෙන්න උත්සහ කලොත්, ඌ වලිගයෙන් යටි අතට පහර දෙනවා. මම ඌගේ වලිගයට පහර දෙන්න උත්සහ කරද්දි, ඌගේ ඩැහි අඬු දෙපැත්තෙන්ම මාව ඩැහැ ගන්න උත්සහ කරනවා. අපිට කළ හැකි එකම දේ වුණේ අපේ ආරක්ෂාව සලසා ගන්න එක විතරයි, ඒක වුණත් අපිට වැඩි වෙලාවක් කරන්න ඉඩ ලැබෙන පාටක් තිබුනේ නැහැ.

මම තවත් අඩි කීපයක් පැත්තෙන් පැත්තට තැබුවා, ඊට පස්සෙ හදිසියේ ම මට පිටුපසින් කිසිවක් නැති බව දැනුණා. එතැන තිබුණේ ගල් කුට්ටිවලින් ලොකුම දෙක අතර තිබුණු පැළුමක්, මීට කලින් මිලියන වාරයක් විතර මම පසු කර ගොය් තිබුණ තැනක්, ඒ වුණත්...

"මේක ඇතුළට," මම කිවුවා.

ගෝනුස්සෙකුට කඩු පහරක් දුන් ඇනබෙත් ඊට පස්සෙ මගේ දිහා බැලුවේ මට පිස්සු හැදිලා වගෙයි. "මේක අස්සට? ඒක ගොඩක් පටුයි නේ."

"ඔයා යනකල් මම පිටිපස්ස බලා ගන්නම්. යන්න!"

මට පිටුපසින් පහත් වුණු එයා ගල් ගෙඩි දෙක අතරින් මිරිකෙමින් යන්න පටන් ගත්තා. ඊත් එක්කම බයෙන් කෑගැසූ එයා මගේ සන්නාහයේ පටිවල එල්ලුණා. හදිසියේ ම මාව ඊට මොහොතකට කලින් එතැන නොතිබුණු වළකට ඇද වැටෙමින් සිටියා. අපිට ඉහළින් ගෝනුස්සන්වත්, සැඳෑ අහසේ දම් පාට සහ ගස් මට පෙනුණා, ඊට පස්සේ කැමරාවක කාචය වැහෙනවා වගේ එක් වරම විවරය වැසී ගියා. සියල්ල අඳුරු වුණා.



අපේ හුස්ම හඬ කළු ගල මත දෝංකාර දුන්නා. එය තෙත් සහ සීතල වුණා. ගඩොලින් සෑදූ බව දැනුණු සමතලා නැති පොළොවක මම ඉඳගෙන හිටියා.

මම රිප්ටයිඩ් ඉහළට එසවූවා. එයින් නිකුත් වූ තුනී එළිය ඇනබෙත්ගේ බියපත් වූ මුහුණ සහ දෙපසින් වූ දිය සෙවෙල බැඳුණු කළු ගල් බිත්ති දැක ගැනීමට ප්‍රමාණවත් වුණා.

"ක්-කොහෙද අපි?" ඇනබෙත් ඇසුවා.

"කොහෙ වුණත්, ගෝනුස්සන්ගෙන් බේරිලා," මම සන්සුන් හඬින් කතා කරන්න උත්සහ කළත්, මමත් හිටියේ හොඳටම බයවෙලා. ගල් ගෙඩි දෙක අතර පැළුම ගුහාවක් තුළට විහිදුණා වෙන්න බැහැ. මෙතැන ගල් ගුහාවක් තිබුණා නම් මම ඒ බව කලින්ම දැන ඉන්න තිබුණා; මට ඒ බව විශ්වාස වුණා. සිද්ධ වුණේ හරියට පොළොවේ කටක් ඇරිලා අපිව ගිල ගත්තා වගේ වැඩක්. ඒ වෙලාවේ මගේ සිහියට ආව එකම දේ වුණේ ගිය ගිම්හානයේ භෝජන මණ්ඩපයේ පොළොව තුළට අර ඇටකෝට්ටෝ ටික ගිල ගත් පැළුම විතරයි. අපිටත් සිද්ධ වෙන්න ඇත්තෙ ඒකම ද හිතලා මම පුදුම වුණා.

ආලෝකයක් ලබා ගැනීමට මම ආයෙමත් මගේ කඩුව එසෙව්වා.

"මේක දිග කාමරයක්," මම කෙඳිරුවා.

ඇනබෙත් මගේ අත තදින් අල්ල ගත්තා. "කාමරයක් නෙවෙයි. කොරිඩෝවක්."

එයා හරි. අපිට ඉදිරියෙන් තිබුණු අන්ධකාරය දැනුණේ... හිස් තැනක් වගෙයි. උමං දුම්රිය පාරවල් තුළ වගේ උණුසුම් මඳ සුළඟක් ඒ තුළ තිබුණත්, ඒ සුළඟේ වඩාත් පැරණි, වඩාත් අනතුරුදායක බවකුත් කොහොමදෝ දැනුණා. මම ඉදිරියට යන්න සූදානම් වෙද්දි ඇනබෙත් මාව නැවැත්වූවා. "තව අඩියක්වත් තියන්නෙපා." එයා අනතුරු ඇඟෙව්වා. "අපි පිටවීම හොයාගන්න ඕනෑ." දැන් එයා කතා කළේ ඇත්තටම බයවෙලා වගෙයි.

"බය වෙන්නෙපා," මම පොරොන්දු වුණා. "ඒක හරියටම-"

ඉහළ බැලූ මට අපි ඇතුළට වැටුණු තැන දකගන්න නැති බව තේරුම් ගියා. ඝන කළු ගලක් සිවිලිම ලෙස තිබුණා. කොරිඩෝව දෙපසටම කෙළවරක් නැතිව පැතිරී තියෙනවා වගෙයි පෙනුණේ.

ඇනබෙත්ගේ අත මගේ අතැඟිලිවල වෙළුණා. මීට වඩා වෙනස් වාතාවරණයක් යටතේ එයින් මම අපහසුවට පත් වෙන්න ඉඩ තිබුණා වුණත් මේ කළුවර මැද එයා ඉන්න තැන දැන ගන්න ලැබීම මට සහනයක් වුණා. මට විශ්වාසයක් තිබුණු එකම දේ ඒක විතරයි.

"අඩි දෙකක් පස්සට." එයා උපදෙස් දුන්නා.

බිම බෝම්බ වැළලූ බිමක ඉන්නවා වගේ අපි දෙන්නා එක්ව ආපස්සට පියවර මැන්නා.

"හරි." එයා කිවුවා. "මේ බිත්ති බලන්න මට උදවු කරන්න."

"ඒ මොකටද?"

"ඩෙඩලස්ගේ සලකුණ." එයා කිවුවේ හරියට එයින් හැමදෙයක් ම පැහැදිලි වෙනවා වගෙයි.

"අහ්, හරි. මොන වගේ-"

"හම්බ වුණා!" එයා කිවුවේ මහා අස්වැසුමක් ලැබුණා වගෙයි. බිත්තිය මත අත තැබූ එයා පුංචි සිදුරක් උඩ අත තද කරද්දි එයා තිල් පාටින් දිලිසෙන්න පටන් ගත්තා. එතැන ග්‍රීක සංකේතයක් මතු වුණා: Δ. පෞරාණික ග්‍රීක ඩෙල්ටා සලකුණ.

වහලය පැත්තකට ඇරෙද්දි එය තුළින් අපිට රෑ අහසේ තරු දිලිසෙනවා දකින්න ලැබුණා. විය යුතු තරමට වඩා ගොඩක් රෑ බෝවී තිබුණා. බිත්තිය පසෙකින් ඉහළට නැගෙන ලෝහ ඉණිමං පෙනී පෙනෙන්න ගත්තා. ඒ වගේම කඳවුරේ අය අපේ නම් කියමින් මොර දෙනවා මට ඇහුණා.

"පර්සි..! ඇනබෙ..ත්!" සියල්ලන්ගේම හඬ පරදා ටයිසන්ගේ හඬ ඉහළින්ම ඇහුණා.

මම කලබලෙන් ඇනබෙත් දිහා බැලුවා. ඊට පස්සේ අපි ඉහළට නගින්න පටන් ගත්තා.

***

ගල් ගෙඩි වටෙන් ගිය අපිට ඉදිරියට හමු වුණේ පන්දම් අතින් ගත් ක්ලැරිස් සහ තවත් කඳවුරුකරුවෝ රංචුවක්.

"ඔය දෙන්නා මොන ලෝකෙ ද හිටියේ?" ක්ලැරිස් ප්‍රශ්න කළා. "අපි කීයෙ ඉඳල ද හොයන්නේ?"



"ඒත් අපි ගිහින් හිටියේ විනාඩි තුන හතරක් විතරයි නේ." මම කිවුවා.

කයිරොන් හැල්මේ දිව එද්දි එයා පිටුපසින් ටයිසන් සහ ග්‍රෝවර් දුව ආවා.

"පර්සි!" ටයිසන් කෑගැසුවා. "ඔයා හොඳින් ද?"

"අපි හොඳින්." මම කිවුවා. "අපිව වළකට වැටුණා."

අනෙක් අය සැක සහිත බැල්මෙන් මගේ දිහාත්, ඉන් පසු ඇනබෙත් දිහාත් බැලුවා.

"ඇත්තමයි!" මම කිවුවා. "ගෝනුස්සෝ තුන්දෙනෙක් අපිව පැන්නුවා. ඉතින් අපි දුවලා ගිහින් ගල් අස්සෙ හැංගුණා. ඒත් අපි ගිහින් හිටියේ විනාඩි දෙක තුනක් විතරයි."

"ඔයාලා පැයක් විතර තිස්සේ අතුරුදහන් වෙලා හිටියා." කයිරොන් කිවුවා. "තරඟය ඉවර වුණා."

"ඔව්." ග්‍රෝවර් කෙඳිරුවා. "අපිට දිනන්න තිබුණා. ඒත් සයික්ලොප්ස් කෙනෙක් මගේ ඇඟ උඩ ඉඳගත්ත නේ."

"ඒක අත්වැරැද්දක්!" ටයිසන් විරෝධය පෑවා. ඊට පස්සේ එයා කිඹුහුම් ඇරියා. ක්ලැරිස් රත් ලෝරල් මාලය පැළඳ සිටියා. ඒත් වෙනදා වගේ ඒවා දිනා ගැනීම ගැන පම්පෝරි ගහන්නවත් එයා උනන්දු වුනේ නැහැ. "වළක්?" එයා අවිශ්වාසයෙන් ඇසුවා.

ඇනබෙත් ගැඹුරු හුස්මක් ගත්තා. එයා වටේ සිටි අනෙක් කඳවුරුකරුවෝ දිහා බැලුවා. "කයිරොන්... අපි මහ ගෙදරට ගිහින් මේ ගැන කතා කරොත් හොඳයි."

ක්ලැරිස් මහ හඬින් හිල්ලුවා. "ඔහේ ඒක හොයාගෙන, එහෙම නේද?"

ඇනබෙත් තොල සැපුවා. "මම-ඔව්. ඔව්, අපි හොයාගත්තා."

මම තරමටම අන්දමන්ද වෙලා හිටපු කඳවුරුකරුවෝ රංචුවක් එක එක ප්‍රශ්න අහන්න පටන් ගත්තත්, කයිරොන් එයාලාව නිහඬ කරවන්න අතක් එසවුවා. "අද රෑ ඒකට සුදුසු වෙලාව නෙවෙයි. ඒ වගේම මෙතැන ඒකට සුදුසු තැනත් නෙවෙයි." එයා ගල් ගොඩ දිහා බලා සිටියේ හරියට ඒවා කොයි තරම් අනතුරුදායක ද කියලා එයාට තේරුනේ දැන් වගෙයි. "ඔයාලා හැමෝම, දැන් ආපහු, කැබින්වලට

Scanned with CamScanner

යන්න. ටිකක් නිදාගන්න. තරගය හොඳට කළා. ඒත් දූත් ඇඳිරි නිසිය බලාත්මක කරලා තියෙන්නෙ."

කෙඳිරිම සහ කැසිවිලි නැගීම් ගොඩක් මැද කඳවුරුකරුවෝ එතැනින් ඉවත් වී යද්දි එයාලා අතරේ රහසින් කතා වෙමින් මගේ දිහාවට සැක සහිත බැළුම් හෙළුවා.

"මේකෙන් ගොඩක් දේවල් පැහැදිලි වෙනවා," ක්ලැරිස් කිවුවා. "ලූක් යන්නෙ මොකක් පස්සෙ ද කියලා ඒකෙන් පැහැදිලි වෙනවා."

"තත්පරයක් ඔහොම ඉන්න," මම කිවුවා. "ඔයා මොකක්ද අදහස් කළේ? අපි මොකක්ද හොයාගත්තේ?"

කණස්සල්ලෙන් ඇස් අඳුරු කරගෙන ඇනබෙත් මගේ දිහාවට හැරුණා. "වංගගිරියට ඇතුළුවෙන දොරටුවක්. ආක්‍රමණයක් කෙලින්ම කඳවුරේ හදවතට එන පාරක්."

# 04

# ඇනබෙත් නීති කැඩුවා

මේ ගැන වැඩිදුර විස්තර කතා කිරීම උදේ වෙන තුරු කල් දමන්න කයිරොන්ට ඕනෑ වුණා. ඒක හරියට 'හේයි, ඔයාලගේ ජීවිත තියෙන්නෙ මාරක අනතුරක. ඒ නිසා හොඳට නිදාගන්න!' කිවුවා වගේ වැඩක්. නින්දට වැටීම කොහෙත්ම කරන්න බැරි දෙයක් වගේ දැනුණත්, අන්තිමේ දි මම නිදාගත්තා. හීනෙන් මම හිර ගෙයක් දැක්කා.

ග්‍රීක කබායකින් සහ සෙරෙප්පු ජෝඩුවකින් සැරසී සිටි හාදයෙක් ගලින් සැදි විශාල කාමරයක තනියම බිම වකුටු වී සිටියා. සිවිලිම රූ අහසට විවර වී තිබුණත් අඩි විස්සක් උස, ඔප දැමූ කිරිගරුඬ ගල් බිත්ති මුළුමනින්ම මටසිලුටු වුණා. කාමරය පුරා ලී පෙට්ටි විසිරී තිබුණා. ඒවායින් සමහරක් පිපිරී, පෙරළී ගොස් තිබුණේ හරියට ඒවා එතැනට විසි කරලා වගෙයි. ඉන් එකකින් ලෝකඩ උපකරණ පිටතට වැටී තිබුණා - මාලිමාවක්, කියතක් සහ මම හඳුනා නොගත් තවත් දේවල් පොකුරක්.

පිරිමි ළමයා මුල්ලක ගුළි වී සීතලෙන් හෝ බයෙන් වෙවුලමින් සිටියා. එයාගේ ඇඟ පුරා මඩ ඉහිලා. එයාගේ අත්, කකුල් සහ මුහුණ සීරී තිබුණේ හරියට එයාවත් පෙට්ටි සමග බිම දිගේ ඇදගෙන ඇවිත් වගෙයි.

ඒ වෙලාවේ දෙපළු ඕක් දොර කෙඳිරි ගාමින් විවර වුණා. ලෝකඩ සන්නාහවලින් සැරසුණු මුරකරුවෝ දෙදෙනෙක් වයසක මනුස්සයෙක්ව අල්ලගෙන ඇතුළට ආවා. එයාලා බිම තිබුණු කඩමාලු ගොඩක් උඩට ඒ මනුස්සයාව තල්ලු කළා.

"තාත්තේ!" පිරිමි ළමයා වයසක මනුස්සයා වෙතට දිවුවා. ඒ මනුස්සයාගේ ලෝගුව වැරහැලි වී තිබුණා. එයාගේ කොණ්ඩයේ අළු පාට වයිරම් වැටිලා. එයාට දිග කැරලි ගැසුණු රැවුලක් තිබුණා. එයාගේ නාසය බිඳී තිබුණා. තොල්වලින් ලේ ගැලුවා.

පිරිමි ළමයා වයසක මනුස්සයාගේ හිස දෑතට ගත්තා "එයාලා ඔයාට මොනවද කළේ?" ඊට පස්සෙ එයා මුරකරුවන්ට මොර දුන්නා. "මම උඹලව මරනවා!"

"අද කවුරුත් කාවවත් මරන්නෙ නැහැ," කටහඬක් කිවුවා.

මුරකරුවෝ දෙපසට වුණා. එයාලට පිටුපසින් සුදු පාට ලෝගුවකින් සැරසුණු උස පිරිමියෙක් සිටගෙන සිටියා. එයා තුනී රන් ශීර්ෂ පටියක් පැලඳගෙන සිටියා. එයාගේ රැවුල අග හෙලි තුඩක් වගේ උල් වුණා. එයාගේ ඇස් කෲර ලෙස දිලිසුණා. "උඹ මගේ මිනටෝර්ව මරන්න ඇතීනියානුවන්ට උදවු කළා, ඩෙඩලස්. උඹ මගේම දුවව මට විරුද්ධව හැරෙව්වා."

"ඒක ඔබතුමාමයි කරගත්තෙ, රජතුමනි," වයසක මනුස්සයා රළු හඬින් කෙඳිරුවා.

මුරකරුවෙක් එයාගේ ඉළ ඇට අතරට පයින් ගැසුවා. වයසක මනුස්සයා වේදනාවෙන් කෙඳිරි ගාද්දි පිරිමි ළමයා කෑගැසුවා. "නවත්තනවා!"

"උඹ උඹේ වංගගිරියට ගොඩක් ආදරෙයි නේ," රජා කිවුවා. "ඉතින් උඹට මේකෙම නවතින්න දෙන්න මම තීරණය කරලා තියෙන්නේ. මේක උඹේ වැඩපොළ වෙයි. මට අලුත් පුදුමාකාර දේවල් හදලා දෙනවා. මාව විනෝද කරනවා. හැම වංගගිරියකට ම රාක්ෂයෙක් ඕනෑ. මගේ එකා උඹ වෙයි!"

"මම ඔහේට බය නැහැ," වයසක මනුස්සයා කෙඳිරි ගෑවා.

රජා කෲර ලෙස හිනාවුණා. එයාගේ ඇස් පිරිමි ළමයා ළඟ නැවතුණා. "ඒත් ඕනෑම මනුස්සයෙක් තමන්ගෙ පුතා ගැන හිතනවා, නෙහ්? මාව අමනාප කරනවා, නාකි මිනිහෝ, එතකොට මගේ මුරකාරයෝ ඊළඟට දෙන දඬුවම විඳින්න වෙන්නෙ එයාට!"

රජා මුරකරුවෝ සමග පිට වී යද්දි, පිරිමි ළමයාව සහ එයාගේ තාත්තාව කළුවරේ තනි කරමින් දොරවල් තදින් වැසුණා.



"අපි දැන් මොකද කරන්නේ?" පිරිමි ළමයා වැලපුණා. "තාත්තේ, උන් ඔයාව මරයි!"

වයසක මනුස්සයා අමාරුවෙන් කෙළ පිඬක් ගිල්ලා. එයා හිනා වෙන්න උත්සහ කළා, ඒත් එයාගේ ලේ වැකුණු කට නිසා එයින් බිහිසුණු දසුනක් මැවුවා.

"හිතට දිරි ගනින්, මගෙ පුතේ." එයා ඈත ඉහළ අහසේ තරු දිහා ඕනෑකමින් බලා සිටියා. "මං- මං ක්‍රමයක් හොයාගන්නම්."

මහ හඬක් නගමින් දොර පොල්ලක් දොර හරහා වැටුණා, ඒත් එක්කම දහඩියෙන් නැහැවී මම ඇහැරුණා.

***

පසුදා උදෑසන කයිරොන් යුධ මන්ත්‍රණ සභාවක් කැඳවන විටත් මම සිටියේ ගැහෙමින්. අපි කඩු හරඹ පිටියට රැස් වුණා. මිසිස් ඕ'ලෙරි ඇත්ත යැක් ගවයෙක් තරම් ලොකු, රෝස පාට රබර් අනුරුවක් හපද්දි කඳවුරේ ඉරණම ගැන සාකච්ඡා කරන්න උත්සහ කරන එක නම් හරිම අමුතු වැඩක් කියලා මට හිතුණා.

කයිරොන් සහ කුයින්ටස් ආයුධ රාක්ක ඉදිරිපස සිටගත්තා. ක්ලැරිස් සහ ඇනබෙත් එක ළඟ වාඩි වී විස්තර සැපයීම කරගෙන ගියා. ටයිසන් සහ ග්‍රෝවර් එකිනෙකාගෙන් හැකි තරම් ඈත් වී ඉන්න වගබලා ගත්තා. මේසය වටේ වාඩි වී සිටි අනෙක් අය වුණේ: රුක් දෙවඟන ජුනිපර්, සිලේනා බියුරිගාඩ්, ට්‍රැවිස් සහ කොනර් ස්ටොල්, බෙකන්ඩොර්ෆ්, ලී ෆ්ලෙචර් සහ ආර්ගස් - අපේ ඇස් සියයේ ආරක්ෂක ප්‍රධානියායි. තත්ත්වය සෑහෙන බරපතළ බව මට තේරුම් ගියේ එතකොටයි. ඉතාමත් වැදගත් දෙයක් නැත්නම් ආර්ගස් ප්‍රසිද්ධියේ පෙනී සිටින්නේ කලාතුරකින්. ඇනබෙත් කතා කළ මුළු කාලය පුරාවටම එයා කොයි තරම් තදින් එයාගේ නිල් පාට ඇස් සියය ඇනබෙත් දිහාවට හරවාගෙන හිටියා ද කියනවා නම් එයාගේ මුළු ඇඟම රතු පාට වුණා.

"මේ වංගගිරි දොරටුව ගැන ලූක් දැනගෙන ඉන්න ඇති," ඇනබෙත් කිවුවා. "එයා කඳවුර ගැන හැමදේම දැනගෙන හිටිය නේ."

Scanned with CamScanner

එයාගේ කටහඬේ පුංචි ආඩම්බරයක් තිබුණා කියලා මට හිතුණා. හරියට ලූක් මොන තරම් දුෂ්ටයෙක් වුණත් ඇනබෙත් තවමත් එයාට ගෞරව කරනවා වගෙයි.

ජුනිපර් උගුර පෑදුවා. "ඊයේ රෑ ඔයාලට මම කියන්න හැදුවේ ඒ ගැන තමයි. ඒ ගුහා දොරටුව එතැන තියෙන්නෙ සෑහෙන කාලෙක ඉඳලා. ලූක් ඒක පාවිච්චි කරන්න පුරුදු වෙලා හිටියා."

සිලේනා බියුරිගාඩ් රවා බැලුවා. "ඔයා වංගගිරියේ දොරටුව ගැන දනගෙන ඉඳලත් ඒ ගැන කිසි දෙයක් කිවුවේ නැහැ?"

ජුනිපර්ගේ මූණ කොළ පාටට හැරුණා. "ඒක ඔය තරම් වැදගත් ඇති කියලා මම හිතුවෙ නැහැ. ඒක ගුහාවක් විතරයි. පරණ ජරා ගුහාවල් මට පේන්න බැහැ."

"එයාට හොඳ තේරීමක් තියෙනවා," ග්‍රෝවර් කිවුවා.

"මං ඒ ගැන කොහෙත්ම සැලකිල්ලක් දක්වන්නැතුව ඉන්න තිබුණා ඒ... ලූක් නොවුණා නම්." එයාගේ කම්මුල් තවත් ටිකක් කොළ පාටට හැරුණා.

ග්‍රෝවර් කේන්තියෙන් හුස්මක් පිට කළා. "එයාගේ හොඳ තේරීම ගැන මම කියපු කතාව අමතක කරලා දාන්න."

"මාරයි නේ," කුයින්ටස් කතා කරන අතරේ ම කඩුව ඔප දැමුවා. "එතකොට මේ කොල්ලා, ලූක් ආක්‍රමණයකට පාරක් හැටියට වංගගිරිය පාවිච්චි කරන්න තරම් එඩිතර වෙයි කියලා ඔයාලා විශ්වාස කරනවා?"

"අනිවාර්යයෙන් ම," ක්ලැරිස් කිවුවා. "එයාට අපේ මායා බැම්ම ගැන වද වෙන්ඩ නොවී, අර්ධ-ලෝහිත කඳවුරේ කැලෑව මැදින් රාක්ෂ හමුදාවක් උඩට ගන්ඩ ලැබුනොත්, අපිට හැරෙන්ඩවත් ඉඩක් නැති වෙයි. එයා ලේසියෙන් ම අපිව අතුගාලා දායි. එයා මේක මාස ගාණක් තිස්සෙ සැලසුම් කරන්ඩැති."

"එයා වංගගිරිය ඇතුළට ඔත්තුකාරයෝ යවනවා," ඇනබෙත් කිවුවා. "අපි ඒක දැනගත්තේ... අපි ඒ කෙනෙක්ව හොයාගත්ත නිසා."

"ක්‍රිස් රොඩ්‍රිගස්," කයිරොන් කිවුවා. එයා කුයින්ටස්ට අරුත්බර බැල්මක් හෙළුවා.



"අන්," කුයින්ටස් කිවුවා. "අර ඇතුළේ ඉන්න... ඔව්, මට තේරුණා."

"මොකක් ඇතුළේ ඉන්න කෙනා ද?" මම ඇසුවා.

ක්ලැරිස් මට රැවුවා. "වැදගත් ම කාරණේ තමයි, ලූක් හොයමින් ඉන්නේ වංගගිරිය හසුරුවන්න ක්‍රමයක්. එයා ඩෙඩලස්ගේ වැඩපොළ හොයනවා."

කලින් රැයේ මම දුටු හීනය - වැරහැලි වූ ලෝගුවක් හැඳ, ලේ පෙරමින් සිටි වයසක මනුස්සයාව මගේ මතකයට නැගුණා. "වංගගිරිය නිර්මාණය කරපු කෙනා."

"ඔව්," ඇනබෙත් කිවුවා. "මේ තරම් කාලයකට හිටපු ශ්‍රේෂ්ඨම වාස්තු විද්‍යාඥයා, ශ්‍රේෂ්ඨම නිමැවුම්කරුවා. ජනප්‍රවාද ඇත්තක් නම්, එයාගේ වැඩපොළ තියෙන්නේ වංගගිරිය මැද. එයා තමයි වංගගිරිය හරියටම හසුරුවන්න දන්න එකම කෙනා. බැරි වෙලාවත් ලූක්ට මේ වැඩපොළ හොයාගෙන, ඩෙඩලස්ව එයාගේ පැත්තට නම්මගන්න පුළුවන් වුනොත්, පාරවල් හොය හොයා දඟලන්නවත්, එයාගේ හමුදාව වංගගිරියේ උගුල්වලට අහුවෙන්න ඇති අවදානම ගන්නවත් ලූක්ට ඕනෑ වෙන්නෙ නැහැ. එයාට උවමනා ඕනෑම තැනකට යන්න ඉඩ ලැබෙයි - ඉක්මනින් වගේම පරිස්සමෙන්. එයා මුලින්ම අපිව සහමුලින් විනාශ කරන්න අර්ධ-ලෝහිත කඳවුරට එයි. ඊට පස්සේ... ඔලිම්පස්වලට."

මුළුමනින්ම නිහඬ වුණු කඩු හරඹ පිටිය තුළ ඇසුණු එකම හඬ වුණේ මිසිස් ඕ'ලෙරී, එයාගේ සෙල්ලම් ගවයාව කෑලි කරන හඬ විතරයි: *ස්ක්වීක්! ස්ක්වීක්!*

අන්තිමේ දි බෙකන්ඩොර්ෆ්, එයාගේ යෝධ අත් දෙක මේසය මත තැබුවා. "තත්පරයක් ඉන්න. ඇනබෙත්, ඔයා කිවුවා නේද 'ඩෙඩලස්ව එයාගේ පැත්තට නම්මගත්තොත්' කියලා? ඒ කියන්නේ ඩෙඩලස් මැරිලා නැද්ද?"

කුයින්ටස් අමනාපයෙන් ගෙරෙව්වා. "මාත් එහෙම හිතනවා. එයා ජීවත් වෙලා හිටියේ, කොයි කාලෙ ද, අවුරුදු තුන්දාහකට කලින් නේද? ඒ වගේම එයා පණ පිටින් හිටියත්, පරණ කතන්දරවල කියන්නේ එයා වංගගිරියෙන් පැනලා ගියා කියලා නෙවෙයි ද?"

කයිරොන් නොසන්සුන්ව කුර ගැසුවා. "ඒක තමයි ප්‍රශ්නේ, මගේ හිතවත් කුයින්ටස්. කවුරුවත් දන්නෙ නැහැ. ඒ ගැන එක එක කටකතා කියනවා... හොඳයි, ගොඩක් කරදරකාරී කටකතා ඩෙඩලස් ගැන කියනවා. ඒත් එකක් කියනවා එයා ජීවිතේ අන්තිම කාලේ වෙද්දි ආපහු වංගගිරිය ඇතුළට අතුරුදහන් වුණාලු. සමහරවිට එයා තවමත් එහෙ ඉන්නවා වෙන්න පුළුවන්."

මට හිතෙන් දකින්න ලැබුණු වයසක මනුස්සයා ගැන මම කල්පනා කළා. එයාට තිබුණේ කොයි තරම් දුර්වල පෙනුමක් ද කියනවා නම්, එයා අවුරුදු තුන්දාහක් තියා තව සතියක්වත් පණ ගැට ගහගෙන ඉන්න ඇති කියලා විශ්වාස කරන්න මට අමාරු වුණා.

"අපි ඇතුළට යන්න ඕනෑ," ඇනබෙත් දැනුම් දුන්නා. "ලූක්ට කලින් අපි වැඩපොළ හොයාගන්න ඕනෑ. ඩෙඩලස් තවම ජීවත් වෙනවා නම්, ලූක්ට නෙවෙයි අපිට උදවු කරන්න කියලා අපි එයාට ඒත්තු ගන්වන්න ඕනෑ. 'අරියඩ්නිගේ නූල' තවමත් තියෙනවා නම්, ඒක ලූක්ගේ අතට නොයන්න අපි වගබලා ගන්න ඕනෑ."

"පොඩ්ඩක් ඉන්න," මම කිව්වා. "අපි ආක්‍රමණයක් ගැන වද වෙනවා නම්, ඇයි දොරටුව පුපුරවලා, උමග වහලා දාන්නැත්තේ?"

"අන්න වැඩේ!" ග්‍රෝවර් කිව්වා. "මම ඩයිනමයිට් අරන් එන්නම්!"

"ඒක එච්චර ලේසි නෑ, මෝඩයෝ," ක්ලැරිස් ගෙරෙව්වා. "අපි ෆීනික්ස්වල හොයාගත්ත දොරටුවට එහෙම කරන්න හැදුවා. ඒක හරි ගියේ නැහැ."

ඇනබෙත් ඔළුව වැනුවා. "වංගගිරිය කියන්නේ මායා නිර්මාණයක්, පර්සි. ඒකෙ එක දොරටුවක් වහලා දාන්නත් මහා බලයක් ඕනෑ වෙනවා. ෆීනික්ස්වල දි, ක්ලැරිස් සම්පූර්ණ ගොඩනැගිල්ලක්ම කඩා බිඳ දැම්මා. ඊට පස්සෙත් වංගගිරි දොරටුව අඩි කීපයක් එහාට ගියා විතරයි. අපිට කරන්න පුළුවන් හොඳම දේ තමයි වංගගිරිය හසුරුවන හැටි ලූක්ට ඉගෙන ගන්න ඉඩ නොදෙන එක."

"අපිට සටන් කරන්න පුළුවන්," ලී ෆ්ලෙචර් කිව්වා. "දොරටුව තියෙන තැන දැන් අපි දන්නවා. අපි ආරක්ෂක සේනාංකයක් පෙළ ගස්වලා උන් එනකල් බලන් ඉමු. හමුදාවක් ඒක හරහා එන්න හැදුවොත්, අපේ දුනුවල රහ බලන්න උන්ට ලැබෙයි."



"ඒකත් එකටම අපි ආරක්ෂක සේනාංකයක් පෙළ ගස්වනවා," කයිරොන් එකඟ වුණා. "ඒත් මට බය, ක්ලැරිස් කිව්වා හරි. මායා බැමි අවුරුදු සිය ගාණක් මේ කඳවුර ආරක්ෂා කළා. අපේ බැමි මග ඇරලා, රාක්ෂ හමුදාවක් කඳවුර මැද්දට අරන් එන්න ලූක්ට ඉඩ ලැබුනොත්... එයාලව පරාද කරන්න තරම් ශක්තියක් අපිට නැති වෙයි."

ඒ ආරංචිය ගැන කිසිවෙක් සතුටු වෙන බවක් පෙනුනේ නැහැ. කයිරොන් කියන්නේ සාමාන්‍යයෙන් ශුභවාදීව බලන්න උත්සහ කරන කෙනෙක්. ප්‍රහාරයක් මැඩ පවත්වන්න තරම් හැකියාවක් අපිට නැති වෙයි කියලා එයා හිතනවා නම්, ඒක හොඳ දෙයක් නෙවෙයි.

"අපිට එයාලට කලින් ඩෙඩලස්ගේ වැඩපොළට යන්න වෙනවා," ඇනබෙත් ස්ථිර හඬින් කිව්වා. "අරියඩ්නිගේ නූල හොයාගෙන, ලූක් ඒක පාවිච්චි කරන්න තියෙන ඉඩ අහුරුවන්න වෙනවා."

"ඒත් කාටවත් ඒක හරහා යන්න බැහැ නේ," මම කිව්වා. "අපිට තියෙන්නෙ මොන වගේ අවස්ථාවක් ද?"

"මම අවුරුදු ගාණක් තිස්සේ ගොඩනැගිලි නිර්මාණ ශිල්පය ඉගෙන ගත්තේ," එයා කිව්වා. "ඩෙඩලස්ගේ වංගගිරිය ගැන වෙන කාටත් වඩා හොඳට මම දන්නවා."

"ඒ ගැන කියවලා."

"හොඳයි, ඔව්."

"ඒක මදි."

"ඒක ඇති වෙන්න ඕනෑ!"

"ඒක එහෙම නෑ!"

"ඔයා මට උදවු කරනවද නැද්ද?"

අනෙක් අය ටෙනිස් තරගයක් නරඹනවා වගේ ඇනබෙත් සහ මා දිහා බලා ඉන්න බව මට තේරුම් ගියා. මිසිස් ඕ'ලෙරී යැක් ගවයාගේ රෝස පාට රබර් ඔළුව ඉරා දමද්දි එයින් *ඊීක්!* හඬ නැගුණා.

කයිරොන් උගුර පෑදුවා. "මුල් දේ මුලින්ම. අපිට ගවේෂණයක් උවමනායි. කවුරුහරි වංගගිරියට ඇතුළු වෙලා, ඩෙඩලස්ගේ වැඩපොළ හොයාගෙන, ලූක් ඒක මේ කඳවුර ආක්‍රමණය කරන්න පාවිච්චි කරන එක වළක්වන්න ඕනෑ."

"මේ ගවේෂණය මෙහෙයවන්න ඕනෑ කවුද කියලා අපි හැමෝම දන්නවා," ක්ලැරිස් කිවුවා. "ඇනබෙත්."

ඊට එකඟතාවය පළ කරන මිමිණුම් හඬවල් ඇසුණා. ඇනබෙත් පුංචි කාලේ ඉඳල ම තමන්ගෙ ම ගවේෂණයකට යන්න මග බලා සිටි බව මම දන සිටියා. ඒ වුණත් එයා හිටියේ අපහසුවෙන් වගෙයි.

"මම තරමට ම ඔයත් කරලා තියෙනවා නේ, ක්ලැරිස්," එයා කිවුවා. "ඒ නිසා ඔයත් යන්න ඕනෑ."

ක්ලැරිස් ඔළුව හෙල්ලුවා. "මම නම් ආයේ ඒක ඇතුළට යන්නෙ නැහැ."

ට්‍රැවිස් ස්ටොල් මහ හඬින් හිනාවුණා. "ඇයි ඔයා බය ද, ක්ලැරිස්, කිකිළි?"

ක්ලැරිස් වාඩි වී සිටි තැනින් නැගිට්ටා. මම හිතුවේ එයා ට්‍රැවිස්ව කුඩු පට්ටම් කරන්න යනවා කියලයි. ඒත් එයා වෙවුලන කටහඬින් කතා කළා: "ඔහේට කිසි දෙයක් තේරෙන්නෑ, මැට්ටෝ. මම ආයේ කවදාවත් ඒක ඇතුළට යන්නෙ නැහැ. කවදාවත් ම නැහැ!"

එයා කඩු තරඟ පිටියෙන් ඉවතට දිවුවා.

ට්‍රැවිස් ලැජ්ජාවෙන් වටේට බැල්මක් හෙළුවා. "මම හිතලා නෙවෙයි-"

කයිරොන් අතක් එසෙව්වා. "අසරණ කෙල්ලට ගෙවන්න වුණේ ලේසි පහසු අවුරුද්දක් නෙවෙයි. දූන්, ඇනබෙත් මේ ගවේෂණය මෙහෙයවන්න ඕනෑ කියන කාරණයට හැමෝම එකඟයි ද?"

කුයින්ටස් හැර අනෙක් හැමෝම ඔළුව වැනුවා. එයා අත් බැඳගෙන මේසයට රවාගෙන සිටියා, ඒත් ඒ බව වෙන කාගෙවත් සැලකිල්ලට හසු වුණා ද, මට විශ්වාසයක් තිබුනේ නැහැ.

"බොහොම හොඳයි," කයිරොන් ඇනබෙත් වෙතට හැරුණා. "මගේ දරුවෝ, ඔයාකල් බැහැ දකින්න ඔයාගෙ වාරය ඇවිත්. ඔයා යන විදිහටම එතැනින් ආපහු ආවොත්, අපි ඊළඟට කරන දේ සාකච්ඡා කරමු."

***

ඇනබෙත් එන තුරු බලා හිඳීම, මම ඔයාකල් බැහැ දකින්න ගිය ගමනටත් වඩා අමාරු වුණා.



මීට කලින් මම දෙවතාවක් එය අනාවැකි කියනවා අසා තිබුණා. පළවෙනි වතාවේ එය සිදු වුණේ මහ ගෙදර දූවිලි පිරුණු අට්ටාලයේ දියි. ඩෙල්ෆි හි ආත්මය නිදා සිටි, මමියක් බවට පත් කළ හිපි ගැහැනු කෙනෙකුගේ සිරුර තිබුණේ එතැනයි. දෙවෙනි වතාවේ, ඔයාකල් කැලෑවේ පොඩ්ඩක් ඇවිදින්න එළියට ඇවිත් තිබුණා. ඒ ගැන මම තවමත් හීනෙන් බය වුණා.

ඔයාකල්ගෙන් අනතුරක් වෙයි කියලා මට නම් එයා ළඟ දී දැනිලා නැහැ. ඒ වුණත් සිහි විකල් වුණ, එහෙමත් නැත්නම් ඇත්ත වගේ දර්ශන පෙනිලා බයට ම මැරුණු කඳවුරුකරුවෝ ගැන කතන්දර මට අහන්න ලැබී තිබුණා.

ඇනබෙත් එන තුරු මග බලමින් මම පිටියේ ඉහළ පහළ සක්මන් කළා. මිසිස් ඕ'ලෙරි දවල් කෑම කමින් සිටියා. එයට මස් රාත්තල් සිය ගාණකුත්, කුණු බැරල්වල පියනක් තරම් ලොකු බලු විස්කෝතුත් අඩංගු වුණා. කුයින්ටස් ඒ තරම් ලොකු බලු විස්කෝතු කොහෙන් හොයා ගත්ත ද හිතලා මම පුදුම වුණා. ඒවා සාමාන්‍ය වෙළඳ සැලක සුරතල් සතුන්ගේ කෑම රාක්කවල ගන්න ඇති කියලා නම් මට හිතුනේ නැහැ.

කයිරොන් කුයින්ටස් සහ ආර්ගස් සමග ගැඹුරු සාකච්ඡාවක යෙදී සිටියා. එයාලා අතරේ යම් දෙයකට විරෝධතාවයක් මතුවෙලා වගෙයි මට පෙනුණේ. කුයින්ටස් නොනවත්වා ම ඔළුව සොලවමින් සිටියා.

පිටියේ අනෙක් පැත්තේ ටයිසන් සහ ස්ටොල් සහෝදරයෝ සන්නාහ කෑලිවලින් ටයිසන් සෑදූ චූටි ලෝකඩ කරත්ත තරඟෙට පදවමින් සිටියා.

ඉහළ පහළ සක්මන් කිරීම නවතා දැමූ මම කඩු සරඹ පිටියෙන් පිටවුණා. මම කෙත් යාය හරහා අඳුරේ නිසොල්මන්ව තිබුණු මහ ගෙදර අට්ටාලයේ ජනේලය දිහා බලා සිටියා. ඇනබෙත් මේ තරම් වෙලාවක් ගත්තෙ මොකද? මගේ ගවේෂණය ගත්ත නම් මේ තරම් වෙලාවක් ගියේ නැහැ කියලා මට සෑහෙන විශ්වාස වුණා.

"පර්සි," ගැහැනු ළමයෙක් රහසින් කතා කළා.

ජුනිපර් පඳුරු අතරේ සිටගෙන සිටියා. පැළෑටි වට කරගෙන සිටිද්දි එයා නොපෙනී යන විදිහ පුදුමාකාරයි.

එයා හදිසියෙන් මාව ළඟට කැඳෙව්වා. "ඔයා මේක දැනගන්න ඕනෑ: මම අර ගුහාව වගේ කැරකෙනවා දැකපු එකම කෙනා ලූක් විතරක් නෙවෙයි."

"ඒ කිවුවේ?"

එයා ආපසු හැරී කඩු සරඹ පිටිය දිහා බැලුවා. "මම ඉස්සර වෙලා දෙයක් කියන්නයි හැදුවේ, ඒත් එයත් එතැන හිටිය නේ."

"කවුද?"

"කඩු සටන් ගුරුතුමා," එයා කිවුවා. "එයා ගල් ගෙඩි වගේ ඇන-ඇන බලමින් හිටියා."

මගේ බඩ තදින් ඇකිළෙනවා වගේ දැනුණා. "කුයින්ටස්? කවද ද?"

"මං දන්නෙ නෑ: මං කාලය ගැන වැඩිය හිතන්නෙ නැහැ නේ. සමහරවිට සතියකට විතර කලින් වෙන්නැති, එයා මුලින් ම ආව දවස්වල."

"එයා මොනවද කරකර හිටියේ? එයා ඇතුළට ගියා ද?"

"මට- මට විශ්වාස නැහැ. එයා මහ අමුතුයි, පර්සි. එයා එතැනට එනවාවත් මම දැක්කෙ නැහැ. එක පාරටම එයා එතැනින් මතු වුණා. ඔයා ග්‍රෝවර්ට කියන්න ඕනෑ ඒක ගොඩක් අනතුරුදායකයි කියලා."

"ජුනිපර්?" ග්‍රෝවර් පිටිය තුළ සිට කතා කළා. "ඔයා කොහෙද ගියේ?"

ජුනිපර් සුසුමක් හෙළුවා. "මම දැන් ඇතුළට ගියොත් හොඳයි. මම කියපු දේ මතක තියාගන්න. ඒ මනුස්සයාව විශ්වාස කරන්නෙපා!"

එයා පිටිය තුළට දිවුවා.

මම මහ ගෙදර දිහා බලා සිටිද්දී වෙන කවරාදාකටත් වඩා නොසන්සුන් හැඟීමක් මට දැනුණා. කුයින්ටස් මොකක් හෝ දේකට අර අඳිනවා නම්...

මට ඇනබෙත්ගේ උපදෙස් උවමනා වුණා. ජුනිපර්ගේ ආරංචියට කොහොම ප්‍රතිචාර දක්වන්න ඕනෑ ද කියලා එයා දන්නවා ඇති. ඒත් එයා මොන ලෝකෙ ගිහිල්ල ද? ඔරකල් සමග සිද්ධ වෙන



දේ මොකක් වුණත්, ඒකට මේ තරම් වෙලාවක් ගත වෙන්න විදිහක් නැහැ.

අන්තිමේ දී මට තව දුරටත් ඉවසාගෙන ඉන්න බැරිවුණා.

ඒක නීතිවලට පටහැණි දෙයක් තමයි, ඒත් කවුරුවත් බලාගෙන හිටියේ නැති නිසා මම කන්දේ පහළටත්, කෙත් යාය හරහාත් දුවන්න පටන් ගත්තා.

***

මහ ගෙදර ඉදිරි සාලය අසාමාන්‍ය ලෙස නිහඬව තිබුණා. ගිනි උඳුන ළඟ කාඩ් සෙල්ලම් කරමින්, මිදි ගෙඩි කමින් ඉන්න ඩයනයිසියස්ව වෙනදාට හුරු පුරුදු දසුනක් වුණත්, මිස්ටර් ඩී තවමත් ඇවිල්ලා නැහැ.

මම කොරිඩෝව දිගේ ඇවිද යද්දී පොළොවේ ලෑලි කිරිකිරි ගෑවා. පඩිපෙළට ළඟා වුණාම, මම පසුබෑවා. තට්ටු හතරකට උඩින් අට්ටාලයට යන බිම් දොර ඇති. ඇනබෙත් එතැන ඇති. මම නිහඬව සිටගෙන ඇහුම්කන් දුන්නා. ඒත් මට අහන්න ලැබුණේ මම බලාපොරොත්තු වූ හඬක් නෙවෙයි.

ඉකි බිඳින හඬක්. ඒ වගේම ඒ හඬ ආවේ මට පහළිනුයි.

මම හෙමින් සීරුවේ පඩිපෙළ පිටුපසට ගියා. බිම් මහලේ දොර ඇර දමා තිබුණා. මහ ගෙදරට බිම් මහලක් තියෙන බවවත් මේ වෙනතුරු ම මම දැන සිටියේ නැහැ. ඇතුළට එබී බැලූ මට එහා කෙළවරේ ඇම්බ්‍රෝසියා සහ සංරක්ෂණය කළ ස්ට්‍රෝබෙරි පෙට්ටි ගොඩක් මැද වාඩි වී සිටින දෙන්නෙක්ව දකින්න ලැබුණා. එයින් එක් අයෙක් ක්ලැරිස්. අනේකා කඩමාලු වූ හමුදා මෝස්තරයේ කලිසමක් සහ කිලුටු කළු ටී-ෂර්ට් එකක් ඇඳ සිටි ගැටවර වයසේ කොල්ලෙක්. එයාගේ කොණ්ඩයේ තෙල් කුණු පිරිලා. එයා උරහිස් බදාගෙන ඉකි ගසමින් සිටියා. ඒ ක්‍රිස් රොඩ්‍රිගස්, ලූක්ට වැඩ කරන්න ගිය අර්ධ-ලෝහිතයා.

"ඔක්කොම හරි," ක්ලැරිස් එයාට කියමින් සිටියා. "තව නෙක්ටාර් වුට්ටක් බොන්න බලන්න."

"ඔයා මායාවක්, මේරි!" ක්‍රිස් මුල්ලකට පසුබැස්සා. "ය-යනවා යන්ඩ."

"මගේ නම මේරි නෙවෙයි." ක්ලැරිස්ගේ කටහඬ මෘදු, එහෙත් දුක්බර වුණා. ක්ලැරිස්ට ඒ වගේ හඬකින් කතා කරන්න පුළුවන් ඇති කියලා මම කවදාවත් හිතුවෙ නැහැ. "මගේ නම ක්ලැරිස්. මතක තියා ගන්න. කරුණාකරලා."

"මෙතැන කළුවරයි!" ක්‍රිස් මොර දුන්නා. "ගොඩාක් කළුවරයි!"

"එළියට එන්න." ක්ලැරිස් වාටු බස් කිවුවා. "ඉර එළිය ඔයාට උදව්වක් වෙයි."

"හිස්... හිස් කබල් දාස් ගාණක්. පොළොව දිගින් දිගටම එයාව සනීප කරනවා."

"ක්‍රිස්." ක්ලැරිස් බැගෑපත් වුණා. එයා කතා කළේ දූන් අඬන්න වගෙයි. "ඔයා සනීප වෙන්න ඕනෑ. අනේ. මිස්ටර් ඩී ළඟදිම ආපහු එයි. එයා මානසික ලෙඩ ගැන විශේෂඥයෙක්. එතකල් අල්ලගෙන ඉන්න."

ක්‍රිස්ගේ ඇස්වල තිබුණේ කොටු වුණ මීයෙකුගේ බැල්මක් - වනචාරී සහ බලාපොරොත්තු සුන් වූ බවක්. "මෙහෙන් පිට වෙන්න පාරක් නෑ. මේරි. පිට වෙන්න පාරක් නෑ."

ඒත් එක්කම මාව යාන්තමින් දකපු එයා බෙල්ල හිරවෙලා වගේ බිහිසුණු හඬක් පිට කළා. "පොසෙයිඩන්ගේ පුතා! එයා භයානකයි!"

ක්ලැරිස් මාව දකින්න නැතුව ඇති, බලාපොරොත්තු වෙමින් මම ආපස්සට ගියා. ක්ලැරිස් මගේ ඇඟට කඩා පනින්න එන හඬ අහන්න මම කන් දිගෙන සිටියා. ඒත් ඒ වෙනුවට මට ඇසුණේ එයා දුක්බර ආයාචනාත්මක හඬින් නොනවත්වා ම ක්‍රිස්ට කතා කරමින්, තව නෙක්ටාර් ටිකක් පොවන්න උත්සහ කරන හඬ විතරයි. සමහරවිට ඒකත් ක්‍රිස්ගේ මනස්ගාතයක් කියලා එයා හිතන්න ඇති. ඒත්... *පොසෙයිඩන්ගේ පුතා* ක්‍රිස් මගේ දිහා බලා සිටියා වුණත්, එයා කතා කළේ කොහෙත්ම මං ගැන නෙවෙයි කියන හැඟීම මට දැනුනේ ඇයි?

ඒ වගේම ක්ලැරිස්ගේ කරුණාවන්තකම - එයාගේ හිත ගත් කෙනෙක් ඇති කියලා මට කවදාවත් හිතිලා තිබුනේ නැහැ; ඒත් එයා ක්‍රිස්ගේ නම කියපු විදිහ... ක්‍රිස් පැති මාරු කරන්න කලින් ක්ලැරිස් එයාව දැනගෙන හිටියා. මම තේරුම් ගත්තටත් වඩා ගොඩක් හොඳට එයා ක්‍රිස්ව දැනගෙන ඉඳලා. එතකොට දැන් එයා එළියට එන්න බයේ, අඳුරු බිම් ගෙයක් ඇතුලේ වෙවුලමින්, මේරි කියලා කෙනෙක් ගැන



දොඩවමින් සිටියා. ඉතින් ක්ලැරිස්ට වංගගිරිය පැත්ත පළාතකටවත් යන්න උවමනා නොවුණු එකේ පුදුමයක් නැහැ. ඒක ඇතුලේ දී ක්‍රිස්ට මොනවා වෙන්න ඇති ද?

මට ඉහලින් ක්‍රීක් හඬක් ඇසුණා - හරියට අට්ටාලයේ දොර ඇරෙනවා වගේ - ඒත් එක්කම මම ඉදිරි දොර වෙත දිවුවා. මට උවමනා වුණේ ඒ ගෙදරින් පිට වෙන්නයි.

***

"මගේ දරුවෝ," කයිරොන් කිවුවා. "ඔයා ඒක කළා."

ඇනබෙත් පිටිය තුළට ඇවිද ආවා. ගල් බංකුවක් මත වාඩි වූ එයා බිම බලාගත්තා.

"හොඳයි?" කුයින්ටස් ඇසුවා.

ඇනබෙත් මුලින් ම බැලුවේ මගේ දිහාවයි. එයා මට අනතුරු අඟවන්න උත්සහ කරනවා ද, නැත්නම් එයාගේ ඇස්වල වූ බැල්මේ තිබුණේ තනිකර ම බය ද කියලා මට තේරුනේ නැහැ. ඊට පස්සේ එයාගේ බැල්ම කුයින්ටස් ළඟ නැවතුණා. "මට අනාවැකිය ලැබුණා. මම ඩෙඩලස්ගේ වැඩපොළ හොයාගෙන යන ගවේෂණයේ මූලිකත්වය ගන්නවා."

එයට කිසිවෙක් ඔල්වරසන් දුන්නෙ නැහැ. මං කියන්නේ, අපි හැමෝම ඇනබෙත්ට හිතවත් වුණා, ඒ වගේම එයාට ගවේෂණයක් ලැබෙනවා දකින්න අපිට ඕනෑ කළා. ඒත් මේ ගවේෂණය නම් හිතා ගන්නත් බැරි තරම් අන්තරාදායක එකක් වගෙයි පෙනුණේ. ක්‍රිස් රොඩ්‍රිගස්ට සිදු වී ඇති දේ දැක්කට පස්සේ, ඒ අද්භූත වංගගිරියට ඇනබෙත් බහිනවා කියලා හිතන්නවත් මට ඕනෑ වුනේ නැහැ.

කයිරොන් දූවිලි පොළොව මත කුරයක් ඇතිල්ලුවා. "අනාවැකියේ හරියට ම කිවුවේ මොනවද, මගේ දරුවෝ? ඒකෙ වචන යෙදුණු විදිහ ගොඩක් වැදගත්."

ඇනබෙත් ගැඹුරු හුස්මක් ගත්තා. "මම, අත්... හොඳයි, ඒකෙ කිවුවේ, '*නුඹට අනන්ත වංගගිරියේ අන්ධකාරය තුළ කණින්න සිදු වේවි...*'"

අපි බලා සිටියා.

*"මළගිය ඇත්තා, දෝහියා සහ නැති වූ නැගැන්නා නැගී සිටිවි."*

Scanned with CamScanner

එයින් ග්‍රෝවර් ඇවිස්සුණා. "නැති වූ තැනැත්තා! ඒ කියන්නේ පෑන් වෙන්න ඕනෑ! ඒක නම් නියමයි!"

"මළගිය ඇත්තෙකුයි ද්‍රෝහියෙකුයි එක්ක." මම එකතු කළා. "එච්චර නියම නැහැ."

"තව?" කයිරොන් ඇසුවා. "ඉතුරු ටික මොකක්ද?"

*"භූත රජුගේ අතින් තුඹගේ නැගීම හෝ බැසීම සිදු වේවි,"* ඇනබෙත් කිවුවා. *"ඇතීනාගේ දරුවා අවසන් වරට නැගී සිටීවි."*

හැම දෙනාම අන්ද මන්ද වෙලා වටපිට බැලුවා. ඇනබෙත් ඇතීනාගේ දුවෙක්. ඒ වගේම අවසන් වරට නැගී සිටින කතාව ඒ හැටි හොඳ දෙයක් නෙවෙයි.

"හේයි... අපි දන්නම අන්තිම නිගමනයකට බහින්න හොඳ නැහැ." සිලේනා කිවුවා. "ඇතීනාගේ එකම දරුවා ඇනබෙත් නෙවෙයි නේ, නේද?"

"ඒත් කවුද භූත රජා?" බෙකන්ඩොර්ෆ් ඇසුවා.

කිසිවෙක් එයාට පිළිතුරු දුන්නේ නැහැ. නිකෝ මළගිය ආත්ම කැඳවනවා දුටු අයිරිස්-පණිවුඩය ගැන මම කල්පනා කළා. අනාවැකිය එයට සම්බන්ධයි කියලා මට හැඟෙන්න ගත්තා.

"ඒකෙ තව පේළි තියෙනව ද?" කයිරොන් ඇසුවා. "අනාවැකිය සම්පූර්ණ නැහැ වගෙයි නේ."

ඇනබෙත් පැකිළුණා. "මට හරියට ම මතක නැහැ."

කයිරොන් ඇහිබැමක් එසෙව්වා. ඇනබෙත්ට කොයි තරම් හොඳ මතකයක් තියෙනව ද කියලා හැමෝම දන්නවා. එයාට අහන්න ලැබුණු දෙයක් කවදාවත් අමතක වෙන්නෙ නැහැ.

ඇනබෙත් බංකුව මත එහා මෙහා වුණා. "මොකක් හරි... වීරයෙකුගේ අන්තිම හුස්ම සමග සියල්ල විනාශ වෙන කතාවක්."

"ආයේ?" කයිරොන් ඇසුවා.

ඇනබෙත් සිටගත්තා. "බලන්න, වැදගත් ම දේ තමයි, මට ඇතුළට යන්න වෙනවා. මම වැඩපොළ හොයාගන්නවා, ඊට පස්සේ ලූක්ව නවත්තනවා. ඒකට... මට උදවු ඕනෑ." එයා මගේ දිහාවට හැරුණා. "ඔයා එනව ද?"



මම ඒ ගැන දෙපාරක් හිතන්න කල් ගත්තෙ නැහැ. "මං එනවා."

දවස් ගාණකට පස්සෙ එයාගේ මූණේ හිනාවක් දකින්න ලැබෙද්දි ඒ තීරණය ගන්නට පාඩුවක් නැහැ කියලා මට හිතුණා. "ග්‍රෝවර්, ඔයත් එනවා නේ? වනගත දෙවියෝ බලන් ඉන්නවා."

එයා පොළොව යට තැන්වලට කොච්චර වෛර කරනව ද කියලා ග්‍රෝවර්ටම අමතක වෙලා වගෙයි. 'නැති වූ තැනැත්තා' ගැන කියවුණු පේළියට එයාව පණ ගහලා තිබුණා. "මම පොඩි බඩගින්නට කන්න වැඩිපුර ටින් කෑන් එහෙම අහුර ගන්නම්!"

"එතකොට ටයිසන්," ඇනබෙත් කිවුවා. "මට ඔයාවත් ඕනෑ වෙනවා."

"යේ! ඩෝං ගාලා පුපුරුවන වෙලාව ඇවිල්ලා!" ටයිසන් කොයි තරම් තදින් අත්පුඩි ගැසුවා ද කියනවා නම්, ඒ හඬට මුල්ලක නිදි කිරමින් සිටි මිසිස් ඕ'ලෙරිවත් ඇහැරුණා.

"ඔහොම ඉන්න, ඇනබෙත්," කයිරොන් කිවුවා. "මේක පෞරාණික නීතිවලට විරුද්ධයි නේ. වීරයෙකුට අරන් යන්න පුළුවන් හවුල්කාරයෝ දෙන්නෙක් විතරයි."

"මට එයාලා හැමෝම ඕනෑ වෙනවා," එයා බල කරා. "කයිරොන්, ඒක ගොඩක් වැදගත්."

ඇනබෙත් ඒ තරම් ස්ථිරව ඒ ගැන කිවුවේ ඇයි කියලා මට තේරුනේ නැති වුණත්, එයා ටයිසන්වත් එකතු කර ගැනීම ගැන මම සතුටු වුණා. ටයිසන්ව දාලා යන එක ගැන මට හිතන්නවත් බැරිවුණා. එයා ගොඩක් ලොකුයි, ශක්තිමත් වගේම යාන්ත්‍රික දේවල් තේරුම් ගන්නත් දක්ෂයි. සැටර්ලාට වගේ සයික්ලොප්ස්ලාට පොළොව යටට යන්න කිසිම ප්‍රශ්නයක් තිබුනේ නැහැ.

"ඇනබෙත්." කයිරොන් කලබලෙන් වලිගය ගැසුවා. "හොඳට හිතලා බලන්න. ඔයා පෞරාණික නීති කඩන්නයි යන්නේ, එහෙම කළොත් හැම වෙලාවෙම ඒකට විපාක අත් විඳින්නත් වෙනවා. ගිය ශීත සෘතුවේ, ආර්ටෙමිස්ව බේරගන්න ගවේෂණයකට පස්දෙනෙක් ගියා. තුන්දෙනෙක්ට විතරයි ආපහු එන්න ලැබුණේ. ඒ ගැන හිතන්න. තුන කියන්නේ පූජනීය ඉලක්කමක්. ඉරණම ලියන තුන්දෙනෙක්, ෆියුරිලා තුන්දෙනෙක්, ක්‍රෝනොස්ගේ ඔලිම්පියානු පුතාලා තුන්දෙනෙක්

වා ඉන්නවා. ඒක අනතුරු ගොඩකට එදිරිව නැගී සිටින යක්ෂිනියන් ගැනයක්. භයානක්.. ඒක නම් අවදානම්."

ඇනබෙත් ගැඹුරු හුස්මක් ගත්තා. "මං දන්නවා. ඒත් අපිට ඒක කරන්න ම වෙනවා. කරුණාකරලා."

කයිරොන් මේකට කොහෙත්ම කැමති නැති බව මට තේරුණා. කුයින්ටස් අපිව අධ්‍යයනය කරමින් සිටියේ, හරියට අපි අතරින් කවුරු ආපසු පණ පිටින් එයි ද කියලා තීරණය කරන්න උත්සහ කරනවා වගෙයි.

කයිරොන් සුසුමක් හෙළුවා. "බොහෝම හොඳයි. දැනට අපි විරාමයක් ගනිමු. ගවේෂණයේ සාමාජිකයෝ තමන් විසින් ම සූදානම් වෙන්න ඕනෑ. හෙට එළි වෙද්දි, අපි ඔයාලව වංගගිරියට පිටත් කරනවා."

***

රැස්වීමට ආව අය විසිරී යද්දි කුයින්ටස් මාව පැත්තකට ඇදගෙන ගියා.

"මට මේ ගැන මහා නරක හැඟීමක් දැනෙනවා," එයා මට කිව්වා.

මිසිස් ඕ'ලෙරී සතුටින් වලිගය වනමින් එතැනට දුවගෙන ආවා. එයා මගේ පාවුලට එයාගේ පලිහ දැමුවා ම මම එයාට අල්ලන්න ඒක විසි කළා. එයා පලිහ පසුපස උඩ පනිමින් දුවද්දි කුයින්ටස් ඒ දිහා බලා සිටියා. එයා වංගගිරිය ගැන ඔත්තු බලමින් හිටියා කියලා ජුනිපර් කියූ කතාව මට මතක් වුණා. ඒ නිසා මම එයාව විශ්වාස කළේ නැහැ. ඒ වුණත් එයා මගේ දිහා බලද්දි, එයාගේ ඇස්වල ඇත්තටම කණස්සල්ලක් තියෙන බව මම දුටුවා.

"ඔයා ඒක ඇතුළට යනවා කියලා හිතන්නවත් මම කැමති නැහැ," එයා කිව්වා. "ඔයාලා කිසිම කෙනෙක්. ඒත් ඔයාලට යන්නම ඕනෑ නම්, ඔයාලා එකක් මතක තියාගන්න ඕනෑ. වංගගිරිය තියෙන්නේ ඔයාලව රවට්ටන්න. ඒක ඔයාලගේ හිත් අවුල් කරයි. අර්ධ-ලෝහිතයන්ට ඒක ගොඩක් අනතුරුදායකයි. අපි ලේසියෙන් ම හිත කලබල කරගන්න නිසා."

"ඔයා ඒක ඇතුළට ගිහින් තියෙනව ද?"



"ගොඩක් කාලෙකට කලින්," එයාගේ කටහඬේ කලබලයක් තිබුණා. "මම පණ බේරගෙන පැන ගත්තේ බොහොම අමාරුවෙන්. ඒක ඇතුළට යන ගොඩක් අය එච්චර වාසනාවන්ත නැහැ."

එයා මගේ උරහිස් අල්ලා ගත්තා. "පර්සි, වඩාත්ම වැදගත් දේ මත ඔයාගේ හිත රඳවා ගන්න. එහෙම කරන්න පුළුවන් නම්, ඔයාට පාර හොයා ගන්න පුළුවන් වෙයි. ඒ වගේම, මෙන්න. මට ඔයාට දෙන්න දෙයක් තියෙනවා."

එයා මට චූටි රිදී බටයක් දුන්නා. ඒක කොයි තරම් සීතල ද කියනවා නම් තව පොඩ්ඩෙන් මම ඒක අත අරිනවා.

"නළාවක්?" මම ඇසුවා.

"බලු නළාවක්," කුයින්ටස් කිවුවා. "මිසිස් ඕ'ලෙරී ට."

"ම්, ස්තුතියි, ඒත්-"

"වංගගිරිය ඇතුළේ මේක වැඩ කරන්නෙ කොහොමද කියල ද අහන්නේ? මටත් ඒ ගැන සීයට සීයක්ම විශ්වාස නැහැ. ඒත් මිසිස් ඕ'ලෙරී කියන්නෙ යම බල්ලෙක් නේ. එයා කොච්චර දුරින් හිටියත්, කවුරුහරි එයාට අඬගැහුවොත් එයාට එතැනින් මතු වෙන්න පුළුවන්. ඔයා ළඟ මේක තියෙනවා කියලා දැනගෙන ඉන්න එක මගේ හිතට සහනයක් වෙයි. ඔයාට ඇත්තටම උදවුවක් ඕනෑ වුනොත්, ඒක පාවිච්චි කරන්න; හැබැයි පරිස්සමෙන්, ඔය නළාව හදලා තියෙන්නේ ස්ටයිජියන් අයිස්වලින්."

"මොන අයිස්වලින්?"

"ස්ටයික්ස් ගඟේ ඒවාගෙන්. ඒක හදන්න ගොඩක් අමාරුයි. හරිම සිවුමැලියි. ඒක දිය වෙන්නෙ නැහැ, ඒත් ඔයා පිම්බාම ඒක කුඩු වෙලා යයි. ඒ නිසා ඔයාට ඒක පාවිච්චි කරන්න ඉඩ ලැබෙන්නෙ එක පාරක් විතරයි."

මම මගේ පරණ හතුරා, ලූක් ගැන හිතුවා. මම මගේ පළවෙනි ගවේෂණයට පිටත් වෙන්න කලින්, ලූක්ත් මට තෑග්ගක් දුන්නා - මාව මරණය වෙත ඇදගෙන යන්න නිර්මාණය කළ මායා සපත්තු කුට්ටමක්. කුයින්ටස් හොඳ කෙනෙක් වගෙයි පෙනුණේ. එයා අපි ගැන ගොඩක් හිතුවා. ඒ වගේම මිසිස් ඕ'ලෙරී එයාට කැමති වීමත් සලකා බැලිය යුතු වුණා. කෙළ ගෑවුණු පලිහ මගේ කකුල් දෙක ළඟ දැමූ මිසිස් ඕ'ලෙරී උනන්දුවෙන් බිරුවා.

කුයින්ටස්ව සැක කිරීම ගැන මට ලැජ්ජාවක් දැනුණා. ඒත් එහෙම බලද්දි, මම එතාවත් ලූක්වත් විශ්වාස කළා නේ.

"ස්තූතියි," මම කුයින්ටස්ට කිව්වා. හිම වගේ සීතල තලාව සාක්කුවට දමාගත් මම ඒක කවදාවත් පාවිච්චි නොකරන්න මටම පොරොන්දු වුණා. ඊට පස්සෙ මම ඇනබෙත්ව හොයාගෙන දිව්වා.

***

කඳවුරේ මෙච්චර කල් ඉඳලත්, මම කවදාවත් ඇතිනා කැබිනය ඇතුළට ගිහින් තිබුණෙ නැහැ.

රිදී පාට ගොඩනැගිල්ලක් වූ එය සුදු පාට තිර රෙදි දැමූ, අරුමෝසම් මෝස්තර නැති තැනක් වුණා. එහි දොරකඩට ඉහළින් ගලින් කැටයම් කළ බකමූණෙක් එල්ලා තිබුණා. මම ළං වෙද්දි බකමූණාගේ අගේනි ඇස් මාව ලුහුබඳිනවා වගෙයි පෙනුණේ.

"හෙලෝ?" මම ඇතුළට කතා කළා.

කිසිවෙක් උත්තර දුන්නෙ නැහැ. ඇතුළට අඩිය තැබූ මට හුස්ම ගන්නත් අමතක වුණා. එතැන මොළේ වැඩි ළමයින්ගේ වැඩපොළක් වගෙයි පෙනුණේ. කාමරයේ නිදන ඇඳන් ඔක්කොම එක බිත්තියකට තේන්තු කරලා තිබුණේ හරියට එයාලට නින්ද ඒ තරම් වැදගත් නැහැ වගෙයි. පට්ටල් බංකු, මේස, උපකරණ සහ ආයුධවලට කාමරයේ වැඩි ඉඩක් වෙන් වී තිබුණා. කාමරය පිටුපස වෙන් වී තිබුණේ පරණ ලේඛන, ලෙදර් කවර දැමූ පොත් සහ කඩදාසි කවර දැමූ පොත් පිරුණු පුස්තකාලයකටයි. එතැන වාස්තු විද්‍යාඥයින් සැලසුම් ඇඳීමට පාවිච්චි කරන මේසයක්, කෝදු සහ කෝණමාන පොකුරක් වගේම ගොඩනැගිලිවල ත්‍රිමාන ආකෘතිත් දකින්න ලැබුණා. අති විශාල යුධ සිතියමක් සිවිලිමේ අලවා තිබුණා. ජනේල යට එල්ලා තිබුණු සන්නාහ කට්ටල ඉර එළිය වැදී දිලිසුණා.

ඇනබෙත් කාමරයේ පිටුපස පරණ ලේඛන අවුස්සමින් සිටියා.

"ටොක්, ටොක්?" මම කිව්වා.

එයා තිගැස්සී හැරී බැලුවා. "ඔහ්... හායි. ඔයා එනවා මට ඇහුනෙත් නැහැ."

"ඔයා හොඳින් ද?"



එයා අතේ තිබුණු ලේඛනයට රැව්වා. "විස්තර ටිකක් හොයාගන්න බැලුවේ. ඩෙඩලස්ගේ වංගිරිය කියන්න බැරි තරම් ලොකුයි. ඒ ගැන තියෙන කතා එකක්වත් එකකට එකක් එකඟ වෙන්නෙ නැහැ. තියෙන සිතියම් එකකවත් අගක්-මුලක් නැහැ."

වංගිරිය අපේ හිත් වියවුල් කරන්න උත්සහ කරනවා කියලා කුයින්ටස් කියපු කතාව ගැන මම හිතුවා. ඇනබෙත් දැනටමත් ඒක දන්නවා ඇති ද හිතලා මම පුදුම වුණා.

"අපි ඒක කොහොම හරි හොයාගමු," මම පොරොන්දු වුණා.

ලිහිල් වී තිබුණු එයාගේ කොණ්ඩය පැටලුණු තඹ පාට තිරයක් වගේ එයාගේ මුහුණ වටේට වැටී තිබුණා. එයාගේ අළු පාට ඇස් කළු පාටට හැරී පෙනුණා.

"මට ගවේෂණයක් මෙහෙයවන්න ඕනැකම තිබුණේ අවුරුදු හතේ ඉඳලා," එයා කිව්වා.

"ඔයා ඒක නියමෙට ම කරන්නයි යන්නේ."

එයා ස්තූතිවන්ත බැල්මකින් මගේ දිහා බැලුවා, ඒත් ඊට පස්සෙ එයා රාක්කවලින් පිටට ගත් පොත් සහ ලේඛන ගොඩ දිහාවට ඇස් හරවා ගත්තා. "මම ඉන්නෙ හිතේ කරදරෙන්, පර්සි. මට තිබුණේ ඔයාව මේකට ගාවගන්නැතුව ඉන්න, ටයිසන්, ග්‍රෝවර් දෙන්නවත්."

"හේයි, අපි ඔයාගේ යාළුවෝ නේ. අපි ඒක මග අරින්නෑ."

"ඒත්..." එයා කියන්න ගිය දේ ගිලගත්තා.

"මොකක්ද ඒක?" මම ඇසුවා. "අනාවැකිය ද?"

"ඒක ප්‍රශ්නයක් වෙන්නැති වෙයි කියලා මට විශ්වාසයි," එයා හින් හඬින් කිව්වා.

"අන්තිම පේළිය මොකක්ද?"

ඒ වෙලාවේ එයා කළ දෙයින් මම ඇත්තටම පුදුම වුණා. එයා දැසින් කඳුළු වැටෙන්න නොදී තදින් ඇසිපිය ගසමින්, දෑත් ඉදිරියට දිගු කළා.

මම අඩියක් ඉදිරියට තබා එයාව වැළඳ ගත්තා. මගේ බඩ ඇතුළේ සමනල්ලු පිරිලා වගේ කිතියක් පැතිරුණා.

"හේයි, ඒක... ඒකට කමක් නෑ." මම එයාගේ පිටට තට්ටු කළා.

කාමරයේ තිබුණු හැම දෙයක්ම මගේ අවධානයට හසු වුණා. රාක්කවල වූ පොත්වල ඇති චූටිම අකුරු පවා කියවන්න පුළුවන් කියලා මට හැඟුණා. ඇනබෙත්ගේ කොණ්ඩයෙන් ලෙමන් සබන් සුවඳක් හැමුවා. එයා හිටියේ ගැහෙමිනුයි.

"සමහරවිට කයිරොන් හරි ඇති," එයා කෙඳිරුවා. "මම නීති කඩනවා. ඒත් වෙන මොනවා කරන්න ද කියලා මම දන්නෙ නැහැ. මට ඔයාලා තුන්දෙනාව ම ඕනෑ. කරන්න ඕනෑ හරිම දේ ඒක කියලයි දැනෙන්නේ."

"ඒ ගැන වද වෙන්නෙපා," මම අමාරුවෙන් කියාගත්තා. "මීට කලිනුත් අපිට ඇති තරම් ප්‍රශ්න තිබිලා තියෙනවා නේ, අපි ඒ හැම එකක්ම විසඳුවා."

"මේක ඒවට වඩා වෙනස්. ඔයාලා කාටවත්... කරදරයක් වෙනවා දකින්න මට ඕනෑ නැහැ."

මට පිටුපසින් කවුදෝ උගුර පෑදුවා.

ඒ මැල්කම්, ඇනබෙත්ගේ අර්ධ සහෝදරයින්ගෙන් කෙනෙක්. එයාගේ මූණ තද රතු පාටට හැරිලා.

"ම්, සමා වෙන්න," එයා කිව්වා. "දුනු හරඹ පුහුණුව පටන් ගන්න යන්නෙ, ඇනබෙත්. කයිරොන් කිව්වා ඔයාව හොයාගෙන එන්න කියලා."

මම ඇනබෙත්ගෙන් ඈත් වුණා. "අපි මේ සිතියම් බලබලා හිටියා විතරයි," මම මෝඩ තාලෙට කිව්වා.

මැල්කම් කන්න වගේ මගේ දිහා බලා සිටියා. "හරි."

"කයිරොන්ට කියන්න මම ඉක්මනට එනවා කියලා," ඇනබෙත් කිව්වා ම මැල්කම් කඩිමුඩියේ එතැනින් පිටවුණා.

ඇනබෙත් දෑස් පිස දැමුවා. "ඔයා යන්න, පර්සි. මම දැන් දුනු හරඹවලට ලෑස්ති වුනොත් හොඳයි."

ජීවිතේ වෙන කවරදාකටත් වඩා අන්දබූත ගතියක් දැනෙද්දි මම ඔළුව වැනුවා. මට කැබිනයෙන් එළියට දුවන්න ඕනෑ වුණා... ඒත් මම එහෙම කළේ නැහැ.

"ඇනබෙත්?" මම කතා කළා. "ඔයාගේ අනාවැකිය. ඒකේ වීරයෙකුගේ අන්තිම හුස්ම ගැන කිව්ව පේළිය-"



"ඔයා කල්පනා කරන්නේ මොන වීරයාගෙ ද කියලා ද? මං දන්නෙ නැහැ."

"නෑ. වෙන දෙයක්. මං කල්පනා කළේ සාමාන්‍යයෙන් අන්තිම පේළියේ තාලයට ගැළපෙන්න ඊට කලින් පේළියක් තියෙනවා කියලා. ඒකෙ තිබුණේ- ඒක ඉවර වුණේ 'මරණය' වචනයෙන් ද?"

ඇනබෙත්ගේ ඇස් එයාගේ ලේඛන දිහාවට හැරුණා. "ඔයා දැන් ගියොත් හොඳයි, පර්සි. ගවේෂණයට යන්න ලෑස්ති වෙන්න. මම- මම උදේට ඔයාව මුණ ගැහෙන්නම්."

එයා අගක්-මුලක් නැති සිතියම් දිහා බලා ඉඳිද්දි මම එතැනින් පිටවුණා; ඒත් අපෙන් කෙනෙක් මේ ගවේෂණයට ගිහින් ආපහු පණ පිටින් එන්නේ නැති වෙයි කියන හැඟීම හිතෙන් ඉවත් කරගන්න මට බැරිවුණා.

Scanned with CamScanner

# 05

# නිකෝගෙන් මළවුන්ට හැපි මීල් සංග්‍රහයක්

අඩුම තරමේ ගවේෂණයට යන්න කලින් මට හොඳ නින්දක්වත් ලැබෙන්න ඇති කියලා ඔයා හිතනවා, නේද?

වැරදියි.

එදා රෑ හීනෙන් මම ගොස් සිටියේ ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩාවේ කන්තෝරු කාමරයටයි. එහි ජනේල හද එළියෙන් බැබළෙන මුහුදට විවර කර තිබුණා. හමා ආ සීතල සුළඟින් විල්ලුද තිර රෙදි සෙලවුණා.

ක්‍රෝනොස්ගේ රන් මිනී පෙට්ටිය ඉදිරියේ එලූ පර්සියානු බුමුතුරුණක් මත ලූක් දණ ගසාගෙන සිටියා. හද එළියට ලූක්ගේ වැලි සහ පාට කොණ්ඩය පිරිසිදු සුදු පාටින් පෙනුණා. එයා පෞරාණික ග්‍රීක කයිටොනයක් හැඳ, ඊට උඩින් සුදු හිමේෂන් කබායක් (පැරණි ග්‍රීක ජාතිකයින් වම් උරහිස මතින් සහ දකුණු අත යටින් දමා පැලඳි ඇඳුමක්) දමාගෙන සිටියා. සුදු ඇඳුම්වලින් එයාට ඔලිම්පස්වල සුළු දෙවියෙකු වගේ අකාලික සහ අපූර්ව පෙනුමක් ලැබී තිබුණා. මම අන්තිම වතාවට දකිද්දි වැම් කන්දෙන් පහළට වැටී එයා සිටියේ කැඩී බිඳී සහ සිහිසුන්වයි. ඒත් දැන් එයා සැපෙන් සනීපෙන් ඉන්නවා වගෙයි පෙනුණේ. ඕනෑවටත් වඩා සනීපෙන්.

"අපේ ඔත්තුකාරයෝ සතුටුදායක ආරංචි වාර්තා කරනවා, මගේ උතුමාණෙනි," එයා කිවුවා. "ඔබතුමා ජෙත කියපු විදිහට ම අර්ධ-ලෝහිත කඳවුරෙන් ගවේෂණයක් පිටත් කරනවා. ගනුදෙනුවේ අපේ පැත්ත සෑහෙන දුරට සම්පූර්ණයි."



විහිළුවයි. ක්‍රෝනොස්ගේ කටහඬ කිණිස්සක් වගේ මගේ හිත සිදුරු කළා. එහි කාරුණ්‍යය කැටී ගැසී තිබුණා. *යන ක්‍රමය හොයාගන්නට පස්සේ, පෙර්සි බල ඇණිය ඒක තරණ මම ම හොයියන්නම්.*

ලූක් සිතුවිලි එක්කාසු කරගන්න වගේ ඇස් පියාගත්තා. "මගේ උතුමාණෙනි, සමහරවිට ඒකට වෙලාසන වැඩි ඇති. ක්‍රියෝස් හරි හයිපරියන් හරි ඒක කළොත්-"

*නෑ.* ඒ හඬ සන්සුන් එහෙත් මුළුමනින්ම දැඩි වුණා. *මමයි මෙහෙයවන්නේ. තව ඒක හදවතක් අපේ පැත්තට එකතු වුනොත්, ප්‍රමාණවත් වෙයි. අනූ තරමේ මට වාරවර්වලින් සම්පූර්ණයෙන් නැගිටින්න පුළුවන් වෙයි.*

"ඒත් රූපය, මගේ උතුමාණෙනි..." ලූක්ගේ හඬ සැලෙන්න පටන් ගත්තා.

*මට නුඹේ කඩුව පෙන්වනවා, ලූක් කාසලන්.*

මගේ ඇඟ කිලිපොළා ගියා. මීට කලින් කවදාවත් මම ලූක්ගේ වාසගම අසා තිබුනේ නැති බව මට තේරුම් ගියා. ඒ ගැන මම කවදාවත් හිතලා තිබුනෙවත් නැහැ.

ලූක්, එයාගේ කඩුව පිටට ඇදලා ගත්තා. බැක්බයිටර්ගේ දෙපැත්ත කැපෙන - අර්ධ වානේ, අර්ධ දිව්‍යමය ලෝකඩ - තලය දුෂ්ට ලෙස දිලිසුණා. ඒ කඩුවෙන් මම කීප වතාවක් ම මැරුම් නොකා බේරුණේ අනූ නමයෙන්. මනුෂ්‍ය, රාක්ෂ දෙවර්ගය ම විනාශ කළ හැකි එය භයානක ආයුධයක්. මම ඇත්තටම බයවුණු එකම කඩුව එයයි.

*නුඹ, මට කැප වෙන්න පුතිඥා දුන්නා,* ක්‍රෝනොස් එයාට සිහිපත් කළා. *නුඹේ දිවුරුමට සාක්ෂියක් විදිහට නුඹ මේ කඩුව ගත්තා.*

"ඔව්, මගේ උතුමාණෙනි. ඒක මේ-"

*නුඹට බලය ඕනෑ වුණා. මම නුඹට ඒක දුන්නා. කාටවත් නුඹට හානියක් කරන්න බැහැ. ඉක්මනින් ම නුඹට දෙවිවරුන්ගේ සහ මිනිස්සුන්ගේ ලෝකය පාලනය කරන්න ලැබෙයි. නුඹට සිද්ධ වුණ වැරදිවලට පළිගන්න ඕනෑ නැද්ද? ඔලිම්පස් විනාශ වෙනවා දකින්න ඕනෑ නැද්ද?*

ලූක්ගේ ඇඟ පුරා වෙවුලීමක් පැතිරුණා. "ඕනෑ."

කාමරය රත්වන් එළියකින් පුරවමින් මිනී පෙට්ටිය දිලිසුණා. *එහෙනම් පහර දෙන බලකාය ලෑස්ති කරනවා. ගනුදෙනුව සිද්ධ වුණ හැටියේ ම, අපිට යන්න*

*පුළුවන් මුලින්ම, අර්ධ-ලෝහිත කඳවුර අපි කරලා දානවා. අර් කාද්‍රකාර විරයෝ ඊට එකතුවාට පස්සේ, අපි බලීමපස්වලට යනවා.*

කන්තෝරු කාමරයේ දොරට තට්ටු කරන හඬක් ඇසුණා. මිනී පෙට්ටියේ එළිය වියැකී ගියා. ලූක් නැගී සිටියා. කඩුව කොපුවට දමා, හැද සිටි සුදු ඇඳුම සකස් කරගත් එයා ගැඹුරු හුස්මක් ගත්තා.

"ඇතුළට එන්න."

දොර පියන් ඇරුණා. බ්‍රැකනෙයි - කකුල් වෙනුවට දෙබිඩි සර්ප කඳන් ඇති සර්ප ගැහැනු දෙන්නෙක් ඇතුළට ලිස්සාගෙන ආවා. එයාලා දෙන්නා මැදින් ඉස්කෝලේ හිටපු එම්පොසා චියර්ලීඩර්, කෙලි ඇවිදගෙන ආවා.

"හෙලෝ, ලූක්," කෙලි හිනාවුණා. රතු ගවුමකින් සැරසී සිටි එයාට හිත ඇදගන්නා පෙනුමක් තිබුණා. ඒත් මම එයාගේ සැබෑ ස්වරූපය දකලා තිබුණ නිසා එයා එකකට එකක් නොගැළපෙන කකුල්, රතු ඇස්, උල් දත් සහ ගිනි ගන්නා කොණ්ඩය සඟවාගෙන ඉන්නා බව මම දැන සිටියා.

"මේ මොකද, යක්ෂණියේ?" ලූක්ගේ කටහඬ නොසැලකිලිවන්ත වුණා. "මට කරදර කරන්නෙපා කියලා කිවුවා නේද."

කෙලි අමනාපයෙන් තොල් නෙරවූවා. "හරි නරකයි නේ. ඔයා ඉන්නෙ මහන්සියෙන් වගේ. හොඳ උරහිස් සම්බාහනයක් ගත්තොත් කොහොමද?"

ලූක් අඩියක් පස්සට වුණා. "ඔහේට වාර්තා කරන්න දෙයක් තියෙනවා නම්, ඒක කියනවා. නැත්නම් මෙතැනින් මකබෑවෙනවා!"

"මේ දවස්වල ඔයා මච්චරට ම කේන්ති ගන්නෙ ඇයි කියලා මට නම් තේරෙන්නෑ. ඉස්සර ඔයා අපිත් එක්ක කොච්චර විනෝදෙන් හිටිය ද."

"ඒ අර සියැටල්වල හිටපු කොල්ලට ඔහේ කරපු දේ මම දකින්න කලින්."

"ඔහ්, එයාගෙන් මට වැඩක් නැහැ," කෙලි කිවුවා. "නිකං කට ගැස්මක් විතරයි, ඇත්තටම. මගේ හදවත අයිති ඔයාට විතරයි කියලා ඔයා දන්නවා නේ, ලූක්."



"නෑ. නැතුවට කමක් නෑ. දැන් වාර්තාව දෙනවා, නැත්නම් මෙතැනින් යනවා."

කෙලි උරහිස් ඇකිළුවා. "හරි එහෙනම්. දිගු දුර කණ්ඩායම ලෑස්තියි. ඔයා හිතපු විදිහටම. අපිට පිටත් වෙන්න පුළුවන්-" එයා රවා බැලුවා.

"මොකද?" ලූක් ඇසුවා.

"කවුරු හරි ඉන්නවා," කෙලි කිවුවා. "ඔයාගේ හැඟීම් දැනීම් මොට්ට වෙලා එනවා, ලූක්. කවුරු හරි අපි ගැන ඔත්තු බලනවා."

එයා කන්තෝරු කාමරය පුරා සෝදිසියෙන් බැලුවා. එයාගේ ඇස් හරියට ම මගේ ළඟ නැවතුණා. එයාගේ මූණ විරූපී වුණා. උල් දත් නියවාගත් එයා පහර දෙන්න පැන්නා.

***

මම තිගැස්සී ඇහැරුණා. මගේ පපුවේ පිටි කොටනවා වගෙයි දැනුණේ. එම්පොසාගේ දළ මගේ උගුරට අඟලක් ඈතින් තිබුණේ කියලා මට දිවුරන්න වුණත් හැකියාව තිබුණා.

මට එහා පැත්තේ ඇඳේ ටයිසන් ගොරවමින් සිටියා. ඒ හඬ මාව ටිකක් සන්සුන් කළා.

හීනෙන් එතැන දකිමින් සිටි මාව කෙලිට දැනුණේ කොහොමද, මට හිතාගන්න බැරිවුණා. ඒත් මට දැනගන්න උවමනා තරමටත් වඩා දේවල් අහන්න ලැබී තිබුණා. ආක්‍රමණයට හමුදාවක් සූදානම්. ඒක ක්‍රෝනොස් විසින්ම මෙහෙයවන්න සූදානම්. දැන් එයාලට අර්ධ-ලෝහිත කඳවුර ආක්‍රමණය කරලා, විනාශ කරන්න උවමනා වුණේ වංගගිරිය හරහා ගමන් කරන්න ක්‍රමයක් විතරයි. ඒ වගේම පෙනෙන්න තිබුණු හැටියට ඒකත් ළඟදි ම සිද්ධ වෙයි කියලා ලූක් හිතනවා.

ඊ දෙගොඩහරි යාමය වුණත් නැතත්, ඒ වෙලාවෙ ම ගිහින් ඇනබෙත්ව ඇහැරවලා විස්තරය කියන්න මට පෙලඹවීමක් ඇති වුණා. කාමරය තුළ තිබිය යුතු තරමට වඩා එළියක් තියෙන බව මට තේරුම් ගියේ ඒ වෙලාවේ දියි. ලුණු දිය උල්පතෙන් පැතිරෙමින් තිබුණු නිල්-කොළ එළිය පෙරදා රැටත් වඩා දීප්තිමත් සහ වඩාත් ඉක්මන් වුණේ හරියට වතුර ගුමුගුමු හඬ පිට කරනවා වගෙයි.

ඇඳෙන් බිමට බැහැපු මම එතැනට ගියා.



Scanned with CamScanner

මේ වතාවේ සල්ලි නැත්පත් කරන්න ඉල්ලන කටහඬක් ඇහුනේ නැහැ. මට දැනුණේ මුල්ම පියවර මම ගත්තා තුරු උල්පත බලා ඉන්නවා වගෙයි.

හරි නම් මට කරන්න තිබුණේ ආපහු ඇඳට යන එකයි. ඒත් ඒ වෙනුවට මම කලින් රෑයේ දකින්න ලැබුණු දේ ගැන - ස්ටයික්ස් ගං ඉවුරේ සිටි නිකෝගේ අරුම පුදුම දර්ශනය ගැන කල්පනා කළා.

"ඔයා මට මොනවා හරි කියන්න හදනවා," මම කිවුවා.

උල්පතෙන් ප්‍රතිචාරයක් නැහැ.

"හරි එහෙනම්," මම කිවුවා. "මට නිකෝ ඩි ආන්ජෙලෝව පෙන්නන්න."

මම අඩු තරමේ කාසියක්වත් විසි කළේ නැතත්, මේ වතාවේ ඒක ප්‍රශ්නයක් වුනේ නැහැ. ඒක හරියට පණිවුඩකාර දේවතාවිය අයිරිස්ට අමතරව තවත් බලවේගයක් වතුර පාලනය කරනවා වගෙයි. වතුර දිලිසෙමින් සැලුණා. ඒත් එක්කම නිකෝව පෙනෙන්න පටන් ගත්තා. ඒත් තව දුරටත් එයා සිටියේ පාතාල ලෝකයේ නෙවෙයි, තරු පිරුණු අහස යට සොහොන් බිමක එයා සිටගෙන සිටියා. එයා වට කර යෝධ විලෝ ගස් නැගී සිටියා.

එයා මිනී වළවල් හාරන්නෝ කීප දෙනෙක් වැඩ කරන දිහා බලා සිටියා. මට සවල් වදින හඬ සමග වළකින් පිටට පස් විසි වෙනවා දකින්න ලැබුණා. නිකෝ කළු පාට කබායකින් සැරසී සිටියා. එය මීදුමෙන් පිරුණු රැයක් වුණා. උණුසුම් හා තෙත්බර වූ වටපිටාවේ ගෙම්බන් කෑගසනවා ඇසුණා. නිකෝගේ දෙපතුල් අසල ලොකු ප්ලාස්ටික් මල්ලක් තිබුණා.

"ඒක තවම හාරලා ඉවර නැද්ද?" නිකෝ ඇසුවා. එයාගේ හඬේ කේන්තියක් තිබුණා.

"තව ටිකයි, මගේ උතුමාණෙනි." ඒ මීට කලිනුත් නිකෝ සමග ඉන්නවා දකින්න ලැබුණු අවතාරයයි. "ඒත්, මගේ උතුමාණෙනි, මම ඔබතුමාට කියන්නේ, මේක උවමනා නැති දෙයක්. ඔබතුමාට උපදෙස් දෙන්න මේ මම ඉන්නේ."

"මට දෙවෙනි උපදේශයක් ඕනෑ!" නිකෝ අසුරක් ගසද්දී, හැරිම නැවතුණා. කවුදෝ දෙන්නෙක් වළෙන් පිටතට බඩගෑවා. ඒ මිනිස්සු නෙවෙයි, වැරහැලි හැඳගත් ඇටසැකිලි දෙකක්.



"ඔයාලට යන්න පුළුවන්," නිකෝ කිවුවා. "ස්තුතියි."

ඇටසැකිලි දෙක ඇටකටු ගොඩකට කඩා වැටුණා.

"තව සවල්වලටත් ස්තුති කරා නම් හරි," අවතාරය අවලාද නැඟුවා. "ඒවාට මුන්ට වඩා හැඟීම් දැනීම් ඇති."

නිකෝ එයාව ගණන් ගත්තේ නැහැ. ප්ලාස්ටික් මල්ලට අත යැවූ එයා කෝක් දුසිමක ඇසුරුමක් පිටට ගත්තා. එයා එක කෑනයක් විවර කළා. ඒත් ඒක බොනවා වෙනුවට, එයා ඒක මිනී වළ ඇතුළට වත්කළා.

"මළවුන්ට නැවතත් රස බලන්න ලැබේවා," එයා මිමිණුවා. "ඔවුන්ට පිබිදී, මේ පූජාව පිළිගැනීමට ලැබේවා. ඔවුන්ගේ මතකය අවදි වේවා."

ඉතිරි කෝක් ටිකත් වළ ඇතුළට දැමූ එයා කාටූන් රූපවලින් සැරසූ සුදු කඩදාසි මල්ලක් පිටට ගත්තා. මට අවුරුදු ගාණකින් දකින්න ලැබී නොතිබුණත්, මම එය හඳුනා ගත්තා - ඒ මැක්ඩොනල්ඩ් හැපි මීල් එකක්.

මල්ලේ කට පහළට හැරවූ එයා එහි තිබුණු බැදපු අල පෙති සහ හැම්බර්ගරය මිනී වළට හැලුවා.

"මගේ කාලෙ නම්, අපි පාවිච්චි කළේ සත්තුන්ගෙ ලේ," අවතාරය කෙඳිරුවා. "ඒ හොඳටම ඇති. උන්ට රසේ වෙනස දැනෙන්නෙ නැහැ නේ."

"මම එයාලට ගෞරවයෙන් සලකනවා," නිකෝ කිවුවා.

"අඩු තරමේ ඔකේ තියෙන සෙල්ලම් බඩුවවත් මට තියාගන්න දෙන්නකෝ," අවතාරය කිවුවා.

"කට වහගන්නවා!" නිකෝ අණ කළා. එයා තවත් සෝඩා දුසිමේ ඇසුරුමක් සහ හැපි මීල් තුනක් මිනී වළට දැමා. පෞරාණික ග්‍රීක බසින් මතුරන්න පටන් ගත්තා. මට එයින් අල්ලගන්න පුළුවන් වුණේ වචන කීපයක් විතරයි - මළවුන් ගැන, මතකයන් ගැන සහ වළෙන් නැගිටීම ගැන දේවල් එයින් කියවුණා. හරිම සතුටුදායක දේවල්.

මිනී වළෙන් බුබුළු මතු වෙන්න පටන් ගත්තා. පෙණ සහිත දුඹුරු පාට දියරයක් ඉහළ නැගුණේ හරියට මුළු වළම සෝඩාවලින්

පිපෙනවා වගෙයි. මීදුම් වලාත් ගත වෙන්න ගත්තා. ගෙබිමත්තේ හැංගිම් නැවතුණා. කොහොත් ගල් පෙලින් රූප දුසිම් ගණන් මතු වෙන්න පටන් ගත්තා නිලට තුරු. කොහැගැඩ්දිලි මිනිස් රූප.

නිකෝ කෝප් සහ ටීස් බර්ගේරිවලින් මළවුන් කැඳවා තිබුණා.

"මේතැන මහ ගෙයක් ඉන්නවා," අවතාරය කිවුවේ මෙයත් වගෙයි. "ඔයාගේ බලය ගැන ඔයා හරියට දන්නෙ නැහැ."

"මම ඒක පාලනය කරගෙනයි ඉන්නේ," නිකෝ කිවුවත් එයාගේ කටහඬේ නම් තිබුණේ දුර්වලකමක්. එයා, එයාගේ කඩුව ඇදලා ගත්තා - ඒක මහ කළු ලෝහයෙන් හැදූ කෙටි තලයක්. මීට කලින් කවදාවත් මම ඒ වගේ එකක් දැකලා තිබුණේ නැහැ. ඒක දිව්‍යමය ලෝකඩවත්, වානේවත් නොවෙයි. සම්භාවිට. යකඩ වෙන්න ඇති? ඒක දැකපු හැටියේ ඒස්ව සිටි අවතාර ඵළ පසුබැවා.

"වරකට එකා ගාණේ," නිකෝ අණ දුන්නා.

තනි රූපයක් ඉදිරියට පාවී ඇවිත් වළ ළඟ දණ ගසාගත්තා. එයා තලු පෙවීම් වලේ තිබූ දියරය බිව්වා. එයාගේ අවතාර අත් බැඳපු අල පෙති වගෙත් අතුලා ගත්තා. එයා ආපසු නැගිට්ටද්දී, පෙරට වඩා පැහැදිලිව මට එයාව පෙනුණා - ග්‍රීක සන්නාහයකින් සැරසුණු ගැටවර වයසේ කොල්ලෙක්. එයාට කැරලි ගැසුණු කොණ්ඩයක් සහ කොළ පාට ඇස් දෙකක් තිබුණා. සිප්පි කටුවක හැඩය ගත් ගාංචුවක් එයාගේ කමිසයට අමුණා තිබුණා.

"කවුද තුඹ?" නිකෝ ඇහුවා. "කතා කරනවා."

තරුණයා මතක් කරන්න උත්සහ කරනවා වගේ නළල රැලි කරගත්තා. ඊට පස්සෙ එයා කඩදාසියක් පොඩි කරනවා වගේ වියලි හඬකින් කතා කළා. "මම තිසියස්."

වෙන්න බැහැ, මම හිතුවා. මේ තිසියස් වෙන්න බැහැ. එයා පොඩි ළමයෙක් නේ. මම ලොකු මහත් වුණේ එයා මිනටෝර් එක්ක සටන් කළ හැටි ගැන කියවෙන කතන්දර අහමිනුයි. ඒත් ඒ හැම කතන්දරයකදී ම මම එයාව හිතේ මවා ගත්තේ හැඩිදැඩි, යෝධ කෙනෙක් විදිහටයි. මම දැන් දකිමින් සිටි අවතාරය කොහෙත්ම උස, ශක්තිමත් කෙනෙක් වුණේ නැහැ. ඒ වගේම එයා මට වඩා වැඩි වයසක කෙනෙක් වෙන්නත් බැහැ.



"මම කොහොමද මගේ සහෝදරියව ආපසු ලබා ගන්නේ?" නිකෝ ප්‍රශ්න කළා.

තිසියස්ගේ ඇස් ප්‍රාණයක් නැති වීදුරු කැලි වගෙයි පෙනුණේ. "ඒකට උත්සහ කරන්නෙපා. ඒක පිස්සුවක්."

"මට කියනවා!"

"මගේ කුඩප්පා මැරුණා," තිසියස් මතක් කළා. "මම වංගගිරිය ඇතුළේ මැරිලා කියලා හිතලා එයා මුහුදට පැන්නා. එයාට ආපහු පණ දෙන්න මට ඕනෑ වුණා. ඒත් මට ඒක කරන්න පුළුවන් වුණේ නැහැ."

නිකෝගේ අවතාරය පිඹින හඬක් පිට කළා. "මගේ උතුමාණෙනි. ආත්ම හුවමාරුව! එයාගෙන් ඒ ගැන අහන්න!"

තිසියස් තරහෙන් රවා බැලුවා. "ඒ කටහඬ. මම ඒ කටහඬ දන්නවා."

"නෑ තුඹ දන්නෙ නැහැ, මෝඩයා!" අවතාරය කිවුවා. "උතුමාණන්ගේ ප්‍රශ්නෙට උත්තර දෙනවා, වෙන දේවල් වැඩක් නැහැ!"

"මම තුඹව දන්නවා," තිසියස් තදින් කියා සිටියේ එය මතකයට නගා ගන්න දඟලනවා වගෙයි.

"මට, මගේ අක්කා ගැන දැනගන්න ඕනෑ," නිකෝ කිවුවා. "මේ වංගගිරිය ඇතුළට යන ගවේෂණයෙන් මට එයාව ආපහු දිනාගන්න ලැබෙයි ද?"

තිසියස් අවතාරය සොයමින් සිටියත්, පෙනුණු හැටියට එයාව දකගන්න ලැබිලා නැහැ වගෙයි. එයා හෙමිහිට එයාගේ ඇස් නිකෝ වෙතට හැරෙව්වා. "වංගගිරිය අනතුරු පිරුණ. විශ්වාස කරන්න බැරි තැනක්. ඒක තරණය කරන්න මට උදවු කළේ එක දෙයක් විතරයි: මනුෂ්‍ය කෙල්ලෙක්ගේ ආදරේ. නූල කියන්නේ උත්තරයෙන් කොටසක් විතරයි. ඒ කුමාරිකාව තමයි මට මග පෙන්නුවේ."

"අපිට ඒ එකක්වත් උවමනා නැහැ," අවතාරය කිවුවා. "මම ඔබතුමාට මග පෙන්වන්නම්. ආත්ම හුවමාරු කරන කතාව ඇත්තක් ද කියලා එයාගෙන් අහන්න. එයා ඔබතුමාට කියයි."

"ආත්මයක් වෙනුවට ආත්මයක්," නිකෝ ඇහුවා. "ඒක ඇත්තක් ද?"

"මට- මට ඔව් කියන්න වෙනවා. ඒත් මේ අවතාරේ-"

Scanned with CamScanner

"අහපු ප්‍රශ්නෙට උත්තර දෙනවා, තක්කඩියා!" අවතාරය කිව්වා.

හදිසියේ ම, වළ වටේ සිටි අනෙක් අවතාර නොසන්සුන් වුණා. එයාලා බයාදු හඬින් කොඳුරමින්, කැලඹුණා.

"මට මගේ අක්කව බලන්න ඕනෑ!" නිකෝ තදින් කියා සිටියා. "එයා කොහෙද?"

"එයා එනවා." තිසියස් බියෙන් වගේ කිව්වා. "එයාට ඔබගේ කැඳවීම දැනිලා. එයා එනවා."

"කවුද?" නිකෝ ප්‍රශ්න කළා.

"එයා මේ බලයේ මූලය හොයාගෙන එනවා." තිසියස් කිව්වා. "ඔබ අපිව නිදහස් කරන්න ඕනෑ."

මගේ උල්පතේ වතුර ශක්තියෙන් ගුම් හඬ නගමින් සැලෙන්න පටන් ගත්තා. මුළු කැබිනය ම කම්පනය වෙන බව මට තේරුම් ගියා. හිගුරුම ටිකෙන් ටික වැඩි වුණා. සොහොන් බිමේ සිටි නිකෝගේ දර්ශනය දිහා බලද්දී ඇස් රිදෙන තරම් එහි දීප්තිය වැඩි වුණා.

"නවත්තන්න." මම හඬ නගා කිව්වා. "ඕක නවත්තන්න!"

උල්පත ඉරි තලන්න පටන් ගත්තා. හීනෙන් මොනවදෝ දෙඩවූ ටයිසන් අනෙක් පැත්තට හැරුණා. දම් පාට එළියෙන් කැබින් බිත්ති මත පිපිසුණු අවතාර හෙවණැලි ඇති වුණේ හරියට අවතාර උල්පතෙන් එළියට පැන ගන්නවා වගෙයි.

කරන්න දෙයක් නැති වූ නිසා මම රිප්ටයිඩ්ගේ කොපුව ගලවා උල්පතට ගැසූ පහරට එය දෙපළු වුණා. කරදිය සෑම තැනම විසුරුවමින්, ගලින් සෑදූ දිය බඳුනේ කැලි බිමට කඩා වැටුණා. ටයිසන් මහ හඬින් තගයෙන් පිඹිමින් දෙඩවූවත් ඇහැරුනේ නැහැ.

දකින්න ලැබුණු දෙයින් වෙවුලමින් මම බිමට ඇද වැටුණා. තවමත් පුණු දිය උල්පතේ කැලි දිහා බලා සිටි මාව ටයිසන්ට උදේ දකින්න ලැබුණා.

* * *

එළි වූ හැටියේ ම, ගවේෂණ කණ්ඩායම සියුස්ගේ මුෂ්ටිය ළඟට එකතු වුණා. මම, මගේ ඔලොගුවට නෙක්ටාර් පිරවූ උණ්



වතුර බෝතලයක්, ඇම්බ්‍රෝසියා මල්ලක්, අතේ ගෙන යා හැකි නිදන මල්ලක්, කඹ, ඇඳුම්, ෆ්ලෑෂ් ලයිට් සහ අතිරේක බැටරි තොගයක් දමාගෙන තිබුණා. රිප්ටයිඩ් මගේ සාක්කුවේත්, ටයිසන් මට සාදා දුන් මායා පලිහ/අත් ඔරලෝසුව මගේ අතේත් තිබුණා.

මීදුම පහ වී ගොස් අහස නිල් පාටින් බැබළුණ එය පැහැදිලි උදෑසනක්. කඳවුරුකරුවෝ අද පියාඹන අසුන් පදිමින්, දුනු හරඹ පුහුණු වෙමින් සහ ලෝදිය බිත්තියේ නගිමින් පුහුණුවීම් කරාවි. ඒ අතර වාරයේ, අපි පොළොව යටට යාවි.

ජූනිපර් සහ ග්‍රෝවර් කණ්ඩායමෙන් ඈතට වී සිටියා. ජූනිපර් ආයෙමත් අඬලා තිබුණත්, එයා ග්‍රෝවර් ගැන හිතලා නාඬා ඉන්න උත්සහ කරමින් සිටියා. එයා නිකරුණේ ග්‍රෝවර්ගේ ඇඳුම් හරි ගස්වමින්, එයාගේ රස්ටා තොප්පිය කෙලින් කරමින්, කමිසයේ වූ එළු ලොම් පිස දමමින් සිටියා. අපිට මුහුණ දෙන්න වෙන දේවල් ගැන කිසිම අදහසක් නොතිබුණු නිසා ග්‍රෝවර් අං දෙක සඟවා ගන්න කැප් එකත්, එළු කකුල් සඟවා ගන්න කලිසමක්, බොරු කකුල් සහ ස්නිකර් ජෝඩුවකුත් හැඳ පැළඳගෙන මනුස්ස වෙසින් සිටියා.

කයිරොන්, කුයින්ටස් සහ මිසිස් ඕ'ලෙරී අපිට සුබ පතන්න ආව අනෙක් කඳවුරුකරුවෝ සමග සිටගෙන සිටියා, ඒත් එය ප්‍රීතිමත් සමු ගැනීමේ සාදයක් වගේ දැනෙන්න එතැන සිදු වෙමින් තිබුණු ක්‍රියාකාරකම් වැඩි වුණා. ගල් ගොඩ අසල මුර සේවයට කූඩාරම් දෙකක් අටවා තිබුණා. බෙකන්ඩොර්ෆ් සහ එයාගේ සහෝදර සහෝදරියෝ උල් කටු සහ අගල්වලින් ආරක්ෂක බාධකයක් ඉදි කරමින් සිටියා. අවදානමක් ගැනීම වළක්වන්න වංගගිරියේ දොරටුව පැය විසි හතර පුරාම මුර කරන්න කයිරොන් තීරණය කර තිබුණා.

ඇනබෙත් අන්තිම වතාවටත් එයාගේ සැපයුම් මල්ල පිරික්සමින් සිටියා. ටයිසනුයි මම යි එතැනට ගියාම එයා රවා බැලුවා. "පර්සි, ඔයාගේ පෙනුම දරුණුයි."

"ඊයේ රෑ එයා වතුර මල මැරුවා," ටයිසන් රහසින් කිව්වා.

"මොකක්?" ඇනබෙත් ඇසුවා.

මට විස්තරේ කියන්න ඉඩක් ලැබෙන්න කලින්, කයිරොන් පිමමේ ආවා. "හොඳයි, මට පේන්නෙ ඔයාලා ලෑස්තියි වගේ"

Scanned with CamScanner

එයා ප්‍රතිමත් හඬින් කතා කරන්න උත්සහ කළත්, එයා පිටිපේ කාංසාවෙන් කියලා මට තේරුණා. එයාව තවත් බය කරන්න මට ඕනෑ වුනේ නැහැ. ඒත් කලින් රැයේ දුටු හීනය ගැන කල්පනා කළ මම මගේ හිත වෙනස් වෙන්න කලින් කතා කළා, "හේයි, අහ්, කයිරොන්, මම ගියාට පස්සෙ උදව්වක් කරන්න පුළුවන් ද?"

"ඕනෑම දෙයක්, මගේ කොල්ලෝ."

"ඉක්මනට එන්නම්, යාළුවනේ." මම කැලෑව දෙසට ඔළුව වැනුවා. කයිරොන් ඇහිබැමක් ඔසවා බැලුවා. ඒත් එයා අනෙක් අයට නෑසෙන මානයට මගේ පසුපස ආවා.

"ඊයෙ රෑ," මම කිවුවා. "මම ලූක්වයි ක්‍රෝනොස්වයි හීනෙන් දැක්කා." මම එයාට සම්පූර්ණ විස්තරය කිවුවා. ඒ ආරංචියෙන් එයාගේ කර මතට තවත් බරක් පැටවුණු බව පෙනුණා.

"මම මේ ගැන බයෙන් හිටියේ," කයිරොන් කිවුවා. "මගේ තාත්තා, ක්‍රෝනොස්ට විරුද්ධව සටනක දි, අපිට දිනන්න කිසිම අවස්ථාවක් නැති වෙයි."

කයිරොන් ක්‍රෝනොස්ට තාත්තා කියලා කතා කළේ කලාතුරකින්. මං කිවුවේ, ඒක ඇත්ත කියලා අපි හැමෝම දන සිටියා. ග්‍රීක ලෝකයේ හැමෝම - දෙවියෙක්, රාක්ෂයෙක් නැත්නම් ටයිටන් කෙනෙක් වුනත් - කොහොමින් කොහොම හරි එකිනෙකාගේ නෑයෝ වුණා. ඒ වුණත් ඒ ගැන කයිරොන් පුරසාරම් දොඩවන්න නම් කොහෙත්ම කැමති වුනේ නැහැ. *බහ්, මගේ තාත්තා තමයි බටහිර ශිෂ්ටාචාර්ය විනාශ කරන්න බලාගෙන ඉන්න මහා බලගතු දුෂ්ට ටයිටන් රජා. මටත් ඕනෑ ලොකු වුණාම එයා වගේ වෙන්න!*

"ගනුදෙනුවක් ගැන එයා කිවුව කතාවේ තේරුම ඔයා දන්නව ද?" මම ඇසුවා.

"මට හරියටම විශ්වාස නැහැ, ඒත් මට බය, එයාලා හොයනවා ඇත්තේ ඩෙඩලස් එක්ක ගනුදෙනුවක් කරන්න විදිහක්. නාකි නිමැවුම්කාරයා තවමත් ජීවත් වෙනවා නම්, වංගගිරිය අස්සෙ අවුරුදු දාස් ගාණක් ඉඳලා එයාට පිස්සු හැදිලත් නැත්නම්... හොඳයි, ඕනෑම කෙනෙක්ව තමන්ගේ කැමැත්තට නම්ම ගන්න ක්‍රමයක් හොයා ගන්න ක්‍රෝනොස් දන්නවා."

"හැමෝවම නෙවෙයි," මම පොරොන්දු වුණා.



කයිරොන් අමාරුවෙන් හිනාවුණා. "නෑ, බාගදා හැමෝම නෙවෙයි. ඒත්, පර්සි, ඔයා ගොඩාක් පරිස්සම් වෙන්න ඕනෑ. ක්‍රෝනොස් වංගගිරිය හරහා යන්න විතරක් නෙවෙයි, වෙන කාරණාවකටත් ඩෙඩලස්ව හොයාගන්න බලයි කියලා මම කාලයක් තිස්සෙ වද වෙවී හිටියේ."

"තව මොනවද එයාට උවමනා?"

"ඇනබෙතුයි මමයි සාකච්ඡා කරපු දෙයක්. ඔයාට මතක ද ඔයා පළවෙනි වතාවට ප්‍රින්සස් ඇන්ඩ්‍රොමීඩා නැව ඇතුළට ගිය ගමන ගැන මට කිවුව දේ? ඔයා රත්තරන් මිනී පෙට්ටිය දැකපු පළවෙනි වතාවේ?"

මම ඔළුව වැනුවා. "ක්‍රෝනොස්ව නැගිට්ටුවන විදිහ ගැන ලූක් කියව කියවා හිටියා. එයාලගේ පැත්තට අලුතෙන් කෙනෙක් එකතු වෙන හැම වතාවක ම ක්‍රෝනොස්ගේ පුංචි කෑලි මිනී පෙට්ටිය ඇතුළේ මතු වෙනවා කිවුවා."

"ක්‍රෝනොස් සම්පූර්ණයෙන් ම නැගිට්ටාම එයාලා මොනවා කරනවා කියල ද ලූක් කිවුවේ?"

මගේ කොඳු නාරටිය පහළට හිරියක් පැතිරුණා. "එයා කිවුවා එයාලා ක්‍රෝනොස්ට අලුත් සිරුරක් හදනවා කියලා, හෙෆාස්ටස්ගේ කම්මල්වලින්වත් හදන්න බැරි විදිහෙ එකක්."

"අන්න හරි," කයිරොන් කිවුවා. "ලෝකෙ හොඳම නිමැවුම්කරුවා වුණේ ඩෙඩලස්. එයා වංගගිරිය ඇරෙන්න තව ගොඩක් දේවල් නිර්මාණය කළා. ස්වයංක්‍රීය උපකරණ, හිතලා වැඩ කරන යන්ත්‍ර... බැරි වෙලාවත් ඩෙඩලස් ලවා අලුත් සිරුරක් හදා ගන්න ක්‍රෝනොස් බලාපොරොත්තු වෙනවා නම්?"

ඒක නම් හරිම සතුටුදායක සිතුවිල්ලක් වුණා.

"ඊට කලින් ඩෙඩලස්ව හොයාගන්න අපිට සිද්ධ වෙනවා," මම කිවුවා. "ඊට පස්සෙ එහෙම කරන්න එපා කියලා එයාට තේරුම් කරන්නත්."

කයිරොන් කැලෑවේ ගස් දිහා බලාගත්වන ම සිටියා. "මට තේරෙන්නෙ නැති තව දෙයක් තියෙනවා... මේ, එයාලගේ පැත්තට

එකතු වෙන අන්තිම ආත්මයේ කතාව. ඒකෙත් නම් හොඳ පෙර නිමිති පෙන්වන්නෙ නැහැ."

මම කිසිවක් නොකියා සිටියත්, මට වරදකාරී හැඟීමක් දැනුණා. නිකෝ හේඩීස්ගේ පුතෙක් බව කයිරොන්ට නොකියා ඉන්න මම තීරණය කර තිබුණා. ඒ වුණත්, මේ ආත්ම ගැන කතාව . ක්‍රෝනොස් නිකෝ ගැන දන්නවා නම්? එයාව නරක පැත්තට හරවා ගන්න ක්‍රෝනොස්ට පුළුවන් වෙලා නම්? එහෙම හිතද්දි කයිරොන්ට හැමදෙයක්ම එළි කරන්න මට ඕනෑ වුණත්, මම එහෙම කළේ නැහැ. එයට හේතුව වුනේ, ඒ ගැන කිසිවක් කරන්න කයිරොන්ට හැකි වේවි කියලා මට විශ්වාසයක් නොතිබීමයි. නිකෝව සොයා ගැනීම මම ම කළ යුතු වුණා. එයාට හැම දෙයක්ම පැහැදිලි කරලා දීලා, එයාව කියන දේ අහන්න පොලඹවා ගන්න මට ඕනෑ වුණා.

"මං දන්නෙ නැහැ," අන්තිමේට මම කිවුවා. "ඒත්, අහ්, ජූනිපර් දෙයක් කිවුවා. ඒක ඔයා දැනගන්න එක හොඳයි." කුයින්ටස් ගල් ගෙඩි අතරට එබී බලමින් ඉන්නවා රූක් දෙවඟනට දකින්න ලැබී තිබුණු හැටි මම එයාට කිවුවා.

කයිරොන්ගේ හනු එකට තද වුණා. "ඒක නම් මට පුදුමයක් නෙවෙයි."

"ඒක පුදුම- ඔයා කියන්නේ ඔයා දන්නවා කියල ද?"

"පර්සි, කුයින්ටස් කඳවුරට ඇවිත් උදවු කරන්න ඉදිරිපත් වුණාම... හොඳයි, ඒ ගැන සැක නොකරන්න නම් මම මෝඩයෙක් වෙන්න ඕනෑ."

"එහෙනම් ඇයි ඔයා එයාට ඉන්න දුන්නේ?"

"මොකද සමහර වෙලාවට ඔයා විශ්වාස නොකරන අයව ඔයා ළඟින් ම තියාගන්න එක හොඳයි, එතකොට එයා ගැන ඇහැ ගහගෙන ඉන්න ඔයාට ඉඩ ලැබෙනවා නේ. බාගදා එයා, එයා කියන කෙනාම වෙන්න පුළුවන්ඃ ඉන්න තැනක් හොයන අර්ධ-ලෝහිතයෙක්. එකත් එකටම මට එයාගේ පක්ෂපාතීකම ප්‍රශ්න කරන්න වෙන විදිහේ කිසිම දෙයක් එයා එළිපිට නම් කරලා නැහැ. ඒත් මාව විශ්වාස කරන්න. මම ඇහැ ගහගෙන ඉන්නම්."

අපි මේ තරම් වෙලා ගත්තේ ඇයි බලන්න ද කොහෙදෝ ඇනබෙත් කකුල් අද්දවමින් ආවා. "පර්සි, ඔයා ලෑස්ති ද?"



මම ඔළුව වැනුවා. මගේ අත සාක්කුව තුළට - කුයින්ටස් මට දුන් අයිස් තළාව තිබුණු තැනට ඇදී ගියා. අනෙක් පැත්ත බැලූ මට කුයින්ටස් සෝදිසියෙන් මගේ දිහා බලා ඉන්නවා දකින්න ලැබුණා. එයා අතක් ඔසවා සමු දුන්නා.

*අපේ බන්ධනකාරයෝ සහයෝගයක ආරංචි වාර්තා කරනවා.* ලූක් කිවුවේ එහෙමයි. අපි ගවේෂණයක් දියත් කරන්න තීරණය කළ දවසේ ම, ලූක්ට ඒ බව දැනගන්න ලැබී තිබුණා.

"පරිස්සම් වෙන්න," කයිරොන් අපිට කිවුවා. "ඒ වගේම හොඳ සොයා යෑමක් කරන්න."

"ඔයත් එහෙමයි," මම කිවුවා.

ටයිසන් සහ ග්‍රෝවර් මඟ බලා සිටි ගල් ගොඩ අසලට අපි ඇවිද ගියා. ගල් ගෙඩි දෙකක් අතර තිබුණු පැළුම - අපිව ගිල ගන්න සූදානමින් තිබුණු දොරටුව දිහා මම ඇසිපිය නොහෙළා බලා සිටියා.

"හොඳයි," ග්‍රෝවර් බයෙන් වගේ කිවුවා. "ගුඩ්-බායි ඉර එළිය."

"හෙලෝ ගල් ගෙඩි," ටයිසන් එයට එකඟ වුණා.

ඊට පස්සෙ අපි හතර දෙනාම එක්ව අන්ධකාරය තුළට පල්ලම් බැස්සා.

Scanned with CamScanner

## 06

# අපිට මුහුණු දෙකේ දෙවියා මුණ ගැසුණා

සත-එත මං නැතුව අතරමං වෙන්න කලින් අපිට අඩි සියයක් විතර යාගන්න පුළුවන් වුණා.

ඒ උමඟ කලින් වතාවේ ඇනබෙත් සහ මම ඇද වැටුණු එකට කොහෙත්ම සමාන වුනේ නැහැ. දැන් කසළ කාණුවක් වගේ රවුම් හැඩයක් ගත් එය අඩි දහයෙන් දහයට යකඩ පොලුවලින් ආවරණය කළ කවුළු සහිතව රතු ගඩොලින් තනා තිබුණා. කුතුහලය නිසා මම එක් කවුළුවක් හරහා විදුලි පන්දමක් දල්වා බැලුවත්, මට කිසිවක් දකින්න ලැබුනේ නැහැ. එය අපිරිමිත අන්ධකාරය තුළට විවර වී තිබුණා. එහි අනෙක් අන්තයෙන් කටහඬක් ඇහුණා කියලා මට හිතුණා. ඒත් සමහරවිට ඒ සීතල සුළඟේ හඬ වෙන්න ඇති.

ඇනබෙත් අපිට මග පෙන්වන්න හැකි උපරිමයෙන් උත්සහ කළා. අපි වම් පස බිත්තිය දිගේ යන්න ඕනෑ කියලා අදහසක් එයාට තිබුණා.

"අපි වම් බිත්තියේ අතක් තියාගෙන, ඒක දිගේම ඉස්සරහට ගියොත්," එයා කිව්වා. "ඒක අතින් පැත්තට කරලා ආපහු එන්න පාර හොයාගන්න පුළුවන් වෙයි."

අවාසනාවට, එයා ඒක කියූ හැටියේ වම් පස බිත්තිය අතුරුදහන් වුණා. උමං අපිත් පිටතට විහිදෙන වෘත්තාකාර කුටියක අපි ඉන්න බව හොයාගන්න ලැබුණත්, අපි එතැනට ආවේ කොහොමද, අපිට කිසිම අදහසක් තිබුනේ නැහැ.



"මේ, මොන පාරෙන් ද අපි ආවේ?" ග්‍රෝවර් බයෙන් වගේ ඇසුවා.

"පිටිපස්ස හැරිලා බලමුකෝ." ඇනබෙත් කිව්වා.

ආපසු හැරුණු අපි එක එක්කෙනා මුහුණ පා සිටියේ එක් එක් උමංවලටයි. ඒක මහ විකාරයක් වුණා. ආපසු කඳවුරට යන පාර තීරණය කරන්න කාටවත් බැරිවුණා.

"වම් පැත්තෙ බිත්ති හරි නරකයි," ටයිසන් කිව්වා. "දැන් මොන පාර ද?"

ඇනබෙත් උමං අවෛම ආරුක්කු ද්වාරවලට විදුලි පන්දම් එළිය යොමු කර බැලුවා. මට පෙනුණු තරමට නම් ඒවා හැම අතින්ම එකිනෙකට සමාන වුණා. "අර පැත්තට," එයා කිව්වා.

"ඔයා කොහොමද දන්නෙ?" මම ඇසුවා.

"නිගාමී තර්කනයෙන්."

"ඒ කියන්නෙ... ඔයා අනුමාන කරලා කිව්වේ."

"පාඩුවේ එන්නකෝ," එයා කිව්වා.

එයා තෝරාගත් උමඟ ඉක්මනින් ම පටු වෙන්න ගත්තා. එහි බිත්ති අළු පාට සිමෙන්තිවලට හැරුණා. ඒ වගේම එහි සිවිලිම කොයි තරම් පහත් වුණා ද කියනවා නම්, ටික වෙලාවකින් ම අපි කුදු ගැසී යන්න පටන් ගත්තා. ටයිසන්ට නම් දණ ගාන්න සිද්ධ වුණා.

වංගගිරිය තුළ වූ ලොකුම හඬ වුණේ ග්‍රෝවර් හුස්ම ගන්නා හඬයි. "මට තවත් නම් බැහැ," එයා කෙඳිරුවා. "අපි තවම එතැනට ගියේ නැද්ද?"

"අපි තාම පහළට ඇවිත් විනාඩි පහක්වත් යන්න නැතුව ඇති," ඇනබෙත් එයාට කිව්වා.

"ඊට වඩා වෙලා ගියා," ග්‍රෝවර් තදින් කියා සිටියා. "පෑන් මොකට මේක අස්සට ආව ද මන්දා! මේක වනගත තැන්වල කණපිට නේ!"

අපි නොනැවතී ඉදිරියට ගැටුවා. උමඟ පටු වෙමින් තිබුණු හැටියට, තව ටිකකින් අපිව හිර වෙයි කියලා මම හිතද්දි ම, ඒක විශාල කාමරයකට විවර වුණා. "වාව්!" එහි බිත්තිවලට විදුලි පන්දම අල්ලා බැලූ මට කියවුණා.

Scanned with CamScanner

මොසැයික් (කුඩා ප්‍රමාණයේ වීදුරු කැබලි, ගල් හෝ වෙනත් ද්‍රව්‍යයන් එකලස් කර විශාල රූපයක් නිර්මාණය කිරීමේ කලාව) ටයිල්වලින් මුළු කාමරයම පිරී තිබුණා. එහි රූප කුණු වැකී, බොඳ වී තිබුණත් මට තවමත් ඒවාගේ පාට හඳුනාගන්න පුළුවන් වුණා - රතු, නිල්, කොළ සහ රන්. බිත්ති හිසේ උත්සවයක ප්‍රීතිවන ඔලිම්පියානු දෙවිවරුන්ගේ දර්ශනයක් පෙන්නුම් කළා. එහි මගේ තාත්තා, පොසෙයිඩන් ත්‍රිශූලය අතකින් දරාගෙන, මිදි පොකුරක් වයින්වලට හැරවීම සඳහා ඩයනයිසියස් වෙතට දිගු කරගෙන සිටියා. සියුස් සැටර්ලා සමග විනෝද වෙමින් සහ හර්මීස්, එයාගේ තටු සෙරෙප්පු දමාගෙන අහසේ පියාඹමින් සිටියා. ඒ චිත්‍ර ලස්සන වුණත්, ඒවා ඒ තරම් නිවැරදි වුනේ නැහැ. මම දෙවිවරුන්ව දකලා තියෙනවා නේ. ඩයනයිසියස් ඒ තරම් කඩවසම් නැහැ. ඒ වගේම හර්මීස්ගේ නහය ඒ තරම් ලොකුත් නැහැ.

කාමරය මැද තට්ටු-තුනක වතුර මලක් තිබුණා. හැබැයි ඒකට තිබුණේ සෑහෙන කාලෙකින් වතුර දකලවත් නැති පෙනුමක්.

"මොකක්ද මේ තැන?" මම කෙඳිරුවා. "මේකෙ පෙනුම-"

"රෝමානු තැනක්." ඇනබෙත් කිවුවා. "අර මොසැයික් කොටස අවුරුදු දෙදහක් විතර පරණයි."

"ඒත් ඒවා රෝමානු වෙන්නෙ කොහොමද?" පැරණි ඉතිහාසයට ඒ තැටි දක්ෂ නැති වුණත්, රෝමානු අධිරාජ්‍යය ලෝන්ග් අයිලන්ඩ් තරම් දුරට පැතිරුනේ නැහැ කියලා මට සෑහෙන විශ්වාස වුණා.

"වංගගිරිය කියන්නෙ කොටස් ගොඩක් එකතු වෙලා හැදුණු පැච්-වර්ක් එකක් වගේ දෙයක්," ඇනබෙත් කිවුවා. "මම ඔයාට කිවුවා නේ, ඒක නිතරම කොටස් එකතු කර ගනිමින් පැතිරෙනවා. තනියම වර්ධනය වෙන එකම ගොඩනැගිලි නිර්මාණය මේක විතරයි."

"ඔයා කතා කරන්නෙ හරියට ඒකට පණ තියෙනවා වගෙයි නේ."

අපිට ඉදිරියෙන් වූ උමඟ තුළින් ගෙරවුම් හඬක් දෝංකාර දුන්නා.

"ඒකට පණ තියෙන කතාව අපි නතර කරමු," ග්‍රෝවර් නාහෙන් ඇඬුවා. "අනේ?"



"හරි එහෙනම්," ඇනබෙත් කිවුවා. "ඉස්සරහට යමු."

"නරක සද්දෙ එන පැත්තට ද?" ටයිසන් ඇසුවා. අඩු තරමේ එයා පවා බය වෙලා වගෙයි.

"ඔව්," ඇනබෙත් කිවුවා. "මේවගෙ ගෘහ නිර්මාණ ශිල්ප ටිකෙන් ටික පරණ වෙනවා. ඒක හොඳ ලකුණක්. ඩෙඩලස්ගේ වැඩපොළ ඇත්තේ පරණ ම කොටසේ."

ඒ අදහස තේරුමක් ඇති දෙයක් වුණත්, ඉක්මනින් ම වංගගිරිය අපිත් එක්ක සෙල්ලම් කරන්න පටන් ගත්තා - අපි අඩි පනහක් විතර ඉදිරියට යද්දි උමඟ ආපසු සිමෙන්තිවලට හැරුණා. එහි දෙපසින් දිවෙන පිත්තල පයිප්ප තිබුණා. විසිරි-පින්තාරු (ස්ප්‍රේ පේන්ටින්ග්) කුරුටු චිත්‍රවලින් බිත්ති වැසී තිබුණා.

"මං හිතන්නෙ මේක නම් රෝමන් නෙවෙයි," මම හරිම ප්‍රයෝජනවත් විදිහට කිවුවා.

ගැඹුරු හුස්මක් ගත් ඇනබෙත් නොනැවතී ඉදිරියට ගියා.

සෑම අඩි කීපයකට ම වරක් උමං ඇඹරෙමින්, වංගු ගනිමින් අතු බෙදුණා. අපේ දෙපතුල්වලට යටින් පොළොව සිමෙන්තිවලින් මඩවලටත්, ගඩොල්වලටත්, ආයෙමත් සිමෙන්තිවලටත් මාරු වුණා. එහි වූ කිසිම දෙයක තේරුමක් තිබුනේ නැහැ. අපි වයින් ගබඩාවකට - ලී රාක්ක මත තැබූ දූවිල්ලෙන් වැසුණු බෝතල් ගොඩක් ඇති තැනකට - ඇද වැටුණේ හරියට අපි කාගේ හරි බිම් මහලක් හරහා ගමන් කරනවා වගෙයි. ඒත් වෙනසකට තිබුණේ අපිට ඉහළින් පිටවීමක් නොතිබුණු එකයි. තිබුණේ ඉදිරියට ඇදෙන තවත් උමං විතරයි.

පසුව අපිට ඉහළින් සිවිලිම ලෑලිවලින් සැදූවකට හැරුණා. ඒ වගේම අපිට ඉහළින් කටහඬවල් සහ පියවර වදිද්දි ලෑලි කිරිකිරි ගාන හඬවල් ඇසුණේ හරියට අපි බීමහලකට යටින් ඇවිදිනවා වගෙයි. මිනිස්සුන්ගේ හඬ ඇසීම හිතට සහනයක් වුණා, ඒත් අපිට එයාලා වෙතට යන්න පුළුවන් කමක් තිබුනේ නැහැ. පිට වෙන්න පාරක් නැතුව අපි පහළ හිර වී සිටියා. ටිකකින් අපි අපේ පළවෙනි ඇටසැකිල්ල සොයාගත්තා.

එයා නිල ඇඳුමක් වගේ සුදු පාට ඇඳුමකින් සැරසී සිටියා. එයා අසල වීදුරු බෝතල් පිරවූ ලී පෙට්ටියක් තිබුණා.

"කිරිකාරයෙක්," ඇනබෙත් කිවුවා.

Scanned with CamScanner

"මොනවා?" මම ඇහුවා.

"එයාලා තමයි ඉස්සර කිරි බේදුවේ."

"ඔව්. එයාලා කවුද කියලා මං දන්නවා. ඒත්... ඒ මගේ අම්මලා එහෙම පුංචි කාලේ නේ. ඒ කියන්නේ අවුරුදු මිලියනේකට විතර කලින්. මෙයා මොනවද මෙතැන කරන්නේ?"

"සමහර මිනිස්සු පාර වැරදිලා මේක ඇතුළට එනවා," ඇනබෙත් කිවුවා. "සමහරු මේක ගැන හොයලා බලන්න ඇවිත් ආයේ යන්න බැරි වෙනවා. ඉස්සර කාලේ ක්‍රීට්වල අය බිලි පූජා විදිහට මේක ඇතුළට මිනිස්සු එවනවලු."

ග්‍රෝවර් තදින් කෙළ ගිල්ලා. "මෙයා සෑහෙන කාලයක් මෙතැන ඉඳලා තියෙනවා." එයා ඇටසැකිල්ලේ බෝතල්වලට අත දිගු කර පෙන්වූවා. ඒවා සුදු පාට දූවිලි තට්ටුවකින් වැසී තිබුණා. ඇටසැකිල්ලේ ඇඟිලි බිත්තිය පහුරු ගානවා වගේ තිබුණේ හරියට එයා මෙතැනින් එළියට යන්න උත්සහ කරමින් මැරිලා වගෙයි.

"ඇටකටු විතරයි," ටයිසන් කිවුවා. "බය වෙන්නෙපා, එළු කොල්ලෝ. කිරිකාරයා මැරිලා ඉන්නේ."

"කිරිකාරයා ගැන මම කරදර වෙන්නෑ," ග්‍රෝවර් කිවුවා. "ඒක මේ ගඳ. රාක්ෂයෝ. ඔයාට ඒ ගඳ දැනෙන්නැද්ද?"

ටයිසන් ඔළුව වැනුවා. "රාක්ෂයෝ ගොඩාරියක්. ඒත් පොළොව යට ගඳ ඒ වගේ තමයි. රාක්ෂයෝයි මැරිච්ච කිරි මිනිස්සුයි."

"ඔහ්, හොඳයි නේ," ග්‍රෝවර් නාහෙන් ඇඬුවා. "මං හිතුවා බැරි වෙලාවත් මට වැරදිලා ඇති කියලා."

"අපිට වංගගිරියේ ගැඹුරට ම යන්න වෙනවා," ඇනබෙත් කිවුවා. "මේක මැදට යන්න පාරක් තියෙන්න ම ඕනෑ."

වා කවුළුවක පෙනුම ගත්, මළ නොකන වාතේ කොරිඩෝ හරහා එයා පසුපස වමටත්, ඊට පස්සේ දකුණටත් ගිය අපි අන්තිමේට ආපහු වතුර මලක් තිබුණු රෝමානු ටයිල් කාමරයට ම ඇවිත් තිබුණා.

හැබැයි මේ වතාවේ අපි හිටියේ තනියම නෙවෙයි.

***

මුලින් ම මගේ අවධානයට හසු වුණේ එයාගේ මුහුණු දෙකයි. එයාගේ ඔළුව දෙපසින් පිටතට නෙරා තිබුණු ඒවා උරහිස් මතින් දෙපැත්ත බලමින් තිබුණා. ඒ නිසා එයාගේ ඔළුව තිබිය යුතු තරමට වඩා ගොඩාක් පළල්ව තිබුණේ හරියට මිටි-හිසැති මෝරෙක්ගේ වගෙයි. එයා දිහා කෙලින් බලද්දි මට දැකගන්න ලැබුණේ එක පිට එක වැටුණු කන් දෙකක් සහ සයිඩ්-බර්න් දෙකක් විතරයි.

එයා සැරසී සිටියේ තිව්[illegible] නගරයේ දොරටු පාලකයෙක් වගෙයිඃ දිගු, කළු පාට පිට කබාය, දිලිසෙන සපත්තු සහ දෙගුණයක් පළල ඔළුව මත කොහොමදෝ රඳවා[illegible]න සිටි උස කළු තොප්පියක් එයා පැළඳ සිටියා.

"හොඳයි, ඇනබෙත්?" එයාගේ වම් පැත්තේ මුහුණ කතා කළා. "ඉක්මන් කරන්න!"

"එයාව ගණන් ගන්නෙපා," දකුණු පැත්තේ මුහුණ කිවුවා. "එයාට කිසිම අණක්-ගුණක් නැහැ. මේ පැත්තෙන් එන්න, මිස්."

ඇනබෙත්ගේ කට ඉබේම ඇරුණා. "අහ්... මට බැහැ..."

ටයිසන්ගේ ඇහිබැම් ඇකිළුණා. "අර විහිළු මිනිහට මුහුණු දෙකක් තියෙනවා නේ."

"විහිළු මිනිහට කන් හතරකුත් තියෙනවා, දන්නව ද!" වම් මුහුණ සැර වුණා. "දැන් ඉක්මන් කරලා ආවා නම්, මිස්."

"නෑ, නෑ," දකුණු මුහුණ කිවුවා. "මේ පැත්තට, මිස්. කරුණාකරලා, මාත් එක්ක කතා කරන්න."

මුහුණු දෙකේ මිනිහා හැකි උපරිමයෙන් ඇස් කොන්වලින් ඇනබෙත් දිහා බලා සිටියා. එයාගේ මුහුණු දෙකින් එකකට විතරක් අවධානය නොදක්වා එයා දිහා එක එල්ලේ බලන්න කොහෙත්ම බැරිවුණා. එයා ඉල්ලන්නෙත් ඒකමයි කියලා හදිසියේ ම මට තේරුම් ගියා - එයා ඇනබෙත්ට කියමින් සිටියේ තෝරාගැනීමක් කරන්න කියලයි.

එයාට පිටුපසින් ලොකු යකඩ අගුළු දැමූ ලී දොරවල් දෙකක් තිබුණා. මීට කලින් වතාවේ අපි මේ කාමරය හරහා යද්දි ඒවා තිබුණේ නැහැ. මුහුණු දෙකේ දොරටු පාලකයා රිදී යතුරක් අතින් අතට මාරු කරමින් සිටියා. මේ මුළුමනින්ම වෙනත් කාමරයක් ද කියලා මම පුදුමයෙන් හිතුවා, ඒත් බිත්ති හිසේ වූ දෙවිවරුන්ගේ චිත්‍ර නම් ඒවාමයි.

අපි මේ කාමරයට ආව දොර අපිට පිටුපසින් අතුරුදහන් වී, ඒ වෙනුවට තවත් මොසැයික් නිර්මාණයක් මතු වී තිබුණා. දැන් අපිට ආව පාරෙන්ම ආපසු යන්නත් විදිහක් නැති වුණා.

"පිටවෙන දොරවල් වහලා නේ," ඇනබෙත් කිව්වා.

"ඩහ්" වම් මුහුණ කිව්වා.

"ඒවායෙන් කොහෙටද යන්නේ?" ඇනබෙත් ඇහුවා.

"මට හිතෙන්නේ, එකකින් ඔයා යන්න හිතන තැනට යන්න පුළුවන්," දකුණු මුහුණ රැකුල් දෙමින් කිව්වා. "අනිත් එක ඒකාන්ත මරණයෙන් කෙළවර වෙනවා."

"ම-මං දන්නවා ඔයා කවුද කියලා," ඇනබෙත් කිව්වා.

"ඔහ්, ඔයා හරි දක්ෂයි නේ!" වම් මුහුණ අවඥාවෙන් කිව්වා. "ඒත් තෝරාගන්න ඕනෑ කොයි පාර ද කියලා ඔයා දන්නව ද? මට මුළු දවසම මෙතැන ළතවෙන්න බැහැ."

"ඇයි ඔයා මාව පටලවන්න හදන්නේ?" ඇනබෙත් ඇහුවා.

දකුණු මුහුණ හිනාවුණා. "ඔයා තමයි දැන් මෙතැන ලොක්කා, මගෙ දරුවෝ. හැම තීරණයක් ම තියෙන්නෙ ඔයාගේ අතේ. ඔයාට ඕනෑ වුණෙත් ඒකමයි, එහෙම නේද?"

"මම-"

"අපි ඔයාව දන්නවා, ඇනබෙත්," වම් මුහුණ කිව්වා. "ඔයා හැම දවසක ම පොර බදන්නේ මොකක් එක්ක ද කියලා අපි දන්නවා. ඔයාගේ දෙගිඩියාව ගැනත් අපි දන්නවා. ඔයාට කවදා හරි ඔයාගේ තෝරාගැනීම කරන්න වෙනවා. ඒ වගේම ඒ තෝරාගැනීම ඔයාව මරන්නත් ඉඩ තියෙනවා."

එයාලා කියමින් සිටියේ මොනවා ගැන ද කියලා මම දැන සිටියේ නැහැ, ඒත් එයාලා කතා කළේ දොරවල් දෙක අතරින් එකක් තෝරා ගැනීමට වඩා වැඩි දෙයක් කියලයි මට හිතුණේ.

ඇනබෙත්ගේ මූණේ ලේ හිඳුණා. "නෑ... මට බැහැ-"

"එයාට පාඩුවේ ඉන්න දෙනවා," මම කිව්වා. "කොහොම වුණත්, කවුද ඔයා?"

"මම ඔයාගේ හොඳම යාළුවා," දකුණු මුහුණ කිව්වා.



"මම ඔයාගේ නරකම හතුරා," වම් මුහුණ කිව්වා.

"මම ජානුස්," මුහුණු දෙකම එකවර කිව්වා. "දොරටුවලට, ආරම්භයට, අවසානයට, තෝරා ගැනීම්වලට අධිපති දෙවියා."

"මම ළඟදි ම ඔයාවත් මුණ ගැහෙන්න එනවා, පර්සියස් ජැක්සන්," දකුණු මුහුණ කිව්වා. "ඒත් මේක ඇනබෙත්ගේ වාරය." එයා විගඩම්කාර තාලෙට මහ හඬින් හිනාවුණා. "මේක නම් මාර ජොලි!"

"කට වහ ගන්නවා!" එයාගේ වම් මුහුණ කිව්වා. "මේක බරපතළ දෙයක්. එක වැරදි තීරණයකට ඔයාගේ මුළු ජීවිතය ම විනාශ කරන්න පුළුවන්. ඒකට ඔයාවයි ඔයාගේ යාළුවෝ ඔක්කොමයි මරන්න පුළුවන්. ඒත් මම කිසිම බලපෑමක් කරන්නෑ, ඇනබෙත්. තෝරාගන්න!"

හදිසි වෙවුලීමක් එක්ක මට අනාවැකියේ කියවුණු පේළියක් මතක් වුණා: *'ඇතීනාගේ දරුවා අවසන් වරට නැගී සිටීවි.'*

"ඒක කරන්නෙපා," මම කිව්වා.

"මට බය, එයාට ඒක කරන්න ම වෙනවා," දකුණු මුහුණ ප්‍රීතිමත් හඬින් කිව්වා.

ඇනබෙත් තොල් තෙත් කරගත්තා. "මම- මම තෝරා ගන්නේ-"

එයා දොරක් පෙන්වන්න කලින්, දීප්තිමත් එළියකින් කාමරය පිරුණා.

ජානුස් අත් දෙපසට ඔසවා ඇස් වසා ගත්තා. එළිය වියැකී ගියාම, වතුර මල ළඟ ගැහැනු කෙනෙක් සිටගෙන සිටියා.

උස සිරුරක් ඇති සුන්දර කෙනෙක් වූ එයාට රන් පීත්ත පටි තබා ගෙතූ චොකලට් පාට දිග කොණ්ඩයක් තිබුණා. එයා සුදු පාට සරල ගවුමකින් සැරසී සිටියා, ඒත් එයා සෙලවෙද්දි වතුර මත වැටුණු තෙල් බිංදුවක් වගේ ඇඳුමේ පාට සැලෙමින් දිලිසුණා.

"ජානුස්," එයා කතා කළා. "අපි ආයෙමත් කරදර ඇති කරනව ද?"

"න්-නෑ, මැතිනියනි!" ජානුස්ගේ දකුණු මුහුණ ගොත ගැසුවා.

"ඔව්!" වම් මුහුණ කිව්වා.

"කට වහගන්නවා!" දකුණු මුහුණ කිව්වා.

"මොකක්ද කිව්වේ?" ගැහැනු කෙනා ඇහුවා.

"ඔබතුමිට නෙවෙයි, මැතිනිය! මම මටමයි කියාගත්තේ."

"එහෙමද," ගැහැනු කෙනා කිවුවා. "ඔයා හොඳටම දන්නවා ඔයාට මේ ගමන එන්න තවම කාලෙ හරි නැහැ කියලා. මේ ගැටලුව ළමයගෙ කාලේ තවම ඇවිල්ලා නැහැ. ඒ නිසා මම ඔයාට තෝරාගැනීමක් කරන්න දෙන්නම්: මේ වීරයන්ව මට බාර දීලා යන්න, නැත්නම් මම ඔයාව දොරකට හරවලා කඩලා දානවා."

"මොන වගේ දොරකට ද?" වම් මුහුණ ඇහුවා.

"කට වහගන්නවා!" දකුණු මුහුණ කිවුවා.

"මොකද ප්‍රංශ දොරවල් නම් ලස්සනයි," වම් මුහුණ කිවුවා. "සොබාවික එළිය හොඳක් ලැබෙනවා."

"කට වහගන්නවකෝ!" දකුණු මුහුණ විලාප දුන්නා. "ඔබතුමිට නෙවෙයි, මැතිනිය! ඇත්තටම මම යන්නම්. මම මේ චුට්ටක් විනෝද වුණා විතරයි. මගේ රස්සාව කළේ. තෝරාගැනීමක් දෙන එක."

"දෙගිඩියාවක් ඇති කරන එක," ගැහැනු කෙනා නිවැරදි කළා. "දැන් යනවා යන්න!"

"කඩාකප්පල්කාරි," වම් මුහුණ කෙඳිරුවා. ඊට පස්සෙ රිදී යතුර ඔසවා වාතයට ඇතුළු කළ එයා අතුරුදහන් වුණා.

ගැහැනු කෙනා අපේ පැත්තට හැරෙද්දී මගේ පපුව බයටම සිර වුණා. එයාගේ ඇස් බලයෙන් දිලිසුණා. *'මේ වීරයන්ව මට බාර දීලා යන්න.'* ඒක නම් ඒ හැටි හොඳ දෙයක් නෙවෙයි. ජානුස්ගෙන් අපිට ලැබුණු තෝරාගැනීම් වලින් එකක් ගත්තා නම් මීට වඩා හොඳයි කියලා එක තත්පරයකට මට හිතුණා. ඒත් ඒ වෙලාවේ ගැහැනු කෙනා හිනාවුණා.

"ඔයාලට බඩගිනි ඇති," එයා කිවුවා. "අපි වාඩිවෙලා කතා කරමු."

එයා අතක් වනද්දී, පරණ රෝමානු වතුර මල ක්‍රියාත්මක වුණා. එයින් පිරිසිදු වතුර දහරා ගුවනට විසිරුණා. සැන්ඩ්විච්ස් පිරවූ බන්දේසි සහ ලෙමනේඩ් පිරවූ කොතල තැබූ කිරිගරුඬ මේසයක් මතු වුණා.

"ඔයා... ඔයා කවුද?" මම ඇහුවා.

"මම හේරා," ගැහැනු කෙනා හිනාවුණා. "දිව්‍යලෝකෙ රැජින."

***



දෙවිවරුන්ගේ මහා මන්ත්‍රණ සභාවේ දී එක වතාවක් මම හේරාව දකලා තිබුණා. ඒත් මම එයාට වැඩි අවධානයක් දක්වා තිබුනේ නැහැ, මොකද ඒ වෙලාවේ මාව වට කරගෙන හිටපු අනෙක් දෙවිවරු ටික මාව මරනව ද, නැද්ද කියලා වාද කරමිනුයි හිටියේ.

එයාට මේ තරම් සාමාන්‍ය පෙනුමක් තිබුණා කියලා නම් මට මතක තිබුනේ නැහැ. ඇත්තටම, ඔලිම්පස්වල දි දෙවිවරු ඉන්නේ අඩි විස්සක් විතර උසටයි. එතකොට එයාලට කොහෙත්ම සාමාන්‍ය පෙනුමක් නැහැ නේ. ඒත් දැන්, හේරාට තිබුණේ නියම අම්මා කෙනෙකුගේ පෙනුමක්.

අපිට සැන්ඩ්විච්ස් පිළිගැන්වූ එයා ලෙමනේඩ් වත්කළා.

"ග්‍රෝවර්, දරුවෝ," එයා කතා කළා, "ඔයාගේ නැප්කින් එක පාවිච්චි කරන්න. ඒක කන්නෙපා."

"හොඳමයි, මැඩම්," ග්‍රෝවර් කිවුවා.

"ටයිසන්, ඔයා වැහැරිලා ගිහිල්ලා නේ. ඔයා තව පීනට් බටර් සැන්ඩ්විච් එකක් කන්න කැමති ද?"

ටයිසන් රාම තෙල් පිට වෙන්න නොදි හිර කරගත්තා. "ඔව්, ලස්සන නෝනා."

"හේරා දේවිය," ඇනබෙත් කතා කළා. "මට මේක විශ්වාස කරන්නත් බැහැ. ඔයා මොනවද වංගගිරියෙ කරන්නේ?"

හේරා හිනාවක් පෑවා. එයා ඇඟිල්ලක් සෙලෙව්වාම ඇනබෙත්ගේ කොණ්ඩය ඉබේටම පීරුණා. එයාගේ මුහුණේ තිබුණු කුණු දූවිලි මැකී ගියා.

"වෙන්න ඕනෑ විදිහටම, මම ආවේ ඔයාලව බලන්න," දෙවඟන කිවුවා.

ග්‍රෝවර් සහ මම සැක සහිත බැල්මක් හුවමාරු කරගත්තා. සාමාන්‍යයෙන් දෙවි කෙනෙක් ඔයාව හොයාගෙන එන්නේ, එයාලගේ හිත හොඳ නිසා නෙවෙයි. එයාලට මොනවා හරි උවමනා වුණාමයි.

ඒ වුණත්, ඒක මම ටර්කි-සහ-ස්විස් සැන්ඩ්විච්, චිප්ස් සහ ලෙමනේඩ් ගිල දමන එක නතර කරන්න තරම් හේතුවක් වුනේ නැහැ. මට කොච්චර ලොකු බඩගින්නක් තිබුණා ද කියලා මටම තේරිලා නැහැ. ටයිසන් පීනට් බටර් සැන්ඩ්විච්ස් එකක් පසුපස එකක් ගිල

දමද්දි, ග්‍රෝවර් ලෙමනේඩ්වලට කෙනෙහෙ පෑවේ අයිස් ක්‍රීම් කෝන් එකක් තනාවා වගේ ස්ටයිරොෆෝම් කප් එකත් කා දමමිනුයි.

"මං හිතුවෙ නැහැ-" ඈනබෙත් ගොත ගැහුවා. "හොඳයි, මං හිතුවේ නැහැ ඔයා විරයින්ට කැමතියි කියලා."

හේරා කාරුණික හිනාවක් පෑවා. "හර්කියුලිස් එක්ක මගේ තිබුණු පුංචි කෝන්තරේ නිසා ද? අවංකවම කියනවා නම්, ඒක මතභේදයක් නිසා මට ලොකු නරක නමක් ගැවුණා."

"ඔයා එයාව මරන්න හැදුවෙ නැද්ද, හරියට, දහ දොළොස් වතාවක් විතර?" ඈනබෙත් ඇසුවා.

හේරා එය නොසලකා හරිමින් අතක් වැනුවා. "ඒවා පරණ කතන්දර. මගෙ දරුවෝ. ඇරත්, එයා මගේ ආදරණීය මහත්තයාගෙයි වෙන ගෑනු කෙනෙකුගෙයි දරුවෙක්. ඉතින් මගේ ඉවසීමේ සීමාව පැන්නා. මම ඒක පිළිගන්නවා. ඒත් ඊට පස්සෙ සියුස්යි මමයි හොඳ විවාහ උපදේශන වැඩසටහනකට එකතු වුණා. අපි අපේ හැඟීම් එළිදරව් කරලා. අපි දෙන්නා අතරේ අවබෝධයක් ඇති කරගත්තා - විශේෂයෙන් ම අර අන්තිමට වුණ චූටි සිද්ධියෙන් පස්සේ."

"ඔයා කියන්නේ එයා තාලියාව බිහි කළාට පස්සේ?" මම අනුමාන කළා. ඒත් එහෙම නොකර හිටියා නම් හොඳයි කියලා මට ඒ වෙලාවේම හිතුණා. අපේ යාළුවා, සියුස්ගේ අර්ධ-ලෝහිත දුවගේ නම මගේ කටින් පිටවුණ හැටියේ හේරාගේ ඇස් තියුණු ලෙස මගේ දිහාවට හැරුණා.

"පර්සි ජැක්සන්, එහෙම නේද? පොසෙයිඩන්ගේ... දරුවෙක්." එයා කියන්න හැදුවේ 'දරුවෙක්' කියන එකට වඩා වෙනස් වචනයක් කියලා මට හැඟුණා. "මට මතක විදිහට, දක්ෂිණායනයේ දී මම ඔයාට ජීවත් වෙන්න ඉඩ දෙන්න ඡන්දෙ දුන්නා. මම හරියට ඡන්දෙ දෙන්න ඇති කියලා මම බලාපොරොත්තු වෙනවා."

බැබළෙන හිනාවක් එක්ක එයා ආපසු ඈනබෙත් දිහාවට හැරුණා. "කොහොම වුණත්, මගේ හිතේ ඔයා ගැන කිසිම තරහක් නැහැ, මගෙ කෙල්ලේ. ඔයාගේ ගවේෂණයේ තියෙන අමාරුකම මට තේරෙනවා. විශේෂයෙන් ම ජානුස් වගේ කරදරකාරයෝ එක්ක ඔයාට ගනුදෙනු කරන්න සිද්ධ වෙද්දි එහෙම."



ඈනබෙත් බැල්ම පහත හෙළුවා. "ඇයි එයා මෙතැන හිටියේ? නව පොඩ්ඩෙන් එයා මාව පිස්සු වට්ටනවා."

"ඒක තමයි," හේරා එකඟ වුණා. "ඔයා තේරුම් ගන්න ඕනෑ. ජානුස් වගේ සුළු දෙවිගොල්ලෝ නිතරම ඉන්නේ එයාලට මේ ලැබිලා තියෙන සුළු චරිත ගැන අසතුටෙන්. සමහරු, මට බය, ඔලිම්පස්වලට වැඩි ආදරයක් නැහැ. ඉතින් එයාලව මගේ තාත්තගේ නැගිටීමට උදවු කරන්න නම්මා ගන්න ලේසියි."

"ඔයාගේ තාත්තා?" මම ඇසුවා. "ඔහ්, හරි හරි."

ක්‍රෝනොස් කියන්නේ සියුස්, පොසෙයිඩන් සහ අනෙක් වැඩිමහල් ඔලිම්පියානුවෝ හැම කෙනාගේම වගේම හේරාගේත් තාත්තා කියලා මට අමතක වෙලයි තිබුණේ. මං හිතන්නේ, එතකොට ක්‍රෝනොස් නෑකමට මගේ සීයා වෙනවා. ඒත් ඒ සිතුවිල්ල කොච්චර භයානකයි ද කියනවා නම් මම ඒක හිතෙන් අයින් කරලා දැම්මා.

"අපිට සුළු දෙවිගොල්ලෝ දිහා ඇහැ ගහගෙන ඉන්න වෙනවා," හේරා කිවුවා. "ජානුස්. හෙකේට්. මෝර්ෆියස්. මෙයාලා ඔලිම්පස්වලට සේවය කරනවා කියලා කටින් නම් කියනවා, ඒ වුණත්-"

"ඒකට තමයි ඩයනයිසියස් ගියේ," මට මතක් වුණා. "එයා සුළු දෙවිවරු පරීක්ෂා කරනවා."

"ඇත්තටම." හේරා මැකී යමින් පැවතුණු ඔලිම්පියානුවන්ගේ මොසැයික් චිත්‍රය දිහා බලා සිටියා. "ඔයාට පේනවා නේ, කරදර ඇති වෙන කාලෙට, දෙවිවරුන්ගේ පවා විශ්වාසය නැති වෙන්න පුළුවන්. එයාලා වැරදි දේවල් විශ්වාස කරන්න පටන් ගන්නවා. එයාලා සාමූහිකව හිතන එක නතර කරලා ආත්මාර්ථකාමී වෙන්න ගන්නවා. ඒත් ඔයාට පේනවා නේ, මම තමයි විවාහයට අධිපති දෙවඟන. මම තදින් උත්සහ කරන්න පුරුදු වුණ කෙනෙක්. මට රණ්ඩු දබර යට කරගෙන නැගිටලා, විශ්වාසය පවත්වා ගන්න වෙනවා. මට හැම වෙලාවෙම මගේ අරමුණු හිතේ තියාගන්න වෙනවා."

"මොනවද ඔයාගේ අරමුණු?" ඈනබෙත් ඇසුවා.

එයා හිනාවුණා. "මගේ පවුල, ඔලිම්පියානුවන්ව එකමුතුව තියාගන්න එක, ඇත්තටම. මේ වෙලාවේ, මට ඒක කරන්න පුළුවන් හොඳම විදිහ තමයි ඔයාලට උදවු කරන එක. සියුස් මට මැදිහත් වෙන්න වැඩිය ඉඩ දෙන්නෙ නම් නැහැ තමයි. ඒත් හැම සියවසකට ම

සැරයක් විතර, මම ගොඩක් සැලකිලිමත් වෙන ගවේෂණයකට වරමක් දෙන්න එයා මට ඉඩ දෙනවා."

"වරමක්?"

"ඔයා ඒක ඉල්ලන්න කලින්, ඔයාට තොම්ලේ උපදෙසක් දෙන්න මට ඉඩ දෙන්න. ඔයා ඩෙඩලස්ව මුණ ගැහෙන්න යනවා කියලා මං දන්නවා. ඔයාට වගේම මටත් එයාගේ වංගගිරිය අභිරහසක්. ඒත් ඔයාට එයාගේ ඉරණම ගැන දැනගන්න ඕනෑ නම්, මගේ පුතා හෙෆාස්ටස්ගේ කම්මලට යන්න. ඩෙඩලස් කියන්නේ ශ්‍රේෂ්ඨ නිමැවුම්කරුවෙක්. හෙෆාස්ටස්ගේ හිත දිනාගන්න මනුෂ්‍යයෙක්. එයා තරම් හෙෆාස්ටස් අගේ කරපු වෙන කිසිම මනුෂ්‍යයෙක් ඉඳලා නැහැ. ඩෙඩලස් එක්ක හිටපු, එයාගේ ඉරණම ගැන දන්න කෙනෙක් ඉන්නවා නම්, ඒ හෙෆාස්ටස්."

"ඒත් අපි කොහොමද එතැනට යන්නේ?" ඇනබෙත් ඇසුවා. "මම ඉල්ලන්නේ ඒක. මට වංගගිරිය හසුරුවන්න ක්‍රමයක් ඕනෑ."

හේරාගේ මුහුණට බලාපොරොත්තු කඩ වුණු පෙනුමක් ආවා. "එහෙනම් ඒක ලැබෙයි. කොහොම වුණත්, ඔයා ප්‍රාර්ථනා කළේ දැනටමත් ඔයාට ලැබිලා තියෙන දෙයක්."

"මට තේරෙන්නෙ නැහැ."

"ඒ උපක්‍රමය දැනටමත් ඔයගේ අතට අහුවෙන මානයේ තියෙන්නේ." එයා මගේ දිහා බැලුවා. "පර්සි දන්නවා උත්තරේ."

"මං දන්නවා?"

"ඒත් ඒක සාධාරණ නැහැ," ඇනබෙත් කිවුවා. "ඒක මොකක්ද කියලා ඔයා මට කියන්නෙ නැහැ නේ!"

හේරා ඔළුව හොල්ලුවා. "දෙයක් ලබා ගන්න එකයි, ඒක පාවිච්චි කරන්න බුද්ධිය තියෙනවා කියන එකයි... එකකට එකක් වෙනස් කාරණා දෙකක්. ඔයාගේ අම්මා ඇතිනාත් ඒකට එකඟ වෙයි කියලා මට විශ්වාසයි."

ඈතින් අකුණක් කොටනවා වගේ ඇසුණු හඬකින් කාමරය දෙදුරුම් කෑවා. හේරා නැගී සිටියා. "ඒක මට දැන්න ඉඟියක්. සියුස් නොයිවසිලිවන්ත වෙනවා. මම කියපු දේ ගැන හිතලා බලන්න, ඇනබෙත්. හෙෆාස්ටස්ව හොයාගන්න. ඔයාලට ගොවිපොළ හරහා



යන්න වෙයි, මට හිතෙන්නේ. ඒත් දිගටම යන්න. ඒ වගේම පිට වීමේදි දන්න උපක්‍රම ඔක්කොම පාවිච්චි කරන්න, ඒවා කොයි තරම් සාමාන්‍යයි වගේ පෙනුණත්."

එයා දොරවල් දෙකට අත දිගු කළා ම ඒවා දිය වී ගොස් විවෘත, අඳුරු කොරිඩෝ යුගලක් මතු වුණා. "තව දෙයක්, ඇනබෙත්. ඔයාගේ තෝරාගැනීමේ දිනය මම කල් දැම්මා විතරයි. මම ඒක නතර කළේ නැහැ. ඉක්මනින්ම, ජානුස් කිවුවා වගේ, ඔයාට තීරණයක් ගන්න සිද්ධ වෙයි. ආයුබෝවන්!"

අත් වැනූ එයා සුදු දුමාරයකට හැරුණා. ටයිසන් සැන්ඩ්විච් එකකින් කෑල්ලක් කඩා ගනිද්දි ම ඒකත් එයාගේ කට තුළ දුමකට හැරුණා. වැස්සෙමින් තිබුණු වතුර මලත් නැවතුණා. මොසැයික් බිත්ති නැවතත් අඳුරු සහ නොපැහැදිලි වුණා. ඒ කාමරය තව දුරටත් පික්නික් එකකට හොඳ තැනක් වුනේ නැහැ.

ඇනබෙත් කකුලක් පොළොවේ ගැසුවා. "මොන ජාතියේ උදව්වක් ද ඒක? 'මෙන්න, සැන්ඩ්විච් එකක් කන්න. ප්‍රාර්ථනාවක් කරන්න. උෆ්ස්, මට ඔයාට උදවු කරන්න බැහැ නේ! පූෆ්!'"

"පූෆ්," හිස් පිඟාන දිහා බලාගෙන ටයිසන් දුකෙන් කිවුවා.

"හොඳයි," ග්‍රෝවර් සුසුමක් හෙළුවා. "පර්සි උත්තරේ දන්නවා කියලා එයා කිවුවා. ඒකවත් වටිනවා නේ."

එයාලා හැමෝම මගේ දිහා බැලුවා.

"ඒත් මම දන්නෙ නැහැ," මම කිවුවා. "එයා මොනවා කිවුව ද කියලා මම දන්නෙ නැහැ."

ඇනබෙත් සුසුමක් පිට කළා. "හරි එහෙනම්. අපිට කරන්න තියෙන්නේ දිගටම යන එකයි."

"කොයි පැත්තට ද?" මම ඇසුවා. මට ඇත්තටම අහන්න ඕනෑ වුණේ ඇනබෙත්ට ගන්න වෙන තීරණයක් ගැන හේරා කියපු කතාවේ තේරුම මොකක්ද කියලයි. ඒත් එතකොටම ග්‍රෝවර් සහ ටයිසන් දෙන්නම තිගැස්සුණා. කලින් පුහුණු වෙලා වගේ ඒ දෙන්නා එක විටම නැගිට්ටා. "වමට," දෙන්නම කිවුවා.

ඇනබෙත් රවා බැලුවා. "ඔච්චර විශ්වාසෙන් කියන්නෙ කොහොමද?"

16

"දකුණු පැත්තෙන් මොකෙක්දෝ එන නිසා," ග්‍රෝවර් කිව්වා.

"මොකෙක්දෝ ලොකු එකෙක්," ටයිසන් එකඟ වුණා. "හදිස්සියෙන් එනවා."

"එහෙනම් වම් පැත්ත හොඳම හොඳයි වගේ," මම තීරණය කළා. අපි එක්ව අඳුරු කොරිඩෝව තුළට දුවන්න ගත්තා.

07

# ටයිසන්ගේ හිර ගෙයක් කැඩීමේ මෙහෙයුම

හොඳ ආරංචියඃ වම් උමඟ පැති දොරටු, ඇඹරුම් හෝ වංගු කිසිවක් නැති කෙළින් පාරක්. නරක ආරංචියඃ ඒක එක පැත්තකින් කෙළවර වෙන පාරක්.

යාර සියයක් විතර පස්ස නොබලා දුවපු අපිට සද්දන්ත ගල් කුට්ටියක් පාර මුළුමනින්ම හරස් කරගෙන තියෙනවා දකින්න ලැබුණා. අපිට පිටුපසින්, කකුල් අද්දවමින් එන හඬ සහ තදින් හුස්ම හෙළන හඬ කොරිඩෝව දිගේ දෝංකාර දුන්නා. මොකෙක් හරි - කොහෙත්ම මනුස්සයෙක් නම් නෙවෙයි - අපේ ඉව පාරේ එමින් සිටියා.

"ටයිසන්," මම කතා කළා, "ඔයාට පුළුවන් ද-"

"ඔව්!" එයා ගල් කුට්ටියේ උරහිස වැද්දවූ වේගයට මුළු උමඟ ම සෙලවුණා. ගල් සිවිලිමෙන් දූවිලි වැස්සුණා.

"ඉක්මනට!" ග්‍රෝවර් කිව්වා. "බලාගෙන, වහලෙත් කඩා වැටෙයි, ඒ වුණාට ඉක්මනට!"

අන්තිමේ දි ගල් කුට්ටිය බිහිසුණු ඇඹරුම් හඬක් නගමින් යටත් වුණා. ටයිසන් ඒක පුංචි කාමරයක් තුළට තල්ලු කරද්දි අපි ඒ හරහා ඇතුළට රිංගා ගත්තා.

"ඔක වහලා දාන්න!" ඇනබෙත් කිව්වා.

ගල් කුට්ටියේ අනෙක් පැත්තට ගිය අපි ඒක තල්ලු කළා. අපි අමාරුවෙන් ගල් ගෙඩිය තිබුණු තැනටම තල්ලු කරලා කොරිඩෝව වසා දමද්දි අපිව ලුහුබැඳගෙන ආව එකා කේන්තියෙන් විලාප නැගුවා.

"අපි ඌව හිර කළා," මම කිව්වා.

"එහෙම නැත්නම් අපි අපිවම හිර කරගත්තා," ග්‍රෝවර් කිව්වා.

මම හැරී බැලුවා. අපි ගිහින් තිබුණු වර්ග-අඩි විස්සක් ලොකු සිමෙන්ති කාමරයේ ඉදිරිපස බිත්තිය යකඩ පොලුවලින් ආවරණය කර තිබුණා. අපි උමඟ දිගේ කෙලින්ම ඇවිත් තිබුණේ හිර මැදිරියකටයි.

***

"මේ මොන කෙහෙම්මලක් ද?" ඇනබෙත් වෙර දමා යකඩ පොලු ඇද්දත් ඒවා සෙලවුනේවත් නැහැ. යකඩ පොලු හරහා බැලූ අපිට දකින්න ලැබුනේ අඳුරු අංගනයක් වටා රවුමට සැදූ සිර මැදිරි පේළියක් - අඩු තරමේ තට්ටු තුනක්වත් උසට යකඩ දොරවල් සහ යකඩ පාලම්-පාරවල් එතැන තිබුණා.

"හිර ගෙයක්," මම කිව්වා. "සමහරවිට ටයිසන්ට මේක කඩන්න-"

"ෂ්ෂ්," ග්‍රෝවර් කිව්වා. "ඇහෙනව ද."

අපිට ඉහළින් කොහේදෝ තැනකින් නැඟුණු ගැඹුරු ඉකි බිඳුම් හඬක් ගොඩනැගිල්ල පුරා දෝංකාර දුන්නා. ඊත් එක්කම තවත් හඬක් ඇහුණා - මට තේරුම් ගන්න බැරි යමක් කොඳුරන, පිරී ගානවා වගේ රළු හඬක්. ඒ වචන හරිම අමුතුයි, හරියට තඹලේරුවක් අස්සෙ ගල් කැට හෙලවෙනවා වගෙයි.

"මොකක්ද ඒ භාෂාව?" මම රහසින් ඇහුවා.

ටයිසන්ගේ ඇස් ලොකු වුණා. "වෙන්න බැහැ."

"මොනවද?" මම ඇහුවා.

අපේ හිර මැදිරි දොරේ පොලු දෙකක් අල්ලා ගත් එයා ඒ අතරින් සයික්ලොප්ස් කෙනෙකුට පවා රිංගන්න ඉඩ ඇති වෙන තරමට ඒවා දෙපැත්තට නැමුවා.

"ඕහොම ඉන්න!" ග්‍රෝවර් කතා කළා.



ඒත් ටයිසන් නවතින පාටක් පෙනුනේ නැහැ. අපිත් එයා පසුපස දිව්වා. දීප්තියක් නැති ෆ්ලොරසන්ට් බුබුළු කීපයක් පමණක් දැල්වෙමින් තිබුණු හිර ගෙය අඳුරින් පිරී තිබුණා.

"මම මේ තැන දන්නවා," ඇනබෙත් මට කිව්වා. "මේ අල්කාට්‍රාස්."

"ඔයා කියන්නෙ අර සැන් ෆ්‍රැන්සිස්කෝ කිට්ටුව තියෙන දූපත කියල ද?"

එයා ඔළුව වැනුවා. "මගේ ඉස්කෝලෙන් එහෙට ට්‍රිප් එකක් ගියා. ඒක හරියට කෞතුකාගාරයක් වගේ."

වංගගිරිය අස්සෙන් ගිහිල්ලා රටේ අනෙක් කෙළවරෙන් මතු වෙන්න අපිට පුළුවන් වුණා කියලා හිතා ගන්නවත් බැරිවුණා, ඒත් ඇනබෙත් මුළු අවුරුද්ද පුරාම ජීවත් වුණේ සැන් ෆ්‍රැන්සිස්කෝවල මුහුදු බොක්ක හරහා ටැමල්පයිස් කන්දට ඇහැ ගහගෙනයි. ඉතින් එයා කතා කරන්නේ මොනවා ගැන ද කියලා එයා දනගෙන ඉන්න ඇති.

"නවතින්න," ග්‍රෝවර් අනතුරු ඇඟෙව්වා.

ඒත් ටයිසන් නොනැවතී ගියා. ග්‍රෝවර් එයාගේ අතක් ඩැහැගෙන ඇති විරියෙන් ආපස්සට ඇද්දා. "නවතිනවා, ටයිසන්!" එයා කෙඳිරුවා. "ඔයාට ඒක පේන්නැද්ද?"

එයා ඇඟිල්ල දිගු කර පෙන්වූ දිහාව බලද්දි මගේ බඩ පිනුම් ගැහුවා. අංගනයේ අනෙක් කෙළවර, දෙවෙනි තට්ටුවේ සඳලුතලය මත සිටියේ මම ජීවිතේට දැකපු බිහිසුණු ම රාක්ෂයායි.

ඉණෙන් උඩට ගැහැනු ඇඟක් තිබුණු ඌ නිකං නරාශ්වයෙක් වගෙයි. හැබැයි අශ්වයෙකුගේ යටි කයක් වෙනුවට, ඌට තිබුණේ මකරෙකුගේ යටි කයක් - අඩු තරමේ අඩි විස්සක්වත් දිග, කළු පාට, කොරපොතු පිරුණු, අති විශාල නිය පහුරු සහ කටු සහිත වලිග යක් ඇති එකක්. එයාගේ කකුල්වල වැල් පැටලිලා වගෙයි පෙනුණේ. ඒත් ඒවාගෙන් සර්පයෝ මෝදු වෙන බව ටිකකින් මට තේරුම් ගියා. පොළොඟුන් සිය ගාණක් දෂ්ට කරන්න යමක් සොයමින් වටේට ඇදි යමින් සිටියා. ගෑනු කෙනාගේ කොණ්ඩයත් මෙඩූසාගේ වගේ සර්පයින්ගෙන් සෑදි තිබුණා. මේ ඔක්කොටම වඩා භයානක දේ වුණේ එයාගේ මකර ඇඟ සහ මිනිස් ඇඟ බද්ධ වෙන තැන, ඉණ වටේ

හමෙන් බුබුළු දමමින්. විටින් විට සත්ත්ව ඔළු උත්පාදනය වුණු එකයි - තඹුරු වෘකයෙක්, වලහෙක්, සිංහයෙක් - හරියට එයා නිතරම හැඩය මාරු වෙන ඉණ පටියක් පැලඳගෙන සිටියා වගෙයි. මම බලා සිටියේ හැඩ පුරුකම් නියමාකාරයෙන් තේරුම් කරන්න කලින් බිහි වුණු කාලයේ ආරම්භය තරමට ම පරණ රාක්ෂණියක් දිහා කියලා මට හැඟුණා.

"ඒ එයා," ටයිසන්ට කෙඳිරි ගෑවුණා.

"පාත් වෙන්න!" ග්‍රෝවර් කිවුවා.

අපි හෙවණැලි අතරේ ඇන තියා ගත්තා. ඒත් රාක්ෂණිය අපිට කිසිම අවධානයක් දක්වූයේ නැහැ. ඌ දෙවෙනි තට්ටුවේ සිර මැදිරියක් තුළ සිටි කෙනෙකුට කතා කරනවා වගෙයි පෙනුණේ. ඉකි බිඳින හඬ ඇසුණේ ඒක ඇතුළෙනුයි. මකර ගැහැනු කෙනා එයාගේ අමුතු ගොරවන භාෂාවෙන් මොනවදෝ කිවුවා.

"මොනවද එයා කියන්නෙ?" මම කොඳුරා ඇසුවා. "මොකක්ද ඒ භාෂාව?"

"ඉස්සර කාලේ භාෂාව." ටයිසන් වෙවුලුවා. "මහ පොළොව ටයිටන්ලටයි... එයාගේ අනිත් දරුවන්ටයි කතා කරේ ඒකෙන්. දෙවිවරුන්ට කලින්."

"ඔයාට ඒක තේරෙනව ද?" මම ඇසුවා. "එයා කියන දේ අපිට කියන්න ඔයාට පුළුවන් ද?"

ඇස් වසා ගත් ටයිසන් බිහිසුණු, රළු ගැහැනු හඬින් කතා කරන්න පටන් ගත්තා. "තුඹ ස්වාමියා වෙනුවෙන් වැඩ කරපන්, නැත්නම් විඳවපන්."

ඇනබෙත් වෙවුලුවා. "එයා එහෙම කරන එක මට පෙනෙන්න බැහැ."

හැම සයික්ලොප්ස් කෙනෙකුට ම වගේ ටයිසන්ටත් අධිමානුෂික ශ්‍රවණ හැකියාවක් සහ කටහඬවල් අනුකරණය කිරීමේ ගුප්ත හැකියාවක් තිබුණා. එයා වෙනත් කටහඬකින් කතා කරන්නේ හරියට මෝහනයකට පත්වෙලා වගෙයි.

"මම ගැතිකම් කරන්නෑ," ටයිසන් ගැඹුරු, පැරුණු හඬකින් කිවුවා.



එයා ආයෙමත් රාක්ෂණියගේ හඬට මාරු වුණා: "එහෙනම් මට තුඹට වධ දීලා විනෝද වෙන්න පුළුවන්, බ්‍රයර්ස්." ඒ නම කියද්දි ටයිසන් පැකිළුණා. මීට කලින් කාවහරි අනුකරණය කරද්දි එයා චරිතයේ හඬ රටාව බිඳිනවා මට කවදාවත් අහන්න ලැබිලා තිබුනේ නැහැ. ඒ වුණත් එයා බලෙන් මැඩ පවත්වා ගත් ඉකියක් පිට කළා. ඊට පස්සේ එයා ආයෙමත් රාක්ෂණියගේ හඬින් කතා කළා. "තුඹේ පළවෙනි හිර අඩස්සිය ඉවසන්න බැරි තරම් කියලා හිතුණා නම්, නියම වධ වේදනා තුඹ තවම විඳලා නැහැ. මම ආපහු එනකල් මේ ගැන හිතලා බලපන්."

පොළොංගු සූ හඬ ගාමින් කකුල් වටේ එතෙද්දි මකර ගැහැනිය පඩිපෙළ දිහාවට ඇදුණා. මීට කලින් මගේ සැලකිල්ලට හසු නොවූ තටු දෙකක් එයා දිග ඇරියා - එයාගේ මකර පිට මත නමාගෙන සිටි යෝධ වවුල් තටු දෙකක්. පාලම්-පාරෙන් ඉහළ නැගුණු එයා අංගනය හරහා පියාසර කළා. අපි හෙවණැලි අතරට තවත් පහත් වුණා. රාක්ෂයා අපිට ඉහළින් පියඹා යද්දි ගෙන්දගම් මුසු උණුසුම් සුළඟක් මගේ මුහුණේ වැදුණා. ටිකකින් එයා කෙළවරෙන් නොපෙනී ගියා.

"බ්-බ්-බය හිතෙනවා," ග්‍රෝවර් කිවුවා. "මීට කලින් මට කවදාවත් රාක්ෂ ගඳ එච්චර තදට දැනිලා නැහැ."

"සයික්ලොප්ස්ලගෙ නරකම හීනේ," ටයිසන් මිමිණුවා. "කැම්පි."

"කවුරු?" මම ඇසුවා.

ටයිසන් තදින් කෙළ ගිල්ලා. "හැම සයික්ලොප්ස් කෙනෙක් ම එයා ගැන දන්නවා. අපි බබාලා කාලේ එයා ගැන කියලා තමයි අපිව බය කරන්නේ. නරක අවුරුදුවල එයා තමයි අපේ හිර ගෙදර බලාගත්තෙ."

ඇනබෙත් ඔළුව වැනුවා. "මට දන් මතකයි. ටයිටන්ලා රජ කරපු කාලේ, එයාලා ගයියාගෙයි යුරේනස්ගෙයි වැඩිමහල් ළමයි - ඒ කියන්නෙ සයික්ලොප්ස්ලවයි, එකටොව්කියර්ලාවයි හිර කළා."

"එකට- මොකුන් ද?" මම ඇසුවා.

"අත්-සියයක් ඇත්තෝ," එයා කිවුවා. "එයාලට ඒ නම කිවුවේ... හොඳයි, එයාලට අත් සීයක් තිබුණ නිසා. එයාලා තමයි සයික්ලොප්ස්ලාගෙ අයියලා."

"ගොඩක් බලගතුයි," ටයිසන් කිව්වා. "පුදුමාකාරයි! අහස තරම් උසයි. කොච්චර හයිය හත්තිය තියෙනව ද කියනවා නම්, එයාලට කන්දක් වුණත් කඩන්න පුළුවන්!"

"මරු නේ," මම කිව්වා. "හැබැයි ඔයා කන්දක් නම් ඇරෙන්න."

"කැම්පී තමයි හිර ගෙදර ලොක්කා," එයා කිව්වා. "එයා වැඩ කළේ ක්‍රෝනොස්ට. එයා අපේ අයියලාව ටාටරස්වල හිර කරලා එයාලට හැම වෙලාවෙම වධ දුන්නා. අන්තිමේ දි සියුස් ආවා, එයා කැම්පීව මරලා සයික්ලොප්ස්ලාවයි අත්-සියයක් ඇත්තන්වයි නිදහස් කරලා, ටයිටන්ලා එක්ක කරපු ලොකු යුද්ධෙ දිනන්න එයාලගෙන් උදවු ගත්තා."

"ඒත් දැන් කැම්පී ආපහු ඇවිල්ලා," මම කිව්වා.

"ඒක නරකයි," ටයිසන් කෙටියෙන් කිව්වා.

"එතකොට කවුද අර හිර කූඩුවෙ ඉන්නේ?" මම ඇහුවා. "ඔයා නමක් කිව්වෙ-"

"බ්‍රයර්ස්!" ටයිසන් උද්දෝගිමත් වුණා. "එයා අත්-සියයක් ඇත්තෙක්. එයාලා අහස තරම් උසයි, එයාලට-"

"ඔව්," මම කිව්වා. "එයාලට කඳු කඩන්නත් පුළුවන්."

අපිට ඉහළින් තිබුණු හිර මැදිරිය දිහා බලාගෙන මම පුදුමයෙන් කල්පනා කළේ අහසට උස කෙනෙක්ව අච්චර චූටි හිර කූඩුවක් ඇතුළට දැම්මෙ කොහොමද කියලයි, එයා අඬන්නේ ඇයි කියලයි.

"මං හිතන්නෙ අපි ගිහින් බැලුවොත් හොඳයි," ඇනබෙත් කිව්වා. "කැම්පී ආපහු එන්න කලින්."

***

අපි හිර මැදිරියට කිට්ටු කරද්දි වැලපෙන හඬ වඩාත් තදින් ඇහුණා. ඇතුළේ සිටි කෙනාව දකිද්දි, මම දකිමින් සිටියේ මොනවද කියලා මටම හිතාගන්න බැරිවුණා. මනුෂ්‍ය ප්‍රමාණයේ කෙනෙක් වූ එයාට සුදුමැලි - ඒ කියන්නේ කිරි පාට හමක් තිබුණා. එයා ලොකු ඩයපරයක් වගේ අමුඩයක් හැඳ සිටියා. ඇගේ තරමට වඩා ගොඩක් ලොකුයි වගේ පෙනුණු එයාගේ කකුල් දෙකේ කැඩුණු, කුණු පිරුණු නියපොතු ඇති ඇඟිලි අට බැගින් තිබුණා. ඒත් අමුතුම කොටස වුණේ එයාගේ උඩු කයයි. එයා එක්ක බලද්දි ජානුස්ගේ පෙනුම හරිම



සාමාන්‍යයි වගෙයි. එයාගේ පපුවෙන්, පැත තැගී, පේළිවලට ඇඟ වටේටම තිබුණේ මට ගණන් කරගන්නත් බැරි තරම් අත් ගොඩක්. ඒ අත් සාමාන්‍ය අත් වගේ පෙනුණත්, ඒවා ගොඩක් එකිනෙක පැටලී තිබුණු නිසා එයාගේ පපුව පෙනුණේ ගෑරුප්පුවකින් කරකැවූ ස්පැගටි ගොඩක් වගෙයි. එයා වැලපෙද්දි අත් කීපයක් එයාගේ මුහුණ වසාගෙන තිබුණා.

"එක්කෝ අහස කලින් තිබුණට වඩා පහළට ඇවිල්ලා," මම කෙඳිරුවා, "නැත්නම් එයා කොට වෙලා."

ටයිසන් ඒ ගැන කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැහැ. එයා දණහිස් මතට ඇද වැටුණා.

"බ්‍රයර්ස්!" එයා කතා කළා.

ඉකි බිඳීම නැවතුණා.

"මහා අත්-සියයක් ඇත්තාණෙනි!" ටයිසන් කිව්වා. "අපිට උදවු කරන්න!"

බ්‍රයර්ස් ඔළුව ඔසවා බැලුවා. ඇද වුණු නහයක් සහ නරක් වුණු දත් තිබුණු එයාගේ දිගටි මුහුණ දුක්බර පෙනුමක් ගත්තා. එයාට තද දුඹුරු පාට ඇස් දෙකක් තිබුණා - මම අදහස් කළේ, සුදු හෝ කළු ඉංගිරියා නැති, තනි දුඹුරු පාට ඇස් දෙකක්. ඒවා හරියට මැටියෙන් හදලා වගෙයි.

"පුළුවන් වෙලාවේ මෙතැනින් පැනලා දුවන්න, සයික්ලොප්ස්," බ්‍රයර්ස් කාලකණ්ණි ලෙස කිව්වා. "මට අඩු තරමේ මටම උදවු කරගන්නවත් බැරුව ඉන්නේ."

"ඔයා අත්-සියයක් ඇත්තෙක් නේ!" ටයිසන් කියා සිටියා. "ඔයාට ඕනෑම දෙයක් කරන්න පුළුවන්!"

බ්‍රයර්ස් අත් පහ හයකින් නහය පිසදාගත්තා. තවත් අත් කීපයක් කැඩුණු ඇඳක ලෝහ සහ ලී කෑලි එහා මෙහා කරමින් සිටියේ හරියට ටයිසන් නිතරම එයාගේ අමතර කොටස් සමග සෙල්ලම් කරනවා වගෙයි. ඒක බලා ඉන්න පුදුම හිතෙන වැඩක්. ඒ අත්වලට තනි තනිව කල්පනා කරන්න හැකියාවක් තිබුණා වගෙයි. ලී කෑලිවලින් සෙල්ලම් බෝට්ටුවක් සෑදූ ඒවා ඒ ඉක්මනින්ම ඒක ආපසු ගැලෙව්වා. තවත් අත් කීපයක් ඕනෑවට-එපාවට වගේ සිමෙන්ති පොළොව පහුරු ගාමින් සිටියා. අනෙක් ඒවා 'සිසර්ස්-පේපර්ස්-රොක්' සෙල්ලම කරද්දි

තවත් අත් කීපයක් තාරාවෝ. බල්ලෝ වගේ හෙවණැලි රූප බිත්තියේ සාදමින් සිටියා.

"මට බැහැ," බ්‍රයර්ස් අදෝනා දුන්නා. "කැම්පි ආපහු ඇවිල්ලා. ටයිටන්ලා රජ වෙලා. අපිව ආපහු ටාටරස්වලට විසි කරලා දායි."

"ඔයාගේ නිර්භීත මූණ පෙන්නන්න!" ටයිසන් කිව්වා.

එසැණින් ම බ්‍රයර්ස්ගේ මුහුණ වෙනස් වුණා. දුඹුරු ඇස්වල වෙනසක් නැති වුණත්, අනෙක් අංග සියල්ල වෙනස් වී තිබුණා. එයාට ඉහළට හැරුණු නහයකුත්, වක් වූ ඇහිබැම් දෙකක් සහ අමුතු හිනාවකුත් තිබුණේ හරියට එයා නිර්භීත ලෙස හැසිරෙන්න උත්සහ කරනවා වගෙයි. ඒත් ඊට පස්සේ එයාගේ මුහුණ ආපසු කලින් තිබුණු විදිහටම හැරුණා.

"වැඩක් නෑ" එයා කිව්වා. "මගේ බයවුණ මූණ ආයෙමත් මතු වෙනවා."

"ඔයා කොහොමද ඒක කළේ?" මම ඇහුවා.

ඇනබෙත් මට වැළමිටෙන් ඇන්නා. "ඔච්චර මෝඩ වෙන්නෙපා. අත්-සියයක් ඇත්තෝ හැමෝටම වෛවාරන්න මූණු පනහක් තියෙනවා."

"එහෙනම් ඉස්කෝලෙ ඉයර්-බුක් එකට ෆොටෝ එකක් ගන්න එයාලට හරිම අමාරු ඇති," මම කිව්වා.

ටයිසන් තවමත් සිටියේ ප්‍රීතියෙන් කුල්මත් වෙලා වගෙයි. " ඔක්කොම හරි යයි, බ්‍රයර්ස්! අපි ඔයාට උදවු කරන්නම්! ඔයා මට සමරු අත්සනක් දෙනව ද?"

බ්‍රයර්ස් නහය ඉහළට ඇද්දා. "ඔයා ළඟ පෑන් සීයක් තියෙනව ද?"

"ඒක නෙවෙයි," ග්‍රෝවර් කතාව මැද්දට පැන්නා. "අපි මෙතැනින් එළියට පැන ගන්න ඕනෑ. කැම්පි ආපහු එයි. එයාට කොයි වෙලාවෙ හරි අපේ ඉව දැනෙයි."

"පොලු කඩන්න," ඇනබෙත් කිව්වා.

"ඔව්!" ටයිසන් කිව්වේ ආඩම්බරයෙන් හිනා වෙමින්. "බ්‍රයර්ස්ට ඒක කරන්න පුළුවන්. එයා ගොඩාක් ශක්තිමත්. සයික්ලොප්ස්ලටත් වඩා ශක්තිමත්! ඔත්ත බලන්නකෝ!"



බ්‍රයර්ස් කෙඳිරි ගෑවා. එයාගේ අත් දුසිමක් විතර 'අතුරු-මිතුරු' කරන්න ගත්තා. ඒත් එකක්වත් යකඩ පොලු කඩන්න තම් කිසිම උත්සහයක් ගත්තේ නැහැ.

"එයා ඔය කියන තරම් ශක්තිමත් නම්," මම කිව්වා, "ඇයි කූඩුවක හිරවෙලා ඉන්නේ?"

ඇනබෙත් ආයෙමත් වැළමිටෙන් මගේ ඉළ ඇටවලට ඇන්නා. "එයා බයවෙලා ඉන්නේ," එයා රහසින් කිව්වා. "කැම්පි එයාව අවුරුදු දාස් ගාණක් ටාටරස්වල හිර කරගෙන හිටියා. ඔයාට එහෙම වුණොත් කොහොම දැනෙයි ද?"

අත්-සියයක් ඇත්තා ආයෙමත් මුහුණ වසා ගත්තා.

"බ්‍රයර්ස්?" ටයිසන් කතා කළා. "මොකද... මොකක්ද ප්‍රශ්නේ? කෝ, අපිට ඔයාගේ ශක්තිය පෙන්නන්න!"

"ටයිසන්," ඇනබෙත් කතා කළා, "මං හිතන්නේ ඔයාම දොර පොලු කැඩුවොත් හොඳයි."

ටයිසන්ගේ හිනාව හෙමිහිට දිය වී ගියා.

"මම දොර පොලු කඩන්නම්," එයා ඒකම කිව්වා. හිර මැදිරියේ දොර අල්ලා ගත් එයා ඒක සරනේරුවලින් ගලවා දැමුවේ හරියට තෙත මැටිවලින් හදපු එකක් වගෙයි.

"මෙහෙ එන්න, බ්‍රයර්ස්," ඇනබෙත් කතා කළා. "අපි ඔයාව මෙතැනින් එළියට අරන් යන්නම්."

එයා අත දිගු කළා. එක තත්පරයකට බ්‍රයර්ස්ගේ මුහුණ බලාපොරොත්තු සහගත පෙනුමකට හැරුණා, එයාගේ අත් කීපයක් ම ඇනබෙත්ගේ අත දිහාවට දිගු වුණා, ඒත් ඒ වගේ දෙගුණයක් විතර අත් ඉදිරියට දිගු වූ ඒවා ගසා දැමුවා.

"මට බැහැ," එයා කිව්වා. "එයා මට දඬුවම් කරයි."

"එහෙම වෙන්නෑ," ඇනබෙත් පොරොන්දු වුණා. "මීට කලිනුත් ඔයා ටයිටන්ලට විරුද්ධව සටන් කළා, ඒ වගේම ඔයාලා දිනුවා, මතක ද?"

"මට ඒ යුද්දෙ මතකයි." බ්‍රයර්ස්ගේ මුහුණ නැවතත් වෙනස් වුණා - එයාගේ ඇහි බැම් රැළි ගැසී, කට උල් වුණා. මං හිතන්නේ, ඒක එයාගේ කල්පනාබර මූණ වෙන්න ඇති. "අකුණු විදුලිවලින් ලෝකෙම

Scanned with CamScanner

හෙලවුණා. අපි ගල් ගොඩවල්වලින් දමලා ගැහුවා. තව පොඩ්ඩෙන් ටයිටන්ලයි රාක්ෂයෝයි දිනනවා. දැන් එයාලා ආයෙමත් ශක්තිමත් වෙනවලු. කැම්පි කිවුවෙ එහෙමයි."

"එයා කියන ඒවා අහන්නෙපා," මම කිවුවා. "එන්න යමු!"

එයා හෙලවුනේවත් නැහැ. ග්‍රෝවර් කිවුව කතාව හරි කියලා මම දැනගෙන හිටියා. කැම්පි ආපහු එන්න කලින් අපිට වැඩි වෙලාවක් තිබුනේ නැහැ. ඒත් අපිට නිකං ම එයාව එතැන දාලා යන්න පුළුවන්කමක් තිබුනෙත් නැහැ. එහෙම කළොත් ටයිසන් සති ගාණක් යනකල් අඩයි.

"අපි එක පාරක් 'සිසර්-පේපර්-රොක්' සෙල්ලම කරමු," මම නොහිතාම කිවුවා. "මම දිනුවොත්, ඔයා අපිත් එක්ක එනවා. මම පැරදුනොත්, ඔයාට හිර කුඩුවේ ඉන්න ඇරලා අපි යනවා."

ඇනබෙත් මගේ දිහා බැලුවේ පිස්සෙක් දිහා බලනවා වගෙයි.

බ්‍රයර්ස්ගේ මුහුණ සැක සහිත පෙනුමක් ඇති එකකට හැරුණා. "මම හැම වෙලාවෙම 'සිසර්-පේපර්-රොක්' සෙල්ලමෙන් දිනනවා."

"එහෙනම් අපි ඒක කරමු!" මම මිට මොළවාගත් අතකින් අනෙක් අත්ලට තුන් සැරයක් ගැසුවා.

බ්‍රයර්ස්, එයාගේ අත් සියයෙන් ම ඒක කරද්දි ඇසුණේ සරඹ පෙළපාළියක යන හමුදාවක් පියවර තුනක් ඉස්සරහට ගියා වගෙයි. එයා රොක්ස් ගොඩක්, පන්ති කාමරයකටම ඇති වෙන්න සිසර්ස් සහ රොකට් බල ඇණියක්ම හදන්න ඇති තරම් පේපර්ස් අත්වලින් හදලා පෙන්නුවා.

"මං ඔයාට කිවුව නේ," එයා දුක්බරව කිවුවා. "මම හැම වෙලාවෙම-" එයාගේ මුහුණ පැටලුණු පෙනුමක් ඇති එකකට මාරු වුණා. "ඔයා ඔය මොකක්ද හදලා තියෙන්නේ?"

"තුවක්කුවක්," මගේ ඇඟිලි තුවක්කුව පෙන්වමින් මම එයාට කිවුවා. ඒක පෝල් බ්ලෝෆිස් මාව අමාරුවේ දාන්න කරන උප්පරවැට්ටියක්, ඒ වුණාට මම ඒ බවක් එයාට කියන්න ගියේ නැහැ. "තුවක්කුවකට ඕනෑ දෙයක් පරාදයි."

"ඒක සාධාරණ නැහැ."



"මම සාධාරණේ ගැන මුකුත් කිවුවෙ නැහේ. අපි මේ අහල පහළක හිටියොත් කැම්පිත් සාධාරණ වෙන්නෙ නැහැ. කුඩුවේ පොලු කැඩුවා කියලා එයා ඔයාට දොස් කියයි. දැන් ඉක්මන් කරලා එන්න!"

බ්‍රයර්ස් නහය ඉහළට ඇද්දා. "උප දෙවිවරු මහ වංචාකාරයෝ." ඒ වුණත් හෙමිහිට දෙපයින් සිටගත් එයා අපි පිටුපසින් කුඩුවෙන් පිටතට ආවා.

මට බලාපොරොත්තු සහගත බවක් දැනෙන්න ගත්තා. දැන් අපිට කරන්න තිබුණේ පහළ තට්ටුවට ගිහින්, වංගගිරියට ඇතුළු වෙන්න දොරටුවක් හොයාගන්න එක විතරයි. ඒත් ඒ වෙලාවේ ටයිසන් ගල් ගැහුණා.

බිම් මහලේ අපිට හරියටම පහළින් කැම්පි දත් නියවා ගොරවමින් අපි දිහා බලා සිටියා.

***

"අනිත් පැත්තට," මම කිවුවා.

අපි පාලම්-පාර දිගේ පහළට දිවුවා. මේ වතාවේ බ්‍රයර්ස් කැමැත්තෙන්ම අපි පස්සේ ආවා. ඇත්තම කියනවා නම් එයා බයෙන් කුලප්පු වෙලා අත් සියයම වනමින්, අපිවත් ඉස්සර කරගෙන දුවපු එකයි කළේ.

අපිට පිටුපසින්, කැම්පි ඉහළට පියාඹද්දි එයාගේ යෝධ තටු වදින හඬ මට ඇසුණා. එයා, එයාගේ පෞරාණික භාෂාවෙන් පිඹින්නත්, ගොරවන්නත් පටන් ගත්තා, ඒත් මේ වතාවේ නම් එයා අපිව මරන්න සැලසුම් කරන බව තේරුම් ගන්න මට භාෂා පරිවර්තකයෙක් ඕනෑ වුනේ නැහැ.

පඩිපෙළ පහළට පොරකමින් දිවූ අපි කොරිඩෝවක් හරහා මුර කුටියක් පසු කරමින් තවත් හිර මැදිරි කාණ්ඩයක් ළඟට ආවා.

"වමට," ඇනබෙත් කිවුවා. "මට මේක ට්‍රිප් එකේ දී දැක්කා මතකයි."

වේගයෙන් පිටතට දිවූ අපිට දකින්න ලැබුණේ මුර කුළුනු සහ කටු කම්බිවලින් වට කළ හිර ගෙදර මිදුලට අපි ඇවිත් ඇති බවයි. දිගු වෙලාවක් ඇතුළේ හිඳීම නිසා, දිවා එළිය දකිද්දී මගේ ඇස් ගිනිකන වැටුණා. සංචාරකයෝ වටපිටාවේ සැරිසරමින්, ඡායාරූප ගනිමින් සිටියා. මුහුදු බොක්කේ සීතල ඇතට පලවා හරිමින් සුළං හැමුවා.

දකුණු දෙසින් සැන් ෆ්‍රැන්සිස්කෝ සුදු පාටින් ලස්සනට දිස්නය දෙමින් පෙනුණා. ඒත් උතුරු දෙස, ටැමල්පයිස් කන්දට ඉහළින් අති විශාල කුණාටු වලාකුළු ගොඩක් සුළි නංවමින් තිබුණා. ඇට්ලස්ව සිර කර තිබුණු සහ ඉස්සර ඔත්‍රිස් කන්දේ තිබුණු ටයිටන් මාලිගාව අලුතින් ඉදි වෙමින් තිබුණු ටැම් කන්ද කේන්ද්‍ර කරගෙන මුළු අහසම බමනවා වගෙයි පෙනුණේ. අහසේ අස්වාභාවික කුණාටුවක් කැකෑරෙනවා සංචාරකයින්ට පෙනුනේ නැහැ කියලා විශ්වාස කරන්නත් අමාරු වුණා. ඒත් වටපිටාවේ කිසිම වැරැද්දක් වෙනවා කියලා එයාලාගෙන් ඉඟියක්වත් පළ වුනේ නැහැ.

"ඒක තිබුණටත් වඩා නරකයි," උතුරු දෙසට බැල්ම යොමාගෙන ඇනබෙත් කිවුවා. "අවුරුද්ද පුරාම කුණාටු වැඩිවෙලා තමයි තිබුණේ, ඒත් අරක-"

"දිගටම යමු," බ්‍රයර්ස් විලාප දුන්නා. "එයා අපිට පිටිපස්සෙන්!"

අපි හිර මැදිරිවලින් හැකි තරම් ඈතට, මිදුලේ අනෙක් කෙළවරට දිවුවා.

"කැම්පී ගොඩක් ලොකු නිසා අර දොරවල් හරහා එන්න බැරි වෙයි," මම බලාපොරොත්තු සහගතව කිවුවා.

එතකොටම බිත්තිය පුපුරා ගියා.

දූවිලි සහ ගල් කැලි අතරින් කැම්පී මතු වෙද්දි සංචාරකයෝ මර හඬ දෙන්න ගත්තා. එයාගේ තටු දෙක මිදුල තරම් පළලට විහිදී තිබුණා. එයා කඩු දෙකක් දෑතින් ගෙන සිටියා - අමුතු කොළ පාටට හුරු දීප්තියකින් බැබළුණු දිග, වකුටු ලෝකඩ කඩු දෙකක්. ඒවායින් පිටවුණු උණුසුම් පිළුණු ගඳ මිදුල හරහා හමා ආවා.

"වස!" ග්‍රෝවර් මොර දුන්නා. "ඒවා ඈගේ ගෑවෙන්නවත් දෙන්නෙපා, එහෙම වුණොත්..."

"අපි මැරෙයි ද?" මම අනුමාන කළා.

"මෙහෙමයි... ඔයාව හෙමින් හෙමින් ඇකිළිලා දූවිලි වුණාට පස්සේ, ඔව්."

"එහෙනම් අපි කඩු මග ඇරලා ඉමු," මම තීරණය කළා.

"බ්‍රයර්ස්, සටන් කරන්න!" ටයිසන් බල කරා. "සම්පූර්ණ ප්‍රමාණයට ලොකු වෙන්න."



ඒත් ඒ වෙනුවට, බ්‍රයර්ස් තවත් ඇකිළිලා පුංචි වෙන්න හදනවා වගෙයි පෙනුණේ. එයා මුළුමනින්ම භීතියට පත් වූ මුහුණ දමාගෙන ඉන්න බව පෙනුණා.

කැම්පී, එයාගේ මකර කකුල්වලින් පොළොව දෙදරවමින් අපි දිහාවට එද්දි සර්පයෝ සිය ගාණක් එයාගේ ඇඟ වටේ ලිස්සා යමින් සිටියා.

එක තත්පරයකට, රිප්ටයිඩ් ඇදලා අරන් එයාට මුහුණ දෙන්න මම හිතුවා, ඒත් මගේ හදවත උගුරට ඇවිල්ලා වගෙයි දැනුණේ. ඒ වෙලාවේ මම හිතමින් සිටි දේ ඇනබෙත් කිවුවා: "දුවන්න."

තවත් වාද කරන්නෙ මොකටද. මේ සතා එක්ක නම් කොහෙත්ම සටන් කරන්න බැහැ. අපි හිර ගෙදර මිදුල හරහා දුව ගොස් ගේට්ටුවෙන් එළියට පැන ගනිද්දි, රාක්ෂයා අපි පිටුපසින්ම ආවා. මිනිස්සු බෙරිහන් දෙමින් දිවුවා. හදිසි අනතුරු සයිරන් නළා හඬ දෙන්න පටන් ගත්තා.

සංචාරක බෝට්ටුවක් සෙනඟ ගොඩ බස්සන්න ගනිද්දි ම අපි ජේගුවට ඇතුළු වුණා. ඉස්සරහට දුවගෙන එන අපිවත්, අපිට පිටුපසින් එන තැති ගත් සංචාරක රැළත්, එයාලට පිටුපසින් එන... මීදුම තුළින් එයාලා දැක්කේ මොකෙක්වද කියලා මම දන්නෙ නැහැ, ඒත් ඒක හොඳ දෙයක් නම් වෙන්න බැහැ - දැකලා අලුත් සංචාරක කණ්ඩායම ගල් ගැසුණා.

"බෝට්ටුව?" ග්‍රෝවර් ඇසුවා.

"වේගෙ මදි," ටයිසන් කිවුවා. "ආපහු වංගගිරියට. බේරෙන්න තියෙන එකම ඉඩ ඒක විතරයි."

"අපිට එයාව වෙන පැත්තකට හරවන්න වෙනවා," ඇනබෙත් කිවුවා.

ටයිසන් ලෝහ පහන් කණුවක් පොළොවෙන් උදුරා ගත්තා. "මම කැම්පීව වෙන පැත්තකට හරවන්නම්. ඔයාලා දුවන්න."

"මම ඔයාට උදවු කරන්නම්," මම කිවුවා.

"නෑ," ටයිසන් කිවුවා. "ඔයා යන්න. වසවලින් සයික්ලොප්ස්ලට රිදෙනවා. ගොඩාක් රිදෙනවා. ඒත් ඒවාගෙන් මැරෙන්නෑ."

"ඔයාට විශ්වාස ද?"

Scanned with CamScanner

"අයියා යන්ඩ. මම ඇතුළෙ දි ඔයාව හම්බ වෙන්නම්."

මම ඒ අදහසට කොහෙත්ම කැමති වුණේ නැහැ. මට එක වතාවකුත් ටයිසන්ව නැති වෙන්න ගියා. ඒ වගේ අවදානමක් ආයෙමත් ගන්න මට ඕනෑ වුණේ නැහැ. ඒත් අපිට වාද කරකර ඉන්න වෙලාවක්වත්, මගේ ළඟ වෙන හොඳ අදහසක්වත් තිබුණේ නැහැ. ඇනබෙත්, ග්‍රෝවර් සහ මම බ්‍රියර්ස්ගේ අත්වලින් අල්ලාගෙන, එයාව අවන්හල පැත්තට ඇදගෙන යද්දි ටයිසන් පොල්ල ඉදිරියට දිගු කරගෙන ගර්ජනා කරමින් කැම්පීට පහර දෙන්න දිවුවේ හරියට අසරු පොරයක යෙදෙන නයිට්වරයෙක් වගෙයි.

කැම්පී බ්‍රියර්ස්ට රවාගෙන සිටියත්, ටයිසන් එයාගේ පපුවට පොල්ලෙන් ඇනලා, බිත්තිය පැත්තට තල්ලු කරලා එයාගේ අවධානය ගත්තා. යටිගිරියෙන් කෑගසමින් කඩුවෙන් පහර දුන් එයා පොල්ල පෙති ගැසුවා. එයා වටේටම වැගිරුණු විස සිමෙන්ති පොළොව මත සිරිසිරි හඬින් කර වුණා.

කැම්පීගේ කොණ්ඩයේ සහ දෙපා වටා සිටි සර්පයින් දිව දිගු කරමින් සෑම අතකටම වේගයෙන් පනිද්දි ටයිසන් ආපස්සට පැන්නා. කැම්පීගේ ඉණ වටා වූ අද්භූත මුහුණු අතරින් පිට පැන්න සිංහ මුහුණක් ගර්ජනා කළා.

අපි හිර මැදිරි දිහාවට දුවද්දි මට අන්තිමට දකින්න ලැබුණේ ටයිසන් ජංගම වෙළඳ කුටියක් ඔසවා කැම්පීට දමා ගසනවායි. අයිස් ක්‍රීම් සහ විස හතර අතට විසිරෙද්දි කැම්පීගේ කොණ්ඩයේ සිටි චූටි සර්පයින්ව පලතුරු කෑලිවලින් පුල්ලි වැටුණා. අපි ආපසු හිර මැදිරි අංගනය තුළට දිවුවා.

"මට ඒක කරන්න බැහැ," බ්‍රියර්ස් හති දැමුවා.

"ඔයාට උදවු කරන්න ටයිසන්, එයාගේ ජීවිතේ අනතුරේ දැම්මා!" මම එයාට කෑගැසුවා. "ඔයාට ඒක කරන්නම වෙනවා."

අපි හිර මැදිරි පේළියේ දොරටුවට ළඟා වෙද්දි මට කේන්තියෙන් පිරුණු ගර්ජනාවක් ඇසුණා. ආපසු හැරී බැලූ මට දකින්න ලැබුණේ උපරිම වේගයෙන් අපි දිහාවට දුවගෙන එන ටයිසන්වයි. කැම්පී එයාව එළවාගෙන ආවා. එයාව අයිස් ක්‍රීම් සහ ටී-ෂර්ට්වලින් වැහිලා. එයාගේ ඉණේ සිටි වලහෙක් දත් ඇද වුණ ප්ලාස්ටික් අල්කාට්‍රාස් අව් කණ්ණාඩියක් දමාගෙන සිටියා.



"ඉක්මනට!" ඇනබෙත් කිවුවේ හරියට ඒක මට අමුතුවෙන් කියන්න ඕනෑ වගෙයි.

අන්තිමේ දි අපි ඇතුළට ආව හිර මැදිරිය හොයාගන්න හැකි වුණත් එහි පිටුපස බිත්තිය මුළුමනින්ම සුමටව තිබුණා - ගල් කුට්ටියක හෝ වෙන කිසිම දෙයක ලකුණක්වත් නැහැ.

"සලකුණ හොයන්න!" ඇනබෙත් කිවුවා.

"අන්න!" ග්‍රෝවර් චූටි සිරුමක් අල්ලද්දි ඒක ග්‍රීක Δ ලකුණකට හැරුණා. ඩෙඩලස්ගේ සලකුණ නිල් පාටින් දිලිසී, ගල් බිත්තිය හඬ නගමින් ඇරුණා.

හරිම හෙමින්. ටයිසන් හිර මැදිරි පේළිය හරහා දිව එමින් සිටියා, එයාට පිටුපසින් කැම්පී වග විභාගයක් නැතිව කඩුව වනමින්, හිර මැදිරි දොරවල් සහ ගල් බිත්ති පෙති ගසමින් ආවා.

මම බ්‍රියර්ස්වත්, ඊට පස්සේ ඇනබෙත්ව සහ ග්‍රෝවර්වත් වංගගිරිය ඇතුළට තල්ලු කළා.

"ඔයාට ඒක කරන්න පුළුවන්!" මම ටයිසන්ට කිවුවා. ඒත් එයාට ඒක කරන්න බැරි වෙන බව එසැණින්ම මට තේරුණා. කැම්පී වේගය වැඩි කරමින් එමින් සිටියා. එයා, එයාගේ කඩු එසෙව්වා. මට එයාව කලබල කරන්න දෙයක් ඕනෑ වුණා - මොකක් හරි ලොකු දෙයක්. මම, මගේ අත් ඔරලෝසුවට ගසද්දි ඒක සර්පිලාකාරව කැරකෙමින් ලෝකඩ පලිහක් බවට පත් වුණා. වෙන කරන්න දෙයක් නැති නිසා මම ඒක රාක්ෂයාගේ මුහුණට දමා ගැසුවා.

ඩතාස්! පලිහ එයාගේ මූණේ වැදුණා. එයින් ටයිසන්ට මාව පසුකර වංගගිරිය ඇතුළට රිංගා ගන්න තරම් වෙලාවක් ලැබුණා. මමත් ටයිසන් පසුපසින් ම ඇතුළට දිවුවා.

කැම්පී ආයෙමත් අපිට පහර දෙන්න ආවත්, ඒ වෙද්දි එයා පරක්කු වැඩියි. ගල් දොර වැසී ගොස්, එහි මායාවෙන් මුද්‍රා තැබුණා. කැම්පී කෝපාවිෂ්ට වී ගල් දොරට තඩිබාද්දි මුළු උමඟම සෙලවෙනවා මට දැනුණා. ඒ කොහොම වුණත් අපි එයත් එක්ක සෙල්ලම් 'ටොක්, ටොක්, ටොක් - කවුදැයි ආවේ? - රාක්ෂයෙක් ' සෙල්ලම කරන්න නැවතුණේ නැහැ. අපි අන්ධකාරය තුළට දුවන්න ගත්තා. ඒ අතරේම පළවෙනි වතාවට (සහ අන්තිම වතාවට) ආපසු වංගගිරිය ඇතුළට යන්න ලැබීම ගැන මම සතුටු වුණා.

08

# අපි ජේත්තුකාර යකෙකුගේ ගොවිපොළට ගොඩ වැදුණා

අන්තිමේ දී අපි නතර වුණේ දිය ඇලි පිරුණු කාමරයකයි. අති විශාල ආවාටයක් වූ ඒ කාමරයේ පොළොව, ලිස්සනසුලු ගල් අඩිපාරකින් වට වී තිබුණා. අපි වටා බිත්ති හතරෙන් ම යෝධ පයිප්පවලින් වතුර කඩා හැලුණා. ඒ වතුර ආවාටය තුළට වැගිරුණා. විදුලි පන්දමක් දල්වා බැලුවත් මට එහි පතුලක් දකගන්න ලැබුනේ නැහැ.

බ්‍රයර්ස් බිත්තියකට හේත්තු වී වාඩි වුණා. අත් දුසිමකට විතර වතුර ගත් එයා මුහුණ සෝදාගත්තා. "මේ වළ කෙලින් ම යන්නේ ටාටරස්වලට," එයා කෙඳිරුවා. "මට තියෙන්නෙ මේකට පැනලා, ඔයාලට තවත් කරදර කරන එක නතර කරන්න."

"එහෙම කතා කරන්නෙපා," ඇනබෙත් එයාට කිවුවා. "ඔයාට අපිත් එක්ක කඳවුරට එන්න පුළුවන්. අපිට යුද්ධෙට ලෑස්ති වෙන්න උදවු කරන්න පුළුවන්. ටයිටන්ලා එක්ක යුද්ධ කරන විදිහ ගැන වෙන කාටත් වඩා හොඳට ඔයා දන්නවා නේ."

"මගේ ළඟ දෙන්න කිසිම දෙයක් නැහැ," බ්‍රයර්ස් කිවුවා. "මම හැම දෙයක් ම නැති කරගත්තා."

"ඔයාගේ සහෝදරයෝ කොහෙද?" ටයිසන් ඇහුවා. "ඒ දෙන්නා නම් කඳු තරම් උස ඇති! ඔයාව එයාලා ළඟට එක්ක යන්න අපිට පුළුවන්."



බ්‍රයර්ස්ගේ මුහුණ තිබුණාටත් වඩා දුක්බර එකකට හැරුණාඃ ඒ එයාගේ සෝකබරිත මූණ වෙන්න ඇති. "එයාලා දැන් නැහැ. එයාලා නැති වුණා."

දිය ඇලි ගිගුරුම් හඬ නැගුවා. ආවාටය දිහාවට ඇස් හරවා ගත් ටයිසන් තදින් ඇහි පිය ගසමින් කඳුළු මැඩගත්තා.

"එයාලා 'නැති වුණා' කියලා ඔයා අදහස් කරේ මොකක්ද?" මම ඇහුවා. "මම හිතන් හිටියේ දෙවිවරු වගේම රාක්ෂයෝත් අමරණියයි කියලා."

"පර්සි," ග්‍රෝවර් දුබල හඬින් කතා කළා, "අමරණියත්වයට පවා සීමාවක් තියෙනවා. සමහර වෙලාවට... සමහර වෙලාවට රාක්ෂයින්ව අමතක වෙලා ගියා ම එයාලට සදාකාලිකව ඉන්න තියෙන කැමැත්ත නැති වෙලා යනවා."

ග්‍රෝවර්ගේ මූණ දිහා බලාගෙන මම පුදුමයෙන් කල්පනා කළේ එයා පෑන් ගැන හිතනවා ඇති ද කියලයි. වතාවක් මෙඩූසා කියූ දෙයක් මට මතක් වුණාඃ එයාගේ සහෝදරියෝ, ගොර්ගොන්ලා දෙන්නා නැති වුණාට පස්සේ එයා තනි වුණා කියලා මෙඩූසා කිවුවා. ඊට පස්සේ ගිය අවුරුද්දේ ඇපලෝ, පුරාණ දෙවි හෙලියෝස් නැති වීමෙන් පස්සෙ හිරු දෙවියන්ගේ රාජකාරිත් එයාට පැවරුණා කියලා කිවුවා. මීට කලින් මම ඒ ගැන වැඩිය හිතලා තිබුනෙ නැහැ, ඒත් දැන්, බ්‍රයර්ස් දිහා බලාගෙන ඉන්නකොට, මට තේරුම් ගියේ ඒ තරම් වයසට ගිහින් - අවුරුදු දහස් ගාණක් වයසට ගිහින් - මුළුමනින්ම තනි වෙන්න සිදුවීම කොයි තරම් දරුණු ඇති ද කියලයි.

"මම යන්න ඕනෑ," බ්‍රයර්ස් කිවුවා.

"ක්‍රෝනොස්ගේ හමුදාව කඳවුර ආක්‍රමණය කරයි," ටයිසන් කිවුවා. "අපිට උදවු ඕනෑ."

බ්‍රයර්ස්ගේ ඔළුව පහතට එල්ලා වැටුණා. "මට බැහැ, සයික්ලොප්ස්."

"ඔයා ශක්තිමත් කෙනෙක් නේ."

"දැන් එහෙම නැහැ." බ්‍රයර්ස් නැගිට්ටා.

"හේයි," එයාගේ අතක් ඩැහැගත් මම වතුරේ සෝෂාවෙන් අපේ හඬ යටපත් වෙන තැනකට එයාව ඇදගෙන ගියා. "බ්‍රයර්ස්, අපිට ඔයාව ඕනෑ. ඔයාට තවම තේරුනේ නැද්ද, ටයිසන් ඔයාව කොච්චර

විශ්වාස කරනව ද කියලා. එයා ඔයා වෙනුවෙන් එයාගේ ජීවිතේ පවා අවදානමේ දැම්මා."

මම එයාට හැමදෙයක් ම කිවුවා - ලූක්ගේ ආක්‍රමණ සැලසුම, කඳවුරේ ඇති වංගගිරි දොරටුව, ඩෙඩලස්ගේ වැඩපොළ, ක්‍රෝනොස්ගේ රන් මිනී පෙට්ටිය - මේ හැම දෙයක්ම.

ඒත් බ්‍රයර්ස් නිකං ම ඔළුව හොල්ලුවා විතරයි. "මට බැහැ, දේවියෝ. මේ තරගේ දිනන්න මට ඇඟිලි තුවක්කුවක් නැහැ." එයාගේ කතාව ඔප්පු කරන්න වගේ එයා ඇඟිලි තුවක්කු සියයක් හැදුවා.

"සමහරවිට රාක්ෂයන්ව නැතිවෙලා යන්නේ ඒ නින්දා වෙන්නැති." මම කිවුවා. "සමහරවිට ඒ මිනිස්සුන්ගේ විශ්වාසය නැති වෙන නිසා නෙවෙයි, ඔයාලා තමන් ගැනම තියෙන විශ්වාසය අත් අරින නිසා වෙන්නැති."

එයා තනි දුඹුරු ඇස්වලින් මගේ දිහා බලා සිටියා. එයාගේ මුහුණ වෙනස් වී මතු වූ හැඟීම මම හඳුනා ගත්තා - ලැජ්ජාව. ඊට පස්සේ ආපසු හැරුණු එයා කොරිඩෝව පහළට ගාටමින් ගොස් හෙවණැලි අතරේ නොපෙනී ගියා.

ටයිසන් ඉකි ගසමින් අඬන්න ගත්තා.

"ඒකට කමක් නෑ." ග්‍රෝවර් පැකිළෙන අතින් එයාගේ උරහිසට තට්ටු කළා. ඒක කරන්න එයාට හිතේ තිබුණු මුළු ධෛර්යයම ඕනෑ වෙන්න ඇති.

ටයිසන් කිවුනුමක් ඇරියා. "කමක් නැත්තෙ නෑ, එළු කොල්ලෝ. එයා තමයි මගේ වීරයා වෙලා හිටියේ."

මට එයාගේ හිත හදන්න ඕනෑ වුණත් මොනවා කියන්න ද මට තේරුනේ නැහැ.

අන්තිමේ දි නැගී සිටි ඇනබෙත්, එයාගේ ගමන් මල්ල කරේ එල්ලා ගත්තා. "කට්ටියම එන්න යමු. මේ වළ දකිද්දි මගේ බඩ දනවා. අපි අද රෑට කඳවුරු බඳින්න මීට වඩා හොඳ තැනක් හොයාගමු."

***

ලොකු කිරි ගරුඬ කුට්ටිවලින් සෑදූ කොරිඩෝවක අපි නතර වුණා. දෙපස බිත්තිවල සවි කර තිබුණු ලෝකඩ පන්දම් රඳවන සමග එතැන පෙනුණේ ග්‍රීක සොහොන් ගෙයක කොටසක් වගෙයි. ඒක



වංගගිරියේ පරණම කොටසක් වෙන්න ඕනෑ. ඒක හොඳ සලකුණක් කියලා ඇනබෙත් තීරණය කළා.

"අපි ඩෙඩලස්ගේ වැඩපොළට කිට්ටු ඇති," එයා කිවුවා. "හැමෝම ටිකක් විවේක ගන්න. උදේට අපි ආපහු යන්න පටන් ගමු."

"උදේ වුණා කියලා අපි කොහොමද දැනගන්නේ?" ග්‍රෝවර් ඇසුවා.

"පාඩුවේ නිදාගන්නකෝ." එයා තදින් කිවුවා.

ග්‍රෝවර්ට ඒක දෙසැරයක් කියන්න උවමනා වුනේ නැහැ. ගමන් මල්ලෙන් පිදුරු කැටියක් පිටතට ගත් එයා එයින් ටිකක් කාලා, ඉතුරු ටිකෙන් කොට්ටයක් හදාගත්තා. වැඩි වෙලාවක් යන්න කලින් ම එයා ගොරවන සද්දෙ ඇහුණා. ටයිසනුත් නින්දට වැටෙන්න වැඩි වෙලාවක් ගත්තෙ නැහැ. එයා ටික වෙලාවක් යන තුරු මෙවලම් මල්ලේ තිබුණු ලෝහ කෑලි ටිකක් එකලස් කරමින් සිටියා, ඒත් එයා හැදුවේ මොකක් වුණත්, ඒ ගැන සතුටු වුණ බවක් පෙනුනේ නැහැ. එයා ඒක ආපසු කෑලි ගලවන්න ගත්තා.

"මම පලිහ නැති කරගත්තට මට දුකයි," මම එයාට කිවුවා. "ඒක හරිගස්සන්න ඔයා ගොඩාක් මහන්සි වුණා."

ටයිසන් ඔළුව ඔසවා බැලුවා. එයාගේ ඇහැ අඬලම රතු වෙලා. "දුක් වෙන්නෙපා, අයියා. ඔයා මාව බේරගත්තා නේ. බ්‍රයර්ස් මට උදවු කරා නම් ඔයාට එහෙම කරන්න වෙන්නෑ."

"එයා හිටියේ බය වෙලා නේ," මම කිවුවා. "ඒක ඇරිලා යයි කියලා මට විශ්වාසයි."

"එයා ශක්තිමත් නැහැ," ටයිසන් කිවුවා. "එයා දැන් වැඩකට ඇති කෙනෙක් නෙවෙයි."

බර සුසුමක් හෙළූ එයා ඇහැ පියාගත්තා. තවමත් එකලස් නොකළ ලෝහ කෑලි එයාගේ අතෙන් වැටෙද්දි ටයිසන් ගොරවන්න පටන් ගත්තා.

මමත් නින්දට වැටෙන්න උත්සහ කළත් නින්ද මගේ අහලකටවත් ආවේ නැහැ. විස බේරෙන කඩු අතින් ගත් සද්දන්ත මකර ගෑනියෙක් අපිව මරන්න පැන්නුව බව මතක් වෙද්දි නිදාගන්න හිත දුන්නෙ නැහැ. මගේ නිදන මල්ල අහුලා ගත් මම ඇනබෙත් වාඩි වී මුර කරමින් සිටි තැනට ඒක ඇදගෙන ගියා.

Scanned with CamScanner

මම එයා ළඟින් වාඩිවුණා.

"ඔයා නිදාගන්න ඕනෑ," එයා කිවුවා.

"නින්ද යන්නෑ. ඔයා හොඳින් ද?"

"ආයෙත් අහලා. ගවේෂණයක් මෙහෙයවන පළවෙනි දවස. මරේ මරු."

"අපි එහෙට යනවා," මම කිවුවා. "අපි ලූක්ට කලින් වැඩපොළ හොයාගන්නවා."

එයා මූණට වැටුණු කෙස් රොදක් ඉවත් කළා. එයාගේ නිකටේ තුණු පැල්ලමක් ගෑවී තිබුණා. එයා පුංචි කාලේ තාලියා සහ ලූක් එක්ක රට වටේ ඉබාගාතේ යන කාලෙත් මේ වගේ ඉන්න ඇති කියලා මට හිතුණා. වතාවක් ඇනබෙත් එයාලව නපුරු සයික්ලොප්ස්ලාගේ බංගලාවකින් බේරගෙන තිබුණේ අවුරුදු හතක් තරම් පොඩි වයසකදියි. එයා බය වෙලා ඉන්නවා වගේ පෙනෙන වෙලාවට පවා, හරියට දන් වගේ. එයාගේ හිතේ ලොකු ධෛර්යයක් තියෙන බව මම දැන සිටියා.

"මේ ගවේෂණේ තර්කානුකූල එකක් වුණා නම් කොච්චර හොඳ ද," එයා මැසිවිලි නැගුවා. "මං කියන්නේ, අපි ඔහේ යනවා, ඒ වුණාට අපි කොහෙන් නවතියි ද කියලා කිසිම අදහසක් නෑ. අපි නිව්යෝක්වල ඉඳලා දවසක ගමනකින් කැලිෆෝනියාවට ආවේ කොහොමද?"

"වංගගිරිය ඇතුලේ දුර පරතරය සාමාන්‍ය ලෝකෙට වඩා වෙනස් නේ."

"මං දන්නවා, මං දන්නවා. ඒක නිකං..." එයා දෙගිඩියාවෙන් මගේ දිහා බැලුවා. "පර්සි, මම සැලසුම් හද හදා, පොත් කියව කියවා කරලා තියෙන්නේ මාවම රවට්ට ගන්න එක. අපි කොහෙ යනව ද කියලා මට මෙලෝ අදහසක් නැහැ."

"ඔයා ඒක හොඳට කරනවා. ඇරත්, අපි කරන්නෙ මොනවද කියලා අපි කවදාවත් දැනගෙන ඉඳලා නැහැ. ඒත් ඒක හැම වෙලාවෙම හරි යනවා. මතක ද සර්සිගෙ දූපතේ දි?"

එයා මහ හඬින් නහයෙන් පිම්බා. "ඔයා හුරතල් රට හාවෙක් වුණා."



"එතකොට ජල උයනෙ දි, ඔයා අර බෝට්ටුවෙන් අපිව විසි වෙන්න සලස්සපු නැති?"

"මම අපිව විසි වෙන්න සැලැස්සුවා? ඒක තනිකරම ඔයාගෙ වැරැද්දෙන් වුණේ!"

"ජේනවා නේ? හැමදේම හරියයි."

එයා හිනා වෙනවා දකින්න ලැබීමත් සතුටක් වුණත්, ඒ හිනාව ඇසිල්ලකින් මැකී ගියා.

"පර්සි, වංගගිරිය හරහා යන ක්‍රමේ ඔයා දන්නවා කියලා හේරා අදහස් කළේ මොකක්ද?"

"මං දන්නෙ නැහැ," මම පිළිගත්තා. "ඇත්තමයි."

"දැනගෙන හිටියා නම් ඔයා මට කියනවා ද?"

"අනිවා. සමහරවිට..."

"සමහරවිට මොකක්ද?"

"සමහරවිට ඔයා මට අනාවැකියේ අන්තිම පේළිය කිවුවොත්, ඒක උදවුවක් වෙයි."

ඇනබෙත් වෙවුලුවා. "මෙතැන බැහැ. මේ කළුවරේ බැහැ."

"ජානුස් කිවුව තෝරාගැනීම මොකක්ද? හේරා කිවුවෙ-"

"ඔක නවත්තන්න." ඇනබෙත් මගේ ඇඟට කඩා පැන්නා. ඊට පස්සෙ එයා සැලෙන හුස්මක් ගත්තා. "මට සමා වෙන්න, පර්සි. මං ඉන්නෙ ආතතියෙන්. ඒත් මට ඕනෑ නැහැ... මට ඒ ගැන හිතලා බලන්න වෙනවා."

වංගගිරිය තුළින් නැගෙන අමුතු කිරිකිරි හඬවල්, ගෙරවුම් හඬවල් සහ උමං මාරු වෙමින්, වර්ධනය වෙමින් පැතිරෙද්දි ගල් එකිනෙක ඇතිල්ලෙන දෝංකාර හඬවලට කන් දෙමින් අපි නිහඬව වාඩි වී සිටියා. එහි වූ අඳුර නිකෝ ඩි ආන්ජෙලෝ ගැන මට දකින්න ලැබුණු දර්ශන ගැන හිතන්න සැලැස්වූවා, ඒ වෙලාවේ හදිසියේ ම මට යමක් තේරුම් ගියා.

"නිකෝ මේ පහළ කොතැන හරි ඉන්නවා," මම කිවුවා. "එයා එහෙම තමයි එයා කඳවුරෙන් අතුරුදහන් වෙලා තියෙන්නෙ. එයා වංගගිරිය හොයාගෙන. ඊට පස්සෙ එයා මීටත් වඩා ගැඹුරට යන

පාරක් හොයාගෙන - පාතාල ලෝකෙට. ඒත් දැන් එයා ආපහු වංගගිරිය ඇතුළට ඇවිත් ඉන්නේ. එයා මගේ පස්සෙන් එනවා."

ඇනබෙත් සැහෙන වෙලාවක් ගත වෙන තුරු නිහඬව සිටියා. "පර්සි. ඔයාට වැරදිලා නම් මම කැමතියි. ඒත් බැරි වෙලාවත් ඔයා හරි නම්.." ගලින් සැදුණු බිත්තිය මත මලානික කවයක් ඇති කරමින් තිබුණු විදුලි පන්දම් එළිය දිහා එයා බලා සිටියා. එයා, එයාගේ අනාවැකිය ගැන හිතනවා කියලා මට නිකමට වගේ හිතුණා. එයා මේ තරම් විඩාපත් වෙලා ඉන්නවා මම කවදාවත් දැකලා තිබුනෙ නැහැ.

"මම පළවෙනි මුරේ කළොත් නරක ද?" මම ඇසුවා. "මොනවා හරි සිද්ධ වුණොත් මං ඔයාව ඇහැරවන්නම්."

ඒකට විරෝධය පාන්න උවමනාවෙන් වගේ ඇනබෙත් බලා සිටියා. ඒත් අන්තිමේ දි ඔළුව වැනූ එයා නිදන මල්ල උඩට ඇද වැටී, ඇස් පියාගත්තා.

***

නින්දට මගේ වාරය ආවාම, මම හීනෙන් ආපසු වයසක මනුස්සයාගේ වංගගිරි හිර කුටියට ගොස් සිටියා.

දැන් ඒක පෙනුණේ වැඩපොළක් වගෙයි. එහි මේස පුරා මිනුම් උපකරණ විසිරී තිබුණා. කෙළවරක කම්මල් ලිපක් ගිනි රතු පාටින් ඇවිලෙමින් තිබුණා. කලින් හීනයේ මට දකින්න ලැබුණු පිරිමි ළමයා මයිනහම අදිමින් සිටියා, හැබැයි දැන් එයා කලින් වතාවට වඩා උස ගිහින්. මගේ වයසම විතර ඇති. කම්මල් ලිපේ චිමිනියට සවි කර තිබුණු අමුතු පුනීලයක් වගේ උපකරණයකින් දුම සහ තාපය උරාගෙන, එය බටයක් තරහා පොළොවේ තිබුණු ලෝකඩ පියනකින් ආවරණය කළ ලොකු හිලක් අසලින් ම පොළොව තුළට යොමු කර තිබුණා.

එය දවල් වරුවක්. කුටියට ඉහළින් අහස නිල් පාටින් තිබුණත්, වංගගිරියේ බිත්තිවලින් වැඩපොළ මත දිගු සෙවණැලි ඇති කළා. දිගු කාලයක් තිස්සේ උමං තුළ සිටි නිසා ම, වංගගිරියේ කොටසක් අහසට විවෘතව තිබීම අරුමයක් වගෙයි මට පෙනුණේ. කොහොම වුණත් එයින් වංගගිරිය වඩාත් කුරිරු තැනක් වගේ පෙනුණා.

වයසක මනුස්සයාට තිබුණේ ලෙඩ පාටක්. එයා කේඩෑරි වී සිටියා. එයාගේ දෑත් වැඩ කිරීම නිසා හම ගිහින්, රතු වී තිබුණා. සුදු කොණ්ඩයෙන් එයාගේ ඇස් වැහිලා. එයාගේ කබාය ලිහිස්සි



තෙල්වලින් පැල්ලම් වැටිලා. එයා මේසය වෙත නැමී, යම් විදිහක දිගු ලෝහ පැච්-වර්ක් එකක වැඩ කරමින් සිටියා - ඒක හරියට ලෝහ දම්වැල් එකට පුරුද්දා සැදූ යකඩ සන්නාහයක් වගෙයි. සියුමැලි ලෝකඩ කැරැල්ලක් අතට ගත් එයා ඒක තැනකට සවි කළා.

"ඉවරයි," එයා නිවේදනය කළා. "වැඩේ සම්පූර්ණයි."

එයා, එයාගේ නිර්මාණය අතට ගත්තා. ඒක කොයි තරම් ලස්සන ද කියනවා නම්, මගේ හදවත පිටට පැන්නා - ඒක ලෝකඩ පිහාටු දහස් ගාණක් එකිනෙකට පුරුද්දා නිර්මාණය කළ පියාපතක්. ඒ වගේ කුට්ටම් දෙකක් තිබුණා. එකක් තවමත් මේසය මත අතුරා තිබුණා. ඩේඩලස් රාමුව දිග අරිද්දි, පියාපත් අඩි විස්සක් පළලට විහිදුණා.

ඒකෙන් කවදාවත් පියාඹන්න බැහැ කියලා මගේ හිතේ පැත්තක් කියන්න ගත්තා. ඒක බර වැඩියි. ඒ වගේම ඒක පොළොවෙන් ඉහළට නංවන්න කිසිම ක්‍රමයකුත් නැහැ. ඒ වුණත් එහි ශිල්පීය දක්ෂතාවය නම් පුදුමාකාර වුණා. ලෝහ පිහාටුවලට හිරු එළිය වැදී රත් පැහැයේ ප්‍රභේද තිහකින් විතර දිලිසුණා.

පිරිමි ළමයා මයිනහම අත හැර ඒක බලන්න දුවගෙන ආවා. කුණු, දහඩියෙන් නැවී සිටි බව පසෙක දමා එයා දත් නියෙව්වා. "තාත්තේ, ඔයා නම් ගොඩාක් බුද්ධිමත් කෙනෙක්!"

වයසක මනුස්සයා හිනාවුණා. "මං නොදන්න දෙයක් කියන්න, ඉකරස්. දැන් ඉක්මන් කරන්න. මේවා අමුණන්න අඩු තරමේ පැයක්වත් යයි. එන්න."

"ඔයා මුලින්ම," ඉකරස් කිවුවා.

එයට වයසක මනුස්සයා විරෝධය පෑවත් ඉකරස් බල කරා. "ඔයානේ ඒවා හැදුවේ, තාත්තේ. ඒවා මුලින්ම පළඳින ගෞරවයත් ඔයාට ලැබෙන්න ඕනෑ."

පිරිමි ළමයා, එයාගෙ තාත්තාගේ පපුවට කඳු නගින්නන්ගේ ගියරයක් වගේ උරහිස්වල සිට ඉණ දක්වා පටි දිවෙන ලෙදර් මෙවලමක් ඇඳුවා. ඊට පස්සෙ එයා යෝධ ගම් විදින තුවක්කුවක් වගේ පෙනුම ඇති ලෝහ බඳුනක් උදවු කර ගනිමින් පියාපත් සවි කරන්න පටන් ගත්තා.

"මේ ඉටි මිශ්‍රණය පැය කීපයක් යනකල් අල්ලලා තියෙයි," පුතා වැඩ කරද්දි ඩෙඩලස් සැකයෙන් වගේ කිව්වා. "ඒත් ඊට කලින් අපි ඒක සන වෙන්න අරින්න ඕනෑ. ඒ වගේම අපි ගොඩක් උඩිනුත්, ගොඩක් පහළිනුත් නොයන්න වගබලා ගන්න ඕනෑ. මුහුදෙන් ඉටි මුද්‍රා පෙඟෙන්න පුළුවන්-"

"ඒ වගේම අව්වට ඒවා බුරුල් වෙන්න පුළුවන්," පිරිමි ළමයා සම්පූර්ණ කළා. "ඔව්, තාත්තේ. අපි මේ ගැන මිලියන වතාවක් විතර කතා වෙලා තියෙනවා!"

"පරිස්සම් වැඩි වුණා කියලා නරකක් වෙන්නෙ නැතේ."

"ඔයාගේ නිර්මාණ මම සම්පූර්ණයෙන් ම විශ්වාස කරනවා, තාත්තේ! ඔයා තරම් දක්ෂ වෙන කවුරුවත් නැහැ."

වයසක මනුස්සයාගේ ඇස් දිලිසුණා. එයා මේ ලෝකෙ වෙන කිසිම දේකට වඩා තමන්ගේ පුතාට ආදරේ කරන බව පැහැදිලිවම පෙනුණා. "දැන් මම ඔයාගේ තටු අමුණන්නම්, මගේ ඒවා හයිවෙන්න ඉඩ දෙන්නත් එපැයි. එන්න!"

ඒක සිදු වුණේ ගොඩක් හෙමිනුයි. පටි අමුණද්දි වයසක මනුස්සයාගේ අත් වෙවුලුවා. පියාපත්වල මුද්‍රා තබද්දි ඒවා නියමිත තැන්වල රඳවාගන්න එයාට ගොඩක් අමාරු වුණා. එයා වැඩ කරන්න උත්සහ කරද්දි එයාගෙම පියාපත්වල බරට එයාව නැමෙනවා වගෙයි පෙනුණේ.

"සුනංගු වෙනවා වැඩියි," වයසක මනුස්සයා කෙඳිරුවා. "මම සුනංගු වෙනවා වැඩියි."

"වෙලාව අරන් කරන්න, තාත්තේ," පිරිමි ළමයා කිව්වා. "මුරකාරයෝ දැන්ම එන්නෙ-"

**බෝං!**

වැඩපොළේ දොර සැලුණා. ඩෙඩලස් ඒවා ඇතුළු පැත්තෙන් අගුළු දමා හරස් කර තිබුණත් ඒවා සරණේරුවලින් සෙලවුණා.

"ඉක්මනට!" ඉකරස් කිව්වා.

**බෝං! බෝං!**

කිසියම් බරැති දෙයක් දොරේ තදින් වදිමින් තිබුණා. දොර පොලු රැඳී තිබුණා වුණත් වම් දොර පළුවේ පැල්මක් ඇති වුණා.



ඩෙඩලස් පිස්සුවෙන් වගේ වැඩ කළා. උණු ඉටි බිංදුවක් පිරිමි ළමයාගේ උරහිස මතට වැටුණා. එයාගේ මූණ වේදනාවෙන් ඇකිළුණත් එයා කිසිම හඬක් පිට කළේ නැහැ. එයාගේ වම් පියාපත පටිවලට මුද්‍රා තබා අවසන් වුණා ම, ඩෙඩලස් දකුණු පියාපත අමුණන්න පටන් ගත්තා.

"අපිට තව වෙලාව ඕනෑ වෙනවා!" ඩෙඩලස් මිමිණුවා. "තවම වේලාසන වැඩියි! ඉටි මුද්‍රා වේලෙන්න තව වෙලාව ඕනෑ."

"ඒකට කමක් නැති වෙයි," එයාගේ තාත්තා දකුණු පියාපතේ වැඩ අවසන් කරද්දි ඉකරස් කිව්වා. "මට උදවු කරන්න මේ වළ-"

*කරාස්!* දොර පතුරු ගැලවී, ප්‍රාකාර බිඳින ලෝකඩ ජම්බාරයක හිස සිදුර තුළින් මතු වුණා. පොරෝවලින් කපොල්ල ලොකු කර, ආයුධ සන්නද්ධ මුර භටයෝ දෙන්නෙක් කාමරයට ඇතුළු වුණා. එයාලට පිටුපසින් රන් ඔටුන්නක් දමාගත්, හෙලි තුඩක් වගේ රැවුල ඇති රජා ඇතුළට ආවා.

"හොඳයි, හොඳයි," කෲර හිනාවක් පාමින් රජා කිව්වා. "බැරක් යන්ඩ හදනවා වගේ?"

ඩෙඩලස් සහ එයාගේ පුතා ගල් ගැසුණා, එයාලට පිටුපසින් ලෝකඩ පියාපත් යාන්තමින් බැබළුණා.

"අපි මෙහෙන් යනවා, මයිනස්," වයසක මනුස්සයා කිව්වා.

මයිනස් රජු කෙකර ගෑවා. "මම ඔහෙගේ බලාපොරොත්තු සුන්නදූලි කරලා දාන්න කලින්, ඔහේ මේ පුංචි උපාය කොච්චර දුරට අරන් යයි ද කියලා බලාගන්නයි මට ඕනෑ වුණේ. ඇත්තටම මම පුදුම වුණා කියලා කියන්න ම ඕනෑ."

රජා එයාලගේ පියාපත් අගය කළා. "උඹලා නිකං යකඩ කුකුළෝ වගේ," එයා තීරණය කළා. "බාගදා, අපි උඹලගේ තටු උගුල්ලලා සුප් එකක් හැදුවොත් හොඳයි."

මුරකාරයෝ මෝඩයින් වගේ හිනාවුණා.

"යකඩ කුකුළෝ," එකෙක් නැවත කිව්වා. "සුප්."

"කට වහගන්නවා," රජා කිව්වා. ඊට පස්සෙ එයා ආපසු ඩෙඩලස් වෙත හැරුණා. "උඹ මගේ දුවට පැනලා යන්ඩ ඉඩ දුන්නා, නාකි මිනිහෝ. උඹ මගේ බිරිඳව පිස්සු වැට්ටෙව්වා. උඹ මගේ

රාක්ෂයාව මරලා. මාව මධ්‍යධරණියේ කවටයා කළා. උඹට කවදාවත් මගෙන් පැනලා යන්ඩ ලැබෙන්නෑ!"

ඉටි තුවක්කුව ඩැහැගත් ඉකරස් එයින් රජාට විදිද්දි, රජා පුදුමයෙන් ආපස්සට ගියා. මුරකාරයෝ ඉස්සරහට දුවගෙන ආවා. ඒත් එයාලටත් උණු ඉටිවලින් මූණ හෝදගන්න ලැබුණා.

"වා දොරා!" ඉකරස් එයාගේ තාත්තට මොර දුන්නා.

"උන්ව අල්ලපියව්!" මයිනස් රජු වියරුවෙන් හඬගෑවා.

වයසක මනුස්සයා සහ එයාගේ පුතා එක්ව පොළොවේ වූ විවරයේ පියන අමාරුවෙන් ඇරියා. ඒත් එක්කම උණුසුම් වායු ධාරාවක් පොළොවෙන් ඉහළට විදුණා.

ඇස් අදහාගන්න බැරුව රජා බලා සිටිද්දි, ලෝකඩ පියාපත් පැලඳ සිටි නිමැවුම්කරුවා සහ එයාගේ පුතාව උඩු-දහරාව විසින් ගුවනට ඇගෙන ගියා.

"උන්ට විදපියව්!" රජා මොර ගැසුවත් එයාගේ මුරකරුවෝ දුනු රැගෙනවිත් තිබුනේ නැහැ. කර කියාගන්න දෙයක් නැතිව එක් මුරකාරයෙක්, එයාගේ කඩුවෙන් දමා ගැසුවා. ඒත් ඒ වෙද්දි ඩෙඩලස් සහ ඉකරස් එය නොවදින දුරකට ගිහින් ඉවරයි. වංගගිරියට සහ රජුගේ මාලිගාවට ඉහළින් පියාසර කළ එයාලා ඉන්පසුව නෝසස් නගරය හරහා වේගයෙන් ඉහළ නැග, ක්‍රීට්වල ගල් කුළු පිරි වෙරළ පසු කළා.

ඉකරස් මහ හඬින් හිනාවුණා. "නිදහස්, තාත්තේ! ඔයා ඒක කළා."

පියාපත් සම්පූර්ණ පළලට විහිදවූ පිරිමි ළමයා සුළඟ මතින් ඉහළ අහසට පියාසර කළා.

"ඉන්න!" ඩෙඩලස් කතා කළා. "පරිස්සමෙන්!"

ඒත් ඒ වෙද්දිත් ඉකරස් එයාලගේ වාසනාව ගැන සතුටු වෙමින් විවෘත මුහුද හරහා උතුරු දෙසට යන්න පටන්ගෙන තිබුණා. ගුවනේ ඉහළට පියාසර කරමින් පියාසරන රාජාලියන්ව බය ගැන්වූ එයා ඉන්පසුව මුහුද දෙසට වේගයෙන් පහත බැස අන්තිම තත්පරයේ නැවතත් ඉහළ නැග්ගේ පියාඹන්නම උපන් කෙනෙක් වගෙයි. එයාගේ සෙරෙප්පු මුහුදේ රළවල වැදුණා.



"ඕක නවත්තපන්!" ඩෙඩලස් කෑගැසුවා. ඒත් සුළඟ එයාගේ හඬ වෙනතකට ගෙන ගියා. ලැබුණු නිදහසෙන් එයාගේ පුතා මත්වෙලා වගෙයි පෙනුණේ.

වයසක මනුස්සයා තුනුරු ලෙස ලිස්සා යමින් එයාගේ පුතාට කිට්ටු කරන්න දඟලුවා.

ක්‍රීට්වලින් සැතපුම් ගාණක් ඈත, ගැඹුරු මුහුදට ඉහළින් යන අතරේ ආපහු හැරී බැලූ ඉකරස් එයාගේ තාත්තාගේ මුහුණේ වූ කණස්සලු සහගත පෙනුම දැක්කා.

ඉකරස් හිනාවුණා. "බය වෙන්නෙපා, තාත්තේ! ඔයා මහා දක්ෂයෙක්! මට ඔයාගේ වැඩ විශ්වාසයි-"

එයාගේ පියාපත්වලින් ගිලිහුණු පළවෙනි ලෝකඩ පිහාටුව සුළඟේ ගසාගෙන ගියා. ඊට පස්සෙ තවත් එකක්. ඉකරස් උඩු ගුවනේ අස්ථාවර ලෙස වැනුණා. හදිසියේ ම එයාගෙන් ලෝකඩ පිහාටු වැස්සක් ඇද හැලෙන්න ගත්තා. ඒවා කරකැවෙමින් එයාගෙන් ඉවතට ගියේ බියපත් කුරුලු රැනක් වගෙයි.

"ඉකරස්!" එයාගේ තාත්තා කෑගැසුවා. "හෙමින් යන්න! තටු දිග අරින්න. පුළුවන් තරම් හෙලවෙන්නැතුව ඉන්න බලන්න!"

ඒත් ඉකරස් නැවත පාලනය ලබා ගන්න උත්සහ කරමින් එයාගේ අත් ඉහළ-පහළ ගැසුවා.

මුලින්ම එයාගේ වම් පියාපත ගැලවුණා - එය පටිවලින් ඉරී ගියා.

"තාත්තේ!" ඉකරස් කෑගැසුවා. ඒත් එක්කම එයාව ඇද වැටෙන්න පටන් ගත්තා. පියාපත් ගැලවී ගියාට පස්සේ එයා සුදු කබායකින් සහ ලෙදර් මෙවලමකින් සැරසී, දෑත් දෙපසට දිගු කරගෙන ඉගිල්ලෙන්න නිෂ්ඵල වෑයමක් ගත්තා තිකං ම කොල්ලෙක් විතරක් වුණා.

පහළට ඇද වැටෙනවා වගේ දැනෙද්දි මම ගැස්සිලා ඇහැරුණා. කොරිඩෝව තවමත් කළුවර වුණා. වංගගිරියේ නොනවතින ළතෝනිය මැදින් ඩෙඩලස්, එයාගේ එකම සම්පත වූ පුතා, ඉකරස්ව අඩි තුන්සීයක් පහළ මුහුදට ඇද වැටෙද්දි ඉවසන්න බැරි වේදනාවෙන් කෑගසන හඬත් ඇහෙනවා වගෙයි මට දැනුණේ.

***

වංකගිරියට උද්‍යානයක් තිබුනේ නැහැ. ඒ වුණත් හැම දෙනාම ඇහැරිලා, ගානෝලා බාර් සහ පෙට්ටි කළ පලතුරු යුෂවලින් තියෙන උදේ ආහාරයක් ගත්තට පස්සේ අපි ආපසු ගමන පටන් ගත්තා. මම මගේ හීනය ගැන කාටවත් කියන්න ගියේ නැහැ. ඒ හීනය නිසා මම හොඳටෝම බයවෙලයි හිටියේ. ඒ වගේම අනෙක් අය ඒක දැනගන්න ඕනෑ කියලා මට හිතුනේ නැහැ.

පැරණි ගල් උමග දේවදාර බාල්ක සහ මැටි පොළොවක් ඇති රන් පතලක් වගේ එකකට මාරු වුණා. ඇනබෙත් කලබල වෙන්න පටන් ගත්තා.

"මේක වෙන්න බැහැ," එයා කිව්වා. "හරි නම් මේකත් ගල්වලින් හැදුණ එකක් වෙන්න ඕනෑ."

සිවිලිමෙන් පහළට හිරි ලඹ එල්ලෙන ගුහාවක් තුළට අපි ආවා. එය මැද මැටි පොළොව මත මිනී වළක් වගේ හතරැස් වළක් තිබුණා.

ග්‍රෝවර් වෙව්ලුවා. "මෙතැන ගඳ හරියට පාතාල ලෝකෙ වගේ."

ඒ වෙලාවේ මම වළේ කෙළවරක දිලිසෙන යමක් දැක්කා - ඇලුමිනියම් දවටනයක්. මගේ විදුලි පන්දම වළ තුළට දල්වා බැලූ මට දකින්න ලැබුණේ දුඹුරු පාට කාබොනේට් දියර ගොඩක පාවෙන බාගෙට කෑව චීස් බර්ගරයක්.

"නිකෝ," මම කිව්වා. "එයා ආයෙමත් මළවුන්ව කැඳවලා."

ටයිසන් කෙඳිරියක් පිට කළා. "මෙතැන හොල්මන් ඉඳලා. මම හොල්මන්වලට ආසා නෑ."

"අපිට එයාව හොයාගන්න වෙනවා." ඇයි කියලා නොතේරුණත්, ඒ වළ අයිනේ හිටගෙන ඉන්නකොට මට ඉක්මන් කරන්න ඕනෑකමක් දැනුණා. නිකෝ ඒ ළඟම සිටියා, මට ඒ බව දැනුණා. මළවුන් ඈර වෙන කිසිවෙක් නැතිව තනියම මේක ඇතුළේ ඉබාගාතේ යන්න එයාට ඉඩ දෙන්න මට ඕනෑ වුනේ නැහැ. මම දුවන්න පටන් ගත්තා.

"පර්සි!" ඇනබෙත් කතා කළා.

උමගක් තුළට රිංගා ගත් මට ඉදිරියෙන් එළියක් පෙනුණා. අත්තිමේට ඇනබෙත්, ටයිසන් සහ ග්‍රෝවර් මට කිට්ටු වෙද්දි, මම හිටියේ මගේ හිසට ඉහළින් ඇති පොලු කට්ටලයක් හරහා දිවා එළිය



පෙරී එන දිහා බලාගෙනයි. අපි සිටියේ ලෝහ බටවලින් සැදූ වානේ ගරාදියක් යටයි. ඒව එපිටින් මට ගස් සහ නිල් අහස පෙනුණා.

"අපි කොහෙද ඉන්නේ?" මම පුදුම වුණා.

ඒ වෙලාවේ ගරාදිය හරහා සෙවණැල්ලක් වැටුණා, එළදෙනක් මගේ දිහා බලා ඉන්නවා මට පෙනුණා. ඌ සාමාන්‍ය එළදෙනක් වගේම වුණත් ඌගේ පාට නම් හරිම අමුතුයි - ඌ තද රතු පාටයි, හරියට චෙරි ගෙඩියක් වගෙයි. ඒ පාට එළදෙන්නු ඉන්නවා කියලා මම දැනගෙන හිටියේ නැහැ.

උම්බෑ ගෑව එළදෙන ගරාදිය උඩ එක කුරයක් අස්ථිර ලෙස තබා නැවතත් ආපස්සට ගියා.

"ඒක හරක් මුර වැටක්," ග්‍රෝවර් කිව්වා.

"මොකක්?" මම ඇසුවා.

"එයාලා හරකුන්ට එළියට යන්න බැරි වෙන්න ගොවිපොළ ගේට්ටු වටේට ඒවා දානවා. හරකුන්ට ඒවා උඩින් ඇවිදින්න බැහැ."

"ඔයා කොහොමද ඒක දන්නේ?"

ග්‍රෝවර් තරහෙන් හුස්ම පිම්බා. "මාව විශ්වාස කරන්න. ඔයාටත් කුර තිබුණා නම්, ඔයත් හරක් මුර වැටවල් ගැන දැනගෙන ඉඳියි. ඒවා මහා කරදරයක්!"

මම ඇනබෙත් දිහාවට හැරුණා. "ගොවිපොළක් ගැන හේරා මොනවා හරි කිව්වා නේද? අපි මේක සෝදිසි කරලා බැලුවොත් හොඳයි. නිකෝ මෙහෙ ඉන්න පුළුවන්."

එයා පැකිළුණා. "හරි එහෙනම්. ඒත් අපි කොහොමද එළියට යන්නේ?"

ටයිසන් අත් දෙකෙන් ම හරක් මුර වැටට ගහලා ඒ ප්‍රශ්නේ විසඳලා දුන්නා. ගැලවී උඩ විසි වුණ එය ඈතට පියඹා ගියා. අපිට ක්ලෑංංගේ! හඬක් සහ බයවුණ උම්බෑ! හඬක් ඇසුණා. ටයිසන් රතු වුණා.

"සමා වෙන්න, එළදෙන!" එයා කෑගසා කිව්වා.

ඊට පස්සෙ එයා අපිව ඉහළට ඔසවා උමගෙන් පිට වෙන්න උදවු කළා.

ඇත්තටම අපි ගිහින් තිබුණේ ගොවිපොළකට තමයි. ඈතින් ඈතට ක්ෂිතිජය දක්වා ම පෙරළී ගිය කඳු වැටි ඕක් ගස්, පතොක්

Scanned with CamScanner

පඳුරු සහ ගල් ගෙඩිවලින් තිත් වැටී තිබුණා. ගේට්ටුවේ සිට දෙපසට ම කටු කම්බි වැටක් දිවුණා. චෙරි ගෙඩි පාට එළදෙන්නු තණ පඳුරු උලා කමින් නිදැල්ලේ ඇවිද්දා.

"රතු එළ හරක්," ඇනබෙත් කිවුවා. "ඉර දෙවියන්ගේ එළ හරක්."

"මොකක්?" මම ඇසුවා.

"උන්ව ඇපලෝට කැප කරලා තියෙන්නේ."

"පූජනීය හරක්?"

"අන්න හරි. ඒත් උන් මොනවද මෙහෙ කරන්නේ-"

"ඔහොම ඉන්න," ග්‍රෝවර් කිවුවා. "ඇහෙනව ද."

මුලදී හැමදෙයක්ම නිහඬව තියෙනවා වගෙයි පෙනුණේ... ඒත් ටිකකින් මට ඒක ඇහුණාඃ ඇතින් බල්ලෝ බුරන හඬක්. ඒ හඬ ටිකෙන් ටික වැඩි වුණා. ඊට පස්සේ සෙලවෙන්න ගත් පඳුරක් යටින් බල්ලෝ දෙන්නෙක් එළියට කඩා පැන්නා. හැබැයි බල්ලෝ දෙන්නෙක් කිවුවට එතැන දෙන්නෙක් හිටියෙ නැහැ. හිටියේ ඔළු දෙකක් තිබුණු එක බල්ලෙක්. දිග, සිනිඳු දුඹුරු පාට වූ ඒකා ග්‍රේ හවුන්ඩ් කෙනෙක් වගෙයි පෙනුණේ. ඒ වුණත් ඌගේ දෙබලකට බෙදුණු බෙල්ල දෙකෙළවර ඔළු දෙකක් තිබුණා. ඒ ඔළු දෙකම හපාකන්න පනිමින් ගොරවමින් තිබුණු හැටියට ඌ අපිව දැකලා සතුටු වුණ බවක් නම් කොහෙත්ම පෙනුනේ නැහැ.

"නරක ජානුස් බල්ලා!" ටයිසන් කෑගැසුවා.

"ආර්ෆ්!" ඌට කතා කළ ග්‍රෝවර් අතක් ඔසවා ආචාර කළා.

ඔළු දෙකේ බල්ලා දත් විළිස්සුවා. මං හිතන්නේ ග්‍රෝවර්ට සත්ත්ව භාෂාව කතා කරන්න පුළුවන් වුණ එක ඌගේ හිත් ගන්න නැතුව ඇති. ඒ වෙලාවේ ඌගේ ස්වාමියා ගස් අතරින් හෙමින් හෙමින් එළියට ආවා. අපිට මූණ දෙන්න වෙන ලොකුම ප්‍රශ්නේ බල්ලා නෙවෙයි කියලා ඒ වෙලාවේ මට තේරුම් ගියා.

පිදුරු කව්බෝයි තොප්පියක් හිසේ දමාගෙන සිටි සද්දන්ත කෙනෙක් වූ එයාට මුළුමනින්ම සුදු කොණ්ඩයක් සහ ගොතපු සුදු රැවුලක් තිබුණා. එයා කලිසමකින්, ටී-ෂර්ට් එකකින් සහ මස් ගොබ පිටතට පෙනෙන ලෙස අත් ඉරා දමූ ඩෙනිම් ජැකට්ටුවකින් සැරසී



සිටියා. එයාගේ දකුණු අත් ගොබය මත එකිනෙක හරස් කළ කඩු දෙකක පච්චයක් තිබුණා. එක් කෙළවරක අඟල් හයක් විතර දිග උල් සවි කළ න්‍යෂ්ටික මිසයිලයක් විතර ලොකු ලී මුගුරක් එයා අත දරාගෙන සිටියා.

"ඉඳ ගන්නවා, ඕර්තස්," එයා බල්ලට කිවුවා.

හිතේ අමාරුව ඇර ගන්න වගේ තව එක පාරක් අපිට ගෙරවූ බල්ලා, ඌගේ ස්වාමියාගේ දෙපා පිටුපසට ගියා. පිරිමියා මුගුර සූදානමෙන් තියාගෙන අපේ ඉහේ ඉඳන් දෙපතුල දක්වා බැලුවා.

"මොක්කු ද මේ?" එයා ඇසුවා. "හරක් හොරු ද?"

"නිකං සංචාරකයෝ," ඇනබෙත් කිවුවා. "අපි ගවේෂණයක යන ගමන්."

පිරිමියාගේ ඇහැක් තදින් ගැහුණා. "අර්ධ-ලෝහිතයෝ, අහ්?"

"ඔයා කොහොමද දැනගත්තේ-" මම කතා කරන්න හැදුවත් ඇනබෙත් මගේ අත උඩින් අතක් තැබුවා. "මම ඇනබෙත්, ඇතීනාගෙ දුවෙක්. මේ පර්සි, පොසෙයිඩන්ගේ පුතා. ග්‍රෝවර් සැටර් කෙනෙක්. ටයිසන්-"

"සයික්ලොප්ස් කෙනෙක්," පිරිමියා අවසන් කළා. "ඔව්, මට ඒක පේනවා." එයා මගේ දිහාවට රවා බැලුවා. "ඒ වගේම මම අර්ධ-ලෝහිතයෝ ගැන දන්නේ මමත් ඒ කෙනෙක් නිසා, පුතෝ. මම එරිතියන්, මේ ගොවිපොළේ ගොපල්ලා. ඒරිස්ගෙ පුතෙක්. ඔහේලත් ඇවිල්ලා තියෙන්නේ අනිකා වගේම වංගගිරිය හරහා, මට පේන්නෙ."

"අනිකා?" මම ඇසුවා. "ඔයා කියන්නේ නිකෝ ඩි ආන්ජෙලෝ?"

"අපිට වංගගිරියෙන් අමුත්තෝ තොග ගණන් එනවා," එරිතියන් නපුරු ලෙස කිවුවා. "උන්ගෙන් වැඩි හරියක් ආපහු යන්නෙ නෑ."

"වාව්," මම කිවුවා. "අපිව මෙහෙට ආදරෙන් සාදරෙන් පිළිගත්තා වගේ මට දැනෙනවා."

ගොපල්ලා ආපස්සට බැල්මක් හෙලුවේ හරියට කවුරු හරි එයා දිහා බලාගෙන ඉන්නවා වගෙයි. ඊට පස්සේ එයා කටහඬ පහත දැමුවා. "මම මේක කියන්නෙ එක සැරයයි, ළමයිනේ. දැන්මම ආපහු වංගගිරියට යනවල්ලා. ඒකට පරක්කු වැඩි වෙන්න කලින්."

"අපි යන්නෙ නැහැ." ඈනබෙත් බල කරමින් කිවුවා. "අපිට අනිත් උප දෙවියව පෙන්වනකල්. කරුණාකරලා."

එරිතියන් අමනාපයෙන් ගෙරෙව්වා. "එහෙනම් මට වෙන කරන්න දෙයක් නෑ. මිසී. මට ඔහේලව ලොක්කා ළඟට අරන් යන්ඩ වෙනවා."

***

අපිව ප්‍රාණ ඇපකාරයින්ට අරගෙන වගේ නම් මට දැනුනේ නැහැ. එරිතියන් මුගුර කරේ තියාගෙන අපේ පැත්තකින් ඇවිද ආවා. ඔළු දෙකේ බල්ලා ඕර්තස් සැරින් සැරේ ගොරවමින්, ග්‍රෝවර්ගේ කකුල් ඉව කර බලමින්, ඉඳහිට සත්තුන්ව පන්නගෙන පඳුරු අස්සට දුවමින් ආවා. ඒ වුණත් එරිතියන් ඌව ගාණට ආම්බාං කරගෙනයි හිටියේ.

කෙළවරක් නැහැ වගේ පෙනුණු ගුරු පාරක් දිගේ අපි ඔහේ ඇවිද ගියා. එහි උෂ්ණත්වය අංශක සියක් විතර වෙන්න ඇති. සැන් ෆ්‍රැන්සිස්කෝවලින් පස්සේ ඒ රස්නය දරා ගන්නත් බැහැ වගෙයි දැනුණේ. රස්නයට පොළොවේ නළියන මිරිඟු සැදුණා. ගස් අතරේ කුරුමිණියෝ ඇමුගුමු හඬ ගෑවා. වැඩි දුරක් යන්න කලින් ම, මම දාඩියෙන් නැවුණා. මැස්සෝ අපි වටා කැරකුණා. තැනින් තැන රතු දෙන්නු පිරුණු පට්ටි හෝ තාඳුනන සතුන් දකින්න ලැබුණා. වතාවක් අපි ඇස්බැස්ටස්වලින් වට කළ ගාලක් පසු කර ගියා. එය ඇතුළේ ගිනි පිඹින අශ්වයින් රංචුවක් සිටියා. උන්ගේ කෑම ඔරුවල දමා තිබුණු පිදුරුත් ගිනි ගනිමින් තිබුණා. උන්ගේ කකුල් වටා පොළොවෙන් දුම් දැමුවා. ඒ වුණත් ඒ අශ්වයෝ හීලෑ එවුන් වගෙයි පෙනුණේ. එක ලොකු කප්පාදු නොකළ අශ්වයෙක් මගේ දිහා බලලා හේෂාරාවය කරද්දී ඌගේ නාස් පුඩුවලින් රතු පාට ගිනි දලු කඳන් දෙකක් පිට පැන්නා. එයින් ඌගේ නාස් කපොල්ලට තුවාල වෙන්නේ නැති ද හිතලා මම පුදුම වුණා.

"එයාලව මොකටද?" මම ඇහුවා.

එරිතියන් රවා බැලුවා. "අපි සේවාදායකයෝ ගොඩක් වෙනුවෙන් සත්තු ඇති කරනවා. ඇපලෝට, ඩයමඩීස්ට, තව... තව අයට."

"කවුරු වගේ ද?"

"ප්‍රශ්න ඇහුවා ඇති."



අන්තිමේ දී අපි කැලෑවෙන් එළියට ආවා. අපිට ඉහළින් කඳු ගැටයක් උඩ ලොකු ගොපලු ගෙයක් තිබුණා - ලොකු ජනේල ඇති තනි සුදු ගල් සහ දැවවලින් හැදුව එකක්.

"ඒක ෆ්‍රෑන්ක් ලොයිඩ් රයිට්ගේ එකක් වගේ!" ඈනබෙත් කිවුවා.

මං හිතන්නෙ එයා දොඩවන්න ඇත්තේ මොකක් හරි වාස්තු විද්‍යාත්මක දෙයක් ගැන වෙන්නැති. මට නම් ඒක පෙනුණේ උප දෙවිවරු දෙතුන් දෙනෙක්ට සෑහෙන ලොකු අමාරුවක වැටෙන්න කියාපු තැනක් වගෙයි. අපි කන්ද උඩට නැග්ගා.

"මෙහෙ නීති කඩන්නෙපා," අපි ඉදිරි පඩි නැග යද්දී එරිතියන් අනතුරු ඇඟෙව්වා. "රණ්ඩු සරුවල් කරන්න බෑ. ආයුධ අදින්න බෑ. ඒ වගේම ලොක්කගෙ පෙනුම ගැන කිසිම දෙයක් කියන්න යන්නත් එපා."

"ඇයි?" මම ඇහුවා. "එයාගේ පෙනුම මොන වගේ ද?"

ඒකට එරිතියන්ට උත්තර දෙන්න ලැබෙන්න කලින්, අලුත් කටහඬක් ඇසුණා. "ට්‍රිපල් ජී ගොවිපොළට සාදරෙන් පිළිගන්නවා."

ඉදිරි දොර පඩිය අසල සිටි මනුස්සයාට සාමාන්‍ය ඔළුවක් තිබුණු එක නම් ලොකු සහනයක්. අවුරුදු ගාණක් ඉර අව්වෙන් බැට කාලම එයාගේ මුහුණ වේලිලා, දුඹුරු පාටට හැරිලා තිබුණා. එයාට සිනිඳු කළු කොණ්ඩයක් සහ පරණ චිත්‍රපටිවල ඉන්න දුෂ්ටයාට තියෙනවා වගේ පැන්සලක් තරම් හීනි කළු උඩු රැවුලක් තිබුණා. එයා අපිට හිනාවක් පෑවත් ඒ හිනාව මිත්‍රශීලී එකක් නම් නෙවෙයි; ඒක හරියට, *'බෑ, මරුනේ, වඩ දෙන්න තව එවුන් ඇවිල්ලා!'* කියනවා වගේ එකක්.

ඒ වුණාට මම ඒ ගැන වැඩිය හිතන්න ගියේ නැහැ, මොකද ඒ වෙලාවේ තමයි මට එයාගේ ඇඟ දකින්න ලැබුණේ... එහෙමත් නැත්නම් ඇඟවල්. එයාට ඒවා තුනක් තිබුණා. ජානුස්වයි බ්‍රයර්ස්වයි දැක්කට පස්සේ අරුම පුදුම ඇඟවල් තියෙන මිනිස්සුන්ට මම පුරුදු වෙලා ඇති කියලා ඔයා හිතයි. ඒත් මේ හාදයා සම්පූර්ණ මිනිස්සු තුන්දෙනෙක්. එයාගේ බෙල්ල සාමාන්‍ය විදිහටම පපුව මැදට සම්බන්ධ වෙලා තිබුණා, ඒත් ඒ පපුවට දෙපැත්තෙන්, අඟල් කීපයක පරතරයක් ඇතිව, උරහිස්වලින් සම්බන්ධ වූ අමතර පපු දෙකකුත් එයාට තිබුණා. එයාගේ වම් අත වම් පපුවෙන් වැඩී තිබුණා, දකුණු පැත්තෙත් ඒ විදිහමයි. එතකොට එයාට අත් දෙකකුත්, කිහිලි හතරකුත් තිබුණා. එයින් පහළට මේ පපු තුනම අති විශාල යටි කඳකට සවි වී තිබුණා.

Scanned with CamScanner

තිබුණේ සාමාන්‍ය. එහෙත් මස් ගොබ පිරුණු කකුල් දෙකක්. මගේ ජීවිතේට දැකපු ලොකුම ලෙවිස් සපත්තු කුට්ටම එයා පැලඳගෙන සිටියා. එයා පපු තුනට තුන් පාටක කමිස හැඳ සිටියා - කොළ, සුදු, රතු - හරියට ස්ටොප් ලයිට් එකක් වගෙයි. එයා මැද පපුවට කමිසයක් කොහොම ඇන්දා ද හිතලා මම පුදුම වුණේ ඒකට අත් නැති නිසයි.

ගොපල්ලා, එරිතියන් මට වැළමිටෙන් ඇන්නා. "මිස්ටර් ගැරියන්ට හෙලෝ කියන්ඩ."

"හායි," මම කිවුවා. "මරු පපු- අහ්, ගොවිපොළක් මරු ගොවිපොළක් නේ ඔයාට තියෙන්නේ."

කදන් තුනේ මිනිහට ප්‍රතිචාරයක් දක්වන්න ඉඩ ලැබෙන්න කලින් නිකෝ ඩි ආන්ජෙලෝ විදුරු දොරක් තුළින් එළියට ආවා. "ගැරියන්, මම බලන් ඉන්නෙ නෑ-"

අපිව දකලා එයා ගල් ගැහුණා. ඊට පස්සෙ එයා කඩුව ඇදලා ගත්තා. ඒ තලය මට හීනෙන් දකින්න ලැබුණු එක වගේමයි: කෙටියි, තියුණුයි. ඒ වගේම රෑ මැදියම වගේ අඳුරුයි.

ඒක දකලා ගැරියන් ගෙරෙව්වා. "ඔක පැත්තකට දානවා, මිස්ටර් ඩි ආන්ජෙලෝ. මගේ අමුත්තෝ එකාට එකා මරාගන්නවා දකින්න මට ඕනෑ නැහැ."

"ඒත් ඒ-"

"පර්සි ජැක්සන්," ගැරියන් කිවුවා. "ඇනබෙත් චේස්. තව එයාලගේ රාක්ෂ යාළුවෝ ජෝඩුවක්. ඔව්, මං දන්වා."

"රාක්ෂ යාළුවෝ?" ග්‍රෝවර් තරහෙන් ඇසුවා.

"ඒ මනුස්සයා කමිස තුනක් ඇඳගෙන ඉන්නවා නේ," ටයිසන් කිවුවෙ එයාට ඒක තේරුණේ දැන් වගෙයි.

"එයාලා මගේ අක්කට මැරෙන්න ඇරියා!" නිකෝගේ කටහඬ කේන්තියෙන් වෙවුලුවා. "එයාලා මෙහෙට ඇවිල්ලා තියෙන්නෙ මාවත් මරන්න!"

"නිකෝ, අපි මෙහෙ ආවේ ඔයාව මරන්න නෙවෙයි," මම මගේ අත් එසෙව්වා. "බියන්කට සිද්ධ වුණ දේ-"

"එයාගේ නම කියන්න එපා! එයා ගැන කතා කරන්නවත් ඔයා වටින්නෙ නෑ!"



"විනාඩියක් ඉන්න," ඇනබෙත් ගැරියන්ට අත දිගු කළා. "ඔයා කොහොමද අපේ නම් දන්නේ?"

කදන් තුනේ මිනිහා ඇහැක් ගැහුවා. "හැම දෙයක් ගැනම දැන ඉගෙනගෙන ඉන්න එක මගේ රාජකාරියක්, ඩාලිං. හැම දෙනාම සැරින් සැරේට ගොවිපොළට එබෙනවා. හැම දෙනාටම නාකි ගැරියන්ගෙන් මොනවා හරි ඕනෑ වෙනවා. දැන්, මිස්ටර් ඩි ආන්ජෙලෝ, ඔයා කැත කඩුව පැත්තකට දාන්ඩ, නැත්නම් මම එරිතියන් ලවා ඒක කරවනවා."

සුසුමක් හෙළූ එරිතියන්, එයාගේ කටු මුගුර එසෙව්වා. එයාගේ දෙපා මුල සිටි ඕර්තස් ගෙරෙව්වා.

නිකෝ පසුබැවා. එයා අයිරිස්-පණිවුඩවල හිටියටත් වඩා කෙට්ටු සහ සුදුමැලි වෙලා. පහුගිය සතියට ම එයා කාලා නැති ද කියලා මම පුදුමයෙන් හිතුවා. වංගගිරිය තුළ සංචාරය නිසා එයාගේ කළු ඇඳුම්වල දූවිලි වැකිලා. ඒ වගේම එයාගේ කළු ඇස් පිරී තිබුණේ වෛරයෙන්. ඒ තරම් කිපුන පෙනුමක් ගන්න එයා පොඩි වැඩියි වගෙයි. මට තවමත් එයාව මතක තිබුණේ මිතොමැජික් කාඩ්වලින් සෙල්ලම් කරන, උද්‍යෝගිමත් පුංචි කොල්ලා විදිහටයි.

එයා අකමැත්තෙන් කඩුව කොපුවට දමාගත්තා. "ඔයා මගේ කිට්ටුවට එහෙම ආවොත්, පර්සි, මම උදවු කැඳවනවා. මම දන්ම කියලා තියන්නම්, ඔයාට මගේ උදවුකාරයෝ මූණ ගැහෙන්න කොහෙත්ම ඕනෑ වෙන්නැති වෙයි."

"ආයෙත් අහලා," මම කිවුවා.

ගැරියන් නිකෝගේ උරහිසට තට්ටුවක් දැමුවා. "දැක්කා නේ, අපි ඔක්කොම ලස්සනට විසඳා ගත්තා. දැන්, කට්ටියම එන්ඩ යමු. ඔයාලව ගොවිපොළ වටේ රවුමක් අරන් යන්ඩ මං කැමතියි."

★★★

ගැරියන්ට ඩක්කුවක් වගේ එකක් තිබුණා - ඒක හරියට සත්තු වත්තේ දි ඔයාව රවුමක් අරන් යන චූටි කෝච්චියක් වගෙයි. ඒක හරකෙකුගේ වයිරම් මෝස්තරයට කළු සහ සුදු පාටින් පින්තාරු කර තිබුණා. එහි රියැදුරු මැදිරියේ වියනට සවි කළ නළා කට්ටලයක් තිබුණා. ඒ නළා නාද කරද්දි නැගුණේ හරකෙකුගේ බෙල්ලේ බඳින ගෙජ්ජි වැලක හඬක්. සමහරවිට එයා මිනිස්සුන්ට වධ දෙනවා ඇත්තේ මේ විදිහට වෙන්න ඇති කියලා මම හිතුවා. එයා මිනිස්සුන්ව ගොන්-

කෝච්චියක පටවාගෙන. එයාලා ලැජ්ජාවෙන් මැරෙනකල් වටේ අරන් යනවා ඇති.

නිකෝ පිටුපසම අසුනට ගිහින් වාඩි වුණා. මට හිතෙන්නේ ඒ එතකොට එයාට අපි දිහා ඇහැ ගහගෙන ඉන්න ඉඩ ලැබෙන නිසා වෙන්න ඇති. එයා අසලට රිංගා වාඩිවුණ එරිතියන්, එයාගේ කව්බෝයි තොප්පියෙන් ඇස් වසා ගත්තේ පොඩි නින්දක් දාන්න යනවා වගෙයි. ඉදිරි අසුනේ සිටි ගැරියන් ළඟට පැනගත් ඕර්තස් සතුටින් බුරන්න පටන් ගත්තා.

ඇනබෙත්, ටයිසන්, ග්‍රෝවර් සහ මම මැද මැදිරි දෙකේ වාඩි වුණා.

"අපිට ලොකු ව්‍යාපාරයක් තියෙනවා!" ගොන්-කෝච්චිය ඉදිරියට ඇදෙද්දි ගැරියන් පම්පෝරි ගැහුවා. "වැඩිපුරම අශ්වයොයි, එළදෙන්නුයි. ඒත් හැම ජාතියකම විදේශික වර්ගත් ඉන්නවා."

අපි කඳු ගැටයකින් එහා පැත්තට ගියා ම ඇනබෙත් හිල්ලුවා. " හිපලෙක්ට්‍රියන්ලා? මං හිතන් හිටියේ උන් වඳ වෙලා ගිහින් කියලා!"

කඳු පාමුල වැටකින් වට කළ තණ බිමක සිටියේ මම මෙතෙක් කාලෙකට දැකපු අද්භූත ම සත්තු දූසිමක්. ඒ හැම සතෙකුට ම අශ්වයෙකුගේ ඉදිරි කයක් සහ කුකුළෙකුගේ පසු කයක් තිබුණා. උන්ගේ පස්සා ගාත් ලෙස තිබුණේ යෝධ කහ පාට නිය පහුරු යුගලක්. උන්ට පිහාටු වලිගා සහ රතු පාට පියාපත් තිබුණා. මම බලා ඉද්දිදී උන් දෙන්නෙක් ඇට ගොඩකට පොර කන්න පටන් ගත්තා. පස්සා ගාත්වලින් පියාපත්වලට ගසමින් සටන් කළ උන් දෙන්නාගෙ ත් පොඩි එකා අන්තිමේ දි එතැනින් පැනලා දිවුවා. ඌ දුවද්දි ඌගේ පසුපස කුකුල් කතුල් යන්තමින් උඩ පැන්නා.

"කුකුල් පෝනියෝ," ටයිසන් පුදුමයෙන් කිවුවා. "උන් බිත්තර දානව ද?"

"අවුරුද්දකට සැරයක්!" ගැරියන් පස්ස බලන කණ්ණාඩිය හරහා දත් නියෙව්වා. "ඒ ඔම්ලට්වලට හරි ඉල්ලුමක් තියෙන්නේ!"

"ඒක නම් දරුණුයි!" ඇනබෙත් කිවුවා. "උන් වඳ වීමේ තර්ජනේට ලක් වුන සත්තු ජාතියක් වෙන්න ඕනෑ!"

ගැරියන් අතක් වැනුවා. "රත්තරන් කියන්නේ රත්තරන්, ඩාලිං. ඒ වගේම ඔයා ඒ ඔම්ලට් එකක රස බලලා නැනේ."



"ඒක හරි නැහැ," ග්‍රෝවර් මිමිණුවා. ඒත් ගැරියන් නොනැවතී අපේ සංචාරයේ විස්තර කියාගෙන ගියා.

"දැන්, මෙන්න මෙතැන," එයා කිවුවා. "අපිට ඉන්නවා ගිනි පිඹින අශ්වයෝ. උන්ව නම් ඔයාලා ඇතුළට එද්දි දකින්නත් ඇති. උන්ව බෝ කරන්නේ යුද්ධයට, ඇත්තටම."

"මොන යුද්ධෙට ද?" මම ඇහුවා.

ගැරියන් කපටි ලෙස හිනාවුණා. "ඔහ්, ඉස්සරහට එන කොයිකට වුණත්. එතකොට අර පෙනෙන තැන තමයි, ඇත්ත වශයෙන් ම, අපේ ඉස්තරම් රතු දෙන්නු ඉන්නේ."

කිවුවා වගේම, චෙරි පාට එළ හරක් සිය ගාණක් කඳු බෑවුමේ උලා කමින් සිටියා.

"මහ ගොඩක් ඉන්නවා නේ," ග්‍රෝවර් කිවුවා.

"ඔව්, හොඳයි, ඇපලෝට උන්ව බලාගන්න වෙලාවක් නෑ" ගැරියන් පැහැදිලි කරා, "ඒ හින්දා එයා අපිට කොන්ත්‍රාත්තුවක් දුන්නා. ඉල්ලුම වැඩි නිසා අපි උන්ව ගොඩක් බෝ කරනවා."

"ඒ මොකටද?" මම ඇහුවා.

ගැරියන් ඇහි බැමක් ඔසවා බැලුවා. "මස්වලට, වෙන මොකට ද! හමුදාවලට කන්නත් එපැයි."

"ඔයා ඉර දෙවියන්ගේ පූජනීය හරක් හැම්බර්ගර් මස්වලට මරනව ද?" ග්‍රෝවර් ඇහුවා. "ඒක පෞරාණික නීතිවලට විරුද්ධයි!"

"ඔහ්, ඒ ගැන ඔච්චර හිතන්නෙපා, සැටර්. උන් නිකංම සත්තු විතරයි."

"නිකංම සත්තු!"

"ඔව්, ඒ වගේම ඇපලෝට ඒක ප්‍රශ්නයක් නම්, එයා අපිට ඒ ගැන කියයි කියලා මට විශ්වාසයි."

"එයා දැනගෙන හිටියා නම්," මම කෙඳිරුවා.

නිකෝ වාඩි වී සිටි අසුනෙන් ඉදිරියට නැමුණා. "මට මේ කිසි දෙයකින් වැඩක් නෑ, ගැරියන්. මේවා අපිට කතා කරගන්න තියෙන ගනුදෙනුවට අදාළ නැනේ!"

Scanned with CamScanner

"හැමදේම හරි වෙලාවට වෙයි. මිස්ටර් ඩී ආත්දේලෝ. මේ පැත්ත බලන්න. මගේ විදේශික ද්‍රව්‍යම්වලින් සමහරක්."

ඊළඟ බිම් කොටස කටු කම්බිවලින් වටකර තිබුණා. ඒ මුළු භූමියම පිරෙන්න සිටියේ යෝධ ගෝනුස්සෝ ගොඩක්.

"ට්‍රිපල් ජී ගොවිපොළ." හදිසියේම දෙයක් මතක් වෙලා මම කිව්වා. "ඔයාගේ සලකුණ තමයි කඳවුරේ ලී පෙට්ටිවල තිබුණේ. කුයින්ටස්. එයාගේ ගෝනුස්සෝ අරන් තියෙන්නෙ ඔයාගෙන්."

"කුයින්ටස්..." ගැරියන් කල්පනා කළා. "කොට අළු පාට කොණ්ඩේ, හැඩිදැඩි, කඩු සටන් කාරයා?"

"ඔව්."

"එහෙම කෙනෙක් ගැන කවදාවත් අහලා නෑ," ගැරියන් කිව්වා. "දැන්, මේ පැත්තෙ තමයි මගේ වටිනාම ඉස්තාල තියෙන්නේ! ඔයාලා ඒවා බලන්නම ඕනෑ."

මට නම් ඒවා බලන්න කොහෙත්ම උවමනා වුනේ නැහැ. මොකද අපි යාර තුන්සියක් විතර දුරින් ඉන්නකොට ම මට ඒවාගේ ගඳ දැනෙන්න පටන් ගත්තා. කොළ පාට ගං ඉවුරක් අසබඩ තිබුණු ඒ අශ්ව ගාල පාපන්දු පිටියක් විතර ලොකුයි. එහි එක් පැත්තක ඉස්තාල පෙළ ගසා තිබුණා. අශ්වයෝ සියයක් විතර ගොහුරේ ඇවිදිමින් සිටියා - මම ගොහුර කියලා අදහස් කළේ, අශ්ව ගොමවලටයි. ඒක තමයි මම ජීවිතේට ම දකපු අප්පිරියා සහගත ම දේ. ඒක හරියට ගොම කුණාටුවක් ඇවිත් එක රැයින් අඩි හතරක් උසට ගොම පිරිලා වගෙයි. ඒවාගේ එරෙමින් එහා මෙහා ගිහිල්ලම අශ්වයොත් හොඳටම අපිරිසිදු වී සිටියා. ඒ මදිවට ඉස්තාලවලත් ගන්න දෙයක් නැහැ. ඒවා ගඳ ගහපු තරම් ඔයාට විශ්වාස කරන්නත් බැරි වෙයි - ඒ ගඳ නැගෙනහිර ගඟේ පාවෙන කුණු බෝට්ටුවල ගඳටත් වඩා අන්තයි.

ඒ ගඳට තිකෝ පවා තහය වසා ගත්තා. "ඒ මොකක්ද?"

"මගේ ඉස්තාල!" ගැරියන් කිව්වා. "මෙහෙමයි, ඇත්තටම ඒවා අයිති ඕජියස්ට, ඒත් පොඩි මාසික ගාස්තුවකට අපි උන්ව බලාගන්නවා. උන් ෂෝක් නේද?"

"උන්ව දක්කම අප්පිරියයි!" ඇනබෙත් කිව්වා.

"ගොම ගොඩයි," ටයිසන් නිරීක්ෂණය කරලා තිබුණා.



"ඔයා මේ විදිහට සත්තු ඇති කරන්නෙ කොහොමද?" ග්‍රෝවර් කෑගැහුවා.

"ඔයාලා මාව අවුස්සනවා නේ," ගැරියන් කිව්වා. "මුන් මස් කන අශ්වයෝ, ජේනවා නේ? උන් කැමති මෙහෙම ඉන්න තමයි."

"ඇරත්, උන්ව පිරිසිදු කරන එක ඔයාට පාඩුයි නේ," එව්‍රිතියන් තොප්පිය යටින් කෙඳිරුවා.

"කට වහගන්නවා!" ගැරියන් කඩා පැන්නා. "හරි හරි, සමහර වෙලාවට මේ ඉස්තාල පිරිසිදු කරන එක ටිකක් අමාරු වැඩක් තමයි. සමහර වෙලාවට නුළඟ වැදී පැත්තට හමද්දි මටත් කැරකිල්ල හැදෙනවා තමයි. එහෙම වුණත් ඉතින් මොකද? මොනවා වුණත් මගේ ගනුදෙනුකාරයෝ මට හොඳට ගෙවනවා නේ."

"මොන ගනුදෙනුකාරයෝ ද?" මම ප්‍රශ්න කළා.

"ඔන්, මස් කන අශ්වයෙක් වෙනුවෙන් ගෙවන්න කොච්චර අය ඉන්නව ද කියලා දැනගත්තොත් ඔයා පුදුම වෙයි. කුණු පිට කරන්න උන් හොඳම ක්‍රමයක්. ඔයාගේ හතුරන්ව බය ගන්වන්ඩ නියම ක්‍රමයක්. උපන්දින සාදවලටත් නියමයි! අපි නිතරම උන්ව කුලියට දෙනවා."

"ඔයා නම් රාක්ෂයෙක්," ඇනබෙත් තීරණය කළා.

ගොන්-කෝච්චිය නතර කළ ගැරියන් ආපසු හැරිලා එයා දිහා බැලුවා. "ඔයා කොහොමද ඒක දැනගත්තේ? ඇඟවල් තුනෙන් ද?"

"ඔයා මේ සත්තුන්ට යන්න අරින්න ඕනෑ," ග්‍රෝවර් කිව්වා. "මේක හොඳ නැහැ!"

"එතකොට ඔයා මේ දිගින් දිගටම කියන ගනුදෙනුකාරයෝ," ඇනබෙත් කිව්වා. "ඔයා වැඩ කරන්නේ ක්‍රෝනොස්ට, හා නැද්ද? ඔයා එයාගේ හමුදාවලට අශ්වයෝ, කෑම, එයාලට උවමනා ඕනෑම දෙයක් සපයනවා."

ගැරියන් උරහිස් ඇකිළුවා. ඒක හරිම අමුතු දෙයක් වුණේ එයාට උරහිස් යුගල් තුනක් තිබුණ නිසයි. ඒක පෙනුණේ එයා ඇඟ හරහා රැල්ලක් යවනවා වගෙයි. "මම රත්තරන් එක්ක එන ඕනෑ කෙනෙක්ට වැඩ කරනවා, පුංචි නෝනේ. මම ව්‍යාපාරිකයෙක්. ඒ වගේම මම, මට පුළුවන් හැමදේම විකුණනවා."

ගැරියන් එයාට හිනාවුණා. "බය වෙන්වෙපා, මගෙ කෙල්ලේ. මම මිස්ටර් ඩී ආන්ජේලෝව බාර දුන්නට පස්සෙ ඔයාටයි ඔයාගේ කාඩ්ටෙටයි යන්ට පුළුවන්. මම ගවේෂණවලට ඇඟිලි ගහන්නෙ නෑ. ඇරත්, ඔයාලව පරිස්සමෙන් ගමන යවන්ඩ මට හොඳ ගාස්තුවක් ගෙවලයි තියෙන්නේ. හැබැයි මට බය, ඒකට මිස්ටර් ඩී ආන්ජේලෝව නම් ඇතුළත් නැහැ."

"කවුද ගෙව්වේ?" ඇනබෙත් ඇහුවා. "මොකක්ද ඒකෙ තේරුම?"

"ඒකෙන් වැඩක් නෑ, ඩාලිං. අපි දැන් යමු ද?"

"ඔහොම ඉන්න!" ඔර්තස් ගොරවද්දි මම කිව්වා. ඌ මගේ උගුරු දණ්ඩ ඉරයි කියන බයට මම හෙලවුනේවත් නැහැ. "ගැරියන්, ඔයා කිව්වා නේද ඔයා බිස්නස්කාරයෙක් කියලා. මාත් එක්ක ගනුදෙනුවක් කරන්න."

ගැරියන්ගේ ඇස් පටු වුණා. "මොන වගේ ගනුදෙනුවක් ද? ඔයා ළඟ රත්තරන් තියෙනව ද?"

"මං ළඟ ඊටත් වඩා හොඳ දෙයක් තියෙනවා. හුවමාරුවක්."

"ඒත් මිස්ටර් ජැක්සන්, ඔයා ළඟ මුකුත් ම නැතේ."

"ඔයාට එයා ලවා ඉස්තාල සුද්ධ කරවා ගන්ඩ පුළුවන්," එරිතියන් අහිංසක විදිහට යෝජනා කළා.

"මං ඒක කරන්නම්!" මම කිව්වා. "මට කරගන්න බැරි වුණොත්, ඔයා අපි හැමෝවම ගන්න. අපි හැමෝවම ලූක්ට විකුණලා රත්තරන් ගන්න."

"ඒ ඉතින් අශ්වයෝ ඔයාව කෑවෙ නැත්නම් විතරයි නේ," ගැරියන් කිව්වා.

"එහෙම වුණත්, ඔයාට මගේ යාළුවෝ ලැබෙනවා," මම කිව්වා. "ඒත් මම වැඩේ කළොත්, ඔයා අපි හැමෝටම යන්න දෙන්න ඕනෑ. නිකෝටත් එක්කම."

"නෑ!" නිකෝ බෙරිහන් දුන්නා. "මට පිහිට වෙන්න හදන්නෙපා, පර්සි. මට ඔයාගෙ උදවු ඕනෑ නෑ!"

ගෙරියන් කෙකර ගෑවා. "පර්සි ජැක්සන්, අර ඉස්තාල අවුරුදු දාස් ගාණකින් සුද්ධ කරලා නැහැ... හැබැයි ඒ ජරාව ඔක්කොම සුද්ධ



කරලා දැම්මොත් මට විකුණන්ඩ ඉස්තාලේ වැඩිපුර ඉඩ ලැබෙන එක නම් ඇත්ත."

"ඉතින්, මේකෙන් ඔයාට මොනවද නැති වෙන්නේ?"

ගොව්පොළ හිමිකරුවා පැකිළුණා. "හරි එහෙනම්, මම ඔයාගේ යෝජනාව පිළිගන්නවා. හැබැයි ඔයාට ඉර බහින වෙලාව වෙද්දි ඒක කරලා ඉවර කරන්න වෙනවා. එහෙම බැරි වුණොත්, ඔයාගේ යාළුවන්ව විකුණලා, මම පෝසත් වෙනවා."

"ඔට්ටුයි."

එයා ඔළුව වැනුවා. "මම ඔයාගේ යාළුවන්ව මාත් එක්ක ආපහු බංගලාවට අරන් යනවා. අපි ඔයාගේ වැඩේ ඉවර වෙනකල් එහෙ ඉන්නවා."

එරිතියන් මට විකාර බැල්මක් හෙළුවා. සමහරවිට ඒ බැල්මේ තිබුණේ අනුකම්පාවක් වෙන්න ඇති. එයා උරුවම් බාද්දි බල්ලා මගේ ඇඟෙන් බිමට පැනලා ඇනබෙත්ගේ ඔඩොක්කුවට ගොඩවුණා. ඇනබෙත් මොර ගැසුවා. ඇනබෙත්ව ප්‍රාණ ඇපකාරියක් විදිහට රඳවාගෙන ඉන්න තාක් ටයිසන් හෝ ග්‍රෝවර් කිසිම දෙයක් කරන්න උත්සහ නොකරන බව මම දැන සිටියා.

වාහනයෙන් බිමට බැස්ස මම ඇනබෙත්ගේ ඇස් දිහා බැලුවා.

"ඔයා කරන්නේ මොනවද කියලා ඔයා දන්නවා ඇති කියලා මම හිතනවා," එයා හෙමිහිට කිව්වා.

"මාත් එහෙම හිතනවා,"

ගැරියන් සුක්කානම පිටුපස වාඩිවුණා. එරිතියන් නිකෝව පිටුපස අසුනට දමා ගත්තා.

"ඉර බහිද්දි," ගැරියන් මට නැවත සිහිපත් කළා. "ඊට වඩා වෙලා ගන්ඩ බැහැ."

තව වරක් මහ හඬින් හිනාවුණ එයා ගෙප්ප් තළා හැඬවූවා. ඊට පස්සේ ගොන්-කෝච්චිය අඩි පාර දිගේ හඬ නගමින් යන්න ගියා.

09

# මම ගොම ඇද්දා

අශ්වයින්ගේ දත් දක්කා ම මගේ බලාපොරොත්තු කඩා වැටුණා.

වැට ළඟට කිට්ටු වෙද්දි මම ගඳ ඉවසාගන්න බැරුව මගේ කමිසයෙන් නහය වසාගත්තා. ගොහුරේ එරෙමින් ආව එක අශ්වයෙක් කේන්තියෙන් නේෂාරාවය කළා. ඌ වලහෙකුගේ වගේ උල් දත් විලිස්සුවා.

මම හිතෙන් ඌට කතා කරන්න උත්සහ කළා. මට අශ්වයින්ගෙන් වැඩි දෙනෙක් සමග එහෙම කරන්න පුළුවන්.

*හායි, මම ඌට කිවුවා. මම ඔයාලගේ ඉස්තාලේ සුද්ධ කරන්න යන්නේ. හොඳයි නේද?*

*ඔව්! අශ්වයා කිවුවා. ඇතුළට එනවා! ඔහේව කන්නම්! රස අර්ධ-ලෝහිතයා!*

*ඒ වුණාට මම පොසෙයිඩන්ගේ පුතා නේ,* මම විරෝධය පෑවා. *එයා තමයි අශ්වයින්ව මැවුවේ.*

සාමාන්‍යයෙන් එහෙම කිවුවාම මට අශ්ව ලෝකයේ අති විශේෂ ගෞරව සැලකිලි ලැබෙනවා වුණත්, මේ වතාවේ එහෙම නැහැ.

*ඔව්! අශ්වයා සතුටින් එකඟ වුණා. පොසෙයිඩන්ටත් එන්න කියනවා! අපි දෙන්නවම කන්නම්! මුහුදු කෑම!*

*මුහුදු කෑම!* එහා මෙහා යමින් සිටි අනෙක් අශ්වයෝ ටිකත් බලෙන්ම අපේ කතාවට මැදිහත් වුණා.



මැස්සන් හැමතැනම කැරකෙමින් සිටියා. දහවල් උෂ්ණුමට ගඳ වැඩි වුණා මිසක් අඩු වුණේ නම් නැහැ. හර්කියුලිස් මේ අභියෝගය ජයගත් හැටි මතක තිබුණු නිසා කළ යුතු දේ ගැන අදහසක් මගේ හිතේ තිබුණා. එයා කරලා තිබුණේ ගඟක් ඉස්තාලයට හරවලා ජරාව සෝදා හැරපු එකයි. සමහරවිට ඒ විදිහට වතුර පාලනය කරන්න මටත් පුළුවන් වෙයි කියලා මම හිතුවා. ඒ වුණත් අශ්වයින්ට මාව කන්න දෙන්නේ නැතිව, උන්ට කිට්ටු වෙන්න මට බැරි වුනොත් නම් ප්‍රශ්නයක් වෙනවා. ඒ වගේම ගඟ තිබුණෙත් මම කලින් හිතුවට වඩා ගොඩක් පහළින්. හැතැප්ම බාගයක් විතර දුරිනුයි. ළං වෙලා බලද්දි ගොම ගොඩ තිබුණාටත් වඩා ලොකුවටයි පෙනුණේ. මලකඩ කෑව සවලක් අහුලාගත් මම අත්හදා බලන්න වගේ වැට අයිනේ තිබුණු ගොම ටිකක් ඇදලා දැමුවා. නියමයි. තව සවල් පාරවල් බිලියන හතරකින් වැඩේ ඉවරයි.

ඉර දනටමත් අවරට හැරිලා. වැඩිම වුනොත් මට තව පැය තුන හතරක් ඇති. මගේ එකම බලාපොරොත්තුව ගඟ කියලා මම තීරණය කළා. අඩු තරමේ මෙතැනදිට වඩා ගඟ ළඟදි කල්පනා කරන්නවත් ලේසි වෙයි. මම පල්ලම් බහින්න පටන් ගත්තා.

***

ගඟ ළඟට යද්දි මම එතකල් බලා ඉන්නා ගෑනු ළමයෙක්ව මට දකින්න ලැබුණා. කලිසමක් සහ කොළ පාට ටී-ෂර්ට් එකක් හැඳ සිටි එයා දිග දුඹුරු පාට කොණ්ඩයට වතුරේ වැවෙන පැළෑටි තබා ගොතාගෙන සිටියා. එයාගේ මුහුණේ තිබුණේ තද පරුෂ පෙනුමක්. එයා අත් පපුව හරහා බැඳගෙන සිටියා.

"ඔහ්, නෑ. ඔයාට බැහැ-" එයා කිවුවා.

මම එයා දිහා බලා සිටියා. "ඔයා ජල දෙවඟනක් ද?"

එයා ඇස් කැරකුවා. "ඇත්ත වශයෙන්ම!"

"ඒත් ඔයා කතා කරන්නේ අපේ භාෂාවෙන් නේ. ඒ මදිවට ඔයා වතුරෙන් ගොඩට ඇවිත් ඉන්නවා."

"මොකද, ඔයා හිතන්නේ අපිට උවමනා වෙලාවට මිනිස්සු වගේ හැසිරෙන්න බැහැ කියලා ද?"

මම කවදාවත් ඒ ගැන හිතලා තිබුනේ නැහැ. ඒ කොහොම වුණත් මට මහා අමන ගතියක් දැනුණා, මොකද කඳවුරේ දී මම ඇති තරම් ජල දෙවඟනන්ව දකලා තිබුණා. ඒ වුණත් එයාලා ඔරු පදින විල් පතුලේ ඉඳන් මුකුළු කරමින් අත් වනනවාට වැඩි දෙයක් කවදාවත් කරලා නැහැ නේ.

"බලන්න," මම කිවුවා. "මම ආවේ-"

"ඔයා කවුද කියලා මම දන්නවා," එයා කිවුවා. "ඒ වගේම ඔයාට උවමනා මොනවද කියලත් මම දන්නවා. ඒකට උත්තරේ නමයි නැහැ! අර ජරා ඉස්තාලේ සුද්ධ කරන්න මම ආයෙමත් මගේ ගඟ දෙන්නෙ නැහැ."

"ඒත්-"

"ඔන්, පාවුවේ ඉන්න, මුහුදු කොල්ලෝ. ඔයාලා වගේ මුහුදු-දෙව කට්ටිය හිතන්නේ පුංචි ගඟකට වඩා ඔයාලා මහා ලොකු වැදගත් අය කියලා, නැද්ද? හොඳයි, මං ඔයාට කියන්නේ, ඔයාගේ තාත්තා පොසෙයිඩන් වෙච්චි පළියට මේ ජල දෙවඟන නම් නැමෙන්න ලැස්ති නැහැ. මේ මිරිදිය රාජධානිය, මිස්ටර්. ඔය උදවුව මගෙන් ඉල්ලපු අන්තිම කොල්ලා - ඔන්, කොහොම වුණත්, එයා නම් ඔයාට වඩා හැඩයි - එයා කොහොම හරි මාව නම්ම ගත්තා. ඒක තමයි මම ජීවිතේට කරපු ලොකුම වැරැද්ද! අශ්වයින්ගේ ජරාව මගේ පරිසර පද්ධතියට කරපු දේ ගැන ඔයාට කිසිම අදහසක් තියෙනව ද? ඔයාට මාව පේන්නේ කුණු කසළ පිරියම් කරන යන්ත්‍රාගාරයක් වගේ ද? මගේ මාළුවෝ මැරිලා යයි. මගේ පැළ වැවෙන එකත් නවතියි. මම අවුරුදු ගාණක් යනකල් ලෙඩ වෙලා ඉඳියි. අනේ නැතුවට කමක් නැහැ!"

එයා කතා කළ විදිහ දකිද්දි මට මගේ මනුස්ස යාළුවා, රේචල් එලිසබෙත් ඩෙයාර්ව සිහි වුණා - එයත් වචනවලින් මට දමලා ගහනවා වගෙයි දැනුණේ. ජල දෙවඟනට දොස් කියන්න මට පුළුවන්කමක් තිබුනේ නැහැ. දැන් මම ඒ ගැන කල්පනා කරලා බලද්දි මට තේරුණේ, කවුරුහරි මගේ ගෙදරට රාත්තල් මිලියන හතරක අශ්ව වසුරු ගෙනැත් දම්මොත් මට කොයි තරම් තරහා යයි ද කියලයි. ඒ වුණත්...

"මගේ යාළුවෝ ඉන්නේ අනතුරක," මම එයාට කිවුවා.

"හොඳයි, ඒක නම් ගොඩක් නරකයි! ඒත් ඒක මගේ ප්‍රශ්නයක් නෙවෙයි. ඒ වගේම ඔයාට මගේ ගඟ විනාශ කරන්නත් දෙන්නෙ නෑ."



එයා බලන් හිටියේ ගහගන්න වුනත් ලෑස්තියි වගෙයි. එයාගේ අත් මිට මෙලවී තිබුණා, ඒත් එයාගේ කටහඬේ පොඩි වෙවුලීමක් ඇහුණා කියලා මට හිතුණා. හදිසියේ ම මට තේරුම් ගියේ එයාගේ කේන්ති ගිය හැසිරීමට යටින්, එයා මට බයෙන් ඉන්න බවයි. ගඟේ පාලනය ගන්න මම එයා එක්ක සටන් කරයි කියලා එයා හිතන්න ඇති, එයා ඉන්න ඇත්තේ පරදියි කියලා බයෙන්.

එහෙම හිතද්දි මට දුක හිතුණා. මට දැනුණේ මම දාමරිකකම් කරනවා වගෙයි, පොසෙයිඩන්ගේ පුතෙක් වුණ ලොකුකම පෙන්වනවා වගෙයි.

මම ගස් කොටයක් උඩ වාඩිවුණා. "හරි, ඔයා දිනුම්."

ජල දෙවඟන ගොඩක් පුදුම වුණා වගෙයි. "ඇත්තටම?"

"මං ඔයා එක්ක රණ්ඩු කරන්නෑ. මේක ඔයාගේ ගඟ නේ."

එයාගේ උරහිස් ලිහිල් වුණා. "ඔන්, ඔන්, හොඳයි නේ. මං කිවුවේ - ඒක ඔයාට හොඳයි!"

"ඒත් මම ඉර බහින්න කලින් අර ඉස්තාල සුද්ධ කරේ නැත්නම් මගේ යාළුවන්වයි මාවයි ටයිටන්ලට විකුණන්න යන්නේ. ඒක කොහොම කරන්න ද කියලා මම දන්නෑ."

ගංගාව ප්‍රීතිමත් හඬින් ගලා ගියා. වතුර මතින් ලිස්සා ගිය සර්පයෙක් ඔළුව ඇතුළට ඔබා ගත්තා. අන්තිමේ දි ජල දෙවඟන සුසුමක් හෙළුවා.

"මං ඔයාට රහසක් කියන්නම්, මුහුදු දෙවියන්ගේ පුත්‍රයෝ. පස් ටිකක් අතට ගන්න."

"මොකක්?"

"ඔයාට මාව ඇහුණා නේ."

බිම ඇත තියා ගත් මම ටෙක්සාස් පස් අහුරක් අතට ගත්තා. වියළි, කළු පසක් වූ එහි තැනින් තැන සුදු ගල් කැලිවලින් පුල්ලි වැටී තිබුණා... නෑ, ගල් කැලිවලට අමතරව තවත් දෙයක් තිබුණා.

"ඒවා සිප්පි කටු," ජල දෙවඟන කිවුවා. "පාෂාණීභූත වුණ සිප්පි කටු. අවුරුදු මිලියන ගාණකට කලින්, දෙවිවරුන්ගේ කාලෙටත් කලින්, ගයියාගෙයි යුරේනස්ගෙයි පාලනය විතරක් තිබුණ කාලේ, මේ පළාත තිබුණේ වතුර යට. ඒ කාලේ මේකත් මුහුදේ කොටසක්."

එක්වරම එයා අදහස් කළ දේ මට තේරුණා. මගේ අතේ තිබුණේ පෞරාණික මුහුදක පුංචි කොටස්, මොලුස්කාවන්ගේ කටු, හුණුගල්වල පවා සිප්පි කටුවල මුද්‍රා එබී තිබුණා.

"හරි," මම කිවුවා. "ඒකෙන් මට වෙන හොඳේ මොකක්ද?"

"ඔයා මට වැඩි වෙනසක් නැහැ, උප දෙවියෝ. මම වතුරෙන් ගොඩ ඉන්න වෙලාවට පවා, වතුර මගේ ඇතුළේ තියෙනවා. ඒක තමයි මගේ ජීව ප්‍රභවය." ආපස්සට ගොස්, කකුල් වතුරට දමූ එයා හිනාවුණා. "ඔයා, ඔයාගේ යාළුවෝ බේරගන්න ක්‍රමයක් හොයාගනී කියලා මම හිතනවා."

ඊට පසසේ එයා වතුර වගේ දිය වෙලා ගඟට එකතු වුණා.

***

මම ආපසු ඉස්තාල වෙත යද්දි ඉර කඳු මුදුන්වල දවටෙමින් තිබුණා. කවුරුහරි ඇවිත් අශ්වයින්ට කන්න දාන්න ඇති කියලා මට හිතුණේ උන් ලොකු මළකුණුවල මස් ඉරා කමින් සිටි නිසයි. ඒවා මොන සතෙකුගේ මළකුණු ද කියන්න මට පුළුවන්කමක් තිබුනේ නැහැ, වගේම ඒ ගැන දැනගන්නත් මට කිසිම උවමනාවක් තිබුනේ නැහැ. ඒ ඉස්තාලයේ තිබුණු අප්පිරියා සහගත බව තවත් වැඩි වෙන්න හැකියාවක් තිබුණා නම්, අමු මස් ඉරා කන අශ්වයින් පනහක දර්ශනය ඒක කළා.

*මුහුදු කැම! මාව දැකලා එක අශ්වයෙක් හිතුවා. ඇතුළට එනවා! අපිට තව ඕනෑනිසා!*

මම මොනවද කරන්නේ? මට ගඟ පාවිච්චි කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වගේම මේ තැන අවුරුදු මිලියන ගාණකට කලින් මුහුද යට තිබුණා කියන කාරණයෙනුත් මේ වෙලාවේ මට උදව්වක් වුනේ නැහැ. මගේ අත්ල මත තිබුණු හුණුවලට හැරුණු සිප්පි කටුව දිහා බැලූ මම ආපහු යෝධ ගොම කන්ද දිහා බැලුවා.

බලාපොරොත්තු කඩ වීමෙන් දැනුණු කේන්තිය නිසා ම මම සිප්පි කටුව ගොම ගොඩට විසි කළා. මම අශ්වයින්ට පිටුපා හැරෙන්න යද්දි හඬක් ඇසුණා: *ප්ප්ෆ්ෆ්ෆ්ට්!* හරියට බැලූනයක හුළං යනවා වගෙයි.

මම විසි කළ සිප්පි කටුව වැටුණු තැනට මගේ ඇස් යොමු වුණා. එතැන ගොහුර තුළින් පුංචි දිය කඳක් පිටතට විදිමින් තිබුණා.

"වෙන්න බෑ," මම කෙඳිරුවා.



මම දෙගිඩියාවෙන් වැට දිහාවට අඩිය තැබුවා. "තව ලොකු වෙන්න," මම වතුර කඳට කිවුවා.

*ෂ්හු-ෂ්!*

අඩි තුනක් ඉහළට විදින්න ගත් වතුර කඳ නොනවත්වා බුබුළු දැමුවා. කොහෙත්ම වෙන්න බැරි වැඩක් වුණත් ඒක ඇත්තටම සිදු වෙමින් තිබුණා. අශ්වයෝ දෙන්නෙක් ඒ ගැන සෝදිසි කර බලන්න එතැනට ආවා. සිය බුබුළුට හොම්බ දැමූ එකෙක් ආපස්සට පැන්නා.

*ඊයා! උං කිවුවා. ලුණු!*

ටෙක්සාස්වල ගොවිපොළක් මැදින් මුහුදු වතුර මතු වෙලා. තවත් පස් මිටක් අතට ගත් මම සිප්පි කටු පොසිල අහුලා ගත්තා. මං මොනවා කරනවා ද, මටම නොතේරුණත්, සිප්පි කටු ගොම ගොඩවල්වලට විසි කරමින් මම ඉස්තාලය වටේ දිවුවා. සිප්පි කටුවක් වැටුණු සෑම තැනකින් ම මුහුදු වතුර උල්පතක් පැන නැග්ගා.

*නවත්තන්න! අශ්වයෝ කෑගැසුවා. මස් හොඳයි! නාන එක නරකයි!*

ඒ වෙලාවේ මට තේරුම් ගියේ වතුර සාමාන්‍ය විදිහට ඉස්තාලයෙන් පිටට හෝ කන්දෙන් පහළට ගලා නොයන බවයි. උල්පත වටේට නිකං ම බුබුළු දැමූ ඒවා ගොමත් සමග පොළොව තුළට කිඳා බැස්සා. අශ්ව ගොම ලුණු වතුරේ දිය වී යද්දි, නියම තෙත පස නැවත මතු වුණා.

"තව!" මම මොර දුන්නා.

මගේ බඩ ඇතුළේ ගැස්මක් දැනෙද්දි, වතුර උල්පත් පුපුරා ගියේ ලෝකයේ ලොකුම කාර් වොෂ් එක වගෙයි. ලුණු දිය අඩි විස්සක් ඉහළට විදින්න ගත්තා. හතර අතින් ම දිය උල්පත් ඉහළට විදිද්දි අශ්වයෝ පිස්සුවෙන් වගේ එහා මෙහා දිවුවා. ගොම කඳු අයිස් වගේ දිය වී යන්න පටන් ගත්තා.

මට දැනෙමින් තිබුණු ගැස්ම තවත් තදබල වෙද්දි වේදනාවක් පවා දැනුණා, ඒ වුණත් ඒ මුහුදු වතුර දකිද්දි මොකක්දෝ සතුටකුත් හිතට දැනුණා. මේක කළේ මමයි. කඳු බෑවුමක් මැද්දට මම මුහුද අරන් ඇවිල්ලා.

*නවත්තන්න, උතුමාණෙනි! අශ්වයෙක් කෑගැසුවා. නවත්තන්න, කරුණාකරලා!*

දත් හැපෙනකම් වතුර කැලතෙමින් තිබුණා. වතුරෙන් පෙඟුණු අශ්වයින්ගෙන් සමහරක් කුලප්පු වෙලා මෙට් ලිස්සමින් සිටියා. මෙම වතුරේ දිය වී පොළොව තුළට කිඳා බැස, සම්පූර්ණයෙන්ම සුද්ධ වෙලා තිබුණා. දත් හැකිලන තැන දිය කඩිතිවලට එකතු වුණ වතුර පුංචි දිය පාරවල් සිය ගාණක් ලෙසින් කන්ද පහළ ගඟ දෙසට ගලා යන්න පටන්ගෙන තිබුණා.

"නවත්තන්න," මම වතුරට කිවුවා.

මුකුත් වුනේ නැහැ. මගේ ඔළු ඇතුළේ වේදනාව වැඩි වෙමින් තිබුණා. මම ඉක්මනින් දිය උල්පත් නවතා නොදැමුවොත් පුණු වතුර ගෙට් එකතු වෙලා මාළු සහ පැළෑටි වනසාවි.

"නවතිනවා!" මුහුදේ බලය නවත්වන්න මම මගේ මුළු චිත්ත ශක්තිය ම යෙදුවා.

එක්වරම දිය උල්පත් වැසී ගියා. මහන්සියෙන් අඩපණ වුණ මම දණහිස් මතට ඇද වැටුණා. මගේ ඉදිරියේ පිරිසිදුව දිලිසෙන අශ්ව ඉස්තාලයක්. පුණු දියෙන් පෙඟුණු පොළොවක් සහ ලොම් වැස්ම දිලිසෙන තුරඟ අතුල්ලා සේදූ අශ්වයින් පනස් දෙනෙක් දකින්න ලැබුණා. අඩු තරමේ අශ්වයින්ගේ දත් අතර රැඳී තිබුණු මස් කැලි පවා සේදී තිබින්.

*අපි බොහොම සන්තෝෂ යි!* අශ්වයෝ විලාප දුන්නා. *ස්තුතියි ලා. උණුවෙනකොට ආයෙ අපි ඉතුරු වතුරෙන් නාවන්න එපා!*

"එක කොන්දේසියක් පිට," මම කිවුවා. "අද ඉඳලා ඔයාලා කන්නෙ ඔයාලව බලාගන්න අය දෙන කෑම විතරයි. මිනිස්සුන්ව නෙවෙයි. එහෙම නැති වුණොත් මම තව සිප්පි කටු ගොඩක් අරන් ආපහු එනවා!"

හේෂාරාවය කළ අශ්වයෝ මීට පස්සේ හොඳ මස්-කන අශ්වයෝ වෙනවා කියලා මට පොරොන්දු ගොඩක් දුන්නා. ඒත් එයාලා එක්ක කතා කරකර ඉන්න මම නැවතුනේ නැහැ. ඉර බැස යමින් තිබුණා. ආපසු හැරුණු මම උපරිම වේගයෙන් ගොවි ගෙදර බලා දිවුවා.

* * *



ගොවි ගෙදරට ළඟා වෙන්නත් කලින් මට බා'බසියු සුවඳක් දැනුණා. එයින් මාව තවත් ඇවිස්සුණේ මම ඇත්තටම බා'බසියුවලට ආසා නිසයි.

එලි පහන මනල පාදයකට සූදානම් කර තිබුණා. ධජ පතාක සහ බැලූන්වලින් රෝදි වැට සරසලා. තෙල් කල්දේරමකින් සැදූ විශාල බා'බසියු උඳුනක ගැරියන් බර්ගර් දෙපැත්ත දමමින් සිටියා. එරිනියන් පික්නික් මේසයක් ළඟ හාන්සි වී, පිඟානකින් තියපොතු කාමින් සිටියා. ඔළු දෙකේ බල්ලා දල මත බැදෙන මස් සහ බර්ගර්වලට ඉව ඇල්ලුවා. ඒත් එක්කම මට මගේ යාළුවන්ව දකින්න ලැබුණා ටයිසන්ව, ග්‍රෝවර්ව, ඇනබෙත්ව සහ නිකෝව ගෙල් කරපු සත්තු ටිකක් වගේ වලලුකරවල් සහ මැණික් කටු කඹයකින් එකට ගැට ගසා, මුඛවාඩම් බැද, මුල්ලක දමා සිටියා.

"එයාලට යන්න දෙනවා!" පඩිපෙළේ ඉහළට දුවගෙන ඇවිත්, හති දමමින් මම මොර දුන්නා. "මම ඉස්තාලේ සුද්ධ කරා!"

ගැරියන් හැරිලා බැලුවා. එයා එක පපුවකට එක බැගින් ඒප්‍රන් ඇඳ සිටියා. ඒවා මැද තිබුණු වචන තුන එක වැකියක් හැදුවා: '*කෝට-හාද්දන්-දෙන්න*'.

"ඔයා කළා ද? ඔයා කොහොමද ඒක කළේ?"

සැහෙන නොයිවසිලිවන්තව සිටියා වුණත්, මම එයාට කතාව කිවුවා.

එයා අගය කරන ලෙසින් ඔළුව වැනුවා. "හරිම දක්ෂයි නේ. ඔයා අර කරච්චල්කාර ජල දෙවිගෙනට විෂ වදින්න ඇරියා නම් තවත් හොඳයි. ඒත් ප්‍රශ්නයක් නැහැ."

"මගේ යාළුවන්ට යන්න දෙන්න," මම කිවුවා. "අපි ගනුදෙනුවකට එකඟ වුණා නේ."

"අත්, මං ඒ ගැන හිතහිතා තමයි හිටියේ. ප්‍රශ්නෙ මේක නේ, මම එයාලට යන්ඩ දුන්නොත් මට ගාස්තුවක් ලැබෙන්නැති වෙනවා."

"ඔයා පොරොන්දු වුණා!"

ගැරියන් කටින් '*ච්ක්-ච්ක්*' හඬක් නැගුවා. "ඒත් ඔයා මාව ස්ටයික්ස් ගඟ මත දිවුරවා ගත්ත ද? නෑ. ඔයා එහෙම කළේ නැහැ. ඉතින් ඒක බැඳීමක් නෙවෙයි. ඔයා බිස්නස් එකක් කරනවා නම්, පුතේ, හැම වෙලාවෙම බන්ධන දිවුරුමක් ගන්න ඕනෑ."

Scanned with CamScanner

මම මගේ කඩුව ඇදලා ගත්තා. ඔර්තස් ගෙරෙව්වා. ග්‍රෝවර්ගේ කනක් වෙතට නැමුණු ඌගේ එක ඔළුවක් දත් විලිස්සුවා.

"එරිතියන්," ගැරියන් කතා කළා. "මේ කොල්ලා මට කරදර කරනවා. එයාව මරලා දාන්ඩ."

එරිතියන් මගේ දිහා සැලකිල්ලෙන් බලා සිටියා. එයාගේ යෝධ මුගුරට එරෙහිව වාසනාව උරගා බලන්න මම කැමති වුනේ නැහැ.

"ඔහේම එයාව මරන්ඩ," එරිතියන් කිවුවා.

ගැරියන්ගේ ඇහිබැම් උඩ ගියා. "මොකක්ද කිවුවේ?"

"ඔහේට මාව ඇහුණා නේ," එරිතියන් ගෙරෙව්වා. "ඔහේ හැම වෙලාවෙම ඔහේගෙ කුණු වැඩ කරන්ඩ මාව යවනවා. ඔහේ කිසිම සාධාරණ හේතුවක් නැතුව රණ්ඩු සරුවල්වල පැටලෙනවා. ඔහේ වෙනුවෙන් මැරිලා මට දැන් ඇති වෙලයි තියෙන්නේ. ඔහේට මේ ළමයා එක්කත් රණ්ඩු කරන්ඩ ඕනෑ නම්, ඒක ඔහේම කරගන්නවා."

ඊරිස්ගේ පුතෙකුගේ කටින් මට අහන්න ලැබුණු අමුතු ම කතාව ඒකයි.

ගැරියන් අතේ තිබුණු පළල් පිහිය පැත්තකට විසි කළා. "ඔහේ මට අකීකරු වෙන්න තරම් චණ්ඩියෙක් ද? මං ඔහේව මේ දැන්ම අස් කරලා දානවා!"

"එතකොට ඔහේගෙ හරක් ටික බලාගන්නෙ කවුද? ඔර්තස්, ඉඳගන්නවා."

එසැණින්ම ග්‍රෝවර්ට ගොරවන එක නතර කළ බල්ලා, ඌගේ ස්වාමියාගේ දෙපා ළඟ වාඩි වුණා.

"හොඳයි!" ගැරියන් ගෙරෙව්වා. "මම ඔහේ ගැන පස්සෙ බලාගන්නම්, මේ කොල්ලා මළාට පස්සේ!"

මස් කපන පිහි දෙකක් දෑතට ගත් එයා මට දමා ගැසුවා. මම, මගේ කඩුවෙන් එකක් ඉවතට හැරෙව්වා. අනෙක පික්නික් මේසය මත එරිතියන් අත තබාගෙන සිටි තැනට අඟලක් ඈතින් වැදුණා.

මම පහර දෙමින් ඉදිරියට ගියා. මගේ පළමු පහර ගිනියම් වූ අඟුරුවකින් ඉවත හැරවූ ගැරියන් බා'බකියු ගෑරුප්පුවකින් මගේ මුහුණට පහර දෙන්න පැන්නා. එයා ඊළඟ වතාවේ අනින්න එද්දී ඉදිරියට ගිය මම එයාගේ මැද පපුව හරහා කඩුව බැස්සුවා.



"ආාාග්ග්ග්හ්!" එයා දණහිස් මතට ඇද වැටුණා. සාමාන්‍යයෙන් රාක්ෂයින්ට වෙනවා වගේ එයාවත් දූවිලිවලට කුඩු වෙන තුරු මම බලා සිටියා. ඒත් ඒ වෙනුවට එයා වේදනාවෙන් මූණ අකුළාගෙන ආපසු නැගිටින්න පටන් ගත්තා. එයාගේ වෙෆ් ඒප්‍රනය මැද වූ තුවාලය සුව වෙන්න ගත්තා.

"හොඳ උත්සහයක්, පුතෝ," එයා කිවුවා. "වැඩේ කියන්නේ මට හදවත් තුනක් තියෙනව නේ. නියම ආරක්ෂක ක්‍රමයක්."

එයා බා'බකියු උඳුනේ හැප්පුණා ම, අඟුරු හැමතැනම විසිරුණා. එකක් ඇනබෙත්ගේ මුහුණ ළඟට වැටෙද්දී, එයා හිරවුණු විලාපයක් පිට කළා. ටයිසන් එයාගේ බැමි ලිහාගන්න දඟලුවා, ඒත් ඒවා කඩන්න එයාගේ ශක්තිය පවා ප්‍රමාණවත් වුනේ නැහැ. මගේ යාළුවන්ට හිරිහැරයක් වෙන්න කලින් මේ සටන අවසන් කරන්න මට තිබුණා.

මම ගැරියන්ගේ වම් පපුවට දමා ඇන්නා. ඒත් එයා මහ හඬින් හිනාවුණා විතරයි. මම එයාගේ දකුණු බඩ මැදට ඇන්නා. ඒත් වැඩක් වැහැ. එයා පෙන්වූ ප්‍රතිචාරවලින් මට දැනුණේ මම ටෙඩී බෙයාර් කෙනෙකුට කඩුවකින් අනිනවා වගෙයි.

හදවත් තුනක්. නියම ආරක්ෂක ක්‍රමයක්. වරකට එක හදවතකට ඇනලා වැඩක් නැහැ...

මම ගේ ඇතුළට දිවුවා.

"බයගුල්ලා!" එයා කෑගැසුවා. "ආපහු ඇවිල්ලා හරි විදිහට මැරෙනවා!"

එහි සාලය සරසා තිබුණේ බිහිසුණු දඩයම් ජය සලකුණුවලින් - පුළුන් පිරවූ මුවෝ සහ මකර ඔළු, තුවක්කු කොපුවක්, ප්‍රදර්ශනයට තැබූ කඩු සමග දුන්නක් සහ ඊතල කොපුවක්.

ගැරියන් අතේ තිබුණු බා'බකියු ගෑරුප්පුවෙන් දමා ගැසුවා ම ඒක බොල් හඬක් නගමින් මගේ ඔළුව ළඟම බිත්තියේ වැදුණා. එයා ගෑරුප්පුව ගලවා ගත්තා. "ඔහේගෙ ඔළු බිත්තියේ ප්‍රදර්ශනයට තිබූ කඩු දෙකක් ඇදලා ගත්තා. "ඔහේගෙ ඔළු ගෙඩියත් ඔතනින් එල්ලෙන්ඩයි යන්නෙ, ජැක්සන්! ඔය ග්‍රිස්ලි වලහා ළඟින්!"

මට පිස්සු අදහසක් පහළ වුණා. රිප්ටයිඩ් අත ඇරිය මම බිත්තියේ තිබුණු දුන්න ඩැහැගත්තා.

ලෝකේ හිටපු නරකම දුනුවායා මමයි. මට කඳවුරේ තිබුණු ඉලක්කවල හරි මැදට කෙසේ වෙතත්, ඒ අහලකටවත් විදින්න පුළුවන් වෙලා නැහැ. ඒත් මට වෙන විකල්පයක් තිබුණේ නැහැ. මට කඩුවකින් මේ සටන දිනන්න හැකියාවක් නැහැ. මම නිවුන් ධනුර්ධයෝ, ආර්ටෙමිස්ට සහ ඇපලෝට යාඥා කළේ මේ වතාවට විතරක්වත් එයාලා මං ගැන අනුකම්පා කරයි කියන බලාපොරොත්තුවෙන්. 'අනේ, කාරුණාකරලා. මේ පාර විතරක්.'

මම හීයක් ඇම්ණුවා.

ගැරියන් මහ හඬින් හිනාවුණා. "මෝඩයා! එක කඩුවකින් වගේම එක ඊතලයකිනුත් වැඩක් නෑ."

කඩුව ඔසවාගත් එයා පහර දෙන්න දුවගෙන ආවා. මම පැත්තකට පිම්බුණා. එයාට හැරෙන්න ඉඩක් ලැබෙන්න කලින්, මම එයාගේ දකුණු පපුවේ පැත්තකට මගේ ඊතලය විද්දා. 'තම්ප්, තම්ප්, තම්ප්' හඬ නගමින් එය එයාගේ පපු තුන පසාරු කරගෙන ගොස් වම් පැත්තෙන් එළියට ඇවිත්, ග්‍රිස්ලි වලහාගේ නළලේ ඇමිණුනා.

ගැරියන් කඩු අත් ඇරියා. ආපසු හැරුණු එයා පුදුමයෙන් මගේ දිහා බලා සිටියා. "ඔහේට විදින්න බැහැ නේ. එයාලා මට කිවුවේ ඔහේට බැහැ කියලා..."

එයාගේ මුහුණ අප්‍රසන්න කොළ පාටකට හැරුණා. දණහිස් මතට ඇද වැටුණු එයා වැලිවලට කුඩු වී ගියා. අන්තිමේ දි එතැන ඉතිරි වුණේ ඊප්‍රන් තුනක් සහ අති විශාල කව්බෝයි බූට් ජෝඩුවක් විතරයි.

***

මම මගේ යාළුවන්ගේ බැමි ගැලෙව්වා. එරිතියන් මාව නවත්වන්න උත්සහ කළේ නැහැ. ඊට පස්සේ බා'බකියූවලින් බඩ කට පුරවාගත් මම ආර්ටෙමිස්ට සහ ඇපලෝට පූජාවක් ලෙස කෑම ගින්නට දැමුවා.

"ස්තූතියි, යාළුවනේ," මම කිවුවා. "මම ඔයාලට ණයයි."

අහසේ ඈතින් අකුණක් කෙටුවා. ඒ නිසා බර්ගර්වල පුවඳ හොඳට තියෙන්න ඇති කියලා මම හිතුවා.

"පර්සිට ජය වේවා!" ටයිසන් කිවුවා.



"දැන් මේ ගොපල්ලව ගැට ගහන්න අපිට පුළුවන් ද?" නිකෝ ඇහුවා.

"ඔව්!" ග්‍රෝවර් එකග වුණා. "මේ බල්ලත් තව පොඩ්ඩෙන් මාව මරනවා!"

තවමත් සැහැල්ලුවෙන් පික්නික් මේසයේ වාඩි වී සිටි එතිරියන් දිහා මම බැලුවා. ඕර්තස්, ඌගේ ඔළු දෙකම ගොපල්ලාගේ දණහිස් මත තබාගෙන සිටියා.

"ගැරියන්ට ප්‍රතිසංස්කරණය වෙන්න කොච්චර කාලයක් යයි ද?" මම එයාගෙන් ඇහුවා.

එරිතියන් උරහිස් ඇකිළුවා. "අවුරුදු සීයක්? දෙවිවරුන්ට ස්තූති වෙන්න. එයා වේගයෙන් ප්‍රතිසංස්කරණය වෙන කෙනෙක් නෙවෙයි. ඔයා මට කරේ ලොකු උදවුවක්."

"මීට ඉස්සරත් එයා වෙනුවෙන් මැරුණා කියලා ඔයා කිවුවා නේද," මට මතක් වුණා. "ඒ කොහොමද?"

"ඒ ජරා සතාට මම අවුරුදු දාස් ගාණක් තිස්සෙ වැඩ කරලා තියෙනවා. මමත් සාමාන්‍ය අර්ධ-ලෝහිතයෙක් වගේ පටන් ගත්තේ. ඒත් මගේ තාත්තා මට අමරණීය වෙන්න අවස්ථාවක් දුන්නාම මම පිළිගත්තා. ඒක තමයි මම කරපු ලොකුම ගොන්කම. දැන් මම මේ ගොවිපොළේ හිරවෙලා. මට මෙතැන දාලා යන්ඩ බැහැ. මෙතැනින් අස් වෙන්ඩත් බැහැ. මම කරන්නේ හරක් බලා ගන්න එකයි ගැරියන් පැටලෙන රණ්ඩුවලට සටන් කරන එකයි විතරයි. අපි දෙන්නා නිකං එකිනෙකාට බැඳිලා වගේ ඉන්නේ."

"සමහරවිට ඔයාට මේ දේවල් වෙනස් කරන්න පුළුවන් වෙයි," මම කිවුවා.

එරිතියන් ඇස් හීනි කරලා බැලුවා. "කොහොමද?"

"සත්තුන්ට කරුණාවන්ත වෙන්න. එයාලව හොඳට බලාගන්න. එයාලව කෑමවලට විකුණන එක නතර කරන්න. ඒ වගේම ටයිටන්ලා එක්ක ගනුදෙනු කරන එකත් නතර කරන්න."

එරිතියන් ඒ ගැන කල්පනා කර බැලුවා. "ඒක හොඳ වෙයි."

"සත්තුන්ට ඔයාගේ පැත්තට හරවා ගන්න. එතකොට එයාලා ඔයාට උදවු කරයි. ගැරියන් ආපහු ආවම, සමහරවිට මේ වතාවේ එයාට ඔයා ගැනත් වැඩ කරන්න වෙයි."

ඊරිතියන් දත් කියෙව්වා. "දත්. ඒක නම් මරු අදහස."

"අපි මෙතැනින් පිටවෙලා යන එක නතර කරන්න ඔයා උත්සහ කරන්නැ නේද?"

"ආපහු නෑ."

ඇනබෙත් එයාගේ තම ගිය මැණික් කටු පිරිමැදගත්තා. එයා තවමත් ඊරිතියන් දිහා බලා සිටියේ සැකෙන් වගෙයි. "ඔයාගේ ලොක්කා කිවුවා අපිට පරිස්සමෙන් ගමන යන්න කවුදෝ එයාට ගෙව්වා කියලා. කවුද ඒ?"

ගොපල්ලා කළේ උරහිස් ඇකිළීම විතරයි. "බාගදා ඔහේලව රවට්ටන්න එයා එහෙම කියන්න ඇති."

"එතකොට ටයිටන්ලා ගැන මොකද?" මම ඇහුවා. "නිකෝ ගැන එයාලට අයිරිස්-මැසේජ් එක යවලා ඉවරයි ද?"

"නැහැ. ගැරියන් ඒක කරන්න හිටියේ බා'බකියු එකෙන් පස්සේ. එයාලා කොල්ලා ගැන දන්නෙ නෑ."

නිකෝ සිටියේ මට රවාගෙනයි. එයත් එක්ක මොනවා කරන්න ද, මට තේරුණේ නැහැ. එයා අපි එක්ක යන්න කැමති වෙයි කියලත් මම හිතුවේ නැහැ. අනෙක් අතට, එයාට තනියම ඉබාගාතේ යන්න ඉඩ දෙන්නත් මට පුළුවන්කමක් තිබුණේ නැහැ.

"අපි අපේ ගවේෂණේ ඉවර කරන කල් ඔයාට මෙහෙට වෙලා ඉන්න පුළුවන්," මම එයාට කිවුවා. "එහෙම කරන එක පරිස්සම්."

"පරිස්සම්?" නිකෝ ඇහුවා. "මගේ පරිස්සම ගැන ඔයා කරදර වෙන්නෙ මොකටද? ඔයා තේ මගේ අක්කව මැරෙන්න ඇරියේ!"

"නිකෝ," ඇනබෙත් කතා කළා. "ඒක පර්සිගෙ වැරැද්ද නෙමෙයි. ඒ වගේම ත්‍රෝනොස්ට ඔයාව අල්ලගන්න ඕනැ වෙයි කියලා ගැරියන් කිවුවෙත් බොරුවට නෙමෙයි. ඔයා කවුද කියලා දැන ගත්තොත්, ඔයාව එයාගේ පැත්තට ගන්න එයා ඕනෑම දෙයක් කරයි."

"මම ඉන්නෙ කාගෙවත් පැත්තක නෙමෙයි. ඒ වගේම මම බයත් නැහැ."



"ඔයා බය වෙන්න ඕනැ," ඇනබෙත් කිවුවා. "ඔයාගේ අක්කට ඕනැ වෙන්නෙ නැති වෙයි-"

"ඔයාලා මගේ අක්කා ගැන වද වෙනවා නම්, එයාව ආපහු ගේන්න මට උදවු කරන්න!"

"ආත්මයක් වෙනුවෙන් ආත්මයක්?" මම ඇහුවා.

"ඔව්!"

"ඒත් ඔයාට උවමනා මගේ ආත්මය නෙමෙයි නම්-"

"මම ඔයාට කිසිම විස්තරයක් කියන්නෙ නම් නැහැ," එයා කඳුළු මැඩ ගන්න තදින් ඇහිපිය ගැහුවා. "ඒ වගේම මම එයාව ආපහු අරන් එනවාමයි."

"එයාව ආපහු අරන් එනවට බියන්කා නම් කැමති නැති වෙයි," මම කිවුවා. "ඒ විදිහට නම්."

"ඔයා එයාව දැනගෙන හිටියෙ නැහැ!" එයා කෑගැහුවා. "එයාට උවමනා මොනවද කියලා ඔයා කොහොමද දන්නේ?"

මම බා'බකියු උඳුනේ ගිනි දළු දිහා ඇහි පිය නොහෙළා බලා සිටියා. ඇනබෙත්ගේ අනාවැකියේ පේළියක් මගේ හිතට නැගුණා: *'භූත රජුගේ අතින් නුඹගේ නැගීම හෝ බැසීම සිදු වේවි.'* එයින් කියවුණේ මයිනස් ගැන වෙන්න ඕනැ. ඒ නිසාම එයා කියන දේවල් අහන්න එපා කියලා නිකෝට ඒත්තු ගන්වන්න මට ඕනැ වුණා. "අපි බියන්කාගෙන් ම අහලා බලමු."

එක පාරටම අහස අඳුරු වෙන්න ගත්තා වගෙයි පෙනුණේ.

"මම උත්සහ කරා," නිකෝ මුසල ලෙස කිවුවා. "එයා උත්තර දෙන්නෑ."

"ආයෙමත් උත්සහ කරන්න. මට හිතෙනවා මම මෙතැන ඉන්න නිසා එයා උත්තර දෙයි කියලා."

"එයා මොකටද එහෙම කරන්නේ?"

"මොකද එයා මට අයිරිස්-මැසේජ් එවපු නිසා," හදිසියේම ඒ ගැන විශ්වාසයක් දැනෙද්දි මම කිවුවා. "ඔයා කරන්න යන දේ ගැන මට අනතුරු අඟවන්න එයා උත්සහ කරා, එතකොට මට ඔයාව ආරක්ෂා කරන්න පුළුවන් නිසා."

නිකෝ ඔළුව හෙල්ලුවා. "ඒක කොහෙත්ම වෙන්න බැහැ."

"ඒ ගැන හොයාගන්න තියෙන්නේ එක ක්‍රමයයි. ඔයා කිවුව නේ ඔයා බය නැහැ කියලා." මම එරිනියත් වෙත හැරුණා. "අපිට වළක් ඕනෑ වෙනවා, හරියට මිනී වළක් වගේ එකක්. ඒ වගේම කෑම, බීම ටිකකුත්."

"පර්සි." ඇනබෙත් අනතුරු ඇඟෙව්වා. "මම නම් හිතන්නේ නැහැ මේක හොඳ."

"හරි එහෙනම්." නිකෝ කිවුවා. "මම උත්සහ කරලා බලන්නම්."

එරිනියත් රැවුල කැසුවා. "පිටිපස්සේ වැසිකිළි වළකට හාරපු එකක් තියෙනවා. අපිට ඒක පාවිච්චි කරන්ඩ පුළුවන්. සයික්ලොප්ස් කොල්ලෝ. කුස්සියේ තියෙන අයිස් පෙට්ටිය අරන් එන්ඩකෝ. මැරිච්ච එවුන් රූට් බියර්වලට කැමති ඇති කියලා මං හිතනවා."

# 10

# අපි මළවුන්ගේ සංදර්ශනයක් පැවැත්වූවා

අපි කළුවර වැටුණට පස්සේ, වැසිකිළි වළ ඉදිරිපිට තිබුණු අඩි විස්සක් දිග වළ ළඟ දී මළවුන් කැඳවීම කළා. කහ පාටින් පින්තාරු කරලා, හිනාවෙන මූණු ඇඳලා තිබුණු ඒ ටැංකිය මළවුන් කැඳවීමකට ගැළපෙන ගතියක් නම් පෙනුනේ නැහැ.

පුර හඳ පායා තිබුණා. අහස පුරා රිදී පාට වලාකුළු පාවී ගියා.

"මේ වෙද්දි මයිනස් එන්න ඕනෑ," නිකෝ නළල රැළි කරගෙන කිවුවා. "දැන් හොඳටම කරුවල වැටිල නේ."

"සමහරවිට එයා අතරමං වෙන්න ඇති." මම බලාපොරොත්තු සහගතව කිවුවා.

වළට රූට් බියර් සහ බා'බකියු දැමූ නිකෝ පෞරාණික ග්‍රීක බසින් මතුරන්න පටන් ගත්තා. එසැණින් ම කැලයෙන් ඇසුණු කුරුමිණියන්ගේ හඬ නැවතුණා. මගේ සාක්කුවේ තිබුණු ස්ටයිජියන් අයිස් බලු නළාව තව තවත් සීතල වෙනවා මගේ කකුලට දැනුණා.

"එයාව නවත්තන්නකෝ," ටයිසන් මට රහසින් කිවුවා.

මගේ හිතේ පැත්තක් ඒකට එකඟ වුණා. එය අස්වාභාවික දෙයක්. රෑ සුළඟ වඩාත් සීතලට සහ භයානක ලෙසට දැනුණා. ඒත් මට කිසිවක් කියන්න ඉඩ ලැබෙන්න කලින්, මුල්ම ආත්ම මතු වුණා. තෙවණැලි ගෙන්දගම් මුසු මීදුම පොළොවෙන් ඉහළට කාන්දු වුණා. එක තිල් පාට රුවක් වළ අද්දරට මිනිස් ස්වරූපවලට ගත වුණා. එක නිල් පාට රුවක් වළ අද්දරට ඇවිත් බිමට දණගසා ගත්තා.

Scanned with CamScanner

"එයාව නවත්තනවා!" ජප කිරීම මොහොතකට නතර කරමින් නිකෝ කිවුවා. "බීමට අවසර තියෙන්නෙ බියන්කාට විතරයි!"

මම රිප්ටයිඩ් ඇදලා ගත්තා. මගේ දිව්‍යමය ලෝකඩ තලය දකිද්දි අවතාර සාමූහික සු හඬක් පිට කරමින් පසුබැස්සා. ඒත් පළවෙනි ආත්මය නතර කරන්න පරක්කු වැඩි වුණා. එයා දැනටමත් සුදු ලෝගුවක් හැඳි, රැවුලක් ඇති පිරිමියෙකුගේ රුව ගනිමින් ඝන වී සිටියා. එයාගේ හිසේ රන් ශීර්ෂ පටියක් තිබුණා. එයා මළගිය කෙනෙක් වුණත් එයාගේ ඇස් ද්වේෂයෙන් ප්‍රාණවත් ව තිබුණා.

"මයිනස්!" නිකෝ කිවුවා. "ඔයා මොනවද කරන්නේ?"

"මට සමා වෙන්න, ස්වාමීනී," අවතාරය කිවුවත් එයාගේ කටහඬේ නම් කණගාටුවක් තිබුනේ නැහැ. "බිලි පූජාව කොච්චර සුවඳයි ද කියනවා නම්, මට රහ බලන්නැතුව ඉන්න බැරිවුණා." තමන්ගේ අත් පිරික්සා බැලූ එයා හිනාවුණා. "මාව ආපහු දකින්න ලැබිච්ච එක කොච්චර දෙයක් ද. මුළුමනින්ම වගේ ස්ථිර රූපයක්-"

"ඔයා පූජාව කඩාකප්පල් කරනවා!" නිකෝ විරෝධය පෑවා. "මෙතැනින්-"

මළගිය ආත්ම අන්තරාකාරී ලෙස දිප්තිමත් වී සැලෙන්න පටන් ගත්තා, එයාලව පාලනය කරගන්න නිකෝට නැවතත් මැතිරීම පටන් ගන්න සිදු වුණා.

"ඔව්, හරියට හරි, ස්වාමීනි," මයිනස් කිවුවේ සමච්චලෙන් වගෙයි. "ඔයා දිගටම ජප කරන්න. මම ආවේ ඔයාව රවට්ටන්න ඉඩ තියෙන බොරුකාරයින්ගෙන් ඔයාව ආරක්ෂා කරගන්න විතරයි."

එයා මගේ දිහාවට හැරුණේ හරියට මම එක ජාතියක කැරපොත්තෙක් වගෙයි. "පර්සි ජැක්සන්... අනේ, අනේ. සියවස් ගාණක් ගිහිල්ලත් පොසෙයිඩන්ගේ පුත්තු දියුණු වෙලා නම් නැහැ, නේද?"

මට එයාගේ මූණට දෙකක් අනින්න ඕනෑ වුණත්, මගේ අත නිකං ම එයාගේ මූණ හරහා යයි කියලා මට හිතුණා. "අපි හොයන්නේ බියන්කා ඩි ආන්ජෙලෝව," මම කිවුවා. "මෙතැනින් තොලොංචි වෙනවා."

අවතාරය කෙකර ගෑවා. "ඔයා එක වතාවක් මගේ මිනටෝර්ව කිසිම ආයුධයක් නැතුව, තනි අත් දෙකෙන් මැරුවා කියලා මම



දන්නවා. ඒත් ඊට වඩා නරක දේවල් ඔයා එනකල් වංගගිරියේ බලන් ඉන්නවා. ඩෙඩලස් ඔයාලට උදවු කරයි කියලා ඔයා ඇත්තටම හිතනව ද?"

අනෙක් ආත්ම කලබල වෙලා කැලඹෙන්න ගත්තා. එයාලව පාලනය කරගන්න ඇනබෙත්, එයාගේ කිණිස්ස අරන් මට උදවු වුණා. ග්‍රෝවර් කොයි තරම් බය වුණා ද කියනවා නම්, එයා ටයිසන්ගේ උරහිසක එල්ලුණා.

"ඩෙඩලස් ඔයාලා ගැන තඹ සතේකට මායිම කරන්නෑ, අර්ධ-ලෝහිතයිනේ," මයිනස් අනතුරු ඇඟෙව්වා. "ඔයාලට එයාව විශ්වාස කරන්න බැහැ. එයා මෙච්චරයි කියන්න බැරි තරම් වයසයි. ඒ වගේම කපටියි. එයා මිනී මැරුවා කියන වරදකාරී හැඟීම නිසා සැඩ පරුෂ වුණ, ඒ වගේම දෙවිවරුන්ගෙන් ශාප වැදුණ කෙනෙක්."

"මිනී මැරුවා?" මම ඇසුවා. "එයා කාවද මැරුවේ?"

"මාතෘකාව වෙනස් කරන්න හදන්නෙපා!" අවතාරය ගෙරෙව්වා. "ඔයා නිකෝට බාධා කරනවා. ඔයා උත්සහ කරන්නෙ එයා, එයාගේ අරමුණට යන එක අත් අරවන්න. මම එයාව අධිපතියෙක් කරවනවා!"

"ඔය ඇති, මයිනස්," නිකෝ අණ කළා.

අවතාරය අවඥාවෙන් බැලුවා. "ස්වාමීනී, මෙයාලා ඔයාගේ හතුරෝ. ඔයා එයාලට කන් දෙන්නෙපා! මට ඔයාව ආරක්ෂා කරන්න ඉඩ දෙන්න. මම අනිත් අයට කරා වගේ, එයාලවත් පිස්සු වට්ටන්නම්."

"අනිත් අය?" ඇනබෙත් හීල්ලුවා. "ඔයා කියන්නේ ක්‍රිස් රොඩ්‍රිගස්? ඒක කළේ ඔයා ද?"

"වංගගිරිය මගේ දේපොළක්," අවතාරය කිවුවා, "ඩෙඩලස්ගේ නෙවෙයි! ඒකට අනවසරයෙන් ඇතුළු වෙන එවුන්ව පිස්සු වට්ටන්න වටිනවා."

"යනවා යන්ඩ, මයිනස්!" නිකෝ තදින් කිවුවා. "මට මගේ අක්කව බලන්න ඕනෑ!"

අවතාරය, එයාගේ කේන්තිය යටපත් කරගත්තා. "එහෙමයි, ස්වාමීනී. ඒත් මං නොකිව්වයි කියන්නෙපා. ඔයාට මේ වීරයින්ව විශ්වාස කරන්න බැහැ."

එහෙම කියපු එයා මීදුමක් වෙලා වියැකුණා.

අනෙක් ආත්ම දඩබ්ඩියේ ඉදිරියට එන්න හැදුවත්, ඇනබෙත් සහ මම එයාලව ආපස්සට යැවුවා.

"බියන්කා, පෙනී සිටින්න!" නිකෝ හඬ නගා කිවුවා. එයාගේ මැතිරීම වේගවත් වෙද්දී මළගිය ආත්ම නොසන්සුන් ලෙස එහා මෙහා වුණා.

"දැන් කොයි වෙලාවෙ හරි," ග්‍රෝවර් කෙදිරුවා.

ඒ වෙලාවේ ගස් අතර රිදී පාට එළියක් දිලිසුණා - අනෙක් අයට වඩා දීප්තිමත් සහ ශක්තිමත් ලෙස පෙනුණු ආත්මයක්. එය ළඟට එද්දී, එයට එන්න ඉඩ දෙන්න කියලා මගේ හිත කිවුවා. වළ ළඟ දණ ගසා ගත් එය එයින් පානය කළා. ආපසු නැගිටිද්දී, එය බියන්කා ඩි ආන්ජෙලෝගේ අවතාර ස්වරූපය ගෙන තිබුණා.

නිකෝගේ මැතිරීම ඇනහිටියා. මම මගේ කඩුව පහත දැමුවා. අනෙක් ආත්ම වටේට රැස් වෙන්න පටන් ගත්තා, ඒත් බියන්කා අත් එසෙව්වා ම එයාලා කැලෑවට පසුබැස්සා.

"හෙලෝ, පර්සි," එයා කිවුවා.

එයාගේ පෙනුම පණපිටින් හිටිය කාලේ වගේමයි: එයාගේ ගත, කළු කොණ්ඩය මත පැත්තකට ඇල වුණු කොළ පාට තොප්පිය. එයාගේ මල්ලිගේ වගේම කළු ඇස් සහ ඔලිව් පාට හම. එයා ජීන්ස් එකකින් සහ රිදී පාට ජැකට්ටුවකින් - ආර්ටෙමිස්ගේ අඩයක්කාරියන්ගේ ඇඳුම් කට්ටලයෙන් සැරසී සිටියා. එයාගේ උරහිසේ දුන්නක් එල්ලෙමින් තිබුණා. එයා යාන්තමින් හිනා වෙද්දී, එයාගෙ මුළු රූපයම සැලුණා.

"බියන්කා," මම කිවුවා. මගේ කටහඬ ගොරෝසු වෙලා. එයාගේ මරණය ගැන මට කාලයක් තිස්සේ වරදකාරී හැඟීමක් දැනෙමින් තිබුණත්, එයාව මේ විදිහට මගේ ඉස්සරහ දකින්න ලැබෙද්දි ඒ හැඟීම පස් ගුණයකින් වැඩි වී දැනුණේ හරියට එයාගේ මරණය අද ඊයේ සිදු වුණා වගෙයි. එයා ජීවිතය පුදා පරාජය කළ ලෝකඩ යෝධයාගේ සුන්බුන් අතරේ එයාව සෙවූ හැටිත්, එයාගේ සලකුණක්වත් දකින්න නොලැබුණු හැටිත් මට මතක් වුණා.

"මට සමා වෙන්න," මම කිවුවා.

"ඔයා සමාව ඉල්ලන්න උවමනා නැහැ, පර්සි. ඒ තීරණය ගත්තේ මමයි. ඒ ගැන මම පසු තැවෙන්නෙ නැහැ."



"බියන්කා!" නිකෝ පැකිළෙමින් ඉදිරියට ආවේ මේ දැන් සිහිය ලැබුණු කෙනෙක් වගෙයි.

බියන්කා, එයාගේ සහෝදරයා වෙතට හැරුණා. එයාගේ මුහුණේ දුක්බර පෙනුමක් තිබුණේ හරියට එයා මේ මොහොත ගැන බයෙන් ඉඳලා වගෙයි. "හෙලෝ, නිකෝ. ඔයා සැහෙන උස ගිහිල්ලා නේ."

"ඇයි ඔයා මීට කලින් මට උත්තර දුන්නෙ නැත්තේ?" එයා ඇඩුවා. "මම මාස ගාණක් තිස්සෙ උත්සහ කරන්නේ!"

"ඔයා ඒක අත ඇරලා දායි කියලා මම බලාපොරොත්තු වුණේ."

"අත ඇරලා දාන්න?" නිකෝ කතා කළේ හිත බිඳිලා වගෙයි. "ඔයා කොහොමද එහෙම කියන්නේ? මම හදන්නේ ඔයාව බේරගන්න!"

"ඔයාට බැහැ, නිකෝ. මේක කරන්න එපා. පර්සි කිවුවා හරි!"

"නෑ! එයා තමයි ඔයාට මැරෙන්න ඇරියේ! එයා ඔයාගේ යාළුවෙක් නෙවෙයි."

බියන්කා, එයාගේ සහෝදරයාගේ මුහුණ අතගාන්න වගේ අත ඉදිරියට දිගු කළා, ඒත් එයා හැදිලා හිටියේ මීදුමෙන් නිසා පණ ඇති හමකට ළං වෙද්දි එයාගේ අත වාෂ්ප වුණා.

"ඔයා මං කියන දේ අහන්න ඕනෑ," එයා කිවුවා. "
හිතේ කෝන්තරයක් තියාගෙන ඉන්න එක හේඩිස්ගේ දරුවෙක්ට අනතුරුදායකයි. ඒක තමයි අපේ මාරක වැරැද්ද. ඔයා සමාව දෙන්න ඕනෑ. ඔයා ඒක කරනවා කියලා මට පොරොන්දු වෙන්න."

"මට බැහැ. කවදාවත් බැහැ."

"පර්සි ඉන්නෙ ඔයා ගැන කරදරෙන්, නිකෝ. එයාට පුළුවන් උදවු කරන්න. එයා ඔයාව හොයාගනී කියන බලාපොරොත්තුවෙන්, මම එයාට ඔයා කරන්න හදන දේ දකින්න සැලැස්සුවා."

"ඒ කියන්නෙ ඒක කළේ ඔයා," මම කිවුවා. "අර අයිරිස්-මැසේජ් එවුවේ ඔයා."

බියන්කා ඔළුව වැනුවා.

"ඇයි ඔයා මට උදවු නොකර එයාට කරන්නේ?" නිකෝ බෙරිහන් දුන්නා. "ඒක අසාධාරණයි!"

"ඔයා දැන් යථාර්ථයට කිට්ටුයි," බියන්කා එයාට කිවුවා. "ඔයා තරහෙන් ඉන්නේ පර්සි එක්ක නෙවෙයි, නිකෝ. මගෙත් එක්ක."

"නැහැ."

"මම ආර්ටෙමිස් දඩයක්කාරියක් වෙන්න ඔයාව දාලා ගියාට ඔයා තරහයි. මම මැරිලා, ඔයාව තනි කළාට ඔයා තරහයි. මට ඒ ගැන කණගාටුයි, නිකෝ. ඇත්තටම කණගාටුයි. ඒ වුණත් ඔයා ඒ තරහව නැති කරගන්න ඕනෑ. ඒ වගේම මගේ තෝරාගැනීම්වලට පර්සිට දොස් කියන එකත් නතර කරන්න. නැත්නම් ඒකෙන් ඔයාව විනාශ වෙයි."

"එයා හරි," ඇනබෙත් කතාවට මැදිහත් වුණා. "ක්‍රෝනොස් නැගිටිනවා, නිකෝ. එයා, එයාට පුළුවන් හැම කෙනාවම එයාගේ පැත්තට හරවගන්නවා."

"මට ක්‍රෝනොස්ගෙන් වැඩක් නෑ," නිකෝ කිවුවා. "මට මගේ අක්කව ආපහු ඕනෑ."

"ඔයාට ඒක ලබාගන්න බැහැ, නිකෝ," බියන්කා මෘදු ලෙස එයාට කිවුවා.

"මම තමයි හේඩීස්ගෙ පුතා! මට පුළුවන්."

"ඒකට උත්සහ කරන්න එපා," බියන්කා කිවුවා. "ඔයා මට ආදරෙයි නම්, ඒක කරන්න එපා..."

එයාගේ කටහඬ වියැකුණා. අපි වටේට නැවතත් මළගිය ආත්ම රැස් කන්න පටන් ගත්තා. එයාලා හිටියේ කැලඹිලා. එයාලගේ හෙවණැලි මාරු වුණා. එයාලගේ හඬවල් කෙඳිරුවා: *අනතුරක්!*

"ටාටරස් කැලඹෙනවා," බියන්කා කිවුවා. "ඔයාගේ බලය ක්‍රෝනොස්ගේ අවධානය ඇදලා ගන්නවා. මළවුන් ආපහු පාතාල ලෝකෙට යන්න ඕනෑ. නැවතිලා ඉන්න එක අපිට පරිස්සම් නැහැ."

"ඉන්න," නිකෝ කිවුවා. "අනේ-"

"ගුඩ් බායි, නිකෝ," බියන්කා කිවුවා. "මං ඔයාට ආදරෙයි. මම කියපු දේවල් මතක තියාගන්න."

එයාගේ රූපය සැලෙද්දී, අවතාර අතුරුදහන් වුණේ අපිව තනිවම කරලා හිතා මුණු ඇති වළ සහ පුර හඳ සමග තනි කරමින්.



* * *

එදා රෑම ආපහු ගමන පටන් ගන්න අපි කාටවත් හදිස්සියක් තිබුනේ නැහැ. ඒ නිසා අපි උදේ වෙනකල් ඉන්න තීරණය කළා. ග්‍රෝවර් සහ මම ගැරියන්ගේ සාලයේ වූ ලෙදර් කවිච්චි උඩට ඇද වැටුණා. ඒවා වංගගිරියේ නිදන මල්ලක නිදාගන්නවාට වඩා ගොඩක් සුව පහසු වුණා. ඒත් එයින් මගේ හීනවල බිහිසුණු බව අඩු වුනේ නම් නැහැ.

ටැම් කන්ද මුදුනේ අඳුරු මාලිගාවක් තුළ ලූක් සමග ඇවිද යනවා මම හීනෙන් දැක්කා. දැන් එය සැබෑ ගොඩනැගිල්ලක් - ගිය සීත සෘතුවේ මට දකින්න ලැබුණු විදිහේ අඩක් නිම කළ මායා දසුනක් නෙවෙයි. බිත්ති දිගේ තැබූ ගිනි අඟුරු බඳුන්වල කොළ පාටින් ගිනි ඇවිළුණා. පොළොව ඔප දැමූ කළු ගරුඬ ගලින් නිමවා තිබුණා. කොරිඩෝව තුළින් සීතල සුළඟක් හමා ගියා. අපිට ඉහළින්, විවෘත සිවිලිම තුළින් අහසේ අළු පාට කුණාටු වලාකුළු සුළි නංවනවා පෙනුණා.

ලූක් හිටියේ සටනකට සැරසිලයි. හමුදා මෝස්තරයේ කලිසමක් සහ සුදු ටී-ෂර්ට් එකක් හැඳ සිටි එයා ලෝකඩ උර තහඩුවක් පැලඳගෙන සිටියා. ඒ වුණත් එයාගේ කඩුව, බැක්බයිටර් එයා ළඟ තිබුනේ නැහැ - තිබුණේ හිස් කඩු කොපුව විතරයි. යුධ භටයන් සහ මකර ගැහැනු දුසිම් ගාණක් යුද්ධයකට සූදානම් වෙමින් සිටි විශාල අංගනයකට අපි ඇවිද ගියා. ලූක්ව දකපු හැටියේ උප දෙවිවරු සීරුවෙන් සිටගත්තා. එයාලා, තමන්ගේ කඩු සහ පලිහ එකට හැප්පුවා.

"වෙලාව හරි ද, මගේ උතුමාණෙනි?" ඩ්‍රැකනෙයි කෙනෙක් ඇසුවා.

"ඉක්මනටම," ලූක් පොරොන්දු වුණා. "ඔයාලගේ වැඩ කරගෙන යන්න."

"මගේ උතුමාණෙනි," ලූක්ට පිටුපසින් කටහඬක් ඇසුණා. කෙලි නම් එම්පොසා එයාට හිනාවක් පාමින් සිටියා. නිල් පාට ගවුමකින් සැරසී සිටි එයා දුෂ්ට ලෙස හැඩකාර වුණා. සැලෙමින් දිලිසුණ එයාගේ ඇස් වරකට තද දුඹුරු පාටටත්, තවත් වරක තනි රතු පාටටත් හැරුණා. කරලකට ගොතා පිට දිගට දමා තිබුණු එයාගේ කොණ්ඩය පන්දම්වල එළිය ඩැහැගන්නවා වගේ පෙනුණේ, හරියට තනි ගින්දරට හැරෙන්න උවමනාවෙන් වගෙයි.

Scanned with CamScanner

මගේ හදවත වේගයෙන් ගැහුණා. කෙලි මාව දැකලා. කලින් වතාවේ වගේ මෙවරත් මාව හීනයෙන් ඉවතට පන්නන තුරු මම බලා සිටියා. ඒත් මේ වතාවේ මාව එයාගේ සැලකිල්ලට හසු වුනේ නැහැ වගෙයි.

"ඔයාව මුණ ගැහෙන්න අමුත්තෙක් ඇවිත්," එයා ලූක්ට කිවුවා. කෙලි පසෙකට අඩිය තැබුවා. ඒ වෙලාවේ දකින්න ලැබුණු දෙයින් ලූක් පවා තිගැස්සුණා වගෙයි පෙනුණේ.

එයා ඉදිරියේ සිටගෙන සිටියේ රාක්ෂ කැම්පියි. එයාගේ කකුල් වටේ සර්පයෝ පිඹිමින් සිටියා. එයාගේ ඉණ වටේ සිටි සත්ත්ව ඔළු ගර්ජනා කළා. පිටට ගෙන තිබුණු කඩු විෂවලින් දිලිසුණා. වවුල් තටු දිග හැරගෙන සිටි එයා මුළු කොරිඩෝව ම වසාගෙන සිටියා.

"ඔයා," ලූක්ගේ කටහඬ යාන්තමින් වෙවුලුවා. "මං කිවුවේ අල්කාට්‍රාස්වලට වෙලා ඉන්න කියලා නේද."

කැම්පි ඇහිපිය ගැසුවේ උරගයින් වගේ හරස් අතටයි. එයා අර අමුතු ගොරවන භාෂාවෙන් කතා කළත්, මේ වතාවේ මගේ හිතේ පිටුපස කොණක් එය තේරුම් ගත්තා: *මම ආවේ සේවය කරන්නයි. මට පළිග න්න දෙනවා.*

"ඔයා හිර ගෙදර මුලාදෑනියෙක්," ලූක් කිවුවා. "ඔයාගේ රස්සාව-"

*මට උන්ව මරන්න ඕනෑ, කාටවත් මගෙන් පැන ගන්න බැහැ.*

ලූක් පසුබැවා. එයාගේ මුහුණේ පැත්තකින් දාඩිය බේරුණා. "බොහොම හොඳයි," එයා කිවුවා. "ඔයත් අපි එක්ක යමු. ඔයාට 'අරියඩ්නිගේ නූල' අරන් යන්න දෙන්නම්. ඒක ගොඩක් ගෞරවාන්විත කානාන්තරයක්."

කැම්පි තරු දෙසට පිඹිවා. කඩු කොපුවල දමා ගත් එයා ආපසු හැරී, යෝධ මකර කකුල් හප්පමින් ශාලාව පහළට ඇවිද ගියා.

"අපිට තිබුණේ එයාව ටාටරස්වලම දාලා එන්න," ලූක් කෙඳිරුවා. "එයා ලොකු අවුලක්. බලගතු වැඩියි."

කෙලි මෘදුව හිනා වුණා. "ඔයා බලයට බයවෙලා හරියන්නෑ, ලූක්. ඒක පාවිච්චි කරන්න!"



"අපි ඉක්මනට පිටත් වෙන තරමට හොඳයි," ලූක් කිවුවා. "මට මේක ඉවරයක් කරන්න ඕනේ."

"ආච්චි," කෙලි අනුකම්පාව පාමින් ලූක්ගේ අත දිගේ ඇඟිල්ලක් දිවෙව්වා. "ඔයාගේ පරණ කඳවුර විනාශ කරන එක අප්‍රසන්න වැඩක් කියලා ඔයාට හිතෙනවද?"

"මං එහෙම කිවුවේ නැතේ."

"ඒ ගැන දෙගිඩියාවෙන් ද ඉන්නේ?"

ලූක්ගේ මුහුණ දැඩි වුණා. "මගේ රාජකාරිය මං දන්නවා."

"ඒක හොඳයි," රාක්ෂණිය කිවුවා. "අපේ ප්‍රහාරක බල ඇණිය ප්‍රමාණවත් කියලා ඔයා හිතනවා ද? එහෙම නැත්නම් මට හෙකේට් මාතාවගෙන් උදවු ඉල්ලන්න වෙයි ද?"

"අපිට උවමනාවටත් වඩා තියෙනවා," ලූක් සැර පරුෂ ලෙස කිවුවා. "ගනුදෙනුව හොඳටම වගේ සම්පූර්ණයි. දැන් මට උවමනා එකම දේ මල්ලව පිටිය හරයා ප්‍රවේසමෙන් එගොඩ වෙන්න කතා කරගන්න විතරයි."

"මම්ම්," කෙලි කිවුවා. "ඒක නම් හිත් ගන්න දෙයක් වෙයි. වැඩ වැරදුනොත් ඔයාගේ කඩවසම් ඔළුව උලක ගහලා තියෙනවා දකින්න මම නම් කැමති වෙන එකක් නැහැ."

"මම වරද්ද ගන්නේ නැහැ. එතකොට ඔහේ, යක්ෂණියේ, ඔහේට කරන්න වෙන වැඩ නැද්ද?"

"ඔහ්, ඔව් නේ." කෙලි හිනාවුණා. "මම හොරෙන් කන්දීගෙන ඉන්න ඔයාගේ හතුරන්ගේ බලාපොරොත්තු විනාශ කරනවා. මම ඒක මේ දැන් කරන්නයි යන්නේ."

එයාගේ ඇස් එක එල්ලේම මගේ දිහාවට හැරුණා. නිය විහිදවූ එයා මගේ හීනය ඉරා දැමුවා.

හදිසියේ ම මම වෙනත් තැනකට ගොස් සිටියා.

සාගරයකට ඉහළින්, ගල් ප්‍රපාතයක් මත නැගී සිටි ගල් බලකොටුවක් මුඳුනේ මම සිටගෙන සිටියා. වයසක මනුස්සයා, ඩෙඩලස් වැඩ මේසයක් වෙත නැමී, යෝධ මාලිමාවක් වගේ දිසාමාන උපකරණයක් සමග හරඹ කරමින් සිටියා. එයා මම අන්තිම වතාවට දකිද්දි සිටියට වඩා අවුරුදු ගාණකින් වියපත් වෙලා වගෙයි පෙනුණේ.

Scanned with CamScanner

කුඩු වී සිටි එයාගේ දැත්වල ගැට මතු වී තිබුණා. පෞරාණික ග්‍රීක බසින් ශාප කළ එයා ඇස් වපර කර බැලුවේ හරියට හොඳින් ඉර පායා තිබුණත් එයාට එයාගේ කටයුත්ත පෙනෙන්නේ නැහැ වගෙයි.

"මාමේ!" කවුදෝ කතා කළා.

තිකෝගේ වයස ඇති පිරිමි ළමයෙක් ලී පෙට්ටියක් රැගෙන පඩිපෙළ දිගේ පිම්මේ දුව ආවා.

"හෙලෝ, පර්ඩික්ස්," වයසක මනුස්සයා කිව්වත් එයාගේ කටහඬේ නම් තිබුණේ නොසැලකිලිමත් බවක්. "ඔච්චර ඉක්මනට ඔයාගේ වැඩ කරලා ඉවර ද?"

"ඔව්, මාමේ. ඒවා හරි ලේසියි!"

ඩෙඩලස් තරහෙන් රවා බැලුවා. "ලේසියි? පොම්පයක් නැතුව වතුර කන්දක් ඉහළට නග්ගන ප්‍රශ්නෙ ලේසියි ද?"

"ඔන්, ඔව්! බලන්නකෝ!"

පෙට්ටිය බිම දැමූ පිරිමි ළමයා එහි වූ දේවල් අවුස්සන්න ගත්තා. එයින් පැපිරස් තීරුවක් පිටට ගත් එයා වියපත් නිමැවුම්කරුවාට රූප සටහන් හා විස්තර සටහන් වගයක් පෙන්වූවා. මට ඒවා ගැන මෙලෝ දෙයක් නොතේරුණත් ඩෙඩලස් ඉරිසියාවෙන් වගේ ඔළුව වැනුවා. "ඔව්. නරකම නැහැ."

"රජතුමා ඒකට ගොඩක් ආසා වුණා!" පර්ඩික්ස් කිවුවා. "එයා කිවුවා මම ඔයාටත් වඩා දක්ෂ කෙනෙක් වෙයි කියලා!"

"එයා එහෙමත් කිවුව ද?"

"ඒත් මම නම් එහෙම හිතන්නෑ. අම්මා මාව ඉගෙන ගන්න ඔයා ළඟට එවුවට මට හරිම සතුටුයි! මට ඔයා කරන හැම දෙයක්ම දැනගන්න ඕනෑ."

"ඔව්," ඩෙඩලස් කෙඳිරුවා. "එතකොට මං මැරිලා ගියාම, ඔයාට මගේ තැන ගන්න පුළුවන්, නෙහ්?"

පිරිමි ළමයාගේ ඇස් ලොකු වුණා. "අනේ නැහැ, මාමේ! ඒත් මම හිතහිතා හිටියේ... ඇයි ඉතින් මනුස්සයෙකුට මැරෙන්න වෙන්නෙ කියලා?"

නිමැවුම්කරුවා රවා බැලුවා. "ඒක තමයි ලෝකෙ හැටි, කොල්ලෝ. දෙවිවරු ඇර අනිත් හැමදේම මැරිලා යනවා."



"ඒත් ඇයි?" පිරිමි ළමයා ප්‍රශ්න කළා. "ඔයාට වෙනත් රූපයක් ඇතුළට ආත්මය කොටු කරගන්න පුළුවන් වුණොත්... හොඳයි, ඔයාගේ ස්වයංක්‍රිය යන්ත්‍ර ගැන මට කියලා තියෙනවා නේ, මාමේ. ගොන්නු, රාජාලියෝ, මකරු, ලෝකඩ අශ්වයෝ. ඇයි මනුස්සයෙක්ට ලෝකඩ ඇඟක් හදන්න බැරි?"

"නෑ, මගෙ කොල්ලෝ," ඩෙඩලස් තියුණු ලෙස කිවුවා. "ඔයා විකාර හිතනවා. එහෙම දෙයක් කරන්න බැහැ."

"මම නම් එහෙම හිතන්නෑ," පර්ඩික්ස් ස්ථිර ලෙස කිවුවා. "පොඩි මායාවක් පාවිච්චි කරලා-"

"මායාවක්? බාහ්!"

"ඔව්, මාමේ! මායා සහ යන්ත්‍ර විද්‍යාව එකතු කරලා - මනුස්සයෙක් වගේම පෙනුම තියෙන, ඊටත් වඩා හොඳ ඇඟක් හදන්න කෙනෙක්ට පුළුවන්. මං ඒ ගැන සටහන් ටිකක් හදලා තියෙනවා."

එයා වයසක මනුස්සයා අතට රෝල් කළ, ගනකම් ලියවිල්ලක් දුන්නා. ඩෙඩලස් එය දිග ඇරගෙන දිගු වේලාවක් කියෙව්වා. එයාගේ ඇස් පටු වුණා. පිරිමි ළමයා දිහාවට බැල්මක් හෙළූ එයා, ඊට පස්සෙ ලියවිල්ල ආපසු ඔතා, උගුර පෑදුවා. "ඒක කවදාවත් වැඩ කරන්නෙ නැති වෙයි, මගෙ කොල්ලෝ. තව ටිකක් ලොකු වුණාම ඔයාට තේරෙයි."

"එහෙනම් මම අර තරු මාලිමාව හදන්න ද, මාමේ? ඔයාගේ හන්දි ආයෙමත් ඉදිමිලා ද?"

වයසක මනුස්සයාගේ හනු තද වුණා. "එපා. ස්තුතියි. දැන් ඇයි ඔයා මෙතැනින් යන්නැත්තේ?"

වයසක මනුස්සයාගේ කේන්තිය පර්ඩික්ස්ට තේරුනේ නැහැ වගෙයි. එයාගේ බඩු මුට්ටු ගොඩෙන් ලෝකඩ කුරුමිණියෙක්ව ඩැහැගත් පිරිමි ළමයා කුලුන අද්දරට දිවුවා. කුලුනේ ගැටිය වටා සාදා තිබුණු කොට බැම්ම යාන්තමින් එයාගේ දණහිස් උසට තිබුණා. සුළඟ තදින් හමමින් තිබුණා.

පැනයට යන්න එයාට කියන්න මට ඕනෑ වුණා. ඒත් මගේ කටහඬ වැඩ කළේ නැහැ.

කුරුමිණියාගේ දූනු පටි කරකැවූ පර්සි ජැක්සන් එය අහසට මුදා හැරියා. තටු විහිදවූ එයා ගුමු හඬ නගමින් ඈතට පියඹා ගියා. පර්ඩික්ස් සතුටින් හිනාවුණා.

"මට වඩා බුද්ධිමත්." ඩෙඩලස් මිමිණුවේ පිරිමි ළමයාට නෑසෙන තරම් මෘදු හඬින්.

"ඔයාගේ පුතා පියාඹන්න ගිහින් මැරුණා කියන කතාව ඇත්ත ද, මාමේ?. මං අහලා තියෙනවා ඔයා එයාට සද්දන්න තටු දෙකක් හදලා දුන්නලු. ඒත් ඒවා වැඩ කළේ නැතිලු." *

ඩෙඩලස්ගේ අත් මිට මෙළවුණා. "මගේ තැන ගන්ඩ," එයා කෙඳිරුවා.

වේගයෙන් හමා යන සුළඟ පිරිමි ළමයාගේ ඇඳුම් ගස්සමින්, කොණ්ඩය අවුස්සමින්, එයා වටේ දුවවුණා.

"මමත් පියාඹන්න ආසයි," පර්ඩික්ස් කිවුවා. "මම කැඩෙන්නැතුව, හරියට වැඩ කරන තටු දෙකක් මට හදා ගන්නවා. මට ඒක කරන්න පුළුවන් වෙයි කියලා ඔයා හිතනව ද?"

සමහරවිට මට හීනය තුළින් තවත් හීනයක් පෙනුණා වෙන්න ඇති. ඒත් එක්වරම මට දකින්න ලැබුණේ ඩෙඩලස් අසල ගුවනේ මතු වූ ඔළු දෙකේ දෙවියා ජානුස් රිදී යතුරක් අතින් අතට මාරු කරමින් හිනාවෙන හැටියි. *'තෝරගන්න,'* එයා වයසක නිමැවුම්කරුවාට කෙඳිරුවා. *'තෝරගන්න.'*

ඩෙඩලස් පිරිමි ළමයාගේ ලෝහ කුරුමිණියෙක් අතට ගත්තා. නිමැවුම්කරුවාගේ වියපත් ඇස් ක්‍රෝධයෙන් රතු වී තිබුණා.

"පර්ඩික්ස්." එයා කතා කළා. "අල්ල ගන්න."

එයා පිරිමි ළමයා දිහාවට ලෝකඩ කුරුමිණියා විසි කළා. සතුටින් පිනා ගිය පර්ඩික්ස් එය අල්ලා ගන්න උත්සහ කළත්, ඒක එයා පසු කර ඈතට විසි වුණා. කුරුමිණියාව ගුවනට විසි වෙද්දි පර්ඩික්ස් ඕනෑවටත් වඩා ඈතට නැමුණා. සුළඟ එයාව අල්ලා ගත්තා.

එයා වැටෙද්දි කොහොම හරි කුළුනේ ගැටිය අල්ල ගන්න එයාට හැකි වී තිබුණා. "මාමේ!" එයා බෙරිහන් දුන්නා. "මට උදව් කරන්නෝ!"



වයසක මනුස්සයාගේ මුහුණ හැඟීම් විරහිත වෙස් මුහුණක් බවට පත් වී තිබුණා. එයා උන් තැනින් අඟලක්වත් සෙලවුණේ නැහැ.

"යන්න, පර්ඩික්ස්," ඩෙඩලස් මෘදුව කිවුවා. "ඔයාගෙම තටු දෙකක් හදාගන්න. ඉක්මන් කරන්න."

"මාමේ!" ග්‍රහණය බුරුල් වෙද්දි පිරිමි ළමයා කෑගැසුවා. එයාව මුහුදට ඇද වැටුණා.

මොහොතකට එතැන සොහොන් පිටියක් තරම් නිහඬ වුණා. ජානුස් දෙවියා සැලෙමින් දිලිසී, වුත වුණා. ඒත් එක්කම අකුණකින් අහස දෙදුරුම් කෑවා. ගැහැනු කෙනෙකුගේ දැඩි කටහඬක් ඉහළින් ඇසුණා: *'නුඹට ඒ වෙනුවෙන් වන්දි ගෙවන්න වේවි, ඩෙඩලස්.'*

ඒ කටහඬ මම මීට කලින් අහලා තිබුණා. ඒ ඇනබෙත්ගේ අම්මා: ඇතිනා.

ඩෙඩලස් ඉහළ දිව්‍ය ලෝකට දිහාවට රවුවා. "මම හැම වෙලාවෙම ඔයාට ගෞරව කළා, අම්මේ. ඔයාගේ මාර්ගය අනුගමනය කරන්න මම හැමදේම කැප කළා."

*'ඒ වුණත් පිරිමි ළමයාටත් මගේ ආශිර්වාදය දීලා තිබුණා. ඒත් නුඹ එයාව මැරුවා. ඒ වෙනුවෙන්, නුඹ වන්දි ගෙවන්න ඕනෑ.'*

"මම වන්දි ගෙවලා ගෙවලා තියෙන්නේ!" ඩෙඩලස් ගෙරෙව්වා. "මට හැමදේම නැති වුණා. මට පාතාල ලෝකෙ විඳවන්න වෙයි, කිසිම සැකයක් නෑ. ඒත් ඒ අතරතුර කාලේ..."

පිරිමි ළමයාගේ ලියවිල්ල අහුලා ගත් එයා, මොහොතක් එය අධ්‍යයනය කරලා, ඊට පස්සෙ ඒක එයාගේ කබා අත ඇතුළට දමාගත්තා.

*'නුඹ තේරුම් ගන්නෙ නෑ,'* ඇතිනා තපුරු ලෙස කිවුවා. *'නුඹ දැනුත්, සදාකාලයටමත් වන්දි ගෙවාවි.'*

එක් වරම ඩෙඩලස් වේදනාවෙන් බිමට ඇද වැටුණා. එයාට දැනුණු දේ මටත් දැනුණා. මගේ බෙල්ල වටේ තියුණු පිළිස්සුම් වේදනාවක් පැතිර ගියේ ලෝදියෙන් සෑදුණු කර පටියක් එතෙනවා වගෙයි - එයින් මගේ හුස්ම පවා නැවතී, සෑම දෙයක්ම අඳුරු වුණා.

***

මම කළුවරට ඇස් ඇරිද්දි, මගේ අත් බෙල්ල වටේ තදින් එති තිබුණා.

"පර්සි?" අනෙක් සෝෆාවේ සිට ග්‍රෝවර් කතා කළා. "ඔයා හොඳින් ද?"

මම, මගේ හුස්ම ගැනීම සන්සුන් කරගත්තා. කොහොම උත්තර දෙන්න ද, මට විශ්වාසයක් තිබුනේ නැහැ. අපි හොයමින් යන මනුස්සයා, ඩෙඩලස්, තමන්ගේ ම ඥාති පුතාව මරනවා මට මේ දැන් දකින්න ලැබුණා. ඉතින් මම හොඳින් වෙන්නෙ කොහොමද? රූපවාහිනිය ක්‍රියාත්මක කර තිබුණා. නිල් පාට එළියක් කාමරය තුළ පැතුණා.

"කියද- කියද දැන් වෙලාව?" මම බැරැඩි හඬින් ඇසුවා.

"පාන්දර දෙකයි." ග්‍රෝවර් කිව්වා. "මට නින්ද ගියේ නැහැ. ඉතින් මම නේචර් චැනල් එක බලබලා හිටියේ." එයා නහය ඉහළට ඇද්දා. "මට ජුනිපර් නැතුව පාළුයි."

මම නිදිමත පහ කරගන්න ඇස් පොඩි කළා. "ඔව්, හොඳයි... ඔයාට ඉක්මනට ම එයාව ආපහු දකින්න ලැබෙයි."

ග්‍රෝවර් දුක්බරව ඔළුව හෙල්ලුවා. "අද දවස මොකක්ද කියලා දන්නව ද, පර්සි? මමත් ඒක දැක්කෙ දැන් ටී.වී එකෙන්. අද ජූනි දහතුන් වෙනිදා. අපි කඳවුරෙන් පිටවෙලා දවස් හතක් ගිහින්."

"මොනවා?" මට කියවුණා. "ඒක වෙන්න බැහැ."

"වංගගිරියෙදි කාලය වේගයෙන් ගත වෙනවා," ග්‍රෝවර් මට සිහිපත් කළා. "ඔයයි ඇනබෙතුයි මුලින් ම පහළට ආව වෙලාවේ, ඔයා හිතුවේ ඔයාලා ගිහින් හිටියේ විනාඩි තුන හතරයි කියලා, නේද? ඒත් එනකොට පැයක් ම ගිහිල්ලා තිබුණා."

"ඔන්," මම කිව්වා. "හරි." ඒ වෙලාවේ එයා කියන්නේ මොනවා ගැන ද කියලා මට ටිකෙන් ටික තේරුම් ගියා. "විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලෙන් ඔයාට දුන්න කාලය."

රූපවාහිනී දුරස්ථ පාලකය කටේ ගසාගත් ග්‍රෝවර් එහි යටි කෙළවර කාගෙන කාගෙන ගියා. "මගේ කාලය ඉවරයි," කටින් එකක් ප්ලාස්ටික් පුරවගෙන එයා කිව්වා. "මම ආපහු ගිය හැටියේ ම, එයාලා මගේ 'සොයන්නෙකුගේ බලපත්‍රය' අරගනී. මට ආයේ කවදාවත් එළියට යන්න අවසර නැතිවෙයි."



"අපි එයාලට කතා කරලා බලමු," මම කිව්වා. "එයාලගෙන් තව කල් ඉල්ලගමු."

ග්‍රෝවර් කටේ තිබුණු ඒවා ගිල දැමුවා. "එයාලා කවදාවත් ඒක කරන එකක් නෑ. මේ ලෝකය මැරිලා යනවා, පර්සි. ඔයා අද කරපු දේ - ගැරියන්ගෙන් ගොවිපොළ සත්තු බේරගත්ත එක - ඒක නම් පුදුමාකාරයි. ම- මටත් ඔයා වගේ වෙන්න තිබුණා නම්."

"හේයි," මම කිව්වා. "එහෙම කියන්නෙපා. ඔයත් වීරයෙක් තමයි-"

"නෑ, මම එහෙම නෑ. මම දිගින් දිගටම උත්සහ කරනවා, ඒත්..." එයා සුසුමක් හෙළුවා. "පර්සි, පෑන්ව හොයාගන්නෙ නැතුව ආපහු කඳවුරට යන්න මට බැහැ. මට බැහැ. ඔයාට ඒක තේරෙනවා නේද? මේක කරගන්න බැරිවුනොත් මට ජුනිපර්ට මූණ දෙන්න බැහැ. මට අඩු තරමේ මටම වත් මූණ දෙන්න බැහැ."

එයාගේ කටහඬේ කොයි තරම් කණගාටුවක් තිබුණා ද කියනවා නම්, එයා කතා කරනවා අහන් ඉන්න එකත් වේදනාවක් වුණා. අපි එක්ව ගොඩක් දේවල්වලට මුහුණ දී තිබුණත්, එයා මේ තරමට හිතින් වැටිලා ඉන්නවා මම දැකලා තිබුනේ නැහැ.

"අපි මොකක් හරි හොයාගමු," මම කිව්වා. "ඔයා පැරදිලා නැහැ. ඔයා තමයි චැම්පියන් එළු කොල්ලා, හරි ද? ජුනිපර් ඒක දන්නවා. ඒ වගේම මමත් දන්නවා."

ග්‍රෝවර් ඇස් පියාගත්තා. "චැම්පියන් එළු කොල්ලා," එයා දුබල ලෙස කෙඳිරුවා.

එයා නින්දට වැටී සෑහෙන වෙලාවකට පසුවත්, මම අවදියෙන්, 'නේචර්' නාලිකාවේ නිල් එළිය ගැරියන්ගේ බිත්ති මත එල්ලා තිබුණු සත්ත්ව ඔළු පිස දමන හැටි බලා සිටියා.

***

පසුදා උදෑසන හරක් මුර වැට වෙත ගිය අපි සමුගැනීම් කළා.

"නිකෝ, ඔයාටත් අපිත් එක්ක එන්න පුළුවන්," මම නොහිතා ම කිව්වා. මං හිතන්නේ ඒ වෙලාවේ මම කල්පනා කරමින් ඉන්න ඇත්තේ මට දකින්න ලැබුණු හීනයත්, පුංචි කොල්ලා පර්ඩික්ස් මට කොයි තරම් නිකෝව සිහිපත් කරා ද කියන කාරණයත් ගැනයි.

එයා ඔළුව හෙල්ලුවා. යක්ෂ ගොවි ගෙදර දි අපි කවුරුවත් හොඳින් නිදාගන්න ඇති කියලා මම හිතන්නෙ නැහැ. ඒ වුණත් අපි කාටත් වඩා නිකෝගේ පෙනුම නරක වුණා. එයාගේ ඇස් රතු වෙලා, මූණ හුණු වගේ සුදුමැලි වෙලා තිබුණා. එයා ඇඟ වටේ ඔතාගෙන සිටි කළු ලෝගුව ගැරියන්ගේ එකක් වෙන්න ඇති. මොකද ඒක වැඩුණු පිරිමියෙකුට වුණත් ප්‍රමාණ තුනකින් විතර ලොකු එකක්.

"මට කල්පනා කරන්න කාලයක් ඕනෑ." එයා මගේ ඇස් දිහා බැලුවේ නැති වුණත් එයා තවමත් තරහෙන් ඉන්න බව එයාගේ කටහඬින් මට තේරුණා. එයාගේ සහෝදරිය එයාට කතා නොකර මට විතරක් කතා කරන්න පාතාල ලෝකයෙන් පිටතට ආව එක එයාට ඉවසගන්න බැරිවෙලා වගෙයි පෙනුණේ.

"නිකෝ." ඇනබෙත් කතා කළා. "බියන්කාට ඕනෑ ඔයා හොඳින් ඉන්නවා දකින්න විතරයි."

එයා නිකෝගේ උරහිස මත අතක් තැබුවා, ඒත් අත ගසා දැමූ එයා පාර දිගේ ගොවි ගෙදර පැත්තට හෙමින් හෙමින් යන්න ගියා. සමහරවිට මේක මම හිතින් මවාගත් දෙයක් වෙන්නත් ඇති, ඒ වුණත් මට පෙනුණේ එයා ඇවිදගෙන යද්දි උදෑසන මීදුමත් එයාගේ ඇලී ඉදිරියට යනවා වගෙයි.

"මට එයා ගැන බයයි," ඇනබෙත් මට කිවුවා. "එයා ආයෙමත් මයිනස්ගේ අවතාරෙට කතා කරන්න පටන් ගත්තොත්-"

"එයාට කරදරයක් වෙන්නෙ නැතිවෙයි," ඒරිතියන් පොරොන්දු වුණා. ගොපල්ලා හොඳින් පිරිසිදු වී සිටියා. අලුත් කලිසමකින් සහ පිරිසිදු කමිසයකින් සැරසී සිටි එයා රැවුලත් පිළිවෙළකට කොට කර තිබුණා. ගැරියන්ගේ බූට් දෙක එයා පැලඳගෙන සිටියා. "කොල්ලට කැමති කාලයක් මෙහෙ නතර වෙලා, හිත එක්කාසු කරගන්න පුළුවන්. එයාගේ පරිස්සම ගැන මම පොරොන්දු වෙන්නම්."

"එතකොට ඔයා මොනවද කරන්න යන්නේ?" මම ඇහුවා.

ඒරිතියන් ඔර්තස්ගේ එක නිකටක් යට කසා, ඊට පස්සෙ අනෙක් නිකට යටත් කැසුවා. "දැන් ඉඳන් ගොවිපොළේ කටයුතු ටිකක් වෙනස් වෙන්ඩයි යන්නේ. ආයෙත් නම් පූජනීය හරක් මසට මරන්නෑ. ඒ වෙනුවට සෝයා බෝංචි පස්තෑල හදන්ඩ මං හිතන් ඉන්නේ. ඒ වගේම මම අර මස් කන අශ්වයෝ එක්කත් යාළු වෙනවා. බාගදා ඊළඟ සැරේ රේස් එකට යන්ඩත් පුළුවන් වෙයි."



ඒ අදහස ගැන හිතද්දිත් මාව වෙවුලා ගියා. "හොඳයි, එහෙනම් සුබ පැතුම්."

"ඔව්." ඒරිතියන් තණ ගස් අතරට කෙළ ගැසුවා. "මට පේන්නෙ, දැන් ඔහේලා ඩෙඩලස්ගේ වැඩපොළ හොයන්ඩයි යන්නේ?"

ඇනබෙත්ගේ ඇස් දැල්වුණා. "ඔයාට පුළුවන් ද අපිට උදවු කරන්න?"

ඒරිතියන් තරක් මුර වැට දිහා බලා සිටියා. ඩෙඩලස්ගේ වැඩපොළ ගැන මාතෘකාව එයාව අපහසුවට පත් කළා කියලා මට හැඟුණා. "ඒක තියෙන්නේ කොහෙද කියලා මං දන්නෙ නෑ. බාගදා හෙෆාස්ටස් නම් දන්නවා ඇති."

"හේරා කිවුවෙත් ඒක තමයි." ඇනබෙත් එකඟ වුණා. "ඒත් අපි කොහොමද හෙෆාස්ටස්ව හොයාගන්නේ?"

ඒරිතියන්. එයාගේ කමිස කොලරය යටින් යමක් ඇදලා ගත්තා - රිදී මාලයකට ඇමිණූ මටසිලුටු රිදී තැටියක්. එය මැද ඇඟිලි සලකුණක් වගේ එබුමක් තිබුණා. එයා ඒක ඇනබෙත් අතට දුන්නා.

"හෙෆාස්ටස් ඉඳලා හිටලා මෙහෙ එනවා." ඒරිතියන් කිවුවා. "සත්තුන්ව හදාරනවා. ඒ විදිහේ යාන්ත්‍රික එවුන්ව හදන්ඩ. අන්තිම වතාවේ, මම- අන්, එයාට උදවුවක් කළා. මගේ තාත්තා ඒරීස්ටයි, ඇෆ්‍රොඩයිට්ටයි පුංචි උගුලක් අටවන්න එයාට ඕනෑ වුණා. එයා මට කළගුණ සැලකීමක් විදිහට ඔය මාලේ දුන්නා. කිවුවා මට කවදා හරි එයාව හොයාගන්ඩ ඕනෑ වුනොත්, ඔය තැටිය මාව එයාගේ කම්මලට අරන් යයි කියලා. හැබැයි එක පාරයි."

"ඉතින් ඔයා මේක මට දෙනව ද?" ඇනබෙත් ඇහුවා.

ඒරිතියන් රතු වුණා. "මට කම්මල් බලන්ඩ ඕනෑ නැහැ, මිස්. මෙහෙ කරන්ඩ ඇති පදම් වැඩ තියෙනවා. ඔය බොත්තම ඔබන්ඩකෝ, ඊට පස්සේ ඔයාලව හරි පාරට වැටෙයි."

ඇනබෙත් බොත්තම එබුවාම තැටිය පණ ගැසුවා. ලෝහමය කකුල් අටක් එයින් පිටතට වැඩුණා. ඇනබෙත් යටි ගිරියෙන් කෑගසමින් ඒක බිම දැමුවේ ඒරිතියන්වත් අන්ද මන්ද කරමින්.

"මකුළුවෙක්!" ඇනබෙත් බෙරිහන් දුන්නා.

"එයා, මේ, මකුළුවන්ට ටිකක් බයයි," ග්‍රෝවර් පැහැදිලි කළා. "ඇතිනයි අරච්නෙයි අතරෙ තිබුණ අර පරණ කෝන්තරේ නිසා."

"ඔන්." එරිතියන් තරමක් අපහසුවට පත්වුණා වගෙයි. "සමා වෙන්න, මිස්."

හරක් මුර වැට වෙත දිවූ මකුළුවා යකඩ පොලු අතරින් රිංගා නොපෙනී ගියා.

"ඉක්මන් කරන්න," මම කිවුවා. "ඌ අපි එනකල් බලන් ඉන්නෙ නැති වෙයි."

ඇනබෙත්ට ඌ පස්සෙ යන්න කිසිම උවමනාවක් තිබුනේ නැහැ. ඒ වුණත් අපිට වෙන කරන්න දෙයක් තිබුනෙත් නැහැ. අපි එරිතියන්ට සමු දුන්නා. ටයිසන් හරක් මුර වැට වළෙන් පිටට ඇදලා ගත්තට පස්සේ අපි ආයෙමත් වංගගිරියට බැස්සා.

***

යාන්ත්‍රික මකුළුවා ව ලණුවකින් බැඳගත්තෙ නැත්තෙ අපරාදෙ කියලා මට හිතුණා. ඌ උමං තුළින් දුවපු වේගයට, බොහෝමයක් වෙලාවට මට ඌව දකගන්නවත් ලැබුනේ නැහැ. ටයිසන්ගේ සහ ග්‍රෝවර්ගේ සුපිරි කන් ඇසීම නොතිබෙන්න, ඌ කොහේ ගියා ද කියලා අපිට කවදාවත් හොයාගන්න බැරි වෙනවා.

කිරි ගරුඬ උමගක් තුළින් දිවූ අපි, ඒ වේගයෙන් ම වම් පැත්තට හැරෙද්දි තව පොඩ්ඩෙන් ආගාධයකට ඇද වැටෙනවා. ටයිසන් මාව අල්ලාගෙන, වැටෙන්න තොදී ආපස්සට ඇදලා ගත්තා. උමග අපට ඉදිරියෙන් නොකඩවා පැතිරී තිබුණත්, අපි සිටි තැන සිට අඩි සියයක් විතර යන තුරු පොළොවක් තිබුනේ නැහැ. තිබුණේ ආගාධය වසා ගත් අන්ධකාරය සහ සිවිලිමේ සවි කළ යකඩ ඉණිමං පෙති පේළියක් විතරයි. යකඩ පොල්ලෙන් පොල්ලට ලෝහමය මකුළු දැල් විදිමින් මකුළුවා එය හරහා දුරෙන් අඩක් ම ගොස් තිබුණා.

"වඳුරු පොලු," ඇනබෙත් කිවුවා. "මට මේක නම් නියමෙට කරන්න පුළුවන්."

පළවෙනි ඉණී පෙතේ එල්ලුණු එයා පැද්දෙමින් එකිනෙකට මාරු වෙමින් ඉදිරියට යන්න පටන් ගත්තා. එයා චූට්ටං මකුළුවන්ට පණ බයයි; හැබැයි වඳුරු පොලුවල එල්ලිලා ගිහින් ඇදගෙන වැටිලා මැරෙන්න කිසිම බයක් නැහැ. අනේ මන්දා.



අනෙක් පැත්තට ගිය ඇනබෙත් මකුළුවා පස්සෙ දිවුවා. මම එයාව ලුහුබැන්දා. අනෙක් පැත්තට ගියා ම, මට දකින්න ලැබුණේ ග්‍රෝවර්ව කරේ එල්ලාගෙන ටයිසන් එන හැටියි. ලොකු යාළුවා පැද්දීම් තුනකින් මෙගොඩ වුණා. ඒක හොඳයි කියලා මට හිතුණේ එයා මේ පැත්තට පය ගහපු හැටියේ ම එයාගේ බරට අන්තිම ඉණී පෙත ගැලවුණු නිසයි.

ඉදිරියට ම ගිය අපි උමග තුළ කඩා වැටුණු ඇටසැකිල්ලක් පසු කළා. කලිසමක, සැහැල්ලු කමිසයක සහ ටයි පටියක කඩමාලුවලින් එය සැරසී තිබුණා. මකුළුවා වේගය අඩු කළේ නැහැ. එක් වරම මාව ලී කෑලි ගොඩක් උඩ ලිස්සුවා. ඒත් මම ඒවාට විදුලි පන්දම් යොමු කර බලද්දි දකින්න ලැබුණේ ඒවා පැන්සල් බවයි - එතැන දෙකට කැඩුණු පැන්සල් සිය ගාණක් තිබුණා.

උමග විශාල කාමරයකට විවර වුණා. අති දීප්තිමත් විදුලි එළියක් අපි මතට වැටුණා. මගේ ඇස් එයට හුරු වුණාට පස්සේ මුලින් ම මගේ සැලකිල්ලට හසු වුණේ ඇටසැකිලියි. ඒවා දුසිම් ගාණක් අපි වටා පොළොවේ විසිරී තිබුණා. පරණ ඒවා සුදට හැරිලා. අලුත් ඒවා වඩාත් අප්පිරියා සහගත වුණා. ඒවා ගැරියන්ගේ ඉස්තාල තරමට ගඳ ගැසුවේ නැති වුණත්, ඊට සැහෙන කිට්ටු වුණා.

මට රාක්ෂණියව දකින්න ලැබුණේ ඒ වෙලාවෙයි. කාමරයේ අනෙක් කෙළවරේ වූ දිලිසෙන වේදිකාවක් මත එයා සිටගෙන සිටියා. එයාට සද්දන්ත සිංහ කයක් සහ ගැහැනු මුහුණක් තිබුණා. කොණ්ඩය තදින් ආපස්සට ඇද ගුලියකට ගැට ගසාගෙන, ඔතැවටත් වඩා මෙක්-අප් තවරාගෙන නොසිටියා නම් එයා ඊට වඩා ලස්සන වෙන්න තිබුණා. එයාව දකිද්දි මට මතක් වුණේ මගේ තුන වසරේ ගීතිකා කණ්ඩායමේ ගුරුතුමියවයි. එයාගේ පපුවට අමුණා තිබුණු නිල් පාට රිබන් නිල ලාංඡනය කියවන්න මට මොහොතක් ගියා: *මෙම රාක්ෂණියව ආදර්ශවත් අයෙක් ලෙස වර්ග කර ඇත!*

ටයිසන්ට කෙඳිරි ගෑවුණා. "ස්ෆින්ක්ස්."

එයා බයවුණ හේතුව මම හොඳාකාරව ම දැන සිටියා. ටයිසන් චූටි කාලේ එයාට ස්ෆින්ක්ස් කෙනෙක් පහර දීලා, තුවාල කරලා තිබුණා. ඒ බව ඔප්පු කරන තුවාල කැළැල් තවමත් එයාගේ පිටේ තිබුණා.

සතාගේ දෙපසින් ම පිරික්සුම් පහන් දල්වෙමින් තිබුණා. එ් කාලාවට ඇති එකම පිටවීමේ දොරටුව තිබුණේ හරියටම වේදිකාව පිටුපසයි. ස්ෆින්ක්ස්ගේ ගාත් අතරින් දඩිබිඩියේ ඇවිද ගිය ලෝහමය මකුළුවා නොපෙනී ගියා.

ඇනබෙත් ඉස්සරහට යන්න හැදුවත්, ස්ෆිනික්ස්, එයාගේ මිනිස් මුහුණේ වූ තියුණු දත් විළිස්සා ගර්ජනා කළා. අපිට පිටුපසින් සහ ඉදිරියෙන් උමං දොරවල් හරස් කරමින් යකඩ පොලුවලින් සැදුණු දොරවල් පහත වැටුණා.

එසැණින් ම රාක්ෂණියගේ ගෙරවුම දිප්තිමත් හිනාවකට හැරුණා.

"සාදරයෙන් පිළිගන්නවා, වාසනාවන්ත තරඟකරුවනි!" එයා නිවේදනය කළා. "**'තේරවිල්ල තෝරන්න'** තරඟය සඳහා සූදානම් වෙන්න..."

පටිගත කළ අත්පොලසන් හඬක් සිවිලිම දෙසින් ඇසුණේ ඒ තැන්වල නොපෙනෙන ශබ්ද විකාශන සවි කරලා වගෙයි. පිරික්සුම් පහන් එළි කාමරය පුරා පැතිරෙමින්, පොළොවේ විසිරී තිබුණු ඇටසැකිලි මතට ඩිස්කෝ ග්ලිටර් වැස්සුවා.

"විස්මයජනක ත්‍යාගයන්!" ස්ෆිනික්ස් කිවුවා. "විභාගය සමත් වුනොත්, ඔබට ඉදිරියට යෑමට ලැබෙනවා! අසමත් වුනොත්, මට ඔබලාව කන්න ලැබෙනවා! ඔබලාගේ තරඟකරුවා කවුද?"

ඇනබෙත් මගේ අත අල්ලා ගත්තා. "මං මේක බලාගන්නම්," එයා රහසින් කිවුවා. "එයා අහන්න යන්නෙ මොකක්ද කියලා මං දන්නවා."

මං වැඩිය වාද කරන්න ගියේ නැහැ. ඇනබෙත්ව රාක්ෂයෙකුගේ කෑමක් වෙනවා දකින්න මට උවමනා නොවුණත්, මේ ස්ෆිනික්ස් තේරවිලි අහන්න යනවා නම්, අපේ හොඳම බලාපොරොත්තුව ඇනබෙත් කියලා මට තේරුම් ගියා.

එයා තරඟකරුවාගේ වේදිකාව දෙසට පිය මැන්නා. එහි පාසැල් තිල ඇඳුමකින් සැරසුණු ඇටසැකිල්ලක් එල්ලෙමින් තිබුණා. එයා ඇටසැකිල්ල පැත්තකට තල්ලු කරද්දී එය හඬ නගමින් බිමට ඇද වැටුණා.

"සමා වෙන්න," ඇනබෙත් එයට කිවුවා.



"ආයුබෝවන්, ඇනබෙත් චේස්!" ඇනබෙත් නම කියන්නත් කලින්ම රාක්ෂණිය මොර ගැසුවා. "ඔබ තරඟයට සූදානම් ද?"

"ඔව්," එයා කිවුවා. "ඔයාගේ තේරවිල්ල අහන්න."

"තේරවිලි විස්සක්, ඇත්තටම!" ස්ෆිනික්ස් කිවුවේ සතුටින්.

"මොනවා? ඒත් ඉස්සර නම්-"

"ඔන්, අපි අපේ ප්‍රමිතිය ඉහළ දාලා තියෙන්නේ! ජයග්‍රහණය කරන්න නම්, විස්සටම නිවැරදි පිළිතුරු ලබා දිය යුතුයි. ඒක හොඳයි නේද?"

අත්පොලසන් හඬ ක්‍රියාත්මක වී, නැවත ක්‍රියා විරහිත වුණේ කවුරු හරි බොත්තමක් ඔබනවා වගෙයි.

ඇනබෙත් බයෙන් වගේ මගේ දිහාවට බැල්මක් හෙළුවා. මම එයාව දිරි ගන්වමින් ඔළුව වැනුවා.

"හරි," එයා ස්ෆිනික්ස්ට කිවුවා. "මම ලෑස්තියි."

ඉහළින් බෙර හඬක් වාදනය වුණා. ස්ෆිනික්ස්ගේ ඇස් දෙක උද්වේගයෙන් දිලිසුණා. "බල්ගේරියාවේ... අගනුවර කුමක් ද?"

ඇනබෙත්ගේ ඇහිබැම එකට ගැට ගැසුණා. එක බිහිසුණු මොහොතකට මම හිතුවේ එයා උත්තර දිගන්න බැරුව අමාරුවේ වැටිලා කියලයි.

"සොෆියා," එයා කිවුවා. "ඒත්-"

"නිවැරදියි!" තවත් පටිගත කළ අත්පුඩි හඬක්. ස්ෆිනික්ස් කොච්චර ලොකු හිනාවක් පෑවා ද කියනවා නම් එයාගේ උල් දත් පවා පෙනුණා. "කරුණාකර, ඔබගේ උත්තරය 2බී පැන්සලෙන් පැහැදිලි ලෙස ප්‍රශ්න පත්‍රයේ සලකුණු කරන්න."

"මොකක්?" ඇනබෙත් ව්‍යාකූල වුණු බවක් පෙනුණා. ඒ වෙලාවේ වේදිකාවේ එයා ඉදිරියෙන් ප්‍රශ්න පත්තර පොත් පිංචක් සහ උල් කරන ලද පැන්සලක් මතු වුණා.

"සෑම පිළිතුරක් ම පැහැදිලිව රවුම් කරන්නත්, රවුමෙන් පිට නොයවන්නත් මතක තියාගන්න," ස්ෆිනික්ස් කිවුවා. "ඔබට මැකීමට අවශ්‍ය නම්, සම්පූර්ණයෙන් මකා දමන්න, නැත්නම් මැෂින් එකට ඔබගේ උත්තර කියවන්න බැරි වෙයි."

"මොන මැෂින් එක ද?" ඇනබෙත් ඇසුවා.

Scanned with CamScanner

ස්ෆිනික්ස්, එයාගේ ගාතයක් දිගු කර පෙන්වූ තැන පිරික්සුම් පහනට එහායින් ගියර, ලීවර පොකුරක් සහ එක් පසෙක ග්‍රීක H, ඊටා ලකුණක් - හෙෆාස්ටස්ගේ ලකුණ - ඇති ලෝකඩ පෙට්ටියක් තිබුණා.

"දැන්," ස්ෆිනික්ස් කිවුවා, "ඊළඟ පැනය-"

"තත්පරයක් ඉන්න," ඇනබෙත් විරෝධය පෑවා. "කොයි අර 'උදෑසනට සකුල් හතරෙන් ඇවිදින්නේ මොකාද?' ප්‍රශ්නේ?"

"සමා වෙන්න?" ස්ෆිනික්ස් කිවුවේ පැහැදිලිව ම, තරහා ගිහිල්ලයි.

"මනුෂ්‍යයා ගැන අහන තේරවිල්ල. එයා උදේට කකුල් හතරෙන් ඇවිදිනවා, ඒ කියන්නේ බබෙක් කාලේ. දවල්ට කකුල් දෙකෙන්, ඒ කියන්නේ වැඩිහිටියෙක් කාලේ. හවසට කකුල් තුනෙන්, ඒ කියන්නේ හැරමිටියෙන් යන නාකි කෙනෙක්. ඔයා ඉස්සර ඇහුව තේරවිල්ල ඒක නේ."

"අන්න ඒ නිසා තමයි අපි පරීක්ෂණේ වෙනස් කළේ!" ස්ෆිනික්ස් කෑගසා කිවුවා. "ඔයාලා කල් තියාම උත්තරේ දැනගෙන එනවා නේ. දැන්, දෙවෙනි ප්‍රශ්නය, දහසයේ වර්ග මූලය කුමක්ද?"

"හතර," ඇනබෙත් කිවුවා, "ඒ වුණාට-"

"නිවැරදියි! නිදහස් ප්‍රකාශයට අත්සන් කළ ජනාධිපතිවරයා කවුද?"

"ඒබ්‍රහම් ලින්කන්, ඒ වුණාට-"

"නිවැරදියි! තේරවිලි අංක හතර. කොපමණ-"

"ඕහොම ඉන්න!" ඇනබෙත් කෑගැසුවා.

මැසිවිලි කියන එක නතර කරන්න කියලා එයාට කියන්න මට ඕනැ වුණා. එයා හොඳට තරඟ කරනවා නේ! එයා පාඩුවේ ප්‍රශ්නවලට උත්තර දුන්නා නම් අපිට එතැනින් යන්න තිබුණා.

"මේවා තේරවිලි නෙවෙයි," ඇනබෙත් කිවුවා.

"ඔයා මොනවද කියන්නේ?" ස්ෆිනික්ස් කඩා පැන්නා. "ඇත්ත වශයෙන්ම මේවා තේරවිලි තමයි. මේ විභාග කරුණු විශේෂයෙන් සැලසුම් කරපු-"



"මේ නිකං වැඩකට නැති, ආවට ගියාට තෝරපු කාරණා ටිකක්," ඇනබෙත් තදින් කියා සිටියා. "තේරවිලි කියන්නෙ කෙනෙක්ට හිතන්න සලස්වන ඒවා."

"හිතන්න?" ස්ෆිනික්ස්ගේ නළල රැළි වුණා. "ඔයාට හිතන්න පුළුවන් ද කියලා මම පරීක්ෂා කරන්නෙ කොහොමද? ඒක විකාරයක්! දැන්, කොපමණ බලයක්-"

"නවත්තන්න!" ඇනබෙත් තදින් කිවුවා. "මේක මහ මෝඩ විභාගයක්."

"මේ, ඇනබෙත්," ග්‍රෝවර් කලබලෙන් මැදට පැන්නා. "සමහරවිට ඔයා පාඩුවේ, ඔයා දන්නවනේ, විභාගේ ඉවර කරලා, දොස් කියන එක පස්සෙ කළොත් නරක ද?"

"මම ඇතීනාගේ දරුවෙක්," එයා කිවුවා. "මේක මගේ බුද්ධියට කරන අපහාසයක්. මං මේ ප්‍රශ්නවලට උත්තර දෙන්නෙ නෑ."

එයා ඒ විදිහට නැඟී සිටීම ගැන මගේ හිතේ පැත්තක් විස්මයට පත් වුණා. ඒත් අනෙක් පැත්ත හිතුවේ එයාගේ ආඩම්බරකම අපි ඔක්කොම මරවන්න යනවා කියලයි.

පිරික්සුම් පහන් තවත් දීප්තිමත් වුණා. ස්ෆිනික්ස්ගේ ඇස් තනි කළු පාටින් දිලිසුණා.

"ඇයි එහෙනම්, ළමයෝ," රාක්ෂණිය සන්සුන්ව කිවුවා. "ඔයා සමත් වෙන්නෙ නැත්නම්, ඔයා අසමත් වෙනවා. ඒ වගේම අපිට කිසිම ළමයෙක්ව රඳවා ගන්න අවසර නැති නිසා, ඔයාව කන්න වෙනවා!"

ස්ෆිනික්ස් අනාවරණය කළ තියු පහුරු මළ නොකන වානේවලින් හදලා වගේ දිස්න දුන්නා. එයා වේදිකාව වෙතට පැන්නා.

"නෑ!" ටයිසන් පහර දෙන්න පැන්නා. කවුරු හරි ඇනබෙත්ට තර්ජනය කරන එක ටයිසන්ට ජේන්න බැරි වැඩක්, ඒ වුණත් ස්ෆිනික්ස් කෙනෙක් නිසා අර තරම් නපුරු අද්දැකීමකට මුහුණ දුන්නට පස්සෙත්, එයා ඒ තරම් නිර්භීත වීම මට අදහන්නත් බැරිවුණා.

ගුවනේ දී ස්ෆිනික්ස්ව අල්ලාගත් ටයිසන් එයත් එක්කම ඇටකටු ගොඩක් උඩට ඇද වැටුණා. මෙයින් ඇනබෙත්ට සිහි එළවාගෙන, කිණිස්ස අතට ගන්න තරම් වෙලාවක් ලැබුණා. ටයිසන් නැගිටිද්දී එයාගේ කමිසය තීරුවලට ඉරී තිබුණා. ස්ෆිනික්ස් පහර දෙන්න ඉඩක් සොයමින්, ගෙරෙව්වා.

Scanned with CamScanner

මම රිප්ටයිඩ් ඇදලා අරන් ඇනබෙත් ඉදිරියට අඩිය තැබුවා.

"නොපෙනී යන්න." මම එයාට කිවුවා.

"මට සටන් කරන්න පුළුවන්!"

"නෑ!" මම මොර ගැසුවා. "ස්ෆිනික්ස් ඔයාගෙ පස්සෙන් එන්නෙ! අපිට එයාව ගන්න දෙන්න."

මගේ කතාව තහවුරු කරන්න වගේ ස්ෆිනික්ස් ටයිසන්ව පැත්තකට පෙරලා, මාව පසු කරගෙන ඇනබෙත් ළඟට යන්න උත්සහ කළා. ග්‍රෝවර් කාගෙදෝ කකුල් ඇටයකින් එයාගේ ඇහැට ඇන්නා. එයා වේදනාවෙන් මොර ගැසුවා. ඇනබෙත් කැප් එක දමාගෙන අතුරුදහන් වුණා. ස්ෆිනික්ස් එයා සිටගෙන සිටි තැනට පැන්නත්, හිස් අතින් ආපහු හැරෙන්න වුණා.

"අසාධාරණයි!" ස්ෆිනික්ස් විලාප දුන්නා. "වංචාකාරි!"

තව දුරටත් ඇනබෙත් පේන්න නැති නිසා, ස්ෆිනික්ස් මගේ දිහාවට හැරුණා. මම කඩුව එසෙව්වා, ඒත් මට පහර දෙන්න ඉඩක් ලැබෙන්න කලින්, රාක්ෂණියගේ ප්‍රශ්න පත්තර ලකුණු කරන යන්ත්‍රය පොළොවෙන් උදුරාගත් ටයිසන් එයින් ස්ෆිනික්ස්ගේ ඔළුවට දමා ගහලා, එයාගේ කොණ්ඩා ගුළිය අවුල් කරා. කෑලි කැඩුණු යන්ත්‍රය එයා වටේට වැටුණා.

"මගේ මැෂින් එක!" එයා කෑගැසුවා. "විභාග ලකුණු නැතුව මං කොහොමද ආදර්ශවත් වෙන්නේ!"

පිටවීම් දොරටුවල යකඩ පොලු දොරවල් ඉහළට එසවුණා. අපි හැමෝම එහා පැත්තෙන් තිබුණු උමඟට කඩාගෙන බිඳගෙන දිවුවා. ඇනබෙතුත් ඒකම කරයි කියලා මට ප්‍රාර්ථනා කරන්න විතරයි ඉතිරිව තිබුණේ.

ස්ෆිනික්ස් අපිව ලුහුබඳින්න පටන් ගත්තා, ඒත් බට නළා අතට ගත් ග්‍රෝවර් තාලයක් වැයුවා. හදිසියේ ම තමනුත් ගහක කොටසක් වෙලා හිටිය බව පැන්සල්වලට මතක් වෙලා තිබුණා. ස්ෆිනික්ස්ගේ ගාත් වටා රැස් වුණ ඒවා මුල් සහ අතු රිකිලි වර්ධනය කර ගනිමින්, රාක්ෂණියගේ පාද වෙලාගත්තා. ස්ෆිනික්ස් ඒවා ඉරා දැමුවත්, එයින් අපිට පැන ගන්න උවමනා කාලය ලැබුණා.



ටයිසන් ග්‍රෝවර්ව උමඟ තුළට ඇදලා ගනිද්දි ම, අපිට පිටුපසින් යකඩ දොරවල් ආපහු වැසුණා.

"ඇනබෙත්!" මම මොර දුන්නා.

"මෙහේ!" මට එහා පැත්තෙ ඉඳන් එයා කිවුවා. "දිගටම යමු!"

විභාග ප්‍රශ්න පත්තර ඔක්කොම අතින් ලකුණු කරන්න වෙන බව කියා අවලාද නගන ස්ෆිනික්ස්ගේ ගර්ජනාවට කන් දෙමින් අපි අඳුරු උමං තුළින් ඉදිරියටම දිවුවා.

11

# මම ගිහි තියාගත්තා

මෙට මකුළුවාව නැති වුණා කියලා මම හිතුවත්, ටයිසන්ට සිහින් හඬක් ඇහුණා. වංගු තීරයක් ගනිමින්, දෙතුන් වතාවක් ම ආපසු හැරෙමින් ගිය මෙට අන්තිමේ දී හොයාගන්න ලැබුණේ මකුළුවා. උගේ පුංචිං ඔළුවෙන් ලෝහමය දොරකට තට්ටාමින් ඉන්න හැටියි.

ඒ දොරට තිබුණේ පරණ පන්නයේ සබ්මැරීන් දොරක පෙනුමක් - දාරය වටා ලෝහ රිවට් ඇණ වැද්දූ, දොර අගුල වෙනුවට රෝදයක් ඇති මිවලාකාර එකක්. එහි දොර පියන තිබිය යුතු තැන තිබුණේ කාලයත් සමඟ කොළ පාටට හැරුණ පිත්තල ඵලකයක්. එය මැද ග්‍රීක පිටා ලකුණක් කැටයම් කර තිබුණා.

අපි එකිනෙකාගේ මුහුණු බලාගත්තා.

"හොල්ස්ටස්ට මුණගැහෙන්න ලැස්ති ද?" ග්‍රෝවර් ඇහුවේ බයෙන් වගෙයි.

"නැහැ," මම ඇත්ත ම කිවුවා.

"ඔව්" හරිම ආසාවෙන් කියූ ටයිසන් රෝදය කැරකුවා.

දොර ඇරෙද්දි ම මකුළුවාත්, උාට පිටුපසින් ටයිසනුත් ඇතුළට රිංගුවා. ඉතුරු අපි ටික නම් එයාලව පුහුණුවුන්දේ ඒ තරම් ආසාවකින් නෙවෙයි.

ඒ කාමරය අති විශාලයි. ඒකට තිබුණේ හයිඩ්‍රොලික් උත්තෝලක කීපයක් ම ඇති මිකැනික් ගරාජයක් වගේ පෙනුමක්.



සමහර උත්තෝලක මත කාර් රඳවා තිබුණා. ඒ වුණත් අනෙත් ඒවාගේ තිබුණේ අමුරු දේවල් අමු මීක හැලදි. කුකුළ වලිගයෙන් මුවට වයර් නොවක් එල්ලෙන ලෝකඩ හිපලෙක්ට්‍රියන් කෙනෙක්, බැටරි චාජරයකට සවි කරලා වගේ පෙනුන ලෝහමය සිංහයෙක් සහ මුළුමනින්ම ගිනිදළුවලින් හැදූ ග්‍රීක යුධ රථයක්.

තවත් පුංචි පුංචි ව්‍යාපෘති ගොඩක් වැඩ මේස දුසිමක විතර විසිරී තිබුණා. බිත්ති දිගේ ආයුධ සහ මෙවලම් එල්ලා තිබුණා. ඒ හැම එකකටම නියමිත තැනක් වෙන් කර තිබුණ බව වැලි සටහන්වලින් පෙනුනත්, කිසිම මෙවලමක් ඊට නියමිත තැන සිමෙන බව නම් පෙනුනේ නැහැ. මිටිය තිබුණේ ඉස්කුරුප්පු නියනට අදාළ තැනයි. ලෝහ කියතට අදාළ තැන එල්ලෙමින් තිබුණේ ස්ටැප්ල් විදිනයයි.

'98 ටොයෝටා කොරොල්ලා රථයක් ඔසවාගෙන සිටි ළඟම වූ හයිඩ්‍රොලික් උත්තෝලකයට යටින් කකුල් දෙකක් එළියට පැනලා තිබුණා - කුණු නැවරුණු අළු පාට කලිසමකින් සහ ටයිසන්ගේ ඒවාටත් වඩා ලොකු සපත්තු ජෝඩුවකින් වැසුණු. යෝධ මනුස්සයෙකුගේ යටි කයක්. එයින් එක කකුලක් ලෝහ ආධාරකයක රඳවා තිබුණා.

මකුළුවා කෙලින්ම කාරය යටට දිවුවා ම, තට්ටාන හඬ නැවතුණා.

"හොඳයි, හොඳයි." කොරොල්ලා රථය යටින් ගැඹුරු හඬක් දෙඩුරුවා. "කවුද මේ ඇවිල්ලා ඉන්නේ?"

ට්‍රොලියකින් ආපස්සට තල්ලු වී එළියට ආ කාර්මිකයා තද කෙලින් කර වාඩි වුණා. මීට කලින් ඔලිම්පස්වලදී මට එක වරක් හෙෆෙස්ටස්ව දකින්න ලැබී තිබුණු නිසා මම හිතුවේ එයාව මුණ ගැහෙන්න මම සූදානම් කියලයි. ඒ වුණත් එයාගේ පෙනුම දකිද්දී මට හදින් කෙළ ගිලුණා.

මං හිතන්නේ, මම ඔලිම්පස්වලදී එයාව දකිනකොට එයා පිරිසිදු වෙලා ඉන්න ඇති, එහෙමත් නැත්නම් මායාවක් පාවිච්චි කරලා එයාගේ පෙනුමේ අප්‍රසන්න බව ටිකක් අඩු කරගෙන ඉන්න ඇති. මෙතැන, එයාගේ ම වැඩපොළේ දී, තමන්ගේ පෙනුම ගැන එයා කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැති බව පැහැදිලිවම පෙනුනා. එයා හැඳ සිටි ජම්ප්-සූට් එක තෙල් සහ දූලි කුණුවලින් පැල්ලම් වැටිලා. එයාගේ එහි පපුව මත වූ සාක්කුවේ එම්බ්‍රොයිඩර් කර තිබුණා. එයා නිරිකිරි හඬවල් සිට ගනිද්දී ලෝහ ආධාරකයේ තිබුණු කකුලෙන්

සහ ප්ලින් තඩවල් ඇහුණා. ඒ වගේ ම එයාගේ වම් උරහිස දකුණු උරහිසට වඩා පහත්ව තිබුණා. ඉතින් කෙලින් සිටගෙන ඉන්නකොටත් එයාව පෙනුණේ පැත්තකට ඇලවෙලා නැමිලා ඉන්නවා වගෙයි. එයාට තිබුණේ පැත්තකට නෙරා ආව, විරූපී ඔළුවක්. එයාගේ මුහුණේ සිදු විටෙක නොමැනෙන රැවුමක් තිබුණා. එයාගේ කළු රැවුලෙන් දුම් දැමුවා. ඉඳහිට සැරයක් එයාගේ රැවුල් ගස් අතරේ පුංචි ලැව් ගින්නක් ඇති වී නැති වී ගියා. එයාගේ අත් බේස්බෝල් ක්‍රීඩකයින් පලඳින අත් වැසුම් පුවළක් තරම් ලොකු වුණත්, එයා මකුළුවාව අතට ගත්තේ හිතා ගන්නත් බැරි තරම් හුරු පුරුදු ලෙසයි. තත්පර දෙකෙන් මකුළුවාගේ කෑලි ගැලවූ එයා ආපසු සවි කළා.

"අන්න හරි." එයා තමන්ටම කොඳුර ගත්තා. "එහෙම හොඳයි."

එයාගේ අත්ල මත සතුටින් උඩ පැන්න මකුළුවා ලෝහමය මකුළු දැලක් සිවිලිමට විදලා, එහි එල්ලී ඉවතට ගියා.

හෙෆාස්ටස් අපි දිහා රවා බැලුවා. "ඔයාලා මං හදපු අය නෙවෙයි නේ?"

"අන්." ඇනබෙත් කිව්වා. "නෑ, සර්."

"එහෙනම් කමක් නෑ." දෙවියා ගෙරෙව්වා. "හදලා තියෙනවා කිසිම කමකට නැහැ."

එයා ඇනබෙත්ව සහ මාව පිරික්සා බැලුවා. "අර්ධ-ලෝහිතයෝ." එයා අමනාපයෙන් ගෙරෙව්වා. "යාන්ත්‍රික එවුන් වෙන්නත් පුළුවන්. ඇත්තටම, ඒත් මට පේන්නෙ එහෙම නැතුව ඇති."

"අපි මීට කලින් මුණගැහිලා තියෙනවා, සර්," මම එයාට කිව්වා.

"එහෙමද?" දෙවියා ඇහුවේ අවසිහියෙන්. මීට කලින් මුණගැහිලා තිබුණත් නැතත් එයාට වගක් නැහැ කියලා මට හැඟුණා. එයා උත්සහ කරමින් සිටියේ මගේ හනුව වැඩ කරන්නේ අසවුවකින් ද, ලීවරයකින් ද, එහෙමත් නැත්නම් වෙන ක්‍රමයකින් ද කියලා තේරුම් ගන්න විතරයි. "හොඳයි, එහෙනම්, අපි මුණගැහිච්ච පළවෙනි සැරේ මම ඔයාව තලපයක් වෙන්න චප්ප කළේ නැත්නම්, මං හිතන්නේ මම දැනුත් එහෙම කරන්නෙ නැති වෙයි."

ග්‍රෝවර් දිහා බලපු එයා රැවුවා. "සැටර් කෙනෙක්," ඊට පස්සේ ටයිසන් දිහාවට හැරුණු එයාගේ ඇස් දිලිසුණා. "හොඳයි,



සයික්ලොප්ස් කෙනෙක්. හොඳයි, හොඳයි. ඔයා මොකද මේවුන් එක්ක රවුම් ගගහා කරන්නේ?"

"අන්..." දෙවියා දිහා පුදුමයෙන් බලා සිටි ටයිසන්ට කියවුණා.

"ඔව්, ඒක ඇත්ත," හෙෆාස්ටස් අනුමත කළා. "ඉතින්, මට කරදර කරන්න එන්න ඔයාලට හොඳ හේතුවක් තිබුණොත් හොඳයි. මේ කොරොල්ලා කාර් එකේ තියෙන පුශ්නේ ලේසි පහසු එකක් නෙවෙයි, ඔයාලා දන්නවා නේ."

"සර්," ඇනබෙත් පැකිළෙමින් කිව්වා. "අපි ඩේඩලස්ව හොයාගෙන යන ගමන්. අපි හිතුවා-"

"ඩේඩලස්?" දෙවියා ගර්ජනා කළා. "ඔයාලට ඒ නාකි අධමයාව ඕනෑ ද? එයාව හොයාගෙන යන්න තරම් හයියක් ආව ද?"

එයාගේ රැවුල ගිනි ජාලාවකට හැරුණා. එයාගේ කළු ඇස් දිලිසුණා.

"අන්, ඔව්, සර්, කරුණාකරලා," ඇනබෙත් කිව්වා.

"හම්ප්. ඔයාලා නිකං බොරුවට වෙලාව නාස්ති කරනවා." වැඩ මේසයක් මත වූ යමක් දිහා රවා බැලූ එයා නොණ්ඩි ගසමින් එතැනට ගියා. දුනු ගොඩක් සහ ලෝහ තහඩු කිහිපයක් අහුලා ගත් එයා ඒවායින් මොකක්දෝ හැදුවා. තත්පර ගාණකින් එයාගේ අතේ තිබුණේ ලෝකඩ සහ රිදී උකුස්සෙක්. ලෝහ අත්තටු විහිදූ ඌ ඔබ්සිඩියන් පාෂාණයෙන් සැදි ඇස් කරකවා, කාමරය වටා පියෑඹුවා.

ටයිසන් මහ හඬින් හිනාවෙමින් අත්පුඩි ගැසුවා. ටයිසන්ගේ උරහිස මත වැසූ කුරුල්ලා හුරතල් නාලෙට එයාගේ කන කොනහන්න ගත්තා.

හෙෆාස්ටස් එයා දිහා සැලකිල්ලෙන් බලා සිටියා. දෙවියාගේ මුහුණේ වූ රැව්ම වෙනස් නොවුණත්, එයාගේ ඇස්වලට කාරුණික එළියක් එකතු වුණා කියලා මට හිතුණා. "මට කියන්න දෙයක් ඔයාට තියෙනවා කියලා මට දැනෙනවා, සයික්ලොප්ස්."

ටයිසන්ගේ හිනාව මැකී ගියා. "ඔ-ඔව්, උතුමාණෙනි. අපිට අත්-සියයක් ඇත්තෙක් හම්බ වුණා."

හෙෆාස්ටස් ඔළුව වැනුවේ කොහෙත්ම පුදුම වුනේ නැහැ වගෙයි. "බ්‍රයර්ස්?"

"ඔව්. එයා- එයා බය වෙලා හිටියේ. එයා අපිට උදව් කළෙත් නැහැ."

"ඉතින් ඒක ඔයාගෙ හිතට වද දෙනවා."

"ඔව්!" ටයිසන්ගේ කටහඬ පැලුණා. "බ්‍රයර්ස් ශක්තිමත් වෙන්න එපැයි! එයා සයික්ලොප්ස්ලටත් වඩා වැඩිමල්. ලොකු කෙනෙක්. ඒ වුණාට එයා බයේ පැනලා දිවුවා."

හෙෆාස්ටස් ගෙරෙව්වා. "මම අත්-සියයන් ඇත්තන්ම අගේ කරපු කාලයක් තිබුණා. පළවෙනි යුද්දෙ කාලේ. ඒත් මිනිස්සු, රාක්ෂයෝ, වෙන එකක් තියා දෙවිවරු පවා වෙනස් වෙනවා, සයික්ලොප්ස් පොඩ්ඩෝ. එයාලව විශ්වාස කරන්න ඔයාට බැහැ. මගේ ආදරණීය අම්මා, හේරාව අරන් බලන්න. ඔයාට එයාව මුණ ගැහුණා, නේ? එයා ඔයත් එක්ක හිනාවෙලා, පවුලක වැදගත්කම ගැන කතා කරන්න ඇති, එහ්? ඒත් මගේ කැත මූණ දැකපු හැටියේ මාව ඔලිම්පස් කන්දෙන් පහළට විසි කරලා දාන්න එයා දෙසැරයක් හිතුවෙ නැහැ."

"ඒත් මං හිතන් හිටියේ ඔයාට එහෙම කළේ සියුස් කියලා," මම කිවුවා.

උගුර පැදුව හෙෆාස්ටස් ලෝකඩ පඩික්කමකට කෙළ ගැසුවා. එයා අසුරක් ගැසුවා ම රොබෝ උකුස්සා ආපසු වැඩ මේසයට පියඹා ගියා.

"අම්මා කැමති කතාව ඒ විදිහට කියන්න තමා," එයා ගෙරෙව්වා. "එතකොට එයා ගැන පැහැදෙනවා නේ, නැද්ද? ඔක්කොම දොස් මගේ තාත්තා පිටට පැටෙව්වාම. මගේ අම්මා පවුල්වලට කැමතියි තමයි. හැබැයි එයා කැමති එක විදිහක පවුලකට විතරයි. අංගසම්පූර්ණ පවුලකට. එයා මගේ දිහා බැලුවේ එක පාරයි, ඊට පස්සේ... හොඳයි. මාව එහෙම පවුලකට ගැළපෙන්නෙ නැහැ නේ, නැද්ද?"

එයා උකුස්සාගේ පිටුපසින් පිහාටුවක් ඇදලා ගත්තා ම රොබෝ කුරුල්ලාව සම්පූර්ණයෙන් ම ගැලවී වැටුණා.

"මාව විශ්වාස කරන්න, සයික්ලොප්ස් පොඩ්ඩෝ," හෙෆාස්ටස් කිවුවා. "ඔයාට අනිත් අයව විශ්වාස කරන්න බැහැ. ඔයාට විශ්වාසය තියන්න පුළුවන් ඔයා අතින් ම කරපු වැඩ ගැන විතරයි."

ඒක නම් ජීවත් වෙන්න හරිම පාළු ක්‍රමයක් වගෙයි පෙනුණේ. ඒ ඇරත්, මම හෙෆාස්ටස්ගේ වැඩ නම් කොහෙත්ම විශ්වාස කළේ



නැහැ. වතාවක් වෙන්වර්වල දී, එයාගේ යාන්ත්‍රික මකුළුවෝ රොත්තක් ඇනබෙත්වයි මාවයි මරන්න ම ගියා. ගිය අවුරුද්දේ ටාලෝස් ප්‍රතිමාවේ අසම්පූර්ණ අනුරුවක් බියන්කාගේ ජීවිතය බිලි ගත්තා - ඒකත් හෙෆාස්ටස්ගේ පුංචි වනාපාතිවලින් එකක්.

එක එල්ලේ මගේ දිහා බැලූ හෙෆාස්ටස් ඇස් පටු කරගත්තේ හරියට මගේ සිතුවිලි කියවනවා වගෙයි. "ඔහ්, මෙයා නම් මට කැමති නැහැ," එයා කල්පනාබරව කිවුවා. "ඒකට කමක් නෑ, මට ඒක පුරුදුයි. ඔයා මගෙන් අහන්න කැමති මොනවද, පුංචි උප දෙවියෝ?"

"අපි ඔයාට කිවුවා නේ," මම කිවුවා. "අපිට ඩෙඩලස්ව හොයාගන්න ඕනෑ. එක කොල්ලෙක් ඉන්නවා, ලූක් කියලා, එයා ක්‍රෝනොස්ට වැඩ කරන්නේ. එයා කඳවුර ආක්‍රමණය කරන්න, වංගගිරිය හරහා යන්න ක්‍රමයක් හොයාගන්න උත්සහ කරනවා. අපි ඊට කලින් ඩෙඩලස් ළඟට නොගියොත්-"

"මම ඔයාට කිවුවා නේ, කොල්ලෝ. ඩෙඩලස්ව හොයනවා කියන්නේ වෙලාව නාස්ති කරන වැඩක්. එයා ඔයාලට උදව් කරන්නෙ නැහැ."

"ඇයි නැත්තේ?"

හෙෆාස්ටස් උරහිස් ඇකිළුවා. "අපෙන් සමහරුන්ව කඳුවලින් පහළට විසි කරලා තියෙනවා. සමහරුන්ව... අපි මිනිස්සුන්ව විශ්වාස නොකර ඉන්න ඉගෙන ගන්න පාඩම ගොඩක් වේදනාකාරීයි. මගෙන් රත්තරන් ඉල්ලන්න. නැත්නම් ගිනි දැලූ නගින කඩුවක්. එහෙමත් නැත්නම් මායා අශ්වයෙක්. මේ වගේ දේවල් මට ලේසියෙන් ම ඔයාලට දෙන්න පුළුවන්. ඒත් ඩෙඩලස් ළඟට යන්න පාරක්? ඒක නම් මිල අධික උදව්වක්."

"ඒ කියන්නේ, එයා ඉන්නෙ කොහෙද කියලා ඔයා දන්නවා," ඇනබෙත් හාරා ඇවිස්සුවා.

"එයාව හොයාගෙන යන එක බුද්ධිමත් වැඩක් නෙවෙයි, කෙල්ලේ."

"මගේ අම්මා නම් කියන්නේ හොයාගෙන යෑම තමයි ප්‍රඥාවේ ස්වභාවය කියලා."

හෙෆාස්ටස්ගේ ඇස් හීනි වුණා. "කවුද එතකොට ඔයාගේ අම්මා?"

"ඇතිනා."

"තේරුණා." එයා සුසුමක් හෙළුවා. "නියම දෙවඟනක්, ඇතිනා. එයා කවදාවත් විවාහ නොවෙන්න ප්‍රතිඥා දුන්න එක නම් අපරාධයක්. හරි එහෙනම්, අර්ධ-ලෝහිතයෝ. ඔයාට දැන ගන්න ඕනෑ දේ මට කියන්න පුළුවන්. හැබැයි ඒකට මිලක් තියෙනවා. මට උදව්වක් කරලා දෙන්න වෙනවා."

"කියන්නකෝ බලන්න." ඇනබෙත් කිව්වා.

හෙෆාස්ටස් මහ හඬින් හිනාවුණා - ඒක හරියට අති විශාල මයිනහමකින් ගින්නකට පිඹිනවා වගේ හඬක්. "මේ වීරයෝ නම්," එයා කිව්වා. "හැම වෙලේම ඉක්මන් පොරොන්දු දෙනවා. කොච්චර හොඳ ද!"

එයා. එයාගේ වඩු බංකුවේ තිබුණු බොත්තමක් එබුවා ම, බිත්තිය දිගේ ලෝහමය පියන්පත් ඇරුණා. ඒක අති විශාල ජනේලයක්, එහෙමත් නැත්නම් පුළුල් තිර රූපවාහිනියක් වෙන්න ඕනෑ. ඒ දෙකෙන් කොයික ද, මට කියන්න බැහැ. අපි වනාන්තරයෙන් වට වුණ අළු පාට කන්දක් දිහා බලා සිටියා. ඒක ගිනි කන්දක් වෙන්න ඕනෑ, මොකද එය මුදුනින් දුම් දමමින් තිබුණා.

"මගේ කම්මල්වලින් එකක්," හෙෆාස්ටස් කිව්වා. "මට ගොඩක් ඒවා තිබුණත්, මේක තමයි මං කැමති ම එක වෙලා තිබුණේ."

"ඒ සෙන්ට් හෙලේන්ස් කන්ද," ග්‍රෝවර් කිව්වා. "ඒක වටේට හොඳ කැලෑවක් තියෙනවා."

"ඔයා එහෙට ගිහින් තියෙනව ද?" මම ඇහුවා.

"ඔයා දන්නව නේ ඉතින්... පැන්ව හොයන්න."

"පොඩ්ඩක් ඉන්න," ඇනබෙත් හෙෆාස්ටස් දිහා බලමින් කිව්වා. "ඔයා කිව්වා නේද ඒක ඔයා කැමතිම තැන වෙලා තිබුණා කියලා. මොනවද වුණේ?"

හෙෆාස්ටස් එයාගේ දුම් දමන රැවුල කැසුවා. "හොඳයි, එතැන තමයි ටයිෆූන් රාක්ෂයාව හිර කරලා ඉන්නේ, ඔයා දන්නවා නේ. ඉස්සර නම් සිසිලියේ එට්නා කන්ද යට, ඒත් අපි ඇමරිකාවට ආවම, එයාගේ බලය සෙන්ට් හෙලේන්ස් කන්ද යට හිර වුණා. ඒක මහා ගිනි ප්‍රභවයක් වුණත් ටිකක් විතර අනතුරුදායකයි. එයා එතැනින් පැනගන්න සැහෙන ඉඩක් තියෙනවා. මේ දවස්වල ඒ කන්ද නිතරම



විදාරණය වෙලා, පෑසවනවා. ටයිටන්ලගේ කැරැල්ලත් එක්ක එයා කලබල වෙලා ඉන්නේ."

"ඔයා අපිට මොනවද කරන්න කියන්නේ?" මම ඇහුවා, "එයා එක්ක සටන් කරන්න ද?"

හෙෆාස්ටස් මහ හඬින් තහයෙන් පිම්බා. "ඒක සියදිවි නසාගන්න වැඩක් වෙයි. ටයිෆූන් නිදහස් වෙලා ඉන්නකොට දෙවිවරු පවා එයාගෙන් ඈතට පැනලා දිව්වා. නෑ, එයා එක්ක සටන් කරනවා තියා එයාව දකින්නවත් ලැබෙන්නෙපා කියලා ප්‍රාර්ථනා කරන්න. ඒත් පහුගිය දවස්වල මගේ කන්දට කවුරුහරි අනවසරයෙන් ඇතුළු වෙලා කියලා මට දැනුණා. මොකෙක් හරි නැත්නම් මොකක් හරි මගේ කම්මල් පාවිච්චි කරනවා. මම ගිහිල්ලා බලද්දි, ඒක හිස්, ඒත් ඒක පාවිච්චි කරලා කියලා මට ටක්කෙටම කියන්න පුළුවන්. එයාලට මං එන බව දැනිලා, නොපෙනී යන්න ඇති. මම ඒ ගැන හොයලා බලන්න මගේ රොබෝලා යැව්වා, ඒත් ඒවා ආපහු ආවෙ නැහැ. මොකක් හරි... පෞරාණික දෙයක් එතැන තියෙනවා. දුෂ්ට දෙයක්. මට දැනගන්න ඕනෑ මගේ භූමිය ආක්‍රමණය කරන්න තරම් එඩිතර වුණේ කවුද කියලයි. එයාලා ටයිෆූන්ව නිදහස් කරන්න හදනව ද කියලයි."

"ඔයාට ඕනෑ ඒ කවුද කියලා අපි ලවා හොයාගන්න," මම කිව්වා.

"අන්න හරි," හෙෆාස්ටස් කිව්වා. "එහෙට යන්න. එයාලට ඔයාලා එනවා දැනෙන එකක් නැහැ. ඔයාලා දෙවිවරු නෙවෙයි නේ."

"ඔයාට ඒක තේරුණ එක කොච්චර හොඳ ද," මම කෙඳිරුවා.

"ගිහිල්ලා ඔයාලට පුළුවන් හැමදේම හොයන් එන්න," හෙෆාස්ටස් කිව්වා. "ආපහු ඇවිත් මට වාර්තා කරන්න. ඊට පස්සේ ඔයාලට ඩෙඩලස් ගැන දැනගන්න ඕනෑ දේවල් මම කියන්නම්."

"හරි එහෙනම්," ඇනබෙත් කිව්වා. "අපි කොහොමද එහෙට යන්නේ?"

හෙෆාස්ටස් අත්පුඩියක් ගැසුවා. පරාල අතරින් මකුළුවා එල්ලී පහළට ආවා. ඌ ඇනබෙත්ගේ කකුල් ළඟට ගොඩ බහිද්දි එයා බයේ ඇකිළුණා.

"මගේ නිර්මාණය ඔයාලට පාර පෙන්නයි," හෙෆාස්ටස් කිව්වා. "වංගගිරිය හරහා යද්දි එහෙට වැඩි දුරක් නැහැ. ඒ වගේම

Scanned with CamScanner

මැරෙන්නැතුව ඉන්න බලන්න. හරි ද? මිනිස්සු කියන්නේ යාන්ත්‍රික දේවල්වලට වඩා ගොඩක් ලේසියෙන් කැඩෙන බිඳෙන, දුර්වල අය නේ."

***

ගස් මුල් දකින්න ලැබෙනකල් ම අපි කිසිම ප්‍රශ්නයක් නැතිව ගියා. මකුළුවා ඉස්සරහට දුවද්දි, අපිත් ඌ එක්කම ඉදිරියට ගියා. ඒත් ඒක වෙලාවකින් අපේ ඇස් ගැටුණේ අපේ පාරෙන් ඉවතට දළ පොළොව හාරා සෑදූ උමගක්. එය වටා ගහ මුල් එතී තිබුණා. ග්‍රෝවර් හිටිවනම නැවතුණා.

"මොකක්ද ඒ?" මම ඇහුවා.

එයා හෙලවෙන්නෙවත් නැතුව කටත් ඇරගෙන උමඟ දිහා බලා සිටියා. එයාගේ කැරලි කොණ්ඩය මද සුළඟින් සෙලවුණා.

"ඉක්මනට එන්න!" ඇනබෙත් කිවුවා. "අපි දිගටම යන්න ඕනෑ."

"මේක තමයි පාර," ග්‍රෝවර් කෙඳිරුවේ විස්මයෙන්. "මේක තමයි ඒ."

"මොන පාර ද?" මම ඇහුවා. "ඔයා කියන්නේ... පෑන් ළඟට?"

ග්‍රෝවර් ටයිසන් දිහා බැලුවා. "ඔයාට ඒ සුවඳ දැනෙන්නේ නැද්ද?"

"පස්." ටයිසන් කිවුවා. "තව පැළ ජාති."

"ඔව්! මේක තමයි පාර. මට ඒක සහතිකයි."

අපිට ඉදිරියෙන්. මකුළුවා ගලින් බැඳි කොරිඩෝව දිගේ ඈතටම යමින් සිටියා. තවත් තත්පර කීපයකින් අපිට ඌව නැති වෙයි.

"අපි ආපහු එමු." ඇනබෙත් පොරොන්දු වුණා. "අපි ආපහු හෙෆාස්ටස් ළඟට එද්දි."

"ඒ වෙද්දි මේ උමඟ නැති වෙලා තියෙයි," ග්‍රෝවර් කිවුවා. "මට ඒක දිගේ යන්න වෙනවා. මේ වගේ පාරක් ගොඩක් වෙලා ඇරිලා තියෙන්නෙ නැහැ!"

"ඒත් අපිට ඒක කරන්න බැහැ නේ," ඇනබෙත් කිවුවා. "කම්මල්!"



ග්‍රෝවර් දුක්බරව එයා දිහා බැලුවා. "මට ඒක කරන්න ම වෙනවා, ඇනබෙත්. ඔයාට තේරෙන්නෙ නැද්ද?"

ඇනබෙත්ව පෙනුණේ දරුණු අවස්ථාවකට මැදිවෙලා වගෙයි. හරියට එයාට මේ කිසිවක් තේරුම් ගන්න බැහැ වගෙයි. මකුළුවා දැන් මුළුමනින්ම වගේ දර්ශන පථයෙන් ඉවතට ගොස් සිටියා. ඒ වුණත් මට කලින් රැයේ ග්‍රෝවර් සමග කළ කතාබහ මතකයට ආවා. ඒත් එක්කම අපි කළ යුතු දේ මට තේරුම් ගියා.

"අපි බෙදිලා යමු," මම කිවුවා.

"නෑ!" ඇනබෙත් කිවුවා. "ඒක ගොඩාක් අනතුරුදායකයි. අපි කොහොමද ආපහු මුණ ගැහෙන්නේ? ඒ වගේම ග්‍රෝවර්ට තනියම යන්නත් බැහැ."

ටයිසන් ග්‍රෝවර්ගේ උරහිස උඩින් අතක් තැබුවා. "මම- මම එයත් එක්ක යන්නම්."

මට මගේ කන් අදහාගන්න බැරිවුණා. "ටයිසන්, ඔයා ඇත්තටම ද කියන්නේ?"

ලොකු යාළුවා ඔළුව වැනුවා. "එළු කොල්ලට උදවු ඕනෑ. අපි දෙවි මහත්තයව හොයාගන්නම්. මම හෙෆාස්ටස් වගේ නෙවෙයි. මම යාළුවන්ව විශ්වාස කරනවා."

ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. "පර්සි, අපි ආපහු මුණ ගැහෙයි. අපි අතරේ තවමත් අර සහකම්පන සම්බන්ධය තියෙනවා නේ. මට... යන්නම වෙනවා."

මම එයාට දොස් කිවුවේ නැහැ. එයාගේ ජීවිතේ අරමුණ වුණේ මේකයි. මේ ගමනේ දි එයා පෑන්ව හොයාගත්තේ නැත්නම්, වැඩිහිටි මණ්ඩලයෙන් එයාට ආයේ කවදාවත් තව අවස්ථාවක් දෙන්නෙ නැති වෙයි.

"ඔයා හරි ඇති කියලා මං හිතනවා," මම කිවුවා.

"මං දන්නවා මම හරි කියලා." මීට කලින් එයා කිසිම දෙයක් ගැන - සමහරවිට, චිකන් එන්චිලඩාවලට වඩා චීස් එන්චිලඩා හොඳයි කියන එක ගැන ඇරුණා ම - මේ තරම් විශ්වාසයෙන් කතා කරනවා මම දැකලා තිබුනේ නැහැ.

"පරිස්සම් වෙන්න," මම එයාට කිව්වා. ඊට පස්සේ මම ටයිසන් දිහා බැලුවා. ඉකියක් ගිල ගත් එයා මාව බදාගෙන මිරිකපු වේගයට මට පොඩ්ඩෙන් මගේ ඇස් දෙක එළියට පනිනවා. ඊට පස්සේ එයයි ග්‍රෝවරුයි ගස් මුල්වලින් කැපුණු උමඟ තුළ නොපෙනී ගියා.

"මේක නම් හොඳ නැහැ," ඇනබෙත් කිව්වා. "බෙදිලා යන්න හිතපු එක තරමක් නරක අදහසක්."

"අපිට ආයෙමත් එයාලව හම්බ වෙයි," මම කිව්වේ විශ්වාසයක් හඬට එකතු කරගන්න උත්සාහ කරමින්. "දැන් එන්න යමු. මකුළුවා ඈතට යනවා!"

***

වැඩි වෙලාවක් යන්න කලින් උමඟ උණුසුම් වෙන්න පටන් ගත්තා.

ගල් බිත්තිවලින් උණුසුම පිට වුණා. අපිට දැනුණේ අපි උදුනක් තුළින් ගමන් කරනවා වගෙයි. උමඟ ක්‍රමයෙන් බෑවුම් වුණා. ඒ අතරේ ම මට ලෝහ ගඟක් ගලනවා වගේ මහා ගර්ජනාවක් ඇහුණා. මකුළුවා නොනැවතී ඉදිරියට දුවද්දී, ඇනබෙත් ඌ එක්කම දිව්වා.

"හේයි, විකක් ඉන්නකෝ," මම එයාට කතා කළා.

එයා ආපසු හැරී මගේ දිහා බැලුවා. "ඇයි?"

"හෙෆස්ටස් අර කියපු කතාව... ඇතීනා ගැන."

"එයා කවදාවත් විවාහ නොවෙන්න දිව්රුවා," ඇනබෙත් කිව්වා. "හරියට ආර්ටෙමිසුයි, හෙස්ටියායි වගේ. එයත් කන්‍යා දෙවඟනන්ගෙන් කෙනෙක්."

මම තදින් ඇහිපිය ගැහුවා. මම ඇතීනා ගැන ඒ කතාව මීට කලින් අහලා තිබුණේ නැහැ. "ඒත් එතකොට-"

"එයාට උප දෙවි දරුවෝ ඉන්නෙ කොහොමද කියන එක ද?"

මම ඔළුව වැනුවා. මට හිතෙන්නේ ඒ වෙලාවේ මගේ මූණ රතු වෙන්න ඇති. ඒ කොහොම වුණත් උමඟ ඇතුළේ ගොඩක් උණුසුම් නිසා ඒක ඇනබෙත්ගේ අවධානයට හසු වෙන්න නැතුව ඇති කියලා මම හිතුවා.

"පර්සි, ඇතීනා ඉපදුණේ කොහොමද කියලා ඔයා දන්නවා නේ?"



"එයා සම්පූර්ණ යුධ සන්නාහයෙන් සැරසිලා සියුස්ගේ ඔළුවෙන් එළියට මතු වුණා ද කොහෙද."

"අන්න හරි. එයා ඉපදුණේ සාමාන්‍ය විදිහට නෙවෙයි. හරියටම කියනවා නම් එයා ඉපදුණේ සිතුවිලිවලින්. එයාගේ ළමයි ඉපදෙන්නෙත් ඒ විදිහටමයි. ඇතීනා මනුෂ්‍ය පිරිමියෙක් එක්ක ආදරෙන් බැඳුණා ම, ඒක තනිකරම බුද්ධිමය දෙයක්. පරණ කතන්දරවල එයා ඔඩිසියස්ට ආදරේ කළ විදිහට. ඒක චින්තනයන් දෙකක හමුවීමක්. ආදරයේ පිරිසිදුම ආකාරය ඒකයි කියලා එයා ඔයාට කියයි."

"එතකොට ඔයාගේ තාත්තයි ඇතීනයි... එතකොට ඔයා..."

"මම මොළ දරුවෙක්," ඇනබෙත් කිව්වා. "වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම. අපේ අම්මගේ දිව්‍යමය සිතුවිලියි, අපේ තාත්තගේ මනුෂ්‍ය බුද්ධියයි එකතුවෙනුයි ඇතීනගේ දරුවෝ හැදෙන්නේ. අපිව තෑග්ගක් විදිහටයි සලකන්නේ. ඇතීනා කැමති පිරිමින්ට ලැබෙන ආශිර්වාදයක් විදිහට."

"ඒත්-"

"පර්සි, මකුළුවා පැනලා යනවා. මම ඉපදුණ විදිහ ගැන හැම විස්තරයක් ම දැනගන්න ඔයාට ඕනෑ ද?"

"ම්... එපා. ඒකට කමක් නෑ."

එයා බොරුවට හිනාවුණා. "මං හිතුවා එපා කියයි කියලා." ඊට පස්සේ එයා ඉස්සරහට දිව්වා. මම එයා පසුපසින් ගියා. ඒත් මීට පස්සේ ඇනබෙත් දිහා පරණ පුරුදු විදිහටම බලන්න මට පුළුවන් වෙයි ද, මට විශ්වාසයක් තිබුණේ නැහැ. සමහර දේවල් අභිරහස් විදිහටම තියෙන්න අරින එක හොඳයි කියලා මම තීරණය කළා.

ගිගුරුම් හඬ තව තවත් වැඩිවුණා. තවත් සැතපුම් බාගයකට විතර පස්සේ අපි පාපන්දු පිට්ටනියක් තරම් ලොකු ලෙනකට ඇතුළු වුණා. අපේ මකුළු මඟ පෙන්වන්නා නතර වෙලා බෝලයකට වකුටු වුණා. අපි හෙෆස්ටස්ගේ කම්මලට ළඟා වී තිබුණා.

පොළොවක් නොතිබුණු එහි තිබුණේ අඩි සිය ගාණක් පහළින් බුබුළු දමන ලෝදිය විතරයි. අපි සිටගෙන සිටියේ ලෙන වටා දිවුන ගල් වැටියක් මතයි. ලෝහ පාලම් ජාලාවක් එය හරහා විහිදී තිබුණා. එය මැද සෑම වර්ගයක ම යන්ත්‍ර, කල්දේරම්, කම්මල් ලිප් සහ මම මෙතෙක් කාලයකට දැකපු ලොකුම තිනිතිර - ගෙයක් විතර ලොකු

යනඩ කුට්ටියක් - ඇති අති විශාල වේදිකාවක් තිබුණා. වේදිකාව මත එහා මෙහා යන සිප දෙනෙක් දකින්න ලැබුණා - අමුතු, අඳුරු රූප. ඒ වුණත් එයාලගේ වැඩි විස්තරයක් බලාගන්න දුර වැඩි වුණා.

"කාටවත් පේන්නේ නැතිවෙන්න උන්ට කිට්ටු කරන්න නම් අපිට කවදාවත් බැරි වෙයි," මම කිවුවා.

ලෝමහය මකුළුවාව අහුලාගත් ඇනබෙත් ඌව සාක්කුවට ඔබාගත්තා. "මම ඒක කරන්නම්. මෙතැනට වෙලා ඉන්න."

"නවතින්න!" මම කිවුවා, ඒත් මට තර්ක කරන්න ඉඩක් ලැබෙන්න කලින්, යැන්කී කැප් එක හිසේ දමාගත් එයා අදෘශ්‍යමාන වුණා.

ඊට පස්සෙ එයාට අඩගහන්න තරම් මම නිර්භීත වුනේ නැහැ, ඒත් එයා තනියම කම්මල ළඟට යනවාටත් මම කැමති වුනේ නැහැ. එතැන ඉන්න අයට දෙවියෙක් ගැනත් ඉව වැටුණා නම්, ඇනබෙත් පරිස්සම් වෙන්නෙ කොහොමද?

මම ආපසු හැරී වංගගිරි උමඟ දිහා බැලුවා. මට දැනටමත් ග්‍රෝවර් සහ ටයිසන් නැති පාළුව දැනුණා. අන්තිමේ දි, තවත් බලාගෙන ඉන්න බැහැ කියලා මම හිතුවා. මම ලෝදිය විලේ පිටත වැටිය දිගේ හෙමින් හෙමින් ඉදිරියට ඇදුණේ, එය මැද සිදුවෙමින් පැවතුණ දේවල් වඩාත් හොඳින් පෙනෙන තැනක් හොයමිනුයි.

එහි උණුසුම බිහිසුණු වුණා. මෙතැනත් සමග සංසන්දනය කරද්දි ගැරියන්ගේ ගොවිපොළ ශීත උයනක් වගෙයි. වැඩි වෙලාවක් යන්නට කලින්ම මාව දහඩියෙන් පෙඟුණා. දුම වැදී මගේ ඇස් දැවිල්ල ඇල්ලුවා. ගැටිය අද්දරින් හැකි තරම් ඈත් වී ඉන්න උත්සහ කරමින් ඉදිරියටම ගිය මට අන්තිමේ දි හොයාගන්න ලැබුණේ ලෝහමය රෝද සහිත කරත්තයක් මගේ මග හරස් කරමින් තිබෙන හැටියි. ඒක පතල්වල පාවිච්චි කරනවා වගේ එකක්. එය වසා තිබුණු ඉටි රෙද්ද ඔසවා බැලූ මට දකින්න ලැබුණේ එහි බාගයක් ම ලෝහ කැබලිවලින් පිරී තිබෙන බවයි. ඒක වටෙන් රිංගා අනෙක් පැත්තට යන්න සූදානම් වෙද්දි මට ඉදිරියෙන්, පෙනුණු හැටියට පැති උමඟක් තුළින් කටහඬවල් ඇසුණා.

"ඒක ඇතුළට ගේන්න ද?" එකෙක් ඇසුවා.

"ඔව්," අනෙකා කිවුවා. "චිත්‍රපටියේ වැඩ ඉවර වෙන්න ළඟයි."



මම හොඳටම බයවුණා. මට පනුබහින්න වෙලාවක් තිබුනේ නැහැ. මට හැංගෙන්න කිසිම තැනක් තිබුනෙත් නැහැ... කරත්තය ඇරෙන්න. ඒක ඇතුළට රිංගුව මම, මට උඩින් ඉටි රෙද්ද වසා ගත්තේ කිසිවෙක් මාව දකින්න නැතුව ඇති, බලාපොරොත්තුවෙන්. මම රිප්ටයිඩ් අතැඟිලි අතර හිර කරගත්තේ, බැරි වෙලාවත් මට සටන් කරන්න සිදු වුණොත් කියලා හිතලයි.

කරත්තය ඉදිරියට තල්ලු වුණා.

"ඔයි," රළු කටහඬක් කිවුවා. "මේක ටොන් එකක් විතර බරයි."

"ඒකා දිව්‍යමය ලෝකඩ," අනෙකා කිවුවා. "ඔහේ හිතුවෙ මොකාවා කියල ද?"

මාව ඉදිරියටම තල්ලු වෙමින් ගියා. අපි කෙළවරකින් හැරුණා, ඊට පස්සේ රෝද කැරකෙන හඬ බිත්තිවල වැදී දෝංකාර දෙන්න ගත් නිසා අපි උමඟක් පසු කර ඇවිත් වඩාත් පුංචි කාමරයකට ඇතුළු වෙන්න ඇති කියලා මම අනුමාන කළා. මෙහෙම ගිහින් මාව ලෝහ උණු වෙන හැළියකට දාන්න නම් එපා කියලා මම ප්‍රාර්ථනා කළා. එයාලා මාව අනෙක් පැත්තට පෙරළන්න පටන් ගත්තොත්, මට සටන් කරලා මෙතැනින් ඉක්මනින් පැනගන්න වෙනවා. මට කතා කරන, දොඩවන හඬවල් ගොඩක් ඇසුණත්, ඒවා එකක්වත් මිනිස් හඬවල් වගේ නම් ඇසුනේ නැහැ - ඒවා වඩාත් කිට්ටු වුණේ සීල් මාළුවෙකුගේ බිරුමකටත්, බල්ලෙකුගේ ගෙරවුමකටත් අතර හඬකටයි. එතැනින් තවත් හඬවල් කිපයක් ඇසුණා - පරණ චිත්‍රපටි ප්‍රක්ෂේපකයක හඬක් සහ විස්තර කථනය කරන අමිහිරි හඬක්.

"ඒක ඔය පිටිපස්සෙන් තියනවා," කාමරයේ එහා කොණෙන් අලුත් කටහඬක් අණ කළා. "දැන්, තරුණ පැටවුනේ, කරුණාකරලා චිත්‍රපටියට හිත් යොමු කරන්න. ඊට පස්සේ ප්‍රශ්න අහන්න වෙලාව ලැබෙයි."

කතා කරන හඬවල් නැවතුණා, ඒත් එක්කම මට චිත්‍රපටිය ඇසුණා.

*තරුණ මුහුදු රාක්ෂයෙක් මුහුකුරා යද්දි,* විස්තර කරන්නා කිවුවා, *රාක්ෂ සිරුරේ වෙනස්කම් ඇති වෙනවා. දළ දිගු වෙනවා ඔබලාට දකින්න ලැබිලා ඇති, ඒ වගේම ඔබලාට මනුෂ්‍යයින්ව කෑමට හදිසි ආශාවක් ඇති වෙලා ඇති. මුළුමනින්ම සාමාන්‍ය මේ වෙනස්කම්වලට සෑම නව යොවුන් රාක්ෂයෙක්ම මුහුණ දෙනවා.*

Scanned with CamScanner

උදෙන්ගිමත් ගෙරවුම් හඬවල්වලින් කාමරය පිරුණා. ගුරුවරයා - ඒ ගුරුවරයෙක් වෙන්න ඇති කියලා මම අනුමාන කළා - තරුණ පැටවුන්ව නිහඬ කළා. ඊට පස්සේ චිත්‍රපටිය තව දුරටත් ධාවනය වුණා. එයින් කියවුණු ගොඩක් දේවල් මට තේරුනේ නැහැ. ඒ වගේම ඒ දිහා බලන්න තරම් මම එඩිතර වුනෙත් නැහැ. වර්ධන වේගයේ හදිසි වැඩිවීම ගැනත්, කම්මල්වල වැඩ කිරීම නිසා මතුවෙන කුරුලෑ ප්‍රශ්න ගැනත්, අවල්පත්වල මනා පිරිසිදුකම ගැනත් කතා කළ චිත්‍රපටිය අන්තිමේදි ඉවර වුණා.

"දැන්, තරුණ පැටවුනේ," උපදේශකයා කිවුවා. "අපේ වර්ගයාගේ නියම නම මොකක්ද?"

"මුහුදු රකුසෝ!" එකෙක් බිරුවා.

"නෑ. වෙන කවුරුහරි?"

"ටෙලිකීන්ලා!" තවත් රාක්ෂයෙක් ගෙරෙව්වා.

"බොහොම හොඳයි," උපදේශකයා කිවුවා. "එතකොට අපි මෙතෙට ආවේ මොකටද?"

"පළිගන්න!" කිපදෙනෙක් කෑගැසුවා.

"ඔව්, ඔව්. ඒත් ඇයි?"

"සියුස් කියන්නේ දුෂ්ටයෙක්!" එක රාක්ෂයෙක් කිවුවා. "අපි මායාවන් පාවිච්චි කළ නිසා එයා අපිව ටාටරස්වල හිර කළා."

"ඇත්තෙන්ම," උපදේශකයා කිවුවා. "අපි දෙවිවරුන්ට හොඳම ආයුධ හදලා දුන්නටත් පස්සේ. පොසෙයිඩන්ගේ ත්‍රිශූලය එහෙම. ඒ වගේම ඇත්ත වශයෙන්ම - ටයිටන්ලාගේ හොඳම ආයුධ හැදුවෙත් අපි! ඒ කොහොම වුණත්, අපිව අතක දාපු සියුස් අර වැඩකට නැති සයික්ලොප්ස්ලා ගැන විශ්වාසෙ තිබ්බා. අන්න ඒ නිසයි අපි අර මංකොල්ලකාරයා, හෙෆාස්ටස්ගේ කම්මල අල්ලා ගත්තේ. ඒ වගේම ඉක්මනින් ම අපි මුහුද යට උඳුන්වල, අපේ පරම්පරාගත ගෙදර පාලනය අතට ගන්නවා!"

මම මගේ පෑන-කඩුව තදින් අල්ලගත්තා. පොසෙයිඩන්ගේ ත්‍රිශූලය හදලා තියෙන්නේ මේ ගොරවන සත්තු ද? එයාලා මොනවා ගැන ද කතා කරන්නේ? මීට කලින් කවදාවත් මම ටෙලිකීන්ලා ගැන අහලා තිබුනේ නැහැ.



"ඉතින්, තරුණ පැටවුනේ," උපදේශකයා කියාගෙන ගියා. "අපි කාට ද සේවය කරන්නේ?"

"ක්‍රෝනොස්ට!" එයාලා කෑගැසුවා.

"එතකොට ඔයාලා ලොකු ටෙලිකීන්ලා වුණා ම, හමුදාවලට ආයුධ හදනව ද?"

"ඔව්!"

"බොහොම හොඳයි. දැන්, ඔයාලට පුහුණුවීම් කරන්න අපි ලෝහ කෑලි ටිකක් ගෙනැත් තියෙනවා. අපි බලමු ඔයාලගෙ දක්ෂකම්."

පිරිසක් කරත්තය දිහාවට දුවගෙන එන හඬ සහ උදෙන්ගමත් කටහඬවල් ගොන්නක් මට ඇසුණා. මම රිප්ටයිඩ්ගේ කොපුව ගලවන්න සූදානම් වුණා. ඉටි රෙද්ද පසෙකට විසි වුණා. මගේ අතේ දි සක්‍රිය වූ ලෝකඩ කඩුව දරාගෙන එතැනින් උඩ පැන්න මට හොයාගන්න ලැබුණේ මගේ දිහා බලන් ඉන්න... බල්ලෝ ටිකක්.

මෙහෙමයි, ඇත්තටම බලු පෙනුමක් ගත්තේ කළු හොම්බක්, දුඹුරු ඇස් සහ උල් කන් තිබුණු එයාලගේ මුහුණු විතරයි. මුහුදු ක්ෂීරපායින්ගේ වගේ සිනිඳු කළු කඳන්වල වූ කොට කකුල්වල අඩක් අවල්පෙති වගෙයි. මිනිස් අත් වගේ අත් කෙළවර තියුණු නිය පහුරු තිබුණා. පොඩි ළමයෙක්ව, ඩොබමන් බල්ලෙක්ව සහ මුහුදු සිංහයෙක්ව එකට කලවම් කරලා බැලුවොත් මම දැන් දකිමින් සිටි ජාතියේ සතෙක්ව ඔයාට ලැබෙයි.

"උප දෙවියෙක්!" එකෙක් ගෙරෙව්වා.

"ඌව කමු!" තවෙකෙක් මොර දුන්නා.

ඒත් එයාලා වැඩි දුරක් ඉදිරියට එන්න කලින් රිප්ටයිඩ්ව පුළුල් අඩ කවයක කරකැවූ මම රාක්ෂයින්ගේ මුළු ඉදිරි පෙළම වාෂ්ප කර දැමුවා.

"පස්සට යනවා!" සැහැසි බවක් අඟවන්න උත්සහ කරමින් මම ඉතිරි උන්ට මොර ගැසුවා. එයාලට පිටුපසින් එයාලගේ උපදේශකයා - ඩොබමන් බලු දත් ඇති අඩි හයක් උස එකෙක් මට දත් නියවා ගොරවමින් සිටියා. මම, මට හැකි තරම් දරුණු ලෙස එයාට රැව්වා.

"අලුත් පාඩමක්, ළමයිනේ," මම නිවේදනය කළා. "දිව්‍යමය ලෝකඩ කඩුවකින් පෙති ගැහුණාම ගොඩක් රාක්ෂයින්ව වාෂ්ප වෙලා

යනවා. මේ වෙනස හරිම සාමාන්‍යයයි. ඒ වගේම ඔයාලා පස්සට නොගියොත් ඔයාලටත් ඒක මේ දැන්ම සිද්ධ වෙනවා!!"

මාව පුදුම කරමින්, ඒක වැඩ කළා. රාක්ෂයෝ පසුබැස්සා. ඒත් එතැන අඩු තරමේ විසිදෙනෙක්වත් සිටියා. මගේ තර්ජනයට එයාලා වැඩි වෙලාවක් බයවෙලා ඉන්නේ නැති වෙයි.

කරත්තයෙන් බිමට පැන්න මම, "පන්තිය ඉවරයි, ළමායි!" මොර දීලා, දොරටුව දිහාවට දිවුවා.

රාක්ෂයෝ ටික බුරමින්, ගොරවමින් මාව ලුහුබැන්දා. කොට කකුල් සහ අවල් පාදවලින් එයාලට ගොඩක් වේගයෙන් දුවන්න බැරි වෙයි කියලා මම හිතුවත්, එයාලා සෑහෙන වේගයකින් බකල ගහමින් ආවා. දෙවිවරුන්ට ස්තූති වෙන්න, උමඟෙන් ප්‍රධාන ලෙනට ඇතුළු වෙන තැන දොරක් තිබුණා. දොර තදින් වසා දැමූ මම එය අගුළු වැටෙන්න රෝද අල්ලුව කැරකුවා. ඒත් එයාලව වැඩි වෙලාවක් නවත්වා ගන්න ඒකට හැකි වෙයි ද කියලා මට තිබුණේ සැකයක්.

මොනවා කරන්න ද, මම දන සිටියේ නැහැ. ඇනබෙත් මේ කොහේ හරි අදෘශ්‍යමානව ඇති. රහසිගත විමර්ශන මෙහෙයුමකට අපිට තිබුණු අවස්ථාව ඉවරෙටම ඉවරයි. මම ලෝදිය විල මැද තිබුණු වේදිකාව දිහාවට දිවුවා.

***

"ඇනබෙත්!" මම මොර ගැසුවා.

"ෂ්ෂ්!" අදෘශ්‍යමාන අතක් මගේ කට වසා, ලොකු ලෝකඩ කල්දේරමක් පිටුපසට මාව ඇදලා ගත්තා. "ඔයා හදන්නෙ අපි දෙන්නවම මරවන්න ද?"

එයාගේ ඔළුව හොයාගත් මම යැන්කීස් කැප් එක ගලවා දැමුවා. එයා සැලෙමින් මගේ ඉදිරියේ මතුවුණේ මට රවාගෙනයි. එයාගේ මුහුණ අළු සහ දූලිවලින් වයිරම් වැටී තිබුණා.

"පර්සි, ඔයාට මොනවද වෙලා තියෙන්නේ?"

"අපිව අහුවෙන්නයි යන්නේ!" මම රාක්ෂ පන්තිය ගැන ඉක්මන් විස්තරයක් කළා. එයාගේ ඇස් ලොකු වුණා.

"එහෙනම් උන් තමයි මෙතැන ඉන්නෙ," එයා කිවුවා. "ටෙලිකීන්ලා. මං කලින්ම ඒක හිතන්න තිබුණා. ඒ වගේම එයාලා හදන්නේ... හොඳයි, බලන්නකෝ."



අපි කල්දේරම පිටුපසින් එබී බැලුවා. වේදිකාව මැද මුහුදු රාක්ෂයෝ හතර දෙනෙක් සිටගෙන සිටියා, හැබැයි මෙයාලා නම් අඩු තරමේ අඩි අටක්වත් උස, හොඳට වැඩුණු අයයි. එයාලා වැඩ කරද්දි ගිනි එළියෙන් එයාලගේ හම දිලිසුණා. එයාලා ගිනියම් වී දිලිසෙන දිගු ලෝහ කැබැල්ලක් මාරුවෙන් මාරුවට තලද්දි ගිනි පුපුරු විසිරුණා.

"තලේ වැඩ සෑහෙන දුරට ඉවරයි," එකෙක් කිවුවා. "ලෝහ හා වෙන්න තව වතාවක් ලේවල දාලා තිවන්න වෙනවා."

"ඔව්," දෙවෙනියා කිවුවා. "ඒක කලින් තිබුණටත් වඩා මුවහත් වෙයි."

"මොකක්ද ඒක?" මම රහසින් ඇසුවා.

ඇනබෙත් ඔළුව හෙල්ලුවා. "එයාලා දිගින් දිගටම ලෝහ හා විමක් ගැන කතා වෙනවා. මට පුදුම-"

"එයාලා කතා වුණේ මහා ටයිටන් ආයුධය ගැන," මම කිවුවා. "එයාලා... එයාලා කිවුවා මගේ තාත්තගේ ත්‍රිශූලෙ හැදුවෙත් එයාලා කියලා."

"ටෙලිකින්ලා දෙවිවරුන්ට ද්‍රෝහි වුණා," ඇනබෙත් කිවුවා. "එයාලා අඳුරු මායාවන් පාවිච්චි කළා. ඒ මොනවද කියලා මමත් හරියටම දන්නෙ නැහැ. ඒත් සියුස් එයාලව ටාටරස්වලට පිටුවහල් කළා."

"ක්‍රෝනොස් එක්ක."

එයා ඔළුව වැනුවා. "අපි මෙතැනින් එළියට යන්න-"

එයා ඒක කියලා ඉවර කරන්නත් කලින් පන්ති කාමරයේ දොර පුපුරා ගොස්, ටෙලිකීන් පැටවු එළියට විසි වුණා. පහර දෙන්න යන්නේ කොයි පැත්තට ද කියලා තීරණය කරන්න උත්සහ කරමින් එයාලා එකා පිට එකා වැටුණා.

"ඔයාගේ කැප් එක ආපහු දාගන්න," මම කිවුවා. "මෙතැනින් එළියට යන්න!"

"මොකක්?" ඇනබෙත් හීන් හඬින් කෑගැසුවා. "නෑ! මම ඔයාව දාලා යන්නෑ."

"මගේ ළඟ සැලැස්මක් තියෙනවා. මම එයාලව වෙන පැත්තකට හරවන්නම්. ඔයාට අර මකුළුවාව පාවිච්චි කරන්න පුළුවන්

- සමහරවිට ඌ ඔයාව ආපහු හෙෆාස්ටස් ළඟට අරන් යයි. මෙතන මොනවද වෙන්නෙ කියලා ඔයා එයාට කියන්න ඕනෑ."

"ඒත් ඔයාට මැරෙන්න වෙයි!"

"මට මුකුත් වෙන්නෙ නැහැ. ඇරත්, අපිට වෙන කරන්න දේකුත් නැහැ."

ඇනබෙත් රවාගෙන හිටියේ හරියට මට ගහන්න යනවා වගෙයි. ඒත් ඊට පස්සෙ එයා කළ දෙයින් මම ඊටත් වඩා පුදුම වුණා. එයා මාව සිපගත්තා.

"පරිස්සම් වෙන්න, පාසි මොළේ." කැප් එක දමාගත් එයා නොපෙනී ගියා. මට හිතෙන්නේ මම මුළු දවසම එතැනින් හෙලවෙන්නෙවත් නැතුව, ලෝදිය දිහා බලාගත් අතේ බලාගෙන මගේ නම මොකක්ද කියලා මතක් කරගන්න උත්සහ කරමින් ඉන්න තිබුණා. ඒත් මුහුදු රාක්ෂයෝ මාව ආපසු යථාර්ථයට ඇදලා ගත්තා.

"අන්න!" එකෙක් මොර ගැසුවා. මුළු ටෙලිකීන් පන්තියම පාලම දිගේ මට පහර දෙන්න දුවගෙන ආවා. මම වේදිකාව මැදට දුවගෙන යද්දි වැඩිමහල් මුහුදු රකුසෝ කොච්චර පුදුම වුණා ද කියනවා නම්, එයාලා ගිනියම් කඩු තලය අත ඇරියා. ඒක අඩි හයක් විතර දිග, අඩ හඳ වගේ වක් වූ තලයක්. මම බය හිතෙන දේවල් ගොඩක් දකලා තිබුණත්, මේ වැඩ නිම නොකළ මොකක් හරි-එක මාව ඊටත් වඩා බය කළා.

වැඩිමල් රාක්ෂයින් ඉක්මනින් පුදුමයෙන් මිදුණා. වේදිකාවෙන් පිටට දිවෙන පාලම් හතරක් තිබුණා, මට ඒ එක පැත්තකටවත් දුවන්න ඉඩක් ලැබෙන්න කලින් එයාලා හතර දෙනා මං හතර ඇහිරුවා.

එයාලගෙන් උසම කෙනා දත් නියවා ගෙරෙව්වා. "කවුද මේ ඇවිල්ලා ඉන්නේ? පොසෙයිඩන්ගේ පුතෙක් නේද?"

"ඔව්," තවෙකෙක් ගෙරෙව්වා. "මට එයාගේ ලේවල මුහුදේ ගඳ දැනෙනවා."

මම රිප්ටයිඩ් එසෙව්වා. මගේ හදවත වේගයෙන් ගැහෙමින් තිබුණා.

"අපෙන් කෙනෙක්ට ගහලා බිම දානවා, උප දෙවියෝ," තුන්වෙනි රාක්ෂයා කිව්වා. "එතකොට අපෙන් ඉතුරු අයට උඹව කීතු කීතු කරන්න පුළුවන්. උඹගේ තාත්තා අපිට ද්‍රෝහි වුණා. එයා අපේ



තෑග්ග අරගෙන. අපිව නිරේට තල්ලු කරද්දි කට පියාගෙන හිටියා. එයාව පෙති ගැහිලා යනවා අපිට දකින්න ලැබෙයි. එයාවයි අනිත් ඔලිම්පියානුවෝ ඔක්කොමයි."

මට ඇත්තටම සැලසුමක් තිබුණා නම් කියලා හිතුණා. මම ඇනබෙත්ට බොරු නොකියා හිටියා නම් කියලා හිතුණා. මට ඕනෑ වුණේ එයාව මෙතැනින් ආරක්ෂිතව පිටමං කරන්නයි, ඒ වගේම ඒක කරන්න තරම් සිහි බුද්ධියක් එයාට තියෙයි කියලත් මම බලාපොරොත්තු වුණා. ඒත් දැන් මට ටිකෙන් ටික තේරුම් යමින් තිබුණේ මෙතැන මම මැරෙන තැන වෙන්න යන බවයි. ඒ කියන්නේ අනාවැකිය මගේ නෙවෙයි. ගිනි කන්දක හදවත මැද දී බලු-මුහුණු ඇති මුහුදු-සිංහ සත්තු මාව විනාශ කරාවි. දැන් වේදිකාව මතට ගොඩ වී සිටි ටෙලිකීන් පැටවු ටිකත් දත් විලිස්සමින් බලා සිටියේ එයාලගේ වැඩිහිටියෝ හතර දෙනා මාත් සමග ගනුදෙනු කරන්න යන විදිහයි.

මගේ කලවයක පැත්තක් පිච්චෙනවා වගේ දැනුණා. මගේ සාක්කුවේ තිබුණු අයිස් නළාව තව තවත් සීතල වෙමින් තිබුණා. එයින් මට උදව්වක් ගන්න පුළුවන් නම්, ඒකට මීට වඩා හොඳ වෙලාවක් නැහැ. ඒ වුණත් මම පැකිළුණා. මම කුයින්ටස්ගේ තෑග්ග විශ්වාස කළේ නැහැ.

මම හිත හදාගන්න කලින්, උසම ටෙලිකීනයා කතා කළා. "අපි බලමු එයා කොච්චර ශක්තිමත් ද කියලා. එයාව පිච්චෙන්න කොච්චර වෙලා යයි ද කියලා අපි බලමු!"

එයා ළඟම වූ උඳුනෙන් ලෝදිය අහුරක් අතට ගත්තා. එයින් එයාගේ ඇඟිලි ඇවිලෙන්න ගත්තත් එයාට නම් ගාණක්වත් නැහැ වගෙයි පෙනුණේ. අනෙක් වැඩිහිටි ටෙලිකීනයිනුත් ඒකම කළා. පළවෙනියා දමා ගැසූ ලෝදිය පහරින් මගේ කලිසම ගිනි ගන්න පටන් ගත්තා. තවත් ලෝදිය අහුරු දෙකක් මගේ පපුව හරහා වැදුණා. ඉහවහා ගිය භීතියෙන් කඩුව බිම දැමූ මම, මගේ ඇඳුම් ගසා දැමුවා. ගිනි දලු මාව ගිල ගනිමින් තිබුණා. අමුතුම දේ වුණේ මුලින්ම මට ගිනි උණුසුමක් විතරක් දැනීමයි. ඒත් මොහොතින් මොහොත ඒ උණුසුම තීව්‍ර වෙන්න ගත්තා.

"උඹගේ තාත්තගේ ගුණය උඹව ආරක්ෂා කරනවා," එකෙක් කිව්වා. "උඹව පුච්චන්න අමාරු කරනවා. ඒත් ඒක කරන්න බැරි දෙයක් නෙවෙයි, පොඩි එකෝ. කරන්න බැරි දෙයක් නෙවෙයි."

එයාලා තව තවත් ලෝදියවලින් මට දමා ගසද්දි මම යටිගිරියෙන් බෙරිහන් දුන්නා මතකයි. මගේ මුළු ඇඟම ගිනි ගනිමින් තිබුණා. ඒ වේදනාව මම අත්විඳ තිබුණු තරකම එකටත් වඩා අන්තයි. මාව දුවී යමින් තිබුණා. ලෝහමය පොළොව උඩට ඇද වැටුණු මට මුහුදු රකුසු පැටවු සතුටින් උඩු බුරනවා ඇසුණා.

ඒ වෙලාවේ මට ගොවිපොළේ සිටි ජල දෙවඟනගේ තඩ සිහි වුණා: වතුර මගේ ඇතුළේ තියෙනවා.

මට මුහුද ඕනෑ වුණා. මගේ බඩ ඇතුළේ ගැස්සෙන හැඟීම මට දැනුණා. ඒත් මට උදවුවට ගන්න කිසිම දෙයක් වටපිටාවේ තිබුණේ නැහැ. ගසක් තියා කරාමයක්වත් නැහැ. මේ වතාවේ අඩු තරමේ පොසිලයකට හැරුණ සිප්පි කටුවක්වත් නැහැ. ඒ ඇරත්, ඉස්තාලය ළඟදි අන්තිම වතාවට මම, මගේ බලය නිදහස් කළ වෙලාවේ, එක බිහිසුණු මොහොතකට එය මුළුමනින්ම මගෙන් ඉවත් වී යන්න ගියා.

ඒත් මට වෙන විකල්පයක් තිබුණේ නැහැ. මම මුහුද කැඳෙව්වා. මගේම අභ්‍යන්තරයට ළඟා වූ මම මුහුදු රළ සහ දියවැල්, මුහුදේ නිමක් නැති බලය සිහි කළා. ඊට පස්සේ මම එක් බිහිසුණු කෑගැසීමකින් එය නිදහස් කළා.

පස්සෙ කාලෙක දි, එතැන සිදු වුණ දේ විස්තර කරන්න මට කොහෙත්ම බැරිවුණා. පිපුරුමක්, උදම් රැල්ලක්, එක විටම මාව ඩැහැගෙන ලෝදිය දෙසට අත් ඇරිය සුළි සුළඟක බලයක්. වේගයෙන් එකිනෙකට ගැටුණු ගින්දර සහ ජලය අධිතප්ත හුමාලයකට හැරෙද්දි, මහා පිපුරුමකින් මාව ගිනි කන්දේ හදවතේ සිට ඉහළට විසි වුණේ රාත්තල් මිලියන ගාණක පීඩනයකින් තල්ලු වෙන පුංචි රොඩ්ඩක් වගෙයි. සිහිසුන් වෙන්න කලින් අන්තිම වතාවට මගේ මතකයේ සටහන් වුණේ මම පියාඹන බවයි - සියුස්ගෙන් කවදාවත් සමාව නොලැබෙන තරම් ඉහළින් පියාඹන බවයි. ඊට පස්සේ මාව වැටෙන්න පටන් ගත්තා. දුම, ගින්දර සහ ජලය මගෙන් වැගිරෙමින් තිබුණා. මම පෘථිවිය දෙසට අධි වේගයෙන් ඇද වැටෙනා වල්ගා තරුවක් බවට පත් වී සිටියා.

12

# මම ස්ථිර නිවාඩුවක් ගත්තා

තවමත් ගිනි ගන්නවා වගේ දැනෙද්දි මම ඇහැරුණා. මගේ හම් දවිල්ල ඇල්ලුවා. මගේ උගුර වැලි වගේ වියළිවටයි දැනුණේ.

මට ඉහළින් නිල් අහස හා ගස් කොළන් පෙනුණා. මට ජුනිපර් පඳුරුවල, දේවදාර ගස්වල සහ තවත් මිහිරි සුවඳැති පැළෑටි ගොන්නක සුවඳ දැනුණා.

ගල් කුළුවලින් සැදුණු වෙරළක මෘදු ලෙස රළ වදින හඬත් ඇසුණා. මම මැරිල ද කියලා පුදුමයක් හිතට දැනුණත්, එහෙම නෑ කියලා තේරුම් ගන්න තරම් මම දැන සිටියා. මම මළවුන්ගේ රටට ගිහින් තිබුණා. එහෙ නිල් අහසක් නැහැ.

මම කඳ කෙලින් කර වාඩි වෙන්න උත්සහ කළා. මට දැනුණේ මගේ මාංශ පේශි දිය වෙනවා වගෙයි.

"හෙලවෙන්නැතුව ඉන්න," ගෑනු ළමයෙකුගේ කටහඬක් කිවුවා. "ඔයා නැගිටින්න දුර්වල වැඩියි."

එයා මගේ නළල මත තෙත රෙදි කඩක් එලුවා. මගේ මුහුණ වෙත පහත් වූ ලෝකඩ හැන්දකින් මගේ කටට දියරයක් වැගිරුණා. මගේ උගුරට සහනයක් ලබා දුන් ඒ පානය කටේ උණුසුම් චොකලට් රසයක් ඉතිරි කළා. දෙවිවරුන්ගේ අමෘතය. ඒ වෙලාවේ ගෑනු ළමයාගේ මුහුණ මට උඩින් පෙනුණා.

එයාට ආමන්ඩ් හැඩැති ඇස් දෙකක් සහ තනි කරලකට ගොතා උරහිසක් මතින් දමා සිටි කැරමල් පාට කොණ්ඩයක් තිබුණා. එයාගේ

Scanned with CamScanner

වයස... පහලොවක් ද? දහසයක් ද? ඒක කියන්න අමාරු වුණා. එයාට තිබුණේ කලාතුරකින් කෙනෙකුට පිහිටන විදිහේ අකාලික පෙනුමක්. එයා ගයන්න පටන් ගත්තා. ඒත් එක්කම මගේ වේදනාව පහ වී ගියා. එයා කළේ මායාවක්. එයාගේ සංගීතය මගේ හම තුළට කාවදිමින්, මගේ මොළය සුව කරමින් ප්‍රකෘතිමත් කරනවා මට දැනුණා.

"කවුද?" මම බැරෑඩි හඬින් ඇසුවා.

"ෂ්ෂ්. වීර කොල්ලෝ," එයා කිවුවා. "විවේක අරන් සනීප වෙන්න. මෙහෙදි ඔයාට කිසිම කරදරයක් වෙන්නෙ නැහැ. මම කැලිප්සෝ."

* * *

ඊළඟ වතාවේ ඇහැරෙද්දි මම සිටියේ ගුහාවක් තුළයි. හැබැයි මම මීට කලින් ගිහින් තිබුණු ගුහා එකක්වත් මේ තරම් හොඳ නැහැ. එහි සිවිලිම පාට ගොඩක පළිඟු මෝස්තරවලින් දිලිසුණා - සුදු, දම් සහ කොළ පාටින්. ඒක හරියට අර වෙළඳ පොලේ ඇති සිහිවටන පළිඟුවක් ඇතුළේ මම ඉන්නවා වගෙයි. පිහාටු කොට්ට සහ කපු ඇතිරිලි දමූ සුව පහසු ඇඳක මම වැතිරී සිටියා. ගුහාව සේද රෙදිවලින් කොටස්වලට බෙදා තිබුණා. ලොකු රෙදි වියන යන්ත්‍රයක් සහ වීණාවක් එක බිත්තියකට හේත්තු කර තිබුණා. අනෙක් බිත්තියේ තිබුණේ කල් තබාගන්න සැකසූ පලතුරු පිරවූ බරණි පිළිවෙළට ඇහිරූ රාක්ක පේළියක්. වියළි බෙහෙත් පැළෑටි සිවිලිමේ එල්ලා තිබුණා: රෝස්මේරි, තයිම් (මින්ට් කුලයේ පැළෑටියක්) සහ තවත් ජාති ගොඩක්. මගේ අම්මා නම් ඒ හැම එකකම නම් දන්නවා ඇති.

ගුහා බිත්තියක් තුළට වද්දා සෑදූ උඳුනක ගිනි දැලූ මත මුට්ටියක් බුබුළු දමමින් තිබුණා. එයින් නිකුත් වුණේ මස් ඉස්ටුවක වගේ ප්‍රණීත සුවඳක්.

මගේ ඔළුව ඇතුළින් පුපුරු ගහනවා වගේ දැනුණු වේදනාව නොසලකා හරින්න උත්සහ කරමින් මම වාඩි වුණා. මම, මගේ අත් දෙක දිහා බැලුවේ ඒවාගේ භයානක ලෙස තුවාල කැළැල් විසිරිලා ඇති කියන විශ්වාසයෙනුයි. ඒ වුණත් ඒවා හොඳින් තිබුණා. ඉස්සරට වඩා ටිකක් වැඩියෙන් රෝස පාට වෙලා තමයි, හැබැයි හිතපු තරම් නරක නැහැ. මම හැඳ සිටි සුදු කපු ටී-ෂර්ට් එකත්, ඉණට පටියක් දැමූ කපු කලිසමත් මගේ ඒවා නෙවෙයි. මගේ කකුල් නග්නව තිබුණා.



ටිජ්ටයිඩට මොකද වුණේ හිතලා හදිසියේ ම මම කලබල වුණා. ඒත් සාක්කු අතගා බලද්දි මගේ පෑන නැවත මතු වූ තැනම තිබුණා.

ඒක විතරක් නෙවෙයි, ස්ටයිජියන් අයිස් බලු තළාවත් මගේ සාක්කුවේ තිබුණා. කොහොමදෝ ඒකත් මං එක්කම ඇවිල්ලා. ඒක නම් ඇත්තටම මාව සැනසුවේ නැහැ.

මම අමාරුවෙන් සිටගත්තා. ගල් පොළොවේ සිසිලස මගේ දෙපතුල්වලට කාවැදුණා. පාපසු හැරුණු මම බලා සිටියේ ඔප දැමූ ලෝකඩ කණ්ණාඩියක් තුළින් මගේ දිහාමයි.

"පොසෙයිඩන්ට ම ඔප්පු වෙච්චාවේ!" මම කෙඳිරුවා. මට තිබුණේ මගේ ඇඟෙන් නැති කරගන්න ඉඩ දෙන්න බැරි රාත්තල් විස්සක් නැති වුණ පෙනුමක්. මගේ කොණ්ඩය මී කූඩුවක් වගෙයි. හෙෆාස්ටස්ගේ රැවුල වගේ ඒය මුදුනින් දැවී ගොස් තිබුණා. මේ වගේ මූණක් තියෙන කෙනෙක් පාරේ යනවා දැක්කොත්, මම කාරයේ දොරවල් අගුළු දමා ගනියි.

මම කණ්ණාඩියෙන් ඉවතට හැරුණා. ගුහා දොරටුව මගේ වම් පසින් තිබුණා. මම දිවා එළිය දෙසට පිය මැන්නා.

ගුහා දොරටුව විවර වී තිබුණේ කොළ පාට දෙණි බිමකටයි. එහි වම් පැත්තේ දේවදාර ගස් ගොන්නකුත්, දකුණු පැත්තේ ලොකු මල් වත්තකුත් තිබුණා. ගලින් නෙළූ සැටර් ප්‍රතිමා හතරක තළාවලින් වතුර මල් හතරක් දෙණියට විසිරෙමින් තිබුණා. කෙලින්ම ඉදිරියෙන් තණ බිම ගලින් සැදුණු වෙරළකට බෑවුම් ව තිබුණා. විලකින් නැගෙන රැළිති පෙරළී ඇවිත් ගල්වල හැපී බිඳුණා. ඒක විලක් කියලා මට දැනුණේ... මෙහෙමයි, මට නිකං ම ඒක දැනුණා. මිරිදිය. කියන්න පුළුවන් වුණේ... මෙහෙමයි, මට නිකං ම ඒක දැනුණා. මිරිදිය. අහස පිරිසිදු ලුණු මිශ්‍රව නැහැ. ඉර එළිය ජල කඳ මත වැටී දිලිසුණා. අහස පිරිසිදු නිල් පාටින් බැබළුණා. එතැන පෙනුණේ ස්වර්ගයක් වගෙයි. ඒ නිසාම මට බයක් දැනුණා, මොකද අවුරුදු ගාණක් මිත්‍යා ලෝකයේ ජීවත් වුණාම, ස්වර්ගය කියන්නේ මැරුණා ම යන තැනක් කියලා ඔයාට ඉගෙන ගන්න ලැබෙනවා.

කැරමල් පාට කොණ්ඩය කරලකට ගොතාගෙන සිටි ගෑනු ළමයා, නම කැලිප්සෝ කියපු කෙනා වෙරළේ සිටගෙන කාත් එක්කදෝ කතා කරමින් සිටියා. වතුරට වැටී දිලිසෙන ඉර එළිය නිසා මට ඒ පිරිමියාව හොඳින් දැකගන්න බැරිවුණත්, එයාලා වාද කරනවා වගෙයි පෙනුණේ. පුරාණ දේව කතාවලින් කැලිප්සෝ ගැන දන්නා

දේ මතක් කරගන්න මම උත්සහ කළා. මම ඒ තරම් මීට කලින් අහලා තිබුණා. ඒත්.. මට මතක් කරගන්න බැරිවුණා. එයා රාක්ෂණියක් ද? එයා වීරයන්ව උගුල්වලට අහු කරගෙන මරනවා ද? ඒ වුණත් එයා එහෙම නපුරු කෙනෙක් නම්, මම තවමත් ජීවතුන් අතර ඉන්නේ ඇයි?

මම එයා දිහාවට හෙමින් සීරුවේ ඇවිද ගියේ මගේ කකුල් තවමත් දරදඬුව තිබුණු නිසයි. තණ බිම බොරළුවලට හැරුණා ම, මම සමබරතාවය රැක ගන්න බිම බලාගෙන ගියා. මම ආපසු ඔළුව ඔසවා බලද්දි ගැහැනු ළමයා සිටියේ තනියමයි. එයා හැඳ සිටි සුදු පාට අත් නැති ග්‍රීක ගවුමේ රවුම් කර වටා රන් පටියකින් හැඩ කර තිබුණා. එයා ඇස් පිස දුඹුරේ අඬමින් ඉඳලා වගෙයි.

"හොඳයි." එයා හිනාවෙන්න උත්සහ කරමින් කිවුවා, "නිදිකුම්බරයා අන්තිමේ දි නැගිටලා."

"ඔයා කාත් එක්ක ද කතා කරකර හිටියේ?" මගේ කටහඬ ඇහුණේ මයික්‍රෝවේව් උඳුනක දාලා ගත්ත ගෙම්බෙකුගේ හඬ වගෙයි.

"ඔහ්... නිකං පණිවිඩකාරයෙක්." එයා කිවුවා. "ඔයාට කොහොමද?"

"මම කොච්චර කාලයක් සිහි නැතුව හිටිය ද?"

"කාලය." කැලිප්සෝ කල්පනාබරව කිවුවා. "කාලය කියන්නේ මෙහෙදි තේරුම් ගන්න අමාරු දෙයක්. ඇත්තටම මම දන්නේ නැහැ, පර්සි."

"ඔයා මගේ නම දන්නව ද?"

"ඔයා හීනෙන් කතා කළා."

මම රතු වුණා. "ඔව්. මට කලිනුත්.... අහ්, කෙනෙක් ඒක කියලා තියෙනවා."

"ඔව්. කවුද ඇනබෙත් කියන්නේ?"

"ඔහ්, අහ්. යාළුවෙක්. අපි දෙන්නා එකට හිටියේ- පොඩ්ඩක් ඉන්න. මම කොහොමද මෙහෙට ආවේ? මම කොහෙද මේ ඉන්නේ?"

අත දිගු කළ කැලිප්සෝ මගේ අවුල් වුණු කොණ්ඩය අතරින් ඇඟිලි දිවෙව්වා. මම කලබලයෙන් ආපස්සට ගියා.

"මට සමා වෙන්න," එයා කිවුවා. "ඔයාට සාත්තු කරන එක මට පුරුද්දට ගිහිල්ලා. ඔයා මෙහෙට ආවේ කොහොමද කියනවා නම්,



ඔයා අහසින් වැටුණා. ඔයාව වැටුණේ වතුරේ අන්න අර හරියට." එයා වෙරළෙන් එපිටට අත දිගු කර පෙන්වුවා. "ඔයාගේ පණ බේරුණේ කොහොමද කියලා මම දන්නේ නැහැ. වතුර ඔයාගේ වැටීම සැහැල්ලු කළා වගෙයි පෙනුණේ. ඔයා කොහෙද ඉන්නේ කියනවා නම්, ඔයා ඉන්නේ ඔජිජියාවේ."

එයා ඒක උච්චාරණය කළේ ඕහ්-ජී-ජී-ආහ් විදිහටයි.

"ඒක සෙන්ට් හෙලෙන්ස් කන්දට කිට්ටුයි ද?" මම ඇහුවේ මගේ භූගෝල විද්‍යා දැනුම ගන්න දෙයක් නැති නිසයි.

කැලිප්සෝ හිනා වුණා. ඒක පුංචි, හික්මවාගත් හිනාවක්, හරියට මම හරිම විහිළුකාරයෙක් කියලා එයාට හිතුණත් මාව අපහසුවට පත් කරන්න එයාට උවමනා නැහැ වගෙයි. හිනා වෙද්දි එයා ගොඩක් ලස්සනයි.

"ඒක කිසිම තැනකට කිට්ටු නහැ, වීර කොල්ලෝ," එයා කිවුවා. "ඔජිජියා කියන්නේ මගේ මායා දූපත. ඒක ඕනෑම තැනක තියෙන, ඒ වගේම කිසිම තැනක නැති තැනක්. ඔයාට මෙහෙදි පරිස්සමෙන් සනීප වෙන්න පුළුවන්. බය වෙන්න දෙයක් නැහැ."

"ඒත් මගේ යාළුවෝ-"

"ඇනබෙත්," එයා කිවුවා. "තව ග්‍රෝවර්රුයි ටයිසනුයි නේද?"

"ඔව්!" මම කිවුවා. "මම ආපහු එයාලා ළඟට යන්න ඕනෑ. එයාලා ඉන්නේ අනතුරක."

එයා මගේ මුහුණ අත ගෑවා, හැබැයි මේ වතාවේ නම් මම පහු බැස්සේ නැහැ. "ඉස්සෙල්ලම විවේක ගන්න. සනීප වෙනකල් ඔයාට යාළුවන්ට කරන්න පුළුවන් උදව්වක් නැහැ."

එයා ඒක කියූ හැටියේ, මට කොයි තරම් මහන්සියි ද කියලා තේරුම් ගියා. "ඔයා... ඔයා දුෂ්ට මන්තරකාරියක් නෙවෙයි නේද?"

එයා ලැජ්ජාවෙන් හිනාවුණා. "ඇයි ඔයා එහෙම හිතන්නේ?"

"මෙකනේ, මට එක සැරයක් සර්සිව මුණ ගැහුණා, එයාටත් ලස්සන දූපතක් තිබුණා. හැබැයි වෙනසකට තිබුණේ එයා පිරිමි අයව රට හාවන්ට හරවන්න කැමති එකයි."

කැලිප්සෝ නැවතත් අර විදිහට හිනාවුණා. "මම නම් ඔයාව රට හාවෙක්ට හරවන්නෑ කියලා පොරොන්දු වෙනවා."

"එහෙනම් මොකෙක්ට ද?"

"මම දුෂ්ට මන්තරකාරියක් නෙවෙයි අනේ," කැලිප්සෝ කිවුවා. "ඒ වගේම මම ඔයාගේ හතුරෙකුත් නෙවෙයි, වීර කොල්ලෝ. දැන් විවේක ගන්න. ඔයාගේ ඇස් දෙනටම පියවීගෙන එනවා."

එයා කිවුවා හරි. මගේ දණහිස් ඔකල ගැහුණා. කැලිප්සෝ මාව අල්ලා ගත්තෙ නැත්නම් මම බොරළු ගොඩේ මුණින් අතට ඇදගෙන වැටෙනවා. එයාගේ කොණ්ඩයෙන් කුරුඳු සුවඳක් හැමුවා. එයා ගොඩක් ශක්තිමත්. එහෙමත් නැත්නම් සමහරවිට මම ගොඩක් දුර්වල ව ඉන්න ඇති. වතුර මල ළඟ තිබුණු කුෂන් කළ බංකුව වෙතට මාව කැඳවාගෙන ගිය එයා මට හාන්සි වෙන්න උදවු කළා.

"විවේක ගන්න," එයා නියෝග කළා. කුරුඳු සහ ජුනිපර් පඳුරුවල සුවඳත්, වතුර මලේ හඬත් අතරින් මම නින්දට වැටුණා.

***

ඊළඟ වතාවේ මම අවදි වුණේ රාත්‍රී කාලයකයි, ඒත් ඒ එදාම ද, නැත්නම් දවස් ගාණකට පස්සෙ රැයක් ද කියලා මට හිතාගන්න බැරිවුණා. ගුහාවේ ඇඳ මත සිටි මම නැගිට, ලෝගුවක් ඇඟ වටේ ඔතාගෙන හෙමින් හෙමින් එළියට ඇවිදගෙන ගියා. අහසේ තරු අති දීප්තිමත්ව පායා තිබුණා - ඒවා දහස් ගාණක් පායා තිබුණේ හරියට ඔයා නාගරික පරිසරයකින් මිදුණ වෙලාවට විතරක් දකගන්න ලැබෙනවා වගෙයි. ඈතඉඳන් මට උගන්වා තිබුණු තරු රටා හැමෙකක්ම මට අඳිනගන්න හැකි වුණා: මකර රාශිය, පෙගසස්, ධනු රාශිය. ඒ වගේම දකුණු දිගන්තය කිට්ටුවෙන් අලුත් තරු රටාවකුත් තිබුණා: ඒ තමයි දඩයක්කාරිය. පසුගිය ශීත සෘතුවේ මියගිය අපේ යාළුවෙකුට උපහාරයක් ලෙස මතු වූ තරු රටාව.

"පර්සි, ඔයා මොනවද බලන්නේ?"

මම, මගේ ඇස් ආපසු පොළොවට ඇදගත්තා. අහසේ දිදුළන තරු කොයි තරම් පුදුමාකාර වුණත්, කැලිප්සෝ ඒ වගේ දෙගුණයක් දීප්තිමත් වුණා. මං අදහස් කළේ, මම ආදරයට අධිපති දෙවඟන, ඇෆ්‍රොඩයිට්ව හැබැහින් දකලා තිබුණා, ඒ වගේම මේ කතාව මම ඈහෙන්න කිවුවොත් එයා මාව අළු දූවිලිවලට පුපුරවලා දාන්නත් ඉඩ තියෙනවා, ඒ වුණත් මට නම් එයාට වඩා කැලිප්සෝ ගොඩක් ලස්සන වුණා. මොකද එයාට තිබුණේ හරිම ස්වභාවික පෙනුමක්, හරියට එයා ලස්සන වෙන්න උත්සහ කරන්නේවත්, ඒ ගැන තැකීමක් කරන්නේවත්



නැහැ වගෙයි. කොණ්ඩා කරලත්, සුදු ගවුමත් එක්ක එයාව පෙනුණේ හඳ එළියෙන් දිලිසෙනවා වගෙයි. එයාගේ අතේ පුංචි පැළයක් තිබුණා. එහි රිදී පාට සියුමැලි මල් තිබුණා.

"මම මේ බලාගෙන හිටියේ..." මම ඇහි පිය නොහෙළා එයා දිහා බලා ඉන්න බව මටම තේරුණා. "අන්... මට අමතක වුණා."

එයා මෘදු ලෙස හිනාවුණා. "හොඳයි. දැන් ඇහැරලා ඉන්න එකේ, මට මේවා පැළ කරන්න උදවු කරන්න ඔයාට පුළුවන්."

එයා මගේ අතට දුන් පැළයේ යට පස් කැටිත්තක් සමග මුල් තිබුණා. මම එය අතේ තබාගෙන සිටිද්දී එහි මල් දිලිසුණා. ගෙවතු වැඩවලට පාවිච්චි කරන ඉස්කෝප්පයක් අතට ගත් කැලිප්සෝ මාව උයන කෙළවරකට කැඳවාගෙන ගොස්, වළක් හාරන්න පටන් ගත්තා.

"ඔක මූන්ලේස් පැළයක්," කැලිප්සෝ කියා දුන්නා. "ඒවා පැළ කරන්න පුළුවන් රෑට විතරයි."

මල් පෙති අතර රිදී පාට එළියක් සැලෙන හැටි මම බලා සිටියා. "ඒක මොනවද කරන්නේ?"

"කරන්නේ?" කැලිප්සෝ කල්පනාබරව කිවුවා. "ඒක ඇත්තටම කිසි දෙයක් කරන්නේ නැහැ, මං හිතන්නේ. ඒක ජීවත් වෙනවා, එළිය දෙනවා, ලස්සන බෙදනවා. ඒක තව මොනවා හරි කරන්න ඕනෑ ද?"

"මං හිතන්නෙ නැහැ," මම කිවුවා.

එයා පැළය ගනිද්දි අපේ අත් එකිනෙක හමු වුණා. එයාගේ අතැඟිලි උණුසුම්ව දැනුණා. මූන්ලේස් පැළය පැළ කළ එයා ආපස්සට ඇවිත්, එයාගේ වැඩේ මැන බැලුවා. "මං මගේ උයනට ආදරෙයි."

"ඒක ගොඩාක් ලස්සනයි," මම එකඟ වුණා. මං කියන්නේ, ඇත්තටම මම ගෙවතු වැඩ ගැන උනන්දු කෙනෙක් නෙවෙයි, ඒ වුණත් කැලිප්සෝ ලතා මණ්ඩපයක් වැහෙන්න වෙනස් පාට හයක රෝස වවලා, හනීසක්ල් ගරාදි වැටක් පිරෙන්න හදලා තිබුණා. රතු සහ දම් පාට මිදි පොකුරුවලින් බර වූ එයාගේ මිදි වැල් දැක්කොත් ඩයනයිසියස් එතැනම ඉඳගෙන හිඟාකන්න පටන් ගනී.

"අපේ ගෙදරත්," මම කිවුවා. "ගෙවත්තක් හදාගන්න මගේ අම්මට හැමදාම උවමනාව තිබුණා."

"ඉතින් ඇයි එයා එකක් හදාගත්තෙ නැත්තේ?"

"මෙතැයි. අපි පදිංචි වෙලා ඉන්නෙ මැන්හැටන්වල, තට්ටු නිවාසෙක නේ."

"මැන්හැටන්" තට්ටු නිවාස?"

මම එයා දිහා බලා සිටියේ පුදුමයෙන්. "මං කියන්නේ මොනවා ගැන ද කියලා ඔයා දන්නෙ නැහැ, නේද?"

"මං කියන්නෙ නැහැ. මම මිරිඩියාවෙන් පිටවෙලා නැහැ... සෑහෙන කාලෙකින්."

"හොඳයි. මැන්හැටන් කියන්නේ ලොකු නගරයක්. එහෙ ගෙවතු වගා කරන්න තරම් ඉඩක් නැහැ."

කැලිප්සෝගේ ඇහිබැම එකට හා වුණා. "ඒක නම් අහන්නත් දුකයි. හර්මීස් කාලෙන් කාලෙට මාව බලන්න එනවා. පිටත ලෝකය ගොඩක් වෙනස් වෙලා කියලා එයා මට කියනවා. ඒත් ඔයාලට ගෙවත්තක් තියාගන්නත් බැරි තරමට ඒක වෙනස් වෙලා ඇති කියලා මම හිතුවෙ නැහැ."

"ඇයි ඔයා ඔයාගේ දූපතෙන් පිටට යන්නෙ නැත්තේ?"

එයා බිම බලාගත්තා. "මේක තමයි මට ලැබුණු දඬුවම."

"මොකටද? මොනවද ඔයා කළේ?"

"මම? මුකුත් නැහැ. ඒත් මගේ තාත්තා නම් ගොඩක් දේවල් කළා. එයාගෙ නම ඇට්ලස්."

ඒ නම ඇහෙද්දි මගේ කොඳු නාරටිය දිගේ හිරියක් පැතිරුණා. පහුගිය ශීත කාලුවේ දී මට ටයිටන් ඇට්ලස්ව මුණ ගැහුණා. හැබැයි ඒක සුහද හමුවක් නම් වුණේ නැහැ. එයා මම ආදරේ කරන හැම කෙනෙක්වම වගේ මරන්න උත්සහ කළා.

"ඒ වුණාට," මම කිවුවේ දෙගිඩියාවෙන්, "ඔයාගේ තාත්තා කරපු දේවල්වලට ඔයාට දඬුවම් දෙන එක සාධාරණ නැහැ නේ. මම ඇට්ලස්ගේ තවත් දුවෙක්ව දැනගෙන හිටියා. එයාගේ නම ෂෝයි. එයා මට මුණ ගැහිලා තියෙන නිර්භීත ම අයගෙන් කෙනෙක්."

කැලිප්සෝ ගොඩක් වෙලා මගේ දිහා බලාගෙන හිටියා. එයාගේ ඇස් පිරිලා තිබුණේ දුකකින්.

"ඇයි මේ?" මම ඇහුවා.



"ඔයා- ඔයාට දත් කකියයි ද, මගේ වීර කොල්ලෝ? ඔයා හිතනවා ද ඉක්මනට මෙතනින් පිටවෙලා යන්න ඔයා ලැස්තියි කියලා?"

"මොකක්?" මම ඇහුවා. "මං දන්නෙ නැහැ." මම මගේ කකුල් හොලවා බැලුවා. ඒවා තවමත් දරදඬුව තිබුණා. දිගු වේලාවක් සිටගෙන සිටීම නිසා දනහිසක් මට කරකැවිල්ලක් දෙනමින් තිබුණා. "ඔයාට ඕනෑ මාව යවන්න ද?"

"මම..." එයාගේ කටහඬ බිඳුණා. "මම උදේට ඔයාව බලන්න එන්නම්. හොඳට නිදාගන්න."

එයා වෙරළ දිහාවට දිවුවා. එයා කවදාවත් නොපෙනී යන තුරු බලා ඉන්නවා ඇරෙන්න වෙන කිසිවක් කර කියාගන්න බැරි තරමට මම ව්‍යාකූල වී සිටියා.

***

කොයි තරම් කාලයක් ගත වුණා ද, මම හරියට ම දැන සිටියේ නැහැ. කැලිප්සෝ කිවුවත් වගේ, මේ දූපතේ දී කාලය ගැන අවබෝධයක් ගන්න අමාරු වුණා. මම පිට වී යා යුතු බව මම දැන සිටියා. අඩුම තරමේ, මගේ යාළුවෝ මං ගැන කරදරෙන් ඇති. තත්ත්වය නරක ම අතට හැරිලා නම්, එයාලා බරපතළ අනතුරක වැටිලා වෙන්නත් පුළුවන්. අඩු තරමේ ඇනබෙත්ට මිනි කන්දෙන් පිට වෙන්නවත් පුළුවන් වුණා ද කියලා මම දැන සිටියේ නැහැ. සිය වතාවක් ම සහකම්පන සම්බන්ධය පාවිච්චි කරලා ග්‍රෝවර්ට කතා කරන්න මම උත්සහ කළත්, මට සම්බන්ධය ඇති කරගන්න බැරිවුණා. එයාලා හොඳින් ඉන්නවා ද නොදැන ඉන්න එක මට පෙනෙන්න බැරි වැඩක් වුණා.

අනෙක් අතට බලද්දී, මම හිටියේ ඇත්තටම දුර්වලවයි. පැය දෙක තුනකට වඩා දෙපයින් හිටගෙන ඉන්නවත් මට බැරිවුණා. සෙන්ට් හෙලේන්ස් කන්දේ දී මම කළ දේ මොකක් වුණත්, එයින් මම කොහෙත්ම බලාපොරොත්තු නොවූ විදිහට මගේ ශක්තිය පිරිහී තිබුණා.

මාව සිරකාරයෙක් වෙලා වගේ නම් දැනුණේ නැහැ. මට එහිදි වේගාස්වල තිබුණු ලෝටස් හෝටලය සහ කැසිනෝව සිහි වුණා. එහිදි පුදුමාකාර 'ගේම්' ලෝකයකට ආකර්ෂණය වී ගිය මට තව පොඩ්ඩෙන් මම ආදරය කරන හැම දෙයක්ම අමතක වෙලා යනවා. ඒත් ඔජිජියා දූපත නම් කොහෙත්ම එහෙම තැනක් නෙවෙයි. මට නිතරම

ඇනබෙත්ව, ග්‍රෝවර්ව සහ ටයිසන්ව සිහි වුණා. මම මෙතැනින් පිට වී යා යුත්තේ ඇයි කියලා මට හරියටම මතක තිබුණා. ඒත් මට... ඒක කරන්න බැරිවුණා. ඒ වගේම එතැන කැලිප්සෝත් සිටියා.

එයා කවදාවත් එයා ගැන වැඩිය කතා කළේ නැහැ. ඒ නිසාම මට එයා ගැන වැඩි වැඩියෙන් දැන ගන්න ඕනෑ වුණා. සමහර වෙලාවට මම දෙණි බිමේ වාඩි වී, නෙක්ටාර් තොල ගාමින් මල්වලට, වලාකුළුවලට හෝ විලෙන් පෙනෙන ඡායාවන්වලට සිත ඒකාග්‍ර කරගන්න උත්සහ කරනවා. ඒත් මගේ අවධානය ඇත්තටම යොමු වෙන්නේ වැඩ කරමින් සිටින කැලිප්සෝ වෙතයි; එයා උරහිසෙන් කොණ්ඩය පිස දමන විදිහ සහ වළක් හෑරීමට දණ ගසාගන්නා සෑම විටෙකම එයාගේ මුහුණට වැටෙන පුංචි කෙස් රොදවල් දිහාවටයි. සමහර වෙලාවට එයා අත දිගු කරගෙන සිටිද්දි ගස් අතරින් පියඹා එන කුරුල්ලෝ එහි වසුවා - ලොරිකිට්ලා, ගිරවු, කොබෙයියෝ. උන්ට සුබ උදෑසනක් පතන එයා, කුරුලු කූඩුවේ විස්තර කොහොමද කියලා අහනවා, සැනෙන වෙලාවක් කිචි-බිචි කියමින් එයාගේ අතේ ඉන්න කුරුල්ලෝ. ආපසු පියඹා යන්නේ සතුටින් වගෙයි. ඒ වෙලාවට කැලිප්සෝගේ ඇස් දිලිසෙනවා. මගේ දිහා බලන එයා මට හිනාවක් පානවා. ඒත් ඒ ඉක්මනින් ම වගේ එයාගේ මූණට නැවතත් අර දුක්බර පෙනුම ඇදි ඇවිත්. එයා අහක බලා ගන්නවා. එයාගේ හිතට වධ දෙමින් තිබුණේ මොනවාද කියලා මට නම් තේරුනේ නැහැ.

එක රැයක අපි වෙරළේ වාඩි වී රෑ කෑම ගනිමින් සිටියා. අදෘශ්‍යමාන සේවකයෝ විසින් මස් ඉස්ටුවක් සහ ඇපල් සයිඩර් තැබූ මේසයක් සූදානම් කර තිබුණා. ඒක ඒ හැටි රසවත් කියලා ඔයාට නම් හිතෙන්නෙ නැතුව ඇති, ඒ ඔයා ඒවා රස බලා නැති නිසයි. මම දූපතට මුලින්ම ආව කාලයේ අදෘශ්‍යමාන සේවකයින්ව මගේ සැලකිල්ලට හසු වුනේ නැහැ, ඒත් ඇඳත් ඉබේම සැකසෙන බවත්, කෑම ඉබේම පිසෙන බවත්, නොපෙනෙන අත්වලින් ඇඳුම් පිරිසිදු කර නමන බවත් ටික කාලෙකින් මට තේරුම් ගියා.

කොහොම හරි, කැලිප්සෝ සහ මම රෑ කෑම මේසයේ වාඩි වී සිටියා. ඉටි පන්දම් එළියෙන් එයාව ගොඩක් ලස්සනට පෙනුණා. නිව්යෝක් නගරය ගැන සහ අර්ධ-ලෝහිත කඳවුර ගැන එයාට විස්තර කරමින් සිටි මම, ඊට පස්සේ අපි ඇපල් ගෙඩියක් බෝලයට අරන් සෙල්ලම් කරද්දි ග්‍රෝවර් ඒක එක කටට කාපු හැටි එයාට කිවුවා.



එයාගේ හින් ඇදගන්නා මදහස පෙන්වමින් එයා හඬ නගා සිනාසෙද්දි අපේ ඇස් එකට ගැටුණා. මොහොතකින් එයා බැල්ම පහත හෙළුවා.

"ඔන්න ඔයා ආයෙමත් ඒක කරනවා," මම කිවුවා.

"මොකක්ද?"

"ඔයා හැම වෙලාවෙම පස්ස ගහනවා, හරියට ඔයා සතුටු නොවී ඉන්න උත්සහ කරනවා වගේ."

එයා සයිඩර් වීදුරුව මත ඇස් රඳවා ගත්තා. "මම ඔයාට කිවුවත් වගේ, පර්සි, මම ඉන්නේ දඬුවමකට යටත් වෙලා. ශාපයකට කිවුවත් වැරදි නැහැ."

"කොහොමද? මට කියන්න. මට ඕනෑ ඔයාට උදවු කරන්න."

"එහෙම කියන්න එපා. අනේ, කරුණාකරලා එහෙම කියන්න එපා."

"දඬුවම මොකක්ද කියලා මට කියන්න."

එයා අඩක් අවසන් කළ ස්ටූ බඳුන අත් පිස්නාවකින් වැසුවා, ඒත් එක්කම නොපෙනෙන සේවකයෙක් එය මේසයෙන් ඉවත් කළා. "පර්සි, මේ දූපත, ඔජීජියාව තමයි මගේ ගෙදර, මම ඉපදුණ තැන. ඒත් ඒකම තමයි මගේ හිර ගෙදරත්. මම ඉන්නේ... නිවාස අඩස්සියක, මං හිතන්නේ ඔයාලා ඒකට කියන්නෙ එහෙමයි. මට කවදාවත් ඔයාගේ මැන්හැටන් බලන්න එන්න බැහැ. වෙන කිසිම තැනකට යන්නත් බැහැ. මම මෙහෙ තනිවෙලා ඉන්නේ."

"ඔයාගේ තාත්තා ඇට්ලස් වුණ නිසා."

එයා ඔළුව වැනුවා. "දෙවිවරු එයාලගේ හතුරන්ව විශ්වාස කරන්නෙ නැහැ. ඒක සාධාරණයි. මම මැසිවිලි කියන්න හොඳ නැහැ. මොකද සමහර හිර ගෙවල් මගේ එක තරම් හොඳ නැහැ නේ."

"ඒත් ඒක සාධාරණ නැහැ," මම කිවුවා. "එයාගේ නෑයෙක් වුණ පළියට ඔයා එයාට උදවු කරා කියලා කියන්නේ කොහොමද. මම දැනගෙන හිටපු අනිත් දූව, ෂෝයි නයිට්ෂේඩ් - එයා ඇට්ලස්ට විරුද්ධව සටන් කළා. එයාව හිර කරලා තිබුනේ නැහැ."

"ඒත්, පර්සි," කැලිප්සෝ මෘදුව කිවුවා. "පළවෙනි යුද්ධයේ දි මම එයාට උදවු කළා. එයා මගේ තාත්තා නේ."

"මොනවා? ඒත් ටයිටන්ලා කියන්නෙ නපුරෝ නේ!"

"ඇත්තටම එයාලා එහෙමද? එයාලා හැමෝම? නැම වෙලාවෙම?" එයා දෙතොල් තදින් පියවා ගත්තා. "මට කියන්න, පර්සි. මට ඔයත් එක්ක වාද කරන්න ඕනෑ නැහැ. ඒත් ඔයා දෙවිවරුන්ට උදවු කරන්නේ එයාලා හොඳ නිසා ද, එහෙමත් නැත්නම් එයාලා ඔයාගේ පවුලේ අය නිසා ද?"

මම ඒකට උත්තර දුන්නේ නැහැ. එයා පෙන්වූ කාරණයත් හරි. පහුගිය ශීත කාලුවේ, ඇනබෙත් සහ මම ඔලිම්පස් බේරගත්තට පස්සේ, දෙවිවරු මාව මරන්න ඕනෑ ද, නැති ද කියලා තීරණය කරන්න විවාදයක් පැවැත්වූවා. ඒක හොඳයි කියන්නෙ කොහොමද. ඒ වුණාට තවමත්, එයාලට උදවු කරන්න ඕනෑ කියලා මට දැනුණේ පොසෙයිඩන් මගේ තාත්තා නිසයි.

"සමහරවිට යුද්ධයේ දී මම වැරදි ඇති," කැලිප්සෝ කිවුවා. "ඒ වගේම සාධාරණ වෙනවා නම්, දෙවිවරු මට හොඳින් සැලකුවා. එයාලා ඉඳලා හිටලා මාව බලන්න එනවා. එයාලා මට පිටත ලෝකයේ ආරංචි අරන් එනවා. ඒත් එයාලට ආපහු යන්න පුළුවන්. මට බැහැ."

"ඔයාට යාළුවෝ කවුරුවත් නැද්ද?" මම ඇසුවා. "මං කිවුවේ... මෙහෙ ඔයත් එක්ක වෙන කවුරුවත් ම ජීවත් වෙන්නෙ නැද්ද? මේක හරිම ලස්සන තැනක් නේ."

එයාගේ කම්මුල හරහා කඳුළක් ගලා ගියා. "මම... මම මටම පොරොන්දු වෙලා ඉන්නෙ මේ ගැන කතා කරන්නෙ නැහැ කියලා. ඒත්-"

විලට එපිටින් මතු වූ ගිගුරුම් හඬකින් එයාගේ කතාවට බාධා වුණා. ක්ෂිතිජයේ ආලෝකයක් මතු වුණා. වඩ වඩාත් දීප්තිමත් වූ එය ගිනි කඳක් වගේ විල හරහා අපි ඉදිරියට එන්න ගත්තා.

නැගී සිටි මම කඩුවට අත යැවුවා. "මොකක්ද ඒ?"

කැලිප්සෝ සුසුමක් හෙළුවා. "අමුත්තෙක්."

ගිනි කඳ වෙරළට ළඟා වෙද්දි නැගී සිටි කැලිප්සෝ කඳ නමා එයට ආචාර කළා. ගිනි දැලු පහ වී යද්දි, අපි ඉදිරියේ සිටගෙන සිටියේ අළු පාට පිට කබායකින් සැරසුණු පිරිමියෙක්. එයා එක කකුලක් ලෝහ ආධාරකයක රඳවාගෙන සිටියා. එයාගේ රැවුලෙන් සහ කොණ්ඩයෙන් දුම් පිට වුණා.



"හෙෆාස්ටස් උතුමාණෙනි," කැලිප්සෝ කිවුවා. "මේක කලාතුරකින් ලැබෙන ගෞරවයක්."

ගිනි දෙවියා ගෙරෙව්වා. "කැලිප්සෝ. හැමදාමත් වගේම ලස්සනයි. කරුණාකරලා, ඔයා අපිට ටික වෙලාවක් දෙනව ද, මගෙ කෙල්ලේ? මට අපේ ඉලන්දාරියා, පර්සි ජැක්සන් එක්ක වචනයක් කතා කරන්න තියෙනවා."

***

කෑම මේසයට නුහුරු ලෙස වාඩි වූ හෙෆාස්ටස් පෙප්සි ඇණවුම් කළා. කෑනයක් රැගෙන ආ අදෘශ්‍යමාන සේවකයා කලබලෙන් ඒක විවර කරද්දි දෙවියාගේ ඇඳුම් පුරා සෝඩා ඉහිරුණා. ගර්ජනා කළ හෙෆාස්ටස් නොසරුප් වදන් දෙක තුනක් කියා, කෑනයට අතින් ගසා විසි කළා.

"මෝඩ සේවකයෝ," එයා කෙඳිරුවා. "මේ කෙල්ලට උවමනා හොඳ රොබෝලා ටිකක්. එයාලා කවදාවත් වැඩ වරද්දන්නෙ නැහැ!"

"හෙෆාස්ටස්," මම කතා කළා. "මොනවද සිද්ධ වෙන්නෙ? ඇනබෙත්ට-"

"එයා හොඳින්," දෙවියා කිවුවා. "උපාය දක්ෂ කෙල්ලෙක්, එයා නම්. ආපහු පාර හොයාගෙන ඇවිත්, මට මුළු කතාව ම කිවුවා. එයා ඉන්නෙ දුකින් පිස්සු වැටිලා, ඔයා දන්නවා නේ."

"මම හොඳින් ඉන්නවා කියලා ඔයා එයාට කිවුවෙ නැද්ද?"

"ඒක මම කියලා හරියන්නෙ නෑ," හෙෆාස්ටස් කිවුවා. "හැමෝම හිතන්නෙ ඔයා මැරිලා කියලා. ඔයා ඉන්නෙ කොහෙද කියලා එයාලට කියන්න කලින්, ඔයා ආපහු එනවාමද කියලා ටක්කෙටම දැනගන්න මට ඕනෑ වුණා."

"ඇයි ඔයා එහෙම කියන්නෙ?" මම ඇසුවා. "ඇත්තටම මම ආපහු එනවා!"

හෙෆාස්ටස් මගේ දිහා බලා සිටියේ සැකයෙන් වගෙයි. එයා සාක්කුව තුළින් යමක් එළියට ගත්තා - අයිපොඩ් එකක ප්‍රමාණයේ ලෝහමය තැටියක්. එයා බොත්තමක් එබුවා ම එය කුඩා ප්‍රමාණයේ රූපවාහිනියකට විහිදුණා. එහි තිරය මත වූයේ සෙන්ට් හෙලේන්ස් කන්දෙන් යෝධ ගිනි සහ අළු කඳන් අහසට ඇදී යන අයුරු දැක්වෙන පුවෘත්ති විකාශයක්.

*"නව දුරවත් විද්‍යුත්ය ඊට පෙර කවදාවත් අභිභවනීයයි,"* ප්‍රවෘත්ති නිවේදකයා කියමින් සිටියා. *"පුරාවෘත්තගත උදෙසා මිලියන ගණනක සමීප ප්‍රජාවක් ඒ අවධිය ඉවත් [illegible] බලධාරීන් [illegible] කර ඇත. ඒ අතරතුරදී, විද්‍යුත් කාලගුණ [illegible] වූ [illegible] සහ [illegible] ඉහළ [illegible] ඉවත් කරයි. [illegible] පොල්ලක් කන්ද ආශ්‍රිත [illegible] [illegible] මාර්ග මේ වන විට [illegible] ඇත. [illegible] හානි සිදුවීමක් වාර්තා වී නැතත්, [illegible] [illegible] සහ [illegible] [illegible]-"*

හොපස්ටස් එය ක්‍රියා විරහිත කළා. "ඔයා කරලා තියෙන්නෙ එහෙ මෙහෙ පිපිරීමක් නෙවෙයි."

මම හිස් ලෝකඩ තිරය දිහා බලා සිටියා. මිනිස්සු මිලියන භාගයක් ඉවත් කරලා? තුවාල. අසනීප. මම මොනවද මේ කරලා තියෙන්නෙ?

"ටෙලිකීන්ලා සීසීකඩ," දෙවියා මට කිවුවා. "සමහරු වාෂ්ප වෙලා. සමහරු කොහොම හරි පැනගෙන. ඒකෙ සැකයක් නෑ. උන්ට ආයේ ළඟකදි නම් මගේ කම්මල පාවිච්චි කරන්න බැරි වෙයි. අනිත් අතට, මටත් ඒක පාවිච්චි කරන්න බැරි වෙයි. පිපුරුමෙන් නිදාගෙන හිටපු ටයිෆුන්ව ඇවිස්සිලා තියෙනවා. අපිට ටික කාලයක් ඉඳලා බලන්න වෙනවා-"

"මට එයාව නිදහස් කරන්න පුළුවන්කමක් තිබුනේ නැහැ, නේද? මං කියන්නේ, මම එච්චර බලවත් නැහැ නේ!"

දෙවියා ගෙරෙව්වා. "එච්චර බලවත් නැද්ද, එහ්? මං ඇවටෙයි. ඉලන්දාරියා. ඔයා තමයි පෘථිවිය සොලවන්නාගේ පුතා. ඔයාගේ ශක්තිය ගැන ඔයාම දන්නෙ නැහැ."

එයාගෙන් මට අහන්න ඕනෑ වුණු අන්තිම දේ ඒකයි. ඒ කන්දේ දි මම හිටියේ මාව පාලනය කරගෙන නෙවෙයි. මම කොයි තරම් ශක්තියක් නිදහස් කරා ද කියනවා නම්, තව පොඩ්ඩෙන් මම මගේ මුළු ජීවයම හිඳෙන්න ඇරලා, මාවම වාෂ්ප කරගන්නවා. දැන් මට හොයාගන්න ලැබුණු විදිහට තව පොඩ්ඩෙන් මම වයඹ දිග ඇමරිකාව විනාශ කරන්නත්, දෙවිවරු විසින් හිරගත කළ බිහිසුණුම රාක්ෂයාව අවදි කරන්නත් ඉඩ තිබුණා. සමහරවිට මම ගොඩක් අනතුරුදායක කෙනෙක් වෙන්න ඇති. සමහරවිට මම මැරිලා කියලා මගේ යාළුවන්ට හිතන්න අරින එක වඩාත් පරිස්සම් ඇති.

"ග්‍රෝවර්ටයි ටයිසන්ටයි කොහොමද?" මම ඇහුවා.



හොපස්ටස් ඔළුව වැනුවා. "ආරංචියක් නැහැ. මට බය, වංගගිරිය එයාලව අරගෙන ද කියලා."

"එතකොට මම මොනවද කරන්න ඕනෙ?"

හොපස්ටස්ගේ මූණ ඇකිළුණා. "මේ නාකි අබ්බගාතයාගෙන් කවදාවත් උපදෙස් ඉල්ලන්න එපා, ඉලන්දාරියා. ඒත් මම ඔයාට දෙයක් කියන්නම්. ඔයාට මගේ නෝනව මුලිච්චි වෙලා තියෙනවා ද?"

"ඇෆ්‍රොඩයිට්."

"එයා තමයි. එයා මහ ඇවටිලිකාරියක්, කොල්ලෝ. ආදරෙන් පරිස්සම් වෙලා ඉන්න. ඒකට පුළුවන් ඔයාගේ මොළේ අඹරලා දාලා, උඩ යට මාරු කරලා හිතන්නත්, හරි වැරැද්ද පටලගන්නත් සලස්වන්න."

ගිය ශීත කාලයේ දි, කාන්තාරයක් මැද, සුදු කැඩිලැක් රථයක පිටුපස අසුනේ දි මම ඇෆ්‍රොඩයිට් සමග කතාබහ කළ හැටි සිහිවුණා. එයා මං ගැන විශේෂ උනන්දුවක් අරගෙන, මගේ ජීවිතේ ආදර අංශය අමාරු කරනවා කියලා කිවුවේ එයා මට කැමති නිසයි.

"මේකත් එයාගේ සැලැස්මේ කොටසක් ද?" මම ඇහුවා. "මාව මෙහෙට වැටෙන්න සැලැස්සුවේ එයා ද?"

"බාග වෙලාවට. එයා කරන දේවල් කියන්න අමාරුයි. ඒත් ඔයා මෙතැනින් යන්න තීරණය කරනවා නම් - හැබැයි හරි වැරැද්ද මොකක්ද කියලා මම කියන්නෙ නැහැ - ඔයාගේ ගවේෂණයට විසඳුමක් දෙන්න මම පොරොන්දු වෙනවා. ඔයාට ඩෙඩලස් ළඟට යන පාර කියන්න මම පොරොන්දු වුණා. හොඳයි දැන්, මේකයි වැඩේ. අරියඩ්නිගේ නූලෙන් කිසිම වැඩක් නැහැ. කොහෙත්ම නැහැ. ඇත්තටම, නූල වැඩ කරනවා. අන්න ඒ නිසයි ටයිටන්ලා ඒක පස්සෙ යන්නේ. ඒ වුණත් වංගගිරිය හරහා යන්න හොඳම ක්‍රමය තමයි... තිසියස්ට කුමාරිකාවගේ උදවු ලැබුණා. ඒ කුමාරිකාව සාමාන්‍ය මනුෂ්‍ය දුවක්. දේව ලේ බිංදුවක්වත් එයාගේ ඇඟේ තිබුනේ නැහැ. ඒ වුණාට එයා ගොඩක් දක්ෂ කෙල්ලෙක්, ඒ වගේම එයාට දකින්න හැකියාව තිබුණා, කොල්ලෝ. එයාට හැමදේම ගොඩක් පැහැදිලිව පෙනුණා. ඉතින් මං කියන්නේ - වංගගිරිය හරහා යන්න ඕනෑ විදිහ ඔයා දන්නවා කියලා මං හිතනවා."

අන්තිමේ දි ඒක මගේ හිතට කාවැදුණා. මීට කලින් මට ඒක නොතේරුණේ ඇයි? තේරා කිවුවා හරි. මේ මුළු කාලය පුරාවටම පිළිතුර මගේ ළඟ තිබිලා.

"ඔව්," මම කිවුවා. "ඔව්, මම දන්නවා."

"එහෙනම් ඔයා මෙහෙන් යනවද නැද්ද කියලා තීරණය කරන්න වෙනවා."

"මම..." මට ඕනෑ වුණේ ඔව් කියන්නයි. ඇත්ත වශයෙන්ම මම ඒක කරනවා. ඒත් වචන මගේ උගුරේ හිර වුණා. නොදැනුවත්වම මගේ ඇස් විල දිහාවට හැරී තිබුණා. හදිසියේ ම මෙතැන හැර දා යනවා කියන අදහස සෑහෙන අමාරු දෙයක් වගේ දැනෙන්න ගත්තා.

"දැන්ම තීරණයක් ගන්නෙපා," හෙෆාස්ටස් අවවාද කළා. " උදේ වෙනකල් කල් ගන්න. ඉර පායන වෙලාව තීරණ ගන්න හොඳ වෙලාවක්."

"ඩෙඩලස් අඩු තරමේ අපිට උදවු කරයි ද?" මම ඇසුවා. "මං කියන්නේ, එයා වංගගිරිය හරහා යන්න ලූක්ට කියලා දුන්නොත්, අපි ඉවරයි. මම හීනෙන් දැක්කා... ඩෙඩලස් එයාගේ බෑණාව මරන හැටි. එයා එපා කරපු තපුරු කෙනෙක් වෙලා-"

"අති දක්ෂ නිමැවුම්කාරයෙක් වෙලා ඉන්න එක ලේසි දෙයක් නෙවෙයි," හෙෆාස්ටස් ගොරවන හඬින් කිවුවා. "හැම වෙලාවෙම තනි වෙලා. හැමෝම එයාව තේරුම් ගන්නෙ වැරදියට. ඉතින් සැර පරුෂ එපා කරපු කෙනෙක් වෙන්න, දරුණු අත්වැරදීම් වෙන්න සෑහෙන ඉඩක් තියෙනවා. යන්ත්‍ර සූත්‍ර එක්ක වැඩ කරනවාට වඩා මිනිස්සු එක්ක වැඩ කරන එක ගොඩක් අමාරුයි. ඒ වගේම ඔයා මනුස්සයෙක්ව බින්දොත්, එයාව ආපහු හදන්න බැහැ."

හෙෆාස්ටස් ඇඳුම් මත ඉහිරී තිබුණු අන්තිම පෙප්සි බිඳු කීපයත් ගසා දැමුවා.

"ඩෙඩලස්ගේ පටන් ගැන්ම හොඳයි. එයා අරියඩ්නි කුමාරිකාවටයි තීසියස්ටයි උදවු කළේ එයාලා ගැන දුක හිතිච්ච නිසා. එයා හොඳ වැඩ කරන්න උත්සහ කළා. ඒ හින්දම එයාගේ ජීවිතේ හැම දෙයක්ම නරක අතට හැරුණා. ඒක සාධාරණයි ද?" දෙවියා උරහිස් ඇකිළුවා. "ඩෙඩලස් ඔයාලට උදවු කරයි ද මං දන්නෑ.



කොල්ලෝ. ඒත් එයාගේ කම්මලට ගිහිල්ලා, එයාගේ මිටියෙන් වැඩ කරලා බලනකම් කෙනෙක්ව මනින්න එපා, හරි ද?"

"මම- මම බලන්නම්."

හෙෆාස්ටස් නැගිට්ටා. "ආයුබෝවන්, ඉලන්දාරියා. ඔයා කළේ හොඳ දෙයක්, ටෙලිකීන්ලව විනාශ කරපු එක. ඒ නිසා මම ඔයාව කවදාවත් අමතක කරන්නෙ නැහැ."

ඒ සමුගැනීමේ නිශ්චිත අවසානයක් දැනුණා. ඒත් එක්කම ගිනි කඳකට හැරුණු එයා ජල තලාව හරහා බාහිර ලෝකයට පිටත් වුණා.

***

මම පැය කීපයක් ම වෙරළේ ඇවිදිමින් සිටියා. අන්තිමේට මම ආපහු දෙණිබිමට යද්දි සෑහෙන වෙලාවක් ගිහිල්ලා. සමහරවිට ඒ පාන්දර හතරට පහට විතර වෙන්න ඇති. ඒත් කැලිප්සෝ තවමත් එයාගේ උයනට වී, තරු එළියෙන් මල් පැළවලට සාත්තු කරමින් සිටියා. එයාගේ මූන්ලේස් මල් රිදී පාටින් දිලිසුණා. ඒ වගේම අනෙක් මල් රතු, කහ සහ නිල් පාටින් දිලිසෙමින් මායාවට ප්‍රතිචාර දැක්වූවා.

"ඔයාට ආපහු එන්න එයා නියෝග කළා," කැලිප්සෝ අනුමාන කළා.

"මෙහෙමයි, නියෝග කළේ නැහැ. එයා මට තෝරාගන්න දුන්නා."

අපි දෙන්නගෙ ඇස් එකිනෙක මුණ ගැසුණා. "ඔයාට යෝජනා කරන්නෙ නැහැ කියලා මම පොරොන්දු වුණා."

"මොකක් යෝජනා කරන්න ද?"

"මෙහෙ නවතින්න."

"නවතින්න," මම කිවුවා. "ඒ කියන්නේ... සදහටම?"

"මේ දූපතේ දි ඔයා අමරණීය වේවි," එයා හෙමිහිට කිවුවා. " ඔයා කවදාවත් වයසට යන්නේවත්, මැරෙන්නෙවත් නැති වේවි. සටන අනිත් අයට කරගන්න ඇරලා ඔයාට නිදහස් වෙන්න පුළුවන්, පර්සි ජැක්සන්. ඔයාට ඔයාගේ අනාවැකියෙන් ගැලවෙන්න පුළුවන්."

මම එයා දිහා බලා සිටියේ පුදුමයෙන්. "එච්චර ලේසියෙන්?"

එයා ඔළුව වැනුවා. "එච්චර ලේසියෙන්."

"ඒත්... මගේ යාළුවෝ."

කැලිප්සෝ නැගිටලා මගේ අත අල්ලා ගත්තා. එයාගේ ස්පර්ශය මගේ ඇඟ පුරා උණුසුම් ධාරාවක් යැවුවා. "ඔයා මගේ ශාපය ගැන ඇහුවා නේද, පර්සි. ඒක ඔයාට කියන්න මට ඕනෑ වුනේ නැහැ. ඇත්ත කතාව තමයි දෙවිවරු කාලෙන් කාලෙට මට යාළුවෙක්ව එවනවා. අවුරුදු දාහකට විතර සැරයක් එයාලා වීරයෙක්ව, මගේ උදවු උවමනා කෙනෙක්ව මගේ වෙරළට ගසාගෙන එන්න අරිනවා. මම එයාට සාත්තු කරලා එයත් එක්ක යාළු වෙනවා. ඒත් ඒක අහඹු දෙයක් නෙවෙයි. ඉරණම ලියන අය වගබලා ගන්නවා මට එවන වීරයාව..."

එයාගේ කටහඬ වෙව්ලන්න ගත් නිසා, එයාට කතාව නතර කරන්න වුණා.

මම එයාගේ අත තදින් මිරිකුවා. "මොනවද? මොනවද මම ඔයාට දුක හිතෙන්න කළේ?"

"එයාලා එවන්නේ කවදාවත් නවතින්න බැරි කෙනෙක්ව," එයා මිමිණුවා. "මගේ යාළුකම පොඩි කාලයකට ඇරෙන්න සදහටම පිළිග න්න බැරි කෙනෙක්ව. එයාලා මට එවන්නේ... මට ආදරේ නොකර ඉන්න හිත හදාගන්න බැරි විදිහේ වීරයෙක්ව."

වතුර මලේ ගොරගොර හඬ සහ වෙරළට රළ වදින හඬ ඇර මුළු රැයම නිහඬ, නිසල වුණා. එයා කියන දේ තේරුම් ගන්න මට සෑහෙන වෙලාවක් ගියා.

"මාව?" මම ඇහුවා.

"ඔයාට දුන් ඔයාගේ මූණේ හැටි බලාගන්න තිබුණා නම්." එයා හිනාවක් යටපත් කර ගත්තත්, එයාගේ ඇස්වල තවමත් කඳුළු පිරී තිබුණා. "ඇත්ත වශයෙන්ම, ඔයාව."

"ඒ නිසා ද ඔයා හැම වෙලාවෙම පස්ස ගැහුවේ?"

"මම ගොඩක් තදින් උත්සහ කළා. ඒත් මට ඒක නවත්වා ගන්න බැහැ. ඉරණම හරිම කෲරයි. එයාලා මගේ ළඟට ඔයාව එවුවේ, මගේ වීර කොල්ලෝ, ඔයාට මගේ හදවත බිඳින්න පුළුවන් කියලා දන්න නිසා."

"ඒත්... මම නිකං ම... මං කිවුවේ, මම නිකං ම මම විතරයි නේ."



"ඒ හොඳටෝම ඇති," කැලිප්සෝ පොරොන්දු වුණා. "මම මේ ගැන කතා කරන්නෙවත් නැහැ කියලා මටම පොරොන්දු වෙලයි හිටියේ. ඔයාට මේ යෝජනාව කරන්නෙවත් නැතුව යන්න අරින්නයි මම හිතුවේ. ඒත් මට බැහැ. මං හිතන්නේ ඉරණමත් ඒක දන්නවා ඇති. ඔයාට මාත් එක්ක නවතින්න පුළුවන්, පර්සි. මට බය, ඔයාට මට උදවු කරන්න පුළුවන් එකම විදිහ ඒකයි."

මම ක්ෂිතිජය දිහා බලාගත් වනම හිටියා. අරුණෝදයේ මුල්ම රතු දහරා අහස එළිය කරමින් තිබුණා. මට පොළොවෙන් අතුරුදහන් වෙලා, සදාකාලයටම මෙහෙ ඉන්න පුළුවන්. මගේ හැම උවමනාවක් ම අදෘශ්‍යමාන සේවකයින් ඉටු කර දෙද්දි, මට කැලිප්සෝ සමග ජීවත් වෙන්න පුළුවන්. අපිට උයනේ මල් වවමින්, සිංදු කියන කුරුල්ලන්ට කතා කරමින්, පිරිසිදු නිල් අහස යටින් වෙරළ දිගේ ඇවිදින්න පුළුවන්. යුද්ධ නැහැ. අනාවැකි නැහැ. තව දුරටත් පැති බෙදීම් නැහැ.

"මට බැහැ," මම එයාට කිවුවා.

එයා දුක්බරව බිම බලාගත්තා.

"මම ඔයාට රිදවන්න කිසිම දෙයක් කවදාවත් කරන්නෙ නැහැ," මම කිවුවා. "ඒත් මගේ යාළුවන්ට මාව ඕනෑ. එයාලට උදවු කරන්නෙ කොහොමද කියලා මම දැන් දන්නවා. මට ආපහු යන්න වෙනවා."

එයා, එයාගේ උයනෙන් මලක් කඩා ගත්තා - රිදී මූන්ලේස් රිකිල්ලක්. ඉර පායාගෙන එද්දි එහි දිස්නය මැකී ගියා. ඉර පායන වෙලාව තීරණ ගන්න හොඳම වෙලාව කියලයි හෙෆාස්ටස් කිවුවේ. කැලිප්සෝ මගේ ටි-ෂර්ට් සාක්කුවේ මල රැඳවූවා. ඊට පස්සේ පා ඇඟිලි තුඩුවලින් එසවුණු එයා මගේ නළල සිප ගත්තේ, ආශිර්වාද කරන්න වගෙයි.

"එහෙනම් එන්න වෙරළට යමු, මගෙ වීරයෝ. ඊට පස්සෙ අපි ඔයාව ආපහු යවමු."

★★★

ගස් කොටන් එකිනෙක බැඳ සාදා තිබුණු වර්ග අඩි දහයක් විතර ලොකු පහුරේ මැද කුඹ ගහක් ලෙස සවි කළ රිටකුත්, සරල සුදු ලිනන් රුවලකුත් තිබුණා. ඒක මුහුදු-ගමනකට, එහෙමත් නැත්නම් විල්-ගමනකට ඒ තරම් හොඳ එකක් වගේ නම් පෙනුනේ නැහැ.

Scanned with CamScanner

"මෙක ඔයා කැමති ඕනෑම තැනකට ඔයාව අරන් යාවි," කැලිප්සෝ පොරොන්දු වුණා. "ඒක සැඟෙන පරිස්සම්."

මම එයාගේ අත අල්ලා ගත්තා. ඒත් එයා ඒක මගේ අතින් ලිස්සා යන්න දුන්නා.

"සමහරවිට මට ඔයාව බලන්න එන්න පුළුවන් වෙයි," මම කිවුවා.

එයා ඔළුව හෙල්ලුවා. "ඔජිජියාව දෙසැරයක් හොයාගන්න කිසිම මනුස්සයෙක්ට බැහැ, පර්සි. ඔයා යන්න ගියාම, ආයේ කවදාවත් මට ඔයාව දකින්න ලැබෙන්නෙ නැහැ."

"ඒත්-"

"යන්න, කරුණාකරලා." එයාගේ හඬ බිඳුණා. "ඉරණම හරිම කෲරයි, පර්සි. මාව අමතක කරන්න එපා," ඊට පස්සෙ එයාගේ හිනාවෙන් පංගු මාත්‍රයක් නැවත මතු වුණා. "මැන්හැටන්වල මං වෙනුවෙන් උයනක් හදනව ද?"

"මම පොරොන්දු වෙනවා." මම පහුර තුළට අඩිය තැබුවා. එසැණින් ම ඒක වෙරළෙන් ඔබ්බට යාත්‍රා කරන්න පටන් ගත්තා.

විල මැදට යාත්‍රා කරද්දි ඉරණම ඇත්තටම ගොඩක් කෲර බව මට තේරුම් ගියා. එයාලා කැලිප්සෝට ආදරය නොකර ඉන්න බැරි කෙනෙක්ව එවුවා. ඒ වුණත් ඒක දෙපැත්තට ම බලපෑවා. මගේ ජීවිතේ ඉතිරි කාලය පුරාවටම මම එයා ගැන හිත හිතා ඉදීවි. එයා මගේ ලොකුම සැබෑ නොවූ හීනය වේවි.

මිනිත්තු ගාණක් තුළදි ඔජිජියා දූපත මීදුම අතරේ නොපෙනී ගියා. මම වතුර මතින් පායා එන ඉර දෙසට තනිවම යාත්‍රා කරමින් සිටියා.

ඒ වෙලාවේ මම කළ යුතු දේ පහුරට කිවුවා. මම, මගේ මතකයට ආව එකම තැන කිවුවේ, මට යාළුවන්ගෙන් අස්වැසුමක් ලබාගන්න ඕනෑ වුණ නිසයි.

"අර්ධ-ලෝහිත කඳවුරට," මම කිවුවා. "මාව ගෙදරට අරන් යන්න."

# 13

# අපි අලුත් මාර්ගෝපදේශකයෙක් කුලියට ගත්තා

පැය ගාණකට පස්සේ, මගේ පහුර අර්ධ-ලෝහිත කඳවුරු වෙරළට සේන්දු වුණා. මම එතෙට ගියේ කොහොමද කියලා නම් මට කිසිම අදහසක් නැහැ. එක්තරා තැනක දි විලේ වතුර තිකංම මුහුදු වතුරට මාරු වුණා. ලෝන්ග් අයිලන්ඩ්වල හුරු පුරුදු වෙරළ තීරය ඉදිරියෙන් මතු වෙද්දි දියෙන් උඩට ආ මිතුරු පුදු මෝරු දෙන්නෙක් මාව වැල්ල දිහාවට තල්ලු කරගෙන ගියා.

ගොඩබිමට පය ගැසූ මට පෙනුණේ කඳවුර පාළුවට ගිහින් වගෙයි. ඉර මුදුන් වී වැඩි වෙලාවක් ගිහින් තිබුනේ නැතත්, දුනු හරඹ පිටිය හිස් වුණා. තැගීම පුහුණු වෙන බිත්තිය තනිවම ලෝදිය පෙරමින් තිබුණා. මණ්ඩපයෘ කවුරුවත් නැහැ. කැබින්ඃ සියල්ල හිස්. ඒ වෙලාවේ රංගාවාටයෙන් දුමක් ඉහළ නගිනවා මට පෙනුණා. කඳවුරු ගිනිමැලය දල්වන්න තවමත් වේලාසන වැඩියි, එයාලා මාෂ්මෙලෝස් කර කරනවා වෙන්නත් බැහැ කියලා මම තේරුම් ගත්තා. මම ඒ පැත්තට දිවුවා.

මට දුර තියාම කයිරොන් නිවේදනයක් දෙනවා ඇසුණා. එයා කියමින් සිටි දේ තේරුම් යද්දි, මම හිටිවනම නැවතුණා.

"-ඔහු මිය ගොස් ඇති බව පිළිගන්න වෙනවා," කයිරොන් කිවුවා. "මේ තරම් දිගු නිහැඬියාවකට පසුව, අපේ යාඥාවලින් පල

ලැබෙයි කියලා හිතන්න අපහසුයි. ඔහු වෙනුවෙන් ගෞරව දක්වන්න, ජීවතුන් අතර සිටින ඔහුගේ හොඳම යහළුවාගෙන් මම ඉල්ලා සිටිනවා."

මම රංගාවාටයට පිටුපසින් ඇතුළු වුණා. මාව කිසිවෙකුගේ අවධානයට හසු වුනේ නැහැ. සැමදෙනාම ඉදිරියට හැරී බලාගෙන සිටියේ, ඇනබෙත් ත්‍රිශූලයක් එම්බ්‍රොයිඩර් කළ දිගු, කොළ පාට සේද ආදාහන සළුවට ගිනි තබන දෙසයි. එයාලා මගේ පාංශුකූලය පුළුස්සනවා.

ඇනබෙත් රැස්ව සිටි පිරිසට මුහුණ දෙන්න හැරුණා. එයාගේ පෙනුම අන්තිම දරුණු වුණා. එයාගේ ඇස් ඇඬීමෙන් ඉදිමිලා. ඒ වුණත් එයා යාන්තමින් වචන දෙක තුනක් ගැට ගසාගත්තා, "මං හිතන්නේ එයා තමයි මට හිටපු නිර්භීතම යාළුවා. එයා..." ඒ වෙලාවේ එයා මාව දැක්කා. එයාගේ මූණ ලේ රතු පාටට හැරුණා. "එයා මෙතැන ඉන්නවා!"

හිස් ගෙඩි හැරුණා. හැමෝම හිල්ලුවා.

"පර්සි!" බෙකන්ඩොර්ෆ්ගේ මුහුණ ලොකු හිනාවකින් පිරුණා. තවත් ළමයි ගොඩක් මාව වට කරගෙන මගේ පිටට තට්ටු දැමුවා. මට ඒරිස් කැබිනයේ අය සිටි පැත්තෙන් දෙස් දෙවිලි කීපයක් ඇසුණා, ඒත් ක්ලැරිස් නිකංම ඇස් කැරකුවේ හරියට මට නොමැරී ඉන්න තරම් ලැජ්ජා නැතිකමක් තිබුණා කියලා එයාට විශ්වාස කරන්නත් බැහැ වගෙයි. කයිරොන් නැල්මේ දුව එද්දී හැමෝම එයාට ඉඩ දුන්නා.

"හොඳයි," එයා හෙළුවේ සැනසුම් සුසුමක් කියලා පැහැදිලිව පෙනුණා. "කඳවුරුකාරයෙක් ආපහු එනවා දැකලා මම මේ තරම් සතුටු වෙලා නැහැ කවදාවත්. ඒත් ඔයාට මට කියන්න ම වෙනවා-"

"ඔයා මොන ලෝකෙ ද ගිහින් හිටියේ?" අනෙක් කඳවුරුකාරයින්ව තල්ලු කරමින් ඇනබෙත් මැදට පැන්නා. මං හිතුවේ එයා මගේ මූණ සමතලා කරන්න යනවා කියලයි, ඒත් ඒ වෙනුවට එයා මාව කොයි තරම් තදින් වැලඳ ගත්තා ද කියනවා නම්, මගේ ඉළ ඇට ටික කුඩු නොවී බේරුණේ යාන්තමින්. අනෙක් කඳවුරුකරුවෝ නිහඬ වුණා. එයා මෙතැන නාට්‍ය ජවනිකාවක් පෙන්වනවා කියලා ඇනබෙත්ටම තේරුණ නිසා ද කොහෙදෝ, එයා මගෙන් ඈත් වුණා.

"මම- අපි හිතුවේ ඔයා මැරිලා කියලා, පාසි මොළේ"

"මට කණගාටුයි," මම කිව්වා. "මම අතරමං වුණා."



"අතරමං වුණා?" එයා මොර ගැසුවා. "සති දෙකක් තිස්සේ, පර්සි? මොන ලෝකෙ ද-"

"ඇනබෙත්," කයිරොන් එයාට බාධා කළා. "බාගදා, අපි මීට වඩා පෞද්ගලික තැනකට ගිහින් මේ ගැන කතාබහ කරොත් නරක ද? අනිත් අය, දැන් ආපහු තම තමන්ගේ වැඩවලට යන්න!"

අපිට විරුද්ධ වෙන්න ඉඩක් නොතබා, ඇනබෙත්ව සහ මාව පූස් පැටවු දෙන්නෙක් ගන්නවා තරම් පහසුවෙන් ඔසවා ගත් කයිරොන්, අපි දෙන්නව එයාගේ පිට මත තබාගෙන මහ ගෙදරට ප්‍රමවේ දිව්වා.

***

මම එයාලට සම්පූර්ණ කතාව ම කිව්වේ නැහැ. මට කැලිප්සෝ ගැන කතා කරන්න හිත හදාගන්න බැරිවුණා. මම පෙන්ට් හෙලේන්ස් කන්දේ පිපුරුම ඇති කළ හැටිත්, ගිනි කන්දෙන් පිටතට විසිවී ගිය හැටිත් විස්තර කළා. මම දූපතක අතරමං වී සිටි බව එයාලට කිව්වා. ඊට පස්සේ හෙෆාස්ටස් මාව හොයාගෙන ඇවිත්, මට පිට වී යන්න පුළුවන් කියූ බවත්, මායා පහුරකින් මාව ආපහු කඳවුරට රැගෙන ආ බවත් කිව්වා.

ඒ සියල්ල ඇත්ත වුණත්, කතා කරද්දි මගේ අත්ලට දහඩිය දමනවා මට දැනුණා.

"ඔයා සති දෙකක් තිස්සේ අතුරුදහන් වෙලා හිටියා." ඇනබෙත්ගේ කටහඬ දැන් සෑහෙන දුරට ඒකාකාරව තිබුණත්, තවමත් එයා හිටියේ කම්පනය වෙලා වගෙයි. "අර පිපුරුම් හඬ ඇහුණා ම මම හිතුවේ-"

"මං දන්නවා," මම කිව්වා. "මට කණගාටුයි. ඒත් මම වංග ගිරිය හරහා යන්නේ කොහොමද කියලා හොයාගත්තා. මම හෙෆාස්ටස් එක්ක කතා කළා."

"එයා ඔයාට විසඳුමක් කිව්වා ද?"

"හොඳයි, එයා කිව්වේ මම ඒ වෙනකොටත් දැනගෙන හිටපු දෙයක්මයි. මට දැන් ඒක තේරෙනවා."

මම එයාලට මගේ අදහස කිව්වා.

ඇනබෙත්ගේ කට ඉබේම ඇරුණා. "පර්සි, ඒක නම් පිස්සුවක්!"

Scanned with CamScanner

රෝද පුටුවේ ආපස්සට වුණ කයිරොන් ඊවුල් කෙනෙක්. "කොහොම වුණත් ඒක මට කලින්ත් කරලා තියෙනවා. සිසියන්ට අයිකඩිනිගේ උදවු ලැබුණා. හැබැයි ටයිමන්, හර්මිස්ගේ පුත්‍රයා. එයාගේ උණ කෝච්චි සංචාලවලට මනුෂ්‍යයෝ ගොඩක් පාවිච්චි කළේත් මේ හේතුව නිසාමයි."

"ඒත් මේක මගේ ගවේෂණය." ඇනබෙත් කිව්වා. "මට ඒක මෙහෙයවන්න ඕනෑ."

කයිරොන් බලා සිටියේ අපහසුවෙන්. "මගෙ දරුවෝ, මේක ඔයාගේ ගවේෂණය තමයි. ඒ වුණාට ඔයාට උදවු ඕනෑ."

"එතකොට මේක උදව්වක් කියලා ද කියන්නේ? අනේ නෑ! ඒක වැරදියි. ඒක බයගුලුකමක්. ඒක-"

"අපිට මනුෂ්‍යයෙකුගේ උදවු ඕනෑ කියලා පිළිගන්න අමාරුයි තමයි." මම කිව්වා. "ඒත් ඒක ඇත්ත."

ඇනබෙත් මට රවා බැලුවා. "ඔයා තමයි මගේ ජීවිතේට හම්බ වුණ ලොකුම කරදරකාරයා!" එහෙම කියපු එයා අඩි තප්පමින් කාමරයෙන් පිටවුණා.

මම දොරකඩ දිහා බලා සිටියා. මට දැනුණේ මොකකට හරි ගහන්න උවමනාවක්. "මහ ලොකුවට කිව්වෙ නම් මම එයාට හිටපු නිර්භීතම යාළුවා කියලා."

"එයා සන්සුන් වෙයි." කයිරොන් පොරොන්දු වුණා. "එයාට ඉරිසියයි, මගෙ කොල්ලෝ."

"ඒක මහ මෝඩකමක් නේ. එයා නෙවෙයි නේ... ඒක හරියට..."

කයිරොන් තනියම හිනාවුණා. "ඒකෙන් කාරියක් නෑ. ඔයාට තේරිලා නැද්ද, ඇනබෙත් එයාගේ යාළුවන්ව එයාටම විතරක් වෙන් කරගෙන ඉන්න විදිහ. එයා හිටියේ ඔයා ගැන සෑහෙන දුකෙන්. දැන් ඔයා ආපහු ආවට පස්සේ, මං හිතන්නේ ඔයා අතරමං වෙලා හිටියෙ කොහෙද කියලා එයා සැක කරනවා."

එයාගේ දෑස් දිහා බලද්දි, කයිරොන් කැලිප්සෝ ගැන අනුමාන කර ඇති බව මට තේරුම් ගියා. අවුරුදු තුන්දාහක් පුරාවට වීරයින්ව පුහුණු කරන මේ ගුරුවරයාගෙන් කිසිම දෙයක් හංගන්න අමාරුයි. එයා ඒ හැම දෙයක්ම දැකලා තිබුණා.



"අපි ඔයාගේ තෝරාගැනීම ගැන හිතන්න යන්නෑ." කයිරොන් කිව්වා. "ඔයා ආපහු ආවනේ. ඒක තමයි වැදගත්."

"ඔය කතාව ඇනබෙත්ට කියන්න."

කයිරොන් හිනාවුණා. "ඔයාලා දෙන්නව උදේට මැන්හැටන්වලට අරන් යන්න කියලා මම ආර්ගස්ට කියන්නම්. ඔයා ටිකකට අම්මවත් බලලා ආවොත් හොඳයි, පර්සි. එයා ඉන්නේ... දුකෙන් කැලඹිලා."

මගේ හදවත මොහොතකට නැවතුණා. කැලිප්සෝගේ දූපතේ මුළු කාලය පුරාවටම, මගේ අම්මට කොහොම දැනෙනවා ඇති ද කියලා මම නිකමටවත් හිතලා තිබුණේ නැහැ. මම මැරිලා කියලා එයා හිතනවා ඇති. එයා වැලපිත්තත් වගේ අඬනවා ඇති. ඒ ගැන හිතන්නවත් නොහිතුණේ මට මොනවා වෙලා ද?

"කයිරොන්," මම කතා කළා. "ග්‍රෝවර්ටයි ටයිසන්ටයි මොකද? ඔයා හිතනව ද-"

"මං දන්නෙ නැහැ, මගෙ කොල්ලෝ." කයිරොන් හිස් ගිනි උදුන දිහා ඔහේ බලා සිටියා. "ජුනිපර් ඉන්නෙත් සෑහෙන දුකෙන්. එයාගේ අතු රිකිලි ඔක්කොම කහ පාටට හැරිලා. ග්‍රෝවර් නැවත නොපැමිණීම නිසා විදාරිත වැඩිහිටි මණ්ඩලය එයාගේ බලපත්‍රය අවලංගු කරලා තියෙන්නේ. එයා පණපිටින් ආපහු ආවත්, එයාලා ග්‍රෝවර්ව නින්දාසහගත පිටුවහල් කිරීමකට බල කරයි." එයා සුසුමක් හෙළුවා. "කොහොම වුණත් ග්‍රෝවරුයි ටයිසනුයි දෙන්නා හරිම දක්ෂයි. අපිට තවමත් බලාපොරොත්තුවක් තියාගන්න පුළුවන්."

"මට තිබුණේ ඒ දෙන්නාට යන්න නොදී ඉන්න."

"ග්‍රෝවර්ට එයාගෙම ඉරණමක් තියෙනවා. ඒ වගේම එයා එක්ක යන්න තරම් ටයිසන් නිර්භීත වුණා. ග්‍රෝවර්ව මාරක අනතුරුදායක වැටිලා නම් ඔයාට ඒක දැනෙයි කියලා ඔයා හිතන්නැද්ද?"

"මං හිතනවා. සහකම්පන සම්බන්ධය. ඒත්-"

"ඔයාට තව දෙයක් කියන්න තියෙනවා, පර්සි." එයා කිව්වා. "ඇත්තටම කන්කටලු ආරංචි දෙකක්."

"නියමයි."

"ක්‍රිස් රොඩ්‍රිගේස්, අපේ අමුත්තා..."

මීම කැලේ දී දකින්න ලැබුණු දේ මට සිහි වුණා. එයා එහෙම "ඕක ගැන තත් දොඩවද්දි, ක්ලැරිස් එයාට කතා කරන්න උත්සාහ කළ හැටි. "එයා මැරුණා ද?"

"තවම නෑ," කයිරොන් අඳුරු කරගත් මුහුණින් කිව්වා. "ඒත් එයාගේ තත්ත්වය හොඳටම නරකයි. එයා දැන් ඉන්නේ අසනීප කාමරේ. හෙලවෙන්නවත් හයියක් නැතිව. ක්ලැරිස්ට ආපහු එයාගේ දින චර්යාවට යන්න කියලා මට නියෝග කරන්න සිද්ධ වුණා. මොකද එයා තමයි දිගින් දිගටම ක්‍රිස්ගේ ඇඳ ළඟ හිටියේ. ක්‍රිස් කිසිම දේකට ප්‍රතිචාර දක්වන්නෑ. එයා කිසිම කෑමක්, බීමක් ගන්නෙත් නැහැ. මගේ බෙහෙත් එකකින්වත් ප්‍රතිඵලයක් වුණේ නැහැ. එයාට ජීවත් වෙන්න තිබුණ ආසාව නිකංම නැති වෙලා."

මම වෙවුලා ගියා. ක්ලැරිස් සහ මම කොයි තරම් දබර කරගත්තා වුණත් මට එයා පවු කියලා හිතුණා. එයා ක්‍රිස්ට උදවු කරන්න හොඳක් මහන්සි වුණා. ඒ වගේම දැන් මම වංගගිරියට කිහින් තිබුණ නිසා, ක්‍රිස්ව පිස්සු වට්ටන්න මයිනස්ගේ අවතාරයට ලේසි වුණේ කොහොමද කියලා මට හිතාගන්න පුළුවන් වුණා. බැරි වෙලාවත් මටත්, මගේ යාළුවන්ගේ උදවු නැතිව වංගගිරිය ඇතුළේ තනියම ඉබාගාතේ යන්න සිද්ධ වුණා නම්, මට කවදාවත් එයින් එළියට එන්න බැරි වෙයි.

"මට කියන්න කණගාටුයි," කයිරොන් කියාගෙන ගියා. "අනිත් පාරංචියත් හොඳ එකක් නෙවෙයි. කුයින්ටස් අතුරුදහන් වෙලා."

"අතුරුදහන්? කොහොමද?"

"රෑවල් තුනකට කලින් එයා වංගගිරිය ඇතුළට පැනගෙන. එයා යනවා ජූනිපර් දැකලා. ජේන විදිහට ඔයා එයා ගැන හිතුවා හරි වගේ."

"එයා ලූක්ගේ ඔත්තුකාරයෙක්," මම කයිරොන්ට ට්‍රිපල් ජී ගොවිපොළ ගැන - කුයින්ටස් එතැනින් ගෝනුස්සෝ මිලට ගෙන තිබුණු විදිහ සහ ගැරියන් ත්‍රෝනොස්ගේ හමුදාවට සැපයීම් කළ විදිහ ගැන කිව්වා. "ඒක අහම්බෙන් වුණ දෙයක් වෙන්න බැහැ."

කයිරොන් බර සුසුමක් පිට කළා. "පාවාදීම ගොඩක්. කුයින්ටස් යාළුවෙක් බව ඔප්පු කරයි කියලා මම බලාපොරොත්තු වුණා. මට පේන්නෙ මගේ තීන්දු ඒ හැටි හොඳ නැහැ."



"එතකොට මිසිස් ඕ'ලෙරි කොහෙද?" මම ඇහුවා.

"ඈම බිල්ලා තවමත් කඩු හරඹ පිටියේ. ඌ කාටවත් ළං වෙන්නවත් දෙන්නෙ නැහැ. මට ඌව කූඩු කරන්නවත්... විනාශ කරන්නවත් හිත දෙන්නෙ නැහැ."

"කුයින්ටස් නිකං ම එයාව දාලා ගියා වෙන්න බැහැ."

"මං කිව්වත් වගේ, පර්සි, අපි එයා ගැන හිතපු විදිහ වැරදියි වගේ. දැන්, ඔයා හෙට උදේ ගමනට ලෑස්ති වෙන්න ඕනේ. ඔයාටයි ඇනබෙත්ටයි කරන්න තව සෑහෙන්න වැඩ තියෙනවා."

එයා රෝද පුටුවට වී, දුක්බරව ගිනි උදුන දිහා බලා සිටිද්දී මම එතැනින් පිට වුණා. එයා කොයි තරම් වාර ගණනක් එහෙම වාඩි වෙලා, කවදාවත් ආපහු නොඑන වීරයෝ වෙනුවෙන් මඟ බලා ඉඳලා ඇති ද, මම පුදුමයෙන් හිතුවා.

***

රෑ කෑමට කලින් මම කඩු හරඹ පිටියට ගොඩවුණා. කිව්වත් වගේම, ක්‍රීඩාංගනය මැද නැබුි කළු පාට සද්දන්ත ලොම් ගුළියක් වගේ වකුටු වී සිටි මිසිස් ඕ'ලෙරී පඹයෙකුගේ හිසත් මිනැවට එපාවට හපමින් සිටියා.

මාව දකපු හැටියේ බිරුව එයා උඩ පනිමින් මගේ දිහාවට දුවගෙන ආවා. මම ඉවරයි කියලා මම හිතුවා. "හෝව්!" මට කියාගන්න ලැබුණේ එච්චරයි. මාව බිම පෙරලා ගත් එයා මගේ මුණ ලෙවකන්න පටන් ගත්තා. දැන්, සාමාන්‍යයෙන් නම්, පොසෙයිඩන්ගේ පුතා වුණු නිසාම, මාව තෙමෙන්නේ මට ඕනෑ නම් විතරයි. ඒත් පෙනුණු හැටියට මගේ ඒ බලය බලු කෙළවලට අදාළ නෑ වගෙයි. මොකද මට සෑහෙන හොඳින් නාගන්න ලැබුණා.

"හෝව්, කෙල්ලේ" මම මොර දුන්නා. "හුස්ම ගන්න බැරියෝ. මට නැගිටින්න දෙන්නෝ!"

අන්තිමේ දී කොහොම හරි මම එයාව මගේ ඇඟ උඩින් ඉවත් කරගත්තා. එයාගේ කන් අත ගෑව මම, එයාට යෝධ බලු බිස්කෝතුවක් හොයලා දුන්නා.

"ඔයාගේ හාම්පුතා කොහෙද?" මම එයාගෙන් ඇහුවා. "ඔයාව දාලා යන්න එයාට පුළුවන් වුණේ කොහොමද, අහ්?"

එයා කෙඳිරියක් පිට කළේ එයාටත් ඒක දැනගන්න ඕනැ වගෙයි. කුයින්ටස් හතුරෙක් කියලා විශ්වාස කරන්න මම සූදානම්ව සිටියත්, එයා මිසිස් ඕ'ලෙරිව දාලා ගියේ ඇයි කියලා නම් මට තවමත් තේරුම් ගන්න බැරිවුණා. මම එයා ගැන හරියටම දැන සිටි දෙයක් තිබුණා නම්, ඒ එයා එයාගේ බලු තඩියට ඇත්තටම ආදරෙයි කියලා විතරයි.

මම බලු කෙළ මුහුණෙන් පිස දාන්න හිතමින් ඉන්නකොට ගැහැනු ළමයෙකුගේ කටහඬක් ඇහුණා, "එයා ඔහේගේ ඔළු ගෙඩිය ගලවා ගත්තේ නැත්තේ ඔහේගේ වාසනාවට."

කඩු සරඹ පිටියේ අනෙක් පැත්තේ, කඩුවක් සහ පලිහක් අත දරාගෙන ක්ලැරිස් සිටියා. "ඊයේ පුහුණුවීම් කරන්ඩ ආවා," එයා ගෙරෙව්වා. "බල්ලා මාව හපයක් කරන්ඩ හැදුවා."

"එයා මොළේ තියෙන බල්ලෙක්," මම කිවුවා.

"හරි හිනා."

එයා අපි දිහාවට ආවා. මිසිස් ඕ'ලෙරි ගෙරෙව්වත්, මම එයාගේ ඔළුවට තට්ටු කළාම එයා සන්සුන් වුණා.

"මෝඩ යම බල්ලා," ක්ලැරිස් කිවුවා. "මගේ පුහුණුවීම් නතර කරන්ඩ එයාට බැහැ."

"මට ක්‍රිස් ගැන අහන්න ලැබුණා," මම කිවුවා. "මට කණගාටුයි."

ක්ලැරිස් පිටිය වටේ රවුමක් ගියා. ළඟම වූ පඹයා අසලට ආ හැටියේ නපුරු ලෙස පහර එල්ල කළ එයා, එක් පහරින් හිස කඳෙන් වෙන් කර, එහි බඩ තුළට කඩුව බැස්සුවා. ආපසු කඩුව ඇදලා ගත් එයා නොනැවතී යන්න ගත්තා.

"ඔව්, හොඳයි. වෙලාවකට සමහර දේවල් වරදිනවා." එයාගේ කටහඬ සැලුණා. "වීරයින්ට තුවාල වෙනවා. එයාලා.... එයාලා මැරෙනවා. ඒ වගේම රාක්ෂයෝ ආයේ ආයෙමත් එනවා."

හෙල්ලයක් අහුලා ගත් එයා පිටිය හරහා එය දමා ගැසුවා. පියඹා ගිය එය පඹයෙකුගේ හිස්වැසුමේ ඇස් සිදුරු දෙක අතරට කිඳා බැස්සා.

එයා ක්‍රිස්ව වීරයෙක් කියලා හැඳින්වුයේ හරියට එයා කවදාවත් ටයිටන්ගේ පැත්තට එකතු වෙන්න ගියේ නැහැ වගෙයි. ඇනබෙත්



සමහර වෙලාවට ලූක් ගැන කතා කළ විදිහ එයා මට සිහි කළා. ඒ ගැන කතා නොකර ඉන්න මම තීරණය කළා.

"ක්‍රිස් නිර්භීත කෙනෙක්," මම කිවුවා. "එයාට සනීප වෙයි කියලා මම හිතනවා."

එයා මට රැවුවේ එයාගේ ඊළඟ ඉලක්කය මම වගෙයි. මිසිස් ඕ'ලෙරි ගොරවන්න ගත්තා.

"මට උදවුවක් කරනව ද?" ක්ලැරිස් මගෙන් ඇසුවා.

"ඔව්, අනිවාර්යයෙන්."

"ඔහේ ඩේඩලස්ව හොයා ගත්තොත්, එයාව විශ්වාස කරන්ඩ එපා. එයාගෙන් උදවු ඉල්ලන්ඩත් එපා. එයාව මරලා දාන්ඩ."

"ක්ලැරිස්-"

"මොකද වංගගිරියක් වගේ දෙයක් හදන්න පුළුවන් කෙනෙක් ඉන්නවා නම්, පර්සි, එයා දුෂ්ටයෙක්. තනිකරම යක්ෂයෙක්."

එක තත්පරයකට එයා මට එයාගේ ගොඩක් වැඩිමල් අර්ධ සොහොයුරා, එරිතියන්ව සිහිපත් කළා. ක්ලැරිස්ගේ ඇස්වලත් තිබුණේ පහුගිය අවුරුදු දෙදහක් පුරාවට ලෝකය දැකපු සහ එයින් විඩාපත් වුණු පෙනුමක්.

"පුහුණුවීම් කරපු කාලේ ඉවරයි. දැන් ඇවිල්ලා තියෙන්නේ ඒවා ඇත්තටම කරන කාලේ."

***

එදා රෑ මම, මගේම ඇඳේ නිදා ගත්තා. ඒ වගේම කැලිප්සෝගේ දූපතෙන් පස්සේ පළවෙනි වතාවට සිහින මාව හොයාගෙන ආවා.

මම සිටියේ රජෙකුගේ රාජ සභාවක - කිරි ගරුඬ කුලුනු සහ දුව සිංහාසනයක් තිබුණු, සුදු පාට ලොකු මැදිරියක. කැරලි ගැසුණු රතු කොණ්ඩය මත ලෝරල් ඔටුන්නක් පැළඳගත් තරබාරු පිරිමියෙක් සිංහාසනය මත වාඩි වී සිටියා. එයා ළඟින් එයාගේ දූවරු කියා සිතිය හැකි තරුණියෝ තුන්දෙනෙක් සිටගෙන සිටියා. නිල් පාට ලෝගුවලින් සැරසී සිටි එයාලටත් රතු කොණ්ඩා තිබුණා.

කිරිකිරි හඬ ගාමින් දොරටුව විවර වෙද්දි, පෙරටුව යන්නා නිවේදනය කළා, "මයිනස්, ක්‍රීට්හි රාජෝත්තමයා!"

මම නැති ගත්තා, ඒ වුණත් සිංහාසනය මත සිටි පිරිමියා එයාගේ දූවරු දිහා බලා සිනාසුණා. "එයාගේ මූණේ හැටි බලාගත්තකල් මට ඉවසිල්ලක් නැහැ."

මයිනස්, රාජකීය නර සතා ශාලාවට ඇතුළු වුණා. එයාගේ උස සහ බරපතළ පෙනුමත් සමග බලද්දි අනෙක් රජාව පෙනුණේ අමනයෙක් වගෙයි. මයිනස්ගේ උල් රැවුල අළු පාටට හැරී තිබුණා. මම අන්තිම වරට සිහිනෙන් දකිද්දි සිටියාට වඩා එයා වැහැරිලා වගෙයි පෙනුණේ. ඒ වගේම එයාගේ මිරිවැඩිවල මඩ ඉසී තිබුණා. ඒ වුණත් එයාගේ ඇස් තවමත් අර කෲර එළියෙන් දිලිසුණා.

එයා සිංහාසනයේ උන් මිනිසාට දරදඬු ලෙස නැමී ආචාර කළා. "කොකලස් රජතුමනි. ඔබතුමා මගේ පුංචි තේරවිල්ල විසඳලා?"

කොකලස් හිනා වුනා. "ඒකට පුංචි කියන්නේ කොහොමද, මයිනස්. විශේෂයෙන් ම, ඒක විසඳන්න සමත් අයට රන් කාසි දහසක් දෙන බව ඔබ ලෝකය පුරාම ප්‍රසිද්ධ කළාටත් පස්සේ. ඒ ත්‍යාගය සැබෑවක් ද?"

මයිනස් අත්පුඩියක් ගැසුවා. ලොකු ලී පෙට්ටගමක් අමාරුවෙන් ඔසවාගෙන ආරක්ෂක භටයින් දෙදෙනෙක් ඇතුළට ආවා. ඒ පෙට්ටගම කොකලස්ගේ දෙපා මුල තැබූ එයාලා එය විවර කළා. එය තුළ රන් කැට ගොඩවල් දිලිසුණා. ඒවා ඩොලර් ට්‍රිලියන ගාණක් වටිනවා ඇති.

කොකලස් අගේ කරන ලෙසින් උරුවම් බෑවා. "මේ වගේ තෑග්ගක් සූදානම් කරලා ඔබතුමාගේ රාජධානිය ම බංකොලොත් වෙන්න ඇති, මගේ මිත්‍රයා."

"ඒක ඔබට අදාළ දෙයක් නෙවෙයි."

කොකලස් උරහිස් ඇකිළුවා. "තේරවිල්ල නම් ගොඩක් සරලයි, ඇත්තෙන්ම. මගේ සේවකයින්ගෙන් කෙනෙක් එය විසඳුවා."

"තාත්තේ," තරුණියන්ගෙන් කෙනෙක් අනතුරු ඇඟෙව්වා. එයා වැඩිමල් කෙනා වගෙයි - එයාගේ සහෝදරියන්ට වඩා එයා ටිකක් උසයි.

කොකලස් එයාව නොසලකා හැරියා. එයා සර්පිලාකාර මුහුදු බෙලි කටුවක් ලෝගුව තුළින් පිටට ගත්තා. එය තුළින් රිදී පොටක් යවා තිබුණා. ඒ නිසා ඒක පෙනුණේ මාලයකට ඇමිණූ ලොකු පබළුවක් වගෙයි.



ඉදිරියට පය තැබූ මයිනස් බෙලි කටුව අතට ගත්තා. "ඔබ කිවුවේ, සේවකයෙක් කියලා ද? එයා කොහොමද මේ කටුව කඩන්නෙ නැතුව නූල ඇමිණුවේ?"

"පුළුවන් නම් විශ්වාස කරන්න, එයා පාවිච්චි කළේ කුඹියෙක්ව. ඒ චූටි සතාට සේද නූලක් ගැට ගහලා, බෙලි කටුවේ අනිත් කොණේ පැණි බිංදුවක් තියලා, උපායෙන් ඌව කටුව ඇතුළෙන් යැවුවා."

"දක්ෂ මනුස්සයෙක්," මයිනස් කිවුවා.

"ඔහ්, ඇත්තෙන්ම. මගේ දියණියන්ගේ ගුරුවරයා. එයාලා ඒ මනුස්සයාට හරිම ලැදියි."

මයිනස්ගේ ඇස් දැඩි වුණා. "මම වුණා නම් ඒ ගැන ඊට වඩා පරිස්සම් වෙනවා."

මට ඕනෑ වුණේ කොකලස්ට අනතුරු අඟවන්නයි: *ඔය මිනිහව විශ්වාස කරන්න එපා! එයාව මස් කන සිංහයෝ රැළක් එක්ක ඇඳිරි ගෙයකට දානවා!* ඒත් රතු කොණ්ඩකාර රජා හිනාවුණා විතරයි. "බය වෙන්න දෙයක් නෑ, මයිනස්. මගේ දූවලා වයසට වඩා බුද්ධිමත්. දැන්, මගේ රත්තරන් ටික-"

"ඔව්," මයිනස් කිවුවා. "ඒත් ඔබතුමාට පේනවා නේ, මේ රත්තරන් අයිති තේරවිල්ල විසඳපු මනුස්සයාට. ඒ වගේම එහෙම මිනිස්සු එක්කෙනයි ඉන්න පුළුවන්. ඔබ ඩෙඩලස්ට රැකවරණය දෙනවා."

කොකලස් සිංහාසනය මත අපහසුවෙන් එහෙ මෙහෙ වුණා. "ඔබතුමා කොහොමද එයාගේ නම දන්නේ?"

"ඒකා හොරෙක්," මයිනස් කිවුවා. "එයා කාලයක් මගේ රජ මැදුරේ සේවය කළා, කොකලස්. එයා මගේම දුවව මට විරුද්ධව හැරෙව්වා. එයා මගේම මාලිගාවේ දි මාව මෝඩයෙක් කරන්න හොරෙක්ට උදවු කළා. ඒ වගේම එයා යුක්තියෙන් පැනලා ගියා. මම එයාව ලුහුබඳින්නේ අවුරුදු දහයක් තිස්සේ."

"මං මේ කිසි දෙයක් දැනගෙන හිටියේ නැහැ. ඒ වුණත් මම ඒ මනුස්සයාට මගේ ආරක්ෂාව දෙන්න පොරොන්දු වෙලයි තියෙන්නේ. එයා ගොඩක් ප්‍රයෝජනවත්-"

"මම ඔබට තෝරාගැනීමක් කරන්න දෙනවා," මයිනස් කිවුවා. "පලා යන්නාව මට බාරදෙන්න, එතකොට මේ රත්තරන් සියල්ල ඔබේ.

නැත්නම් මාව ඔබේ හතුරෙක් කරගන්න අවදානම ගන්න. ක්‍රීට් හතුරු කරගන්න ඔබට කොහෙත්ම උවමනා නොවේවි."

කොකලස් සුදුමැලි වුණා. තමන්ගේම රාජ සභාවේදී ඒ තරම් බය වෙන එක මෝඩකමක් කියලයි මට නම් හිතුණේ. එයාට තිබුණේ එයාගේ හමුදාව කැඳවන්නයි. මයිනස්ට හිටියේ ආරක්ෂක සෙබළු දෙන්නෙක් විතරයි. ඒ වුණත් කොකලස් කළේ දාඩිය පෙරාගෙන නිකංම සිංහාසනය උඩ ඉඳගෙන හිටපු එක විතරයි.

"තාත්තේ," එයාගේ වැඩිමල් දුව කතා කළා, "ඔයාට බැහැ-"

"නිහඬ වෙන්න, ඇලියා." කොකලස් එයාගේ රැවුල ඇඹරුවා. එයා නැවත වරක් දිලිසෙන රන් දිහා බැලුවා. "මෙය මට වේදනා දෙනවා, මයිනස්. ආගන්තුක සත්කාර කිරීමට දුන් පොරොන්දුව බිඳින මිනිස්සුන්ව දෙවියෝ ප්‍රිය කරන්නෑ."

"අපරාධකාරයින්ට රැකවරණය දෙන මිනිස්සුන්වත් දෙවියෝ ප්‍රිය කරන්නෑ."

කොකලස් ඔළුව වැනුවා. "බොහොම හොඳයි. ඔබට ඔබගේ මනුස්සයාව දම්වැලින් බැඳලා ලැබෙයි."

"තාත්තේ!" ඇලියා ආයෙමත් කිව්වා. ඒත් එක්කම තමන්ව නවතා ගත් එයා, වඩාත් හුරතල් හඬකින් කතා කරන්න ගත්තා. "අ-අඩු තරමේ අපේ අමුත්තට සංග්‍රහ කරන්න අපිට ඉඩ දෙන්න. මේ තරම් දිගු ගමනකට පස්සේ එතුමාට උණුසුම් ස්නානයක්, අලුත් ඇඳුම් සහ ප්‍රණීත ආහාර වේලක් ලබා දිය යුතුමයි. එතුමාට නෑමට වතුර පිළියෙළ කිරීමට මට ඉඩ ලැබේ නම් එය ලොකු ගෞරවයක්."

එයා මයිනස්ට ලස්සන හිනාවක් පෑවා, නාකි රජා ගෙරෙව්වා. "නා කියාගත්තොත් වරදක් නැති වෙයි මට හිතෙන්නෙ." එයා කොකලස් දිහා බැලුවා. "මම ඔබව රාත්‍රී භෝජනයේ දී මුණ ගැසෙන්නම්, උතුමාණෙනි. මගේ හිරකරුවාත් සමඟ."

"මේ පැත්තෙන්, දේවයන් වහන්ස!" ඇලියා කිව්වා. එයයි එයාගේ සහෝදරියෝ දෙන්නයි මයිනස්ව මැදිරියෙන් පිටතට කැඳවාගෙන ගියා.

මමත් එයාලා පසුපස මොසැයික් ටයිල්වලින් හැඩ කළ නාන කුටියකට ගියා. එහි වාතය හුමාලයෙන් පිරී තිබුණා. වතුර කරාමයකින් උණු වතුර නාන ඔරුවට වැස්සුණා. ඇලියා සහ එයාගේ සහෝදරියෝ



රෝස පෙතිත්, පෞරාණික ග්‍රීක සබන් බුබුළු දියර ලෙස සිතිය හැකි යමකුත් වතුරට එකතු කළා. ඉක්මනින් ම වතුර වෛවර්ණ බුබුළුවලින් වැසුණා. තරුණියෝ පසෙකට වෙද්දී, ලෝගුව උනා දමූ මයිනස් නාන ඔරුවට බැස්සා.

"අහ්හ්." එයා හිනාවුණා. "උත්කෘෂ්ටවත් ස්නානයක්. ස්තුතියි, මගේ කෙල්ලනේ. මේ ගමන නම් ඇත්තෙන්ම දිගු එකක් වුණා."

"ඔබතුමා අවුරුදු දහයක් පුරාවටම ඔබගේ ගොදුර ලුහුබැන්දා ද, උතුමාණෙනි?" ඇලියා ඇහිපිය සලමින් ඇසුවා. "ඔබතුමා දැඩි අධිෂ්ඨානයක් ඇති කෙනෙක් වෙන්න ඕනෑ."

"මම කවදාවත් ණයක් අමතක කරන්නෑ." මයිනස් දත් නියෙව්වා. "මගේ කොන්දේසියට එකඟ වෙලා ඔබලාගේ පියතුමා ගත්තේ බුද්ධිමත් තීරණයක්."

"ඔහ්, ඇත්තෙන්ම, උතුමාණෙනි!" ඇලියා කිව්වා. එයා ඕනෑවටත් වඩා වැඩියෙන් චාටු කතා කියනවා කියලා මට හිතුණත්, නාකි මනුස්සයා ලණුව කෑවා. ඇලියාගේ සහෝදරියෝ සුවඳ ගැන්වූ තෙල් බිඳු රාජකීය ඔළු ගෙඩියට වැස්සුවා.

"ඔබතුමා දන්නව ද, උතුමාණෙනි," ඇලියා කිව්වා. "ඔබතුමා එයි කියලා ඩේඩලස් හිතුවා. තේරවිල්ල උගුලක් වෙන්න ඇති කියලා එයා හිතුවත් ඒක විසඳන්නෙ නැතුව ඉන්න එයාට බැරිවුණා."

මයිනස්ගේ නළල රැළි වුණා. "ඩේඩලස් ඔබත් එක්ක මං ගැන කතා කළා ද?"

"එහෙමයි, උතුමාණෙනි."

"එයා නරක මිනිහෙක්, කුමරිය. මගේම දුවත් එයාගේ වශියට අහු වුණා. එයා කියන දේවල් අහන්න එපා."

"එයා ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක්," ඇලියා කිව්වා. "ඒ වගේම එයා විශ්වාස කරනවා කාන්තාවත් පිරිමියා තරම් උගත් විය යුතුයි කියලා. අපිට අපේම හිතක් තියෙනවා කියලා මුලින්ම ඉගැන්නුවේ එයයි. සමහරවිට ඔබතුමාගේ දුවටත් එහෙම දැනෙන්න ඇති."

මයිනස් නැගිටින්න උත්සහ කළත් ඇලියාගේ සහෝදරියෝ එයාව නැවතත් වතුරට තල්ලු කළා. ඇලියා එයා පිටුපසට ආවා. එයාගේ අත්ල මත චූටි ගෝල තුනක් තිබුණා. මුලදී මම හිතුවේ ඒවා සබන් පබළු කියලයි. ඒත් එයා ඒවා වතුරට දැමුවා ම පබළුවලින් ලෝකඩ

පොටවල් පිටට මතු වෙමින් රජාව වෙලා ගනිමින්, එයාගේ වළලු කරවල් එකට ගැට ගසමින්, මැණික් කටු දෙපසට බැඳ දමමින්, බෙල්ල වටා එතුණා. මම මයිනස්ට වෛර කළා වුණත්, එය බලා ඉන්න බය හිතෙන දසුනක් වුණා. එයා දඟලමින් කෑගැසුවත්, තරුණියෝ ඊට වඩා ශක්තිමත් වුණා. ඉක්මනින්ම එයා අසරණව කරවටක් වතුරේ ගිලී වැතිරී සිටියා. ලෝකඩ රැහැන් තවමත් එයා වටා එතෙමින්, එයාව දළඹු කෝෂයකට හරවමින් තිබුණා.

"මොනවද උඹලට උවමනා?" මයිනස් ප්‍රශ්න කළා. "උඹලා ඇයි මෙහෙම කරන්නේ?"

ආලියා හිනාවුණා. "ඩෙඩලස් කියන්නේ අපිට බොහොම කරුණාවන්ත කෙනෙක්, දේවයන් වහන්ස. ඒ වගේම ඔබතුමා අපේ තාත්තාට තර්ජනය කරනවටත් මම කැමති නැහැ."

"උඹ ඩෙඩලස්ට කියපන්," මයිනස් ගෙරෙව්වා. "එයාට කියපන් මම මැරුණට පස්සෙත් එයාව එළවගෙන එනවා කියලා! පාතාල ලෝකෙ යුක්තියක් කියලා දෙයක් තියෙනවා නම්, මගේ ආත්මය සදාකාලයටම එයා පස්සෙ එළවාවි!"

"තිර්භීත කතාවක්, දේවයන් වහන්ස," ආලියා කිවුවා. "පාතාල ලෝකෙන් යුක්තිය හොයාගන්න මම ඔබතුමාට සුබ පතනවා."

ඒත් එක්ක ම, ලෝකඩ රැහැන් මයිනස්ගේ මුහුණ වටේ එතී, එයාව ලෝකඩ මමියකට හැරෙව්වා.

නාන කුටියේ දොර ඇරුණා. ගමන් මල්ලක් රැගෙන ඩෙඩලස් ඇතුළට ආවා.

එයා කොණ්ඩය කොටටම කපා තිබුණා. එයාගේ රැවුල තනි සුදු පාටට හැරිලා. එයාගේ පෙනුම බෙලහීන සහ දුක්මුසු වුණා. එයා පහළට නැමී, මමියේ නළල ස්පර්ශ කළාම රැහැන් ලිහී නාන ඔරුව පතුලට කිඳා බැස්සා. ඒවා ඇතුළේ කිසිවක් තිබුනේ නැහැ. ඒක හරියට මයිනස් රජාව නිකං ම දියවෙලා ගිහින් වගෙයි.

"වේදනා රහිත මරණයක්," ඩෙඩලස් කල්පනාබරව කිවුවා. "එයාට ලැබිය යුතු තරමටත් වඩා වටිනා එකක්. ස්තූතියි, මගේ කුමරියනි."

ආලියා එයාව වැලඳ ගත්තා. "ඔබට මෙහෙ රැඳෙන්න බැහැ, ගුරුතුමනි. අපේ පියතුමා මේ බව හොයාගත්තාම-"



"ඔව්," ඩෙඩලස් කිවුවා. "මට බය මම ඔබලාවත් කරදරේක පැටලුවා ද කියලයි."

"ඔහ්, අපි ගැන කරදර වෙන්න එපා. නාකි මනුස්සයාගේ රත්තරන් ටික අරගෙන තාත්තා සතුටු වෙයි. ඒ වගේම ක්‍රීට් තියෙන්නේ ගොඩාක් දුරින් නේ. ඒ වුණත් මයිනස්ගේ මරණයට එයා ඔබට චෝදනා කරයි. ඔබ කොහේ හෝ ආරක්ෂිත තැනකට පලා යා යුතුයි."

"කොහේ හෝ ආරක්ෂිත තැනකට," වයසක මනුස්සයා එයම කිවුවා. "අවුරුදු ගාණක් තිස්සේ මම ආරක්ෂිත තැනක් හොයමින් රාජධානියෙන් රාජධානියට පලා ගියා. මට බය මයිනස් කියපු දේ සැබෑවක් වෙයි කියලා. එයා මාව ලුහුබැඳ ඒම මරණයටවත් නතර කරන්න බැරි වෙයි. මේ අපරාධය ගැන ආරංචිය පැතිරුණා ම, මේ ඉර යට කිසිම තැනක් මට රැකවරණය දෙන්න ඉදිරිපත් වෙන්නේ නැති වෙයි."

"එතකොට ඔබ යන්නේ කොහෙද?" ආලියා ඇසුවා.

"මම ආයේ කවදාවත් ම නොයන්න දිවුරුව තැනකට," ඩෙඩලස් කිවුවා. "මගේ හිරගෙය මගේ එකම අභය භූමිය වේවි."

"මට තේරෙන්නෙ නැහැ," ආලියා කිවුවා.

"ඔබ එය තේරුම් නොගත් තරමට හොඳයි."

"ඒත් පාතාල ලෝකය?" ආලියාගේ සහෝදරියක් ඇසුවා. "ඔබ වෙනුවෙන් දරුණු විනිශ්චයක් සූදානම්ව තියේවි! සෑම මනුෂ්‍යයෙක්ම මිය යා යුතුයි."

"වෙන්න ඇති," ඩෙඩලස් කිවුවා. ඊට පස්සේ එයා ගමන් මල්ල තුළින් එතූ ලියවිල්ලක් පිටතට ගත්තා - ඒක තමයි මීට කලින් හීනයේදිත් මට දකින්න ලැබුණු, එයාගේ ඥාති පුතාගේ සටහන් ඇති ලියවිල්ල. "එහෙම නොවෙන්නත් පුළුවන්."

ආලියාගේ උරහිසට තට්ටු කළ එයා, සහෝදරියො තුන්දෙනාට ආශිර්වාද කළා. එයා අවසන් වරටත් නාන ඔරුව පතුලේ දිලිසෙමින් තිබුණු තඹවන් රැහැන් දිහා බැලුවා. "පුළුවන් නම් මාව හොයාග න්නවා, අවතාර රජෝ."

මොසැයික් බිත්තියකට මුහුණලා හැරුණු එයා එක ටයිලයක් ඇල්ලුවා. එතැනින් දිලිසෙන ලකුණක් මතු වුණා - ග්‍රීක ඩෙල්ටා

ලකුණක් - ඒත් එක්කම බිත්තිය පසෙකට ලිස්සා ගියා. කුමාරිකාවෝ හිල්ලුවා.

"ඔබ අපිට කවදාවත් රහස් ගමන් මාර්ග ගැන කිවුවේ නැහැ!" ආලියා කිවුවා. "ඔබ හරිම කාර්යබහුලව ඉඳලා වගෙයි."

"වංගගිරිය කාර්යබහුලව ඉඳලා," ඩෙඩලස් නිවැරදි කළා. " ඔබලාට තමන්ගේ හොඳ සිහිය වටිනවා නම්, මගේ දරුවනේ, මා පසුපස එන්න උත්සහ කරන්න එපා."

***

මගේ සිහිනය මාරුවුණා. මම සිටියේ ගලින් සෑදූ හුගත කුටියක් තුළයි. ලූක් සහ තවත් අර්ධ-ලෝහිත භටයෙක් විදුලි පන්දමක් ආධාරයෙන් සිතියමක් අධ්‍යයනය කරමින් සිටියා.

ලූක්ගේ කටින් ශාපයක් පිටවුණා. "ඒක අන්තිමට හැරුණු තැන වෙන්න ඕනෑ." එයා සිතියම ගුළි කරලා පැත්තට විසි කළා.

"සර්!" එයාගේ සහායකයා විරෝධය පෑවා.

"මෙහෙදි සිතියම්වලින් වැඩක් නැහැ," ලූක් කිවුවා. "බය වෙන්න එපා. මම ඒක හොයාගන්නම්."

"සර්, අර කතාව ඇත්තක් ද, කණ්ඩායම ලොකු වෙන තරමට-"

"අතරමං වෙන්න තියෙන ඉඩ වැඩියි කියල ද? ඔව්, ඒක ඇත්ත. අපි මේක පටන් ගන්න කලින් ගවේෂකයෝ තනි තනිව යැවුවේ මොකට කියල ද ඔයා හිතන්නේ? ඒත් බය වෙන්න එපා. නූල අපේ අතට ලැබුණු හැටියේ ම, අපිට පෙරටු බල ඇණිය අරන් යන්න පුළුවන්."

"ඒ වුණාට අපි කොහොමද නූල ලබාගන්නේ?"

ලූක් අතේ ඇඟිලි නමමින්, දිග අරිමින් සිටගෙන සිටියා. "ඔහ්, කුයින්ටස් ඒ ගැන බලාගනී. අපිට කරන්න තියෙන්නේ මල්ලව පිටිය හොයාගෙන යන එක විතරයි, හැබැයි ඒක තියෙන්නෙ මංසන්ධියක. එතැන පනු කරන්නේ නැතුව කොහෙටවත් යන්න කිසිම විදිහක් නැහැ. අන්න ඒ නිසා තමයි අපි ඒකෙ ස්වාමියා එක්ක සටන් විරාමයක් ඇති කරගන්න ඕනෑ. අපිට කරන්න තියෙන්නේ කොහොමහරි පණ බේරගෙන-"



"සර්!" කොරිඩෝව දෙසින් අලුත් කටහඬක් ඇසුණා. ග්‍රීක යුධ සන්නාහයෙන් සැරසුණු තවත් කොල්ලෙක් පන්දමක් රැගෙන දුවගෙන ආවා. "ඩ්‍රැකනෙයි අර්ධ-ලෝහිතයෙක්ව හොයාගෙන!"

ලූක් රවා බැලුවා. "තනියම? වංගගිරිය අස්සෙ රෝන්දෙ ගහනකොට?"

"ඔව්, සර්! ඔයා ඉක්මන් කරලා ආවොත් හොඳයි. එයාලා ඉන්නේ අතින් කුටියේ. එයාලා එයාව කොටු කරගෙන ඉන්නේ."

"කවුද ඒ?"

"මීට කලින් දැකලා නැති කෙනෙක්, සර්."

ලූක් ඔළුව වැනුවා. "ක්‍රෝනොස් එවපු ආශිර්වාදයක්. අපිට මේ අර්ධ-ලෝහිතයව පාවිච්චි කරන්න පුළුවන් වෙයි. එන්න!"

එයාලා කොරිඩෝව පහළට දුවද්දි, තිගැස්සී ඇහැරුණ මම ඇහිපිය නොහෙළා අඳුර දිහා බලා සිටියා. *තනි අර්ධ-ලෝහිතයෙක්, වංගගිරියේ රෝන්දෙ ගහනවා.* මට ආයෙමත් නින්දට වැටෙන්න ගොඩක් වෙලා ගියා.

***

ඊළඟ උදෑසන මම මිසිස් ඕ'ලෙරිට ඇති තරම් බලු විස්කෝතු ලබා දෙන්න වගබලා ගත්තා. එයා ගැන ඇහැ ගහගෙන ඉන්න කියලා මම බෙකන්ඩොර්ෆ්ගෙන් ඉල්ලුවා. එයා නම් ඒකට ඒ හැටි සතුටු වුණ බවක් පෙනුනේ නැහැ. ඊට පස්සේ අර්ධ-ලෝහිත කඳු මුඳුනට නැගපු මට පාරට වී බලා සිටි ඇනබෙත්ව සහ ආර්ගස්ව මුණ ගැසුණා.

වෑනයේ දි ඇනබෙතුයි මමයි වැඩිය කතා කළේ නැහැ. ආර්ගස් නම් කවදාවත් කතා කරන කෙනෙක් නෙවෙයි, සමහරවිට ඒ එයාගේ මුළු ඇඟ පුරාම වගේම - මට අහන්න ලැබී තිබුණු විදිහට - එයාගේ දිව අගත් ඇස් තිබුණ නිසා, ඒක පෙන්වන්න අකමැත්තෙන් වෙන්න ඇති.

ඇනබෙත් හිටියේ අසනීපයෙන් වගෙයි. එයාට මට තරම්වත් හොඳ නින්දක් ලැබිලා නැහැ වගෙයි.

"නරක හීනයක් ද?" අන්තිමේදි මම එයාගෙන් ඇහුවා.

එයා ඔළුව හෙල්ලුවා. "එරිතියන්ගෙන් අයිරිස්-මැසේජ් එකක්."

"එරිතියන්ගෙන්! නිකෝට මොකක්හරි ප්‍රශ්නයක් ද?"

"ඊයෙ රෑ එයා ගොවිපොළෙන් පිටවෙලා, ආපහු වංගගිරියට ගිහිල්ලා."

"මොනවා? එරිතියන් එයාව නවත්තගන්න හදලා නැද්ද?"

"එයා නැගිට්ටින්න කලින් නිකෝ යන්න ගිහින්. ඔර්තස් එයාගෙ ඉව දිගේ හරක් මුර වැට ළඟට යනකල් ගිහිල්ලා. නිකෝ පහුගිය රෑ යවල් දෙක තුනේම තනියම කතා කරනවා ඇහුණා කියලා එරිතියන් කිවුවා. ඒත් දන් එයාට හිතෙනවලු නිකෝ ආයෙමත් මයිනස්ගේ අවතාරේ එක්ක කතා කරන්න ඇති කියලා."

"එයා ඉන්නේ අනතුරක," මම කිවුවා.

"ඇත්තටම. මයිනස් කියන්නේ මළවුන්ගේ විනිශ්චයකාරයින් තුන්දෙනාගෙන් කෙනෙක්. ඒත් ඒ මිනිහා මහා නපුරෙක්. එයාට නිකෝගෙන් මොනවා ඕනෑ ද මම දන්නෙ නැහැ, හැබැයි-"

"මං කිවුවේ ඒ ගැන නෙවෙයි," මම කිවුවා. "ඊයේ රෑ මම හීනයක් දැක්කා..." මම එයාට ලූක් ගැනත්, ලූක් කුයින්ටස් ගැන කියූ දේ ගැනත්, එයාගේ කෙනෙක් වංගගිරියේ තනියම යමින් සිටි අර්ධ-ලෝහිතයෙක්ව හොයාගත් හැටිත් කිවුවා.

ඇනබෙත්ගේ හනු තද වුණා. "ඒක නම් නරකම නරකයි."

"එතකොට අපි මොකද කරන්නේ?"

එයා ඇහි බැමක් එසෙව්වා. "හොඳයි, අපිට මග පෙන්වන්න ඔයාට සැලසුමක් තියෙන එක හොඳට ගියා, නැද්ද?"

***

සෙනසුරාදාවක් වූ එදා, නගරයට ඇදෙන රථ වාහනවල තදබදයක් තිබුණා. ඉර මුදුන් වෙද්දි මට අපේ තට්ටු නිවාසයට යාගන්න හැකි වුණා. දොර විවර කළ මගේ අම්මා මාව වැලඳ ගත් වේගය යම බල්ලෙක් ඇඟට පැන්නට වඩා පොඩ්ඩයි අඩු.

"මං එයාලට කිවුවා ඔයා හොඳින් ඇති කියලා," මගේ අම්මා කිවුවා, ඒ වුණත් එයාගේ කටහඬ නම් ඇසුණේ එයා අහස කරේ තියන් ඉඳලා බිම තිබ්බා වගෙයි - මං කියනවට විශ්වාස කරන්න. ඒ හැඟීම කොහොම එකක් ද කියලා මම අද්දැකීමෙන් ම දන්නවා.

අපිව මුළුතැන්ගෙයි වාඩි කරවූ අම්මා, එයාගේ විශේෂ නිල් පාට චොකලට්-චිප් විස්කෝතු කන ගමන් ගවේෂණයේ විස්තර කියන්න



අපිට බල කරා. සුපුරුදු විදිහට ම, කතාවේ බය හිතෙන කොටස්වල (ඒ කියන්නේ මුළු කතාවම වගේ) සැර බාල කරලා කියන්න මම උත්සහ කළා, ඒත් ඒකෙන් වුණේ කතාවේ බිහිසුණු ගතිය තවත් වැඩිවුණ එකයි.

මම ගැරියන් සහ ඉස්තාලය ගැන කියාගෙන යද්දි අම්මා බොරුවට ඇඟෙව්වේ මගේ බෙල්ල මිරිකන්න යනවා වගෙයි. "මං කට කැඩෙනකල් කිවුවත් මෙයා කාමරේවත් අස් කරගන්නෙ නැහැ, ඒ වුණාට කොහෙවත් ඉන්න රාක්ෂයෙක්ගේ ඉස්තාලෙක අශ්ව ගොම ටොන් සිය ගාණක් අස් කරන්න එයාට කිසිම අමාරුවක් නැහැ!"

ඇනබෙත් මහ හඬින් හිනාවුණා. සෑහෙන කාලෙකට පස්සෙ මට අහන්න ලැබුණු ඒ හිනාව ඇත්තටම මිහිරි වුණා.

"ඉතින්," මගේ කතාව ඉවර වුණාම අම්මා කිවුවා, "ඔයා අල්කාට්‍රාස් දූපත කුඩු කරලා, සෙන්ට් හෙලේන්ස් කන්ද පුපුරවලා, මිනිස්සු මිලියන බාගෙකට විතර උන්හිටි තැන් නැති කරා, ඒ වුණත් අඩු තරමේ ඔයා පරිස්සමෙන් ඉන්නවනේ." මගේ අම්මා එහෙම තමයි, හැම වෙලාවෙම බලන්නේ සුබවාදී පැත්ත ගැනයි.

"ඔව්," මම එකඟ වුණා. "ඒ හින්දා කමක් නෑ."

"පෝල් මෙතැන හිටියා නම්," එයා කිවුවේ එයාටම කියාගන්නවා වගෙයි. "එයාට ඔයත් එක්ක කතා කරන්න ඕනෑ වුණා."

"ඔහ්, හරි. ඉස්කෝලේ."

මේ ටික දවසට කොයි තරම් දේවල් වුණා ද කියනවා නම්, මට ගුඩ් ඉස්කෝලේ ගැන සහමුලින්ම අමතක වෙලයි තිබුණේ - මම ඒ ඉස්කෝලේ සංගීත කාමරය ගිනි ගන්න ඇරලා ආවා, ඒ වගේම මම අපරාධයක් කරලා පලා යන්නෙක් වගේ ජනේලයෙන් පැනලා යනවා මගේ අම්මගෙ පෙම්වතාට දකින්න ලැබී තිබුණා.

"ඔයා මොනවද එයාට කිවුවේ?" මම ඇසුවා.

මගේ අම්මා ඔළුව හෙල්ලුවා. "මම මොනවා කියන්න ද? ඔයාගේ මොකක් හරි වෙනසක් තියෙනවා කියලා එයා දන්නවා, පර්සි. එයා මොළේ තියෙන මනුස්සයෙක්. ඔයා නරක ළමයෙක් නෙවෙයි කියලා එයාට විශ්වාසයි. සිද්ධ වෙන්නෙ මොනවද කියලා එයාට තේරුමක් නැහැ, ඒත් ඉස්කෝලෙන් එයාට බලපෑම් කරනවා. ඔයාව ඉස්කෝලෙට බඳවා ගත්තේ එයා නේ. ඒක කොහොම වුණත්,

සිද්ධ වුණේ ඔයාගේ වැරැද්දෙන් නෙවෙයි කියලා එයාලට ඒත්තු ගන්වන්න එයාට ඕනෑ. ඒත් ඔයා පැනලා ගියපු එක පරහට හිටලා."

ඇනබෙත් මගේ දිහා සැලකිල්ලෙන් බලා සිටියා. එයාගේ බැල්මේ තිබුණේ අනුකම්පාවක්. එයාටත් මීට සමාන අවස්ථාවලට මුහුණ දෙන්න වෙලා තියෙන බව මම දන සිටියා. මනුෂ්‍ය ලෝකයේ අර්ධ-ලෝහිතයෙක් වෙලා ඉන්න එක කොහෙත්ම ලේසි පහසු දෙයක් නෙවෙයි.

"මම එයාට කතා කරන්නම්," මම පොරොන්දු වුණා. "අපි මේ ගවේෂණය ඉවර කළාට පස්සේ. ඔයා කැමති නම් මම එයාට ඇත්තම වුණත් කියන්නම්."

අම්මා මගේ උරහිස උඩින් අතක් තැබුවා. "ඔයාට ඒක කරන්න පුළුවන් ද?"

"හොඳයි. ඔව්. මං කියන්නේ, අපිට පිස්සු කියලා එයා හිතයි ද දන්නෑ."

"එයා දැනටමත් එහෙම හිතනවා."

"එහෙනම් ඉතින් බය වෙන්න දෙයක් නැනේ."

"ස්තූතියි, පර්සි. මං එයාට කියන්නම් ඔයා ගෙදර එන්නේ..." එයාගේ නළල ඇකිළුණා. "කවදද? දැන් මොනවද වෙන්න යන්නේ?"

ඇනබෙත් එයාගේ විස්කෝතුව දෙකට කැඩුවා. "පර්සි ළඟ සැලැස්මක් තියෙනවා."

අකමැත්තෙන් වුණත් මම ඒක අම්මට එළි කරා.

එයා හෙමින් සීරුවේ ඔළුව වැනුවා. "ඒක නම් ගොඩක් අනතුරුදායකයි වගේ. හැබැයි ඒක හරියන්න ඉඩ තියෙනවා."

"ඔයාටත් ඒ හැකියාව තියෙනවා, එහෙම නේද?" මම ඇහුවා. "ඔයාට මීදුම හරහා දකින්න පුළුවන්."

මගේ අම්මා සුසුමක් හෙළුවා. "දැන් එච්චරටම බැහැ. මම තරුණ කාලෙ නම් ඒක ගොඩක් පහසුයි. ඒත් ඔව්, මට හැමදාම උවමනා තරමට වඩා දේවල් දකින්න පුළුවන්කම තිබුණා. ඔයාගේ තාත්තයි මමයි මුලින්ම මුණ ගැහුණු වතාවේ ඒකත් එයාගේ අවධානය දිනාගන්න හේතුවක් වුණා. හැබැයි පරිස්සමෙන්. ඔයාලා පරිස්සම් වෙනවා කියලා මට පොරොන්දු වෙන්න."



"අපි උත්සහ කරන්නම්, මිසිස් ජැක්සන්," ඇනබෙත් කිවුවා. "කොහොම වුණත්, ඔයාගේ පුතාව පරිස්සම් කරනවා කියන එක ලේසි පහසු වැඩක් නම් නෙවෙයි." දෑත් පපුව හරහා බැඳගත් එයා මුළුතැන්ගෙයි ජනේලයෙන් පිටතට රවාගෙන බලා සිටියා. මම මගේ අත් පිස්නාව කොනහමින් සිටියේ මුකුත් නොකියා ඉන්න උත්සහ කරමින්.

මගේ අම්මා රවා බැලුවා. "ඔයාලා දෙන්නට මොකද වෙලා තියෙන්නේ? ඔයාලා රණ්ඩු වුණා ද?"

අපි දෙන්නගෙන් එක්කෙනෙක්වත් එයාට උත්තර බැන්දේ නැහැ.

"මට තේරුණා," මගේ අම්මා කියද්දි මම පුදුම වුණේ එයාට මීදුම හරහා දකිනවාට වඩා වැඩි දෙයක් දකින්න තරම් හැකියාවක් තියෙනවා ද හිතලයි. එයා කතා කළේ හරියට ඇනබෙත් සහ මං අතර ඇති දේ එයාට හරියටම තේරුණා වගෙයි. ඒ වුණත් මට නම් මෙලෝ දෙයක් තේරුනේ නැහැ. "හොඳයි, මතක තියාගන්න," එයා කිවුවා. "ග්‍රෝවර්, ටයිසන් දෙන්නත් ඔයාලා ගැන බලාපොරොත්තුවෙන් ඉන්නේ."

"මං දන්නවා." ඇනබෙතුයි මමයි එකටම කිවුවා. ඒකෙන් වුණේ මාව තවත් අපහසුවට පත් වුණ එකයි.

මගේ අම්මා හිනාවුණා. "පුතේ, ඔයා සාලේ තියෙන ෆෝන් එකෙන් කතා කරොත් හොඳයි. සුබ පැතුම්."

මම කරන්න සූදානමින් සිටි දේ ගැන චකිතයෙන් සිටියා වුණත්, මුළුතැන්ගෙයින් පිට වෙන්න ලැබීම මට සහනයක් වුණා. මගේ දුරකථනය වෙත ගිය මම ඇමතුම ගත්තා. ඒ දුරකථන අංකය මගේ අත්ලෙන් මැකී ගොස් සෑහෙන කාලයක් වුණත් ප්‍රශ්නයක් නොවුණේ, මම ඉබේම වගේ ඒක කටපාඩම් කරගෙන තිබුණු නිසයි.

***

අපි ටයිම්ස් චතුරස්‍රයේ දි හමුවෙන්න යොදාගත්තා. මැරියට් මාර්කුයිස් සුපිරි හෝටලය ඉදිරිපස දි අපි රේචල් එලිසබෙත් ඩෙයාර්ව හොයාගනිද්දි එයා සිටියේ මුළුමනින්ම රන් පාටින් පින්තාරු කරගෙනයි.

මං අදහස් කළේ. එයාගේ මූහුණ. කොණ්ඩය. එයාගේ ඇඟිලි හැම දෙයක්ම හරියට එයාව මයිඩාස් රජු ස්පර්ශ කරලා වගෙයි. (මයිඩාස් රජු ග්‍රීක මිත්‍යා කතාවල සඳහන් ප්‍රසිද්ධ රජෙක්. ඩයනයිසියස් දෙවියන් රජුට වරයක් දුන් විට ඔහු ස්පර්ශ කරන සියල්ල රන්වලට හැරෙන වරයක් ලබාගත් බව සඳහන් වේ.) තඹ, ලෝකඩ, රිදී වගේ ලෝහමය පාටවලින් පින්තාරු කරපු තවත් ළමයි පස්දෙනෙක් සමඟ එයා පිළිමයක් වගේ සිටගෙන සිටියා. එයාලා එක් එක් ඉරියව්වලින් ගල් ගැහුණා වගේ නොසෙල්වී සිටිද්දි සමහර සංචාරකයෝ එයාලා පසුකර කඩිමුඩියේ ගියා. තවත් සමහරු නැවතී පුදුමයෙන් බලා සිටියා. මඟ යන එන සමහරු එයාලට සල්ලි දමා ගියා.

රේචල්ගේ දෙපා මුල වූ පුවරුවක මෙසේ සටහන් කර තිබුණා:

**ළමුන් උදෙසා නාගරික කලාව, ඔබගේ පරිත්‍යාග ආයාචනා කරමු**

ඇනබෙතුයි මමයි විනාඩි පහක් විතර එතැන සිටගෙන රේචල් දිහා බලා සිටියා. ඒත් එයා අපිව දැක්කත්, ඒ බවක් ඇඟෙව්වේ නැහැ. එයා සෙලවුණේවත්, ඇහි පිල්ලම් ගැහුවේවත් නැහැ. ඒ.ඩී.එච්.ඩී ඇති කෙනෙක් හැටියට මට නම් කොහෙත්ම ඒක කරන්න බැරි වෙයි. ඒ තරම් වෙලාවක් එකම විදිහට සිටගෙන හිටියොත් මට පිස්සු හැදෙයි. ඒ වගේම එයාව තනි රන් පාටින් දකින්න ලැබීමත් අරුමයක් වුණා. එයාව පෙනුණේ කවුරු හරි ප්‍රසිද්ධ කෙනෙකුගේ රන් ප්‍රතිමාවක් වගෙයි. සුපුරුදු කොළ පාටින් තිබුණේ එයාගේ ඇස් දෙක විතරයි.

"අපි එයාව සොලවලා බලමු ද." ඇනබෙත් යෝජනා කළා.

ඒක නම් විකක් පහත් වැඩක් කියලා මට හිතුණා. ඒත් රේචල් ප්‍රතිචාර දැක්වූයේ නැහැ. තවත් විනාඩි පහකට පස්සේ හෝටලයේ තුලි රා ගාලට වී විරාමයක් ගනිමින් සිටි රිදී පාට ළමයෙක් එතැනට ඇවිදගෙන ආවා. එයා රේචල් ළඟින් සිටගෙන, පිරිසකට දේශනාවක් දෙන අයෙකුගේ ඉරියව්ව ගත්තා. තමා සිටි ඉරියව්වෙන් මිදුණු රේචල් එතැනින් ඉවත් වුණා.

"හේයි, පර්සි." එයා දත් තියෙව්වා. "නියම වෙලාවට ආවේ! අපි කෝපි එකක් බොන්න යමු."

අපි 'ජාවා මූස්' නම් තැනකට ඇවිද ගියා. රේචල් ග්‍රෝවර්ගේ ප්‍රියතම වර්ගය වූ එස්ප්‍රෙසෝ කෝපි ඇණවුම් කළා. පලතුරු ස්මූති දෙකක් ගත් ඇනබෙත් සහ මම පුරන් පිරවූ හෝතෙකුව යටින් වූ



මේසයකට වාඩිවුණා. රන්තරන් පාට රේචල් දිහා කිසිවෙක් දෙවරක් හැරී බැලුවේ නැහැ.

"ඉතින්." එයා කිව්වා. "මේ ඇනබෙල්, නේ?"

"ඇනබෙත්." ඇනබෙත් නිවැරදි කළා. "ඔයා හැමවෙලාවෙම රන්තරන් පාටින් ද අඳින්නේ?"

"හැම වෙලාවෙම නෙවෙයි." රේචල් කිව්වා. "අපි අපේ කණ්ඩායමට සල්ලි එකතු කරනවා. අපි ප්‍රාථමික පන්තිවල ළමයි වෙනුවෙන් කලා ව්‍යාපෘති කරන්න ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙනවා. මොකද එයාලා ඉස්කෝලවලින් කලා විෂය අයින් කරන්න යන්නේ, ඔයා දන්නව ද? අපි මාසෙකට සැරයක් මේක කරනවා. සරු සති අන්තෙකට ඩොලර් පන්සියක් විතර එකතු කරගන්නවා. ඒත් මං හිතන්නේ ඔයාලට ඒ ගැන කතා කරන්න ඕනෑ නැතුව ඇති. ඔයත් අර්ධ-ලෝහිතයෙක් ද?"

"ෂ්ෂ්ෂ්!" ඇනබෙත් කිව්වේ වටපිට බලමින්. "ඕක ලෝකෙටම අඬබෙර ගහලා කිව්වා නම් ඊට වඩා හොඳ නැද්ද?"

"හරි." නැගී සිටි රේචල් හැමෝටම ඇහෙන්න කෑගැහුවා. "හේයි, හැමෝම අහගන්න! මේ දෙන්නා මිනිස්සු නෙවෙයි! එයාලා අර්ධ ග්‍රීක දෙවිවරු!"

කවුරුවත් හැරිලා බලන්නවත් කරදර වුණේ නැහැ. උරහිස් ඇකිළූ රේචල් වාඩිවුණා. "එයාලට ඒකෙන් වැඩක් නෑ වගේ."

"මේක විහිළුවක් නෙවෙයි. මනුස්ස කෙල්ලේ." ඇනබෙත් කිව්වා.

"නවත්තන්න ගන්නව ද, ඔය දෙන්නම." මම කිව්වා. "සන්සුන් වෙන්න."

"මම සන්සුන් වෙලා තමයි ඉන්නේ." රේචල් කියා සිටියා. "මම ඔයා ළඟ ඉන්න හැම වෙලාවක ම, මොකෙක් හරි රාක්ෂයෙක් අපිව මරන්න එනවා. ඉතින් කලබල වෙන්නෙ මොකටද?"

"බලන්න." මම කිව්වා. "සංගීත කාමරේ දී සිද්ධ වුණ දේට මට ඇත්තටම කණගාටුයි. ඒක නිසා ඔයාව ඉස්කෝලෙන් එළවන්න එහෙම නැතුව ඇති නේ."

"නැත්. එයාලා මගෙන් ඔයා ගැන ප්‍රශ්න මහ ගොඩක් ඇහුවා. මම ගොනා වගේ හිටියා."

"ඒක නම් එච්චර අමාරු වෙන්න නැතුව ඇති නේ?" ඇනබෙත් ඇහුවා.

"අයියෝ, ඕක නවත්තගන්නකෝ!" මම මැදිහත් වුණා. "රේචල්, අපිට ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. ඒකට අපිට ඔයාගේ උදව් ඕනෑ."

රේචල් ඇස් හීනි කරලා ඇනබෙත් දිහා බැලුවා. "ඔයාලට මගේ උදව් ඕනෑ?"

ඇනබෙත් බීම බටයෙන් ස්මූති එක කැලතුවා. "ඔව්," එක්වරම එයා කිවුවා. "සමහරවිට."

මම රේචල්ට වංගගිරිය ගැනත්, අපිට ඩෙඩලස්ව හොයාගන්න උවමනා ඇයි කියලත් කිවුවා. පහුගිය වාර කීපයේදී ම අපි ඇතුළට ගියාම සිද්ධ වුණේ මොනවද කියලත් මම එයාට කිවුවා.

"එතකොට ඔයාලා කියන්නේ මට ඔයාලට පාර පෙන්වන්න කියලා," එයා කිවුවා. "මම කවදාවත් ගිහිල්ලා නැති තැනක් අස්සේ."

"ඔයාට මීදුම හරහා දකින්න පුළුවන්," මම කිවුවා. "හරියට අරියඩ්නිට වගේ. ඔයාට හරි පාර දකින්න පුළුවන් වෙයි කියලා මම ඕනෑ ඔට්ටුවක් දානවා. වංගගිරියට ඔයාව මෝඩයා කරන්න ලේසි වෙන එකක් නැහැ."

"ඒත් ඔයා වැරදි නම්?"

"එහෙනම් අපි අතරමං වෙයි. කොයි පැත්තෙන් බැලුවත්, ඒක අනතුරුදායකයි. ගොඩක්ම ගොඩක් අනතුරුදායකයි."

"මං මැරෙන්නත් පුළුවන්?"

"ඔව්."

"ඒත් ඔයා කිවුවේ රාක්ෂයින්ට මිනිස්සුන්ගෙන් වැඩක් නැහැ කියලා. අර ඔයාගේ කඩුව-"

"ඔව්," මම කිවුවා. "දිව්‍යමය ලෝකඩවලින් මිනිස්සුන්ට තුවාල වෙන්නෙ නැහැ. ගොඩක් රාක්ෂයෝ ඔයාව ගණන් ගන්නෙ නැති වෙයි. ඒත් ලූක්... එයාට කවුරුත් එකයි. එයා මිනිස්සු, උප දෙවිවරු, රාක්ෂයෝ, ඕනෑ කෙනෙක්ගෙන් වැඩ ගන්නවා. ඒ වගේම එයාට බාධා කරන ඕනෑම කෙනෙක්ව මරලා දානවා."

"ෂෝක් කොල්ලෙක්," රේචල් කිවුවා.



"එයා ටයිටන් කෙනෙක්ගේ බලයට අහුවෙලා ඉන්නේ," ඇනබෙත් ලූක්ගේ පැත්තට කතා කළා. "එයාව රවට්ටලා තියෙන්නේ."

රේචල් අපි දෙන්නා දිහා මාරුවෙන් මාරුවට බැලුවා. "හරි," එයා කිවුවා. "මම එන්නම්."

මම තදින් ඇහිපිය ගැහුවා. ඒක ඒ තරම් ලේසි වෙයි කියලා මම කොහෙත්ම හිතුවෙ නැහැ. "ඔයාට විශ්වාස ද?"

"හේයි, මගේ ගිම්හාන නිවාඩුව වස කම්මැලි එකක් වෙන්නයි යන්නේ. දැනට මට ලැබුණු හොඳම යෝජනාව තමයි මේක. එතකොට මම මොනවද හොයන්න ඕනෑ?"

"අපිට වංගගිරියට ඇතුළු වෙන්න දොරටුවක් හොයාගන්න වෙනවා," ඇනබෙත් කිවුවා. "අර්ධ-ලෝහිත කඳවුරේ එකක් තියෙනවා, ඒත් ඔයාට එහෙට යන්න බැහැ. ඒක මනුෂ්‍යයින්ට තහනම් කලාපයක්."

එයා 'මනුෂ්‍යයින්ට' කියලා කිවුවේ ඒක හරිම දරුණු තත්ත්වයක් වගෙයි, ඒත් රේචල් නිකං ම ඔළුව වැනුවා. "හරි. මේ වංගගිරි දොරටුවක් මොන වගේ ද?"

"ඒක ඕනෑම දෙයක් වෙන්න පුළුවන්," ඇනබෙත් කිවුවා. "බිත්තියක කොටසක්. ගල් කුට්ටියක්. දොරකඩක්. කාණු කටක්. ඒ වුණාට ඒකෙ ඩෙඩලස්ගේ ලකුණ ඇති. නිල් පාටින් දිලිසෙන ග්‍රීක ඩෙල්ටා ලකුණක්."

"මේ වගේ එකක් ද?" රේචල් වතුර බිංදුවකින් මේසය මත Δ ලකුණ ඇන්දා.

"ඒක තමයි," ඇනබෙත් කිවුවා. "ඔයා ග්‍රීක දන්නව ද?"

"නැහැ," රේචල් කිවුවා. සාක්කුවෙන් නිල් පාට ලොකු පනාවක් ඇදලා ගත් එයා කොණ්ඩයෙන් රත් පාට පීරා හරින්න පටන් ගත්තා. "මට ඇඳුම් මාරු කරගන්න දෙන්න. ඔයාලත් මාත් එක්ක මැරියට්වලට ආවොත් හොඳයි."

"ඇයි?" ඇනබෙත් ඇහුවා.

"මොකද ඒ හෝටලේ බිම් මහලේ, අපි අපේ ඇඳුම් තියන තැන දොරක් තියෙනවා. ඒකෙ ඔය ඩෙඩලස්ගේ ලකුණ තියෙනවා."

Scanned with CamScanner

එයා ඇටසැකිල්ලේ වම් අත යටින් රිංගා ඉදිරියට ගියා. ඇනබෙතුයි මමයි බැල්මක් හුවමාරු කරගත්තා. ඇනබෙත් උරහිස් ඇකිළුවා. අපි රේචල් පසුපස වංගගිරියේ ගැඹුරට ම ගියා.

තවත් අඩි පනහකට විතර පස්සේ අපි හතරමං හන්දියකට ආවා. එය ඉදිරියට, ගඩොල් උමග දිගටම ඇදුණා. දකුණු පැත්තට, පෞරාණික කිරි ගරුඬ කුට්ටිවලින් සැදූ බිත්ති තිබුණා. වම් පසට තිබුණේ පස් සහ ගස් මුල්වලින් සැදුණු උමගක්.

මම වම් පැත්තට අත දිගු කළා. "ඒක ටයිසනුයි ග්‍රෝවරුයි ගියපු උමග වගෙයි."

ඇනබෙත්ගේ නළල රැළි ගැසුණා. "ඔව්, ඒත් දකුණු පැත්තේ උමගේ නිර්මාණ ශිල්පය - අර පරණ ගල් - ඒකෙ පෙනුම වංගගිරියේ පෞරාණික කොටසට යන එකක් වගෙයි. ඩෙඩලස්ගේ වැඩපොළ පැත්තට."

"අපි කෙලින්ම ඉස්සරහට යන්නයි ඕනෑ," රේචල් කිව්වා.

ඇනබෙතුයි මමයි දෙන්නම එයා දිහා බැලුවා.

"ඒක තමයි මෙතැනින් නරකම තෝරාගැනීම," ඇනබෙත් කිව්වා.

"ඔයාලට පේන්නෙ නැද්ද?" රේචල් ඇසුවා. "පොළොව දිහා බලන්න."

ගෙවී ගිය ගඩොල් සහ මඩ ඇරෙන්න මට නම් වෙන කිසිවක් පෙනුනේ නැහැ.

"මේකෙ දීප්තිමත් ගතියක් තියෙනවා," රේචල් කියා සිටියා. "බොහොම ලාවට. ඒත් ඉස්සරහට යන එක තමයි හරි පාර. වම් පැත්තේ උමග ඇතුළට වෙන්න, අර ගස් මුල් පණ තියෙන ඒවා වගේ නලියනවා. මම නම් ඒකට කොහෙත්ම කැමති නැහැ. දකුණු පැත්තේ, අඩි විස්සක් විතර ඇතුළෙන් උගුලක් තියෙනවා. බිත්ති දිගේ හිල් තියෙනවා, සමහරවිට උල්වලට වෙන්න ඇති. අපි ඒ අවදානම ගන්න ඕනෑ කියලා මට නම් හිතෙන්නෑ."

එයා විස්තර කරමින් සිටි කිසි දෙයක් මට පෙනුනේ නැති වුණත්, මම ඔළුව වැනුවා. "හරි. ඉස්සරහට."

"ඔයාට එයාව විශ්වාස ද?" ඇනබෙත් ඇසුවා.



"ඔව්," මම කිව්වා. "ඇයි ඔයාට නැද්ද?"

ඇනබෙත් වාද කරන්න වගේ බලා සිටියත්, එයා රේචල්ට ඉස්සර වෙලා යන්න ඉඟි කරමින් අතක් වැනුවා. අපි එක්ව ගඩොලින් බැඳි කොරිඩෝව දිගේ ඉදිරියටම ගියා. එය ඇඹරෙමින් වංගු ගත්තත්, තවත් පැති උමං තිබුනේ නම් නැහැ. එය පහළට ආනතව, තවත් පොළොව ගැඹුරට යනවා වගෙයි දැනුණේ.

"උගුල් නැද්ද?" මම ඇසුවේ සැකයෙන්.

"මුකුත් නෑ." රේචල්ගේ ඇහිබැමි එකට ගැට ගැසුණා. "ඒක මෙච්චර ලේසි වෙන්න පුළුවන් ද?"

"මං දන්නෙ නෑ," මම කිව්වා. "මීට කලින් නම් එහෙම වුනේ නැහැ."

"ඉතින්, රේචල්," ඇනබෙත් ඇසුවා. "ඇත්තටම, ඔයා කොහෙන්ද ආවේ?"

එයා ඒක ඇසුවේ හරියට 'ඔයා මොන ග්‍රහලෝකෙන් ද ආවේ?' කියලා අහනවා වගෙයි. ඒ වුණත් රේචල් එයින් අමනාප වූණ බවක් පෙනුනේ නැහැ.

"බෲක්ලින්වලින්," එයා කිව්වා.

"ඔයා පරක්කු වුනොත් ඔයාගේ අම්මා තාත්තා කලබල වෙන්නෙ නැති වෙයි ද?"

රේචල් සුසුමක් හෙළුවා. "එහෙම වෙන එකක් නැහැ. මම සතියක් තිස්සෙ අතුරුදහන් වෙලා හිටියත්, එයාලට ඒක තේරෙන එකක් නැහැ."

"ඇයි නැත්තේ?" මේ පාර නම් ඇනබෙත්ගේ හඬේ සරදමක් තිබුනේ නැහැ. දෙමව්පියෝ සමග ප්‍රශ්න තිබීම කියන්නේ එයාටත් පොදු දෙයක්.

රේචල් එයාට උත්තර දෙන්න කලින් අපිට ඉදිරියෙන් යෝධ දොරක් ඇරෙනවා වගේ හඬක් ඇහුණා.

"ඒ මොකක්ද?" ඇනබෙත් ඇසුවා.

"මං දන්නෑ," රේචල් කිව්වා. "යකඩ සරනේරු වගේ."

"ඔහ්, ඒක නම් හරිම ප්‍රයෝජනවත්. මං ඇහුවේ, මොකක්ද ඒක කියලා?"

Scanned with CamScanner

ඒ වෙලාවේ බර අඩි ශබ්දයක් කොරිඩෝව දෙදරවනවා ඇහුණා - ඒවා එමින් තිබුණේ අපේ පැත්තටයි.

"දුවමු?" මම ඇහුවා.

"දුවමු," ජේවල් එකඟ වුණා.

ආපසු හැරුණු අපි ආව පැත්තටම දුවන්න ගත්තා, ඒත් අඩි විස්සක් දුර යන්නත් කලින් අපිට ඉස්සරහට මුණ ගැහුණේ පරණ යාළුවෝ වගයක්. ඩ්‍රැකනෙයිලා - ග්‍රීක යුධ සන්නාහයෙන් සැරසුණු සර්ප ගැහැනු - දෙන්නෙක් අපේ පපුවට ඉලක්ක කර හෙලි මානාගෙන සිටියා. ඒ දෙන්නා මැද සිටියේ එම්පොසා වියර්ලීඩර්, කෙලී.

"හොඳයි, හොඳයි," කෙලී කිවුවා.

මම රිප්ටයිඩ්ගේ කොපුව ගැලෙව්වා, ඇනබෙත් එයාගේ කිණිස්ස ඇදලා ගත්තා, ඒ වුණත් මගේ පැන කඩුවකට හැරෙන්නත් කලින්, කෙලී ජේවල් උඩට කඩා පැන්නා. එයාගේ අත් නිය පහුරුවලට හැරුණා. එයා ජේවලව වටයක් කරකවා, නිය පහුරුවලින් එයාගේ බෙල්ල තදින් අල්ලා ගත්තා.

"ඔයාලගේ චූටි මනුස්ස හුරතලීව ඇවිදින්න අරන් යනවා වගේ?" කෙලී මගෙන් ඇහුවා. "එයාලා හරිම දුර්වල ජාතියක්. කඩලා බිඳලා දාන්න හරිම ලේසියි!"

අපිට පිටුපසින් අඩි හඬවල් ටික ටික ළං වුණා. අන්ධකාරය තුළින් යෝධ රුවක් මතුවුණා - රතු ඇස් සහ උල් දත් ඇති, අඩි අටක් උස ලැයිස්ට්‍රිගෝනියානු යෝධයෙක්.

අපිව දකපු හැටියේ යෝධයා තොල කට ලෙව කෑවා. "මං මුත්ව කන්ඩ ද?"

"එපා," කෙලී කිවුවා. "තුගේ ස්වාමියාට මුන්ව ඕනෑ වෙයි. එයාලාගෙන් සෑහෙන හොඳ ගනුදෙනුවක් කරගන්න ලැබෙයි." එයා මට හිනා වුණා. "දැන් යමු, අර්ධ-ලෝහිතයෝ. නැත්නම් මේ මිනිස් කෙල්ලගෙන් පටන්ගෙන, තුඹලා හැමෝටම මෙතැන ම මැරෙන්න වෙයි."

***

ඒක නම් මගේ නරකම හීනයටත් වඩා නරක වුණා. මාව විශ්වාස කරන්න. මම නරක හීන ගොඩක් දැකලා තියෙනවා. උමඟ



පහළට අපිව අරගෙන යද්දි, අපිට දෙපැත්තෙන් ඩ්‍රැකනෙයිලා දෙන්නත්, පිටුපසින් කෙලී සහ යෝධයාත් මුරට ආවේ බැරි වෙලාවත් අපි පැනලා දුවයි හිතලා වෙන්න ඇති. අපි ඉස්සරහට දුවයි කියලා නම් කවුරුවත් කරදර වුනේ නැහැ වගෙයි. එයාලට අපිව අරන් යන්න ඕනෑ වුනෙත් ඒ පැත්තටයි.

අපිට ඉදිරියෙන් ලෝකඩ දොරවල් දෙකක් මට පෙනුණා. අඩි දහයක් විතර උස් වූ ඒවා එකිනෙකට හරස් කළ කඩු යුගලවලින් සරසා තිබුණා. ඊට පිටුපසින් මහ සෙනගක් කෑගහනවා වගේ ගර්ජනාවක් ඇහුණා.

"ඔහ්, නියමයි," මට වම් පසින් සිටි සර්ප ගැහැනිය කිවුවා. "අපේ අනුග්‍රාහකයා එක්ක තුඹ සෑහෙන ජනප්‍රිය වෙයි."

මීට කලින් කවදාවත් මම ඩ්‍රැකනෙයි කෙනෙක්ව ළඟට දකලා තිබුනේ නැහැ. දැන් ඒකට අවස්ථාවක් ලැබීම ගැන මම කොහෙත්ම සතුටු වුනෙත් නැහැ. එයාට දෙකට බෙදුණු දිවකුයි, කළු ඉංගිරියා වෙනුවට කළු පාට දික් සිදුරු දෙකක් ඇති කහ පාට ඇස් දෙකකුයි නොතිබුණා නම් එයා ලස්සන වෙන්න තිබුණා. එයා ඉණ දක්වා දිවෙන ලෝකඩ සන්නාහයකින් සැරසී සිටියා. එතැනින් පහළ, එයාගේ දෙපා තිබිය යුතු තැන තිබුණේ ලෝකඩ සහ කොළ පාටින් පුල්ලි වැටුණු තඩි සර්ප කඳන් දෙකක්. එයා ලිස්සීමක් සහ ඇවිදීමක් අතර ගමනක් ගියේ හරියට හිමේ ලිස්සන සපත්තු දාගෙන යනවා වගෙයි.

"කවුද ඔයාලගේ අනුග්‍රාහකයා?" මම ඇහුවා.

එයා හිනාවක් විය හැකි පිඹීමක් කළා. "ඔහ්, තුඹට බලාගන්න ලැබෙයි. තුඹලාට මුණ ගැහෙන්න ලැබෙයි. කොහොම වුණත්, එයා තුඹගේ සහෝදරයා නේ."

"මගේ මොකා?" එක්වරම මගේ සිහියට ආවේ ටයිසන්වයි, ඒත් ඒක වෙන්න බැහැ. මේ සර්ප ගෑනි මොනවා ගැනද කියවන්නේ?

අපිව තල්ලු කරගෙන ඉදිරියට ගිය යෝධයා දොර ඇරියා. "තුඹ මෙතැනට වෙලා ඉන්නවා," ඇනබෙත්ව, එයාගේ කමිසයෙන් ඔසවාගත් යෝධයා කිවුවා.

"හේයි!" ඇනබෙත් විරෝධය පෑවා. ඒත් එයාට වඩා දෙගුණයක් විතර ලොකු යෝධයා ඒ වනවිටත් එයාගේ කිණිස්ස සහ මගේ කඩුව රාජසන්තක කරගෙන තිබුණා.

කෙලි මහ හඬින් හිනාවුණා. එයාගේ තියුණු පහුරු තවමත් තිබුණේ රේචල්ගේ බෙල්ල මතයි. "යනවා, පර්සි. අපිව විනෝද කරනවා. නුඹේ හැසිරීම පාලනය කරගන්න අපි නුඹේ යාළුවන්ව මෙතැන තියාගන්නම්."

මම රේචල් දිහා බැලුවා. "මට සමා වෙන්න. මම ඔයාව මේකෙන් ගලවගන්නම්."

යක්ෂණියක් බෙල්ල මිරිකගෙන ඉන්න වෙලාවකට කරන්න පුළුවන් තරමට එයා ඔළුව වැනුවා. "ඒක නම් හොඳයි."

ඩ්‍රැකනෙයි පිටුපසින් හෙලි තුඩකින් අනිද්දි මම මල්ලව පිටියකට ඇතුළු වුණා.

***

මං හිතන විදිහට මම ගිහින් තිබුණු ලොකුම මල්ලව පිටිය ඒක නෙවෙයි, ඒ වුණත් මුළුමනින්ම භූගතව ඇති තැනක් විදිහට බලද්දි, ඒක සැහෙන විශාලයි වගේ පෙනුණා. දූවිල්ලෙන් වැසුණු වෘත්තාකාර පිටිය ඒ හැටි ලොකු නැහැ. පිටිය මැද යෝධයෙක් සහ නරාශ්වයෙක් අතර සටනක් සිදුවෙමින් තිබුණා. නරාශ්වයා බයෙන් කුලප්පු වෙලා වගෙයි පෙනුණේ. එයා කඩුවක් සහ පලිහක් අත දරාගෙන එයාගේ හතුරා වටේ පිම්මේ දුවමින් සිටියා. ඒ අතරේ යෝධයා ටෙලිෆෝන් කණුවක් තරම් ලොකු හෙල්ලයක් වනද්දි සෙනඟ ඔල්වරසන් හඬ නැගුවා.

මුල්ම ආසන පේළිය තිබුණේ මල්ලව පිටියේ පොළොවේ සිට අඩි දොළහක් විතර උඩින්. පිටිය වටාම තිබූ තනි කළු ගල් ආසන සියල්ල පිරෙන්න සෙනඟ සිටියා. එතැන යෝධයෝ, ඩ්‍රැකනෙයිලා, ටෙලිකීන්ලා සහ තවත් අමුතු සත්තු සිටියාඃ වවුල් තටු ඇති රාක්ෂයෝ සහ අර්ධයක් මිනිස්, ඉතිරි අර්ධය ඔයා නම් කරන ඕනෑම සතෙක්ගේ - කුරුල්ලෙක්, උරගයෙක්, කුරුමිණියෙක්, ක්ෂීරපායියෙක් - හැඩය ගත් රාක්ෂයෝ.

ඒත් ගොඩක් ම බය හිතෙන දේ වුණේ හිස්කබල් ගොඩවලුයි. මල්ලව පිටිය එවායින් පිරී තිබුණා. ඒවා ගරාදි වැට වටේට තබා තිබුණා. අඩි තුනක් උසට තැබූ හිස්කබල් ගොඩවල්වලින් ආසන අතර සරසා තිබුණා. ඒවා වේදිකාවට පිටුපස උල් මත රැඳී දත් නියවමින් තිබුණා. තවත් ඒවා බිහිසුණු පොකුරු පහන් වගේ දම්වැල්වලින් සිවිලිමෙන් පහළට එල්ලෙමින් තිබුණා. ඒවාගෙන් සමහරක් සැහෙන පරණ වුණා



- ඒවාගේ තනි සුදට හැරුණු ඇටකටු ඇර වෙන කිසිවක් නැහැ. අනෙක් ඒවාට තිබුණේ සැහෙන අලුත් පෙනුමක්. ඒවාගේ පෙනුම නම් මම විස්තර කරන්නේ නැහැ. මාව විශ්වාස කරන්න, ඔයාලට ඒ විස්තරය අහන්නත් ඕනෑ නැති වෙයි.

මේ සියල්ල මැද, නරඹන්නන්ගේ වේදිකාවේ බිත්තියක් මත උදාරම් ලෙස ප්‍රදර්ශනය කරමින් තිබුණු දේ නම් මට කොහෙත්ම තේරුම් ගන්න බැරිවුණා - ඒ පොසෙයිඩන්ගේ ත්‍රිශූලය මධ්‍යයේ ඇති කොළ පාට කොඩියක්. මේ වගේ බිහිසුණු තැනක ඒක මොනවද කරන්නේ?

කොඩියට ඉහළින්, ගෞරවණීය අමුත්තන්ගේ අසුනක වාඩි වී සිටියේ මගේ පරණ හතුරෙක්.

"ලූක්," මම කිවුවා.

රැස්ව සිටි සෙනගේ ඝෝෂාවට ඉහළින් එයාට මාව ඇහුණා ද කියලා මට විශ්වාස නැහැ, ඒ වුණත් එයා කුරිරු හිනාවක් පෑවා. මම හීනෙන් දුටු විදිහටම එයා හමුදා මෝස්තරයේ කලිසමකින්, සුදු ටී-ෂර්ට් එකකින් සහ ලෝකඩ උර තහඩුවකින් සැරසී සිටියා. ඒ වුණත් එයා ළඟ තවමත් එයාගේ කඩුව නොතිබීම නම් අමුතු දෙයක් කියලයි මට හිතුණේ. එයාට එහා පැත්තෙන් වාඩි වී සිටියේ මෙච්චර කාලෙකට මම දකපු ලොකුම යෝධයායි. එයා පිටිය මැද නරාශ්වයා සමග සටන් කරමින් සිටි යෝධයාටත් වඩා ලොකුයි. ලූක් ළඟ සිටි යෝධයා අඩුම තරමේ අඩි පහළොවක්වත් උසයි, ඒ වගේම එයාගේ ඇඟේ පළලට ආසන තුනක් පිරී තිබුණා. එයා හැඳ සිටියේ සූමෝ මල්ලව පොරකරුවෙක් වගේ අමුඩයක් විතරයි. තද රතු පාටක් ගත් එයාගේ හම මතුපිට නිල් පාට රළ මෝස්තරයක් පච්චා කොටා තිබුණා. එයා ලූක්ගේ අලුත් පුද්ගලික ආරක්ෂකයාවත් වෙන්න ඇති කියලා මම හිතුවා.

පොර පිටියෙන් මර හඬදීමක් ඇසුණා. නරාශ්වයා විසි වී ඇවිත් මගේ ළඟට ඇදගෙන වැටෙද්දි මම පස්සට පැන්නා.

එයා පිංසෙණ්ඩු වෙමින් මගේ දිහා බැලුවා. "උදවු කරන්න!"

මම මගේ කඩුවට අත යැවූවා, ඒත් ඒක මගෙන් උදුර ගත්තට පස්සේ තවමත් මගේ සාක්කුවට ආපසු ඇවිත් තිබුනේ නැහැ.

හෙල්ලය සූදානමින් තබාගෙන යෝධයා කිට්ටු වෙද්දි නරාශ්වයා නැගිටින්න දඟලුවා.

උල් තිය පතුරු ඇති අතක් මගේ උරහිස් ග්‍රහණය කරගත්තා. "නුඹට යාළුවන්ගේ ජීවිත වටිනවා නම්," මගේ ඩ්‍රැකනෙයි මුරකාරිය කිවුවා, "ඕකට ඇඟිලි නොගහා හිටියොත් හොඳයි. මේක නුඹගේ සටන නෙවෙයි. නුඹේ වාරය එනකල් ඉන්නවා."

නරාශ්වයාට නැගිටින්න බැරිවුණා. එයාගේ එක කකුලක් කැඩිලා. නරාශ්වයාගේ පපුව මත යෝධ කකුලක් තැබූ යෝධයා හෙල්ලය ඉහළට එසෙව්වා. එයා ලූක් දිහා බැලුවා. "මරණය! මරණය!" රැස්ව සිටි සෙනඟ ජය ඝෝෂා කළා.

ලූක් කිසිවක් කළේ නැහැ, ඒත් එයා ළඟින් වාඩි වී සිටි පච්චා කොටාගත් සූමෝ හාදයා නැඟී සිටියා. එයා පහළ සිටි නරාශ්වයාට හිනාවෙද්දි, නරාශ්වයා කෙඳිරි ගෑවා, "කරුණාකරලා! එපා!"

ඒ වෙලාවේ සූමෝ හාදයා අතක් ඉදිරියට දිගු කරලා, මහපටැඟිල්ල යටි අතට හරවා සංඥා කළා.

මල්ලව පොර යෝධයා, එයාගේ හෙල්ලයෙන් දමා අනිද්දි මම ඇස් පියාගත්තා. මම ආපසු ඇස් ඇර බලද්දි නරාශ්වයා අළුවලට කුඩු වී, යන්න ම ගිහිල්ලා. එයාගෙන් ඉතිරිව තිබුණේ එක කුරයක් විතරයි. ජය සලකුණක් ලෙස ඒ කුරය ගත් යෝධයා ඒක සෙනඟට පේන්න එසවූවා. එයාලා ඒක අනුමත කරමින් ඝෝෂා කළා.

ක්‍රීඩාගාරයේ විරුද්ධ පැත්තෙන් ඇරුණු දොරෙන් යෝධයා ජයග්‍රාහීව පිටව ගියා.

වේදිකාව මත සිටි සූමෝ හාදයා අතක් ඔසවා පිරිස නිහඬ කළා.

"හොඳ විනෝදාංගයක්!" එයා ගිගුරුවා. "ඒත් මම මීට කලින් දැකලා නැති දෙයක් නෙවෙයි. නුඹ ළඟ තව මොනවද තියෙන්නේ, ලූක්, හර්මීස්ගේ පුත්‍රයෝ?"

ලූක්ගේ හනු තද වුණා. 'හර්මීස්ගේ පුත්‍රයා' කියලා කවුරුවත් එයාට කතා කරනවට එයා කැමති නැති බව මට තේරුණා. එයා එයාගේ තාත්තාට වෛර කළා. ඒ කොහොම වුණත් එයා සන්සුන්ව නැගී සිටියා. එයාගේ ඇස් දිලිසුණා. ඇත්ත වශයෙන්ම, එයා සිටියේ සෑහෙන හොඳ මුහුණුවරකයි.



"ඇන්ටියස් උතුමාණෙනි," ලූක් කිවුවේ මුළු සෙනඟටම ඇහෙන තරම් සද්දෙන්. "ඔබගේ භූමිය හරහා යන්න ඉඩ දීලා, අපිට කරපු උපකාරයට, ඔබතුමාව විනෝදයට පත් කරලා කළගුණ සලකන්න ලැබීම අපිට සතුටක්."

"ඒ උදවුව කරන්න මම තවම කැමැත්ත දුන්නෙ නැහැ," ඇන්ටියස් ගෙරෙව්වා. "මට ඕනෑ විනෝදය!"

ලූක් නැමී ආචාර කළා. "ඔබතුමාගේ මල්ලව පිටියේ සටන් කරවන්න නරාශ්වයින්ට වඩා හොඳ දෙයක් දැන් මගේ ළඟ තියෙනවා කියලා මං හිතනවා." එයා අත දිගු කර මාව පෙන්වූවා. "පර්සි ජැක්සන්, පොසෙයිඩන්ගේ පුතෙක්."

නරඹන්නන් මට ඔච්චම් කරමින් ගල්වලින් ගහන්න පටන් ගත්තා. බොහෝමයක් ඒවා මම මග ඇරියත්, එකක් මගේ කම්මුලේ වැදී සෑහෙන ලොකු කැපුමක් ඇති කළා.

ඇන්ටියස්ගේ ඇස් දැල්වුණා. "පොසෙයිඩන්ගේ පුතෙක්? එහෙනම් එයා හොඳින් සටන් කර යුතුයි! නැත්නම් හොඳින් මිය යා යුතුයි!"

"එයාගේ මරණය ඔබතුමාව සතුටු කළොත්," ලූක් ඇසුවා. " ඔබගේ භූමිය හරහා මගේ හමුදාවට යන්න ඉඩ දෙනවා ද?"

"සමහරවිට!" ඇන්ටියස් කිවුවා.

'සමහරවිට' කතාවට ලූක් නම් ඒ හැටි සතුටු වුණ බවක් පෙනුණේ නැහැ. එයා මට රැවුවේ හරියට මම විශිෂ්ට විදිහට මැරුනේ නැත්නම්, ලොකු කරදරේක වැටෙන්න වෙයි කියලා අනතුරු අඟවන්න වගෙයි.

"ලූක්!" ඇනබෙත් මොර දුන්නා. "මේක නවත්තන්න. අපිට යන්න දෙන්න!"

එයාව ලූක්ගේ අවධානයට මුලින්ම හසු වුණේ ඒ වෙලාවේ වගෙයි. ලූක් මොහොතකට තිගැස්සුණු බව පෙනුණා. "ඇනබෙත්?"

"ගෑනුන්ට සටන් කරන්න පස්සෙ ඇති තරම් වෙලාව ලැබෙයි," ඇන්ටියස් මැදට පැන්නා. "මුලින්ම, පර්සි ජැක්සන්, නුඹ තෝරාගන්න ආයුධය මොකක්ද?"

ඩ්‍රැකනෙයි මාව පිටිය මැදට තල්ලු කළා.

මම ඇන්ටියස් දිහා බැලුවා. "ඔයා කොහොමද පොසෙයිඩන්ගෙ පුතෙක් වෙන්නෙ?"

ඇන්ටියස් මහ හඬින් හිනා වෙද්දි, ඉතුරු සෙනඟත් එයා අනුව හිනාවුණා.

"මම තමයි එයාගේ ප්‍රියතම පුතා!" ඇන්ටියස් දෝංකාර නැගෙන හඬින් කිවුවා. "බලනවා, මම පෑටීවිය සොලවන්නා වෙනුවෙන් හැදුව දේවස්ථානය දිහා! මම ඒක හැදුවේ එතුමාගේ නාමයෙන් මම මැරුව එවුන්ගේ හිස්කබල්වලින්! තුඹටත් ඒ ගොඩට එකතු වෙන්න ලැබෙයි!"

ඒ හිස්කබල් ගොඩ දිහා මම බලා සිටියේ භීතියෙන් - හිස්කබල් සිය ගාණක් - සහ පොසෙයිඩන්ගේ ධජයත් එතැන තිබුණා. මේක මගේ තාත්තා වෙනුවෙන් හැදූ දේවස්ථානයක් වෙන්නේ කොහොමද? මගේ තාත්තා හොඳ කෙනෙක් නේ. එයා මගෙන් කාගෙවත් හිස්කබලක් තියා පියවරුන්ගේ දිනයට කාඩ් එකක්වත් ඉල්ලලා නැහැ.

"පර්සි!" ඇනබෙත් මට මොර ගැසුවා. "එයාගේ අම්මා තමයි ගයියා! ගයි-"

එයාව අල්ලගෙන සිටි ලැයිස්ට්‍රිගෝනියානුවා එයාගේ කට අතකින් වැසුවා. *එයාගේ අම්මා ගයියා*. ඒ කියන්නේ මහී දෙවඟන. ඇනබෙත් මට කියන්න උත්සහ කළේ ඒක වැදගත් නිසයි, ඒ වුණත් ඒ ඇයි කියලා මට තේරුනේ නැහැ. සමහරවිට මේ යෝධයාගේ අම්මා තාත්තා දෙන්නම දෙවිවරු කියලා වෙන්න ඇති. ඒකෙන් වෙන්නේ එයාව මරන එක තවත් අමාරු වෙන එකයි.

"ඔහේට පිස්සු, ඇන්ටියස්," මම කිවුවා. "මේක හොඳ පූජාවක් කියලා ඔහේ හිතනවා නම්, ඔහේ පොසෙයිඩන් ගැන කිසි දෙයක් දන්නෙ නැහැ."

රැස්ව සිටි සෙනඟ මට අපහාස කරමින් බෙරිහන් දුන්නා, ඒත් ඇන්ටියස් එයාලව නිහඬ කරවන්න අතක් එසෙව්වා.

"ආයුධ," එයා බල කරමින් කිවුවා. "ඊට පස්සෙ අපි බලමු තුඹ මැරෙන්නෙ කොහොමද කියලා. තුඹට ඕනෑ පොරොවක් ද? පලිහක්? දැල්? ගිනි විදිනයක්?"

"මගේ කඩුව විතරක් ඇති," මම කිවුවා.



රාක්ෂයින් අතරේ හිනාවක් පුපුරා ගියා, ඒත් එසැණින් ම රිප්ටයිඩ් මගේ අතේ මතු වෙද්දි සමහරුන්ගේ හිනාවල් කෙඳිරියකට හැරුණා. කඩුවේ ලෝකඩ තලය තුනී එළියකින් දිලිසුණා.

"පළවෙනි වටය!" ඇන්ටියස් නිවේදනය කළා. ගේට්ටු පියන් විවර වී මුකතෙයි කෙනෙක් ලිස්සාගෙන ආවා. එයාගේ එක අතක ත්‍රිශූලයකුත්, අනෙක් අතේ බර එල්ලූ දැලකුත් තිබුණා - සාම්ප්‍රදායික මල්ලව පොර ආයුධ. මම කඳවුරේ දි ඒ ආයුධවලට විරුද්ධව සටන් කරන්න අවුරුදු ගාණක් පුහුණුවීම් කරලා තිබුණා.

මකර ගැහැනිය අත්හදා බලන්න වගේ මට ඇනලා බැලුවා. මම පැත්තකට අඩිය තැබුවා. මම කඩුව දරාගෙන සිටි අත පටලවන්න හිතාගෙන එයා දැල දමුවත්, මම ලේසියෙන් ම ඒය මග ඇරලා, එයාගේ හෙල්ලය දෙකට කපා දමමින්, එයාගේ සන්නාහයේ සිදුරක් තුළින් රිප්ටයිඩ් දමා ඇන්නා. වේදනාත්මක විලාපයක් සමග එයා වාෂ්ප වී යද්දි සෙනගේ ජය ඝෝෂාව නැවතුණා.

"නෑ!" ඇන්ටියස් ගර්ජනා කළා. "ඉක්මන් වැඩියි! තුඹ මරන්න කලින් වෙලාව ගන්න ඕනෑ. ඒකට අණ දෙන්නේ මම විතරයි!"

මම ඇනබෙත් සහ රේචල් සිටි දිහාවට බැල්මක් හෙළුවා. එයාලව නිදහස් කරගන්න මම ක්‍රමයක් හොයාගන්න ඕනෑ, සමහරවිට මුරකාරයින්ගේ අවධානය වෙන අතකට හැරෙව්වොත් හරි යයි.

"නියම වැඩේ, පර්සි." ලූක් හිනාවුණා. "ඔයා ඉස්සරටත් වඩා කඩු සටන්වලට දක්ෂ වෙලා. මං ඒක කියන්න ම ඕනෑ."

"දෙවෙනි වටය!" ඇන්ටියස් මොර දුන්නා. "මේ වතාවේ හෙමින්! විනෝදය වැඩියෙන්! මේ වතාවේ මරන්න කලින් මං අණ දෙනකල් ඉන්නවා! එහෙම නැති වුනොත්"

නැවත වරක් විවර වුණු ගේට්ටුව තුළින් මෙවර පිටියට ආවේ තරුණ යුධ භටයෙක්. මට වඩා ටිකක් වැඩිමල් කෙනෙක් වුණ එයාට වයස අවුරුදු දාසයක් විතර ඇති. එයාට දිලිසෙන කළු කොණ්ඩයක් තිබුණා. එයාගේ වම් ඇහැ රෙදි කැල්ලකින් වසා තිබුණා. කෙසඟ කොල්ලෙක් වුණ එයාගේ ඇඟේ ග්‍රීක සන්නාහය බුරුලට එල්ලෙමින් තිබුණා. කඩුව බිම ගැසූ එයා, පලිහේ පටි සකසා ගෙන, අශ්ව කෙස් රැල්ලක් සවි කළ යුධ හිස්වැසුම දමාගත්තා.

"කවුද ඔයා?" මම ඇහුවා.

"ඊතන් නකමුරා," එයා කිව්වා. "මට ඔයාව මරන්න වෙනවා."

"ඇයි ඔයා මේක කරන්නේ?"

"හේයි!" වේදිකාවේ සිටි රාක්ෂයෙක් ඇද කළා. "කතාව නවත්තලා සටන් කරනවා!" අනෙක් රාක්ෂයෝත් කෑගහන්න පටන් ගත්තා.

"මට මං ගැන ඔප්පු කරලා පෙන්වන්න වෙනවා," ඊතන් කිව්වා. "එයාලට එකතු වෙන්න තියෙන එකම ක්‍රමය ඒකයි."

එහෙම කියපු එයා පහර දෙන්න පැන්නා. හිස් අවකාශයේ අපේ කඩු එකට ගැටෙද්දි සෙනඟ ඝෝෂා කරන්න පටන් ගත්තා. ඒක හරි දෙයක් වගේ දැනුනේ නැහැ. රාක්ෂයෝ රැළකට විනෝදය සපයන්න සටන් කරන්න මට ඕනෑ වුනේ නැහැ, ඒත් ඊතන් නකමුරා මට වෙන කරන්න දෙයක් ඉතිරි කළෙත් නැහැ.

එයා මාව තෙරපමින් ඉදිරියට ආවා. එයා සෑහෙන දක්ෂයි. මම දන සිටි තරමින්, එයා කවදාවත් අර්ධ-ලෝහිත කඳවුරේ ඉඳලා නැහැ. ඒ වුණත් එයා පුහුණුවීමක් ලබා තිබුණා. මගේ පහර වැළකූ එයා, එයාගේ පලිහෙන් ගහන්න උත්සහ කළත්, මම ආපස්සට පැන්නා. එයා කඩුවෙන් ගැහුවා. මම පැත්තකට පෙරළුණා. අපි දෙන්නා අතරේ වැරෙන් ඇනීම් සහ පහර මග ඇරීම් හුවමාරු වෙද්දි, එකිනෙකාගේ සටන් විලාසය හඳුනා ගන්න අපි උත්සහ කළා. ඊතන්ගේ අන්ධ පැත්තෙන් දිගින් දිගටම පහර දෙන්න මම උත්සහ කළත්, එයින් වැඩි උදව්වක් වුනේ නැහැ. පෙනුණු හැටියට එයා සෑහෙන කාලයක් තිස්සේ තනි ඇහැකින් සටන් කරන්න ඇති, මොකද එයා බොහොම හොඳින් එයාගේ වම් පැත්තත් ආරක්ෂා කරගත්තා.

"ලේ ඕනෑ!" රාක්ෂයෝ මොර ගැහුවා.

මගේ ප්‍රතිවාදියා වේදිකාව දිහාවට බැල්මක් හෙළුවා. එයාගේ දුර්වලතාවය ඒකයි කියලා මට තේරුණා. එයාට උවමනා වෙලා තිබුණේ එයාගේ දක්ෂකම්වලින් එයාලව සතුටු කරවන්නයි. මට එහෙම කිසිම උවමනාවක් තිබුනේ නැහැ.

කෝපාන්විත රණ හඬක් නැගූ එයා මට පහර දෙන්න දුවගෙන ආවා. ඒත් එයාගේ කඩුව පැත්තකට හැරවූ මම පසු බැස්සේ එයාට මාව ලුහුබඳින්න සලසමින්.

"ඉ...හු!" ඇන්ටියස් කිව්වා. "නැවතිලා සටන් කරනවා!"



ඊතන් මාව තෙරපුවත් පලිහක් නැතිවම වුණත් ආරක්ෂාව සලසා ගන්න මට කිසිම අපහසුවක් වුනේ නැහැ. එයා ආරක්ෂාවට බර සන්නාහයකින් සහ පලිහෙන් සැරසී සිටි නිසා පහර දීම් කරන්න එයාට ගොඩක් වෙහෙසෙන්න වුණා. මම පහසු ඉලක්කයක් වුණත්, ඒ වගේම මම සැහැල්ලු සහ වේගවත් වුණා. සෙනඟ පිස්සු හැදිලා වගේ බැණ අඩගසන්නත්, ගල් මුල්වලින් ගහන්නත් පටන් ගත්තා. අපි දත් විනාඩි පහක් විතර සටන් කරමින් සිටියත් තවම කාගේවත් ලේ වැගිරීමක් වුනේ නැහැ.

අන්තිමේ දි ඊතන්ට වැරදීමක් වුණා. එයා මගේ බඩට අනින්න උත්සහ කළා. ඒත් එක්කම මම, මගේ කඩුවෙන් එයාගේ කඩු මිට හිර කරගෙන. එය ඇඹරුවා. එයාගේ කඩුව දූවිලි ගොඩට ඇද වැටුණා. එයාට ඒක නැවත ලබාගන්න ඉඩක් ලැබෙන්න කලින්, මම කඩු මිටෙන් එයාගේ හිස්වැසුමට තද පහරක් දීලා, එයාව බිමට තල්ලු කරා. එයාගේ බර සන්නාහයෙන් එයාට වඩා උදව්වක් ලැබුණේ මටයි. එයා මහන්සියෙන් සහ තෝන්තුවෙන් ආපස්සට ඇද වැටුණා. මම, මගේ කඩු තුඩ එයාගේ පපුවට එල්ල කරා.

"ඉවරයක් කරලා දානවා," ඊතන් කෙඳිරි ගෑවා.

මම ඉහළට හැරී ඇන්ටියස් දිහා බැලුවා. එයාගේ රතු මූණ තරහෙන් ඇඹුල් වී තිබුණත්, එයා අතක් ඔසවා මහපටැඟිල්ල පහළට හැරෙව්වා.

"නිකං ඉන්නවා," මම මගේ කඩුව කොපුවට දමාගත්තා.

"මෝඩයෙක් වෙන්නෙපා," ඊතන් කෙඳිරි ගෑවා. "එයාලා අපි දෙන්නවම මරලා දායි."

මම එයාට අත දුන්නා. පැකිළෙමින් වුණත්, එයා ඒක ගත්තා. මම එයාට නැගිටින්න උදව් කළා.

"තරඟයට අවනම්බු කරන්න කාටවත් බැහැ!" ඇන්ටියස් ගර්ජනා කළා. "නුඹලා දෙන්නගෙම ඔළු ගෙඩි පොසෙයිඩන්ට පූජාවට තියනවා!"

මම ඊතන් දිහා බැලුවා. "ඉඩක් දැකපු හැටියේ, දුවන්න." ඊට පස්සෙ මම ආපහු ඇන්ටියස් වෙත හැරුණා. "ඇයි ඔහේම මාත් එක්ක සටන් කරන්න එන්නැත්තේ? ඔහේට තාත්තගේ පිහිට ලැබිලා තියෙනවා නම්, පහළට ඇවිත් ඒක ඔප්පු කරලා පෙන්නනවා!"

Scanned with CamScanner

නැරඹුම් වේදිකාවල සිටි රාක්ෂයෝ ගොරවන්න ගත්තා. වරෙට බැල්මක් හෙළූ ඈන්ටියස්ට වෙන කරන්න දෙයක් නැති බව තේරුම් ගියා වගෙයි. බයගුල්ලෙක් වගේ නොපෙනෙන්න එයාට බැහැ කියන්න පුළුවන්කමක් තිබුනේ නැහැ.

"මම තමයි මේ ලෝකෙ ඉන්න ශ්‍රේෂ්ඨම මල්ලවපොර ගුරයා, කොල්ලෝ," එයා අනතුරු ඇඟෙව්වා. "මම පළවෙනි පන්ක්‍රෂන් එකේ ඉඳලම මල්ලවපොර කරන කෙනෙක්."

"පන්ක්‍රෂන්?" මම ඇහුවා.

"ඒ කියන්නේ මරණය දක්වා සටන් කරනවා කියන එක," ඊතන් කිව්වා. "නීති-රීති මුකුත් නැහැ. සීමා මායිම් නැහැ. ඒක ඉස්සර ඔලිම්පික් ක්‍රීඩා ඉසව්වක් වෙලා තිබුණා."

"කියලා දුන්නට ස්තුතියි," මම කිව්වා.

"ඒ ගැන මතක් කරන්නෙපා."

රේචල් ඇස් ලොකු කරගෙන මගේ දිහා බලා සිටියා. ලැයිස්ට්‍රිගෝනියානුවාගේ අතින් තවමත් කට වැසී තිබුණත්, ඈනබෙත් තදින් ඔළුව හෙල්ලුවා.

මම ඈන්ටියස්ට කඩුව දිගු කළා. "දිනන කෙනාට හැමදේම ලැබෙනවා! මම දිනුවොත්, අපි හැමෝම නිදහස් වෙලා යනවා. ඔයා දිනුවොත්, අපි මැරෙනවා. ස්ටයික්ස් ගඟ පිට දිවුරනවා!"

ඈන්ටියස් මහ හඬින් හිනාවුණා. "මේකට ඒ හැටි වෙලාවක් යන එකක් නැහැ. මම නුඹේ කොන්දේසිවලට එකඟ වෙන්න දිවුරනවා!"

එයා ගරාදි වැටට උඩින් පිටියට පැන්නා.

"සුබ පැතුම්," ඊතන් මට කිව්වා. "ඔයාට ඒක ඕනෑවෙයි." ඊට පස්සෙ එයා ඉක්මනින්ම පසු බැස්සා.

ඈන්ටියස් ඇඟිලිවල කරගැට කැඩුවා. එයා දත් නියවද්දි මම දක්කේ එයාගේ දත් රළ මෝස්තරයට එකපිට එක වැටී ඇති හැටියි. කෑම කෑවට පස්සෙ දත් මදින එක එයාට නම් හරිම අමාරු වැඩක් වෙන්න ඇති.

"ආයුධ?" එයා ඇහුවා.

"මට මගේ කඩුව ඇති. ඔයා?"



දෑත් දිගු කළ එයා ඇඟිලි නැටෙව්වා. "මට වෙන මුකුත් ඕනෑ නෑ! මාස්ටර් ලූක්, නුඹ තමයි තරග විනිශ්චයකාරයා."

ලූක් මට හිනාවුණා. "සතුටින් බාරගන්නවා."

ඈන්ටියස් පහර දෙන්න පැන්නා. මම එයාගේ කකුල් දෙක අතරින් පෙරළී, එයාගේ කලවයක් පිටුපසට ඇන්නා.

"ආර්ග්ග්!" එයා මොර දුන්නා. ඒත් තුවාලයෙන් ලේ වෙනුවට වැලි පිල්ලක් ගලන්න පටන් ගත්තේ හරියට මම වැලි ඔරලෝසුවක පැත්තක් හිල් කරලා වගෙයි. ඒවා පොළොව මත විසිරෙද්දි එයාගේ කකුල වටේට දූවිලි එකතු වුණේ අච්චුවක් වගෙයි. ඒ දූවිලි ආපහු හැලී යද්දි තුවාලය අතුරුදහන් වෙලා.

එයා ආයෙමත් පහර දෙන්න දුවගෙන ආවා. වාසනාවකට, යෝධයෝ සමග සටන් කරලා මට අද්දැකීම් ටිකක් තිබුණා. මේ වතාවේ මම පැත්තකට පැනලා, එයාගේ අතකට යටින් ඇන්නා. රිප්ටයිඩ්ගේ මිට දක්වාම එයාගේ ඉළ ඇට අතරට ගිලුණා. ඒක තමයි හොඳ ආරංචිය. නරක ආරංචිය තමයි, යෝධයා හැරෙද්දි කඩු මිට මගේ අතින් අත ඇරුණා. ඒත් එක්කම නිරායුධ මාව පිටිය හරහා විසිවුණා.

ඈන්ටියස් වේදනාවෙන් මොර ගැසුවා. එයා දූවිල්ලකට කුඩු වී යනතුරු මම බලා සිටියා. මගේ කඩුවෙන් ලැබුණු ඒ වගේ තියුණු පහරක් දරාගන්න කිසිම යකෙකුට පුළුවන් වෙලා නැහැ. දිව්‍යමය ලෝකඩ තලයෙන් එයාගේ ජීවය විනාශ වෙන්න ම ඕනෑ. ඒත් ඈන්ටියස් කළේ කඩු මිට අමාරුවෙන් අල්ලාගෙන, කඩුව එළියට ඇදලා අරන්, පිටිපස්සට විසි කරපු එක විතරයි. එයාගේ තුවාලයෙන් තවත් වැලි වැගිරුණත්, නැවතත් එයාව ආවරණය කරන්න පොළොව නැඟී සිටියා. එයාගේ උරහිස් දක්වා ම දූවිල්ලෙන් වැසුණා. ඒවා ආපසු හැලී යද්දි, ඈන්ටියස් සුව වී සිටියා.

"මං කවදාවත් පරදින්නැත්තේ ඇයි කියලා දැන් නුඹට පේනවා නේද, උප දෙවියෝ!" ඈන්ටියස් පාරම් බෑවා. "මෙහෙට ඇවිල්ලා මට නුඹව චප්ප කරන්ඩ ඉඩ දෙනවා. මං ඒක ඉක්මනින් කරන්නම්!"

ඈන්ටියස් සිටගෙන සිටියේ මමත්, මගේ කඩුවත් අතරයි. කර කියාගන්න දෙයක් නැතුව දෙපැත්ත බලද්දි, මට ඈනබෙත්ගේ ඇස් හසුවුණා.

Scanned with CamScanner

පොළොව. මම හිතුවා. ඇතමෙත් මට කියන්න උත්සහ කළේ මොකක්ද? ඇන්ටියස් අම්මා තමයි ගයියා - මහී කාන්තාව. ඒ කියන්නේ හැමෝටම වඩා පෞරාණිකම දෙවඟන. ඇන්ටියස්ගේ තාත්තා පොසෙයිඩන් වෙන්න ඇති. ඒත් ගයියා එයාගේ ජීවිතය රකිමින් සිටියා. එයා පොළොවේ පය ගසාගෙන ඉන්න තාක් මට එයාට කිසිම හානියක් කරන්න බැහැ.

මම එයාගේ වලෙවින් යන්න උත්සහ කළා. ඒත් ඇන්ටියස් මගේ උපක්‍රමය කලින්ම අනුමාන කර තිබුණා. එයා තනියම හිනාවෙමින් මගේ පාර අවහිර කළා. එයා දත් කරමින් සිටියේ මීයෙක්ව අල්ලාගත් පූසෙකු වගේ මාත් එක්ක සෙල්ලම් කරන එකයි. එයා මාව කොටු කරගෙන තිබුණා.

එයාගේ කකුලන්ගේ හිස්කබල් වැනෙමින් තිබුණු සිවිලිමෙන් පහළට එල්ලෙන දම්වැල් දිහා මම බැලුවා. හදිසියේ ම මට අදහසක් ආවා.

මම අනෙක් පැත්තට යනවා වගේ බොරුවට ඇඟෙව්වා. ඇන්ටියස් මගේ මග ඇහිරුවා. මාව ඉවර කරලා දාන්න බල කරමින් යක්ව සිටි රාක්ෂයෝ ඇන්ටියස්ට මොර ගැසුවත්, එයා සිටියේ සැහෙන්න විනෝද වෙමිනුයි.

"චූට්ටං කොල්ලා." එයා කිව්වා. "සමුද්‍ර දෙවියන්ගේ පුතෙක් වෙන්ඩ වටින්නැ!"

මගේ පැන ආපනු සාක්කුවට ඇවිත් ඇති බව මට දැනුණා. ඒත් ඇන්ටියස් ඒක දන්නෙ නැහැ නේ. එයා හිතාගෙන ඇත්තේ රිප්ටයිඩ් තවමත් එයාට පිටුපස දූවිලි ගොඩේ කියලයි. මගේ අරමුණ කඩුව ආපනු ගන්න එක කියලා එයා හිතාවි. ඒක මහා ලොකු වාසියක් නොවුණත්, ඒ වෙලාවේ මට තිබුණේ එච්චරයි.

මම කෙලින්ම ඉදිරියට දුවන අතරේ ම පහළට නැමුණේ. මම ආයෙමත් එයාගේ කකුල් අතරින් රිංගන්න යනවා කියලා එයාට හිතෙන්න අරින්නයි. එයා කඩුලු රකින්නෙක් වගේ ඉස්සරහට නැමිලා මාව අල්ලගන්න සූදානමින් ඉන්න අතරේ. මම කළේ පුළුවන් තරම් උඩට පනින එකයි - එයාගේ උඩු බාහුවට කකුල ගසා ගැම්ම අරන්. ඉණිමගක වගේ එයාගේ උරහිසට නැගලා, එයාගේ ඔළුව උඩින් මම කකුලක් තැබුවා. මම බලාපොරොත්තු වුණ දේම එයා කළා. "හේයි!" එයා තරහෙන් කෑගසමින් කෙලින් වුණා. මම එයාගේ බලයෙන් සිවිලිම



දිහාවට විසි වෙන්න ගැම්ම ගත්තා. මම දම්වැලක් මුදුනේ එල්ලෙද්දි, මට පහළින් හිස්කබල් සහ කොකු අම්බිට් හඬින් සෙලවුණා. ටාසන් ජන්ගියේ දී කඹයක එල්ලී නටින්න පුහුණු වී තිබුණු විදිහටම මම දම්වැල වටා කකුල් පටලවා ගත්තා. ඊට පස්සෙ මම රිප්ටයිඩ් ඇදලා අරන් මගේ ළඟින්ම වූ දම්වැල කපාගත්තා.

"පහළට එනවා, බයගුල්ලෝ!" ඇන්ටියස් ගිගුරුවා. එයා මාව වැනැගන්න උත්සහ කළත්, මම සිටියේ එයාගේ අතට හසු නොවෙන මානයේයි. පණ බේරගන්න එල්ලී ඉන්න අතරේ ම මම මොර දුන්නා, "පුළුවන් නම් උඩට ඇවිල්ලා මාව අල්ල ගන්නවා! එහෙම නැත්නම් මහේ ඒක කරන්න තව වැඩියි ද?"

බෙරිහන් දුන්න එයා තවත් වතාවක් මාව වැනැගන්න උත්සහ කළා. දම්වැලක් අල්ලා ගත් එයා උඩට බඩගාන්න උත්සහ කළා. එයා ඒකට දඟලන අතරේ, මම කපාගෙන තිබුණු දම්වැලේ කොක්ක පහළට හිටින්න හෙමින් සීරුවේ පහත් කළා. වැරදුණ උත්සහයන් දෙකකට පස්සේ, අන්තිමේ දී මම ඇන්ටියස්ගේ අඩුවයට කොක්ක පටලවා ගත්තා.

"වාහන්!" එයා මොර ගැසුවා. ඉක්මනින්ම මම කපා තිබූ දම්වැල මම එල්ලී සිටි දම්වැලේ ගාංචු පුරුකක් තුළින් යවා, තදින් ඇදලා, මට පුළුවන් උපරිමයෙන් සිරකළා. ඇන්ටියස් ලිස්සා බිමට යන්න හැදුවත්, අඩුවයෙන් එල්ලී පැද්දෙමින් සිටි එයාට ගැලවෙන්න බැරිවුණා. යටිකුරු අතට නොවැටී ඉන්න එයාට අත් දෙකෙන්ම අනෙක් දම්වැල්වල එල්ලී ඉන්න සිද්ධ වුණා. තව තත්පර කිපයකට අඩුවයට සහ දම්වැලට බර දරාගන්න පුළුවන් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරා. ඇන්ටියස් ශාප කරමින් දඟලද්දි, මම අනෙක් දම්වැල්වල එල්ලී පැද්දෙමින් ඒවා කපා දැමුවේ පිස්සු හැදුණ වඳුරෙක් වගෙයි. මම කොකු සහ දම්වැල්වලින් නොණ්ඩු සෑදුවා. මං ඒක කොහොම කරා ද කියලා මම දන්නෙත් නැහැ. මගේ අම්මා හැම වෙලාවෙ ම කියපු කතාවක් තමයි මට හැමදේම පටලවන්න නම් හොඳ හැකියාවක් තියෙනවා කියලා. මට හිතා වුණේ කොහොම හරි මගේ යාළුවන්ව බේරගන්නයි. කොහොම වුණත්, විනාඩි දෙකක් යද්දි යෝධයා පොළොවෙන් ඉහළ, දම්වැල් සහ කොකු ගොඩක පැටලිලා, කර කියාගන්න දෙයක් නැතිව ගොරවමින් සිටියා.

මම දාඩිය පෙරාගෙන, හති දමමින් බිමට පැන්නා. දම්වැල් දිගේ බඩ ගාලා මගේ අත් නම ගිහින් තිබුණා.

"මාව පහළට ගන්නවා!" ඇන්ටියස් තර්ජනය කළා.

"එයාව නිදහස් කරනවා!" ලූක් අණ කළා. "එයා තමයි අපේ අනුග්‍රාහකයා!"

මම විස්ටයිඩ්ගේ කොපුව ගැලෙව්වා. "මම එයාව නිදහස් කරන්නම්."

ඒත් එක්කම මම යෝධයාගේ බඩට ඇන්නා. එයා මර හඬ දෙද්දි, කඩුව වැදුණු තැනින් වැලි එළියට වැගිරෙන්න ගත්තා. ඒ වුණත් මේ වතාවේ එයා හිටියේ පොළොවෙන් සැහෙන උසකින් නිසා, එයාට උදවු කරන්න දූවිල්ල නැගී සිටියේ නැහැ. ටිකෙන් ටික එළියට වැගිරී ඇන්ටියස් නිකං ම විසිරිලා ගියා. අන්තිමේදි ඉතුරු වුණේ පැද්දෙන දම්වැල් ගොඩකුත්, ලොකුම ලොකු අමුඩයකුත්, හිනාවෙන්න දෙයක් නම්බ වුණා වගේ දත් නියවාගෙන මට උඩින් තටන හිස්කබල් පොකුරකුත් විතරයි.

"ජැක්සන්!" ලූක් මොර දුන්නා. "මට ඔහේව මරන්න තිබුණේ ඒ කාලෙමයි!"

"ඔහේ ඒකට උත්සහ කළා," මම එයාට සිහි කර දුන්නා. "අපිට යන්න දෙනවා, ලූක්. ඇන්ටියස්සුයි මමයි ගිවිසුමකට දිවුරුම් දුන්නා. මමයි දිනුවේ."

මම බලාපොරොත්තු වුණ දේම එයා කළා. "ඇන්ටියස් දැන් මැරිලා." එයා කිවුවා. "එයාගේ දිවුරුමත් එයා එක්කම මැරුණා. ඒ වුණත් අද මට කාරුණික වෙන්න හිතිලා තියෙන නිසා, මම ඔහේව ඉක්මනට ඉවරයක් කරලා දාන්නම්."

එයා ඇනබෙත්ට අත දිගු කරා. "මේ කෙල්ලව ඉතුරු කරනවා." එයාගේ කටහඬ යාන්තමින් වෙවුලුවා. "අපේ - අපේ මහා ජයග්‍රහණයට කලින් මට එයත් එක්ක ටිකක් කතා කරන්න ඕනෑ."

ප්‍රේක්ෂකාගාරයේ සිටි හැම රාක්ෂයෙක් ම ආයුධ ඇදගත්තා, නැත්නම් නිය පහුරු දිග ඇරියා. අපිව හතර අතින්ම කොටු වුණා. මේ තරම් සෙනඟක් එක්ක අපිට හැරෙන්නවත් ඉඩක් නැහැ.



ඒ වෙලාවේ මට මගේ සාක්කුව තුළ යමක් දැනුණා - සීතලෙන් හිත වෙන හැඟීමක්. බලු නළාව. මගේ ඇඟිලි එය වටා වෙළුණා. මම දවස් ගාණක් තිස්සේ කුයින්ටස් දුන් තෑග්ග පාවිච්චි කිරීම මග ඇරියා. ඒක උගුලක් වෙන්න ඕනෑ. ඒත් දැන්... මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. මම නළාව සාක්කුවෙන් පිටට අරගෙන පිම්බා. එයින් කනට ඇහෙන ශබ්දයක් පිට වුනේ නැහැ. අයිස් කැබලිතිවලට කුඩු වී ගිය එය මගේ අතේදි ම දියවුණා.

ලූක් මහ හඬින් හිනාවුණා. "ඒ මොකක්ද තෙරුවේ?"

මට පිටුපසින් පුදුමයෙන් කළ මොර දීමක් ඇහුණා. ඇනබෙත්ව මුර කරමින් සිටි ලැයිස්ට්‍රිගෝනියානු යෝධයා මට උඩින් පියාඹගෙන ගිහින් බිත්තියක හැප්පුණා.

"අර්ර්වූෆ්!"

කෙලි බෙරිහන් දෙද්දි, රාත්තල්-පන්සියක්-බර කළු මස්ටිෆ් බැල්ල එයාව සෙල්ලම් බඩුවක් වගේ කටින් ඩැහැගෙන උඩින් විසි කරේ කෙලින්ම ලූක්ගේ ඔඩොක්කුවට වැටෙන්නයි. මිසිස් ඕ'ලෙරි දත් විළිස්සා ගොරවද්දි ඩ්‍රැකෙනයිලා දෙන්නා පසු බැස්සා. එක මොහොතකට, මුළු ප්‍රේක්ෂකාගාරය ම පුදුමයෙන් ගල් ගැහුණා.

"අපි යමු!" මම මගේ යාළුවන්ට මොර ගැහුවා. "එන්න, මිසිස් ඕ'ලෙරි!"

"එහා කෙළවරේ දොරෙන් යමු!" රේචල් කෑගැහුවා. "ඒක තමයි හරි පාර!"

ඊතන් නකමුරාත් ඒ ඉඟිය තේරුම් ගත්තා. අපි එක්ව පිටිය හරහා අනෙක් කොණේ දොරටුව වෙත දුවද්දි, මිසිස් ඕ'ලෙරිත් අපිත් එක්කම ආවා. අපි දුවන අතරේ, අවුල් වියවුල් වුණු හමුදාවක් වේදිකාවෙන් බිමට පැනලා, අපිව ලුහුබඳින්න දඟලන හඬවල් මට ඇහුණා.

ඒ වෙලාවේ මට තවත් දෙයක් තේරුම් ගියා: මිසිස් ඕ'ලෙරි ආගිය අතක් නැති වුණා. එයා අතුරුදහන් වුණේ කොයි වෙලේ ද කියලා මම දැනගෙන හිටියේ නැහැ. එයාව අතරමං වෙලා ද, නැත්නම් රාක්ෂයින්ට අහු වෙලා ද කියන්නවත් මම දැනගෙන හිටියෙ නැහැ. මගේ හදවත ඊයම් බරුවකට හැරුණා. අපේ ජීවිත බේරගත්තේ එයායි, ඒත් එයා අපිත් එක්කම එනවා ද බලන්නවත් මම නැවතුනේ නැහැ.

ඊතන් බිමට ඇද වැටුණා. "ඔයාලට නම් හොඳටෝම පිස්සු." එයා හිස්වැසුම ගැලෙව්වා. එයාගේ මූහුණ දාඩියෙන් දිලිසුණා.

ඇනබෙත් හිල්ලුවා. "මට ඔයාව මතකයි! ඔයා අවුරුදු ගාණකට කලින්, හර්මීස් කැබින් එකේ හිටපු 'තීරණය නොකළ' ළමයින්ගෙන් කෙනෙක්."

එයා ඇනබෙත්ට රවුවා. "ඔව්, එතකොට ඔයා තමයි ඇනබෙත්. මටත් මතකයි."

"මොනවද- මොනවද ඔයාගේ ඇහැට වුණේ?"

ඊතන් අහක බලාගත්තා. ඒක එයා කතා කරන්න කැමති මාතෘකාවක් නෙවෙයි කියලා මට හැඟුණා.

"මගේ හීනේ හිටපු අර්ධ-ලෝහිතයා ඔයා වෙන්න ඕනෑ," මම කිවුවා. "ලූක්ගේ කට්ටිය කොටු කරගත්ත කෙනා. අන්තිමේ දී බලනකොට එහෙනම් ඒ නිකෝ නෙවෙයි."

"කවුද නිකෝ කියන්නේ?"

"ඒකෙන් වැඩක් නෑ," ඇනබෙත් ඉක්මනින් කිවුවා. "ඇයි ඔයා වැරදි පැත්තට එකතු වෙන්න හැදුවේ?"

ඊතන් අවඥාවෙන් විරිත්තුවා. "හරි පැත්තක් නැති නිසා. දෙවිවරු කවදාවත් අපි ගැන බැලුවා. ඇයි මට බැරි-"

"අතිත් අයට විනෝදය සපයන්න මැරෙනකල් සටන් කරන්න කියන හමුදාවකට එකතු වෙන්න?" ඇනබෙත් කිවුවා. "හත්, ඒකත් ඇත්ත."

ඊතන් අමාරුවෙන් දෙපයින් සිටගත්තා. "මට ඔයත් එක්ක රණ්ඩු කරන්න ඕනෑ නැහැ. උදවුවට ස්තූතියි. ඒත් මම මෙහෙන් යනවා."

# 15

# අපි වැඩිය පාවිච්චි නොකළ පියාපත් කිපයක් ඉස්සුවා

"මේ පැත්තට!" රේචල් මොර දුන්නා.

"අපි මොකටද ඔයා පස්සෙ එන්නේ?" ඇනබෙත් ප්‍රශ්න කළා. "ඔයා අපිව කෙලින්ම අරන් ගියේ මර උගුලකට නේ!"

"ඒක තමයි ඔයාලට යන්න ඕනෑ වුණ පාර," රේචල් කිවුවා. "ඒ වගේම මේකත් එහෙමයි. ඉක්මන් කරන්න!"

ඒ ගැන වැඩි සතුටක් පෙන්වූයේ නැති වුණත්, ඇනබෙත් අපිත් එක්ක ම දුවගෙන ආවා. රේචල් යන්නෙ කොහෙද කියලා හරියට ම දන සිටියා වගෙයි පෙනුණේ. මුලුවලින් වේගයෙන් හැරුණු එයා, තරප් පාරවල් ඇති තැන්වල දි දෙපැත්ත බලන්නවත් කරදර වුනේ නැහැ. "පාත් වෙන්න!" එක වතාවක් එයා කිවුවා. අපි බිමට නැමෙද්දී ම යෝධ පොරොවක් අපේ හිස්වලට ඉහළින් වැනුණා. ඊට පස්සෙ මුකුත් නොවුණ ගාණට අපි ආපහු ඉස්සරහට යන්න පටන් ගත්තා.

අපි හැරුණු වාර ගණන මට ගණන් තියාගන්නත් බැරිවුණා. පරණ කිරි ගරුඬ කුලුනු මත වහලය රඳවා තිබුණු, ව්‍යායාම ශාලාවක් තරම් විශාල කාමරයකට එන තුරුම අපි විවේක ගන්න නැවතුනේ නැහැ. මම දොරකඩ නැවතී, අපිව ලුහුබැඳ එන අයගේ හඬට කන් දුන්නත්, මට කිසිවක් ඇසුනේ නැහැ. පෙනුණු හැටියට අපි ලූක්වයි එයාගේ භේවායින්වයි වංගගිරිය ඇතුළේ අතරමං කරලා.

Scanned with CamScanner

"අපි යන්නෙ ඩෙඩලස් හොයාගෙන." මම කිව්වා. "අපිත් එක්ක එන්න. අපි මේක ඉවර කරාට පස්සේ, ඔයාටත් කඳවුරට එන්න පුළුවන්."

"ඩෙඩලස් ඔයාල්ට උදවු කරයි කියලා හිතනවා නම් ඔයාලට ඇත්තටම පිස්සු."

"එයාට කරන්නම වෙනවා," ඇනබෙත් කිව්වා. "අපි එයාව කොහොම හරි නම්ම ගන්නවා."

ඊතන් මහ හඬින් නහයෙන් පිම්බා. "ඔව්, හොඳයි. එහෙනම් ඒකට සුභ පැතුම්."

මම එයාගේ අත අල්ල ගත්තා. "ඔයා හදන්නේ වංගගිරිය අස්සේ තනියම වෙන අතකට යන්න ද? ඒක පණ නහගන්න වැඩක්."

එයා මගේ දිහා බලා සිටියේ යාන්තමින් පාලනය කරගත් තරහවකින්. එයාගේ ඇහැ වසා තිබුණු කළු රෙදි කැල්ලේ පාට වියැකී, වටේට ගෙවී තිබුණේ හරියට එයා ඒක සෑහෙන කාලයක් තිස්සේ පැලඳගෙන ඉඳලා වගෙයි. "ඔයාට තිබුණේ මාව බේරගන්නැතුව ඉන්න, ජැක්සන්. මේ යුද්ධයේදි අනුකම්පාවට තැනක් නැහැ."

ඊට පස්සේ එයා අන්ධකාරය තුළට, අපි ආපු පැත්තටම ආපහු දිව්වා.

***

ඇනබෙත්, ජේවල් සහ මම කොයි තරම් හෙම්බත් වී සිටියා ද කියනවා නම්, අපි එතැන ම කඳවුරු බැඳ ගත්තා. ලී කැලි ටිකක් හොයාගත් මම ගිනි ගොඩක් දැල්වූවා. රුස්ස ගස් වගේ අපි වටා ඉහළට නැගී සිටි කුලුනුවල සෙවණැලි බිත්ති මත නැටුවා.

"ලූක්ගේ මොකක්දෝ වෙනසක් තිබුණා," ඇනබෙත් කෙඳිරුවේ කිණිස්සෙන් ගිනි ගොඩට අනිමින්. "එයා හැසිරුණු විදිහ ඔයා දැක්ක ද?"

"මට නම් පෙනුනේ මිනිහා සෑහෙන සන්තෝසෙන් හිටියා වගේ," මම කිව්වා. "හරියට වීරයින්ට වධ දෙමින් හොඳ දවසක් ගෙවන්න ලැබිලා වගේ."

"ඒක ඇත්ත නෙවෙයි! එයාගේ මොකක් හරි වෙනසක් තිබුණා. එයා හිටියේ.... කලබලෙන් වගේ. මාව ඉතුරු කරන්න කියලා එයා



එයාගේ රාක්ෂයින්ට කිව්වා. එයාට මට මොනවදෝ කියන්න ඕනේ වුණා."

"මට හිතෙන්නේ එයා කියන්න හදන්න ඇත්තේ, *'හායි, ඇනබෙත්! මාත් එක්ක වාඩි වෙලා, මං ඔයාගේ යාළුවන්ව ඉරලා දාන දිහා බලන් ඉන්නකෝ. ඒක හරි ජොලි වැඩක් වෙයි!'* කියලා වෙන්නැති."

"ඔයා නම් මහ මොකෙක් ද මන්දා." ඇනබෙත් අවලාද නැගුවා. කිණිස්ස කොපුවට දමා ගත් එයා ජේවල් දිහා බැලුවා. "ඉතින්, දැන් කොයි පැත්තට ද, නඩේ ගුරෝ?"

ජේවල් එයාට ප්‍රතිචාර දක්වන්න හදිස්සි වුණේ නැහැ. මල්ලව පිටියේ සිදුවීමෙන් පස්සේ එයා නිහඬ වෙලා සිටියා. දැන්, ඇනබෙත් මොන විදිහේ ඇනුම්පදයක් කිව්වත්, ඒවට උත්තර දෙන්න ජේවල් කරදර වුනේ ම නැති තරම්. එයා ගිනි ගොඩෙන් අඟුරු කැල්ලක් අරන්, අපිට දකින්න ලැබුණු රාක්ෂයින්ගේ රූප බිම අඳිමින් සිටියා. එයා අඟුරු පාරවල් කීපයකින්ම ඩ්‍රැකනෙයිගේ රූපය අංගසම්පූර්ණ ලෙස මතු කරගත්තා.

"අපි පාර දිගේ යනවා," එයා කිව්වා. "පොළොව දිලිසෙන පාර දිගේ."

"අපිව කෙලින්ම උගුලකට අරන් ගියපු දිලිසෙන පාර දිගේ ද?" ඇනබෙත් ඇසුවා.

"එයාට ඉන්න දෙන්න, ඇනබෙත්," මම කිව්වා. "එයා එයාට පුළුවන් උපරිමෙන් කරනවා නේ."

ඇනබෙත් නැගිට්ටා. "ගින්න නිවෙන්න යන්නේ. මම ගිහිල්ලා තව ලී කැලි ටිකක් හොයත් එන්නම්. එනකල් ඔයාලා යුධෝපායන් ගැන කතා කරකර ඉන්න." ඊට පස්සෙ එයා අඩි තප්පමින් සෙවණැලි තුළට ගියා.

ජේවල් අඟුරු කැල්ලෙන් තවත් රූපයක් ඇන්දා - දම්වැල්වලින් එල්ලෙන ඇන්ටියස්ව.

"ඇනබෙත් වෙනදට ඔහොම නැහැ," මම එයාට කිව්වා. "එයාට මොනවා වෙලා ද කියලා මං දන්නෑ."

ජේවල් ඇහිබැම් එසෙව්වා. "ඔයා දන්නෑ කියලා ඔයාට විශ්වාස ද?"

"ඇයි ඔයා එහෙම කියන්නේ?"

"මේ කොල්ලො නම්," එයා කෙඳිරුවා. "මහ පොට්ටයෝ."

"හේයි, ඔයත් මගේ ඇඟට ගොඩවෙන්න හදන්නෙපා! බලන්න, ඔයාවත් මේකට ඇදලා ගත්තට මට කණගාටුයි."

"නෑ. ඔයා කිවුවා හරි," එයා කිවුවා. "මට පාර පේනවා. මට ඒක තේරුම් කරන්න බැහැ. ඒත් ඒක හරිම පැහැදිලියි." එයා කාමරයේ අනෙක් කෙළවරේ අඳුර තුළට අත දිගු කර පෙන්වූවා. "වැඩපොළ තියෙන්නෙ අර පැත්තේ. වංගගිරියේ හදවත. අපි දැන් හොඳටම කිට්ටුයි. මේ පාර මල්ලව පොර පිටිය හරහා වැටිලා තියෙන්නෙ ඇයි කියලා මම දන්නෙ නැහැ. මට- මට ඒ ගැන කණගාටුයි. මං හිතුවේ ඔයා මැරෙයි කියලා."

එයා කතා කළේ අඬන්න ඔන්න-මෙන්න වගෙයි.

"හේයි, මම කොහොමත් ඉන්නෙ දැන් මැරෙයි වගේ තමයි," මම එයාගේ හිත හැදුවා. "ඒ ගැන දුක් වෙන්නෙපා."

එයා මගේ මූණ දිහා ඕනෑකමින් බලා සිටියා. "එතකොට ඔයා හැම ගිම්හානෙ ම මේක කරනවා? රාක්ෂයෝ එක්ක සටන් කරනවා? ලෝකෙ බේරගන්නවා? ඔයා කවදාවත් නිකං, මං කියන්නේ, සාමාන්‍ය දේවල් කරන්නැද්ද?"

මං කවදාවත් ඒ ගැන එහෙම හිතලා තිබුනේ නැහැ. මම අන්තිම වතාවට සාමාන්‍ය දෙයක් කරේ... හොඳයි, මතක ඇති කාලෙකින් එහෙම දෙයක් කරලා නැහැ. "මං හිතන්නේ, අර්ධ-ලෝහිතයෝ ඒකට පුරුදු වෙලා ඉන්නේ. සමහරවිට පුරුදු වෙලා නැතුව ඇති, ඒත්..." මම අපහසුවෙන් එහා මෙහා වුණා. "එතකොට ඔයා? ඔයා සාමාන්‍යයෙන් මොන වගේ දේවල් ද කරන්නේ?"

රේචල් උරහිස් ඇකිළුවා. "මම චිත්‍ර අඳිනවා. ගොඩක් පොත් කියවනවා."

හොඳයි, මම හිතුවා. මෙච්චර දුරකට නම් අපි දෙන්නගෙ සමානකම් ලැයිස්තුව බිංදුවයි. "ඔයාගේ පවුලෙ විස්තර මොනවද?"

මම ඇදලා ගත්තේ ආරක්ෂිත මාතෘකාවක් නෙවෙයි වගෙයි, මොකද ඉබ්බා කටුව අස්සට රිංගනවා වගේ එයා හිතෙන් පහු බහිනවා මට දැනුණා. "ඔහ්... එයාලා නිකං ම, ඔයා දන්නවා නේ, පවුලක්."



"ඔයා අතුරුදහන් වුණත් එයාලට ගාණක් නැතිවෙයි කියලා එයා කිවුවේ."

එයා අඟුරු කැබැල්ල බිම දැමුවා. "වාව්, මට මාර මහන්සියි. මම ටික වෙලාවක් නිදාගත්තම්, හොඳේ?"

"ඔහ්, හරි. සමා වෙන්න මම..."

ඒත් ඒ වෙද්දිත් රේචල්, එයාගේ ගමන් මල්ල කොට්ටයට තියාගෙන බිම වකුටු වෙලා ඉවරයි. ඇස් දෙක වහගෙන, හෙලවෙන්නෙවත් නැතිව හිටියත්, එයාට ඇත්තටම නින්ද ගිහින් නැහැ කියලා මට දැනුණා.

විනාඩි දෙක තුනකට පස්සෙ ඇනබෙත් ආපහු ආවා. එයා ගින්නට තව ලී පතුරු ටිකක් විසි කළා. එයා මුලින්ම රේචල් දිහාවත්, ඊට පස්සෙ මගේ දිහාවත් බැලුවා. "මම පළවෙනි මුරේ කරන්නම්," එයා කිවුවා. "ඔයත් නිදාගත්තොත් හොඳයි."

"ඔයාට ඔය විදිහට හැසිරෙන්න හේතුවක් නැහැ."

"මොන විදිහට ද?"

"හරියට... ඒකෙන් කමක් නෑ." මූසල හැඟීමක් හිතට දැනෙද්දි මම බිම වැතිරුණා. මම කොයි තරම් මහන්සි වී සිටියා ද කියනවා නම්, ඇස් පියාගත් හැටියේ මට නින්ද ගියා.

***

සිහිනෙන් මට හිනා හඬක් ඇසුණා. පිහියක් ගල ගානවා වගේ කුරිරු, රළු හිනා හඬක්.

මම හිටගෙන හිටියේ ටාටරස් නරා වළ අද්දරයි. මට පහළින් කට්ට කළු සුප් එකක් වගේ අන්ධකාරය කැකෑරුණා.

"නුඹෙම විනාශයට හොඳටෝම කිට්ටුයි, පුංචි වීරයෝ," ක්‍රෝනොස්ගේ හඬ සරදම් කළා. "ඒත් නුඹ තවමත් අන්ධයි."

ඉස්සරට වඩා ඒ හඬ වෙනස් වී තිබුණා. දැන් එහි බොහෝ දුරට සැබෑ බවක් තිබුණේ හරියට... එයා සිරි කැලි කැපුණු තත්වයේ සිට වෙනුවට සැබෑ ඇඟක ඉඳගෙන කතා කරනවා වගෙයි.

"මට නුඹට ස්තුති කරන්න ගොඩක් දේවල් තියෙනවා," ක්‍රෝනොස් කිවුවා. "මගේ නැඟී සිටීම සහතික කළේ නුඹයි."

Scanned with CamScanner

ගුහාව තුළ වූ සෙවණැලි වඩාත් ගැඹුරු සහ බියකරු වුණා. මම ආගාධය අද්දරින් පනු බහින්න උත්සහ කළත්, එය දණුණේ තෙල් ගොඩක් මැදින් පිහිනනවා වගෙයි. කාලය මන්දගාමී වුණා. මගේ හුස්ම ගැනීම මුළුමනින්ම වගේ නැවතුණා.

"උදව්වක් කරන්නම්," ක්‍රෝනොස් කිව්වා. "ටයිටන් රජා නිතරම තමන්ගේ ණය ගෙවනවා. බාගදා, තුඹ අත ඇරලා දාපු යාළුවන්ව ටිකක් බලාගන්න දුන්නොත්..."

මගේ වටා වූ අඳුර රැළි නගද්දී, මම වෙනත් ගුහාවකට ගොස් තිබුණා.

"ඉක්මනට!" ටයිසන් කිව්වා. එයා කාමරයට වේගයෙන් දුවගෙන එද්දී, ග්‍රෝවර් කකුල් පැටලෙමින් එයා පසුපස ආවා. එයාලා ආව කොරිඩෝවෙන් ගෙරවුමක් ඇසුණා, ඒත් එක්කම අති විශාල සර්පයෙකුගේ ඔළුව ගුහාව තුළට කඩා වැදුණා. මං අදහස් කළේ, මේ සතා කොච්චර ලොකුයි ද කියනවා නම්, ඌගේ කඳට උමගේ ඉඩ සෑහුණේ යාන්තමින් වගෙයි. ඌට තඹවන් කොරපොතු තිබුණා. ඌගේ දියමන්ති හැඩය ගත් ඔළුවේ තිබුණු කහ පාට ඇස් දෙක වෛරයෙන් දිලිසුණා. ඌ කට අරිද්දි, ඌගේ දළ ටයිසන් තරමට උසයි කියලා මට පෙනුණා.

ඌ ග්‍රෝවර්ට පහර දෙන්න පැන්නා, ඒත් ග්‍රෝවර් එතැනින් පැනගත් නිසා සර්පයාට කටින් එකක් පස් කැවුණා. ගල් ගෙඩියක් ඔසවාගත් ටයිසන් එයින් සර්පයාගේ ඇස් දෙක අතරට දමා ගැසුවා. ඒත් නිකං ම ආපස්සට පැන්න සර්පයා හූ හඬගෑවා.

"ඌ ඔයාව කන්න යන්නේ!" ග්‍රෝවර් ටයිසන්ට මොර දුන්නා.

"ඔයා කොහොමද දන්නේ?"

"ඌ මේ දැන් මට කිව්වා! දුවන්න!"

ටයිසන් එක පැත්තකට වේගයෙන් පැන්නා, ඒත් සර්පයා, ඌගේ ඔළුව මුගුරක් වගේ පාවිච්චි කරමින් එයාව බිමට වැට්ටුවා.

"නෑ!" ග්‍රෝවර් මොර ගැසුවා. ඒත් ටයිසන්ට නැවත සමබරතාවය ලබාගන්න ඉඩක් ලැබෙන්න කලින්, සර්පයා එයා වටේ දරණ ගසාගෙන, එයාව පොඩි කරන්න පටන් ගත්තා.

ටයිසන් එයාගේ අපරිමිත ශක්තිය යොදවා තල්ලු කෙරුවත්, සර්පයාගේ ග්‍රහණය තව තවත් තද වුණා, ග්‍රෝවර් පිස්සුවෙන් වගේ එයාගේ බට නළා කුට්ටමෙන් සර්පයාට ගැසුවා. ඒත් එයා කළු ගල් බිත්තියකට ගැහුවා නම් ඊට වඩා හොඳයි කියලා මට හිතුණා.



සර්පයා ටයිසන්ගේ ශක්තිය මැඩ පවත්වා ගන්න මුළු වෙර යොදා පේශි අකුළද්දී මුළු කාමරයම සැලුණා.

ග්‍රෝවර් බට නළා වාදනය කරන්න පටන් ගත්තා, ඒත් එක්කම සිවිලිමෙන් හිරිලිඹ වැහි වැස්සා. මුළු ගුහාවම දැන් කඩා වැටෙයි වගෙයි තිබුණේ...

***

ඇනබෙත් මගේ උරහිස සොලවද්දී මම ඇහැරුණා. "පර්සි, නැගිටින්න!"

"ටයිසන්- ටයිසන්ට කරදරයක්!" මම කිව්වා. "අපි එයාට උදව් කරන්න ඕනෑ!"

"මුල් දේ මුලින්ම," එයා කිව්වා. "භූමිකම්පාවක්!"

කිව්වත් වගේම, කාමරය දෙදුරුම්කමින් තිබුණා. "රේචල්!" මම මොර ගැසුවා.

එසැණින්ම එයාගේ ඇස් ඇරුණා. එයා ගමන් මල්ල ඩැහැ ගත්තා ම, අපි තුන්දෙනා එතැනින් දිව්වා. අපි එහා කොණේ උමඟට කිට්ටු වෙද්දී ම අපි ළඟින්ම වූ කුලුනක් කෙඳිරිගාමින් නැමුණා. අපි නොනැවතී දුවද්දී අපිට පිටුපසින් කිරි ගරුඬ ටොන් සිය ගාණක් කඩා වැටුණා.

කොරිඩෝවට ඇතුළු වූ අපි ආපසු හැරී බලද්දී ම අනෙක් කුලුනු ටිකත් ඇද වැටෙනවා දකින්න ලැබුණා. සුදු දූවිල්ලක් අපිව වසාගෙන ඉහළ නගිද්දී, අපි නොනැවතී දිව්වා.

"ඔයා දන්නව ද වැඩක්?" ඇනබෙත් කිව්වා. "කොහොම වුණත් මං මේ පාර කැමතියි."

වැඩි වෙලාවක් යන්න කලින්ම අපිට ඉදිරියෙන් එළියක් පෙනුණා - හුරු පුරුදු විදුලි එළියක්.

"අන්න," රේචල් කිව්වා.

අභ්‍යාවකාශ මධ්‍යස්ථානයක ඇති කියලා මම හිතේ මවාගෙන සිටි විදිහේ මළ නොබැඳෙන වානේවලින් සෑදූ කොරිඩෝවක් දිගේ අපි

එයා පසුපස ගියා. ප්‍රතිදීප්ත පහන් සිවිලිමෙන් පහළට එළිය විහිදුවා. ලෝහමය ගරාදියකින් පොළොව සාදා තිබුණා.

දිගින් දිගටම අඳුරට පුහුණු වී තිබුණු මගේ ඇස් ගිනිකණ වැටුණා. සැර එළියෙන් ඇනබෙත්, ග්‍රෝවර් දෙන්නවම පෙනුණේ පාණ්ඩු පාටටයි.

"මේ පැත්තෙන්," කියූ ග්‍රෝවර් දුවන්න පටන් ගත්තා. "අපි කිට්ටුයි!"

"මේක නම් හරිම වැරදියි!" ඇනබෙත් කිවුවා. "වැඩපොළ තියෙන්න ඕනෑ වංගගිරියේ පරණම කොටසේ. මේක වෙන්න බැහැ-"

එයාගේ කතාව ඇනහිටියේ, අපි ලෝහමය දෙපළු දොරක් ඉදිරියට ආව නිසයි. එහි ඇස් මට්ටමෙන්, ලෝහය තුළට කැටයම් කර තිබුණේ නිල් පාට ලොකු ග්‍රීක Δ ලකුණක්.

"අපි එතැනට ආවා," ග්‍රෝවර් නිවේදනය කරා. "ඩෙඩලස්ගේ වැඩපොළට."

* * *

ඇනබෙත් දොර පියනේ වූ සලකුණ ඔබද්දි එය සූ ගාමින් ඇරුණා.

"මරු පෞරාණික වාස්තු විද්‍යාව," මම කිවුවා.

ඇනබෙත් තරහෙන් රවා බැලුවා. අපි එක්ව ඇතුළට පිය මැන්නා.

මුලින්ම මගේ හිතට වැදුණු දෙය වුණේ දිවා එළියයි - යෝධ ජනේල හරහා සැඩ ඉර එළිය ඇතුළට ගලා එමින් තිබුණා. ඒක අඳුරු කුටියක් මැද ඔයා කොහෙත්ම දකින්න බලාපොරොත්තු වෙන දෙයක් නෙවෙයි නේ. අඩි තිහක් උස සිවිලිම සහ කාර්මික ආලෝකකරණයත්, ඔප දැමූ ගල් පොළොව සහ ජනේල දිගේ තැබූ වැඩ මේස සමග ඒ වැඩපොළට තිබුණේ චිත්‍ර ශිල්පියෙකුගේ කලාගාරයක පෙනුමක්. සර්පිලාකාර පඩිපෙළකින් එය දෙවෙනි මහලට සම්බන්ධ වී තිබුණා. ලියනාඩෝ ඩාවින්චිගේ කටු සටහන් වගේ අතින් අඳින ලද රූප සටහන් ඇඳවූ කැන්වස් ආධාරක දුසිම් බාගයක් විතර තැන තැන ප්‍රදර්ශනයට තබා තිබුණා. මේස මත ලැප්ටොප් පරිගණක කිපයක්ම විසිරී තිබුණා. කොළ පාට තෙල් - ග්‍රීක ගින්දර - පිරවූ වීදුරු බරණි රාක්කයක පෙළ ගසා තිබුණා. එතැන අලුතින් නිපදවූ දේවලුත් තිබුණා - මට තේරුම් ගන්න බැරි විදිහේ අමුතු ලෝකඩ යන්ත්‍ර. විදුලි රැහැන් පොකුරක් සවි කළ එක් ලෝකඩ පුටුවකට තිබුණේ වධක උපකරණයක පෙනුමක්. තවත් කෙළවරක මිනිහෙක් තරම් උස යෝධ ලෝහමය බිත්තරයක් තිබුණා. බට්ටා ඔරලෝසුවක් තනි වීදුරුවෙන් සාදා තිබුණේ එය තුළ දතිරෝද කැරකෙන හැටි පැහැදිලිව පිටට පෙනෙන ලෙසයි. ඒ අතරේ බිත්තිවල එල්ලූ ලෝකඩ සහ රිදී පියාපත් ජෝඩු කිපයකුත් දකින්න ලැබුණා.

"කාරුණික ඇත්තන්ටම ඉප්පු වෙච්චාවේ," ඇනබෙත් කෙඳිරුවා. ළඟම කැන්වස් ආධාරකය වෙතට දිවූ එයා කටු සටහන් දිහා බැලුවා. "එයා මාර බුද්ධිමත් කෙනෙක් නේ. බලන්නකෝ මේ බිල්ඩිමේ වක් හැඩය අරන් තියෙන විදිහ!"

"ඒ වගේම කලාකාරයෙක්," ග්‍රෝවර් කිවුවේ විමතියෙන්. "මේ තටු නම් පුදුමාකාරයි!"

ඒ පියාපත් මම හීනෙන් දුටු ඒවාටත් වඩා වැඩි දියුණු කළ ඒවා බව පෙනුණා. ඒවාගේ පිහාටු වඩාත් තදින් එකිනෙක ඇඳා තිබුණා. ඉටි මුද්‍රා වෙනුවට, ඉබේ ඇලෙන පටි එය දෙපසින් පහළට දිවුණා.

මම සිටියේ අතක් රිප්ටයිඩ් මත තබාගෙනයි. පෙනුණු හැටියට ඩෙඩලස් නම් ගෙදර නැහැ වගෙයි. ඒ වුණත් එයාගේ වැඩපොළ මෑතක දි පාවිච්චි කර ඇති බව පෙනුණා. ලැප්ටොප් පරිගණක තිර මත ස්ක්‍රීන් සේවර් ක්‍රියාත්මක වෙමින් තිබුණා. බාගෙට කෑව බ්ලූබෙරි මෆිනයක් සහ කෝපි කෝප්පයක් වැඩ බංකුවක් මත තිබුණා.

මම ජනේලය ළඟට ඇවිදගෙන ගියා. එයින් පිටත පෙනුණු දර්ශනය හිතාගන්නත් බැරි තරම් පුදුමාකාරයි. ඈතින් නැගී සිටි ගල් කඳු මම හඳුනා ගත්තා. අපි සිටියේ පා කන්දක, අඩු තරමින් අඩි පන්සියක්වත් ඉහළිනුයි. ඊට පහළින් පැතිරී තිබුණු මිටියාවත පිරී තිබුණේ තැනිතලා මුදුන් සහ ප්‍රපාත බෑවුම් සහිත රතු පාට කඳු ගැට සහ කොත් ගල්වලිනුයි. එයට තිබුණේ යෝධ බබෙක් තට්ටු ගොඩනැගිලි තරම් ලොකු ගල් කුට්ටිවලින් සෙල්ලම් නගරයක් හදමින් ඉඳලා, ඊට පස්සෙ ඒක පෙරළා දමන්න තීරණය කරලා වගේ පෙනුමක්.

"අපි මේ කොහෙද ඉන්නේ?" මම පුදුම වුණා.

"කොලරාඩෝ ස්ප්‍රින්ග්ස්වල," අපිට පිටුපසින් කටහඬක් ඇසුණා. "දෙවිවරුන්ගේ උයනේ."

අපිට ඉහළින් සර්පිලාකාර පඩිපෙළ මත, ආයුධ අත දරාගෙන සිටියේ අපේ නැති වුණ කඩු සරඹ ගුරුතුමා, කුයින්ටස්.

***

"ඔයා," ඇනබෙත් කිවුවා. "ඔයා මොනවද ඩෙඩලස්ට කළේ"

කුයින්ටස් ලාවට හිනාවුණා. "මාව විශ්වාස කරන්න, මගෙ දරුවෝ. ඔයා එයාව මුණගැහෙන්න ඕනෑ නැහැ."

"බලන්න, මිස්ටර් දෝහියා," එයා ගෙරෙව්වා, "මම මකර කැනියෙකුයි, ඇගවල්-තුනේ මිනිහෙකුයි, මොළේ නරක් වෙච්ච ස්ෆින්ක්ස් කෙනෙකුයි එක්ක සටන් කරේ ඔහේව බලන්න නෙවෙයි. දැන්, කොහෙද ඩෙඩලස්?"

කුයින්ටස් කඩුව පැත්තකින් තබාගෙන ම පඩිපෙළ පහළට ආවා. එයා කලිසමකින්, බූට් ජෝඩුවකින් සහ අර්ධ-ලෝහිත කඳවුරු උපදේශක ටී-ෂර්ට් එකකින් සැරසී සිටියා. එයා ඔත්තුකාරයෙක් කියලා දැන් අපි දන්න නිසාම, ඒක අපහාසයක් වගෙයි දැනුණේ. කඩු සටනකින් එයාව පරදවන්න මට පුළුවන් වෙයි ද කියලා මම දැන සිටියේ නැහැ. එයා සැහෙන දක්ෂයි. ඒත් ඒකට මට උත්සාහ කරන්න වෙන බව මට තේරුණා.

"ඔයාලා හිතන්නෙ මම ක්‍රෝනොස්ගෙ ඒජන්ත කෙනෙක් කියලා." එයා කිවුවා. "මම ලූක්ට වැඩ කරනවා කියලා."

"ආයෙත් අහලා," ඇනබෙත් කිවුවා.

"ඔයා බුද්ධිමත් කෙල්ලෙක් තමයි," එයා කිවුවා. "ඒත් ඔයා වැරදියි. මං වැඩ කරන්නෙ මට විතරයි."

"ලූක් ඔයා ගැන කිවුවා," මම කිවුවා. "ගැරියනුත් ඔයාව දැනගෙන හිටියා. ඔයා එයාගේ ගොවිපොළට ගිහින් තිබුණා."

"ඇත්ත වශයෙන්ම," එයා කිවුවා. "මම හැම තැනකටම වගේ ගිහින් තියෙනවා. මෙහෙටත් එහෙම."

මගෙන් කිසිම තර්ජනයක් නැති ගාණට මාව පහු කරගෙන ගිය එයා ජනේලය ළඟ සිටගත්තා. "මේ දර්ශනය දවසින් දවසට මාරු වෙනවා," එයා කල්පනාකාරව කිවුවා. "නිතරම වගේ ඒකට එන්නෙ කොහේ හරි උස තැනක්. ඊයේ මෙතැන තිබුණේ උස ගොඩනැගිල්ලක් මුදුනෙන් පෙනෙන මැන්හැටන් නගරය. පෙරේදා, මිචිගන් විලේ



ලස්සන දර්ශනයක්. ඒත් ඒක ආයෙ ආයෙම දෙවිවරුන්ගේ උදහසට ලක් වෙනවා. මං හිතන්නෙ වංගගිරිය මෙහෙට කැමති ඇති. ගැළපෙන තැනක්, මට හිතෙන්නෙ."

"ඔයා මීට කලිනුත් මෙහෙට ඇවිත් තියෙනවා," මම කිවුවා.

"ඔව්, ඔව්."

"එළියේ තියෙන්නෙ මායා දර්ශනයක් ද?" මම ඇහුවා. "ප්‍රක්ෂේපණය කරපු රූපයක් වගේ දෙයක් ද?"

"නෑ," රේචල් මිමිණුවා. "ඒක ඇත්ත එකක්. අපි ඇත්තටම කොලරාඩෝවල ඉන්නෙ."

කුයින්ටස් එයා දිහා සැලකිල්ලෙන් බලා සිටියා. "ඔයාට පැහැදිලි පෙනීමක් තියෙනවා, නේද? ඔයාව දකිද්දි මම ඉස්සර දැනගෙන හිටපු තවත් මනුෂ්‍ය ගැහැනු ළමයෙක්ව මතක් වෙනවා. දුක්බර ඉරණමක් ලැබුණු තවත් කුමාරිකාවක්."

"සෙල්ලම් ඇති," මම කිවුවා. "ඔයා ඩෙඩලස්ට මොනවද කළේ?"

කුයින්ටස් මගේ දිහා බලා සිටියා. "මගෙ කොල්ලෝ, පැහැදිලිව දකින ගැන ඔයා, ඔයාගේ යාළුවාගෙන් පාඩමක් ඉගෙන ගත්තොත් හොඳයි. මම තමයි ඩෙඩලස්."

***

"මම ඒක දැනගෙන හිටියා." කියන උත්තරේ ඉඳන් "හොරුකාරයා!" එහෙමත් නැත්නම් "අන්න හරි, එතකොට මම තමයි සියුස්," වගේ ඕනෑම උත්තරයක් මට එයාට දෙන්න තිබුණත්, ඒ වෙලාවේ මගේ හිතට ආව එකම දේ වුණේ, "ඒ වුණාට ඔයා නිමැවුම්කරුවෙක් නෙවෙයි නේ! ඔයා කඩු සටන්කාරයෙක් නේ" කියන එක විතරයි.

"මම ඒ දෙකම තමයි," කුයින්ටස් කිවුවා. "ඒ වගේම වාස්තු විද්‍යාඥයෙක්. නව විශාරදයෙක්. වයස අවුරුදු දෙදහක් වෙනකල් පුහුණුවීම පටන් ගන්නෙ නැති කෙනෙක් විදිහට බලද්දි, මම බොහොම හොඳට පැසි පන්දු ක්‍රීඩාවත් කරනවා. නියම කලාකාරයෙක් වුණාම ගොඩක් දේවල්වලට දක්ෂ වෙන්න ඕනෑ."

"ඒක ඇත්ත," රේචල් කිවුවා. "හරියට මට අත්වලින් වගේම කකුල්වලිනුත් චිත්‍ර අඳින්න පුළුවන් වගේ."

"දක්ෂ නේද?" කුයින්ටස් කිවුවා. "දක්ෂකම් ගොඩක් තියෙන ගෑනු ළමයෙක්."

"ඒ වුණාට ඔයාගේ පෙනුම ඩෙඩලස් අහලකින්වත් යන්නෙ නැහැ නේ," මම විරෝධය පෑවා. "මම එයාව හීනෙන් දැක්කා, එතකොට..." හදිසියේ ම එක බිහිසුණු කාරණයක් මට ටිකෙන් ටික අවබෝධ වුණා.

"ඔව්," කුයින්ටස් කිවුවා. "අන්තිමේ දි ඔයා ඇත්ත අනුමාන කළා."

"ඔයා යාන්ත්‍රික කෙනෙක්. ඔයා, ඔයාට අලුත් ඇඟක් හදාගෙන."

"පර්සි," ඇනබෙත් කිවුවෙ නොසන්සුන්වයි, "ඒක වෙන්න බැරි දෙයක්. ඒක- ඒක යාන්ත්‍රික ඇඟක් වෙන්න බැහැ."

කුයින්ටස් තනියම හිනාවුණා. "කුයින්ටස් කියන නමේ තේරුම මොකක්ද කියලා දන්නව ද, මගෙ දරුවෝ?"

"ලතින් භාෂාවෙන් 'පස්වැන්න', ඒත්-"

"මේක තමයි මගේ පස්වෙනි ඇඟ." කඩු සටන්කරුවා අතක් ඉදිරියට දිගු කරා. එයා වැළමිට තද කරද්දි, එයාගේ මැණික් කටුවේ කොටසක් ඉහළට ඇරුණා - එයාගේ හමෙන් හරි හතරැස් පළුවක්. එයට යටින්, ලෝකඩ ගියර වේගයෙන් කැරකුණා. වයර් දිලිසුණා.

"ඒක නම් මාරයි!" රේචල් කිවුවා.

"ඒක නම් අමුතුයි," මම කිවුවා.

"ඔයා ඔයාගේ විඥාණය යන්ත්‍රයක් ඇතුළට මාරු කරන්න ක්‍රමයක් හොයාගත්තා?" ඇනබෙත් ඇහුවා. "ඒක... ස්වාභාවික නැහැ නේ."

"ඔහ්, මං ඔයාට සහතික කරන්නම්, මගෙ දරුවෝ, මේ තවමත් මම ම තමයි. මම තවමත් ඩෙඩලස් තමයි. අපේ අම්මා, ඇතීනා, මට ඒක අමතක කරන්න ඉඩ නොදෙන්න වග බලාගන්නවා." එයා කමිසයේ කොලරය පහත් කළා. එයාගේ බෙල්ල මුල තිබුණේ මීට



කලින් වතාවකත් මට දකින්න ලැබුණු සලකුණයි - එයාගේ හම තුළට හණ තැබූ කුරුල්ලෙකුගේ අඳුරු රූපයයි.

"මීනීමරුවෙකුගේ හංවඩුවක්," ඇනබෙත් කිවුවා.

"ඔයාගේ බෑණා, පර්ඩික්ස් වෙනුවෙන්," මම අනුමාන කළා. "ඔයා කුළුනෙන් පහළට තල්ලු කරපු පිරිමි ළමයා."

කුයින්ටස්ගේ මූණ කළු වුණා. "මම එයාව තල්ලු කරේ නැහැ. මම නිකංම-"

"එයාගේ සමබරතාවය නැති වෙන්න සැලැස්සුවා," මම කිවුවා. "එයාට මැරෙන්න ඇරියා."

කුයින්ටස් ජනේලයෙන් එපිට දම් පාට කඳු දිහා බලාගත්තා. "මම කරපු දේ ගැන පසුතැවෙනවා, පර්සි. මම තරහෙන් පිරිලා, රළු පරළු වෙලා හිටියේ. ඒත් මට ඒක ආපහු හරවන්න පුළුවන්කමක් නැහැ, ඒ වගේම ඇතීනා මට ඒක කවදාවත් අමතක කරන්න දෙන්නෙත් නැහැ. පර්ඩික්ස් මැරෙද්දි, ඇතීනා එයාව චූටි කුරුල්ලෙකුට හැරෙව්වා - වටුවෙක්ට. මට සිහි කැඳවීමක් විදිහට එයා ඒ කුරුල්ලගෙ රූපය මගේ බෙල්ලෙ හංවඩු ගැහුවා. මම මොන ඇඟක් ගත්තත්, මේ හංවඩුව මගේ හමේ මතු වෙනවා."

එයාගේ ඇස් දිහා බැලූ මට තේරුම් ගියේ එයා මම සිහිනයෙන් දුටු කෙනාම බවයි. එයාගේ මුහුණ සම්පූර්ණයෙන් ම වෙනස් වී තිබුණා වුණත්, එයා තුළ තිබුණේ පරණ ආත්මයමයි - පරණ බුද්ධිය සහ දුක්බර බවමයි.

"ඔයා ඇත්තටම ඩෙඩලස් තමයි," මම තීරණය කළා. "ඒත් ඇයි ඔයා කඳවුරට ආවේ? ඇයි අපි ගැන ඔත්තු බැලුවේ?"

"ඔයාලගෙ කඳවුර බේරගන්න තරම් වටිනව ද කියලා බලාගන්න. ලූක් මට කතාව එයාගෙ පැත්තෙන් කිවුවා. මම වඩා කැමති වුණේ මම ම තීරණයක් ගන්නයි."

"ඒ කියන්නෙ ඔයා ලූක් එක්ක කතා කරලා."

"ඔහ්, ඔව්. කීප වතාවක්ම. එයා කෙනෙක්ව නම්ම ගන්න සෑහෙන දක්ෂයි."

"ඒත් දැන් ඔයා කඳවුර දැක්කානේ!" ඇනබෙත් පසුබාන්නෙ නැතිව කතා කළා. "ඒ කියන්නෙ අපිට ඔයාගේ උදවු ඕනෑ කියලා

ඔයාට තේරෙනවා නේ. ලූක්ට වංගගිරිය හරහා යන්න ඉඩ දෙන්න ඔයාට බැහැ."

ඩෙඩලස් කඩුව වඩු බංකුවක් මත තැබුවා. "වංගගිරිය තව දුරටත් මගේ පාලනය යටතේ තියෙන දෙයක් නෙවෙයි, ඇනබෙත්. ඇත්ත. මම තමයි ඒක හැදුවේ. ඇත්ත වශයෙන් කියනවා නම්, ඒක මගේ ජීව බලයට බැඳිලයි තියෙන්නේ. ඒ වුණාට මම ඒකට තනියම පවතින්නත්, තනියම වැඩෙන්නත් ඉඩ දීලයි තියෙන්නේ. මගේ පුද්ගලික නිදහස වෙනුවෙන් ගෙවපු මිල ඒකයි."

"පුද්ගලික නිදහස ලබන්නෙ කාගෙන් ද?"

"දෙවිවරුන්ගෙන්," එයා කිවුවා. "සහ මරණයෙන්. මම අවුරුදු දෙදහක් තිස්සේ ජීවත් වෙනවා, මගෙ දරුවෝ, මරණයෙන් හැංගිලා."

"ඒත් ඔයා කොහොමද හේඩීස්ගෙන් හැංගෙන්නේ?" මම ඇහුවා. "මං කිවුවේ... හේඩීස් ළඟ ෆියුරිලා ඉන්නවා නේ."

"එයාලා හැමදේම දන්නෙ නැහැ," එයා කිවුවා. "හැමදේම දකින්නෙත් නැහැ. ඔයාට එයාලව මුණගැහිලා තියෙනවා නේ, පර්සි. මේක ඇත්ත කියලා ඔයා දන්නවා. මොළේ ඇති මනුස්සයෙක්ට සෑහෙන කාලයක් හැංගිලා ඉන්න පුළුවන්, ඒ වගේම මම, මාව සෑහෙන ගැඹුරක වළලාගෙනයි ඉන්නේ. මගේ පස්සෙන් දිගටම එළවාගෙන එන්නෙ මගේ ලොකුම හතුරා විතරයි. හැබැයි මම එයාව පවා වළකලයි තියෙන්නේ."

"ඔයා කියන්නේ මයිනස් ගැන," මම කිවුවා.

ඩෙඩලස් ඔළුව වැනුවා. "එයා නපුරු විදිහට මගේ පස්සෙන් එළවනවා. දැන් එයා මළවුන්ගේ විනිශ්චයකාරයෙක් නිසා, මම එයා ඉස්සරහට යනවට වඩා හොඳ දෙයක් එයාට නැතුව ඇති. එතකොට මගේ අපරාධවලට දඬුවම් කරන්න එයාට පුළුවන් නේ. කොකලස්ගේ දූවලා එයාව මැරුවට පස්සෙ, මයිනස්ගේ අවතාරේ මට හීනවලින් වධ දෙන්න පටන් ගත්තා. මාව අල්ලගන්නවා කියලා එයා දිවුරුවා. මම මට කරන්න පුළුවන් එකම දේ කළා. මම, මගේ වංගගිරිය ඇතුළට රිංගුවා. මගේ පරම ජයග්‍රහණය මේක වෙයි කියලා මම හිතුවා: මරණයට වංචා කිරීම."



"හිතුවා වගේම ඔයා ඒක කළා." ඇනබෙත් පුදුම වුණා. "අවුරුදු දෙදහක් තිස්සේ." ඩෙඩලස් කරලා තිබුණු බිහිසුණු දේවල් පැත්තක දාලා, ඇනබෙත් එයාව අගය කරනවා වගෙයි පෙනුණේ.

එතකොටම වගේ කොරිඩෝවෙන් මහා බිරුම් හඬක් ඇහුණා. මට යෝධ ගාන් යුගල් දෙකක් බිම වදින 'බා-බම්ප්, බා-බම්ප්, බා-බම්ප්' හඬක් ඇහුණා. ඒත් එක්කම මිසිස් ඕ'ලෙරි වැඩපොළට කඩා වැදුණා. මගේ මූණ වරක් ලෙව කෑව එයා සතුටින් පැත්න වේගයට ඩෙඩලස් බිම නොපෙරළී සිටියේ අමාරුවෙන්.

"මෙ ඉන්නෙ මගේ පරණ යාළුවා!" ඩෙඩලස් කිවුවේ මිසිස් ඕ'ලෙරිගේ කන් පිටුපස අතගාමින්. "පාළුවෙන් ගෙවුණ මේ දිග අවුරුදු ගාණ පුරාවට මගේ තනියට හිටපු එකම සගයා."

"ඔයා මාව බේරගන්න එයාට ඉඩ දුන්නා," මම කිවුවා. "අර නළාව ඇත්තටම වැඩ කළා."

ඩෙඩලස් ඔළුව වැනුවා. "ඇත්තටම ඒක වැඩ කළා, පර්සි. ඔයාගේ හිත හොඳයි. ඒ වගේම මිසිස් ඕ'ලෙරි ඔයාට කැමතියි කියලත් මම දැනගෙන හිටියා. මට ඔයාට උදවු කරන්න ඕනෑ වුණා. බාගදා ඒ මට- මට වරදකාරි හැඟීමක් දැනුණ නිසා වෙන්නැති."

"ඇයි වරදකාරි හැඟීමක් දැනුණේ?"

"ඔයාලගේ ගවේෂණය පලක් නැති එකක් වෙන නිසා."

"මොනවා?" ඇනබෙත් කිවුවා. "ඒත් ඔයාට තවමත් පුළුවන් අපිට උදවු කරන්න. ඔයා එහෙම කරන්න ඕනෑ! අපිට අරියඩ්නිගේ නූල දෙන්න. එතකොට ඒක ලූක්ගේ අතට යන්නෙ නැහැ නේ."

"ඔව්... නූල. හරියටම මඟ පෙන්වන්න පුළුවන්කම තියෙන්නෙ පැහැදිලි පෙනීමක් තියෙන මනුෂ්‍යයෙක්ට කියලා මම ලූක්ට කිවුවා. ඒත් එයා මාව විශ්වාස කළේ නැහැ. එයාගේ හිත තදින්ම වැදිලා තිබුණේ මායා භාණ්ඩයකට. ඇත්තටම නූලත් වැඩ කරනවා. බාගදා, ඒක ඔයාලගේ මේ මනුෂ්‍ය යාළුවා තරම් නිවැරදි නැතුව ඇති. ඒ වුණත් ඒකත් සෑහෙන හොඳයි. සෑහෙන හොඳයි."

"ඒක කොහෙද?" ඇනබෙත් ඇහුවා.

"ලූක් ළඟ," ඩෙඩලස් දුක්බරව කිවුවා. "මට කණගාටුයි, මගෙ දරුවෝ. ඒත් ඔයාලා පැය ගාණක් පරක්කුයි."

ඇඟ පුරා පැතිරුණු හිරිවැටීමක් සමඟ, මල්ලව පිටියේ දී ලූක් ඒ තරම් සතුටින් සිටි හේතුව මට තේරුම් ගියා. ඒ වෙද්දිත් එයාට ඩෙඩලස්ගෙන් නූල ලැබිලා ඉවරයි. එයාගේ එකම බාධකය වෙලා තියෙන්න ඇත්තේ මල්ලව පිටියේ පාලකයා විතරයි. මම ඇන්ටියස්ව මරා දමලා ඒ ප්‍රශ්නෙත් එයාට විසඳලා දීලා.

"ක්‍රෝනොස් මට නිදහස දෙන්න පොරොන්දු වුණා." කුයින්ටස් කිවුවා. "හේඩීස්ව බලයෙන් පහ කරාට පස්සෙ, එයා පාතාල ලෝකයේ පාලනය මට පවරයි. මට මගේ පුතා ඉකරස්ව ආපහු ලැබෙයි. අසරණ පර්ඩික්ස් කොල්ලට කරපු වැරදි හරිගස්සන්නත් මට ඉඩ ලැබෙයි. මයිනස්ගේ ආත්මයට ආයේ මට කරදර කරන්න ඉඩ නොලැබෙන විදිහට මම එයාව ටාටරස්වලට විසි කරලා දානවා. ඊට පස්සෙ මට කවදාවත් මරණයෙන් බේරිලා දුවන්න වෙන්නෙ නැහැ."

"ඒකද ඔයාගේ මහ ලොකු අදහස?" ඇනබෙත් මොර දුන්නා. "ඔයා ලූක්ට අපේ කඳවුර විනාශ කරලා, උප දෙවිවරු සිය ගාණක් මරලා, ඊට පස්සෙ ඔලිම්පස්වලටත් පහර දෙන්න ඉඩ දෙනවා? ඔයාට ඕනෑ දේ ලැබෙනවා නම්, ඔයා මුළු ලෝකෙම විනාශ කරලා දානවා?"

"ඔයාලගෙ පැත්ත විනාශ වෙන්න නියම වෙලා ඉවරයි, මගෙ දරුවෝ. ඔයාලගේ කඳවුරේ වැඩ කරන්න පටන් ගත්ත හැටියෙ ම මම ඒක දක්කා. ක්‍රෝනොස්ගේ බලය මැඩ පවත්තන්න ඔයාලට කොහෙත්ම බැහැ."

"ඒක ඇත්ත නෙවෙයි!" ඇනබෙත් බෙරිහන් දුන්නා.

"මම කරන්නෙ කරන්න ඕනෑ දේ, මගෙ දරුවෝ. එයාලා ගෙනාව යෝජනාව අතෑරලා දාන්න හොඳ වැඩියි. මට කණගාටුයි."

ඇනබෙත් කැන්වස් ආධාරකයක් තල්ලු කර දැමුවා. වාස්තු විද්‍යා රූප සටහන් පොළොව පුරා විසිරුණා. "මම ඔයාට ගෞරව කළා. ඔයයි මගේ වීරයා වෙලා හිටියේ ඔයා- ඔයා පුදුමාකාර දේවල් හැදුවා. ඔයා ප්‍රශ්න විසඳුවා. ඒත් දැන්... ඔයා කවුද කියලා මම දන්නෙ නැහැ. ඇතීනාගේ දරුවෝ දක්ෂ විතරක් නෙවෙයි, බුද්ධිමත් වෙන්නත් ඕනෑ. සමහරවිට ඔයා දැන් නිකං ම යන්ත්‍රයක් විතරයි වෙන්න ඇති. ඔයා අවුරුදු දෙදහසකට කලින්ම මැරිලා යන්නයි තිබ්බෙ."

ගේන්ති ගන්නවා වෙනුවට, ඩෙඩලස් ඔළුව පහත් කරගත්තා. "ඔයා දැන් ගිහින් කඳවුරට අනතුරු ඇඟෙව්වොත් හොඳයි. දැන් ලූක් ළඟ නූල තියෙන නිසා-"



එක්වරම මිසිස් ඕ'ලෙරිගේ කන් දෙක කෙළින් වුණා.

"කවුරු හරි එනවා!" රේචල් අනතුරු ඇඟෙව්වා.

වේගයෙන් ඇරුණු දොර පියන් අතරින් ඇතුළට තල්ලු වුණේ දාමවලින් බැඳපු නිකෝව්. එයාට පිටුපසින් කෙලී සහ ලැයිස්ට්‍රිගෝනියානුවෝ දෙන්නෙකුත්, මයිනස්ගේ අවතාරයත් ඇතුළට ආවා. දැන් එයාව පෙනුණේ මුළුමනින්ම වගේ ගනවයි - හරියට කෑර ඇස් ඇති, සුදුමැලි, රැවුල වැවූ රජෙක් මීදුම් දහර ගැහෙමින් පිටවෙන ලෝගුවකින් සැරසී ඉන්නවා වගෙයි.

එයාගේ බැල්ම ඩෙඩලස් මත නැවතුණා. "මේ ඉන්නෙ, මගේ පරණ යාළුවා."

ඩෙඩලස් දත්මිටි කෑවා. එයා කෙලී දිහා බැලුවා. "මොකක්ද මේකෙ තේරුම?"

"ලූක් ඔයාට නෑග්ගක් එව්වා." කෙලී කිවුවා. "එයා හිතුවා ඔයා, ඔයාගේ පරණ හාම්පුතා, මයිනස්ව දකින්න කැමති වෙයි කියලා."

"අපේ ගිවිසුමේ මෙහෙම දෙයක් තිබුනෙ නැහැ," ඩෙඩලස් කිවුවා.

"ඇත්තෙන්ම නැහැ," කෙලී කිවුවා. "ඒත් අපි දැන් ඔයාගෙන් අපිට ඕනෑ කරපු දේ අරන් ඉවරයි, ඒ වගේම අපිට සලකන්න තවත් ගිවිසුම් තියෙනවා නේ. මේ ජෝක් උප දෙවි පැටියව අපිට දීලා, ඒ වෙනුවට මයිනස් අපෙන් වෙනත් දෙයක් ඉල්ලුවා." එයා නිකෝගේ නිකට යට ඇඟිල්ලකින් අතගෑවා. "මෙයා සෑහෙන ප්‍රයෝජනවත් වෙයි. ඒ වෙනුවට මයිනස් අපෙන් ඉල්ලුව එකම දේ ඔයාගේ ඔළුව විතරයි, නාකි මිනිහෝ."

ඩෙඩලස් සුදුමැලි වුණා. "ද්‍රෝහියෝ."

"ඒකට හුරු වෙන්න," කෙලී කිවුවා.

"නිකෝ," මම කතා කළා. "ඔයා හොඳින් ද?"

එයා මුසල විදිහට ඔළුව වැනුවා. "මට- මට සමා වෙන්න, පර්සි. මයිනස් මට කිවුවා ඔයාලා ඉන්නෙ අනතුරක කියලා. ආපහු වංගගිරියට යන්න එයා මාව නම්මගත්තා."

"ඔයා අපිට උදවු කරන්න ද හැදුවේ?"

"මාව රවැට්ටුවා," එයා කිවුවා. "එයා අපි හැමෝවම රැවැට්ටුවා."

මම කෙලීට රවුවා. "ලූක් කොහෙද? මොකද එයා මෙතැනට ආවෙ නැත්තෙ?"

යක්ෂණිය හිනාවක් පෑවේ හරියට අපි දෙන්නා විතරක් දන්න රහසිගත විහිළුවක් තියෙනවා වගෙයි. "ලූක්ට... වැඩ වැඩියි. එයා පහර දෙන්න ලෑස්ති වෙනවා. ඒත් බය වෙන්න එපා. අපේ තව යාළුවෝ මග එනවා. ඒ අතර වාරේ, මං හිතන්නෙ මට රසම රස කටගැස්මක් ගන්න පුළුවන්!" එයාගේ අත් නිය පහුරුවලට හැරුණා. එයාගේ කොණ්ඩය ගිනි දලුවලට හැරෙද්දි, එයාගෙ කකුල් සැබෑ ස්වරූපයට - ඒ කියන්නෙ එකක් බූරු කකුලකටත්, අනෙක ලෝකඩ කකුලකටත් හැරුණා.

"පර්සි." රේචල් මිමිණුවා. "තටු. ඔයා හිතනව ද-"

"ඒවා ගන්න," මම කිවුවා. "මම ඔයාට වෙලාව අරන් දෙන්න බලන්නම්."

ඒත් එක්කම එතැන යම පිටියකට හැරුණා. ඇනබෙත් සහ මම කෙලීට පහර දෙන්න පැන්නා. යෝධයෝ කෙලින්ම ඩෙඩලස් වෙත ආවත්. මිසිස් ඕ'ලෙරී එයාගෙ ආරක්ෂාවට ඉදිරියට පැන්නා. තල්ලු වී බිමට වැටුණ නිකෝ දම්වැල් ගලවාගන්න දඟලන අතරේ මයිනස්ගේ අවතාරය විලාප දෙන්න ගත්තා. "නිමැවුම්කාරයාව මරපල්ලා! ඒකව මරපල්ලා!"

රේචල් බිත්තියේ එල්ලා තිබුණු පියාපත් ඩැහැගත්තා. කිසිවෙක් එයා ගැන සැලකිල්ලක් දක්වූයේ නැහැ. කෙලී ඇනබෙත්ට කෙටුවා. මම එයාට ළං වෙන්න උත්සහ කළා, ඒත් යක්ෂණිය ඊට වඩා වේගවත් සහ මාරාන්තික වුණා. එයා මේස පෙරළා දමමින්, නව නිපැයුම් කුඩු කරමින්, එයාට ළං වෙන්න තිබුණු ඉඩ ඇහිරුවා. මිසිස් ඕ'ලෙරී යෝධයෙකුගේ අත් ගොබයකට එයාගේ දත් කිඳා බස්සවනවා මම ඇස් කොණකින් දක්කා. වේදනාවෙන් විලාප දුන් යෝධයා අත ගසමින්, මිසිස් ඕ'ලෙරීව ගලවා දමන්න උත්සහ කළා. ඩෙඩලස් එයාගේ කඩුව ගන්න පැන්නා, ඒත් දෙවෙනි යෝධයා මිට් කරගත් අතකින් වැඩ මේසයට ගැසූ පහරින් කඩුව ඈතට විසිවුණා. බිම තිබුණු ග්‍රීක ගින්දර පිරවූ මැටි බඳුනක් බිඳී හටගත් ගින්න, අසුරු සැණින් පැතිරෙන්න ගත්තා.



"මළවුන්ගේ ආත්මයනි!" මයිනස් කෑගැසුවා. "මා වෙත එනු!" එයා අවතාර අත් උඩට ඔසවද්දි වාතය ගුමු-ගුමු හඬ නගන්න පටන් ගත්තා.

"එපා!" නිකෝ කෑගැසුවා. එයා දන් දෙපයින් සිටගෙන සිටියා. කොහොම හරි එයාට මාංචු ගලවාගන්න හැකි වී තිබුණා.

"උඹට මාව පාලනය කරන්න බැහැ, මෝඩ පැංචෝ," මයිනස් අවඥාවෙන් කිවුවා. "මේ මුළු කාලය පුරාවටම, මමයි උඹව පාලනය කරේ! ආත්මයක් වෙනුවට ආත්මයක්, ඔව්. ඒත් ඒ මළවුන්ගෙන් නැගිටින්නෙ උඹේ සහෝදරී නෙවෙයි. මමයි. මම මේ නිමැවුම්කාරයාව මරා දාපු හැටියේම!"

මයිනස් වටා ආත්ම පෙනී සිටින්න පටන් ගත්තා - සැලෙමින් දිලිසෙන රූප හෙමින් හෙමින් වැඩි වෙමින්. ක්‍රීට්වල සෙබළු බවට ගත වුණා.

"හේඩීස්ගෙ පුතා මමයි," නිකෝ තදින් කිවුවා. "මෙතැනින් යනවා!"

මයිනස් මහ හඬින් හිනාවුණා. මට ඉහළින් යන්න උඹට බලයක් නැහැ. මළගිය ආත්මවල ස්වාමියා මමයි! අවතාරවල රජා මමයි!"

"නෑ." නිකෝ එයාගේ කඩුව ඇදලා ගත්තා. "මමයි."

එයා කළු පාට කඩු තලයෙන් පොළොවට කොටද්දි, එය බටර් කුට්ටියක් හරහා යනවා වගේ කළු ගල කපාගෙන ගියා.

"කවදාවත් නැහැ!" මයිනස්ගෙ රූපයේ රැළි නැගුණා. "මම කොහෙත්ම-"

පොළොව ගිගුරුවා. ඉරි තැළු ජනේල කැලි කැලිවලට කුඩු වෙද්දි, නැවුම් සුළං ධාරාවක් ඇතුළට කඩා වැදුණා. වැඩපොළේ පොළොව මැද ගැඹුරු විවරයක් ඇරී, මයිනස්ව සහ එයාගේ අනෙක් මළගිය ආත්ම සියල්ලම ඇතුළට උරා ගත්තේ බිහිසුණු විලාපයක් පිට කරමිනුයි.

තරක ආරංචිය තමයි: අපි වටා තවමත් සටන සිදුවෙන අතරේ මම, මගේ අවධානය වෙනතකට යොමු වෙන්න ඉඩ ඇරලා තිබුණා. කෙලී මගේ ඇඟට පැන්න වේගයට, මට මාව ආරක්ෂා කරගන්න වෙලාවක් නැති වුණා. මගේ කඩුව පැත්තකට විසි වී ගියා. මම වැටෙද්දි

මගේ ඔළුව වැඩ මේසයක හදිස්සියේ වැදුණා. මගේ ඇස් බොඳ වුණා. මට අත් මිටවා ගන්නවත් බැරිවුණා.

කෙලී මහ හඬින් හිනාවුණා. "ඔයා නම් රහ ඇති!"

එයා උල් දත් විළිස්සුවා. එක්වරම එයාගේ ඇඟ දරදඬු වුණා. එයාගේ රතු ඇස් ලොකු වුණා. එයා අමාරුවෙන් හුස්මක් ඇද්දා. "සිසිම... ඉස්කෝලෙක... ආත්මයක්.."

ඒත් එක්කම එම්පොසාගේ පිටුපසින් ඇනබෙත්, එයාගේ තිණිස්ස ඉවතට ඇදලා ගත්තා. භයානක විලාපයක් එක්ක කෙලී කහ පාට දුම්ලියකට විසිරුණා.

ඇනබෙත් මට නැගිටින්න උදවු කළා. මට තවමත් ඉපේ කරකැවිල්ලක් දැනුණත්, අපිට නාස්ති කරන්න වෙලාවක් තිබුණේ නැහැ. මිසිස් ඕ'ලෙරී සහ ඩේඩලස් තවමත් යෝධයෝ සමග පොරයක පැටලී සිටියා. ඒ අතරේම මට උමඟ පැත්තෙන් කෑගහන හඬවල් ඇහුණා. වැඩපොළ දිහාවට තව තවත් රාක්ෂයෝ එමින් සිටියා.

"අපිට ඩේඩලස්ට උදවු කරන්න වෙනවා!" මම කිවුවා.

"වෙලාවක් නැහැ," රේචල් කිවුවා. "ගොඩක් එවුන් එනවා!"

දැනටමත් පියාපත් ජෝඩුවක් සවි කරගෙන සිටි එයා, මයිනස් සමග පොර බදා සුදුමැලි වී දාඩියෙන් නෑවී සිටි නිකෝටත් පියාපත් සවි කරමින් සිටියා. ඒ පියාපත් සැණෙකින් එයාගේ පිටට සහ අත්වලට බද්ධ වුණා.

"දැන් ඔයා!" එයා මට කිවුවා.

තත්පර ගාණක් තුළදී නිකෝ, ඇනබෙත්, රේචල් සහ මම තඹවන් පියාපත් ජෝඩුව බැගින් පැළඳගෙන සිටියා. ඒ වෙද්දිත් ජනේලය තුළින් තමා ආ සුළඟට මාව එසවෙනවා මට දැනුණා. ග්‍රීක ගින්දර මේස සහ ලී බඩු දවමින් සර්පිලාකාර පඩිපෙළ දෙසට පැතිරී යමින් තිබුණා.

"ඩේඩලස්!" මම මොරගැසුවා. "ඉක්මනට එන්න!"

එයාට කැපුම් තුවාල සිය ගාණක් සිදු වී තිබුණා - ඒත් ඒ තුවාලවලින් ලේ වෙනුවට පිටට වැගිරුණේ රන් පාට තෙල් වර්ගයකුයි. කඩුව ආපසු සොයාගෙන සිටි එයා කැඩුණු මේසයක කොටසක්



යෝධයින්ට එදිරිව පලිහක් ලෙස පාවිච්චි කරමින් සිටියා. "මට මිසිස් ඕ'ලෙරීව දාලා එන්න බැහැ!" එයා කිවුවා. "යන්න!"

වාද කරමින් ඉන්න වෙලාවක් තිබුණේ නැහැ. අපි නොයා හිටියත්, එයාට උදවු කරන්න අපිට පුළුවන් වෙයි කියලා මම හිතුවෙ නැහැ.

"අපි කවුරුවත් පියාඹන්න දන්නෙ නැහැ නේ" නිකෝ අමනාපය පෑවා.

"ඒක ඉගෙන ගන්න මේක තමයි හොඳම වෙලාව," මම කිවුවා. ඊට පස්සෙ අපි හතර දෙනාම ජනේලයෙන් පිටත විවෘත අහසට පැන්නා.

"යාහෝ!" මම මොර ගැසුවා. ඒ හැඟීම අදහන්නත් බැරි තරම්. පියාපත් ක්‍රියා කරන ක්‍රමය අල්ලාගත්තට පස්සේ, මට දැනුණේ ඒවා මගේ ඇඟේම කොටසක් වගෙයි. මට ඕනෑ කළ ඕනෑම තැනකට ඉහළට පියාඹන්නත්, වේගයෙන් පහළ බහින්නත්, ගුවනේ කිමිදෙන්නත් මට හැකියාව තිබුණා.

ආපසු හැරී බැලූ මට පෙනුණේ මගේ යාළුවෝ - රේචල්, ඇනබෙත් සහ නිකෝ - ඉර එළියට දිස්නය දෙමින් සර්පිලාකාරව කැරකෙන විදිහයි. එයාලට පිටුපසින්, ඩෙඩලස්ගේ වැඩපොළේ ජනේලවලින් දුම් පිටවුණා.

"නිමෝ!" ඇනබෙත් මොර දුන්නා. "මේ තටුවලට දිගටම අල්ලගෙන ඉන්න බැරි වෙයි."

"කොච්චර වෙලා තියෙයි ද?" රේචල් ඇසුවා.

"මට ඒක හොයාගන්න කොහෙත්ම ඕනෑ නෑ!" ඇනබෙත් කිවුවා.

අපි දෙවිවරුන්ගේ උයනට වේගයෙන් පහළ බැස්සා. මම කොත් ගලක් වටා රවුමක් ම කැරකුණේ කඳු නගින්නන් දෙන්නෙකුත් බය කරමින්. ඊට පස්සේ මිටියාවත හරහා පියඹා ගිය අපි, පාරක් ළඟ, සංචාරකයන්ගේ මධ්‍යස්ථාන මළුවකට ගොඩබෑවා. හවස් වරුවක් නිසා එය සෑහෙන හිස්ව තිබුණත් අපි හැකි ඉක්මනින් පියාපත් ගලවා දැමුවා. ඒවා දිහා බලද්දි, ඇනබෙත් කිවුවා හරි කියලා මට තේරුණා. පියාපත් අපේ පිටට සවි කළ ඉටි-ඇලෙන මුද්‍රා පටි දැනටමත් දියවී, ලෝකඩ පිහාටු හැලෙමින් තිබුණා. එය අපරාධයක් වගේ දැනුණත්, අපිට ඒවා අලුත්වැඩියා කරන්නවත්, මිනිස්සුන්ට පේන්න තැන තැන දාලා යන්නවත් පුළුවන්කමක් නොතිබුණු නිසා අපි ඒවා ආපනශාලාවට පිටින් තිබුණු කුණු භාජනවලට එබුවා.

මම සංචාරක දුරදක්නයක් පාවිච්චි කරමින් කන්ද උඩ ඩෙඩලස්ගේ වැඩපොළ තිබුණු තැන පරීක්ෂා කර බැලුවත්, එය අතුරුදහන් වී තිබුණා. ඉහළ නගින දුම් රොටු නැහැ. කැඩුණු ජනේල නැහැ. තිබුණේ කඳු බෑවුම විතරයි.

"වැඩපොළ වෙන තැනකට මාරු වෙලා," ඇනබෙත් අනුමාන කළා. "කොහෙටද කියලා කියන්න පුළුවන්කමක් නැහැ."

16

# මම මිනී පෙට්ටියක් විවර කළා

පොළොවෙන් අඩි පන්සියයක් විතර උඩින් ඇති ජනේලයකින් එළියට පනින එක මම නම් ජොලි වැඩක් කියලා හිතන්නෙ නැහැ. විශේෂයෙන්ම ලෝකඩ පියාපත් ජෝඩුවක් පැලඳගෙන, තාරාවෙක් වගේ අත් දෙක උඩ-පහළ ගසන්න වෙන එක කොහෙත්ම ජොලි වැඩක් නෙවෙයි.

පහළින් වූ රතු ගල් පර්වත සහිත මිටියාවත දිහාවට මාව වේගයෙන් ඇද වැටුණා. දෙවිවරුන්ගේ උයනෙන් මගේ කෑලි සවලකට එකතු කරගන්න වෙනවා කියලා මට නම් හොඳටෝම සහතික වුණා. ඒත් මට උඩින් කොහෙදෝ තැනකින් ඇනබෙත් මොර දෙනවා මට ඇහුණා. "ඔයාගේ අත් දිග අරින්න! ඒවා දෙපැත්තට දික් කරගෙන ම ඉන්න."

මගේ මොළයේ බය විසින් ගිල නොගත් චූටි කොටසකට එයා කියපු දේ ඇහුණා. එයට මගේ අත් ප්‍රතිචාර දැක්වුවා. මම දෑත් දෙපසට දිග අරිද්දි ම, පියාපත් දැඩි වී සුළඟ බැඳුවා. ඒත් එක්කම මගේ පහළට වැටීම මන්දගාමී වුණා. මම පාලනය කරගත් කෝණයකින් පහළට පියාසර කරන්න ගත්තේ පහළ බහින සරුංගලයක් වගෙයි.

අත්හදා බලන්න වගේ මම එක් වරක් මගේ අත් ගැසුවා. මාව අඩ කවාකාර පථයක අහසට විසි වෙද්දි සුළඟ මගේ කන් තුළ උරුවම් බෑවා.

"එතකොට දැන් අපි මොකද කරන්නෙ?" මම ඇසුවා. "අපි කොහොමද ආපහු වංගගිරිය ඇතුළට යන්නේ?"

ඇනබෙත්ගේ ඇස් ඇතින් දිස්වුණු පයික්ස් පීක් කඳු මුදුනට යොමු වුණා. "සමහරවිට අපිට බැරිවෙයි. ඩෙඩලස් මැරුණා නම්... එයාගේ ජීව බලය වංගගිරියට බැඳිලා තියෙන්නෙ කියලා එයා කිව්වා. එහෙනම් ඒකත් විනාශ වෙන්න ඇති. සමහරවිට ඒකෙන් ලූක්ගේ ආක්‍රමණය නතර වෙයි."

තවමත් පහළ කොතන හෝ සිටි ග්‍රෝවර්ව සහ ටයිසන්ව මට සිහිවුණා. ඒ වගේම ඩෙඩලස්වත්... එයා මහා දරුණු වැඩ කරලා, මම ආදරේ කරන හැමදෙනාගේම ජීවිත අවදානමේ දම්මා වුණත්, ඒක නම් මැරෙන්න භයානක ක්‍රමයක් කියලයි මට දැනුණේ.

"නෑ." නිකෝ කිව්වා. "එයා මැරිලා නැහැ."

"ඔයා කොහොමද එහෙම කියන්නේ?" මම ඇසුවා.

"මිනිස්සු මැරුණාම මම ඒක දන්නවා. නිකං මගේ කන් ඇතුළේ ගුමු ගුමු ගානවා වගේ අමුතු හැඟීමක් මට දැනෙනවා."

"එතකොට. ටයිසන්ටයි ග්‍රෝවර්ටයි මොකද?"

නිකෝ ඔළුව හෙල්ලුවා. "ඒක කියන්න අමාරුයි. එයාලා මිනිස්සුවත්, අර්ධ-ලෝහිතයෝවත් නෙවෙයි නේ. එයාලට මරණයට යටත් වෙන ආත්ම නැහැ."

"අපි ටවුමට යන්න ඕනෑ," ඇනබෙත් තීරණය කළා. "එතකොට වංගගිරියට ඇතුළු වෙන දොරටුවක් හොයාගන්න අපිට මීට වඩා ඉඩක් ලැබෙයි. ලූක් එයාගේ හමුදාවත් එක්ක යන්න කලින් අපි ආපහු කඳවුරට යන්න ඕනෑ."

"ඉතින් අපිට ප්ලේන් එකක යන්න පුළුවන් නේ," රේචල් කිව්වා.

මම වෙව්ලා ගියා. "මම උඩින් යන්නෙ නැහැ."

"ඒත් ඔයා මේ දැනුත් ඒක කරේ."

"ඒක පහළින් පියෑඹීමක් නේ," මම කිව්වා, "හැබැයි ඒක පවා අවදානම්. ගොඩක් උඩින් යන්න ගියොත් - ඒක තමයි සියුස්ගේ බල ප්‍රදේශය. මට ඒක කරන්න බැහැ. ඇරත්, අපිට ප්ලේන් එකක යන්නවත් වෙලාවක් නැහැ. වංගගිරිය තමයි ආපහු යන්න ඉක්මන් ම ක්‍රමය."



මට ඒක කියන්න ඕනෑ වුනේ නැහැ, ඒත් මම යටි හිතෙන් බලාපොරොත්තු වෙමින් සිටියේ සමහරවිට, යන අතරමග දි අපිට ග්‍රෝවර්ව සහ ටයිසන්ව හොයාගන්න ලැබෙයි කියලයි.

"ඒ කියන්නෙ අපිට ටවුමට යන්න කාර් එකක් ඕනෑ වෙනවා," ඇනබෙත් කිව්වා.

රේචල් රථ ගාල දිහා බැලුවා. එයාගේ මුහුණ පුලුටු වුණේ හරියට එයා පසුතැවෙන්න වෙන විදිහේ දෙයක් කරන්න සූදානම් වෙනවා වගෙයි. "මං ඒ ගැන බලාගන්නම්."

"කොහොමද?" ඇනබෙත් ඇසුවා.

"මාව විශ්වාස කරන්නකෝ."

නොසන්සුන්ව සිටියත් ඇනබෙත් ඔළුව වැනුවා. "හරි, මම තෑගි කඩෙන් ප්‍රිස්මයක් අරන් එන්න යනවා. ඒකෙන් දේදුන්නක් හදලා, කඳවුරට අයිරිස්-මැසේජ් එකක් යවන්න බලන්න ඕනෑ."

"මාත් ඔයා එක්ක එන්නම්," නිකෝ කිව්වා. "මට බඩගිනියි."

"එහෙනම්, මම රේචල් එක්ක ඉන්නම්," මම කිව්වා. "වාහන ගාලෙදි හම්බ වෙමු."

රේචල්ගේ මූණ ඇකිළුණේ මම එයා එක්ක එනවට කැමති නැහැ වගෙයි. ඒකෙන් මගේ හිතට හරි නැති වුණත්, මම එයා පසුපස රථ ගාලට ගියා.

එයා කෙළවරක නවතා තිබුණු ලොකු කළු කාරයක් දිහාවට ගියා. ඒක මම මැන්හැටන්වල දි නිතරම දැක තිබුණු 'ලෙක්සස්' වර්ගයේ කාරයක්. එහි රියැදුරා එළියට වී පත්තරයක් බලමින් සිටියා. එයා කළු ඇඳුම් කට්ටලයකින් සහ ටයි පටියකින් සැරසී සිටියා.

"ඔයා මොනවද කරන්න යන්නේ?" මම රේචල්ගෙන් ඇසුවා.

"මෙතැනට වෙලා ඉන්නව ද," එයා මූසල විදිහට කිව්වා. "කරුණාකරලා."

කෙලින්ම රියැදුරා වෙත ගිය රේචල් එයාට කතා කළා. රියැදුරාගේ නළල රැළි වුණා. රේචල් තවත් මොනවදෝ කිව්වා. සුදුමැලි වුණ රියැදුරා දඩිබිඩි ගාලා පත්තරය නැමුවා. එයා ඔළුව වනමින් කලබලෙන් ජංගම දුරකථනය එළියට ගත්තා. කෙටි ඇමතුමකින් පස්සේ, එයා රේචල්ට නගින්න කාරයේ පිටුපස දොර විවර කර දුන්නා.

රේවල් මගේ පැත්තට අත දිගු කර පෙන්වද්දි, රියැදුරා තවත් ටිකක් ඔළුව පහත් කළේ හරියට **'ඔව්, මැඩම්, ඔබතුමීට ඕනෑම දෙයක්'** කියනවා වගෙයි.

ඒ මනුස්සයා ඒ හැටි කලබල වුණේ ඇයි කියලා මට තේරුම් ගන්න බැරිවුණා.

රේවල් ආපහු මගේ ළඟට එද්දි ම ඇනබෙත් සහ නිකෝ තැපැල් කඩයේ සිට ආවා.

"මම කයිරොන්ට කතා කළා," ඇනබෙත් කිවුවා. "එයාලා පුළුවන් උපරිමෙන් යුද්ධයකට ලෑස්ති වෙනවා. ඒ වුණාට එයාට අපිවත් ඕනෑ. එයාලට පුළුවන් හැම වීරයෙක්ව ම එකතු කරගන්න ඕනෑ. අපිට යන්න වාහනයක් හම්බ වුණා ද?"

"අපි ලෑස්තියි නම් ඩ්‍රයිවරුත් ලෑස්තියි," රේවල් කිවුවා.

රියැදුරා දත් කාකි කලිසමකින් සහ පෝලෝ කමිසයකින් සැරසුණු තවත් කෙනෙකුට කතා කරමින් සිටියා, පෙනුණු හැටියට ඒ එයාගෙ කාරය කුලියට ගත් සේවාදායකයායි. ඒ මනුස්සයා මැසිවිලි කියමින් සිටියා, ඒත් රියැදුරා එයාට කියූ දේ මට ඇසුණා, "මට සමා වෙන්න, සර්. හදිසි තත්ත්වයක්. මම ඔයාට වෙන කාර් එකක් ඔඩර් කරලා තියෙන්නේ."

"ඉක්මන් කරන්න," රේවල් කිවුවා. එයා අපිව කාරය වෙත කැඳවාගෙන ගොස් එයට ගොඩවුණේ, කලබල වී සිටි කාරය කුලියට අරගත් මනුස්සයා දිහා බලන්නෙවත් නැතිවයි. විනාඩියකට පස්සේ අපි පාර දිගේ ඉදිරියට යමින් සිටියා. එහි ආසන ලෙදර්වලින් නිමවා තිබුණා. එය තුළ හිතේ හැටියට කකුල් දිග ඇරගන්න ඉඩ තිබුණා. එහි පිටුපස අසුනේ හිස් රැඳවුම තුළට වැද්දූ පැතලි-තිර රූපවාහිනීත්, බෝතල් කළ වතුර, සෝඩා සහ කෙටි කෑම වර්ග පිරවූ මිනි-ශීතකරණයකුත් තිබුණා. අපි ඒවා ගිල දමන්න පටන් ගත්තා.

"කොහෙටද, මිස් ඩෙයාර්?" රියැදුරා ඇසුවා.

"මාත් තවම හරියටම දන්නෙ නැහැ, රොබට්," එයා කිවුවා. "අපිට ඕනෑ ටවුම හරහා ගිහින්, අහ්, වටපිටාව බලාගන්න."

"ඔයා කියන ඕනෑම දෙයක්, මිස්."

මම රේවල් දිහා බැලුවා. "ඔයා මේ මනුස්සයාව දන්නවා ද?"

"නැහැ."



"ඒත් එයා හැමදේම දාලා ඔයාට උදවු කරනවා. ඇයි ඒ?"

"ඇස් දෙක හොඳට ඇරගෙන යන්කෝ," එයා කිවුවා. "මට බලන්න උදවු කරන්න."

ඒක මගේ ප්‍රශ්නයට උත්තරයක් නම් නෙවෙයි.

අපි පැය බාගයක් විතර කොලරාඩෝ ස්ප්‍රින්ග්ස් හරහා ගමන් කළත්, වංගගිරි දොරටුවක් වියහැකියි කියලා රේවල් හිතන විදිහේ කිසිවක් දකින්න ලැබුනෙ නැහැ. රේවල්ගේ උරහිස මගේ උරහිසට තෙරපී ඇති බව මට හොඳින්ම දැනුණා. ඇත්තෙන් ම එයා කවුද කියලත්, අහම්බෙන් මුණ ගැසුණු රියැදුරෙක් ළඟට ගිහින් එසැණින් ම එයාව ගමනක් යන්න පොළඹවා ගත්තේ කොහොමද කියලත් මම පුදුමයෙන් කල්පනා කළා.

පැයකට විතර පස්සෙ අපි ඩෙන්වර් බලා උතුරු දෙසට යන්න තීරණය කළේ, වඩා විශාල නගරයක වංගගිරි දොරටුවක් තියෙන්න වඩාත් ඉඩ ඇති හිතලයි. ඒ වුණත් අපි හැමෝම හිටියේ කලබල වෙමිනුයි. අපේ කාලය ගෙවී යමින් තිබුණා.

අපි කොලරාඩෝ ස්ප්‍රින්ග්ස්වලින් පිට වෙද්දි ම වගේ, රේවල් වේගයෙන් කෙලින් වී වාඩිවුණා. "අධිවේගී පාරෙන් එළියට යන්න!"

රියැදුරා පිටුපසට බැල්මක් හෙළුවා. "මිස්?"

"මම දෙයක් දැක්කා, මං හිතන්නේ. මේකෙන් එළියට යන්න."

වාහන අතරින් රිංගමින් ගිය රියැදුරා පිටවීමක් සොයාගත්තා.

"ඔයා මොකක්ද දැක්කේ?" මම ඇසුවේ, අපි දැන් නගරයෙන් සෑහෙන පිටට ඇවිත් සිටි නිසයි. කඳු ගැට, තණ බිම් සහ තැන තැන විසිරුණු ගොවිපොළ ගොඩනැගිලි ඇරෙන්න වටපිටාවේ වෙන කිසිවක් තිබුනේ නැහැ.

බලාපොරොත්තු තැබිය නොහැකි පාරකට රේවල් රියැදුරාව හැරෙව්වා. අපි වේගයෙන් පසු කර ගිය සලකුණ මට කියවා ගන්න බැරිවුණත්, එහි දැක්වුණු දේ රේවල් කිවුවා. "බටහිර පතල් හා කර්මාන්ත කෞතුකාගාරය."

කෞතුකාගාරයක් හැටියට නම්, එයට වැඩි පෙනුමක් තිබුනේ නැහැ - තිබුණේ පරණ මෝස්තරයේ දුම්රිය නැවතුම්පොළක් වගේ

ප්‍රංචි ශාලාවක පිටතින් ප්‍රදර්ශනයට තැබූ විදුම් යන්ත්‍ර කීපයක්, පොම්ප සහ පරණ හුමාල සවල් දෙක තුනක් විතරයි.

"අතන." රේචල් ළඟ පාත තිබුණු කඳු බෑවුමක වූ සිදුරකට අත දිගු කළා - එය පුවරු හා දම්වැල්වලින් වසා දැමූ උමගක්. "පරණ පතල් දොරක්."

"වංගගිරියට දොරක්?" ඇනබෙත් ඇසුවා. "ඔයාට විශ්වාස ද?"

"හොඳයි, බලන්නකෝ ඒ දිහා!" රේචල් කිවුවා. "මං කිවුවේ... මට ඒක පේනවා, හරි ද?"

එයා රියැදුරාට ස්තුති කළාට පස්සෙ අපි ඔක්කොම එළියට බැස්සා. රියැදුරා සල්ලි ගැනවත් වෙන කිසිම දෙයක්වත් ඇසුවේ නැහැ. "ඔයාට කරදරයක් නැති වෙයි කියලා විශ්වාස ද, මිස් ඩෙයාර්? මට කතා කරන්න පුළුවන් ඔයාගේ-"

"නෑ!" රේචල් කිවුවා. "එපා, ඇත්තටම. ස්තුතියි, රොබට්. ඒ වුණාට අපි හොඳින්."

කෞතුකාගාරය වසා දමලා වගෙයි පෙනුණේ, ඒ නිසා අපි පතල් වළ දෙසට කන්ද නගිද්දි, කවුරුවත් අපිට කරදර කරන්න ආවේ නැහැ. අපි දොරටුව ළඟට ගියාම, ඩෙඩලස්ගේ ලකුණ ඉබ්බාගේ කැටයම් කර තියෙනවා මට දකින්න ලැබුණා. ඒ වුණත් ඒ තරම් චූටි දෙයක් අධිවේගී පාරේ සිටිද්දි රේචල්ට පෙනුණේ කොහොමද කියලා නම් මට කිසිම අදහසක් තිබුනේ නැහැ. මම ඉබ්බාට අත තබද්දි දම්වැල් ගැලවී වැටුණා. දොර ආවරණය කරමින් තිබුණු පුවරු කීපයකට පයින් ගසා බිම දැමූ අපි ඇතුළට පියවර තැබුවා. හොඳට හෝ නරකට, අපි නැවතත් වංගගිරියට ඇතුළු වී සිටියා.

★★★

පසින් සෑදි තිබුණු උමග ගල්වලට හැරුණා. ඒවා දරඟ ගැහෙමින්, බෙදී යමින් මූලිකව උත්සහ කළේ අපිව ව්‍යාකූල කරන්නයි, ඒ වුණත් අපිට මග පෙන්වන්න රේචල්ට කොහෙත්ම අමාරු වුනේ නැහැ. අපිට උවමනා ආපහු නිව්යෝක්වලට යන්න කියලා අපි එයාට කිවුවා, ඊට පස්සේ උමග බෙදෙන තැන්වල දි දෙපැත්ත බලන්නවත් එයා නතර වුනේ නැති තරම්.

මාව පුදුම කරමින්, අපි ඇවිදගෙන යන අතරේ රේචල් සහ ඇනබෙත් කතාබහ කරන්න පටන් ගත්තා. ඇනබෙත් රේචල්ගේ



පවුලේ විස්තර වැඩි වැඩියෙන් ඇසුවා, ඒත් රේචල් ඒවාට කපටි උත්තර දුන්නා. ඊට පස්සෙ එයාලා වාස්තු විද්‍යාව ගැන කතා කරන්න පටන් ගත්තා. පෙනුණු විදිහට, කලාව හදාරද්දි රේචල් ඒ ගැන යමක්-කමක් ඉගෙන ගෙන තිබුණා. නිව්යෝක් වටා ඇති ගොඩනැගිලි මුහුණත්වල විවිධත්වය ගැන එයාලා කතා කළා - "ඔයා අරක දැකලා තියෙනව ද," බ්ලාහ්, බ්ලාහ්, බ්ලාහ් - ඔය වගේ විකාර. ඉතින් පසුබෑව මම නිකෝ සමග ඇවිදගෙන ගියේ අපහසුකාරී නිහඬතාවයක් මැදයි.

"අපව හොයාගෙන ආවට ස්තුතියි," අන්තිමේ දි මම එයාට කිවුවා.

නිකෝගේ ඇස් පටු වුණා. එයා ඉස්සර හිටිය තරම් තරහෙන් ඉන්න බවක් පෙනුනේ නැහැ - සැක සහිත සහ පරිස්සම්කාරී වුණා විතරයි. "ගොවිපොළේ දි වුණ දේට මම ඔයාට ණය වෙලයි හිටියේ, පර්සි. ඇරත්... මට ඩෙඩලස්ව බලාගන්නත් උවමනාව තිබුණා. ඒක අතකින්, මයිනස් කිවුව දේවල් හරි. ඩෙඩලස් මැරෙන්න ඕනෑ. කිසිම කෙනෙක් ඒ තරම් කාලයක් මරණය මග අරින්න හොඳ නැහැ. ඒක ස්වාභාවික නැහැ."

"මෙච්චර දවසක් ඔයා ඒක පස්සෙන් නේද පැන්නුවේ," මම කිවුවා. "ඩෙඩලස්ගේ ආත්මයට ඔයාගේ අක්කගෙ ආත්මය ගනුදෙනු කරන්න."

එයට උත්තර බඳින්න කලින් නිකෝ යාර පනහක් විතර නිහඬව ගියා. "ඒක ලේසි දෙයක් වුනේ නැහැ, ඔයා දන්නවා නේ. ජීවත් වෙන අය ආශ්‍රය කරන්න මැරිච්ච එවුන් විතරක් ඉන්න එක. මට කවදාවත් මාව පිළිගන්නෙ නැහැ කියලා දැනගෙන ඉන්න එක. මට ගරු කළේ මැරිච්ච අය විතරයි, එයාලත් එහෙම කළේ බය නිසයි."

"ඔයාව පිළිගන්න තිබුණා," මම කිවුවා. "ඔයාට කඳවුරේ යාළුවෝ ඇති කරගන්නත් තිබුණා."

එයා මගේ දිහා බලා සිටියා. "ඔයා ඇත්තටම එහෙම හිතනව ද, පර්සි?"

මම උත්තර දුන්නෙ නැහැ. ඇත්තම කියනවා නම්, මම ඒක දැන සිටියේ නැහැ. කොහොමත් නිකෝ අනෙක් අයට වඩා ටිකක් වෙනස් කෙනෙක් වුණා. ඒත් බියන්කාගේ මරණයෙන් පස්සෙ, එයා බිය උපදවන කෙනෙක් වුණා. එයාට තිබුණේ මුළුමනින්ම වගේ... භය උපදවන කෙනෙක් වුණා. එයාට තිබුණේ මුළුමනින්ම වගේ... එයා මහා මොළකාරයෙක් ද, එයාගේ තාත්තාගේ ඇස් දෙකමයි - එයා මහා මොළකාරයෙක් ද,

නැත්නම් පිස්සෙක් ද කියලා ඔයාව දෙගිඩියාවට පත් කරවන අර කැඳබල, උමතු දිප්තියයි. ඒ වගේම එයා මයිනාස්ව පලවා හැරිය විදිහ, එයා අවතාරවල රජා ලෙස තමන්වම හඳුන්වාගත් විදිහ - ඒක එක විදිහකින් හිත් ඇදගන්නාසුලු වුණත්, එයින් මාව අපහසුතාවයකටත් පත් කළා.

එයාට කියන්න ඕනෑ මොනවද කියලා මම හිතාගන්න කලින්, මාව හිටිවනම නතර වී සිටි රේචල්ගේ ඇඟේ හැප්පුණා. අපි තුන්මං හන්දියකට ඇවිත් තිබුණා. උමඟ නොනැවතී ඉදිරියට ඇදුණා. ඒත් දකුණු පසට පැති උමඟක් විහිදී තිබුණා - ගිනි කඳු පාෂාණයක් තුළට කැපූ රවුම් පතල් වළක්.

"මොකක්ද ඒක?" මම ඇසුවා.

රේචල් අඳුරු උමඟ තුළට ඇස් දල්වා බලා සිටියා. මලානික විදුලි පන්දම් එළියෙන් එයාගේ මුහුණ පෙනුණේ නිකෝගේ අවතාරවලින් එකක් වගෙයි.

"ඒක තියෙන්නෙ ඒ පැත්තෙ ද?" ඇනබෙත් ඇසුවා.

"නෑ," රේචල් කිවුවේ බයෙන් වගෙයි. "කොහෙත්ම නැහැ."

"එහෙනම් අපි නැවතුනේ ඇයි?" මම ඇසුවා.

"අහන්න," නිකෝ කිවුවා.

උමඟ තුළින් සුළං හමන හඬ මට ඇසුණේ හරියට පිටවීම ළඟින් ම තියෙනවා වගෙයි. ඒ වගේම මට නොපැහැදිලි ලෙස හුරු පුරුදු බවක් ගෙනා සුවඳක් දැනුණා - නරක මතකයන් ඇවිස්සූ සුවඳක්.

"යුකැලිප්ටස් ගස්," මම කිවුවා. "කැලිෆෝනියාවේ තිබුණා වගේ."

පහුගිය ශීත සෘතුවේ ටැමල්පයිස් කන්ද මුදුනේ දි අපි ලූක්ට සහ ටයිටන් ඇට්ලස්ට මුහුණ පෑ වෙලාවේ, සුළඟේ තිබුණෙත් මේ සුවඳයි.

"මේ උමඟ කෙළවර මොකක්දෝ නපුරු දෙයක් තියෙනවා," රේචල් කිවුවා. "මොකක් හරි ගොඩක් බලගතු දෙයක්."

"ඒ වගේම මරණයේ ගඳත්," නිකෝ එකතු කළේ, මට දැනෙමින් තිබුණ සතුට තවත් වැඩි කරමින්.

ඇනබෙත් සහ මම බැල්මක් හුවමාරු කරගත්තා.



"ලූක්ගේ දොරටුව," එයා අනුමාන කළා. "ඔත්‍රිස් කන්දට - ටයිටන්ලගෙ මාලිගාවට යන එක."

"මට ඒක සෝදිසි කරලා බලන්න වෙනවා," මම කිවුවා.

"පර්සි, එපා."

"ලූක් මෙතැන ඉන්නවා වෙන්න පුළුවන්," මම කිවුවා. "නැත්නම්... නැත්නම් ක්‍රෝනොස්. එතැන වෙන්නෙ මොනවද කියලා මට හොයලා බලන්න ඕනෑ."

ඇනබෙත් පැකිළුණා. "එහෙනම් අපි ඔක්කොම යමු."

"නෑ," මම කිවුවා. "ඒක ගොඩක් අනතුරුදායකයි. එයාලා නිකෝව අල්ලගත්තොත්, මේ වෙලාවෙදි නම් රේචල්ව වුණත්, උන් එයාලව පාවිච්චි කරයි. ඔයා මෙතැනට වෙලා එයාලව බලාගන්න."

මම නොකියපු දේ තමයි: මම ඇනබෙත් ගැනත් වධ වුණා කියන එක. ආයෙමත් ලූක්ව දැක්කොත් එයා මොනවා කරයි ද කියලා මට විශ්වාසයක් තිබුනේ නැහැ. මීට කලිනුත් බොහෝ වතාවක් ලූක් එයාව රවට්ටගෙන, එයාව මෙහෙයවලා තිබුණා.

"පර්සි, එපා," රේචල් කිවුවා. "තනියම එහෙට යන්න එපා."

"මම ඉක්මනට එන්නම්," මම පොරොන්දු වුණා. "මම මෝඩ වැඩ මොනවත් කරන්න යන්නෑ."

ඇනබෙත් එයාගේ යැන්කීස් කැප් එක සාක්කුවෙන් ගත්තා. "අඩු තරමේ මේකවත් අරන් යන්න. ඒ වගේම පරිස්සම් වෙන්න."

"ස්තුතියි." ඇනබෙත් සහ මම අන්තිම වරට සෙන්ට් හෙලේන්ස් කන්දේ දි දෙපැත්තකට බෙදී ගිය මොහොත මට සිහිවුණා. ඒ වෙලාවේ නම් එයා මට සුබ පතලා හාද්දක් දුන්නා. මේ වතාවේ, මට එයාගෙන් ලැබුණේ මේ තොප්පිය විතරයි.

මම එය පැලඳ ගත්තා. "ඔන්න මම ගියා." ඊට පස්සෙ මම අදෘශ්‍යමානව අඳුරු උමඟට රිංගුවා.

***

පිටවීමට ළඟා වෙන්නත් කලින් මට කටහඬවල් ඇසුණා: මුහුදු රකුසු කම්මල්කාරයින්ගේ, ටෙලිකීන්ලාගේ ගෙරවුම් සහ බිරුම් හඬවල්.

"අඳුරු ගාගේ අපි කලේවත් මෙරගත්තා නේ," එකෙක් කිවුවා. "ඒකට උතුමාණන් අපිට තෑගි දෙයි."

"ඔව්! ඔව්!" තවත් එකෙක් යටිගිරියෙන් හඬගෑවා. "ගණන් කරගන්නත් බැරි තරම් තෑගි ගොඩක්!"

තවත් කටහඬක්, වඩාත් මනුස්ස බවක් ගත් හඬක්, කතා කළා: "අම්, ඔව්, හොඳයි ඒක නම් තියමයි. දැන්, ඔයාලට මගෙන් වැඩක් නැත්නම්-"

"නෑ, අර්ධ-ලෝහිතයෝ!" ටෙලිකීනයෙක් කිවුවා. "පිළිගැන්වීම ලෑස්ති කරන්න තුඹ අපිට උදවු කරන්න ඕනෑ. ඒක ලොකු ගෞරවයක්!"

"ඇත්තට, ස්තුතියි," අර්ධ-ලෝහිතයා කිවුවා. ඒ ඊතන් නකමුරා, මල්ලව පිටියේ දි මම එයාගේ නිවට ජීවිතේ බේරුවාට පස්සෙ පැනලා ගිය හාදයා කියලා මට තේරුම් ගියා.

මම හොරෙන් හොරෙන් උමඟ කෙළවරට ගියා. මම ඉන්නේ අදෘශ්‍යමානවයි කියලා මටම සිහි කර දෙන්න වුණා. එයාලට මාව පෙනෙන්න විදිහක් නැහැ.

මම එළියට යද්දි ම සීතල සුළං දහරාවක් ඇගේ හැපුණා. මම සිටගෙන සිටියේ ටැම් කඳු මුදුනට ආසන්නයෙනුයි. වලාකුළින් බර අහසට යටින්, පැසිෆික් සාගරය අළු පාටින් පැතිරී තිබුණා. කන්දේ අඩි විස්සක් විතර පහළින්, ටෙලිකීනයෝ දෙන්නෙක් ලොකු ගලක් මත මොකක්දෝ තබමින් සිටියා - කළු රෙද්දකින් එතූ සිහින්, දිග දෙයක්. එය විවර කිරීමට ඊතන් උදවු කරමින් සිටියා.

"පරිස්සමෙන්, මෝඩයෝ," ටෙලිකීනයෙක් දොස් කිවුවා. "යන්තං හරි ගෑවුනොත්, මේ තලේ තුඹගෙ ආත්මය ඇඟෙන් වෙන් කරලා ගනී."

ඊතන් බයෙන් කෙළ පොදක් ගිල්ලා. "එහෙනම්, ඔයාලටම මේක දිග අරින්න දුන්නොත් හොඳයි වගේ."

මම කඳු මුදුනට, සිහිනයෙන් මම දුටු ලෙසටම ඉහළ නැගී තිබුණු කළු ගරුඬ බලකොටුව දෙසට බැල්මක් හෙළුවා. එය දකිද්දි මට සිහිවුණේ අඩි පනහක් උස බිත්ති ඇති, ඕනෑවටත් වඩා ලොකු සොහොන් ගැබකුයි. ඒක මෙතැන තියෙන බව මනුෂ්‍යයින්ට නොපෙනෙන්නේ කොහොමද කියලා මට කොහෙත්ම හිතාගන්න



බැරිවුණා. ඒ කොහොම වුණත්, කඳු මුදුනෙන් පහළ වූ දේවල් මටත් බොඳ වෙලා පෙනුණේ හරියට මම සහ කන්දේ පහළ අර්ධය අතරේ ගන තිරයක් දමලා වගෙයි. මෙතැන මායාවක් ක්‍රියාත්මක වෙමින් තිබුණා - වඩාත් බලගතු මීදුමක්. මට ඉහළින්, අහස එකම යෝධ පුනීල හැඩැති වලාවකට සුළි නැගී තිබුණා. මට ඇට්ලස්ව දැකගන්න බැරිවුණත්, අහසේ බර තවමත් දරාගෙන එයා කෙඳිරිගාන හඬ බලකොටුවට එපිටින් ඇසුණා.

"ඕන්න!" ටෙලිකීනයෙක් කිවුවා. එයා භක්තිමත් ලෙස ආයුධය ඔසවද්දි, මගේ ඇගේ ලේ අයිස්වලට හැරුණා.

එතැන තිබුණේ දෑකැත්තක් - අඩ හඳක හැඩයට වක් වූ අඩි හයක් දිග තලයක, ලෙදර් එතූ ලී මිටක් සවි කළ එකක්. එහි තලය වෙනස් පාට දෙකකින් දිස්න දුන්නා - වානේ සහ ලෝකඩ. ක්‍රෝනොස්ගේ ආයුධය වෙලා තිබුනේ ඒකයි. දෙවිවරු ක්‍රෝනොස්ගෙන් ඒක උදුරාගෙන, එයාව පෙති ගසා ටාටරස්වලට විසි කරන්න ඉස්සර, ක්‍රෝනොස් එයාගේම තාත්තා යුරේනස්ව කපා දමන්න පාවිච්චි කළ ආයුධයයි. දැන් ඒ ආයුධය ආයෙමත් හදලා.

"අපි මේක ලේවලින් පිරිසිදු කරන්න ඕනෑ," ටෙලිකීනයෙක් කිවුවා. "ඊට පස්සෙ තුඹට, අර්ධ-ලෝහිතයෝ, උතුමාණන් ඇහැරුණාම මේක පිළිගන්වන්න උදවු කරන්න පුළුවන්."

මගේ හද ගැස්ම කන් තුළ දෙදරනවා දැනෙද්දි මම බලකොටුව දිහාවට දිවුවා. ඒ බිහිසුණු කළු සොහොන් ගැබ කිට්ටුවටවත් යන්න මට ඕනෑ නොවුණත්, මම කළ යුතු දේ දැන සිටියා. ක්‍රෝනොස් අවදි වීම මම නැවැත්විය යුතු වුණා. මට ලැබෙන එකම අවස්ථාව මේක වෙන්න පුළුවන්.

අඳුරු පිවිසුම් මග හරහා දිවූ මම ප්‍රධාන ශාලාවට ඇතුළු වුණා. පොළොව මැහෝගනී ලීයෙන් සෑදූ පියානෝවක් වගේ - තනි කළු, එහෙත් එළියෙන් පිරී දිලිසුණා. බිත්ති දිගේ කළු ගරුඬ ප්‍රතිමා පෙළ ගස්වා තිබුණා. මම ඒවාගේ මුහුණු හැඳිනුවේ නැති වුණත්, මම බලා සිටින්නේ දෙවිවරුන්ට පෙර රජ කළ ටයිටන්වරුන්ගේ රූප දිහා බව මම දැන සිටියා. ශාලාව කෙළවරේ, ලෝකඩ ගිනි අඟුරු බඳුන් දෙකක් මැද, කුඩා වේදිකාවක් තිබුණා. ඒ වේදිකාව මත තිබුණේ රන් මිනී පෙට්ටියයි.

Scanned with CamScanner

ගිත්තේ සටපට හඬ ඇර මුළු ශාලාවම නිහැඬියාවක ගිලී තිබුණා. මුරකරුවෝ නැහැ. කිසිවෙක් නැහැ.

ඒක ඕනෑවටත් වඩා ලේසි වුණා, ඒත් මම වේදිකාව ළඟට ගියා.

මිනී පෙට්ටිය මට මතක තිබුණු විදිහටමයි - අඩි දහයක් විතර දිගයි, මනුස්සයෙකුට නම් ලොකු වැඩියි. එහි පිටතින් මරණයේ සහ විනාශයේ විචිත්‍ර දර්ශන, දෙවිවරුන්ව කරත්තවලට යට කරන අන්දම, දේවස්ථාන සහ ලෝක ප්‍රසිද්ධ ස්මාරක කුඩු කර දමන හා ගිනිබත් කරන දර්ශන කැටයම් කර තිබුණා. මුළු මිනී පෙට්ටියෙන් ම අධික සීතලක් විහිදුණේ, මම අධි ශීතකරණයක් තුළට ඇවිද යනවා වගෙයි. මගේ හුස්ම පවා දුම් නැගෙන්න පටන් ගත්තා.

රිප්ටයිඩ් අතට ගත් මට, කඩුවේ හුරු පුරුදු බර අතට දැනෙද්දි සහනයක් දැනුණා.

මීට කලින් මම ක්‍රෝනොස්ගේ කිට්ටුවට ආ හැම වතාවක ම, එයාගේ දුෂ්ට හඬ මගේ හිත ඇතුළේ කතා කරා. දැන් එයා නිශ්ශබ්ද ඇයි? එයාව, එයාගේම දෑකැත්තෙන් කපා, හීනි තීරු දහස් ගාණකට ඉරා දමලයි තියෙන්නේ. මම ඒ පෙට්ටියේ පියන ඇරියොත් මට මොනවා හොයාගන්න ලැබෙයි ද? එයාලා එයාට අලුත් සිරුරක් හැදුවේ කොහොමද?

ඒ ප්‍රශ්නවලට මට උත්තර තිබුනේ නැහැ. මම දැන සිටියේ එයා නැගිටින්න සූදානම් බවත්, එයාට එයාගේ දෑකැත්ත ලැබෙන්න කලින් මම එයාව විනාශ කළ යුතු බවත් විතරයි. එයාව නවත්තන්න ක්‍රමයක් හොයාගන්න මට ඕනෑ වුණා, මම මිනී පෙට්ටිය ළඟ සිටගත්තා. පෙට්ටියේ පැතිවලටත් වඩා සංකීර්ණ ලෙස එහි පියන සරසා තිබුණා - ඒ මනුෂ්‍ය සංහාරවල සහ බලයේ දර්ශනවලින්. එය මැද කැටයම් කර තිබුණු වාක්‍යයේ අකුරු ග්‍රීකවලටත් වඩා පැරණි මායාවේ භාෂාවක ඒවායි. මට එය හරියටම කියවා ගන්න බැරිවුණත්, එයින් කියවුණ දේ මම දැන සිටියා: *ක්‍රෝනොස්, කාලයට අධිපති.*

මගේ අත පියන ස්පර්ශ කළා. මගේ ඇඟිලි තුඩු නිල් පාටට හැරුණා. මගේ කඩුව මත තුහින බැඳුණා.

ඒත් එක්කම මට පිටුපසින් කෝලාහලයක් ඇසුණා - ඉදිරියට එන අයගේ කටහඬවල්. මේක දැන් නොකළොත් ආයේ කවදාවත්



බැහැ. මම පෙට්ටියේ රන් පියන පැත්තකට තල්ලු කරද්දි එය මහා තඩි! හඬක් නගමින් බිම වැටුණා.

මම පහර දෙන්න සූදානමින් කඩුව එසෙව්වා. ඒත් ඇතුළ බැලුවා ම, මම දකිමින් සිටි දේ තේරුම් ගන්න මට බැරිවුණා. අළු පාට කලිසමකින් සැරසුණ මනුෂ්‍ය දෙපා. සුදු පාට ටී-ෂර්ට් එකක්, බඩ මත බැඳගත් දෑත්. එයාගේ පපුවේ එක කැබැල්ලක් අඩු වුණා - එයාගේ හදවත තිබිය යුතු තැන, උණ්ඩයකින් වූ තුවාලයක් තරමේ පිරිසිදු කළු සිදුරක්. එයාගේ දෑස් වැසී තිබුණා. එයාගේ හම පාණ්ඩු පාට ගත්තා. එයාගේ වැලි පාට කොණ්ඩය... ඒ වගේම එයාගේ වම් කම්මුල දිගේ පහළට ඇදී තිබුණු තුවාල කැළැල.

මිනී පෙට්ටියේ තිබුණේ ලූක්ගේ සිරුරයි.

***

මට තිබුණේ ඒ වෙලාවේ ම එයාට අනින්නයි. මට තිබුණේ මගේ උපරිම ශක්තිය යොදා රිප්ටයිඩ්ගේ තුඩ බස්සවන්නයි.

ඒත් මම හිටියේ හොඳටෝම තිගැස්සිලයි. මට කිසිවක් තේරුම් ගන්න බැරිවුණා. මම ලූක්ට කොයි තරම් වෛර කළා වුණත්, එයා මට කොයි තරම් ද්‍රෝහිකම් කළා වුණත්, එයා මිනී පෙට්ටියේ සිටි හේතුව මට තේරුම් ගන්න බැරිවුණා. ඒ වගේම එයාට ඒ තරම් මළගිය පෙනුමක් තිබුණේ ඇයි කියලත්.

ඒත් එක්කම ටෙලිකීන්ලාගේ හඬවල් මට හරියටම පිටුපසින් ඇහෙන්න ගත්තා.

"මොනවද වෙලා තියෙන්නේ!" පියන දැකපු හැටියේ එක රාක්ෂයෙක් බෙරිහන් දුන්නා. එයාලා ළඟට එද්දිම මම පැකිළෙන කකුල්වලින් වේදිකාවෙන් ඉවත් වී, කුලුනක් පිටුපස සැඟවුණේ මම අදෘශ්‍යමාන බවත් අමතක වෙලයි.

"පරිස්සමෙන්!" අනෙක් රාක්ෂයා අවවාද කළා. "බාගදා එතුමා සෙලවෙන්න ඇති. අපි දැන් තෑගි පිළිගන්වන්න ඕනෑ. ඉක්මනටම!"

කකුල් අද්දවමින් ඉදිරියට ආ ටෙලිකීන්ලා දෙන්නා දණගසාගෙන, රෙද්දක එතූ දෑකැත්ත ඉදිරියට දිගු කළා. "මගේ උතුමාණෙනි," එකෙක් කිවුවා. "ඔබතුමාගේ බලයේ සංකේතය නැවත සෑදුවා."

නිශ්ශබ්දතාවයක්. මිනී පෙට්ටිය තුළ කිසිවක් සිදු වුනේ නැහැ.

Scanned with CamScanner

"මෝඩයා," අනෙක් ටෙලිකීනයා කෙඳිරුවා. "එතුමාට මුලින් ම ඕනෑ කරන්නෙ අර්ධ-ලෝහිතයාව."

ඊතන් අඩියක් පස්සට ගියා. "හෝව්, ඔයාලා මොකක්ද කිවුවේ, එයාට මාව ඕනෑ කරනවා?"

"බයගුල්ලෙක් වෙන්නෙපා!" පළවෙනි ටෙලිකීනයා පිම්බා. "එතුමාට නුඹේ මරණය ඕනෑ නැහැ. නුඹේ පක්ෂපාතීකම විතරයි ඕනෑ. එතුමාට සේවය කරන්න පොරොන්දු වෙනවා. දෙවිවරු එක්ක ඇති සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කරනවා. එච්චරයි ඕනෑ."

"එපා!" මම මොර දුන්නා. ඒක මෝඩ වැඩක් වුණත්, මම ශාලාව මැදට කඩා පැනලා කැප් එක ගැලෙව්වා. "ඊතන්, එපා!"

"හොරෙන් ඇතුළට ආව එකෙක්!" ටෙලිකීනයා උන්ගේ සීල් දත් විලිස්සුවා. "උතුමාණන් ඉක්මනින් ම නුඹ එක්ක ගනුදෙනුව බලාග නී. ඉක්මන් කරනවා, කොල්ලෝ!"

"ඊතන්," මම බැගෑපත් වුණා, "උන් කියන ඒවා අහන්නෙපා. ඒක විනාශ කරන්න මට උදවු කරන්න."

ඊතන් මගේ පැත්තට හැරුණා. එයාගේ ඇහැ වසා තිබුණු රෙදි කැබැල්ල එයාගේ මුහුණේ සෙවණැලි සමග මිශ්‍ර වී පෙනුණා. එයාගේ මුහුණෙන් පළ වුණේ අනුකම්පාවක් වගේ හැඟීමක්. "මාව බේරගන්න එපා කියලා මම ඔයාට කිවුවා නේ, පර්සි. 'ඇහැට ඇහැක්.' ඔයා ඒ කියමන කවදා හරි අහලා තියෙනව ද? මම ඒකෙ තේරුම අමාරු පාරෙන් ඉගෙන ගත්තා - මගේ දෙමව්පියන්ගෙන් දේව පාර්ශවය ගැන හොයාගත්තට පස්සෙ. මම තමයි නෙමෙසිස්ගේ දරුවා. පළිගැනීමට අධිපති දේවතාවියගේ. ඒ වගේම මම හැදිලා තියෙන්නේ මේකට තමයි."

එයා වේදිකාව වෙතට හැරුණා. "මම දෙවිවරු සමග ඇති සම්බන්ධය ප්‍රතික්ෂේප කරනවා! එයාලා මං වෙනුවෙන් මොනවද කරලා තියෙන්නේ? එයාලා විනාශ වෙන හැටි මට දකින්න ලැබෙයි. මම ක්‍රෝනොස්ට සේවය කරන්න කැප වෙනවා."

ගොඩනැගිල්ල දෙදුරුවා. ඊතන් නකමුරාගේ දෙපා මුල පොළොවෙන් නිල් පාට ආලෝක කඳක් ඉහළ නැග්ගා. එය මිනී පෙට්ටිය වෙතට පාවී ගොස් දිලිසෙන්න ගත්තේ, තනිකරම බලශක්තියෙන් සෑදුණ වලාවක් වගෙයි. ඉන්පසුව එය මිනී පෙට්ටියට පහත් වුණා.



ලූක් වේගයෙන් කෙලින් වී වාඩිවුණා. එයාගේ ඇස් ඇරුණා. තව දුරටත් ඒ ඇස් නිල් පාට වුනේ නැහැ. ඒවා මිනී පෙට්ටිය වගේම රන් පාට වුණා. එයාගේ පපුවේ වූ සිදුර නැතිවෙලා. එයාව සම්පූර්ණ වෙලා. එයා ලේසියෙන් ම මිනී පෙට්ටියෙන් පිටට පැන්නා. එයාගේ දෙපා බිම වැටුණු තැන, කිරි ගරුඬ පොළොව අයිස් කුට්ටියක් වගේ මිදුණා.

එයා අර බිහිසුණු රන් ඇස්වලින් ඊතන් සහ ටෙලිකීන්ලා දිහා බැලුවේ, අලුත ඉපදුණු බබෙක් වගේ දකිමින් සිටි දේ ගැන විශ්වාසයක් නැතුවයි. ඊට පස්සෙ එයා මගේ දිහා බැලුවා, ඒත් එක්කම මාව හඳුනා ගත් බව අඟවන හිනාවක් එයාගේ තොල් මත ඇඳුණා.

"මේ සිරුර හොඳින් සූදානම් කරලා තියෙනවා." එයාගේ කටහඬ මගේ හම මත දැළි පිහි තලයක් අදිනවා වගෙයි දැනුණේ. එය ලූක්ගේ තමයි, ඒත් ලූක්ගේ නෙවෙයි. එයාගේ කටහඬට යටින් තවත් කටහඬක්, වඩාත් බිහිසුණු හඬක් තිබුණා - හරියට ගලක් මත ලෝහයක් අතුල්ලනවා වගේ පෞරාණික, කෲර හඬක්. "නුඹට එහෙම හිතෙන්නෙ නැද්ද, පර්සි ජැක්සන්?"

මට සෙලවෙන්න බැරිවුණා. මට උත්තර දෙන්නත් බැරිවුණා.

හිස පිටුපසට ගැස්සූ ක්‍රෝනොස් මහ හඬින් හිනාවුණා. එයාගේ මුහුණ මත වූ තුවාල කැළැල රැළි නැගුණා.

"ලූක් නුඹට බය වුණා," ටයිටන්ගේ හඬ කිවුවා. "එයාගේ ඉරිසියාවයි, වෛරයයි බලගතු ආයුධ වුණා. එයාව කීකරු කරලා තියාගත්තෙ ඒකෙන්. ඒකට මම නුඹට ස්තුති කරනවා."

ඊතන් භීතියෙන් බිමට ඇද වැටුණා. එයා දෑතින් මුහුණ වසාගත්තා. දෑකැත්ත ඔසවාගෙන සිටි ටෙලිකීන්ලා වෙවුලුවා.

අන්තිමේ දි මම මගේ ධෛර්යය මතු කරගත්තා. ඉස්සර-ලූක්ගේ ඇඟට පැන්න මම මගේ කඩු තලයෙන් එයාගේ පපුවට වැර දමා ඇන්නා, ඒත් එයාගේ හම මගේ පහර ඉවතට හැරවූවේ එය තනි වානේවලින් හැදුණු එකක් වගෙයි. එයා සරදම් බැල්මෙන් මගේ දිහා බැලුවා. ඊට පස්සෙ එයා අතක් ගසද්දි, මාව ශාලාව හරහා විසි වී ගියා.

මාව කුලුනක තදින් වැදුණා. මගේ ඔළුව වටේ කැරකෙන තරු පළවා හරින්න තදින් ඇහි පිය ගසමින් මම දෙපයින් නැගිට්ටින්න

Scanned with CamScanner

දඟලුවා. ඒත් ඒ වෙද්දි ක්‍රෝනොස් එයාගේ දෑකැත්තේ මිට අල්ලගෙන ඉවරයි.

"අන්... ගොවක් හොඳයි," එයා කිවුවා. "ලූක් ඒකට කිවුවේ බැක්බයිටර් කියලා. ගැළපෙන නමක්. දන් ඒක සම්පූර්ණයෙන් ම හදලා ඉවර නිසා, ඒකට ආයෙමත් හපාකන්න ඉඩ දෙන්න ඕනෑ."

"ඔහේ ලූක්ට මොනවද කළේ?" මම කෙඳිරිගෑවා.

ක්‍රෝනොස් එයාගේ දෑකැත්ත එසෙව්වා. "මට ඕනෑ කරපු විදිහටම, එයා එයාගේ මුළු ජීවයෙන් ම මට සේවය කරනවා. වෙනසකට තියෙන්නෙ, එයා නුඹට බයයි, පර්සි ජැක්සන්. මම එහෙම නැහැ."

මම දුවන්න ගත්තේ ඒ වෙලාවෙයි. මම ඒක කරන්න හිත හිතා හිටියේ නැහැ. මගේ හිතේ කිසිම විවාදයක් තිබුනේ නැහැ - මෙ, මම එයාට විරුද්ධව නැගිටලා ආපහු සටන් කරන්න බැලුවොත් හොඳ නැද්ද? නැහැ, මම නිකංම දිවුවා විතරයි.

ඒත් මගේ කකුල් ඊයම් බරුවලට හැරිලා වගෙයි දැනුණේ. මගේ වටා කාලය මන්දගාමී වුණේ හරියට ලෝකයම ජෙලි කුට්ටියකට හැරෙනවා වගෙයි. මේ හැඟීම මීට කලිනුත් මට දැනිලා තිබුණා, ඒ වගේම ඒක ක්‍රෝනොස්ගේ බලය කියලත් මම දැන සිටියා. එයාගේ පැවැත්ම කොයි තරම් ශක්තිමත් වුණා ද කියනවා නම් එයාට කාලය පවා යටත් කරගන්න හැකි වුණා.

"දුවපන්, පුංචි වීරයෝ," එයා හිනාවුණා. "දුවපන්!"

ආපස්සට බැල්මක් හෙළූ මට දකින්න ලැබුණේ ආයෙමත් දැත් පාවිච්චි කරන්න ලැබුණු හැඟීම විඳිනවා වගේ දෑකැත්ත පද්දමින්, ක්‍රෝනොස් තිවාඩු පාඩුවේ මගේ දිහාවට ළං වෙන හැටියි. මේ ලෝකෙ ඇති කිසිම ආයුධයකට එයාව නවත්වන්න බැහැ, කොයි තරම් දිව්‍යමය ලෝකඩ ගෙනාවත් බැහැ.

"පර්සි!" එයා අඩි දහයක් දුරින් ඉන්නකොට මට ඇහුණා.

ඒ රේචල්ගේ හඬයි.

මාව පසු කරගෙන යමක් පියඹා ගියා. ඒත් එක්කම නිල් පාට ප්ලාස්ටික් පනාවක් ක්‍රෝනොස්ගේ ඇහේ වැදුණා.

"ඌයි!" එයා මොර ගැසුවා. එක මොහොතකට එය පුදුමයෙන් හා වේදනාවෙන් පිරුණු ලූක්ගේ හඬ විතරක් වුණා. මගේ



ගාත් නිදහස් වුණා. මම කෙලින්ම දිවුවේ ශාලාවේ දොරටුව ළඟ සිටගෙන, ත්‍රාසයෙන් පිරී ඇස්වලින් බලා සිටි රේචල්, නිකෝ සහ ඇනබෙත් වෙතටයි.

"ලූක්?" ඇනබෙත් කතා කළා. "මොනවද-"

මම එයාගේ කමිසයෙන් අල්ලාගෙන ඇදගෙන ගියා. මීට කලින් කවදාවත් දුවලා නැති තරම් වේගයෙන් මම කෙලින් ම දිවුවේ බලකොටුවෙන් එළියටයි. අපි වංගගිරි දොරටුවට කිට්ටු වෙද්දිම මට ලෝකෙ ලොකුම ගර්ජනාව ඇහුණා - නැවතත් පාලනය ලබා ගනිමින් සිටි ක්‍රෝනොස්ගේ හඬ. "උන් පස්සෙන් පලයල්ලා!"

"නෑ!" නිකෝ මොර දුන්නා. එයා අත්පුඩියක් ගසද්දි, රෝද-දහඅටේ වාහනයක් තරමේ කොත් ගලක් බලකොටුව ඉදිරියේ පොළොව දෙබෑ කරගෙන උඩට මතුවුණා. එයින් ඇති වූ කම්පනයේ බලයට ගොඩනැගිල්ලේ ඉදිරි කුලුනු සියල්ල කඩා වැටුණා. එය ඇතුළේ හිරවුණ වෙලිකින්ලා බෙරිහන් දෙන හඬවල් මට ඇහුණා. දූවිලි සෑම අතම විසිරුණා.

වංගගිරියට කඩා වැදුණු අපි නොනැවතී දුවද්දි, ටයිටන් රජාගේ උඩු බිරුමට අපිට පිටුපසින් ලෝකයම සෙලවුණා.

# 17

# නැති වූ දෙවියා කතා කළා

අපි හති වැටෙන තුරු ම දිවුවා. රේචල් අපිව උගුල්වලින් ඉවතට අරගෙන ගියත්, ගමනාන්තයක් ගැන අපේ හිත්වල තිබුනේ නැහැ - තිබුණේ අර අඳුරු කන්දෙන් සහ ක්‍රෝනොස්ගේ ගර්ජනාවෙන් ඈතට යන්න උවමනාව විතරයි.

සොභාවික ගුහාවක් වගේ තෙත සුදු ගලින් සෑදුණු උමඟක අපි නතර වුණා. අපිට පිටුපසින් කිසිවක් ඇහෙන්න නැති වුණත් මට ආරක්ෂිත බවක් නම් දැනුනේ නැහැ. ලූක්ගේ මුහුණෙන් පිටට පනින්න වගේ මගේ දිහා බලා සිටි අර අස්වාභාවික රන් ඇස් මතක් වෙද්දි, තවමත් මගේ අත පය හෙමින් ගල් ගැහෙනවා වගෙයි මට දැනුණේ.

"මට තවත් නම් යන්න බැහැ," රේචල් පපුව අල්ලගෙන හති දැමුවා.

අපි දුවගෙන ආව මේ කාලය පුරාවටම ඇනබෙත් සිටියේ අඬමිනුයි. දැන් බිමට ඇද වැටුණු එයා දණහිස් අතරේ මුහුණ සඟවා ගත්තා. එයාගේ ඉකිබිඳුම් උමඟේ දෝංකාර දුන්නා. නිකෝයි මමයි එක ළඟින් වාඩිවුණා. මගේ කඩුව ළඟට එයාගේ කඩුව දැමූ නිකෝ සැලෙන හුස්මක් ගත්තා.

"ඒක නම් මළ මඟුලක්," එයා කියද්දි, ඒ කතාව සහතික ඇත්ත කියලා මට හිතුණා.

"ඔයා අපේ ජීවිත බේරුවා," මම කිවුවා.



නිකෝ මූහුණේ දූවිලි පිසගත්තා. "මාවත් එතැනට ඇදගෙන ගියාට ගැනු ළමයින්ට තමයි බනින්න ඕනෑ. එයාලා දෙන්නට එකඟ වෙන්න පුළුවන් වුණේ ඒ ගැන විතරයි. අපි ඔයාට උදවු කරන්න ඕනෑ, නැත්නම් ඔයා ඔක්කොම අනාගනියි කියලා."

"එයාලා මාව එච්චර විශ්වාස කරපු එක කොච්චර හොඳද," මම ගුහාව තුළට විදුලි පන්දම දල්වා බැලුවා. හෙමින් හෙමින් ඇද හැලෙන වැස්සක් වගේ හිරි ලඹවලින් වතුර බිංදු වැස්සුණා. "නිකෝ... ඔයා, අහ්. ඔයාගේ සැබෑ ස්වරූපෙ පෙන්නුවා."

"ඇයි ඔයා එහෙම කියන්නෙ?"

"අර කළු ගල් බිත්තිය? ඒක නම් මරේ මරු. ඔයා කවුද කියලා ක්‍රෝනොස් මීට කලින් දැනගෙන හිටියෙ නැත්නම්, දැන් එයා දන්නවා - පාතාල ලෝකයේ දරුවෙක්."

නිකෝ රවා බැලුවා. "හරි වැඩේ."

මම ඒ කතාව අත ඇරියා. එයා හිතේ තිබුණු බය හංගන්න උත්සහ කරන බව මට තේරුණා. ඉතින් එයාට දොස් කියන්න මට පුළුවන්කමක් තිබුනේ නැහැ.

ඇනබෙත් ඔළුව ඔසවා බැලුවා. එයාගේ ඇස් අඬලා ම රතුවෙලා. "මොනවද... මොනවද ලූක්ට වෙලා තියෙන්නෙ? උන් එයාට මොනවද කරලා තියෙන්නේ?"

මිනී පෙට්ටිය ඇතුළේ මට දකින්න ලැබුණු දේ ගැනත්, ඊතන් නකමුරා සේවය කරන්න පොරොන්දු දුන් මොහොතේ ක්‍රෝනොස්ගේ ආත්මයේ අන්තිම කොටසත් ලූක්ගේ සිරුරට ඇතුළ් වූ හැටිත් මම එයාට කිවුවා.

"නෑ," ඇනබෙත් කිවුවා. "ඒක ඇත්ත වෙන්න බැහැ. එයාට බැහැ-"

"එයා එයාව ක්‍රෝනොස්ට කැප කරලා," මම කිවුවා. "මට කණගාටුයි, ඇනබෙත්. ඒත් ලූක් කියලා කෙනෙක් දැන් නැහැ."

"නෑ!" එයා තදින් කියා සිටියා. "රේචල් එයාට ගහපු වෙලාවේ ඔයා දැක්කා නේද."

මම ගරු සැලකිල්ලෙන් රේචල් දිහා බලමින් ඔළුව වැනුවා. "ඔයා ටයිටන් රජාගේ ඇහැට ප්ලාස්ටික් පනාවකින් ගැහුවා."

රේචල්ට එයින් ලැජ්ජා හිතිලා වගෙයි. "මගේ ළඟ තිබුණේ ඒක විතරයි."

"ඒත් ඔයා දක්කා," ඇනබෙත් ආයෙමත් කිව්වා. "ඒක එයාගේ වැදුණු වෙලාවේ, ඒක තත්පරේකට, එයාට සිහිය ආවා. එයාට ආයෙමත් හැඟීම් දැනීම් ලැබුණා."

"එහෙනම් සමහරවිට ක්‍රෝනොස් සම්පූර්ණයෙන් ම ඇඟ ඇතුළට හයිවෙලා නැතුව ඇති," මම කිව්වා. "පාලනය තියෙන්නෙ ලූක් අතේ කියලා ඒකෙන් කියන්න බැහැ නේ."

"ඔයාට ඕනෑ එයා දුෂ්ටයෙක් වෙනවා දකින්න, එහෙම නේද?" ඇනබෙත් මොර දුන්නා. "ඔයා ඉස්සර එයාව දැනගෙන හිටියේ නැහැ, පර්සි. මමයි දැනගෙන හිටියේ!"

"ඔයාට මොකද වෙලා තියෙන්නේ?" මම කඩා පැන්නා. "ඔයා මොකටද දිගින් දිගටම එයාගේ පැත්ත ගන්නේ."

"හෝව්, හෝව්, ඔය දෙන්නා," රේචල් කිව්වා. "ඕක නතර කරගන්නකෝ!"

ඇනබෙත් එයා දිහාවට හැරුණා. "මේක මැදට පනින්නැතුව ඉන්නවා, මනුස්ස කෙල්ලේ! ඔයා නොහිටින්න..."

එයා කියන්න හැදුවේ මොකක් වුණත්, එයාගේ හඬ මැදින් බිඳුණා. ඔළුව පහත් කරගත් එයා හොඳටෝම ඇඬුවා. මට එයාව සනසන්න ඕනෑ වුණත්, ඒක කොහොම කරන්න ද මම දැන සිටියේ නැහැ. මට තවමත් තිගැස්සුමක් දැනෙමින් තිබුණේ, හරියට ක්‍රෝනොස්ගේ කාලය-මන්දගාමී කිරීම මගේ මොළයට බලපෑම් කරලා වගෙයි. මට දකින්න ලැබුණු දේ තේරුම් ගන්න මට කොහෙත්ම බැරිවුණා. ක්‍රෝනොස් ජීවතුන් අතර සිටියා. එයා ආයුධ සන්නද්ධව සිටියා. ඒ වගේම පෙනුණු හැටියට ලෝක විනාශය අත ළඟටම ඇවිත් තිබුණා.

"අපි දිගටම යන්න ඕනෑ," නිකෝ කිව්වා. "එයා අපි පස්සෙ රාක්ෂයෝ එවයි."

කවුරුවත් දුවන්න පුළුවන් තත්ත්වයක සිටියේ නැති වුණත්, නිකෝ කිව්වා හරි. අමාරුවෙන් සිටගත් මම රේචල්ට නැගිටින්න උදව් කළා.

"ඔයා [illegible] වැඩක් කළේ," මම එයාට කිව්වා.



එයාගේ මුහුණේ දුබල හිනාවක් මතු වුණා. "මචං, හොඳයි. ඔයාට මැරෙන්න දෙන්න මට ඕනෑ වුනේ නැහැ." එයාගේ කම්මුල් රතු වුණා. "මං කිව්වේ... මොකද මේ, ඔයා දන්නවා නේ. ඔයා මට ගොඩක් දේවල් ණයයි නේ. ඔයා මැරුණොත් මම කොහොමද ඒවා ආපහු ගන්නේ?"

මම ඇනබෙත් ළඟ දණ ගසාගත්තා. "හේයි, මට සමා වෙන්න. අපි දුන් යන්න ඕනෑ."

"මං දන්නවා," එයා කිව්වා. "මම... මම හොඳින්."

පැහැදිලිව ම එයා හිටියේ හොඳින් නෙවෙයි. ඒ කොහොම වුණත් එයා නැගිට්ටා, ඊට පස්සෙ අපි ආයෙමත් වංගගිරිය හරහා අයාලේ යන්න පටන් ගත්තා.

"ආපහු නිව්යෝක්වලට," මම කිව්වා. "රේචල්, ඔයාට පුළුවන් ද-"

මම හිටිවනම ගල් ගැහුණා. අපිට අඩි කීපයකට ඉදිරියෙන්, බිම වැටී, පැඟුණු රතු පාට රෙදි කඩකට මගේ විදුලි පන්දම් එළිය යොමු වී තිබුණා. ඒක රස්ටා කැප් එකක්: ග්‍රෝවර් හැම වෙලාවෙම පැලඳගෙන හිටපු එක.

***

කැප් එක අහුලා ගනිද්දි මගේ අත වෙව්ලුවා. ඒක පෙනුණේ මඩ වැකුණු යෝධ බූට් එකකට පෑගිලා වගෙයි. අද දවසේ මට මුහුණ දෙන්න වුණු හැමදේකට ම පස්සේ, ග්‍රෝවර්ටත් මොනවාහරි වෙලා ද කියන සිතුවිල්ල දරාගන්න මට පුළුවන්කමක් නැහැ.

ඒ වෙලාවේ තවත් දෙයකට මගේ අවධානය යොමු වුණා. ගුහාවේ පොළොව හිරි ලඹවලින් වැටුණු වතුරෙන් තෙමී ගොහොරු වී තිබුණා. එහි ටයිසන්ගේ වගේ ලොකු පා සටහන් සහ පොඩි ඒවා - එළු කුරවලින් වැදුණු ඒවා - වම් පැත්තට ගමන් කර තිබුණා.

"අපිට ඒවා දිගේ යන්න වෙනවා," මම කිව්වා. "එයාලා ගිහින් තියෙන්නේ ඒ පැත්තට. ඒ ළඟකදි වෙන්න ඕනෑ."

"එතකොට අර්ධ-ලෝහිත කඳවුර?" නිකෝ ඇසුවා. "ඒකට වෙලාවක් නැහැ නේ."

"අපි එයාලව හොයාගන්න ඕනා," ඇනබෙත් තදින් කියා සිටියා. "එයාලා අපේ යාළුවෝ."

ග්‍රෝවර්ගේ පොඩිවුණු කැප් එක අතට ගත් එයා ඉදිරියට යන්න ගත්තා.

මම එයා පසුපස ගියේ නරකම දෙයකට මුහුණ දෙන්න හිත දඩි කරගෙනයි. ඒ උමග අතුරුවලින් පිරුණු, විශ්වාස කළ නොහැකි තැනක් වගේ වුණා. අසාමාන්‍ය කෝණවලට ඇල වී තිබුණු එය දිය සීරාව නිසා ලිස්සනසුලු වුණා. ගමනෙන් බාගයක් විතර අපි ඇවිදගෙන යනවට වඩා කළේ ලිස්සමින්, රූටාගෙන යන එකයි.

අන්තිමේ දී බෑවුම පතුලට ගිය අපිට හොයාගන්න ලැබුණේ ගොඩ හිරි ලම කුලුනු ඇති විශාල ගුහාවක්. ගුහාව මැදින් භූගත ගඟක් ගලා ගියා. ග්‍රෝවර්ව ඔඩොක්කුවේ තබාගෙන ටයිසන් ගං ඉවුරේ වාඩි වී සිටියා. ග්‍රෝවර්ගේ ඇස් පියවී තිබුණා. එයා සෙලවුනේවත් නැහැ.

"ටයිසන්!" මම මොර ගැසුවා.

"පර්සි! ඉක්මනට එන්නකෝ!"

අපි එයා වෙතට දිවුවා. දෙවිවරුන්ට ස්තුති වේවා, ග්‍රෝවර් මැරිලා නැහැ. ඒත් එයාගේ මුළු ඇඟම වෙවුලුවේ හරියට එයා සීතලෙන් මැරෙන්න යන්න වගෙයි.

"මොකද වුණේ?" මම ඇසුවා.

"නොයෙක් දේවල්," ටයිසන් මිමිණුවා. "ලොකු නයෙක්. ලොකු බල්ලෝ. කඩු ගත්ත මිනිස්සු. ඒත් ඊට පස්සේ... අපි මෙතෙට ළං වුණා. ග්‍රෝවර් කලබල වුණා. එයා දිවුවා. ඊට පස්සෙ අපි මේ කාමරේට ආවම, එයා වැටුණා. මේ විදිහට."

"එයා මොනවද හරි කිවුව ද?" මම ඇසුවා.

"එයා කිවුවා, 'අපි ළඟයි' කියලා. ඊට පස්සෙ එයාගේ ඔළුව ගලේ හප්ප ගත්තා."

මම එයා ළඟ දණ ගසාගත්තා. මීට කලින් ග්‍රෝවර් මේ විදිහට සිහි නැතුව ඉන්නවා මට දකින්න ලැබුණේ නිව් මෙක්සිකෝවලදී, එයාට පෑන්ගේ බලය දැනුණු වෙලාවේ විතරයි.

මම මගේ විදුලි පන්දම් එළිය ගුහාව වටේට යොමු කර බැලුවා. එහි එහා කෙළවරේ තවත් ගුහා කටක් තිබුණා. එය දෙපස දියමන්ති



වගේ ගෝට පළිඟු කුලුනු පෙළගැසී තිබුණා. ඒ ගුහා කටට එපිටින් තිබුණේ...

"ග්‍රෝවර්," මම කතා කළා. "නැගිටින්න."

"අන්න්න්."

එයා ළඟ දණ ගසාගත් ඇනබෙත් අයිස් වගේ සීතල ගඟේ වතුර මූණට ඉස්සා.

එයා ඇහි පිය ගැසුවා. "පර්සි? ඇනබෙත්? කොහෙද..."

"ඔක්කොම හරි," මම කිවුවා. "ඔයාට සිහිය නැතිවුණා. ඔයාට ඒ බලය දරාගන්න බැරිවුණා."

"මට- මට මතකයි. පෑන්."

"ඔව්," මම කිවුවා. "මොකක් හරි බලගතු දෙයක් අර දොරෙන් එහා පැත්තෙ තියෙනවා."

***

මම ඉක්මන් හඳුන්වා දීමක් කළේ, ටයිසන්ටයි ග්‍රෝවර්ටයි මීට කලින් රේචල්ව මුණගැහිලා නැති නිසයි. රේචල් ලස්සනයි කියලා ටයිසන් කිවුවා ම, ඇනබෙත්ගේ නාස් පුඩු පිම්බුණේ හරියට එයා ගිනි පිඹින්න යනවා වගෙයි.

"කොහොම වුණත් කමක් නෑ," මම කිවුවා. "කෝ එන්න, ග්‍රෝවර්. ඇඟට හේත්තු වෙන්න."

ඇනබෙත් සහ මම එයාට නැගිටින්න උදවු කළා. ඊට පස්සෙ අපි හැමෝම භූගත ගඟට බැස්සා. වතුර පහර තැඩ වුණා. වතුර මට්ටම අපේ ඉණ උසට තිබුණා. මම නොතෙමී ඉන්න අධිෂ්ඨාන කරගත්තා. ඒ පුංචි හැකියාව මට සැහෙන ප්‍රයෝජනවත් වුණත්, එයින් අනෙක් අයට උදවුවක් වුනේ නැහැ. ඒ වගේම නොතෙමී සිටියත් මට සීතල දැනුණා. ඒක හරියට හිම ගොඩක එරෙමින් යනවා වගෙයි.

"මං හිතන්නෙ අපි ඉන්නවා ඇත්තෙ කාර්ල්ස්බඩ් ගුහාවල," ඇනබෙත් කටකට ගා ගැහෙන දත් අතරින් කිවුවා. "සමහරවිට ගවේෂණය කරලා නැති කොටසක වෙන්න ඇති."

"ඔයා කොහොමද දන්නෙ?"

"කාර්ල්ස්බඩ් තියෙන්නෙ නිව් මෙක්සිකෝවල," එයා කිවුවා. "ගිය ශීත කාලේ වුණ දේ ඒකෙන් පැහැදිලි වෙනවා."

Scanned with CamScanner

මම ඔළුව වැනුවා. අපි නිව් මෙක්සිකෝ හරහා යද්දිත් ග්‍රෝවර්ට සිහිය නැතිවුණා. පෑන්ගේ බලයට වඩාත්ම සමීප බවක් එයාට දැනිලා තිබුණේ එහෙදියි.

වතුරෙන් ගොඩවුණු අපි ඉදිරියට ම ගියා. පළිඟු කුලුනු වඩ වඩාත් ළං වෙද්දි, එහා කාමරයෙන් පිටවෙන බලය මට දැනෙන්න ගත්තා. මීට කලිනුත් මම දෙව්වරු කිට්ටුවට ගිහින් තිබුණා වුණත්, මේක ඊට වඩා වෙනස්. ජීවමාන බල ශක්තියකින් මගේ හම පොපියන්න ගත්තා. මගේ විඩාව දුරු වී ගියේ මට මේ දැන් සුවබර රාත්‍රී නින්දක් ලැබුණා වගෙයි. මම වඩාත් ශක්තිමත්ව වැඩෙනවා මට දැනුණේ හරියට පැළෑටියක් වර්ධනය වෙන ආකාරය කාලය-වේගවත්-කළ වීඩියෝ පටියකින් පෙන්වනවා වගෙයි. ගුහාව තුළින් හමා ආ සුවඳ පොළොව යට තෙත ගොහොරු තැනකින් හමන ගඳට කොහෙත්ම සමාන වුනේ නැහැ. එහි තිබුණේ උණුසුම් ගිම්හාන දවසක ගස් සහ මල්වල සුවඳක්.

ග්‍රෝවර් උද්‍යෝගයෙන් කෙඳිරියක් පිටකළා. පුදුමයෙන් තිගැස්සී සිටි මට ඇවිදගන්නත් බැරිවුණා. නිකෝ පවා සිටියේ ගොළු වෙලයි. අපි ගුහාව තුළට අඩිය තැබුවා. "ඔහ්, වාව්." රේචල්ට කියවුණා.

ගුහා බිත්ති පළිඟුවලින් දිලිසුණා - රතු, කොළ සහ නිල් පාටින්. නොපුරුදු එළියක් මැද ලස්සන පැළ වර්ග වැවී තිබුණා - යෝධ උඩවැඩියා වර්ග, තරු හැඩැති මල්, පළිඟු අතරින් වැවුණු වැල් බර වූ තැඹිලි සහ දම් පාට බෙරි වර්ග. ගුහා බිම කොළ පාට පාසිවලින් වැසී තිබුණා. ඉහළින්, දෙව් මැඳුරකටත් වඩා උස් වූ සිවිලිම තරු පිරි මන්දාකිණියක් වගේ දිලිසුණා. ගුහාව මැද, විල්ලුද කුෂන් දැමූ, රන් ආලේපිත ලීයෙන් වක් හැඩයට සැදූ, රෝමානු මෝස්තරයේ ඇඳක් තිබුණා. එය වටා සත්තු අලසව වැතිරී සිටියා - ඒත් ඒ සත්තු පණ පිටින් සිටිය යුතු එවුන් නෙවෙයි. එතැන ඩෝඩෝ කුරුල්ලෙක්, වෘකයෙක් සහ කොටියෙකුගේ දෙමුහුමක පෙනුම ගත් සතෙක්, රට හාවන්ගේ අම්මා වගේ පෙනුම ඇති අති විශාල සතෙක් වගේම ඇඳට පිටුපසින් නිදැල්ලේ ඇවිදිමින්, හොඬවැලෙන් බෙරි ගෙඩි කඩා කමින් සිටි වූලි මැමත් කෙනෙකුත් සිටියා.

ඇඳ මත වියපත් සැටර් කෙනෙක් වැතිරී සිටියා. අපි ඇතුළු වෙද්දි එයා අහස් නිල් පාට ඇස්වලින් අපි දිහා බලා සිටියා. එයාගේ කැරලි කොණ්ඩය වගේම, යටින් උල් වූ රැවුලත් සුදු පාට වුණා. අඩු තරමේ, එයාගේ දෙපාවල එළු ලොම් පවා අළු පාටට හැරී තිබුණා. එයාගේ අං දෙක අති විශාලයි - දිලිසෙන දුඹුරු පාට ඒවා වක් වී



තිබුණා. ග්‍රෝවර් කරන විදිහට තොප්පියක් ඇතුළේ ඒවා සඟවා ගන්න එයාට නම් කොහෙත්ම බැහැ. බට නළා කුට්ටමක් එයාගේ බෙල්ලේ එල්ලෙමින් තිබුණා.

එයාගේ ඇඳ ඉදිරිපිට ග්‍රෝවර් දණින් වැටුණා. "පෑන් උතුමාණෙනි!"

දෙවියා කාරුණික ලෙස හිනා වුණත්, එයාගේ ඇස්වල දුක්බර බවක් තිබුණා. "ග්‍රෝවර්, මගෙ දරුවෝ, නිර්භීත සැටර්. මම ඔයා එනකල් ගොඩක් කල් බලන් හිටියා."

"මම... අතරමං වුණා," ග්‍රෝවර් සමාව ඉල්ලුවා.

පෑන් හිනාවුණා. ඒක පුදුමාකාර හඬක්, වසන්ත සමයේ මුල්ම සුළං රැල්ල වගේ, මුළු ගුහාවම බලාපොරොත්තුවෙන් පුරවන හඬක්. සුසුමක් හෙළූ කොටි-වෘකයා දෙවියාගේ දණහිස මත ඔළුව තබාගත්තා. ඩෝඩෝ කුරුල්ලා උගුර යටින් අමුතු හඬක් නගමින්, දෙවියාගේ කුරයට ආදරණීය ලෙස හොට ගැසුවා. ඌ මිමිණුවේ " මේක පුංචි ලෝකයක්" සිංදුවේ තාලය කියලා මට දිවුරන්න වුණත් පුළුවන්.

ඒ වුණත්, පෑන් සිටියේ මහන්සියෙන් වගෙයි. එයාගේ මුළු රූපය ම සැලුණේ එයා මීදුමෙන් හැදිලා වගෙයි.

මගේ අනෙක් යාළුවෝත් දණ ගසන බව මට පෙනුණා. එයාලගේ මුහුණු ගරුසරු ඇති විස්මයකින් පිරී තිබුණා. මමත් දණ නමාගත්තා.

"ඔයාට සිංදු කියන ඩෝඩෝ කුරුල්ලෙක් ඉන්නවා නේ," මම මෝඩ තාලෙට කිවුවා.

දෙවියාගේ ඇස් දිලිසුණා. "ඔව්, මෙයා තමයි ඩේඩේ. මගේ චූටි නළඟන."

ඩේඩේ නම් ඩෝඩෝ එයින් අමනාප වුණා වගෙයි. පෑන්ගේ දණහිසට කෙටූ එයා මළ ළතෝනියක් වගේ යමක් මිමිණුවා.

"මේක තමයි ලෝකෙත් ම ලස්සන ම තැන!" ඇනබෙත් කිවුවා. "මේ තරම් කාලෙකට හදපු කිසිම ගොඩනැගිල්ලකටත් වඩා මේක හොඳයි."

"ඔයා ඒකට කැමති වුණාට මට සතුටුයි, දරුවෝ." පෑන් කිවුවා. "මේක ඉතුරු වෙලා තියෙන අන්තිම වනගත තැන්වලින් එකක්. මට බය, ළඟ තිබුණු මගේ රාජධානිය නැත්තටම නැති වෙලා ඉවරයි. පොඩි පොඩි ලෑහැබි විතරයි ඉතුරු. ජීවයේ චූටි චූටි කෑලි. මෙතැන විනාශ නොවී තියේවි... තව ටික කාලෙකට."

"මගේ උතුමාණෙනි," ග්‍රෝවර් කිවුවා. "කරුණාකරලා, ඔබතුමා මාත් එක්ක ආපහු යන්න එන්න! වැඩිහිටියෝ කවදාවත් මේක විශ්වාස කරන්නෙ නැති වෙයි! එයාලා සතුටින් පිස්සු වැටෙයි! ඔබතුමාට පුළුවන් වනාන්තරය බේරගන්න!"

ග්‍රෝවර්ගේ හිස මත අතක් තැබූ පෑන් එයාගේ කැරලි කොණ්ඩය ඇවිස්සුවා. "ඔයා ගොඩක් තරුණයි, ග්‍රෝවර්. ගොඩක් හොඳයි වගේම නිර්ව්‍යාජයි. මං හිතන්නේ මගේ තෝරාගැනීම හරි."

"තෝරාගැනීම?" ග්‍රෝවර් ඇසුවා. "මට- මට තේරෙන්නෙ නැහැ."

පෑන්ගේ රූපය සැලී, මොහොතකට දුමෙන් සැදුණු එකකට හැරුණා. බයෙන් තඩගෑව යෝධ රට හාවා ඇඳ යටට දිවුවා. මූලි මුමත් කලබලයෙන් ගෙරෙව්වා. ඩේඩේ තටුව යට ඔළුව සඟවා ගත්තා. ඊත් එක්කම පෑන් නැවත මතුවුණා.

"මම යුග ගාණක් නිදාගෙනයි හිටියේ," දෙවියා අසරණ ලෙස කිවුවා. "මට පෙනුණේ මහා අඳුරු හීන. මම ඉඳහිට ඇහැරුණා. ඒ හැම වතාවක ම මම අවදියෙන් ඉන්න කාලය ටිකෙන් ටික කෙටි වුණා. දැන් අපි අවසානයට ළඟයි."

"මොනවා?" ග්‍රෝවර් කෑගැසුවා. "ඒත් එහෙම නෑ! ඔබතුමා මෙතැන ඉන්නවා නේ!"

"මගේ ආදරණීය සැටර්," පෑන් කිවුවා. "මම ලෝකයාට කියන්න උත්සහ කළේ, අවුරුදු දෙදහකට කලිනුයි. මම ලයිසස්ට, ඔයා වගේම සැටර් කෙනෙකුට ඒක දැන්වූවා. එයා හිටියෙ එෆිසොස්වල. එයා ඒ පණිවුඩේ පතුරුවන්න උත්සහ කළා."

ඇනබෙත්ගේ ඇස් ලොකු වුණා. "අර පරණ කතන්දරේ. එෆිසොස් වෙරළ පහු කරගෙන ගිය සේලරුවෙක්ට, වැල්ලේ ඉඳන් කෑගහන හඬක් ඇහිලා තිබුණා, 'ශ්‍රේෂ්ඨ දෙවි පෑන් මියගිය බව ඔවුන්ට දන්වනු,' කියලා."



"ඒත් ඒක ඇත්ත නෙවෙයි!" ග්‍රෝවර් කිවුවා.

"ඔයාලගේ ජාතිය කවදාවත් ඒක විශ්වාස කළේ නැහැ," පෑන් කිවුවා. "මේ හරිම හොඳ. හිතුවක්කාර සැටර්ලා මගේ නැති වී යාම පිළිගන්න කැමති වුනේ නැහැ. ඒකට මම ඔයාලට ආදරෙයි. ඒත් ඔයාලා කරේ අනිවාර්යයෙන්ම වෙන්න තියෙන දෙයක් පරක්කු කරපු එක විතරයි. ඔයාලා මගේ දිග, වේදනාබර නික්ම යාම, මගේ සදාකාලික නින්දට යාම දික්ගැස්සුවා විතරයි. ඒක ඉවරයක් වෙන්න ඕනෑ."

"නැහැ!" ග්‍රෝවර්ගේ හඬ වෙවුලුවා.

"දයාබර ග්‍රෝවර්," පෑන් කිවුවා. "ඔයා ඇත්ත පිළිගන්න ඕනෑ. ඔයාගේ යාළුවා, නිකෝ, එයාට තේරෙනවා."

නිකෝ හෙමිහිට ඔළුව වැනුවා. "එයා මැරෙන්න යන්නේ. එයාට මැරෙන්න තිබුණේ ගොඩක් කාලෙකට කලිනුයි. මෙතැන... මෙතැන තියෙන්නෙ හරියට මතකයක් වගේ දෙයක්."

"ඒත් දෙවිවරුන්ට මැරෙන්න බැහැ," ග්‍රෝවර් කිවුවා.

"එයාලට වියැකිලා යන්න පුළුවන්," පෑන් කිවුවා. "එයාලා නියෝජනය කළ හැමදෙයක් ම නැතිවෙලා ගියාම. එයාලට බලයක් නැතිවෙලා ගියාම. ඒ වගේම එයාලගේ පූජනීය තැන් වඳවෙලා ගියාම. වනාන්තර, මගේ දයාබර ග්‍රෝවර්, දැන් ගොඩක් පොඩි වෙලා, හොඳටෝම විනාශ වෙලා. කිසිම දෙවියෙකුට ඒක බේරගන්න බැහැ. මගේ රාජධානිය තුරන් වෙලා. අන්න ඒ නිසයි ඔයා අතේ පණිවුඩයක් යවන්න මට උවමනා. ඔයා ආපහු මණ්ඩලයට යන්න ඕනෑ. ශ්‍රේෂ්ඨ දෙවි පෑන් මැරුණ බව ඔයා සැටර්ලට, රුක් දෙවිවරුන්ට, වගේම අනිත් සොබාදහමේ බලවේගවලට දන්වන්න ඕනෑ. මගේ වියැකී යෑම ගැන එයාලට කියන්න. මොකද එයාලව බේරගන්න මම එනකල් බලන් ඉන්න එක එයාලා නතර කරන්න ඕනෑ. මට ඒක කරන්න බැහැ. ඔයාලගේ ගැලවීම ඔයාලම හදාගන්න ඕනෑ. ඔයාලා හැම කෙනාම-"

කතාව නතර කරපු එයා ආයෙමත් මුමුණමින් යිටි ඩෝඩෝ කිරිල්ලිට රැවුවා.

"ඩේඩේ, ඔයා මොකද කරන්නේ?" පෑන් ප්‍රශ්න කළා. "ඔයා ආයෙමත් කුම්බායා සිංදුව කියනව ද?"

අහිංසක විදිහට එයා දිහා බලපු ඩේඩේ එයාගේ කහ පාට ඇස් තදින් සැලුවා.

පෑන් සුසුමක් හෙළුවා. "හැමෝම හිතන්නෙ මම, මං ගැන විතරක් හිතනවා කියලා. ඒත් මම කියකියා හිටියත් වගේ, මගේ ආදරණීය ග්‍රෝවර්, ඔයාලා හැම කෙනාම මගේ රස්සාව කරගෙන යන්න ඕනෑ."

"ඒත්... එපා!" ග්‍රෝවර් ඉකිබින්දා.

"ශක්තිමත් වෙන්න," පෑන් කිවුවා. "ඔයා මාව හොයාගත්තා. දැන් ඔයා මාව නිදහස් කරන්න ඕනෑ. ඔයාලා මගේ ජීව ගුණය අරන් යන්න ඕනෑ. ඒක තවදුරටත් දෙවි කෙනෙකුට අරන් යන්න බැහැ. ඒක ඔයාලා හැමෝම බාරගන්න ඕනෑ."

පෑන් පිරිසිදු නිල් ඇස්වලින් එක එල්ලේ මගේ දිහා බලද්දි, එයා කතා කරන්නේ සැටර්ලා ගැන විතරක් නොවෙන බව මට තේරුණා. එයා අදහස් කළේ අර්ධ-ලෝහිතයෝ, මිනිස්සු, මේ හැමෝම ගැනයි.

"පර්සි ජැක්සන්," දෙවියා කතා කළා. "ඔයාට අද දවසේ දකින්න ලැබුණේ මොනවද කියලා මම දන්නවා. ඔයාගේ සැකයන් ගැනත් මම දන්නවා. ඒත් මම ඔයාට මේ ආරංචිය කියන්නම්: වෙලාව ආවම, ඔයාව බය විසින් පාලනය නොවේවි."

එයා ඇනබෙත් වෙත හැරුණා. "ඇතීනාගේ දියණිය, ඔයාගේ කාලය එළඹෙනවා. ඔයා වැදගත් භූමිකාවක් රඟ දක්වාවි, හැබැයි ඒ ඔයා හිතාගෙන හිටපු භූමිකාව නොවෙන්න පුළුවන්."

ඊට පස්සෙ එයා ටයිසන් දිහා බැලුවා. "සයික්ලොප්ස් මහත්තයෝ, බලාපොරොත්තු නැති කරගන්න එපා. අපි අපේක්ෂා කරන තරමට වීරයෝ ජීවත් වෙන්නෙ කලාතුරකින්. ඒත් ඔයා, ටයිසන් - ඔයාගේ නම පරම්පරා ගාණක් යනකල් සයික්ලොප්ස්ලා අතරේ පවතීවි. එතකොට මිස් රේචල් ඩෙයාර්..."

පෑන් එයාගේ නම කියද්දි රේචල් ඇකිළුණා. එයා පසුබෑවේ මොකක් හරි වැරදි දෙයක් කරලා වගෙයි, ඒත් පෑන් එයාට හිනාවක් පෑවා විතරයි. එයා ආශිර්වාද කරමින් අතක් එසෙව්වා.



"කරපු වැරදි පිරිමහන්න බැහැ කියලා ඔයා විශ්වාස කරන බව මම දන්නවා," එයා කිවුවා. "ඒ වුණත් ඔයත් ඔයාගේ තාත්තා තරමටම වැදගත්."

"මම-" රේචල්ට ගොත ගැහුණා. එයාගේ කම්මුල පහළට කඳුළු බිඳුවක් ගලා ගියා.

"ඔයා දැන් මේක විශ්වාස කරන්නෙ නැහැ කියලා මම දන්නවා," පෑන් කිවුවා. "ඒත් ඉඩ ප්‍රස්ථාවක් හොයන්න. ඒවා ලැබෙයි."

අන්තිමේ දි එයා ආපහු ග්‍රෝවර් වෙත හැරුණා. "මගේ ආදරණීය සැටර්," පෑන් කාරුණික ලෙස කිවුවා. "ඔයා මගේ පණිවුඩය අරන් යනව ද?"

"ම- මට බැහැ."

"ඔයාට පුළුවන්," පෑන් කිවුවා. "ඔයා තමයි ශක්තිමත් ම සහ නිර්භීත ම කෙනා. ඔයාගේ හදවත අවංකයි. වෙන කිසිම කෙනෙක්, කිසිම දවසක විශ්වාස නොකරපු තරමට ඔයා මං ගැන විශ්වාසය තිබ්බා. අන්න ඒ නිසයි ඔයා මගේ පණිවුඩය අරන් යන්න ඕනෑ. ඒ නිසයි ඔයා මාව මුලින්ම නිදහස් කරන කෙනා වෙන්නත් ඕනෑ."

"මට එහෙම කරන්න ඕනෑ නැහැ."

"මං දන්නවා," දෙවියා කිවුවා. "ඒත් මගේ නම, පෑන්... ඒකෙ තේරුම ග්‍රාමීය කියන එක. ඔයා ඒක දැනගෙන හිටිය ද? ඒත් කාලයත් එක්ක ඒකට වෙන තේරුම් ලැබිලා. දැන් වනාන්තරයේ ජීව බලය ඔයාලා හැමෝටම දෙන්න ඕනෑ. ඔයාලට මුණගැහෙන හැම කෙනාටම මේක කියන්න ඕනෑ: ඔයාලා පෑන්ව හොයාගන්න කැමති නම්, පෑන්ගේ ජීව ගුණය බාරගන්න ඕනෑ. ලෝකයේ තමන්ගේ ම කෙළවරක, වරකට ටික බැගින්, වනාන්තර නැවත ඇති කරන්න. ඔයාලට වෙන කවුරුවත් ඒක කරනකල්, අඩු තරමේ දෙවියෙක් කරනකල් වත්, බලාගෙන ඉන්න බැහැ."

ග්‍රෝවර් දෑස් පිස දැමුවා. ඊට පස්සෙ හෙමින් සීරුවේ එයා නැගිට්ටා. "මම ඔබතුමාව හොයමින් මගේ මුළු ජීවිතය ම ගෙව්වා. දැන්... මම ඔබතුමාව නිදහස් කරනවා."

පෑන් හිනාවුණා. "ස්තූතියි, දයාබර සැටර්. මගේ අන්තිම ආශිර්වාදය."

Scanned with CamScanner

එයා ඇස් වසාගත්තා. ඒත් එක්කම දෙවියාව අන්තර්ධාන වුණා. සුදු මීදුම බලශක්ති රොදවල්වලට බෙදුණා. ඒත් මේ බලශක්තිය මම ක්‍රෝනොස්ගෙන් දකපු නිල් පාට බලශක්තිය වගේ බිය උපදවනසුලු වුනේ නැහැ. එයින් කාමරය පිරුණා. දුම් රැල්ලක් එක එල්ලේම මගේ කට ඇතුළටත්, ග්‍රෝවර්ගේ සහ අනෙක් අයගේ කටවල් ඇතුළටත් ඇදුණා. ඒත් මට හිතෙන්නේ එයින් ටිකක් වැඩිපුර ග්‍රෝවර් තුළට ගියා. පළිඟුවල දීප්තිය නැතිවුණා. සත්තු දුක්බර ලෙස අපි දිහා බැලුවා. ඩෙඩෙ නම් ඩෝඩෝ සුසුමක් හෙළුවා. ඊට පස්සේ එයාලා ඔක්කොම අළු පාටට හැරිලා දූවිලිවලට කුඩු වුණා. වැල් පරවුණා. ඊට පස්සෙ බලනකොට අපි අඳුරු ගුහාවේ, හිස් ඇඳ සමග තනි වී සිටියා. මම මගේ විදුලි පන්දම දැල්වුවා. ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා.

"ඔයා... හොඳින් ද?" මම එයාගෙන් ඇසුවා.

එයාට හිටියට වඩා වැඩිමහලු සහ දුක්බර පෙනුමක් ඇවිත් තිබුණා. ඈනබෙත් අතින් එයාගේ කැප් එක ගත් ග්‍රෝවර්, එහි මඩ පිස දමා, එයාගේ කැරලි හිසකේ පිරුණු ඔළුව මත ස්ථිර ලෙස පැළඳ ගත්තා.

"අපි දැන් යන්න ඕනෑ," එයා කිවුවා, "ගිහිල්ලා එයාලට කියන්න ඕනෑ. ශ්‍රේෂ්ඨ දෙවි පෑන් මැරුණා කියලා."

# 18

# ග්‍රෝවර් ඇති කළ කුලප්පුව

වංගගිරියේ දී දුර සාමාන්‍ය තරමට වඩා ගොඩක් අඩුයි. ඒ වුණත්, රේචල් අපිව ආපහු ටයිම්ස් චතුරස්‍රයට අරගෙන ගිය වෙලාව වෙද්දි, මට දැනුණේ අපි නිව් මෙක්සිකෝවල ඉඳන් මේ මුළු දුරම පයින් දුවගෙන ආවා වගෙයි. මැරියට් බිම් මහලෙන් පිටතට ආව අපි දීප්තිමත් ගිම්හාන ඉර එළිය යට, පදික වේදිකාව මත සිටගෙන වපර කරගත් ඇස්වලින් වාහන සහ මග යනෙන සෙනග දිහා බලාගෙන සිටියා.

මේ අතරින් වඩාත් අතාත්වික කොතැන ද කියලා මට තීරණය කරන්න බැරිවුණා - නිව්යෝක් නගරය ද, එහෙමත් නැත්නම් මම දෙවියෙක් මැරෙන දිහා බලා සිටි පළිඟු ගුහාව ද.

හඬ හොඳින් දෝංකාර දෙන පටු පාරකට මම අනෙක් අයව කැඳවාගෙන ගියා. එතැන දී මම හැකි උපරිම සද්දෙන්, පස්වරක් උරුවම බෑවා.

විනාඩියකට පස්සේ, රේචල් හීල්ලුවා. "එයාලා මාර ලස්සනයි!"

අහස පිසින ගොඩනැගිලි අතරින් වේගයෙන් පහත බසිමින්, පියඹා ආවේ පේගසි රංචුවක්. පෙරටුවේ ආ බ්ලැක්ජැක්ට පිටුපසින්, එයාගේ තනි සුදු යාළුවෝ හතර දෙනෙකුත් ආවා.

*යෝ, බොස්!* එයා මගේ හිත ඇතුළේ කතා කළා. *ඔයා නාම පණපිටින්!*

"ඔව්," මම එයාට කිවුවා. "ඒකට වාසනාව තිබුණා. අහන්න. අපිට පුළුවන් තරම් ඉක්මනට කඳවුරට යන්න ඕනෑ."

*මගේ විශේෂත්වේ ඒක නේ! මත් මනුෂ්‍යයෝ, අර සයික්ලොප්ස්කාරයෝත් එක්ක ඉන්නව දෑ නේ. ගෙබනුෆ් ඔයාගේ පස්ස දැන් කොහොමද?*

පෙගසස් ගයිඩෝ නෙදිරිගාමින් මැසිවිලි නැගුවත්, අන්තිමේ දී ටයිසන්ව අරන් යන්න එයා එකඟ වුණා. හැමදෙනාම සැදල යොදන්න පටන් ගත්තා - රේචල් ඇරෙන්න.

"හොඳයි," එයා මට කිව්වා. "මං හිතන්නෙ ඒක මෙතැනින් ඉවරයි."

මම අපහසුවෙන් ඔළුව වැනුවා. එයාට කඳවුරට යන්න බැරි බව අපි දෙන්නම දනගෙන හිටියා. තමන්ගේ පෙගසස් එක්ක බරටම වැඩ වගේ පෙන්වමින් සිටි ඇනබෙත් දිහාවට මම බැල්මක් හෙළුවා.

"ස්තූතියි, රේචල්," මම කිව්වා. "ඔයා නොහිටියා නම් අපිට ඒක කරගන්න බැරි වෙනවා."

"ඒ වගේ දෙයක් අත් ඇරෙන්න මම කොහෙත්ම ඉඩ දෙන්නෙ නැහැ. මං කිව්වෙ, මැරෙන්න ඔන්න-මෙන්න ගිය ටික ඇරෙන්න. ඒ වගේම පෑන්..."

එයාගේ කතාව ඇන හිටියා.

"එයා ඔයාගේ තාත්තා ගැන මොනවදෝ කිව්වා නේද," මට සිහිවුණා. "මොකක්ද එයා කියපු කතාවෙ තේරුම?"

රේචල් එයාගේ ගමන් මල්ලේ පටියක් ඇඹරුවා. "මගේ තාත්තා... මගේ තාත්තගෙ රස්සාව. එයා එක විදිහක ප්‍රසිද්ධ බිස්නස්කාරයෙක්."

"ඔයා කියන්නෙ... ඔයා පෝසත් ද?"

"හොඳයි, ඔව්."

"එහෙනම් ඔයා අපේ උදවුවට වැෆර් එක ගත්තෙ එහෙමයි. ඔයා ඔයාගේ තාත්තාගෙ නම කියපු ගමන්-"

"ඔව්," රේචල් මගේ කතාවට බාධා කළා. "පර්සි... මගේ තාත්තා ඉඩම් සංවර්ධනය කරන කෙනෙක්. එයා සංවර්ධනය නොකරපු ඉඩම් තියෙන පළාත් හොයාගෙන ලෝකෙ පුරාම යනවා." එයා සැලෙන හුස්මක් ගත්තා. "කැලෑවල්. එයා- එයා ඒවා සල්ලිවලට ගන්නවා. මට ඒක පේන්න බැහැ. ඒත් එයා කරන්නෙ ඒවා එළිපෙහෙළි කරලා කට්ටි



කරන එකයි. ජරා ෂොපින් සෙන්ටර් හදන එකයි. ඒත් දැන් මට පෑන්ව දකින්න ලැබුණා... පෑන්ගෙ මරණය-"

"හේයි, ඒකට ඔයාටම දොස් කියාගන්න ඔයාට බැහැ."

"ඒකෙ නරකම පැත්ත ගැන ඔයා දන්නෙ නැහැ නේ. මම-මම මගේ පවුල ගැන කතා කරන්නවත් කැමති නැහැ. ඔයා ඒ ගැන දැනගන්නවටත් මම කැමති නැහැ. මට සමා වෙන්න. මට තිබුණේ මුකුත්ම නොකියා ඉන්න."

"නෑ," මම කිව්වා. "ඒකට කමක් නෑ. බලන්න, රේචල්, ඔයා කරපු දේවල් නියමයි. ඔයා අපිව වංශගිරිය හරහා අරන් ගියා. ඔයා ගොඩක් නිර්භීත වුණා. මං ඔයාව මනින්නේ එහෙම විතරයි. ඔයාගේ තාත්තා මොනවා කළත් මට වැඩක් නැහැ."

රේචල් ස්තූතිවන්ත ලෙස මගේ දිහා බැලුවා. "හොඳයි... ඔයාට ආයෙ මනුස්ස කෙල්ලෙක් එක්ක කතා කරන්න හිතුනොත්... ඔයාට පුළුවන් මට කෝල් එකක් දෙන්න."

"අහ්, ඔව්. අනිවා."

එයාගේ ඇහිබැම් එකට හා වුණා. මං හිතන්නේ මගේ හඬේ කිසිම සතුටක්, උද්‍යෝගයක් තියෙන්න නැතුව ඇති. ඒත් මම අදහස් කළේ එහෙම නෙවෙයි. මගේ යාළුවෝ හැමෝම වටේට බලාගෙන ඉද්දිදි එයාට මොනවා කියන්න ද කියලා මට අදහසක් නොතිබුණා විතරයි. ඒ වගේම මම හිතන්නේ පහුගිය දවස් දෙකේ දි මගේ හැඟීම් අව්වාරුවක් වෙලයි තිබුණේ.

"මං කිව්වේ... මං ඒකට කැමතියි," මම කිව්වා.

"මගේ අංකේ පොතේ නම් නැහැ," එයා කිව්වා.

"මගේ ළඟ තියෙනවා."

"තවමත් ඔයාගේ අතේ තියෙනවා? වෙන්න බැහැ."

"නෑ. මට ඒක... කටපාඩම්."

එයාගේ හිනාව හෙමින්, ඒත් වඩාත් ප්‍රීතිමත්ව නැවත මතුවුණා. "ආයෙම හම්බවෙමු, පර්සි ජැක්සන්. ගිහිල්ලා මං වෙනුවෙන් ලෝකෙ බේරගන්න, හොඳේ?"

හත්වෙනි වීදිය දිගේ ඈතට ගිය එයා සෙනග අතරේ නොපෙනී ගියා.

Scanned with CamScanner

***

මම ආපසු අශ්වයෝ වෙතට ගියා. නිකෝට කරදරයක් වෙලා තිබුණා. එයාගේ පෙගසස් එයාට නගින්න ඉඩ නොදී, දිගින් දිගටම එයාගෙන් ඉවතට යමින් සිටියා.

*එයා ළඟ නැතිවීම මිස්සුනේ නෑයි!* පෙගසස් මැසිවිලි නැගුවා.

*මේ ආගෙවා*, බ්ලැක්ජැක් කිවුවා. *අනියෝ, පෝර්කි. ගොඩක් උප දෙවිවරු ළඟින් එන්නෙ අමුතු ගෙඩිල් නමයි. ඒක එයාලගේ වැරැද්දක් නෙවෙයි. ඔන්-ආන්, මම මේ කිවුවේ ඔයා ගැන එහෙම නෙවෙයි, බොස්.*

"මාව දාලා යන්න!" නිකෝ කිවුවා. "කොහොමත් මට ආපහු කඳවුරට යන්න ඕනැත් නැහැ."

"නිකෝ," මම කිවුවා. "අපිට ඔයාගේ උදවු ඕනෑ."

අත් බැඳගත් එයා තරහෙන් රවාගත්තා. ඇනබෙත් එයාගේ උරහිස උඩින් අතක් තැබුවා.

"නිකෝ," එයා කතා කළා. "අනේ."

නිකෝගේ මුහුණේ හැඟීම් හෙමිහිට මෘදු වුණා. "හරි එහෙනම්," එයා අකමැත්තෙන් වගේ කිවුවා. "ඔයා නිසා එන්නම්. හැබැයි මම නවතින්නෙ නම් නැහැ."

මම ඇහිබැමක් ඔසවා ඇනබෙත් දිහා බැලුවේ, හරියට, *එක පාර්වම නිකෝ ඔයා කියන ඒවා අහන්න පටන් ගත්තෙ කොහොමද?* කියලා අහන්න වගෙයි. එයා මට දිව එළියට දමා ඇද කළා.

අන්තිමේ දි හැමදෙනාවම පෙගසස් කෙනෙකුගේ පිටට නංවන්න අපිට හැකි වුණා. අහසට නැගුණු අපි ඉක්මනින්ම නැගෙනහිර ගඟ පසුකර, ඉදිරියෙන් විහිදී ඇති ලෝන්ග් අයිලන්ඩ් දෙසට ඇදුණා.

***

කැබින් අතර මැද මිදුලට ගොඩබෑව අපිට ඒ එක්කම කයිරොන්ව, කළගෙඩි බඩක් ඇති සැටර් සිලෙනස්ව සහ ඇපලෝ කැබිනයේ දුනුවායන් දෙන්නෙක්ව මුණගැසුණා. නිකෝව දැක්කම කයිරොන් ඇහිබැමක් එසෙව්වා. ඒ වුණත් අපි ගෙනා අලුත්ම ආරංචි වූ කුයින්ටස් කියන්නෙ ඩෙඩලස් බව හෝ ක්‍රෝනොස් අවදි වුණ බව



අහලා කයිරොන් පුදුම වෙයි කියලා මම බලාපොරොත්තු වුණා නම්, මට වැරදිලා.

"මමත් බයේ හිටියේ ඒකමයි," කයිරොන් කිවුවා. "අපි ඉක්මන් කරන්න ඕනෑ. ඔයාලා ටයිටන් රජාව පරක්කු කරා කියලා හිතන්න පුළුවන්. ඒ වුණත් එයාගේ බල ඇණිය නතර නොවී එයි. උන්ට ලේ දකින්න ඕනෑ වෙයි. අපේ ආරක්ෂකයින්ගෙන් වැඩිදෙනෙක් දැනටමත් ස්ථානගත වෙලා ඉවරයි. එන්න!"

"පොඩ්ඩක් ඉන්න," සිලෙනස් නියම කළා. "පැන්ව සෝදිසියට මොකද වුණේ? ඔයා දැනටමත් සති තුනක් පරක්කුයි, ග්‍රෝවර් අන්ඩර්වුඩ්! ඔයාගේ සොයන්නෙකුගේ බලපත්‍රය අවලංගුයි!"

ග්‍රෝවර් ගැඹුරු හුස්මක් ගත්තා. සිරුවෙන් හිටගත් එයා සිලෙනස්ගේ ඇස් දිහා එක එල්ලේ බැලුවා. "සොයන්නෙකුගේ බලපත්‍රවලින් තව දුරටත් වැඩක් නැහැ. ශ්‍රේෂ්ඨ දෙවි පෑන් මැරුණා. එතුමාගේ ජීව බලය අපිට ඉතුරු කරලා එතුමා නැතිවුණා."

"මොනවා?" සිලෙනස්ගේ මූණ තද රතු පාටට හැරුණා. "බොරු කියනවා මදිවට ශුද්ධ වස්තු කෙලෙසනවා! ග්‍රෝවර් අන්ඩර්වුඩ්, ඔය විදිහට කතා කරාට, මම ඔයාව පිටුවහල් කරනවා!"

"ඒක ඇත්ත," මම කිවුවා. "එයා මැරෙද්දි අපි එතැන හිටියා. අපි හැමෝම."

"වෙන්න බැහැ! නුඹලා ඔක්කොම බොරුකාරයෝ! සොබාදහම වනසන්නෝ!"

කයිරොන් ග්‍රෝවර්ගේ මුහුණ දිහා පරික්ෂාකාරීව බලා සිටියා. "අපි මේ ගැන පස්සෙ කතා කරමු."

"අපි මේ ගැන මේ දැන්ම කතා කරනවා!" සිලෙනස් කිවුවා. "අපි මේක බේරුමක් කරගන්න-"

"සිලෙනස්," කයිරොන් එයාට බාධා කළා. "මගේ කඳවුර ප්‍රහාරයකට මැදි වෙලයි තියෙන්නේ. පෑන්ගේ ප්‍රශ්නය අවුරුදු දෙදහසක්ම තිබුණ එකේ, තව ටික වෙලාවක් තිබුණට කමක් නැහැ නේ. ඒකත් ඉතින් අද හවස් වෙද්දිත් අපි ඉඳියි කියලා උපකල්පනය කරොත් විතරයි."

ඒ සතුටුදායක සදහනත් එක්ක, දූන්ත සූදානම් කරගෙන එයා කැලෑව දෙසට දිවුවේ, අපිට පුළුවන් විදිහට එයා පසුපස දුවන්න ඇරලයි.

***

කඳවුරේ දී මට දකින්න ලැබී තිබුණු ලොකුම හමුදා මෙහෙයුම එයයි. සම්පූර්ණ යුධ සන්නාහයෙන් සැරසී හැමදෙනාම එළිමහන් බිමට රැස් වී සිටියත්, මේ වතාවේ නම් ඒ කොඩිය ඇල්ලීමේ තරඟයකට නෙවෙයි. හෙෆාස්ටස් කැබිනයේ අය වංගගිරි දොරටුව වටා උගුල් සවිකර තිබුණා - දළිපිහි වගේ තියුණු රැහැන්, ග්‍රීක ගින්දර පිරවූ මුට්ටි, ප්‍රහාරයක් වෙනතකට හරවන්න උල් කරන ලද පිටි පේළි. සියුස්ගේ මුෂ්ටිය ඉලක්ක කර ස්ථානගත කර තිබූ පික්-අප් ට්‍රක් රථ තරම් ලොකු කැටපෝල දෙකක් බෙකන්ඩෝර්ෆ් මෙහෙයවමින් සිටියා. පෙරමුණේ සිටි ඒරිස් කැබිනයේ අය ක්ලැරිස්ගේ නියෝග පරිදි පෙළ ගැසෙමින් සිටියා. ඇපලෝ සහ හර්මීස් කැබින්වල ළමයි දුනු සූදානමින් තබාගෙන කැලයේ තැන තැන විසිරී සිටියා. වැඩි දෙනෙක් ගස් උඩ ලැගුම්ගෙන තිබුණා. අඩු තරමේ රුක් දෙවිවරු පවා දුනු ඊතලවලින් සන්නද්ධව සිටියා. ලී මුගුරු සහ තද ගස් පොතුවලින් සැදූ පලිහවල් අත දරාගෙන සැටර්ලා එහෙ මෙහෙ ගියා.

සේනාපති කූඩාරමක් පිහිටුවා, මෙහෙයුම අධීක්ෂණය කරමින් සිටි ඇතීනා කැබිනයේ සහෝදරයින්ට එකතු වෙන්න ඇනබෙත් ගියා. බකමූණෙකුගේ රූපය සහිත අළු පාට බැනරයක් කූඩාරමට පිටතින් ලෙළ දෙමින් තිබුණා. අපේ ආරක්ෂක ප්‍රධානියා, ආර්ගස්, දොරටුව මුර කරමින් සිටියා. ඇෆ්‍රොඩයිටිගේ දරුවෝ හැමෝගෙම සන්නාහ හරිගස්සමින් සහ අපේ හිස්වැසුම්වල අශ්ව ලොම් රැල්ලේ ගැට ලිහා පිරා දෙන්න අහමින් වටේ දිවුවා. ඩයනයිසියස්ගේ ළමයින්ට පවා කරන්න දෙයක් ලැබී තිබුණා. ඒ දෙවියා තවමත් පෙනෙන්න නැති වුණත්, එයාගේ තඹ පාට කොණ්ඩා ඇති නිවුන් පුත්තු දෙන්නා දාඩිය දමා සිටින සෙබළුන්ට වතුර බෝතල් සහ පලතුරු යුෂ පෙට්ටි බෙදා දෙමින් හැමතැනම දිවුවා.

ඒ සියල්ල සෑහෙන හොඳ සැලසුමක් වගේ පෙනුණත්, මගේ ළඟ සිටි කයිරොන් කෙඳිරුවා. "මේ හොඳටම මදි."

වංගගිරිය තුළ දී මට දකින්න ලැබුණු දේවල්, ඇන්ටියස්ගේ ක්‍රීඩාංගණයේ සිටි රාක්ෂයෝ සියල්ල සහ වැම් කන්දේ දී මට විඳින්න



ලැබුණු ක්‍රෝනොස්ගේ බලය ගැන මම කල්පනා කළා. මගේ හදවත කඩා වැටුණා. කයිරොන් කිව්වා හරි, ඒත් අපිට රැස් කරගන්න පුළුවන් උපරිමය මෙච්චරයි. ඩයනයිසියස් මෙතැන හිටියා නම් කියලා මට හිතුණා. ඒත් එයා හිටියත්, එයාට කරන්න දෙයක් තියෙයි ද කියලා මම දැනගෙන හිටියෙ නැහැ. යුද්ධයක දී, දෙවිවරුන්ට සෘජුව මැදිහත් වෙන්න තහනම්. පෙනුණු හැටියට, ඒ තහනම ගැන ටයිටන්ලට නම් වගක් තිබුණෙ නැහැ වගෙයි.

එළිමහන් බිම කෙළවර, ග්‍රෝවර් ජුනිපර් සමග කතා කරමින් සිටියා. ග්‍රෝවර් අපේ කතාව එයාට කියන අතරේ ජුනිපර් එයාගේ අත් දෙක අල්ලගෙන හිටියා. එයා පෑන් ගැන කියද්දි ජුනිපර්ගේ ඇස් කොළ පාට කඳුළින් පිරුණා.

හෙෆාස්ටස් ළමයින්ට රැකවල් යොදන්න ටයිසන් උදවු කළා. තඩි ගල් කුට්ටි ඔසවාගෙන ආව එයා පහර දීම සඳහා ඒවා කැටපෝල ළඟ ගොඩ ගැසුවා.

"මාත් එක්කම ඉන්න, පර්සි," කයිරොන් කිව්වා. "සටන පටන් ගත්තා ම, අපි ගනුදෙනු කරන්නෙ කාත් එක්ක ද කියලා හරියටම දැනගන්න කල් ඔයා ඉන්න ඕනෑ. අපිට වඩාත්ම උදවු උවමනා තැනට ඔයා යන්න ඕනෑ."

"මම ක්‍රෝනොස්ව දැක්කා," මම කිවුවේ ඒ ගැන තවමත් තෝන්තුවෙන්. "මම එයාගේ ඇස් දිහා කෙලින්ම බැලුවා. ඒ ලූක්... ඒත් එයා නෙවෙයි."

කයිරොන් එයාගේ දුනු දිය දිගේ ඇඟිලි දිවෙව්වා. "එයාට රත්තරන් පාට ඇස් තියෙන්න ඇති, මං හිතන්නෙ. එතකොට එයා ළඟදි, කාලය දියරයක් වගේ ගලනවා දැනෙන්න ඇති."

මම ඔළුව වැනුවා. "මනුස්ස ඇඟකට යන්න එයාට පුළුවන් වුනේ කොහොමද?"

"මම දන්නෙ නැහැ, පර්සි. දෙවිවරු යුග ගාණක් තිස්සෙ මිනිස් රූපය අරගෙන ඉන්නවා, ඒත් ඇත්තටම ඒ කෙනෙක් වෙන්න... දිව්‍යමය ශරීරය මනුෂ්‍ය එකකට බද්ධ කරගන්න. ලූක්ගේ ඇඟ අළු වෙන්නෙ නැතුව ඒක කොහොම කරා ද කියලා මම දන්නෙ නැහැ."

"එයාගේ ඇඟ සූදානම් කරලා තිබුණා කියලා ක්‍රෝනොස් කිවුවා."

"ඒක හේරුම මොකක්ද කියලා හිතනකොටත් මාව වෙවුලනවා. ඒ වුණත් බාගදා ඒකෙන් ක්‍රෝනොස්ගේ බලය සීමා කරයි. අඩු තරමේ, කාලයකට. එයා මනුස්ස ශරීරෙකට සීමා වෙනවා. ඒකෙන් එයාව එකට බැඳගන්නවා. ඒකෙන් එයාව සීමා කරයි කියලා අපි හිතමු."

"කයිරොන්. මේ ආක්‍රමණය මෙහෙයවන්නෙ එයා නම්-"

"මම එහෙම හිතන්නෙ නැහැ, මගෙ කොල්ලෝ. එයා කිට්ටු වෙනවා නම් මට ඒක දැනෙයි. නිව්වියටම එයා එහෙම කරන්න සැලසුම් කරන් ඉන්න ඇති, ඒ වුණත් ඔයා එයාගේ සිංහාසන ශාලාව එයාගේ උඩටම කඩා වට්ටලා, එයාට සැහෙන කරදරයක් කරන්න ඇති." එයා දොස් කියන බැල්මෙන් මගේ දිහා බැලුවා. "ඔයයි ඔයාගේ යාළුවා නිකෝ, හේඩීස්ගේ පුතායි."

මට දැනුණේ ලොකු ගුළියක් මගේ උගුරේ බැඳෙනවා වගෙයි. "මට සමා වෙන්න, කයිරොන්. මං දන්නවා, මට ඒක ඔයාට කියන්න තිබුණේ. ඒක මේ-"

කයිරොන් අතක් එසෙව්වා. "ඔයා එහෙම කළේ ඇයි කියලා මට තේරෙනවා, පර්සි. ඒකට වගකියන්න ඕනෑ කියලා ඔයාට දැනුණා. එයාව ආරක්ෂා කරන්න ඔයා බලාපොරොත්තු වුණා. ඒත්, මගෙ කොල්ලෝ. මේ යුද්ධයෙන් නොනැසී බේරෙන්න නම්, අපි එකිනෙකාව විශ්වාස කරන්න ඕනෑ. අපි..."

එයාගේ කටහඬ සැලුණා. අපිට යටින් පොළොව දෙදරමින් තිබුණා.

එළිමහන් බිමේ සිටි සියලු දෙනා, තම තමන් කරමින් සිටි වැඩ නතර කළා. ක්ලැරිස් කෑගසා එක නියෝගයක් දුන්නාඃ "පලිහවල් හිර කරගනිල්ලා!"

ඒත් එක්කම ටයිටන් රජාගේ හමුදාව වංගගිරියෙන් පිටට කඩා පැන්නා.

***

මං කියන්නේ, මීට කලිනුත් මම සටන්වලට ගිහින් තියෙනවා තමයි, ඒත් මේක සම්පූර්ණ-පරිමාණයේ යුද්ධයක්. මට මුලින්ම දකින්න ලැබුණේ ලැයිස්ට්‍රිගෝනියානු යෝධයෝ දුසිමක් පොළොව පළාගෙන මතුවෙන හැටියි. උන් මොර ගෑපු සද්දෙට මගේ කන් අඩි පුපුරයි



කියලා මට හිතුණා. සමතලා කරපු කාර් පලිහවල් ලෙසත්, උගුලුවා ගත් ගස් කඳන්වල කෙළවරකට මළ බැඳුණු උල් සවි කර සාදාගත් මුගුරුත් උන් අත දරාගෙන සිටියා. ඊරිස් සෙබළ මුලට ගර්ජනා කළ එක යෝධයෙක්, එයට මුගුරෙන් පහර දුන්නාම, මුළු කැබිනය ම පැත්තකට විසිවුණා. සෙබළු දුසිමක් විතර උඩ විසි වුණේ රෙදි බෝනික්කෝ වගෙයි.

"පහර දෙනු!" බෙකන්ඩෝර්ෆ් මොර දුන්නා. කැටපෝල ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. ගල් කුට්ටි දෙකක් යෝධයෝ දෙසට වැරෙන් විසිවුණා. කාර් පලිහක වැදුණු එකක් යාන්තමින් එය කඩතොලු කරමින් පැත්තකට විසිවුණා, ඒත් අනෙක ලැයිස්ට්‍රිගෝනියානුවෙකුගේ පපුවේ වැදි, යෝධයාව බිමට ඇද වැට්ටුවා. ඇපලෝ දුනුවායන්ගෙන් නිකුත් වූ ඊ මුරයෙන්, ඊතල දුසිම් ගාණක් යෝධයින්ගේ ගන සන්නාහවල ඇමිණුනේ ඉත්තෑ කුරු වගෙයි. ඒවායින් කීපයක් සන්නාහවල සිදුරු හොයාගෙන ඇතුළට යද්දි, දිව්‍යමය ලෝකඩ ගැවුණු හැටියේ සමහර යෝධයෝ වාෂ්ප වී ගියා.

ඒ වුණත් ලැයිස්ට්‍රිගෝනියානුවෝ යටපත් වෙන්න කිට්ටුයි වගේ පෙනෙද්දි ම, ඊළඟ රැල්ල වංගගිරියෙන් පිට පැන්නාඃ කිහක්, නැත්නම් හතලිහක් විතර ඩ්‍රැකනෙයිලා සම්පූර්ණ යුධ සන්නාහයෙන් සැරසී, හෙලි සහ දැල් ලෙළවමින් ආවා. උන් හැම අතටම විසිරුණා. සමහරු හෙෆාස්ටස් කැබිනය අටවා තිබූ උගුල්වලට හසුවුණා. උල්වල වැදුණු එකෙක් දුනුවායින්ට පහසු ඉලක්කයක් වුණා. තවත් එකෙක් පැන්නුම් එකෙක් ... කම්බියක පැටලෙද්දි, ග්‍රීක ගින්දර බඳුන් පුපුරා හටගත් කොළ පාට ගිනි දලු සර්ප ගැහැනු කිප දෙනෙක්වම වෙලාගත්තා. ඒත් තව තවත් එවුන් නොනැවතී එමින් සිටියා. ආර්ගස් සහ ඇතීනා රණශූරයෝ උන්ව මුණගැහෙන්න ඉදිරියට දිවුවා. ඇනබෙත් කඩුව ඇදගෙන එකෙක්ට පහර දෙනවා මම දැක්කා. ඒ ළඟින් ම, ටයිසන් යෝධයෙකුගේ පිටේ යමින් සිටියා. එයා කොහොමදෝ යෝධයාගේ පිටට නැගලා, ලෝකඩ පලිහකින් ඔළුවට ගහමින් හිටියා - *බොන්ග්! බොන්ග්! බොන්ග්!*

කයිරොන් සත්පුන් ලෙස ඊතල එකක් පසුපස එකක් එල්ල කරමින්, ඒ සෑම පහරකින් ම රාක්ෂයෙක්ව බිම දමමින් සිටියා. ඒත් තව තවත් සතුරෝ වංගගිරියෙන් පිටට බඩගාමින් ආවා. අන්තිමේ දී යම බල්ලෙක් - මිසිස් ඕ'ලෙරී නෙවෙයි - උමඟෙන් පිටට පැනලා එක එල්ලේම සැටර්ලා දෙසට දුවන්න ගත්තා.

"යන්න!" කයිරොන් මට මොරගසා කිවුවා.

පිස්ටයිඩ් ඇදගත් මම පහර දෙන්න පැන්නා.

යුධ පිටිය හරහා දුවද්දී මට දකින්න ලැබුණේ බිහිසුණු, දරුණු දේවල්. සතුරු අර්ධ-ලෝහිතයෙක් ඩයනයිසියස්ගේ පුතෙක් සමග සටන් කරමින් හිටියා. ඒ වුණත් එතැන වැඩි සටනක් තිබුණේ නැහැ. එයාගේ අතට ඇන්න හතුරා, කඩු මිටෙන් ඔළුවට තද පහරක් ගැසුවා ම ඩයනයිසියස්ගේ පුතා බිම ඇද වැටුණා. තවත් හතුරු පාර්ශවයේ සෙබළෙක් ගිනි ගත්තා ඊතල ගස්වලට විදිමින්, අපේ ද්‍රෙනුවායන්ව සහ රුක් දෙව්වරුන්ව බය වැද්දුවා.

හදිසියේ ම ප්‍රධාන සටනෙන් වෙන් වුණු ඩ්‍රැකනෙයිලා දූසිමක් කඳවුර දෙසට වැටී ඇති පාර දිගේ ලිස්සාගෙන ගියේ, යන්නෙ කොහෙද කියලා දන්නවා වගෙයි. මෙතැනින් පිටවුනොත්, උන් කිසිම කරදරයක් බාධාවක් නැතුව මුළු කඳවුරම ගිනිබත් කරාවි.

ළඟ පාතක සිටි එකම කෙනා වුණේ නිකෝ ඩී ආන්ජෙලෝයි. එයා ටෙලිකීනයෙකුට ඇන්නාම, එයාගේ කළු පාට ස්ටයිජියන් කඩුව රාක්ෂයාගේ සාරය උරාගෙන, එතැන දූවිල්ලක් ඇර වෙන කිසිවක් නැති වෙන තුරු උගේ ශක්තිය ඇදගත්තා.

"නිකෝ!" මම මොර දුන්නා.

මම අත දිගු කර පෙන්වූ දිසාව බැලූ එයා, සර්ප ගැහැනුන්ව දක්කා. ඒත් එක්කම එයාට තේරුම් ගියා.

ගැඹුරු හුස්මක් ගත් එයා එයාගේ කළු කඩුව ඉදිරියට දිගු කළා. "මට සේවය කරනු." එයා කිවුවා.

පොළොව දෙදුරුවා. ඩ්‍රැකනෙයිලා ඉදිරියෙන් පොළොවේ විවරයක් ඇරී. ඇටසැකිලි සෙබළ දූසිමක් බඩගාමින් පිටට ඇදුණා - සෑම කාලවකවානුවකට ම අයත් හමුදා නිල ඇඳුම්වලින් සැරසුණු බිහිසුණු මළමිනී - ඇමරිකානු විප්ලවකාරයෝ, රෝමානු මුලාදැනියෝ වගේම ඇටසැකිලි අශ්වයෝ මත නැගී නැපෝලියානු අශ්වාරෝහකයෝ හටයෝ. එකා මෙන් ආයුධ ඇදගත් උන් ඩ්‍රැකනෙයිලාට පහර දෙන්න පැන්නා. නිකෝ දණහිස් මතට ඇද වැටුණා. ඒත් එයා හොඳින් ද කියලා බලන්න මට වෙලාවක් තිබුණේ නැහැ.

දැන් සැටර්ලාව කැලෑව දෙසට පලවා හරිමින් සිටි යම බල්ලාට මම කිට්ටු වුණා. සතා සැටර් කෙනෙක්ව හපා කන්න පැන්නා, එයා වේගයෙන් උගේ කටෙන් ඉවතට පැන්නා, ඒත් ඊට පස්සෙ ඌ ඒ



තරම් වේගවත් නැති වෙනත් කෙනෙකුට කඩා පැන්නා. ඒ සැටර් වැටෙද්දී, එයාගේ ගස්-පොතු පලින පුපුරා ගියා.

"හේයි!" මම මොර ගැසුවා.

යම බල්ලා හැරුණා. දත් නියවා ගොරවපු ඌ මගේ ඇගට පැන්නා. ඌට මාව කැලි වෙන්න පතුරු ගන්න තිබුණා, ඒත් මම ආපස්සට වැටෙද්දී, මගේ ඇඟිලිවලට මැටි බරණියක් හසුවුණා - මෙකන්ඩෝර්ෆ් ග්‍රීක ගින්දර දමා තිබූ බඳුන්වලින් එකක්. මම ඒක යම බල්ලාගේ කට ඇතුළට විසි කළා. ඒත් එක්කම සතාව ගිනි දැලුවලින් වැසී ගියා. මම අමාරුවෙන් හුස්ම ගනිමින් ඉවතට ඔබනැවා.

සතාට පෑගුණු සැටර් හෙලවුනේවත් නැහැ. මම එයාව බලන්න දුවද්දී, මට ග්‍රෝවර්ගේ කටහඬ ඇසුණා "පර්සි!"

කැලෑවේ ගින්නක් හටගෙන තිබුණා. ජූනිපර්ගේ ගහට අඩි දහයක්වත් දුරින් ගිනි දැලු බුරබුරා නැගෙද්දී, ජූනිපර් සහ ග්‍රෝවර් පිස්සුවෙන් වගේ එය බේරගන්න උත්සහ කරමින් සිටියා. ග්‍රෝවර් බට නළාවලින් වැහි සිංදුව වාදනය කළා. ජූනිපර් එයාගේ කොළ පාට සළුවෙන් නිෂ්ඵල ලෙස ගිනි දැලුවලට පහර දී නිවන්න උත්සහ කළා. ඒත් එයින් වුණේ තත්ත්වය වඩාත් නරක අතට හැරුණු එක විතරයි.

මම ද්වන්ධ සටන්වලට උඩින් පනිමින්, යෝධයින්ගේ කකුල් අතරින් රිංගමින්, ඒ දෙන්නා දිහාවට දිවුවා. ආසන්නයෙන් ම වතුර ඇති තැනකට තිබුණේ සැතපුම් බාගයක් දුරින් ඇති දොළ විතරයි... ඒත් මට මොනවා හෝ කරන්න වුණා. මම හිත එකඟ කර ගත්තා. ඒත් එක්කම මගේ බඩ තුළ ගැස්මකුත්, කන් තුළ ගිගුරුමකුත් දැනුණා. ඒත් එක්කම තාප්පයක් තරම් උස වතුර කඳක් ගස් අතරින් වේගයෙන් ගලා ආවා. එය ගින්නත්, ජූනිපර්ව හා ග්‍රෝවර්වත් වගේම, අනෙක් හැමදෙයක්මත් තෙමා දැමුවා.

ග්‍රෝවර් කටින් වතුර එළියට විද්දා. "ස්තූතියි, පර්සි!"

"අවුලක් නෑ!" මම ආපසු සටන දෙසට දුවද්දී, ග්‍රෝවර් සහ ජූනිපර් මගේ පස්සෙන් ආවා. ග්‍රෝවර් ළඟ මුගුරකුත්, ජූනිපර්ගේ අතේ කෝටුවකුත් තිබුණා - ඒක හරියට පරණ වේවැලක් වගෙයි. එයා හිටියේ කාගේ හරි පස්සක් පතුරු ගහන්න වගේ කේන්තියෙන්.

යුද්ධය ආයෙමත් සමබර වෙනවා වගේ පෙනෙන්න පටන් ගනිද්දී ම - අපිට දිනන්න ඉඩක් ලැබෙයි වගේ හිතෙද්දී ම - වංග

හිරිය තුළින් අමනුස්ස බෙරිහන්දීමක් දෝංකාර දුන්නා. මීට කලින් මට අහන්න ලැබී තිබුණු හඬක්.

වවුල් තටු මුළුමනින්ම විහිදාගෙන කැම්පී අහසට පැන්නා. සියුස්ගේ මුෂ්ටිය මතට ගොඩබෑව එයා සංහාරය සෝදිසි කර බැලුවා. එයාගේ මූණ පිරී තිබුණේ යක්ෂ සන්තෝෂයකින්. විකෘති සත්ත්ව ඔළු එයාගේ ඉණේ සිට ගෙරෙව්වා. එයාගේ දෙපා වටා සර්පයෝ පිඹිමින් වෙලුණා. එයාගේ දකුණු අතේ දිලිසෙන නූල් බෝලයක් තිබුණා - අරියඩ්නිගේ නූල - ඒත් එයා ඒක ඉණේ සිටි සිංහයෙකුගේ කට ඇතුළට ඔබලා. එයාගේ වකුටු කඩු දෙක ඇදලා ගත්තා. කඩු තල විෂවලින් කොළ පාටට දිලිසුණා. කැම්පී යටි උගුරෙන් ජයග්‍රාහී ලෙස කෑගසද්දී, සමහර කඳවුරුකරුවෝ බෙරිහන් දුන්නා. දුවන්න උත්සහ කළ අනෙක් අයව යම බල්ලාගේ සහ යෝධයින්ගේ කකුල්වලට පෑගුණා.

"ඩි ඉමෝර්ටේල්ස්!" කයිරොන් මොර ගැසුවා. එයා ඉක්මනින් ම හීයක් මැනුවා. ඒත් කැම්පිට එයා ඉන්න බව දැනිලා වගෙයි. එයා අදහන්නත් බැරි වේගයකින් එතැනින් ඉවතට පියඹා යද්දී, කයිරොන්ගේ හීය කිසිම ආපදාවක් නොකර එයාගේ ඔළුවට උඩින් ගියා.

ටයිසන් සිහිය නැති වෙනකල් ම ගහලා බිම දැමූ යෝධයාගෙන් මිදී, කෑගසමින් අපේ සෙබළ පේළි දිහාවට දුවගෙන ආවා. " නවතින්ඩෝ! එයාට බයේ දුවන්ඩ එපෝ! සටන් කරන්ඩෝ!"

ඒත් එතකොටම යම බල්ලෙක් එයාගේ ඇඟට කඩා පැන්නා. ටයිසනුයි බල්ලයි ඈතට පෙරළුණා.

ඇතිනා සේනාපති කූඩාරම මත ගොඩබෑව කැම්පී එය සමතලා කර දැමුවා. එයාව ලුහුබැඳගෙන දිවූ මට දකින්න ලැබුණේ කඩුව සූදානමින් තබාගෙන මගේ පසෙකට ඇවිත් සිටි ඇනබෙත්වයි.

"මේක වෙන්නැති ඒ," එයා කිව්වා.

"වෙන්නත් පුළුවන්."

"ඔයා ළඟ ඉඳන් සටන් කරන්න ලැබුණට සතුටුයි, පාසි මොළේ."

"මටත් එහෙමයි."

අපි දෙන්නා එක්ව රාක්ෂණියගේ පාරට පැන්නා. කැම්පී පිඹිමින් අපිව පෙති ගහන්න දඟලුවා. ඇනබෙත් පහර දෙන්න ඉදිරියට යන අතරේ, කැම්පිගේ අවධානය වෙනතකට හරවන්න උත්සහ කරමින්



මම පැත්තකට පැන්නා. ඒත් රාක්ෂණියට වෙන වෙනම අත් දෙකෙන් ම සටන් කරන්න පුළුවන් වගෙයි. එයා ඇනබෙත්ගේ කඩුව හරස් කරද්දී, විෂ දුම් වලාවෙන් ගැලවෙන්න ඇනබෙත්ට ආපස්සට පනින්න වුණා. ඒවා කිට්ටුවෙන් ඉන්න එකත් ඇසිඩ් දුමක් ළඟ ඉන්නවා වගෙයි. මගේ ඇස් පිලිස්සෙන්න ගත්තා. මගේ පෙණහලුවලට උවමනා තරම් වාතය නොලැබී ගියා. තවත් තත්පර කීපයකට වඩා සටන් කරන්න අපිට බැරි වෙන බව මම දැනගත්තා.

"මෙහෙ එන්න!" මම කෑගැසුවා. "අපිට උදවු ඕනෑ!"

ඒත් කිසිම උදවුවක් ලැබුනේ නැහැ. හැමදෙනාම හිටියේ බිම වැටී හෝ ජීවිත රැකගන්න සටන් කරමින් හෝ හෙලවෙන්නවත් බැරි තරමට බයවෙලයි. කයිරොන්ගේ ඊතල තුනක් කැම්පිගේ පපුවට කිඳා බැස්සත්, එයින් වුණේ එයාගේ ගර්ජනාව වැඩිවුණ එක විතරයි.

"දැන්!" ඇනබෙත් කිව්වා.

අපි දෙන්නම එක්ව ඉදිරියට දුවමින්, රාක්ෂණියගේ කඩු පහරවල් මග අරිමින්, එයා ළඟටම ළං වෙලා, හරියටම... හරියටම වගේ කැම්පිගේ පපුවට අතින්න කිට්ටු වුණා. ඒත් එතකොටම එයාගේ ඉණෙන් සද්දන්ත වලස් ඔළුවක් අපිව හපා කන්න පනිද්දී, අපිට ආපස්සට පැකිළී වැටෙන්න සිදුවුණා.

*දඩාාාං!*

මගේ ඇස් අඳුරු වුණා. ඊළඟට මට තේරුම් ගිය දේ වුණේ, ඇනබෙත්ව සහ මාව බිමට ඇද වැටී ඇති බවයි. රාක්ෂණියගේ ඉස්සරහා ගාත් අපේ පපුව මත තබා, අපිව බිමට තෙරපාගෙන සිටියා. මට උඩින් සර්පයෝ සිය ගාණක් ලිස්සාගෙන ගියේ හිනාවක් වගේ සූ හඬවල් පිට කරමින්. කැම්පී එයාගේ කොළ පාටින් [illegible] වැටුණු කඩු ඉහළට ඔසවද්දී, ඇනබෙත්ටයි මටයි විකල්පයක් නැති බව මම දැනගත්තා.

ඒ වෙලාවේ, මට පිටුපසින්, මොකෙක්දෝ උඩු බිරුවා. කළු පාට බිත්තියක් වගේ දෙයක් ඇවිත් කැම්පීගේ වේගයෙන් වැදුණේ, මිසිස් ඕ'ලෙරී අපිට උඩින් රාක්ෂණියව පැත්තකට විසි කරමින්. මිසිස් ඕ'ලෙරී අපිට උඩින් සිටගෙන දත් විළිස්සා ගොරවමින්, කැම්පීව හපා කන්න පනිමින් සිටියා.

"හොඳ කෙල්ල!" පුරුදු කටහඬක් කිව්වා. ඩෙඩලස් සටන් කරමින් වංගගිරියෙන් පිටතට ඇවිත්, වමටත් දකුණටත් සතුරන්ව

පෙති ගසමින් මග පාදාගෙන අපි දිහාවට ආවා. එයත් එක්ක තවත් කෙනෙක් ආවා - ලැයිස්ට්‍රිගෝනියානුවන්ට වඩා ගොඩාක් උස. අත් සියයටම යෝධ ගල් ගෙඩි අරගෙන සිටි හුරු පුරුදු යෝධයෙක්.

"බ්‍රයර්ස්!" ටයිසන් කෑගැසුවේ පුදුමයෙන්.

"සැරදේවා, පුංචි මල්ලියා!" බ්‍රයර්ස් බෙරිහන් දුන්නා. "පස්ස නොබලා යමු!"

ඊට පස්සෙ මිසිස් ඕ'ලෙරි පැත්තකට පනිද්දි ම, අත්-සියයක් ඇත්තා ගල් ගෙඩි වරුසාවක් කැම්පි මතට වැස්සුවා. බ්‍රයර්ස්ගේ අතින් මිදි යද්දි ගල් ගෙඩි ප්‍රමාණයෙන් තව තවත් විශාල වෙනවා වගෙයි පෙනුණේ. එතැන කොයි තරම් ගල් ගොඩක් තිබුණා ද කියනවා නම්, පොළොවෙන් බාගයක්ම ඉගිල්ලෙනවා වගෙයි පෙනුණේ.

බූම්!

මොහොතකට කලින් කැම්පි සිටගෙන සිටි තැන දැන් තිබුණේ සියුස්ගේ මුන්ටිය තරමට ම උස ඇති ගල් කන්දක්. එතැන රාක්ෂයෙක් සිටි බවට වූ එකම සලකුණ වුණේ සිදුරු දෙකක් තුළින් පිට පැන තිබුණු කොළ පාට කඩු දෙක විතරයි.

කඳවුරුකරුවෝ අතරේ ජයඝෝෂාවක් පැතිරුණා. ඒත් අපේ සතුරෝ තවමත් අවසන් වී සිටියේ නැහැ. ඩ්‍රැකනෙයිලාගෙන් එකෙක් මොර ගැසුවා. "උන්ව වනසපල්ලා! උන්ව මරපල්ලා. නැත්නම් ක්‍රෝනොස් උඹලාව පණ පිටින් හම ගහයි!"

පෙනුණු හැටියට, ඒ තර්ජනය අපිට වඩා ගොඩක් බය උපදවන එකක් වුණා. අත්තිම වරටත් තදින් වෑයම් කරමින්, යෝධයෝ රැල්ලක් මෙන් ඉදිරියට ආවා. එකෙක් කයිරොන්ගේ පස්සා ගාත්වලට ක්ෂණික පහරක් දෙමින් එයාව බිම වැට්ටුවා. යෝධයෝ හයදෙනෙක් සතුටින් මොර දෙමින් එයා දිහාවට දිවුවා.

"එපා!" මම බෙරිහන් දුන්නා. ඒත් මම හිටියේ උදව් කරන්න බැරි තරම් දුරින්.

ඒක සිද්ධ වුණේ ඒ වෙලාවෙයි.

ග්‍රෝවර් කට ඇරියා. ඒත් එක්කම මෙච්චර කාලෙකට මට අහන්න ලැබුණු බිහිසුණුම හඬ එළියට ආවා. ඒක හරියට පිත්තල තොරණෑවක හඬ දහස් ගුණයකින් වැඩි කරලා වගෙයි - ඒ තනිකරම භීතියේ හඬයි.



එකා වගේ, ආයුධ බිම දමූ ක්‍රෝනොස්ගේ හමුදාව පණ බේරගන්න දිවුවා. මුලින්ම වංගගිරියට යන්න පොරකමින් දිවූ යෝධයින්ට ඩ්‍රැකනෙයිලාව පෑගුණා. ටෙලිකීන්ලා, යම බල්ලෝ සහ හතුරු අර්ධ-ලෝහිතයෝ ඊට පිටුපසින් දිවුවා. උමඟ ගොරවමින් වැසී ගියාම, යුද්ධයත් එතැනින් අවසන් වුණා. කැලෑවේ ගිනි ගන්නා හඬ සහ තුවාල ලැබූවන්ගේ හැඬීම් ඇර මුළු එළිමහන් බිම ම නිහඬ වුණා.

මම ඇනබෙත්ට නැගිටින්න උදව් කළා. අපි කයිරොන් ළඟට දිවුවා.

"ඔයා හොඳින් ද?" මම ඇසුවා.

නිස්කාරණේ නැගිටින්න දඟලමින් එයා පැත්තකට ඇලවී සිටියා. "මොන ලැජ්ජාවක් ද," එයා කෙඳිරුවා. "මං හිතන්නෙ මට අවුලක් නැතිවෙයි. වාසනාවට, අපි කකුල කැඩිච්ච නරාශ්වයන්ට... ඌයි... වෙඩි තියන්නැත්තේ."

"ඔයාට උදව් ඕනෑ," ඇනබෙත් කිවුවා. "මම ඇපලෝ කැබින් එකෙන් වෙදෙක්ව එක්ක එන්නම්."

"එපා," කයිරොන් තරයේ කියා සිටියා. "ඊට වඩා අමාරු තුවාලකාරයෝ ඉන්නවා. යන්න! මම හොඳින්. ඒත්, ග්‍රෝවර්... එයා ඒක කරේ කොහොමද කියලා අපි පස්සෙ කතා කරන්න ම ඕනෑ."

"ඒක නම් මාරයි," මම එකඟ වුණා.

ග්‍රෝවර් රතු වුණා. "ඒක කොහෙන් ආව ද කියලා මං දන්නෙ නැහැ."

ජුනිපර් එයාව තදින් වැලඳගත්තා. "මම දන්නවා!"

එයාට වැඩි දෙයක් කියන්න ලැබෙන්න කලින්, ටයිසන් කතා කළා. "පර්සි, ඉක්මනට එන්න! ඒ නිකෝ!"

***

එයාගේ කළු ඇඳුම්වලින් දුම් රොටු නගිමින් තිබුණා. එයාගේ ඇඟිලි මිට මෙළවී තිබුණා. එයාගේ ඇඟ වටා වූ තණකොළ සියල්ල කහ පාටට හැරිලා මැරුණා.

මම මට හැකි තරම් මෘදුව එයාව අනෙක් පැත්තට පෙරළා, එයාගේ පපුව මතින් කන තබා බැලුවා. එයාගේ හදවත යාන්තමින් ගැහෙමින් තිබුණා. "නෙක්ටාර් ටිකක් ගේන්න!" මම මොර දුන්නා.

[illegible]

"[illegible]" [illegible]

[illegible]

[illegible]

"මෙවිලෙන්," [illegible]

"ඔව්, මගේ කොල්ලෝ," [illegible]

[illegible]

[illegible]

[illegible]

"ඇයි" [illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

"ඔව්, මගේ [illegible]" [illegible]

[illegible]

"මගේ [illegible]" [illegible]

[illegible]

"මම වැඩ කරපු විදිහට හිලවු වෙන්න හොඳ වෙන්දියක්," ඩෙඩලස් කිවුවා. "ඇතීනාගේ දරුවෝ ගැන ඔයා කිවුවා හරි, ඇනබෙත්. අපි බුද්ධිමත් වෙන්නත් ඕනැ. ඒත් මම එහෙම වුණේ නැහැ. කවදාහරි දවසක ඔයා මටත් වඩා හොඳ වාස්තු විද්‍යාඥයෙක් වෙයි. මගේ අදහස් අරගෙන ඒවා වැඩි දියුණු කරන්න. යන්නම යන්න කලින් මට කරන්න පුළුවන් එකම දේ මෙච්චරයි."

"හොඳයි," මම කිවුවා. "යන්න ම යනවා? ඒත් ඔයාට නිකං ම සියදිවි නසාගන්න බැහැ. ඒක වැරදියි."

එයා ඔළුව හෙල්ලුවා. "අවුරුදු දෙදහසක් තිස්සේ මම කරපු අපරාධවලින් හැංගිලා ඉන්නවා තරම් වැරදි නැහැ. බුද්ධිමත්කම දුෂ්කරතාවලට සමාව දෙන්නෙ නැහැ, පර්සි. මගේ වෙලාව ඇවිල්ලා. මම මගේ දඬුවම්වලට මුහුණ දෙන්න ම ඕනැ."

"ඔයාට සාධාරණ විනිශ්චයක් ලැබෙන්නෙ නැතිවෙයි," ඇනබෙත් කිවුවා. "මයිනස්ගේ ආත්මේ විනිසුරු ආසනේ ඉඳගෙන-"

"ලැබෙන දෙයක් මම බාරගන්නවා," එයා කිවුවා. "ඒ වගේම ඇති හැටියකට, පාතාල ලෝකයේ යුක්තිය ගැන විශ්වාස කරනවා. අපිට කරන්න පුළුවන් එච්චරයි නේ, නේද?"

එයා එක එල්ලේ ම නිකෝ දිහා බලද්දී, නිකෝගේ මුහුණ අඳුරු වුණා.

"ඔව්," එයා කිවුවා.

"එහෙනම්, ඔයා මගේ ආත්මය හිලවුවට දෙන්න ගන්නවා ද?" ඩෙඩලස් ඇහුවා. "ඔයාට ඒක පාවිච්චි කරලා ඔයාගේ අක්කව ආපහු බේරගන්න පුළුවන්."

"නැහැ," නිකෝ කිවුවා. "මම ඔයාගේ ආත්මය නිදහස් කරන්න ඔයාට උදවු කරන්නම්. ඒත් බියන්කා යන්න ගිහින් ඉවරයි. එයා ගිය තැනක ඉන්න ඕනැ."

ඩෙඩලස් ඔළුව වැනුවා. "බොහෝම හොඳයි, හේඩිස්ගේ පුතුනේ. ඔයා එන්න එන්නම බුද්ධිමත් වෙනවා."

ඊට පස්සෙ එයා මගේ දිහාවට හැරුණා. "තව එක උදව්වක් ඕනැ, පර්සි ජැක්සන්. මට මිසිස් ඕ'ලේරිව තනියම දාලා යන්න බැහැ. ඒ වගේම ආපහු මිනිස් ලෝකෙට යන්න එයාගේ කිසිම ආසාවකුත් නැහැ. ඔයා එයාව බලා ගන්නව ද?"

තවමත් ඩෙඩලස්ගේ [illegible] පෙරළමින්, ඇගෙන් ලෙස [illegible] බැල්ම දීලා මම බැලුවා. මම හිතුවේ මගේ අම්මගේ කවිදු නිවාසයේ බල්ලෝ දෙන්න ආයෙ දෙන්නෙ නැති වෙයි කියලයි. විශේෂයෙන් ම, කවිදු නිවාසයේ වගා ලොකු බල්ලෙක්. "ඔව්. ඇත්තටම මට පුළුවන්." ඒ වුණත් මම කිවුවා.

"එහෙනම් මම මගේ පුතාව බලන්න යන්න ලෑස්තියි... ඒ වගේම පර්ඩික්ස්වත්," එයා කිවුවා. "මට කොච්චර කණගාටුයි ද කියලා මම එයාලට කියන්න ඕනැ."

ඇනබෙත්ගේ ඇස්වල කඳුළු පිරී තිබුණා.

ඩෙඩලස් නිකෝ වෙතට හැරුණා. නිකෝ එයාගේ කඩුව ඇදලා ගත්තා. එයා වයසක නිමැවුම්කරුවාව මරයි කියලා මම මුලින්ම බය වුණත්, එයා නිකංම මෙහෙම කිවුවා විතරයි. "ඔයාගේ වෙලාව ඇවිත් ගොඩක් කල්. නිදහස් වෙලා විවේක ගන්න."

ඩෙඩලස්ගේ මුහුණ පුරා සැනසිලිදායක හිනාවක් පැතිරුණා. එයා ප්‍රතිමාවක් වගේ ගල් ගැහුණා. එයාගේ සිරුර තුළ වූ ලෝකඩ ගියර සහ යාන්ත්‍රික කරකැවිම් අනාවරණය කරමින් එයාගේ සම විනිවිද පෙනෙනසුලු වුණා. ඊට පස්සෙ අළුවලට හැරුණු ප්‍රතිමාව විසිරී ගියා.

මිසිස් ඕ'ලේරී උඩු බුරමින් වැලපුණා. මම එයාගේ ඔළුවට තට්ටු කරමින්, මට හැකි උපරිමයෙන් එයාව සනසන්න උත්සාහ කළා. පොළොව දෙදරවමින් පෞරාණික වංගගිරිය කඩා වැටුණා - ඒ භූමිකම්පාව රට පුරා සෑම ප්‍රධාන නගරයකට ම දැනෙන්න ඇති. කොහේ හෝ තැනක, වයිටන්ගේ ප්‍රතාරක කඳවුරේ ඉතිරිය වැළලී යන්න ඇති කියලා මම බලාපොරොත්තු වුණා.

එළිමහන් බිමේ වී ඇති සංහාරය දෙසත්, මගේ යාළුවන්ගේ වෙහෙසින් බර වූ මුහුණු දෙසත් මම බැලුවා.

"දැන් එන්න," මම එයාලට කිවුවා. "අපිට කරන්න වැඩ තියෙනවා."

# 19

# මණ්ඩලය විදාරණය වුණා

එදා සමුදීම ගොඩක් සිදුවුණා.

කඳවුරේ ආදාහන සළු සිරුරු මතට දමා තියෙනවා මම ඇත්තටම දක්කේ එදා යි. ඒ දසුන නම් ආයේ කවදාවත්ම දකින්න ප්‍රාර්ථනා කරන එකක් නෙවෙයි.

මිය ගිය අය අතර, යෝධයෙකුගේ මුගුරු පහරකට හසු වූ ඇපලෝ කැබිනයේ ලී ෆ්ලෙචර් සිටියා. එයාව කිසිම මෝස්තරයක් නැති රන් පාට සළුවක ඔතා තිබුණා. හතුරු අර්ධ-ලෝහිතයෙකුගෙන් පහර ලැබූ ඩයනයිසියස්ගේ පුතාව මිදි වැල් මෝස්තරයක් එම්බ්‍රොයිඩර් කරන ලද තද දම් පාට සළුවක ඔතා තිබුණා. එයාගේ නම වුණේ කැස්ටර්. අවුරුදු තුනක් පුරාවට කඳවුරේ දී එයාව දකින්න ලැබී තිබුණත්, කවදාවත් එයාගේ නම දැනගන්න උනන්දු නොවීම ගැන මට මං ගැනම ලැජ්ජා හිතුණා. එයාගේ නිවුන් සහෝදරයා පෝලක්ස් වචන කීපයක් කතා කරන්න උත්සහ කළත්, ඒවා එයාගේ උගුරේ හිරවුණා. ඉතින් නිකං ම පන්දම අතට ගත් එයා, රංගාවාටය මැද ඉදි කර තිබූ චිතයකට ගිනි දැල්වුවා. තත්පර ගාණක් තුළ දී ආදාහන සළු සියල්ලට ම ගිනි ඇවිළී, ඈත ඉහළ අහසේ පායා තිබූ තාරකා දෙසට දුම් සහ ගිනි පුලිඟු විසිරුවා.

ඊළඟ දවස අපි ගත කරේ තුවාල ලැබූවන්ට - ඒ කියන්නේ හැමදෙනාටම වගේ ප්‍රතිකාර කරත්තයි. කැලෑවට සිදු වූ හානිය පිරියම් කරන්න සැටර්ලා සහ රුක් දෙවිවරු වෙහෙසුණා.



දහවලේ දී, විදාරිත වැඩිහිටියන්ගේ මණ්ඩලය, කඳවුරේ පූජනීය අරමේ හදිසි රැස්වීමක් පැවැත්වුවා. එයට ජ්‍යෙෂ්ඨ සැටර්ලා තුන්දෙනාත්, රෝද පුටුවේ සිටි කයිරොනුත් සහභාගී වුණා. එයාගේ කැඩුණු අශ්ව කකුල තවමත් සුව වෙමින් පැවතුණු නිසා, ඒක එයාගේ ඇඟේ බර දරාගන්න හැකි තරම් ශක්තිමත් වෙන තුරු එයාට රෝද පුටුවට සීමා වෙලා මාස ගාණක් ඉන්න වෙයි. සැටර්ලාගෙන්, රුක් දෙවිවරුන්ගෙන් සහ වතුරෙන් ගොඩ ආ ජල දෙවඟනන්ගෙන් අරමේ පිරී තිබුණා - සිය ගාණක් දෙනා ඒ විදිහට රැස් වී සිටියේ, මොනවා වෙයි ද කියලා දැනගන්න උනන්දුවෙන්. ජුනිපර්, ඇනබෙත් සහ මම ග්‍රෝවර් ළඟින්ම සිටගත්තා.

ග්‍රෝවර්ව එවෙලේම පිටුවහල් කරන්න සිලෙනස්ට ඕනෑ වුණත්, අඩු තරමේ සාක්ෂිවලට ඇහුම්කන් දෙනකල්වත් ඉන්න කයිරොන් එයාව නම්මගත්තා. ඉතින් පළිඟු ගුහාවේ දී සිදු වූ දේවල් සහ පෑන් කියූ දේවල් අපි සියලු දෙනාටම කිවුවා. ඊට පස්සෙ යුධ පිටියේ දී ග්‍රෝවර් නැගූ අමුතු ශබ්දය ගැනත්, එයින් ටයිටන්ගේ හමුදාව ආපසු පොළොව යටටම පලවා හැරිය හැටිත් යුධ පිටියේ සිටි ඇසින් දුටු සාක්ෂිකරුවන් කීප දෙනෙක්ම විස්තර කළා.

"ඒක පැනික් එකක් (සංත්‍රාසයක්)," ජුනිපර් ස්ථිර ලෙස කියා සිටියා. "ග්‍රෝවර් වනගත දෙවියාගේ බලය කැඳෙව්වා."

"පැනික්?" මම ඇහුවා.

"පර්සි," කයිරොන් පැහැදිලි කර දුන්නා. "දෙවිවරුන්ගේ සහ ටයිටන්වරුන්ගේ පළවෙනි යුද්ධයේ දී, පෑන් උගුරා බිහිසුණු හඬක් පිට කරලා හතුරු සේනා බය කරලා පැන්නුවා. ඒක- ඒක තමයි එයාගේ ලොකුම බලය වුණේ - එදා දවසේ දෙවිවරුන්ට දිනන්න උදවු කළේ ඒ අති විශාල භීතියේ තරංගයයි. ඔයාට පේනවා නේ, 'පැනික්' කියන වචනය හැදුණේ පෑන් නිසයි. ඒ වගේම ග්‍රෝවර්ත් ඒක එයා තුළින් පිටතට කැඳවලා, ඒ බලය පාවිච්චි කළා."

"විකාර!" සිලෙනස් ගිගුරුවා. "පූජනීය දේවල් කෙළෙසනවා! බාගදා වනගත දේවෝත්තමයා අපිට ආශිර්වාදයකින් උදවු කරන්න ඇති. එහෙමත් නැත්නම් ග්‍රෝවර්ගේ සවුත්තු සංගීතය අහන් ඉන්න බැරුව හතුරෝ පැනලා දුවන්න ඇති!"

"ඒක එහෙම නෙවෙයි, සර්," ග්‍රෝවර් කිවුවා. කවුරු හරි මට ඒ වගේ අපහාසයක් කරොත් මම හැසිරෙන්න ඉඩ තිබුණාට වඩා එයා

සිටියේ ගොඩක් සන්සුන්වයි. "එතුමාගේ ජීව බලය අපි හැමෝටම බෙදිලා යන්න සැලැස්සුවා. අපි දන් වැඩ කරන්න පටන් ගන්න ඕනෑ. අපි හැමදෙනා ම වනාන්තර නැවත ඇති කරන්නත්, ඉතුරු වෙලා තියෙන ඒවා ආරක්ෂා කරගන්නත් වැඩ කරන්න ඕනෑ. අපි මේ පණිවුඩය පතුරුවන්න ඕනෑ. පෑන් මිය ගියා. දන් අපිට අපි ඇරෙන්න වෙන කවුරුවත් නැහැ."

"අවුරුදු දෙදහක ගවේෂණයෙන් පස්සේ, ඔයා අපිට විශ්වාස කරන්න කියන්නේ මේක ද?" සිලෙනස් කෑගැසුවා. "කවදාවත් නැහැ! අපි සොයා යාම දිගටම කරගෙන යන්න ඕනෑ! මේ ද්‍රෝහියාව පිටුවහල් කරමු!"

එයට අනුමැතිය දෙමින් වැඩිමල් සැටර්ලා කිපදෙනෙක් කෙඳිරුවා.

"ඡන්දයක්!" සිලෙනස් නියම කළා. "කොහොම වුණත්, මේ විකාර සැටර් කොල්ලව විශ්වාස කරන්නෙ කවුද?"

"මම," හුරුපුරුදු කටහඬක් කිවුවා.

හැමදෙනාම හැරී බැලුවා. දිග අඩි තබමින් අරඹට එමින් සිටියේ ඩයනයිසියස්. චාරිත්‍රානුකූල කළු ඇඳුම් කට්ටලයකින් සැරසිලා, තද දම් පාට ටයි පටියක් පැලඳගෙන, කළු කැරලි කොණ්ඩය පිළිවෙළට පීරා සිටි එයාව මට හඳුනා ගන්නත් බැරිවුණා. පුරුදු පරිදිම එයාගේ ඇස් ලේ රතු පාටට හැරිලා, එයාගේ පිම්බුණු මුහුණ රතු වෙලා තිබුණත්, එයාට තිබුණේ වයින් මතට වඩා දුකින් පෙළෙන පෙනුමක්.

එයා එද්දි සියලුම සැටර්ලා ගෞරවාන්විතව නැගිටලා, නැමී ආචාර කළා. ඩයනයිසියස් අතක් වැනුවාම සිලෙනස් ළඟින් ම පොළොවෙන් අලුත් පුටුවක් ඉහළට වැඩුණා - මිදි වැල්වලින් සෑදුණු සිංහාසනයක්.

එහි වාඩි වූ ඩයනයිසියස් කකුලක් පිට කකුලක් දමාගත්තා. එයා අසුරක් ගැසුවා ම චීස්, ක්‍රැකර් සහ ඩයට් කෝක් සහිත පිඟානක් රැගෙන සැටර් කෙනෙක් යුහුසුලුව ඉදිරියට ආවා.

වයින් දෙවියා රැස්ව සිටි සෙනඟ දිහා බැලුවා. "මං නැතුව පාළු ද?"

සැටර්ලා එකා පිට එකා වැටෙමින් ඔළුව වනන්නත්, නැමිලා ආචාර කරන්නත් ගත්තා. "අනේ, ඔව්, ගොඩාක්, සර්!"



"හොඳයි, මට නම් මෙහෙ නැතුව කිසිම පාළුවක් දනුනේ නැහැ!" ඩයනයිසියස් සැරෙන් කිවුවා. "මම ගෙනාවේ නරක ආරංචි, මගේ යාළුවනේ. නපුරු ආරංචි. සුළු දෙවිවරු පැති මාරු කරනවා. මෝර්ෆියස් හතුරන්ගේ පැත්තට එකතු වෙලා. හෙකේට්, ජානුස් වගේම නෙමෙසිසුත් එහෙමයි. තව කී දෙනෙක් යයි ද කියලා දන්නෙ සියුස් තමයි."

ඈත අහසේ අකුණු ගිගුරුමක් නැගුණා.

"අතැරලා දාන්ඩ," ඩයනයිසියස් කිවුවා. "ඒක සියුස් දන්නෙත් නැහැ. දන්, මට ග්‍රෝවර්ගේ කතන්දරේ අහන්න ඕනෑ. ආපහු, මුල ඉඳලම."

"ඒත්, මගේ උතුමාණෙනි," සිලෙනස් විරෝධය පෑවා. "ඒක නිකං මනස්ගාතයක් විතරයි!"

ඩයනයිසියස්ගේ ඇස් දම් පාට ගින්නකින් ඇවිලුණා. "මගේ පුතා කැස්ටර් මැරුණා කියලා මට දනගන්න ලැබුණේ මේ දනුයි, සිලෙනස්. මම ඉන්නෙ හොඳ මූණුවරකින් නෙවෙයි. මාව සතුටු කරන්න සෑහෙන මහන්සි වෙන්න වෙයි."

තදින් කෙළ ගිල්ල සිලෙනස් ග්‍රෝවර්ට නැවත කතාව පටන් ගන්න ඉඟි කළා.

ග්‍රෝවර් කියලා ඉවර වුණාම, මිස්ටර් ඩී ඔළුව වැනුවා. "ඒක නම් පෑන් කළා කියලා හිතන්න පුළුවන් දෙයක් තමයි. ග්‍රෝවර් කිවුවා හරි. තව දුරටත් ගවේෂණය කරලා පලක් නැහැ. ඔයාලා තම තමන් ගැන හිතන්න පටන් ගත්තොත් හොඳයි." එයා සැටර් කෙනෙක් වෙත හැරුණා. "මට පොතු ඇරපු මිදි අරන් එනවා, මේ දන්ම!"

"එහෙමයි, සර්!" සැටර් බයෙන් දිවුවා.

"අපි මේ ද්‍රෝහියාව පිටුවහල් කරන්න ඕනෑ!" සිලෙනස් කියා සිටියා.

"මම කියන්නේ එපා කියලා," ඩයනයිසියස් එයට එදිරි වුණා. "ඒක තමයි මගේ ඡන්දය."

"මමත් කියන්නෙ එපා කියලා," කයිරොන් එයට එකතු වුණා.

සිලෙනස් ඇට්ටර තාලෙට හොස්ස දිගු කළා. "පිටුවහල් කරනවට එකඟ අය කවුද?"

එයා එක්ක තවත් වැඩිමහල් සැටර්ලා දෙන්නෙක් අත් එසෙව්වා.

"තුනට දෙකයි," සිලෙනස් කිව්වා.

"අහ්, ඔව්," ඩයනයිසියස් කිව්වා. "ඒත් ඔයාගේ අවාසනාවට, දෙවියෙකුගේ ඡන්දයක් දෙසැරයක් ගණන් ගැනෙනවා. එතකොට මම ඒකට විරුද්ධව ඡන්දේ දුන්න නිසා, අපි සමානයි."

සිලෙනස් තරහෙන් නැගිට්ටා. "මේක මහා අවනම්බුවක්! මණ්ඩලය මේ වගේ අවුල් ජාලයක තියෙන්න අරින්න බැහැ."

"එහෙනම් ඒක අවලංගු කරලා දානවා!" මිස්ටර් ඩී කිව්වා. "මට කමක් නැහැ."

සිලෙනස්, එයාගේ යාළුවෝ දෙන්නත් එක්ක දරදඬුව නැමී ආචාර කරලා, අරමෙන් පිටවුණා. තවත් සැටර්ලා විසිදෙනෙක් විතර එයාලා සමග ගියා. ඉතිරි අය අපහසුවෙන් මුමුණමින් වටේට හිටගෙන හිටියා.

"බය වෙන්නෙපා," ග්‍රෝවර් එයාලට කිව්වා. "කරන්න ඕනෑ මොනවද කියලා කියන්න අපිට මණ්ඩලය ඕනෑ නැහැ. අපිටම ඒක හොයාගන්න පුළුවන්."

එයා ආයෙමත් පෑන්ගේ වචන එයාලට කිව්වා - වරකට ටික බැගින් වනාන්තර බේරගන්නෙ කොහොමද කියන එක. එයා සැටර්ලාව කණ්ඩායම්වලට බෙදන්න පටන් ගත්තා - ජාතික වනෝද්‍යානවලට යන්නෙ කවුද, ඉතිරිව ඇති අන්තිම වනගත තැන් හොයන්න යන්නෙ කවුද, ලොකු නගරවල ඇති උයන් ආරක්ෂා කරන්නෙ කවුද.

"හොඳයි," ඇනබෙත් මට කිව්වා. "මට පේන්නෙ ග්‍රෝවර් ලොකු වෙනවා වගේ."

***

එදා හවස ටයිසන් වෙරළට වී බ්‍රයර්ස් සමග කතා කරමින් ඉන්නවා මට දකින්න ලැබුණා. බ්‍රයර්ස් සිටියේ අත් පනහකින් විතර වැලි මාලිගාවක් හදමිනුයි. ඇත්තෙන්ම එයා ඒකට අවධානයක් දක්වමින් නොසිටියත්, එයාගේ අත් ශක්තිමත් ප්‍රාකාර, අගලක් සහ අකුලන පාලමක් සහිත තට්ටු තුනක බලකොටුවක් ඉදිකර තිබුණා.

ටයිසන් සිටියේ වැල්ලේ සිතියමක් අඳිමින්.



"ගල් පරය ළඟින් වමට යන්න," එයා බ්‍රයර්ස්ට කිව්වා. "ඔයාට ගිලිච්ච නැව පෙනෙන තැනින් කෙලින්ම පහළට. ඊට පස්සේ නැගෙනහිරට හැතැම්මක් විතර ගිහින්, කිඳුරු මිනිස්සුන්ගේ සොහොන පහු කරාම, ඔයාට ගින්නක් ඇවිලෙනවා පේන්න ගනියි."

"ඔයා එයාට කම්මල්වලට යන පාර කියලා දෙනවා ද?" මම ඇහුවා.

ටයිසන් ඔළුව වැනුවා. "බ්‍රයර්ස්ටත් උදවු කරන්න ඕනැලු. අපිට අමතක වෙලා ගියපු ගොඩක් හොඳ ආයුධ, සන්නාහ හදන්න එයා සයික්ලොප්ස්ලට කියලා දෙයි."

"මට සයික්ලොප්ස්ලාව බලන්න ඕනෑ," බ්‍රයර්ස් එකඟ වුණා. "මට තවත් නම් තනියම ඉන්න ඕනෑ නෑ."

"එහෙට ගියාම ඔයා තනි වෙයි ද කියලා මට නම් සැකයි," මම කල්පනාබරව කිව්වේ, පොසෙයිඩන්ගේ රාජධානියට යන්න මට තවමත් ඉඩක් ලැබිලා නැති නිසයි. "ඔයාට කරන්න වැඩ ගොඩ ගැහිලා තියෙයි."

බ්‍රයර්ස්ගේ මුහුණ සතුටින් පිරුණු එකකට මාරුවුණා. "ඒක නම් නියමයි! ටයිසන්ටත් මාත් එක්ක යන්න තිබුණා නම්."

ටයිසන් රතු වුණා. "මට මගේ අයියත් එක්ක මෙහෙ ඉන්න ඕනෑ. ඔයාට හොඳට වැඩ කරන්න ලැබෙයි, බ්‍රයර්ස්. ස්තූතියි."

අත්-සියයක් ඇත්තා සිය වතාවක් විතර මට අතට-අත දුන්නා. "අපි ආපහු මුණ ගැහෙයි, පර්සි. මං ඒක දන්නවා!"

ඊට පස්සේ බූවල්ලෙක් වගේ ටයිසන්ව තදින් බදාගත් එයා මුහුදට බැස්සා. එයාගේ අති විශාල ඔළුව රළ අතරේ නොපෙනී යන තුරුම අපි බලා සිටියා.

මම ටයිසන්ගේ පිටට ගැහුවා. "ඔයා එයාට ගොඩක් උදවු කළා."

"මම කරේ එයාට කතා කරපු එක විතරයි."

"ඔයා එයා ගැන විශ්වාසේ තිබ්බා. බ්‍රයර්ස් නොහිටියා නම්, අපිට කවදාවත් කැම්පීව ඉවර කරන්න වෙන්නෙ නැහැ."

ටයිසන් දත් නියෙව්වා. "එයා හොඳට ගල් විසි කරනවා නේ!"

Scanned with CamScanner

මම හිනාවුණා. "ඔව්. එයා හොඳම හොඳට ගල් විසි කරනවා. එන්න යමු. ලොකු යාළුවා. අපි රෑ කෑමට යමු."

***

කඳවුරේ සාමාන්‍ය රෑ කෑම වේලක රස බලන්න ලැබීම සතුටක් වුණා. පොසෙයිඩන්ගේ මේසයේ මාත් එක්ක ටයිසන් වාඩි වී සිටියා. ලෝන්ග් අයිලන්ඩ් මුහුදු තීරයට එපිටින් බැස යන ඉරේ දසුන ලස්සනට පෙනුණා. කඳවුර ආයෙමත් කලින් තිබුණු තත්ත්වයට පත් වෙන්න කොහෙත්ම ඉඩක් නැතිවුණත්, ගිනි උඳුන වෙතට ගිහින් මගේ කෑම වේලෙන් කොටසක් පොසෙයිඩන්ට පූජා කරද්දි, මට ස්තුතිවන්ත වෙන්න ඇත්තටම ගොඩක් දේවල් තියෙනවා කියලා මට දැනුණා. මගේ යාළුවෝ සහ මම තවමත් ජීවතුන් අතර සිටියා. කඳවුර ආරක්ෂිතව තිබුණා. ක්‍රෝනොස්ට පැරදෙන්න සිදු වුණා, අඩු තරමේ ටික කාලෙකටවත්.

මට වද දුන් එකම කාරණය වුණේ, මණ්ඩපය කෙළවරක හෙවණැලි අතරට වී සිටි නිකෝ විතරයි. එයාට හර්මීස් මේසයේ තැනක් වගේම, කයිරොන් සමග ප්‍රධාන මේසයේ තැනක් පවා පිළිග න්වා තිබුණත්, එයා ඒවා ප්‍රතික්ෂේප කරා. රෑ කෑමෙන් පස්සේ, කඳවුරුකරුවෝ පල්ලම් බැස ගියේ ඇපලෝ කැබිනයේ අය අපේ නැති වී ගිය ධෛර්යය නැවත ඉහළ නංවන්න නියම කඳවුරු සාජ්ජයක් පවත්වන්න යොදාගෙන තිබුණු රංගාවාටය දෙසටයි. ඒත් නිකෝ විතරක් අනෙක් පැත්තට හැරී කැලය තුළට අතුරුදහන් වුණා. එයා පසුපස ගියොත් හොඳයි කියලා මම තීරණය කළා.

ගස්වල හෙවණැලි යටින් යද්දි, කොයි තරම් කළුවර වැටිලා ද කියලා මට තේරුණා. මීට කලින් මම කැලෑවට යන්න කවදාවත් බයවෙලා නැති වුණත්, එහි ඇති තරම් රාක්ෂයෝ ඉන්න බව මම දැනගෙන හිටියා. ඒ වුණත්, ඊයේ සිදු වූ යුද්ධය ගැන මතක් වෙද්දි, මම පුදුම වුණේ මීට පස්සේ කවදාවත් ඒ බිහිසුණු සටන් ගැන සිහිපත් නොවී මට මේ කැලෑවේ ඇවිදින්න බැරිවෙයි ද කියලයි.

මට නිකෝව දැකගන්න බැරිවුණා, ඒත් විනාඩි තුන හතරක් ඇවිදගෙන ගියාම මට ඉදිරියෙන් දිලිසුමක් පෙනුණා. මුලින් ම මම හිතුවේ නිකෝ පන්දමක් පත්තු කරගෙන කියලයි. ඒත් ළඟට යද්දි, ඒ දිලිසෙන්නේ අවතාරයක් කියලා මට තේරුණා. බියන්කා ඩි ආන්ජෙලෝගේ සැලෙමින් දිලිසෙන රුව එළිමහන් බිමේ සිටගෙන,



එයාගේ සහෝදරයාට හිනාවක් පාමින් සිටියා. නිකෝට යමක් කියූ බියන්කා එයාගේ මූණ අතගෑවා - නැත්නම් ඒකට උත්සහ කරා. ඊට පස්සෙ එයාගේ රූපය වියැකී ගියා.

ආපසු හැරුණු නිකෝ මාව දැක්කා. ඒත් එයා කේන්ති ගත් බවක් පෙනුනේ නැහැ.

"එයාට සමු දුන්නා," එයා බැරෑඩි හඬින් කිවුවා.

"රෑ කෑම වෙලාවේදි අපි ඔයාව හෙව්වා," මම කිවුවා. "ඔයාට ඇවිත් මාත් එක්ක ඉඳගන්න තිබුණා නේ."

"බැහැ."

"නිකෝ, ඔයාට හැම කෑම වේලක්ම මග අරින්න බැහැ. ඔයා හර්මීස්ලා එක්ක ඉන්න කැමති නැත්නම්, සමහරවිට එයාලා මේ පාරට වෙනසක් කරලා, ඔයාට මහ ගෙදර ඉන්න දෙයි. එහෙ ඕනෑ තරම් කාමර තියෙනවා."

"මම නවතින්නෙ නැහැ, පර්සි."

"ඒත්... ඔයාට එහෙම නිකංම යන්න බැහැ. තනි අර්ධ-ලෝහිතයෙක්ට එළියේ ගොඩාක් අනතුරුදායකයි. ඔයා පුහුණු වෙන්න ඕනෑ."

"මම මැරුණු අය එක්ක පුහුණු වෙන්නම්," එයා ඒකාන්ත ලෙස කිවුවා. "මේ කඳවුර මට හරියන්නෙ නැහැ. එයාලා මෙහෙ හේඩීස්ට කැබින් එකක් හැදුවේ නැති හේතුවක් තියෙනවා, පර්සි. ඔලිම්පස්වලට වගේම, මෙහෙටත් එයාව පිළිගන්නෙ නැහැ. මාව මෙහෙට අයිති නැහැ. මට යන්න වෙනවා."

එයා එක්ක තර්ක කරන්න මට ඕනෑ වුණත්, එයා කියන කතාව හරි කියලා මගේ කොටසක් දැනගෙන හිටියා. මම ඒකට අකමැති වුණත්, නිකෝට එයාගේම, අඳුරු පාරක් හොයාගන්න වෙනවා. පෑන්ගේ ගුහාවේ දි, වනගත දෙවියා අපි හැමෝටම තනි තනිව ඇමතූ හැටි මට සිහිවුණා... නිකෝට ඇරෙන්න.

"ඔයා කවදද යන්නේ?" මම ඇසුවා.

"මේ දැන්ම. මට ප්‍රශ්න ටොන් ගාණක් තියෙනවා. මගේ අම්මා කවුද? බියන්කාටයි මටයි ඉස්කෝලෙ යන්න සල්ලි ගෙව්වේ කවුද?

අපිව ලෝටස් හෝටලෙන් එළියට ගත්ත තීතීඇයා කවුද? මගේ අතීතේ ගැන මම කිසිම දෙයක් දන්නෙ නැහැ. මට ඒවා හොයාගන්න ඕනෑ."

"ඒකත් ඇත්ත." මම පිළිගත්තා." ඒත් අපිට තරඟකාරයෝ වෙන්න සිද්ධ වෙන්නෙ නැහැ කියලා මම හිතනවා."

එයාගේ බැල්ම පහත වැටුණා. "මුරණ්ඩු වුණාට මට සමා වෙන්න. ඔයා බියන්කා ගැන කිවුව දේවල් මට අහන්නයි තිබුණේ."

"මේ, ඒක නෙවෙයි..." මම සාක්කුවෙන් දෙයක් පිටතට ඇදලා ගත්තා. "අපි කැබින් එක අස් කරද්දි ටයිසන්ට මේක හම්බ වුණා. ඔයාට ඒක ඕනෑ වෙයි කියලා හිතුණා." ඊයම්වලින් සෑදූ හේඩීස්ගේ චූටි ප්‍රතිමාව මම දිගු කළා - පහුගිය ශීත සෘතුවේ කඳවුරෙන් පැනලා යද්දි නිකෝ දාලා ගිය මිතොමැජික් ප්‍රතිමාව.

නිකෝ අදිමදි කළා. "මම දැන් ඒ සෙල්ලම කරන්නෑ. ඒක හොඳ පොඩි එවුන්ට."

"මේකට ප්‍රහාරක බල හාරදාහක් තියෙනවා," එයාව උපායෙන් පොළඹවාගන්න මම උත්සහ කළා.

"පන්දාහක්," නිකෝ නිවැරදි කළා. "ඒත් ඔයාගේ හතුරා මුලින් පහර දුන්නොත් විතරයි."

මම හිනාවුණා. "සමහරවිට ඉඳලා හිටලාවත් ආයෙමත් පොඩි එකෙක් වෙන එකේ වරදක් නැහැ." මම ප්‍රතිමාව එයාට දැමුවා.

ඒක අත්ල මත තබාගෙන තත්පර කීපයක් බලා සිටි නිකෝ ඊට පස්සෙ ඒක සාක්කුවට ඔබාගත්තා. "ස්තූතියි."

මම අත දිගු කළා. එයා පසුබාමින් මට අතට-අත දුන්නා. එයාගේ අත අයිස් වගේ සීතල වුණා.

"මට හොයලා බලන්න ගොඩක් දේවල් තියෙනවා," එයා කිවුවා. "සමහර ඒවා... මෙහෙමයි, මට ප්‍රයෝජනවත් දෙයක් ඉගෙන ගන්න ලැබුනොත්, මම ඔයාට දන්වන්නම්."

එයා අදහස් කළේ මොකක්ද කියලා මට හරියට ම විශ්වාසයක් නැති වුණත්, මම ඔළුව වැනුවා. "විස්තර දන්වන්න, නිකෝ."

ආපසු හැරුණු එයා කැලෑව ඇතුළට හෙමින් ගමනෙන් යන්න ගියා. එයා ඇවිදගෙන යද්දි හෙවණැලි එයා වෙතට නැමෙනවා වගෙයි



පෙනුණේ. හරියට ඒවා එයාගේ අවධානය ලබාගන්න දඟලනවා වගෙයි.

මට හරියටම පිටුපසින් කවුදෝ කතා කළා. "කරදර ගොඩක ඉන්න පොඩි මිනිහා අන්න යනවා."

හැරී බැලූ මට දකින්න ලැබුණේ තවමත් කළු ඇඳුම් කට්ටලයෙන් සැරසී සිටින ඩයනයිසියස්වයි.

"එන්න මාත් එක්ක," එයා කිවුවා.

"කොහෙටද?" මම ඇසුවේ සැකයෙන්.

"කඳවුරු ගිනිමැලේ ළඟට විතරයි," එයා කිවුවා. "මට ටිකක් හොඳ ගතියක් දැනෙන්න ගත්තා. ඉතින් මං හිතුවා ඔයා එක්ක ටිකක් කතා කරොත් හොඳයි කියලා. මාව තරහා ගස්සන්න ඔයාට හැම වෙලාවෙම පුළුවන් නේ."

"අහ්, ස්තූතියි."

අපි නිහඬව කැලෑව මැදින් ඇවිද ගියා. ඩයනයිසියස් අඩිය තබා යන්නේ වාතය මත බව මට දකින්න ලැබුණා. එයාගේ ඔප දැමූ කළු සපත්තු පොළොවෙන් අඟලක් ඉහළින් පාවෙමින් ගියා. එයා මඩ ගාගන්න අකමැති ඇති කියලා මම හිතුවා.

"අපිට පාවාදීම් ගොඩකට මූණ දෙන්න වුණා," එයා කිවුවා. "මේ වෙන දේවල් ඔලිම්පස්වලට හොඳ පාටක් පේන්නෙ නැහැ. ඒ වුණත් ඔයයි ඇනබෙතුයි මේ කඳවුර බේරගත්තා. ඒකට මම ඔයාට ස්තූති කරන්න ඕනෑ ද කියලා මට සහතික නැහැ."

"ඒක හැමෝම එකතු වෙලා කරපු දෙයක්."

එයා උරහිස් ඇකිළුවා. "ඒ වුණත්, මං හිතන්නේ, ඔය දෙන්නා කරපු දේ සෑහෙන වටිනවා. මං හිතුවේ ඔයා දැනගත්තොත් හොඳයි කියලා - ඒක සම්පූර්ණයෙන් ම අපතේ ගියේ නැහැ."

අපි රංගාවාටයට ළඟා වුණා, ඩයනයිසියස් කඳවුරු ගිනිමැලය දෙසට අත දිගු කර පෙන්වූවා. ක්ලැරිස්ගේ උරට උර හේත්තු වී ලොකු හිස්පැනික් (ස්පාඤ්ඤ භාෂාව කතා කරන රටවලට අයත්) කොල්ලෙක් විහිළු කතාවක් කියමින් සිටියා. ඒ ක්‍රිස් රොඩ්‍රිගස්, වංගගිරියේ දි උමතු වූ අර්ධ-ලෝහිතයා.

මම ඩයනයිසියස් වෙතට හැරුණා. "ඔයා එයාව සනීප කරා ද?"

"උමතුව කියන්නේ මගේ විශේෂ ඥානයක්. ඒක ගොඩක් ලේසි වුණා."

"ඒත්... ඔයා හොඳ දෙයක් කරලා. ඇයි ඒ?"

එයා ඇහිබැමක් එසෙව්වා. "මම හොඳයි තමයි! මගෙන් හොඳ වැස්සෙනවා, පෙරී ජොහැන්සන්. ඔයාට ඒක තේරිලා නැද්ද?"

"අහ්-"

"බාගදා මගේ පුතාගේ මරණය ගැන මට දුකක් දැනිච්ච නිසා වෙන්නැති. බාගදා මේ ක්‍රිස් කොල්ලට දෙවෙනි අවස්ථාවක් ලැබෙන්න ඕනෑ කියලා මට හිතුණ නිසා වෙන්න ඇති. කොහොම වුණත්, ඒකෙන් ක්ලැරිස්ගේ මූණුවර හොඳ අතට හැරිලා වගේ."

"ඇයි ඔයා මට මේවා කියන්නේ?"

වයින් දෙවියා සුසුමක් හෙළුවා. "ඔහ්, හේඩීස් දනී ඇයි කියලා. ඒත් මතක තියාගන්න, කොල්ලෝ, සමහර වෙලාවට කාරුණික ක්‍රියාවක් කඩුවක් තරමට ම බලවත්. මනුස්සයෙක් වෙලා හිටපු කාලේ මම කවදාවත් හොඳ සටන්කාරයෙක්වත්, ක්‍රීඩකයෙක්වත්, කවියෙක්වත් වුනේ නැහැ. මම කළේ වයින් හදපු එක විතරයි. මගේ ගමේ හිටපු එවුන් මට හිනාවුණා. මට කවදාවත් කිසිම දෙයක් හම්බ කරන්න වෙන්නෙ නැහැ කියලා උන් කිවුවා. ඒත් දැන් මගේ දිහා බලන්න. සමහර වෙලාවට පුංචි දේවල්වලට ගොඩක් ලොකු වෙන්න පුළුවන්."

මට ඒ ගැන තනියම හිතන්න ඇරලා එයා යන්න ගියා. ඒ අතරේ කාටවත් පේන්නෙ නැහැ කියලා හිතාගෙන, කළුවරේ අත් අල්ලාගෙන, මෝඩ කඳවුරු සිංදු කියන ක්ලැරිස්ව සහ ක්‍රිස්ව දකිද්දී මට හිනා නොවී ඉන්න බැරිවුණා.

# 20

# මගේ උපන් දින සාදයට ආව අමුතු අමුත්තා

ගිම්හානයේ ඉතිරි කාලය කොයි තරම් සාමාන්‍ය විදිහට ගතවුණා ද කියනවා නම් ඒක දැනුණේ හරිම අසාමාන්‍ය විදිහටයි. දිනපතා ක්‍රියාකාරකම් නොකඩවා සිදුවුණා: දුනු හරඹ පුහුණුව, ගල් කඳු නැගීම, පෙගසස් පැදීම. අපි කොඩිය ඇල්ලීමේ තරඟයක් පැවැත්වූවා (හැබැයි අපි හැමෝම සියුස්ගේ මුෂ්ටිය පැත්ත මග ඇරියා). අපි කඳවුරු ගිනිමැලය ළඟ දි සිංදු කිවුවා, කරත්ත තරඟ පැවැත්වූවා වගේම අනෙක් කැබින්වල අයව රවටන විහිළු කරලා විනෝද වුණා. මම ටයිසන් සමගත්, මිසිස් ඕ'ලෙරී සමග සෙල්ලම් කරමිනුත් වැඩි කාලයක් ගත කළා. ඒත් පරණ ස්වාමියා නැති පාළුවෙන් මිසිස් ඕ'ලෙරී තවමත් රෑට උඩු බිරුවා. ඇනබෙත් සහ මම හැකි තරම් එකිනෙකාව මග අරිමින් කල් යැවූවා. එයා එක්ක ඉන්න මම සතුටු වුණත්, ඒක වේදනාකාරී දෙයකුත් වුණා. ඒ වගේම එයත් එක්ක ඉන්න නොලැබීමත් වේදනාවක් වුණා.

මට එයා සමග ක්‍රෝනොස් ගැන කතා කරන්න ඕනෑ වුණත්, ලූක්ව කතාවට ඇදා නොගෙන තව දුරටත් ඒක කරන්න පුළුවන්කමක් තිබුනේ නැහැ. ඒ නිසාම මට ඒ මාතෘකාව ඇදලා ගන්න බැරිවුණා. මම ඒකට උත්සහ කළ හැම වතාවකදි ම එයා මගේ කට වැහුවා.

හතරවෙනිදා වෙරළේ පැවැත්වූ ගිනිකෙළි සංදර්ශනයත් එක්ක ජූලි මාසය ගෙවී ගියා. අගෝස්තු මාසය කොයි තරම් උණුසුම් වෙන්න

Scanned with CamScanner

ගන්නා ද කියනවා නම් කෙත්වල ස්ට්‍රෝබෙරි කර වී යන්න පටන් ගන්නා. අන්තිමේ දී, කඳවුරේ අවසන් දවස උදාවුණා. උදේ කෑමෙන් පස්සේ මගේ ඇඳ අසල මේසය උඩින් මතු වූ සම්මත ආකාරයේ ලිපියේ, මම මධ්‍යන්තයෙන් පසුවත් කැබිනයේ රැඳුනොත්, පිරිසිදු කිරීම් කරන හාර්පිලා මාව ආහාරයට ගන්න බව දන්වා අනතුරු අඟවා තිබුණා.

පෙරවරු දහය වෙද්දි මම අර්ධ-ලෝහිත කඳු මුදුනට වී බලා සිටියේ කඳවුරු වෑනය මාව නගරයට රැගෙන යන්න එන තුරුයි. මිසිස් ඕ'ලෙරීව කඳවුරේ නවතා යන්න මම කටයුතු සූදානම් කර තිබුණේ, කයිරොන් එයාව බලාගන්න පොරොන්දු වුණ නිසයි. අවුරුද්දේ ඉතිරි කාලයේ දි මාරුවෙන් මාරුවට ඇවිත් එයාව බලලා යන්න ටයිසනුයි මමයි කතා කරගත්තා.

ඈනබෙත් මාත් එක්ක මැන්හැටන් දක්වා යන්න එයි කියලා මම බලාපොරොත්තුවෙන් හිටියත්, එයා ආවේ මාව ඇරලවන්න විතරයි. තව ටික කාලයක් කඳවුරේ නවතින්න කටයුතු සූදානම් කරගත් බව එයා මට කිවුවා. කයිරොන්ගේ කකුල හොඳටම සුව වෙනකල් එයාට සාත්තු කරන්නත්, පහුගිය මාස දෙක පුරාවටම එයාගේ අවධානය මුළුමනින්ම යොමු වී තිබුණු ඩෙඩලස්ගේ ලැප්ටොප් පරිගණකයේ ඇති දේවල් තව දුරටත් අධ්‍යයනය කරන්නත් එයා යොදාගෙන තිබුණා. ඊට පස්සේ එයා සැන් ෆ්‍රැන්සිස්කෝවල එයාගේ තාත්තා ළඟට යන බව කිවුවා.

"මම එහෙ පෞද්ගලික ඉස්කෝලෙකට යන්නයි හදන්නේ," එයා කිවුවා. "මට හිතෙන්නෙ ඒක එපා කරපු තැනක් වෙයි, ඒ වුණත්..." එයා උරහිස් ඇකිළුවා.

"ඔව්, හොඳයි, මට කෝල් කරන්න, හරි ද?"

"අනිවාර්යයෙන්," එයා කිවුවේ උදාසීනවයි. "මම ඇහැ ගහගෙන ඉන්නම්..."

ඔන්න ආයෙමත් ඒක. ලූක්. එයාට වේදනාවයි, දුකයි, තරහයි පිරුණු ලොකු පෙට්ටගමක් අරින්නෙ නැතිව එයාගේ නමවත් කියන්න පුළුවන් වුනේ නැහැ.

"ඈනබෙත්," මම කතා කළා. "අනාවැකියේ ඉතුරු ටික මොකක්ද?"



එයා ඈතින් පෙනෙන කැලෑව දෙසට ඇස් හරවා ගත්තා. ඒත් එයා කිසිවක් කිවුවේ නැහැ.

"'*නුඹට අනන්ත වංගගිරියේ අන්ධකාරය තුළ කණින්න සිදු වේවි,*'" මම මතක් කරා. "'*මළගිය ඇන්නා, ද්‍රෝහියා සහ නැති වූ නැනැත්තා නැගී සිටීවි.*' අපි මළගිය එවුන් ගොඩක් නැගිට්টුවා, අපි ඊතන් නාකමුරාව බේරගත්තා. පස්සෙ බලනකොට එයා ද්‍රෝහියෙක් වුණා. අපි පෑන්ගේ ජීව බලය හොයාගත්තා, එයා තමයි නැතිවුණ නැනැත්තා."

ඈනබෙත් ඔළුව හෙල්ලුවේ එයාට මාව නවත්වන්න ඕනෑ වගෙයි.

"'*නත රජුගේ සුරතින් නුඹගේ නැග්ම හෝ බැස්ම සිදු වේවි,*'" මම කියාගෙන ගියා. "මම හිතාගෙන හිටිය විදිහට ඒ මයිනස් නෙවෙයි. ඒ නිකෝ. අපේ පැත්ත තෝරගෙන, එයා අපිව බේරුවා. එතකොට *ඇතීනාගේ දරුවා අවසන් වරට නැගී සිටීම*- ඒ ඩෙඩලස්."

"පර්සි-"

"'*වීරයෙකුගේ අවසන් හුස්මෙන් සියල්ල විනාශ වේවි.*' දැන් ඒකේ තේරුමක් පේනවා. වංගගිරිය විනාශ කරන්න ඩෙඩලස් මැරුණා. ඒත් මොකක්ද අන්තිම-"

"'*මරණයටත් අන්ත ලෙස ආදරයක් අහිමි වේවි.*'" ඈනබෙත්ගේ ඇස්වල කඳුළු පිරී තිබුණා. "ඒක තමයි අන්තිම පේළිය, පර්සි. ඔයාට දැන් සතුටුයි ද?"

ඉරේ උණුසුම මොහොතකට කලින් තිබුණාට වඩා අඩුවුණා වගෙයි මට දැනුණේ. "ඔහ්," මම කිවුවා. "ඒ කියන්නේ ලූක්-"

"පර්සි, අනාවැකියේ කියවුණේ කවුරු ගැන ද කියලා මම දැනගෙන හිටියෙ නැහැ. මම- මම දැනගෙන හිටියෙ නැහැ ඒ..." එයා අසරණ ලෙස ගොත ගැහුවා. "ලූක්යි මමයි- අවුරුදු ගාණක් තිස්සේ, මං ගැන ඇත්තටම හොයලා බැලුවේ එයා විතරයි. මං හිතුවේ..."

එයාට තව දුරටත් කතා කරන්න ඉඩක් ලැබෙන්න කලින්, අපි ළඟින් දිප්තිමත් එළියක් මතුවුණේ හරියට කවුරු හරි වාතය මත රන් තිරයක් ඇරියා වගෙයි.

"ඔයාට සමාව ඉල්ලන්න කාරණයක් නැහැ, මගෙ දරුවෝ." "ඔයාට සමාව ඉල්ලන්න කාරණයක් නැහැ, මගෙ දරුවෝ."

කරලකට ගොතා උරහිසක් මතින් ඉදිරියට දමාගෙන සිටි උස ගැනු කෙනෙක්.

"හේරා," ඇනබෙත් කිවුවා.

දෙවගන හිනාවක් පෑවා. "ඔයා කරයි කියලා මම හිතුව විදිහටම. ඔයා පිළිතුරු හොයාගත්තා. ඔයාගේ ගවේෂණය සාර්ථකයි."

"සාර්ථකයි?" ඇනබෙත් ඇහුවා. "ලූක් නැත්තටම නැතිවෙලා. ඩේඩලස් මැරුණා. පෑන් මැරුණා. ඒක කොහොමද-"

"අපේ පවුල ආරක්ෂිතයි," හේරා කියා සිටියා. "අනිත් අය නැතිවුණ එකමයි හොඳ, මගෙ දරුවෝ. මට ඔයා ගැන ආඩම්බරයි."

මගේ අත් මිට මෙළවුණා. එයා මෙහෙම කතාවක් කිවුවා කියලා මට අදහන්නත් බැරිවුණා. "අපිට ගොවිපොළ හරහා යන්න ඉඩ දෙන්න ගැරියන්ට ගාස්තුව ගෙවුවේ ඔයා, එහෙම නේද?"

හේරා උරහිස් ඇකිළුවා. එයාගේ ඇඳුම දේදුනු පාටවලින් දිලිහුණා. "මට ඕනෑ වුණේ ඔයාලගේ ගමන ඉක්මන් කරවන්න."

"ඒත් ඔයා නිකෝ ගැන බැලුවෙ නැහැ. එයාව ටයිටන්ලා අතට යනවා දකින්න ඔයා සතුටු වුණා."

"ඔහ්, කරුණාකරලා." හේරා එය ඉවත දමමින් අතක් වැනුවා. "එයා හේඩීස්ගේ පුතෙක්. කාටවත් එයාව තියාගන්න ඕනෑ නෑ. එයා අපිට අයිති කෙනෙක් නෙවෙයි."

"හෙෆාස්ටස් කිවුවා හරි," මම තරහෙන් ගෙරෙව්වා. "ඔයාට වැදගත් ඔයාගේ අංගසම්පූර්ණ පවුල විතරයි. අනිත් මිනිස්සු නෙවෙයි."

එයාගේ ඇස් අනතුරුදායක ලෙස දිප්තිමත් වුණා. "පරිස්සම් වෙන්න, පොසෙයිඩන්ගේ පුතුයෝ. ඔයා දන්න තරමටත් වඩා මම වංගගිරියෙදි ඔයාට පිහිට වුණා. ඔයා ගැරියන්ට මූණ දෙන වෙලාවේ මම ඔයා එක්ක හිටියා. ඔයාගේ රිතලේ ඉලක්කයට යන්න මම ඉඩ දුන්නා. මම ඔයාව කැලිප්සෝගේ දූපතට යැවුවා. මම ටයිටන්ගේ කන්දට යන පාර ඇරලා දුන්නා. ඇනබෙත්, මගෙ දරුවෝ, අනිවාර්යයෙන්ම ඔයාට පේනවා ඇති මම කොයි තරම් උදවු කරා ද කියලා. මගේ උත්සහය වෙනුවෙන් දෙන පූජාවක් මම සතුටින් බාරගන්නවා."

ඇනබෙත් පිළිමයක් වගේ නොසෙල්වී සිටියා. එයාට තිබුණේ ස්තුතියි කියන්නයි. එයාට තිබුණේ කෑම වෙලාවට ගිනි උඳුනට



බා'බකියු ටිකක් දාන්න පොරොන්දු වෙන්නයි, එහෙනම් හේරා මේ සියල්ලම අමතක කර දමාවි. ඒත් එයා කළේ හිතුවක්කාර ලෙස දත්මිටි කෑව එකයි. එයා හිටියේ හරියටම එයා ස්ෆින්ක්ස්ට මුහුණ දුන් වෙලාවේ සිටි විදිහටමයි - හරියට, එයා මොන තරම් ලොකු කරදරේක වැටුණත් ලේසි උත්තරයක් පිළිගන්න ලෑස්ති නැහැ වගෙයි. ඒක මම ඇනබෙත්ගේ කැමති ම ගතිගුණවලින් එකක් කියලා මට ඒ වෙලාවේ තේරුම් ගියා.

"පර්සි කිවුවා හරි." එයා දෙවගනට පිටුපා හැරුණා. "මේකට අයිති නැති කෙනා ඔයයි, හේරා දේවි. ඒ නිසා ඊළඟ වතාවේ, බොහෝම ස්තුතියි... ඒත් ඔයාගේ උදවු නැතුවට කමක් නැහැ."

හේරාගේ රැවුම එම්පොසා කෙනෙකුටත් වඩා අන්ත වුණා. එයාගේ රූපය දිලිසෙන්න පටන් ගත්තා. "මේ කරපු අපහාසය ගැන ඔයා පසුතැවෙයි, ඇනබෙත්. මේකට ඔයාට ගොඩාක් පසුතැවෙන්න වෙයි."

දෙවගන එයාගේ සැබෑ දිව්‍යමය ස්වරූපයට හැරිලා, ආලෝක කදම්බයක් තුළට චූත වී යද්දි මම ඇස් මුවා කරගත්තා.

කඳු මුඳුන නැවතත් සාමකාමී වුණා. පයින් ගහ ළඟ, පෙලියස් මකරා කිසිවක් සිදු නොවූ ගාණට රන් සළුව යට නිදි කිරමින් සිටියා.

"මට සමා වෙන්න," ඇනබෙත් කිවුවා. "මම- මම ආපහු ගියොත් හොඳයි. මම ඔයාට කතා කරන්නම්."

"අහන්න, ඇනබෙත්-" සෙන්ට් හෙලේන්ස් කන්ද සහ කැලිප්සෝගේ දූපත ගැනත්, ලූක් සහ රේචල් එලිසබෙත් ඩෙයාර් ගැනත්, එක පාරටම හැමදෙයක් ම ගොඩක් සංකීර්ණ අතට හැරුණු විදිහ ගැනත් මම කල්පනා කළා. මට ඇනබෙත්ට කියන්න ඕනෑ වුනේ මට එයාගෙන් මේ තරම් ඈත් වෙන්න ඇත්තටම ඕනෑ නැහැ කියලයි.

ඒ වෙලාවේ පහළ පාරේ සිට ආර්ගස් තළා හැඬවූවා, ඉතින් මට මගේ අවස්ථාව නැති වුණා.

"ඔයා දුන් ගියොත් හොඳයි," ඇනබෙත් කිවුවා. "පරිස්සමෙන්, පාසි මොළේ."

එයා කන්ද පහළට දිවුවා. එයා කැබින්වලට ළඟා වෙන තුරු මම බලා සිටියා. එයා එකම වතාවක්වත් ආපහු හැරිලා බැලුවේ නැහැ.

***

Scanned with CamScanner

දවස් දෙකකට පස්සේ මගේ උපන් දිනය ආවා. මම කවදාවත් ඒ දවස ප්‍රසිද්ධ කරලා නැහැ. මොකද හැම අවුරුද්දක ම ඒක යෙදෙන්නේ හරියට ම කඳවුරු කාලය ඉවර වුණාමයි. ඒ නිසා මගේ කඳවුරු යාළුවෝ කාටවත් එන්න හැකියාවක් නැති වුණා. ඒ වගේම මට වැඩිය මනුෂ්‍ය යාළුවෝ හිටියෙත් නැහැ. ඇරත්, අවුරුදු දහසය ලැබුවාම මම ලෝකය විනාශ කරනවා හෝ බේරගන්නවා කියලා මහා අනාවැකියේ කියවුණු දා ඉඳන්, වයසට යෑම සමරන්න පුළුවන් දෙයක් වගේ මට දැනුනේ නැහැ. දැන් මට පහළොව ලබා තිබුණා. මගේ කාලය ඉවර වෙමින් තිබුණා.

මගේ අම්මා අපේ ගෙදර පුංචි සාදයක් සූදානම් කළා. පෝල් බ්ලෝෆිස් ඒකට ආවා. ඒත් ඒක ප්‍රශ්නයක් නොවුණේ, කයිරොන් මීදුමක් මෙහෙයවා, ගුඩ් ඉස්කෝලේ හැමදෙනාටම සංගීත කාමරයේ දි සිදුවුණ දේට මගේ සම්බන්ධයක් නැති බව ඒත්තු ගන්වා තිබුණු නිසයි. දැන් පෝල් වගේම අනෙක් අයත් හිතාගෙන හිටියේ කෙලී කියන්නේ පිස්සු හැදුණ, ගිනි-බෝම්බ විසි කරන චියර්ලීඩර් කෙනෙක් කියලත්, මම එයා කරපු දේවල්වලට බයේ දුවපු අහිංසකයෙක් විතරයි කියලයි. ලබන මාසයේ ඉඳන් ආධුනිකයෙක් විදිහට ගුඩ් ඉස්කෝලේ ඉගෙනීම පටන් ගන්න මට තවමත් අවසර තිබුණා. හැම අවුරුද්දකම ඉස්කෝලෙකින් පිටුවහල් වීමේ මගේ වාර්තාව නොකඩවා තියාගන්න නම්, මට වඩාත් මහන්සි වෙන්න සිදු වී තිබුණා.

ටයිසනුත් මගේ සාදයට ආවා. ඉතින් මගේ අම්මා නිල් පාට කේක් දෙකක් වැඩිපුර හැදුවේ එයාටමයි. මගේ අම්මට බැලූන් පුම්බන්න ටයිසන් උදවු කරන අතරේ, මුළුතැන්ගෙයි වැඩවලට උදවු වෙන්න කියලා පෝල් බ්ලෝෆිස් මට කතා කළා.

අපි බීම වත් කරන අතරේ එයා කතා කළා, "ඔයාගේ අම්මා මේ වාරේ ඔයාට ලයිසන් අරන් දෙන්න බඳවන්න යනවා කියලා මට අහන්න ලැබුණා."

"ඔව්. ඒක නම් නියමයි. මං ඉවසිල්ලක් නැතුව ඉන්නේ."

ඇත්තටම, මගේ රියැදුරු බලපත්‍රය ලබාගන්න තුරු මම කාලයක් තිස්සේ ආසාවෙන් හිටියත්, තව දුරටත් මගේ හිතේ ඒ ආසාව නැති බව මට දැනුණා. ඒ වගේම පෝල්ටත් ඒ බව තේරිලා වගෙයි. සමහර වෙලාවට එයා මගේ දිහා බලලා, මගේ හිතේ තියෙන දේවල්



හරියටම තේරුම් ගන්න විදිහ දකිද්දි, මට කයිරොන්ව සිහිවුණා. මං හිතන්නේ ඒක ගුරුවරුන්ගේ බලය වෙන්නැති.

"ඔයාට මේ ගිම්හානේ කරදර ගොඩක් වෙලා වගෙයි," එයා කිවුවා. "මට හිතෙන්නේ ඔයාට කවුරු හරි වැදගත් කෙනෙක්ව නැතිවෙලා. තව... ගැනු ළමයෙකුගේ හුටපටයකුත් තියෙනවා නේද?"

මම එයා දිහා බැලුවේ පුදුමයෙන්. "ඔයා කොහොමද ඒක දන්නේ? මගේ අම්මා-"

එයා අත් එසෙව්වා. "ඔයාගේ අම්මා කිසි දෙයක් කිවුවෙ නැහැ. මම ඔපාදුප භාරවුස්සන්න යන්නෙ නැහැ. හැබැයි ඔයාගේ මොකක්දෝ අමුත්තක් තියෙනවා කියලා මම දන්නවා, පර්සි. මට තේරුම් ගන්න බැරි ගොඩක් දේවල් ඔයාගේ ජීවිතේ වෙනවා. ඒත් මමත් කාලයක් අවුරුදු පහළොවක කොල්ලෙක් වෙලා හිටියා නේ, ඉතින් ඔයාගේ මූණේ හැටි දැක්කාම මට හිතෙන්නේ... හොඳයි, ඔයාට අමාරු කාලයක් ගෙවන්න වෙලා කියලා."

මම ඔළුව වැනුවා. පෝල්ට මං ගැන ඇත්ත කියනවා කියලා මම අම්මට පොරොන්දු වෙලා තිබුණත්, මේ ඒකට වෙලාව නෙවෙයි කියලා මට හිතුණා. දැන්ම නෙවෙයි. "මම යන කඳවුරේ යාළුවෝ දෙන්නෙක් නැතිවුණා," මම කිවුවා. "මං කිවුවේ, ළඟම යාළුවෝ නෙවෙයි, ඒ වුණාට-"

"මට කණගාටුයි,"

"ඔව්. තව, අහ්, මං හිතන්නේ කෙල්ලෙක් ගැනත්...."

"මෙන්න." පෝල් මගේ අතට බීම එකක් දුන්නා. "ඔයාගේ පහළොස් වෙනි උපන්දිනේට. ඒ වගේම ඉස්සරහට එන අවුරුද්ද වඩාත් හොඳ වෙන්න."

අපි බීම බොන්න කලින් අපේ කඩදාසි කෝප්ප එකිනෙක තට්ටු කරා.

"පර්සි, ඔයාගේ හිතට තවත් බරක් එකතු කරන්න මට මොකක්දෝ වගේ," පෝල් කිවුවා. "ඒත් මට ඔයාගෙන් අහන්න දෙයක් තියෙනවා."

"මොකක්ද?"

"කෙල්ලෙක් ගැන."

Scanned with CamScanner

මම නළලේ රැළි කරගත්තා. "ඒ කිව්වේ?"

"ඔයාගේ අම්මා," පෝල් කිව්වා. "මං හිතාගෙන ඉන්නෙ එයාට විවාහ යෝජනා කරන්න."

තව පොඩ්ඩෙන් මගේ අතින් කෝප්පය අත ඇරෙනවා. "ඔයා කියන්නේ... එයාව බඳිනවා? ඔයයි එයයි?"

"හොඳයි, ඒක තමයි අදහස. ඔයාට ඒක ප්‍රශ්නයක් නැද්ද?"

"ඔයා ඒකට මගේ අවසර ඉල්ලනව ද?"

පෝල් රැවුල කැසුවා. "ඒක අවසරයක් ද කියලා මං දන්නෙ නැහැ, කොහොම වුණත් එයා ඔයාගේ අම්මා නේ. ඒ වගේම ඔයාට කරදර ගොඩක් තියෙනවා කියලා මං දන්නවා. මුලින්ම ඒ ගැන ඔයත් එක්ක පිරිමියෙක්ට-පිරිමියෙක් විදිහට කෙලින් කතා නොකළොත් මගේ හිතට හරි නැහැ වගේ දැනුණා."

"පිරිමියෙක්ට-පිරිමියෙක් විදිහට," මම ඒකම කිව්වා. ඒක කියද්දි මට හරි අමුත්තක් දැනුණා. මම පෝල් ගැන සහ මගේ අම්මා ගැන හිතුවා. පෝල් ළඟ ඉන්නකොට අම්මගේ මූණේ හිනාව ඉතිරෙන විදිහ, ඒ වගේම මාව උසස් පාසලට ඇතුළත් කරගන්න පෝල් මහන්සි වුණ විදිහ. මටත් නොදැනීම මගේ කටින් එයාට උත්තරයක් පිටවුණා. "ඒක නම් නියම අදහසක්, පෝල්. සුබ පැතුම්."

ඒක ඇහුවාම එයාගේ හිනාව තවත් පුළුල් වුණා. "චියර්ස්, පර්සි. අපි ගිහින් පාටියට එකතු වෙමු."

***

මම ඉටිපන්දම් නිවන්න ලෑස්ති වෙනකොටම දොරේ සීනුව නාද වුණා.

මගේ අම්මා ඇහිබැම් අකුළා බැලුවා. "ඒ කවුරු වෙන්න ඇති ද?"

ඒක අමුතු දෙයක් වුණේ, අපි පදිංචි වී සිටි අලුත් තට්ටු නිවාස සංකීර්ණයේ දොරටු පාලකයෙක් හිටියත්, එයා අපිට කතා කරලා දන්වූයේවත් නැති නිසයි. දොර විවර කරපු අම්මා මහ හඬින් හීල්ලුවා.

ඒ ඇවිත් හිටියේ මගේ තාත්තා. එයා හැමදාමත් වගේම එදාත් බර්මියුඩා කොට කලිසමකින්, හවායි කමිසයකින් සහ ලෙදර් පටි සෙරෙප්පු දෙකකින් සැරසී සිටියා. එයාගේ කළු රැවුල පිළිවෙළකට



කොට කර තිබුණා. එයාගේ මුහුදු-කොළ පාට ඇස් දිලිසුණා. එයා බිලී කොකුවලින් හැඩ කළ පරණ තොප්පියක් පැලඳගෙන සිටියා. *'නෙප්චූන්ගේ වාසනාවන්ත ධීවර තොප්පිය'* එහි සටහන් කර තිබුණා.

"පොසෙ-" මගේ අම්මා කියන්න ගිය දේ නවතා ගත්තා. එයා හිසේ කෙස් මුල ඉඳලම පහළට රතු වෙමිනුයි හිටියේ. "ම්, හෙලෝ."

"හෙලෝ, සැලී," පොසෙයිඩන් කිව්වා. "ඔයා හැමදාමත් වගේම ලස්සනයි. මම ඇතුළට එන්න ද?"

මගේ අම්මා "එන්න" නැත්නම් "උදව්" වගේ සද්දයක් උගුරෙන් නැගුවා. ඒක 'එන්න' කීමක් විදිහට බාරගත් පොසෙයිඩන් ඇතුළට ආවා.

පෝල් අපේ මුහුණුවලින් පළ වෙන හැඟීම් කියවන්න උත්සහ කරමින් මාරුවෙන් මාරුවට අපි දෙන්නා දිහා බැලුවා. අන්තිමේ දි එයා ඉස්සරහට ආවා. "හායි, මම පෝල් බ්ලෝෆිස්."

එයාගේ අත අල්ලා සොලවමින් පොසෙයිඩන් ඇහිබැම් ඔසවා බැලුවා. "බ්ලෝෆිෂ් කියල ද කිව්වේ?"

"අහ්, නෑ. බ්ලෝෆිස්, ඇත්තටම."

"ඔහ්, මට තේරුණා," පොසෙයිඩන් කිව්වා. "අපරාදේ. මම බ්ලෝෆිෂ්ලාට හරි කැමතියි. මම පොසෙයිඩන්."

"පොසෙයිඩන්? ඒක නම් හිත් ගන්නා නමක්."

"ඔව්. මම ඒකට කැමතියි. මම තව තව නම් වලිනුත් ඉඳලා තියෙනවා. ඒත් මම වඩා කැමති පොසෙයිඩන් කියන එකට."

"හරියට මුහුදට අධිපති දෙවියන්ගේ නම වගේ."

"හරියටම ඒක වගේ, ඔව්."

"හොඳයි!" මගේ අම්මා මැදට පැන්නා. "මේ, ඔයා මෙහෙට ගොඩ වුණාට අපිට ගොඩක් සතුටුයි. පෝල්, මේ තමයි පර්සිගේ තාත්තා."

"අහ්." පෝල් ඔළුව වැනුවත්, ඒ වැඩි සතුටකින් නම් නෙවෙයි වගෙයි. "මට තේරුණා."

පොසෙයිඩන් මට හිනාවුණා. "මේ ඉන්නෙ, මගේ කොල්ලා. ටයිසනුත් ඉන්නවා නේ, හෙලෝ, පුතා!"

"කාන්ති!" කාමරය හරහා දුවගෙන ආව ටයිසන් පොසෙයිඩන්ව බදාගත් වේගයට, එයාගේ තොප්පියත් බිම වැටෙන්න ගියා.

පෝල්ගේ කට ඉබේම ඇරුණා. එයා මගේ අම්මා දිහා පුදුමයෙන් බලා සිටියා. "ටයිසනුත්..."

"මගේ නෙවෙයි," එයා දිවුරුවා. "ඒක දිග කතාවක්."

"මං කොහොමද පර්සිගේ පාලොස්වෙනි උපන් දිනේ මග අරින්නේ," පොසෙයිඩන් කිවුවා. "මොකද, අපි ස්පාර්ටාවල හිටියා නම්, අද පර්සි මිනිහෙක් වෙනවා!"

"ඒක ඇත්ත," පෝල් කිවුවා. "මම ඉස්සර පෞරාණික ඉතිහාසය උගන්නලා තියෙනවා."

පොසෙයිඩන්ගේ ඇස් තරු දෙකක් වගේ දිලිසුණා. "ඒ තමයි මම. පෞරාණික ඉතිහාසය. සැලී, පෝල්, ටයිසන්... මම පර්සිව ටිකකට ගත්තට කමක් නැද්ද?"

මගේ කර වටා අතක් දමාගත් එයා මාව මුළුතැන්ගෙයට කැඳවාගෙන ගියා.

***

අපි තනිවුණ හැටියේ, එයාගේ හිනාව නැති වුණා.

"ඔයා හොඳින් ද, මගේ කොල්ලෝ?"

"ඔව්. මම හොඳින්. මං හිතන්නේ."

"මට එක එක කතන්දර අහන්න ලැබුණා," පොසෙයිඩන් කිවුවා. "ඒත් ඒක කෙලින්ම ඔයාගෙන් අහගන්න මට ඕනෑ වුණා. මට හැමදේම කියන්න."

ඉතින් මම එහෙම කළා. එයින් මාව තරමක් චකිතයට පත් කළේ, පොසෙයිඩන් තද ඕනෑකමකින් ඇහුම්කන් දුන් නිසයි. එයාගේ ඇස් කොයිම වෙලාවකවත් මගේ මුහුණෙන් ඉවතට ගියේ නැහැ. මම කතා කළ මුළු කාලය පුරාවටම එයාගේ මුහුණේ ඉරියව් මාරු වුණේ නැහැ. මම කතාව කියලා ඉවර වුණා ම, එයා හෙමිහිට ඔළුව වැනුවා.

"ඒ කියන්නේ ක්‍රෝනොස් සිකුරට ම ආපහු ඇවිල්ලා. ලොකුම යුද්ධය අපේ පිටට එන්න තව වැඩි කාලයක් යන එකක් නැහැ."

"එතකොට ලූක්ට මොකද වුණේ?" මම ඇසුවා. "එයා ඇත්තටම නැතිවෙලා ද?"



"මම දන්නේ නැහැ, පර්සි. ඒක තමයි ගොඩක්ම හිතට කරදර දෙන දේ."

"ඒත් එයාගේ ඇඟ මනුෂ්‍ය එකක් නේ. ඔයාට තිකංම එයාව විනාශ කරලා දාන්න බැරි ද?"

"මනුෂ්‍ය වෙන්නැති, බාගදා, ඒත් ලූක්ගේ මොකක්දෝ වෙනසක් තියෙනවා, මගේ කොල්ලෝ. එයා ටයිටන්ගේ ආත්මය දරාගන්න සූදානම් වුණේ කොහොමද කියලා මම දන්නෑ, ඒත් එයාව ලේසියෙන් මරන්න බැරිවෙයි. ඒ වගේම දූන්, ක්‍රෝනොස්ව ආපහු ටාටරසයට යවන්න නම් ලූක්ව මරන්නම වෙයි කියලයි මට බය. මට මේ ගැන කල්පනා කරලා බලන්න වෙනවා. අවාසනාවට, මට තවත් ප්‍රශ්න වගයක් ඇති වෙලා තියෙන්නේ."

මේ ගිම්හානය මුල දී ටයිසන් කියූ දේ මට සිහිවුණා. "පරණ මුහුදු දෙවිවරු?"

"ඇත්තටම. යුද්ධය ඉස්සෙල්ලාම ආවේ මටයි, පර්සි. ඇත්ත ම කියනවා නම්, මට වැඩි වෙලාවක් නැවතිලා ඉන්න බැහැ. මේ දූන් වුණත් සාගරය තමන් එක්කම යුද්ධ කරමින් ඉන්නේ. සටන කොයි තරම් තදබලයි ද කියනවා නම්, මම හරිකේන්, ටයිෆූන්වලට ඔයාලගේ මතුපිට ලෝකය විනාශ කරන්න ඉඩ නොදී පාලනය කරගෙන ඉන්නේ බොහොම අමාරුවෙන්."

"මටත් එහෙට එන්න දෙන්න," මම කිවුවා. "මට උදවු කරන්න දෙන්න."

හිනා වෙද්දී පොසෙයිඩන්ගේ ඇස් දෙපස රැළි ගැසුණා. "දැන්ම නෙවෙයි, මගේ කොල්ලෝ. ඔයාව මෙහෙට උවමනා වෙයි කියලා මට දැනෙනවා. ඔන්න ඒකෙන් මට මතක් වුණේ..." සෑන්ඩ් ඩොලරයක් (පැතලි බෙල්ලන් විශේෂයක්) පිටට ගත් එයා ඒක මගේ අතින් තැබුවා. "ඔයාගේ උපන් දින තෑග්ග. මේක කල්පනාවෙන් වියදම් කරන්න."

"අහ්, සෑන්ඩ් ඩොලරයක් වියදම් කරන්න?"

"ඔහ්, ඔව්. මගේ කාලේ නම්, සෑන්ඩ් ඩොලරයකින් ගොඩක් දේවල් ගන්න පුළුවන්. හරිම අවස්ථාවට පාවිච්චි කළොත්, තවමත් ඒකෙන් ගොඩක් දේවල් ගන්න පුළුවන් කියලා ඔයාට හොයාගන්න ලැබෙයි."

"මොන අවස්ථාවට ද?"

"වෙලාව ආවාම," පොසෙයිඩන් කිවුවා. "මං හිතන්නේ ඔයා ඒක දැනගනී."

මම සැන්ඩ් ඩොලරය ගුළි කරගත්තා. ඒත් එක දෙයක් ඇත්තෙන්ම මගේ හිතට වධ දෙමින් තිබුණා.

"තාත්තේ," මම කතා කළා. "මම වංගගිරියේ ඉන්නකොට, මට ඇන්ටියස්ව මුණ ගැහුණා. එයා කිවුවා... මෙහෙමයි, එයා කිවුවා එයා තමයි ඔයා කැමති ම පුතා කියලා. එයා එයාගේ පිට්ටනිය මිනී ඔළුවලින් සරසලා-"

"ඒවා මට පූජා කරලා," පොසෙයිඩන් අඩුව පිරෙව්වා. "දැන් ඔයා පුදුම වෙන්නේ කවුරු හරි කෙනෙක් මගේ නමින් එච්චර දරුණු දෙයක් කරේ කොහොමද කියලා."

මම අපහසුවෙන් ඔළුව වැනුවා.

පොසෙයිඩන් එයාගේ පදම් වුණ අතක් මගේ උරහිස උඩින් තැබුවා. "පර්සි, පහත් එවුන් දෙවියන්ගේ නමින් භයානක දේවල් ගොඩක් කරනවා. ඒකේ තේරුම අපි දෙවිගොල්ලෝ ඒවා අනුමත කරනවා කියන එක නෙවෙයි. අපේ පුතාලා දුවලා අපේ නමින් වැඩ කරන විදිහෙන්... හොඳයි, සාමාන්‍යයෙන් ඒකෙන් වඩාත් පැහැදිලි වෙන්නේ එයාලා ගැන ම මිසක් අපි ගැන නෙවෙයි. එතකොට ඔයා තමයි, පර්සි, මගේ ප්‍රියතම පුතා."

එයා හිනාවක් පෑවා. ඒ මොහොතේ, එයා එක්ක මුළුතැන්ගෙයි ඉන්න ලැබීම මට ලැබුණු හොඳම උපන් දින තෑග්ග වුණා. ඒත් ඒක්කම සාලයේ සිට මගේ අම්මා කතා කළා.

"පර්සි? ඉටිපන්දම් දිය වෙනවා!"

"ඔයා දැන් ගියොත් හොඳයි," පොසෙයිඩන් කිවුවා. "ඒත්, පර්සි, ඔයා තව දෙයක් දැනගන්න ඕනෑ. සෙන්ට් හෙලේන්ස් කන්දේ දී අර සිද්ධ වුණ දේ..."

එයා කතා කරන්නේ ඇනබෙත් මාව සිපගැනීම ගැන කියලා එක තත්පරයකට හිතෙද්දි, මගේ මූණ රතු වෙනවා මට දැනුණා, ඒත් එයා කියන්නේ ඊට වඩා ගොඩක් ලොකු දෙයක් ගැන කියලා ඊට පස්සේ මට තේරුම් ගියා.



"පිපිරීම් දිගින් දිගටම සිද්ධ වෙනවා," එයා කිවුවා. "ටයිෆූන් කැලඹෙනවා. ළඟදි ම, තව මාස දෙක තුනකින්, වැඩිම වුනොත් අවුරුද්දකින්, එයා එයාගේ බැම්මවලින් ගැලවෙයි වගේ."

"මට සමා වෙන්න," මම කිවුවා. "මම හිතුවේ නැහැ-"

පොසෙයිඩන් අතක් එසෙව්වා. "ඒක ඔයාගේ වැරැද්දක් නෙවෙයි, පර්සි. ක්‍රෝනොස් පෞරාණික රාක්ෂයින්ව ඇහැරවීමත් එක්ක, ඒක කවදා හරි වෙන්න තිබුණ දෙයක්. ඒත් පරිස්සමෙන්, ටයිෆූන් කැළඹුනොත්... ඒක මීට කලින් ඔයාට මූණ දෙන්න ලැබුණු හැම දේකටම වඩා වෙනස් වෙයි. එයා මුලින් ම මතුවුණ වතාවේ, එයාට විරුද්ධව සටන් කරන්න ඔලිම්පස්වල බලකාය සැහුනේ යාන්තමින් වගේ. එයා ආයෙමත් ඇවිස්සුනොත්, එයා එන්නේ මෙහෙට, නිව්යෝක්වලට. එයා කෙලින්ම ඔලිම්පස්වලට යයි."

ඒක නම් මගේ උපන් දිනේ දවසේ මට අහන්න ඕනෑ කළ ජාතියේ ම සතුටුදායක ආරංචියක්. ඒ වුණත් පොසෙයිඩන් මගේ පිටට තට්ටුවක් දැමුවේ හැමදේම හරියයි කියන්න වගෙයි. "මම ගියොත් හොඳයි. ඔයාගේ කේක් එක රහ බලන්න."

ඊට පස්සේ දුමකට හැරුණු එයා උණුසුම් මුහුදු හුළඟක් වගේ ජනේලයෙන් ඉවතට ඇදුණා.

***

හදිසි ගින්නක් ඇති වූ වෙලාවකට පිටවෙන්න හදලා තියෙන පඩිපෙළෙන් පොසෙයිඩන් යන්න ගිය බව පෝල්ට ඒත්තු ගන්වන්න මට ටිකක් වෙහෙසෙන්න වුණා, ඒත් මිනිස්සුන්ට නිකං ම හුළඟක් වෙලා අතුරුදහන් වෙන්න හැකියාවක් නැති බව එයා දන්න නිසා, මගේ කතාව විශ්වාස කරනවා ඇරෙන්න එයාට වෙන විකල්පයක් තිබුනේ නැහැ.

අපි ඉස්මුරුත්තාව හැදෙනකල් නිල් පාට කේක් සහ අයිස් ක්‍රීම් කෑවා. ඊට පස්සේ අපි ශරාඩ් (එක් ක්‍රීඩකයෙකු වචනයක් අභිනයෙන් හා තොල් සෙලවීමෙන් පෙන්වද්දි අනෙකා එම වචනය අනුමාන කරන ක්‍රීඩාවක්) සහ මොනොපොලි (පුවරුවක් යොදාගෙන කරන ක්‍රීඩාවක්) වගේ සාදවලට ගැළපෙන සෙල්ලම් කරන්න ගත්තා. ටයිසන්ට ශරාඩ් ක්‍රීඩාව තේරුනේ නැති වුණත්, එයා මොනොපොලි සෙල්ලමට සෑහෙන දක්ෂ බව අපිට හොයාගන්න ලැබුණා. එයා පිට පිට පස් වතාවක් මාව පරද්දවලා, ඊට පස්සේ මගේ අම්මාව සහ පෝල්වත්

බංකොලොත් කරන්න පටන් ගත්තා. එයාලට සෙල්ලම් කරන්න ඉඩ දීලා මම මගේ නිදන කාමරයට ගියා.

මම නිල් පාට කේක් කෑබැල්ලක් මගේ කණ්ණාඩි මේසය උඩින් තැබුවා. ඊට පස්සේ මගේ අර්ධ-ලෝහිත කදවුරු මාලය ගලවා ජනෙල් පඩිය මත ඇතිරුවා. දැන් එහි පබළු තුනක් තිබුණේ. මම කඳවුරේ ගත කළ ගිම්හානයන් තුන සංකේතවත් කරන්නයි - ත්‍රිශූලයක්, රන් බැටළු ලොම් සළුවක් සහ අලුත්ම එක වුණේ: සංකීර්ණ වංගගිරියක සලකුණක්. එයින් සංකේතවත් වුණේ වංගගිරියේ සටනයි. ලබන අවුරුද්දේ පබළුව මොකක් වෙයි ද, ඒක ලබාගන්නත් මම ඉඳියි ද හිතලා මම පුදුම වුණා. ලබන ගිම්හානය වෙනකල් කඳවුර විනාශ නොවී තියෙයි ද?

මගේ ඇඳ අසල තිබුණු දුරකථනය දිහා මම බැලුවා. රේචල් එලිසබෙත් ඩෙයාර්ට කතා කරන්න මම හිතුවා. අද රෑට තව කාට හරි ආරාධනා කරන්න ඕනෑ ද කියලා මගේ අම්මා මගෙන් අහද්දි, මට රේචල් ගැන කල්පනා වුණා. ඒත් මම එයාට කතා කළේ නැහැ. ඒ ඇයි කියලා මම දන්නෙ නැහැ. ඒ අදහසත් වංගගිරි දොරටුවක් තරමට ම මාව කලබල කරවන දෙයක් වුණා.

මගේ සාක්කුවලට තට්ටු කර බැලූ මම ඒවා හිස් කරන්න පටන් ගත්තා - රිප්ටයිඩ්, කඩදාසි ලේන්සු, මගේ ගෙදර යතුරක්. ඊට පස්සේ මගේ කමිස සාක්කුවට තට්ටු කළ මට පුංචි ගුළියක් තියෙනවා දැනුණා. මට කලින් තේරුම් නොගියත්, මම ඒ වෙලාවේ ඇඳගෙන සිටියේ ඔජිජියාවේ දි කැලිප්සෝ මට දුන් සුදු කපු කමිසයයි. සාක්කුවේ තිබුණු පුංචි රෙදි කෑබැල්ල එළියට අරන්, දිග ඇර බැලූ මට හොයාගන්න ලැබුණේ මූන්ලේස් කෑබැල්ලක්. ඒ පුංචි රිකිල්ල මාස දෙකකට පසුව වේලී ඇකිළී ගොස් තිබුණත්, එයින් තවමත් මට ඒ මායා උයනේ සුවඳ දැනුණා. ඒක දකිද්දි මට දුක හිතුණා.

කැලිප්සෝ මගෙන් ඉල්ලූ අන්තිම දේ මට මතක් වුණා: *'මැන්හැටන්වල මං වෙනුවෙන් උයනක් හදනව දා'* මම ජනේලය ඇරලා හදිසි පිටවීමට අඩිය තැබුවා.

මගේ අම්මා මෙතැන පැළ වැවූ පෙට්ටියක් තියාගෙන හිටියා. වසන්ත කාලයේ දි එයා ඒක මල්වලින් පිරවූවත්, දැන් නම් එහි තිබුණේ අලුත් යමක් එන තුරු මග බලා සිටි පස් ටික විතරයි. එදා පැහැදිලි රැයක් වුණා. අසූ දෙවෙනි විදියට ඉහළින් පුර හඳ



පායා තිබුණා. වියළී ගිය මූන්ලේස් රිකිල්ල පස් තුළ සිටවූ මම, මගේ කඳවුරු කෑනයෙන් නෙක්ටාර් ස්වල්පයක් එයට ඉස්සා.

මුලදි කිසිවක් සිදුවුණේ නැහැ.

ටික වෙලාවකින්, මම බලාගෙන ඉඳිද්දි ම, චූටි රිදී පාට පැළයක් පස් අතරින් උඩට මතුවුණා - උණුසුම් ගිම්හාන රැයක වැඩෙන මූන්ලේස් බබෙක්.

"ලස්සන පැළයක්," කටහඬක් කිවුවා.

මම උඩ ගියා. හදිසි පිටවුමේ මට එහා පැත්තෙන් නිකෝ ඩි ආන්ජෙලෝ හිටගෙන හිටියා. එයා නිකං ම එතැනින් මතුවෙලා.

"සමා වෙන්න," එයා කිවුවා. "ඔයාව බය කරන්න හිතුවෙ නැහැ."

"ඒකට- ඒකට කමක් නෑ. මං කිවුවේ... ඔයා මොනවද මෙහෙ කරන්නේ?"

පහුගිය මාස දෙකට එයා අඟලක් විතර උස ගිහින්. එයාගේ කොණ්ඩය එකම කළු පාට අවුල් ජාලයක් වෙලා. කළු පාට ටී-ෂර්ට් එකක් සහ කළු පාට ජීන්ස් එකක් හැඳ සිටි එයා, හිස්කබලක හැඩයේ අලුත් රිදී මුද්දක් පැලඳගෙන සිටියා. එයාගේ ස්ටයිජියන් කඩුව පැත්තකින් එල්ලෙමින් තිබුණා.

"මම පොඩි ගවේෂණයක් කළා," එයා කිවුවා. "ඔයා දැනගන්න කැමති වෙයි කියලා හිතුණා, ඩෙඩලස්ට එයාගේ දඬුවම හම්බවෙලා."

"ඔයා එයාව දැක්කා ද?"

නිකෝ ඔළුව වැනුවා. "මයිනස්ට ඕනෑ වුණේ එයාව චීස් හැලියක දාලා සදාකාලයටම කකාරවන්න. ඒත් මගේ තාත්තට වෙන අදහසක් ඇවිල්ලා. ඩෙඩලස් හැමදාටම ඇස්ෆොඩෙල්වල ගුවන් පාලම්, පිටවීම් දොරටු වගේ දේවල් හදහදා ඉඳියි. ඒකෙන් සෙනඟ තදබදය අඩු වෙයි. ඇත්තම කියනවා නම්, නාකි මනුස්සයා ඉන්නේ ඒ ගැන සතුටින් කියලා මට හිතෙනවා. එයාට තවමත් ගොඩනැඟිලි හදන්න පුළුවන්. තවමත් අලුත් නිර්මාණ කරන්න පුළුවන්. ඒ වගේම සති අන්තෙට එයාට එයාගේ පුතාවයි පර්ඩික්ස්වයි දකින්නත් ලැබෙනවා."

Scanned with CamScanner

"එහෙනම් හොඳයි නේ."

නිකෝ එයාගේ වීදි මුද්දට තට්ටු කළා. "ඒත් මම මෙහෙට ආව ඇත්තම කාරණේ ඒක නෙවෙයි. මට සමහර දේවල් හොයාගන්න ලැබුණා. මට ඕනෑ ඔයාට යෝජනාවක් කරන්න."

"මොකක්ද?"

"ලූක්ව පරද්දන්න ක්‍රමයක්," එයා කිවුවා. "මම හරි නම්, ඔයාට අවස්ථාවක් ලැබෙන එකම ක්‍රමේ තමයි ඒක."

මම ගැඹුරු හුස්මක් ගත්තා. "හරි මම අහගෙන ඉන්නේ."

නිකෝ මගේ කාමරය ඇතුළට බැල්මක් හෙළුවා. එයාගේ ඇහිබැම රැලි ගැහුණා. "අර තියෙන්නේ... අර තියෙන්නේ තිල් පාට උපන් දින කේක් එකක් ද?"

එයාගේ හඬේ බඩගිනිකාර බවක් වගේම, පුංචි ආසාවකුත් තිබුණා. මේ දුප්පත් කොල්ලට කවදාවත් උපන් දින සාදයක් පවත්වන්න කෙසේ වෙතත් ඒකකට ආරාධනාවක්වත් ලැබිලා ඇති ද හිතලා මම පුදුම වුණා.

"ඇතුළට ගිහින් කේක් කෑල්ලකුයි, අයිස් ක්‍රීම් ටිකකුයි කමු," මම කිවුවා. "මට පේන්නේ අපිට කතා කරන්න ගොඩක් දේවල් තියෙනවා වගේ."

Scanned with CamScanner

# පර්සි ජැක්සන් සහ
# වංගගිරියේ සටන

අවංකවම කියනවා නම්, තවත් ඉස්කෝලයක් පුපුරවා දාන්න මට කිසිම උවමනාවක් තිබුණේ නැහැ.

ග්‍රීක දෙවියෙකුගේ පුතා හැටියට, මම මරණාසන්න උපද්‍රවවලට ඇති තරම් මුහුණ දීලා තිබුණා. ඒවා මදිවට වගේ දැන් මගේ පරම සතුරා ක්‍රෝනස් පෞරාණික වංගගිරියක් හරහා ඇවිත් අපේ කඳවුර ආක්‍රමණය කරන්න ඕනෑ වෙලා.

එය සාර්ථක වුණොත්, ලේ පිපාසිත රාක්ෂයෝ දහස් ගාණක් අපිට පහර දෙයි. ඉතින් වෙන මොනවා කරන්න ද, අපි හතරදෙනෙක් ඉර එළියට සමු දීලා, කිසිතුණු අන්ධකාරය තුළට පල්ලම් බහිනවා ඇරෙන්න...

ආශිර්වාද ප්‍රකාශකයෝ
033 2275419
ISBN 978-955-697-089-0
Rs. 650/-

Scanned with CamScanner